

# ලක් මවට මුතු පොටක්

අජිත් නිවාඩ් කබ්රාල්

# ලක් මවට මුතු පොටක්

අජිත් නිවාඩ් කබ්රාල්

© අජිත් නිවාඩ් කබ්රාල්

ප්‍රථම මුද්‍රණය 2004 ඔක්තෝම්බර්

කබ්රාල්, අජිත් නිවාඩ්
ලක්මවට මුතුපොටක්
පි. xvi, 300 : සෙ.මී. 21
**ISBN 955-8744-01-8** මිල : රු. 350

**ISBN 955-8744-01-8**

ප්‍රකාශනය :-
අජිත් නිවාඩ් කබ්රාල්
සි/ස අජිත් කබ්රාල් 2000 (පුද්) සමාගම
අංක 18/1 පාසල් පටුගම
නාවල.

මුද්‍රණය :-
සීමාසහිත ප්‍රින්ට්වේව් (පුද්) සමාගම
නො. 95/28, රාජගිරිය පාර
රාජගිරිය
ටෙලි. 011 2888750

# පිදුම

මාගේ නිරන්තර දිරිගන්වන්නා ද,

මාර්ගෝපදේශකයාද, මිතුරාද වූ

මා ආදරණීය පියාණන් වන

වෛද්‍ය ලෙස්ලි කබ්රාල්ටද,

සෑම අවස්ථාවකදීම මා කෙරෙහි

පූර්ණ විශ්වාසයක් තබමින් මා දිරිමත් කරන

මා ආදරණීය මෑණියන් වන

ට්‍රික්සි කබ්රාල්ටද

පිරිනැමේ

# ලක්මවට මුතුපොටක්


ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සභාපතිතුමාගේ පණිවිඩය ix

විවරණිකා - සිරි රණසිංහ මහතා xi

පෙරවදන සහ ස්තුතිය xiii

**1 පළමු කොටස - ශ්‍රී ලංකා ආර්ථිකය** 1

1.1 ශ්‍රී ලංකා ආර්ථිකය වසර 50 කට පෙර සහ දැන්? 3

1.2 ආර්ථිකය ප්‍රාණවත් කිරීමට විශේෂ තල්ලුවක් 7

1.3 ආර්ථිකයට අවශ්‍ය ශ්‍රම බලකායක් බිහි කරමු 10

1.4 බුද්ධි ආර්ථිකයට අප සම්බන්ධ වීමට නම් 13

1.5 වැඩෙන ආදායම් පරතරය භයානකය 16

1.6 බැංකු ප්‍රතිසංස්කරණයට මැලේසියාවෙන් ආදර්ශයක් 20

1.7 ප්‍රමුඛ බැංකු සිද්ධියෙන් මහ බැංකුව පාඩම් උගත යුතුය 24

1.8 යුද්ධය නිමාවී වසරක් ගතවුවත් සාමයේ ලාභාංශ ජනතාවට නොලැබුණේ ඇයි? 29

1.9 ඉරාක යුද්ධයෙන් ඉගෙන ගත හැකි පාඩම් 34

1.10 ජීවන වියදම අඩු කරමුද? පාලනය කරමුද? 38

1.11 කොටි සංවිධානයේ ආර්ථික යෝජනා වලින් පාඩම් උගනිමු 41

1.12 යෝජිත රාජ්‍ය ස්වයං විශ්‍රාම වරප්‍රසාද ක්‍රමයට විකල්පයක් 45

1.13 තවත් 60,000 ක් රජයේ සේවට බඳවා ගැනිමට හැකිවේද? 49

1.14 ණයපත් හිතකරද? අහිතකරද? 53

1.15 අක්‍රිය ගිණුම් අනතුරුදායකයි - පරිහරණය ප්‍රවේශමෙන් 57

1.16 මතුවට අපට විදුලිබල හිගයක් ඇතිවේද? 60

1.17 පිරමිඩ ශ්‍රී ලංකාවේත් ? 64

1.18 පංගු ක්‍රමය අහෝසි වීම තර්ජනයක්
නොව අවස්ථාවකි 68

1.19 පෞද්ගලික අංශය යනු කොටස් වෙළඳපොළේ
ලොකු සමාගම් විතරද? 72

1.20 100% ඉඩම් පැවරුම් බද්දෙන් විදේශ
ආයෝජනයට දරුණු පහරක් 76

1.21 ආබාධිතයන් කියන පුද්ගලයින් ආර්ථිකයට
සම්බන්ධ කර ගනිමු 80

1.22 රුපියලේ අගය සහ ආර්ථිකය ආරක්ෂා
කරගන්නට නම් ඉන්ධන භාවිතය අඩුකර ගනිමු 84

1.23 චිත්‍රපට, ටෙලිනාට්‍ය, විලාසිතා සහ ආර්ථිකය 88

**2 දෙවන කොටස - ව්‍යාපාරික** 93

2.1 අප රට ව්‍යාපාරිකයන් දෙස නව කෝණයකින්
බැලිය යුතුය 95

2.2 සුලු සහ මධ්‍යම ව්‍යාපාර සුරකිමු 98

2.3 ව්‍යාපාරයක මුදල් ද්‍රවශීලතාවය රැකගැනීම
අත්‍යවශ්‍ය කාර්යයකි 101

2.4 ව්‍යාපාරයක නායකත්වයේ අනුප්‍රාප්තිකය ගැන
කලින්ම සිතමු 104

2.5 වැටෙන ව්‍යාපාර වලට නව ජීවයක් 108

**3 තෙවන කොටස - කෘෂිකර්මය සහ ධීවර** 113

3.1 වැවිලි කර්මාන්තයට නව දැක්මක් 115

3.2 වැවිලි ක්ෂේත්‍රයේ ගැටලු වලට පිළියම් 119

3.3 වී ගොවිතැන සඳහා නව දැක්මක් 122

3.4 වී ගොවියා දිරි ගන්වමු 126

3.5 නියඟය ප්‍රයෝජනයට ගෙන ගොඩවී ඇති
වැව් හාරමු 130

3.6 පිටි සහනාධාරයට වැයකරන මුදල වැව්
නඩත්තුවට වෙන් කරමු 133

3.7 සාගර ආර්ථිකයට යොමු වෙමු 137

3.8 අප ධීවරයින් ශක්තිමත් කළ යුතුය 140

**4 සිව්වන කොටස - විදේශ ආධාර සහ ණය** 143

4.1 අප රට නැවත පුබුදු කර වීමට නම්.. 145

4.2 ආධාර මුදල් කාර්යක්ෂමව හසුරුවීම යුගයේ අවශ්‍යතාවයයි 148

4.3 ගන්නා ණය ගෙවිය යුතු බව මතක තබා ගනිමු 151

4.4 විදේශාධාර මතම යැපෙමින් රටක් දියුණු කළ හැකිද? 154

4.5 විදේශ ණය ලබාගනිද්දී බලපෑම් අවමකර ගැනීමට නම් 162

**5 පස්වන කොටස - බදු** 167

5.1 බදු දැල පුළුල් කිරීමට නම් 169

5.2 බදු ගෙවන්නන් ගණුදෙනුකරුවන් ලෙස සැලකිය යුතුය 173

5.3 බදු සහන බදු ගෙවන්නන්ට පමණයි ! 177

**6 හයවන කොටස - කළමනාකාරීත්වය** 181

6.1 මනා කළමනාකාරිත්වය හැම මට්ටමකින්ම සිදුවිය යුතුයි. 183

6.2 ප්‍රතිඵල ඉලක්ක කරගත් පාලනයකට පිවිසෙමු 186

6.3 අවදානම ගැන අවධානය යොමු කරමු 190

**7 හත්වන කොටස - අධ්‍යාපනය සහ රැකියා** 195

7.1 විරැකියා උපාධිධාරීන්ට වැයවූ කෝටි 900යේ වගකීම කාටද? 197

7.2 රැකියා විසි හත් දහසක් එකවර බිහිකිරීම සිහිනයක්ද? 201

7.3 උපාධිධාරීන්ට රජයේ රැකියා දෙමුද? ජීවනෝපායක් ලබා දෙමුද? 210

**8 අටවන කොටස - ඵලදායීතාවය සහ වගවීම** 215

8.1 ඵලදායිතාවය වැඩි නොකර රට සංවර්ධනය කළ හැකිද? 217

8.2 සුලු ව්‍යාපාරිකයන්ගේ ආදායම හා ඵලදායිතාව වර්ධනය කරමු 220
8.3 ඵලදායිතාවය වර්ධනය කිරීමට සිත් යොමු කරමු 224
8.4 ක්‍රියාකාරිත්වය පදනම් කරගත් පිරිවැය කරණයකට රජය පිවිසිය යුතුය 228
8.5 අය වැය හරහා වගකීම් පැවරීමේ ක්‍රමයක් 232
8.6 ඵලදායිතාව වර්ධනය සඳහා වැටුප් දෙසතියකට වරක්? 236
8.7 සේවක භාරකාර අරමුදල වැඩ දෙගුණ වීමක්ද? 240

9 නවවන කොටස - දුම්රිය, මහාමාර්ග, සංචාරක හා ඉදිකිරීම් ක්ෂේත්‍රය 245
9.1 ශ්‍රී ලංකා දුම්රිය සේවය යළි පණ ගන්වන්නට නම්... 247
9.2 කටුනායක - කොළඹ අධිවේගී මාර්ගය වෙනුවෙන් විකල්ප සලකා බලමු 251
9.3 සංචාරක ව්‍යාපාරයෙන් ආර්ථිකයට විශේෂ අත්වැලක් 255
9.4 සංචාරක ව්‍යාපාරය යනු හෝටල් සහ බස් රථ පමණක් නොවේ 258
9.5 සංචාරක ව්‍යාපාරයට ක්‍රීඩාව සම්බන්ධ කරමු 265
9.6 අමතක නොකළ යුතු ඉදිකිරීම් ක්ෂේත්‍රය 268

10 දහවන කොටස - දේශපාලනය 271
10.1 දකුණේ නායකයන් යථාර්ථය වටහාගෙන නෑ 273
10.2 ආර්ථිකය විමධ්‍යගත නොකර බලය විමධ්‍යගත කිරීමෙන් පලක් නෑ 280
10.3 ශ්‍රී ලංකාව දූෂණය අතින් 66 වැනි ස්ථානයට 286
10.4 මැතිවරණ මනාප ක්‍රමය සහ එහි දුබලතා 290
10.5 පොරොන්දු ඉටුකිරීමට මුදල්? 295

පසුවදන 299

# ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සභාපතිතුමාගේ පණිවිඩය

වරළත් ගණකාධිකාරි ආයතනයේ ශිෂ්‍යයෙකු වශයෙන් මා කටයුතු කළ කාලයේ සිටම, අජිත් නිවාඩ් කබ්රාල් මහතා, හිටපු සභාපතිවරයෙකු ලෙසද, ප්‍රවීණ ආර්ථික විද්‍යා විශේෂඥයෙකු ලෙසද කිට්ටුවෙන් ඇසුරු කිරීමට මට අවස්ථා ලැබිණි. ඒ නිසා, එතුමාගේ පුළුල් දැනුම, ප්‍රායෝගික භාවය, කළමණාකාරීත්ව දක්ෂතාවය සහ කෙනෙකු සමග සුහදව කටයුතු කරගැනීමේ හැකියාව, දැකගැනීමට සහ අවබෝධ කරගැනීමට මට හැකි විය. අද එතුමා වැදගත් කෘතියක් එළි දක්වන අවස්ථාවේදී වරළත් ගණකාධිකාරි ආයතනයේ සභාපති වශයෙන් එම විශේෂ කර්තව්‍යයට සමීපව සම්බන්ධ වීමට මට ලැබීම, මාගේ භාග්‍යයක් ලෙස මා සලකමි.

ජාතික මට්ටමේ පමණක් නොව අන්තර්ජාතික මට්ටමින්ද සමුට හා සැසිවාර රාශියක් නියෝජනය කරමින්, අති විශාල අත්දැකීම් හා දැනුම් සම්භාරයක් ලබා ඇති කබ්රාල් මහතා, එම දැනුම සහ අත්දැකීම් ඇසුරෙන් වසර කිහිපයක් පුරා අප රට දැවෙන ආර්ථික, අධ්‍යාපනික, ව්‍යාපාරික, කළමනාකරණ, දේශපාලනික හා අනිකුත් සමාජ ක්ෂේත්‍රවල ගැටලු පිළිබඳව පුවත්පත් වල පළකර ඇති බව අප දනිමු. එසේ පළකරන ලද ලිපි, මුතු පොටක් මෙන් එකිනෙක අමුණා එක්තැන්කොට "ලක් මවට මුතු පොටක්" යන කෘතිය ලෙසින් මෙසේ අප සැම වෙත පුද කරන අවස්ථාව අප සියලු දෙනාටම සතුට ලබාදෙන එකක් ලෙස මට හැඳින්විය හැක. තවද, ඉදිරි අනාගතයේදී මෙම කෘතියෙහි අඩංගු අදහස් ක්‍රියාත්මක වුවහොත්, එය අප රටේ වාසනාවට අනිවාර්යයෙන්ම හේතුවන බවද මා නිසැකයෙන්ම දනිමි.

කබ්රාල් මහතාගේ මෙම කෘතියෙහි එතුමා හුවා දක්වන්නේ කාලීනව පැණ නැගී ඇති ගැටලු පමණක් නොවේ. එම ගැටලු පැණ නැගීමට බලපා ඇති පසුබිම හා ඊට ගතහැකි සරළ හා පහසු පිළියම්ද එතුමා විස්තර කොට ඇත. එතුමා විසින් ලක්මවට

දායාද කොට ඇති මෙම මුතුපොටෙහි වටිනාකම තව තවත් වැඩි වීමට එම ලක්ෂණය ඉවහල් වී ඇත. තවද එම කෘතියෙහි මා දකින විශේෂත්වය වන්නේ එහි සුපැහැදිළිවම දක්නට ඇති සරළ භාෂා ව්‍යවහාරයයි. එතුමා සතු දැනුම් සම්භාරය කෙතරම් පුලුල් වුවත්, නෙකතරම් ගැඹුරු වුවත්, එය ලොකු පොඩි කා හටත් කියවා අවබෝධ කරගත හැකි පරිද්දෙන් ඉතා සරළ හා ලගන්නා සුලු බසකින් ඉදිරිපත් කොට ඇත.

අප ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ මෙම මහගු කර්තව්‍යයේදී කෘතිය දොරට වැඩීමේ කටයුතු අප ආයතනයේ අනුග්‍රහකත්වයෙන් සිදු කරන්නට ලැබීම පිළිබඳව පුද්ගලිකව මමද, අප ආයතනයද, බෙහෙවින් සතුටු වන්නෙමු. එතුමාට මෙබඳු වූ කර්තව්‍යයන් ඇසුරෙන් තව තවත් රටට ඵලදායී සේවාවන් ලබා දීමට අවශ්‍ය ධෛර්යය, ශක්තිය හා වාසනාව ලැබේවායි මා ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු
සභාපති
ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනය,
30 ඒ, මලලසේකර මාවත
කොළඹ 7.

2004 ඔක්තෝම්බර් 8 වැනිදා

# විවරණිකා

"සැම තැනැත්තෙකුටම සිතිමේ නිදහසට හිමිකම් ඇත්තේය."

ඒ මිනිස් අයිතිවාසිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනයෙන් සේම ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ද තහවුරු වී ඇති මූලික මිනිස් අයිතියකි.

යම් නිෂ්පාදනයක් හෝ නිර්මාණයක් කිරීමට අමු ද්‍රව්‍ය අවශ්‍ය වන්නාක් මෙන්ම සිතිමටද හේතු සැධක අවශ්‍යමය.

සිතිමට හේතු සාධක වන්නේ තොරතුරුය. තොරතුරු අප ජීවත් වන මේ 21 වැනි සියවසේ පුද්ගලයෙකු සතු හොඳම සහ වටිනාතම ධනය ලෙසද සැළකේ.

සිංහලයෙන් පමණක් ලියන, කියවන අයට තොරතුරු ලබාගැනීමට තිබෙන මාධ්‍ය ඉතා සීමිතය.

අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ "ලක් මවට මුතු පොටක්" නැමැති මෙම ග්‍රන්ථය එකී සීමිත අවකාශයේ වෙසෙන අයට අසීමිත මංපෙත් විවර කරදෙතැයි අපි විශ්වාස කරමු. අප ඒ නිගමනයට එළැඹියේ මෙහි ඇතුළත් තොරතුරු පදනම් කොට ගෙනය.

අධ්‍යාපනය, ආර්ථික, ව්‍යාපාරික, කෘෂිකර්මාන්ත, ධීවර කර්මාන්තය රාජ්‍ය ණය හා බදු කළමනාකරණ, ප්‍රවාහන, මහා මාර්ග, සංචාරක, ඉදිකිරීම් කර්මාන්ත සහ දේශපාලන යන ක්ෂේත්‍රවල පවතින ප්‍රශ්න, ගැටලු හා අර්බුද ලක් මවට මුතු පොටක් හි සාකච්චාවට බඳුන් වී තිබේ. අප රටේ ජීවත් වන උගතුන්, බුද්ධිමතුන්, වෘත්තිකයන් සේම ව්‍යාපාරික ප්‍රජාව හා දේශපාලකයන්ද ඒ ප්‍රශ්න, ගැටලු හා අර්බුද ගැන නොයෙක් කතා කියනු අපට ඇසේ. බොහෝ දේශපාලකයන්ගේ කතාවලින් පෙනෙන්නේ ඔවුනට ඒවා තවත් කටගැස්මක් බවට පත්ව තිබෙන සෙයකි. ඔවුහු යථාර්ථය දකින්නටත් කියන්නටත් අකමැත්තෝය. ඒ අභාග්‍ය සම්පන්න තත්ත්වය නිදහසින් පසුව සැම කාල වකවානුවකම

ගම්‍ය වෙයි. අපේ ආර්ථිකය එකතැන පල්වීමටත් සදාචාරාත්මක ගුණධර්ම සෝදා පාලුවටත් එය හේතු වී තිබේ.

පවතින අර්බුද වලට උගතුන්, බුද්ධිමතුන් හා වෘත්තිකයන් යෝජනා කරන බොහෝ පිළියම්වල දක්නට ඇත්තේ න්‍යායාත්මක හෝ පොතේ ගුරුවාදී ස්වරූපයකි. විශේෂයෙන්ම එය මෙරට විද්වතුන්යයි කියාගන්නා බොහෝ පිරිස් අතර සුලබව ප්‍රකට වන ලක්ෂණයකි.

ව්‍යාපාරික ප්‍රජාවගේ මතාන්තර තුළින් බොහෝවිට ගම්‍ය වන්නේ ලාභ ඉපැයීම උපරිම අරමුණ කර ගැනීමේ අපේක්ෂාය.

ලක් මව පීඩාවට පත් කරන අර්බුදවලට අජිත් යෝජනා කරන පිළියම්වලින් පසක් වන්නේ ඔහුට ඒ කිසිවක් කටගැස්මක් වී නොමැති බවයි. ලාභය උපරිම අරමුණ කර ගැනීමේ අපේක්ෂාවක් ඔහු සන්තානයෙහි නොමැති බවයි. ඒ කෙසේ වුවද ඔහු යෝජනා කරන පිළියම් අප මන බැඳගන්නේ ඒවායෙහි පවතින ප්‍රායෝගික බව නිසාමය. මලකඩ බැඳුනු මොළවලට ඒවා කදිම ප්‍රතිකාර ලෙස අපට පෙනේ. පොතේ ගුරු වාදී අල්පශ්‍රැත ප්‍රජාවට මෙමගින් සිතන්නට නව මං පැදෙනු ඇත. කුසිත, ආදානග්‍රාහි හා විචාර බුද්ධියෙන් තොර විතණ්ඩවාදි ප්‍රතිපත්ති සම්පාදක දේශපාලකයන්ට හා රාජ්‍ය නිලධාරීන්ට මෙය හස්තසාර ග්‍රන්ථයක් ලෙස නිර්දේශ කළ හැකියි.

ඉංග්‍රීසි මාධ්‍යයෙන් තත් විෂය පිළිබඳව පරිණත පරිචයක් ලබා සිටින අජිත් කබ්රාල් වැනි විද්වතකුගෙන් මෙවැනි සාරගර්භ ග්‍රන්ථයක් උත්පාදනය වීම එක් අතකින් අපූර්වත්වයකි. එවන් පරිසරයක සිට ඔහු සිංහල බස සිය අණසක යටතට ගැනීම සඳහා ලබාගත් නිපුණතාවට ඉරිදා ලංකාදීප පත්‍රයත් පාදක වන්නට ඇතැයි සිතමි. එයද මට මහත් ආඩම්බරයකි. සිංහල පාඨක සැමට භාග්‍යයකි.

**සිරි රණසිංහ**

**ලංකාදීප ප්‍රධාන කර්තෘ**

# පෙරවදන සහ ස්තුතිය

ශ්‍රී ලාංකිකයන්ට හැකියාව ඇත. ලෝක කුසලාන දිනූ ක්‍රිකට් කණ්ඩායම ඔප්පු කළේ එයයි. එහෙත්, "අපට කළ හැකිය" යන විශ්වාසය අප තුළ ඇත්තේ ඉතා අවම ප්‍රමාණයකටය. අප රටේ විශිෂ්ඨ දක්ෂතාවයන් ඇති පුද්ගලයෝ බොහෝ දෙනෙක් සිටිති. අවශ්‍ය පරිසරය, අදහස්, නිදහස, ධෛර්යය සහ අවබෝධය ලැබේ නම්, ඔවුන්ට මේ රට දියුණුව කරා ඉදිරියට රැගෙන යා හැක. එබඳු විප්ලවයක් සිදුවීමට ඉඩ ලැබුණහොත්, එය සරල මෙන්ම වැඩි ආටෝපයකින් තොර එකක් වන අතර, එහි ප්‍රතිඵල අප සියලු දෙනාටම භුක්ති විඳීමට හැකි වනු ඇත. එබැවින් මා මෙම කෘතියෙහි අඩංගු ලිපි මාලාව තුළින් යෝජනා කරන්නේ අප දැනට ගමන් කරන දිශාව වෙනස් කොට, යම් "මෘදු" පෙරළියක් ("soft" revolution) රට තුළ ආරම්භ කරන ලෙසය. ඒ පෙරළිය සිදු කිරීමට, මේ කෘතියෙහි අඩංගු අදහස් උපකාරී වනු ඇතැයි මා සිතමි. වෙනස් ආකාරයකින් සිතීමටත්, අපට එල්ල වන තර්ජන ඉඩ ප්‍රස්තා බවට හරවා ගැනීමටත්, එම අදහස් අපට උපකාරී වනු ඇත. අතීතය තුළ සිර නොවී, නව සහශ්‍රයට එඩිතර පිම්මක් පැනීමට මෙම කෘතිය ශ්‍රී ලංකාවට අත්වැලක් වනු ඇතැයි මා විශ්වාස කරමි.

මෙම කෘතිය ලිපි 68 කින් සමන්විතය. ඒවායේ අඩංගු සමහර අදහස් මාගේමය. එහෙත්, ඒවායේ ඇති අදහස් හෝ යෝජිත ක්‍රියාමාර්ග හෝ ප්‍රතිචාර වලින් වැඩි කොටසක්ම මා විවිධ පුද්ගලයන්ගෙන් ලබාගත් ඒවාය. මට වටිනා අදහස් ලබාදී ඇති පුද්ගලයන් රාශියකි. ඔවුන් අතර, පොළොන්නරුවේ කුඩා ගම්මානයක ගොවිතැනෙහි යෙදෙන ගොවි මහතෙකු සහ කොළඹ නගරයේ විශාල පරිමාණයේ ජාත්‍යන්තර ආයතනයක උසස්ම වගකීම් දරණ කළමනාකරණ අධ්‍යක්ෂවරයෙකු වේ. සමස්තයක් වශයෙන් මා ඉගෙන ගෙන ඇති බොහෝ පාඩම් මා ඉගෙන ගත්තේ විවිධ ක්ෂේත්‍රවල ප්‍රායෝගිකව කටයුතු කරන සාමාන්‍ය පුද්ගලයන්ගෙනි. බොහෝ විට, ගැටලුවක් විසඳීමට උපදෙස් ලබාගත හැකි අදාල පුද්ගලයා එම ගැටලුවට ප්‍රායෝගිකව

මුහුණ දෙන අයෙක් බව අප අමතක නොකළ යුතුය. එසේ වුවද, බොහෝ පාලකයින් සහ නිලධාරීන් එවැනි අයගෙන් ගැටලුව පිළිබඳව නොවිමසා තමන්ගේම මතයන් හරහා, විසඳුම් සෙවීමට ප්‍රයත්න දරති. පසුබිම හරිහැටි නොදැන කරන මෙවැනි ප්‍රතිකාර අසාර්ථක වීම පුදුමයක් නොවේ.

බොහෝ අවස්ථාවලදී අප සරල විසඳුම් සළකා බලනවාට වඩා සංකීර්ණ විසඳුම් ගැන සිත් යොමු කිරීමට කැමැත්තක්ද දක්වමු. සරල විසඳුමක් හෝ සරල ප්‍රතිචාරයක් දෙස අප බලන්නේ සැකයකිනි. සංකීර්ණ ප්‍රශ්නවලට සරල විසඳුම් තිබෙනවා යයි සිතීමට පවා අප අකමැතිය. පණ්ඩිතයාට ඒදණ්ඩෙන් එගොඩ වීමට අපහසු යැයි යන පැරණි කියමන අපගේ සිත් තුළ නිරන්තරයෙන්ම තිබුණත්, අපගේ එදිනෙදා ජීවිත වල නම්, එම කියමනෙන් ලැබෙන පාඩම නොසලකා හරින අවස්ථා අනන්ත අප්‍රමාණය.

මාගේ මතය වනුයේ සමාජයක් විනිශ්චයට ලක් විය යුත්තේ එහි දිළිඳු ජනතාවගේ ජීවන මට්ටම සහ තත්ත්වය හරහාය. ඒ මිනුම් දණ්ඩ අනුව, අකමැත්තෙන් වුවද අපට පිළිගන්නට සිදුවන්නේ අප සමාජය සාර්ථක වී නැති බවත්, තවමත් අසාර්ථක තත්ත්වයක පවතින බවත්ය. මේ තත්ත්වය අප වෙනස් කළ යුතුය. එය නොපමාව කළ යුත්තකි.

එසේ නම්, අප සැළකිය යුතු අත්‍යාවශ්‍යම ආර්ථික සාධකය, අප රටේ දිළිඳුයයි කියන පුද්ගලයන් කොපමණ පොහොසත්ද යන්නය. යම් ආර්ථික ප්‍රතිපත්තියක් හරහා අප රටේ පොහොසත් පුද්ගලයන්ට සාපේක්ෂව දිළිඳු පුද්ගලයන් වඩාත් දිළිඳු වන්නේ නම්, එම ආර්ථික ප්‍රතිපත්තියෙහි කිසිඳු ඵලක් හෝ වටිනාකමක් නොමැත. එසේ නම්, අප සිත් යොමු කරගත යුත්තේ ධනය නිර්මාණය කරමින් ධනය වැඩිකරනවාත් සමගම එම ධනය වඩාත් සාධාරණ අන්දමින් භුක්ති විඳිමේ සමාජ සංස්කෘතියක් අප රටේ බිහි කිරීම වෙතය. මාගේ සෑම ලිපියකම පාහේ මා පුන පුනා අපේක්ෂා කරන මෘදු පෙරළිය නම් අප රටවැසියන් තුළ සහ පාලකයන් තුළ ඇතිවෙන ආකල්ප වෙනස් වීම හරහා රටේ ආර්ථික වර්ධනයේ ප්‍රතිඵල සියලු දෙනාටම භුක්තිවිඳ

ගැනීමට හැකිවන ස්වභාවයකින් සකස්කර ගැනීමය. එසේ නම් මෙම කෘතියෙහි යෝජනා වී ඇති උපාය මාර්ග සාර්ථකව ක්‍රියාවට නැගේ නම් ඒවා නිසැකව ම ශ්‍රී ලංකාව නැවත ගොඩ නැගීමට ඉවහල් වනු ඇතැයි මා තරයේම විශ්වාස කරමි.

පසුගිය වසර දෙක තුලදී, සෑම සතියකම විවිධ මාතෘකා ඔස්සේ අපගේ ජාතික පුවත්පත් වලට මා ලිපි ඉදිරිපත් කළෙමි. සාකච්ඡා සටහන් හරහාද, විවිධ අදහස් සඟ මත ප්‍රසිද්ධ කළෙමි. ඒවා තුළින් අප රටේ ජීවන තත්ත්වය නංවාලීමේ ක්‍රම මා හඳුනා දුනිමි. එම ලිපි සහ සටහන් ඒකරාශි කරද්දී මට වැටහුනේ ඒවා එක්තැන් කොට, කෘතියක් වශයෙන් එළිදැක්වුවහොත්, එම අදහස් ගොනුවූ කේන්ද්‍රයක් අපට නිර්මාණය කර ගත හැකි බවය. එසේ නම් මෙම කෘතිය, එම පරමාර්ථය මුදුන්පත් කර ගනිමින් කරන්නට යෙදුනු ක්‍රියාවලියකි.

2003 මුල් භාගයේදී, ලංකාදීප පුවත්පතෙහි ප්‍රධාන කර්තෘ සිරි රණසිංහ මහතා ඉරිදා ලංකාදීප පුවත්පතෙහි සතිපතා "දැවෙන ආර්ථික ප්‍රශ්න" යන මැය යටතේ තීරුවක් ඉදිරිපත් කරන ලෙස මට ආරාධනා කළේය. සතිපතා මෙවැනි කාර්යයක යෙදීම දුෂ්කර බවත්, එසේ කරද්දී මතුවෙන අභියෝග ගැනත් මා හොඳින් දැන සිටියෙමි. එහෙත්, එම කාර්යයෙහි නිරත වීමට මා එකග වූයේ එවැනි කාර්යයක ඇති වටිනාකම ගැන මා හොඳින් අවබෝධ කරගෙන තිබූ බැවිනි. සෑම සතියකම නව මාතෘකාවක් තෝරා ගෙන ඒ පිළිබඳව විශ්ලේෂණයක් කරමින් ඒ ගැන ප්‍රායෝගික අන්දමට සාකච්ඡා කිරීම, මා හට විශාල ආශ්වාදයක්ද, චිත්ත විනයක්ද, ලබාදුන් කටයුත්තකි. එම සතුට භුක්ති විඳීමට මට අවස්ථාවක් ලබාදුන් සිරි රණසිංහ මහතාට මාගේ කෘතඥතාවය මා පුද කරන්නෙමි. එපමණක්ද නොව, සිරි රණසිංහ මහතා මෙම කෘතිය පිළිබඳව විචාරණයක්ද ලබාදීම ගැන මා ඔහුට වැඩි දුරටත් ස්තුතිවන්ත වෙමි.

ඊට අමතරව, මාගේ උපදෙස් මත මෙම කෘතියෙහි පිට කවරය නිර්මාණය කළ A & D ආයතනයටද, කෘතිය මුද්‍රණය කළ Print Wave ආයතනයේ, කැලුම් තරංග මහතාටද මා ස්තුතිවන්ත වෙමි.

මෙම කෘතිය සකස් කරද්දි ඊට අදාළ සියලුම අත්පිටපත් සහ කෙටුම්පත් සුපරික්ෂාවෙන් කියවා ඒවා නිසි ආකාරයට සකස් කළේ යමුනා හෙට්ටිආරච්චි මෙනවියය. මෙම කෘතිය සම්බන්ධයෙන් නොයෙකුත් අදහස් සහ සංවිධානාත්මක කටයුතුවල මූලික තැනක් ගත්තේ දර්ශනී අමරසිංහ මහත්මියය. තවද, විවිධ අන්දමට, නුවන් දේශප්‍රිය මහතා, සූරාජ් දුමින්ද මහතා, සේපාලි උදේනිකා මහත්මිය, කේ. පී. ලක්ෂමන් මහතා යන අය සහය ලබා දුන්නෝය. ඒ සැම කෙනෙකුටම මා බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

**අජිත් නිවාඩ් කබ්රාල්**
2004 ඔක්තෝම්බර් 8 වැනිදා
nivard@eureka.lk

# 1

පළමු කොටස

# ශ්‍රී ලංකා ආර්ථිකය

# 1.1

## ශ්‍රී ලංකා ආර්ථිකය වසර 50 කට පෙර සහ දැන්?

අද, ශ්‍රී ලංකාව දැවෙන ආර්ථික අර්බුද කිපයකටම මුහුණ දෙන බව සියලු දෙනා ම පාහේ පිළිගනිති. සෙමින් වුවද නියත වශයෙන්ම වැඩිවන අයවැය පරතරය, ක්‍රමයෙන් ඉහළ නගින උද්ධමනය, ශීඝ්‍රයෙන් වැටෙන රුපියලේ වටිනාකම, ක්‍රම ක්‍රමයෙන් වැඩි වන පොළී අනුපාතය, තියුණු ලෙස ප්‍රසාරණය වන රාජ්‍ය ණය, ග්‍රාමීය සහ කෘෂි කාර්මික ආර්ථිකය නංවාලීමට ඇති බාධා වැඩිවීම, ඇතුලු ආර්ථික අභියෝග ජයගත හැකිද නැද්ද යන ප්‍රශ්නය ගැන බොහෝ දෙනා තම සිත් යොමු කරන්නේ විශාල සැකයකින් සහ භිතියකිනි.

අප රටේ ආර්ථිකය විවිධ ලෙස කවුරු කුමන ආකාරයට විග්‍රහ කළත්, ඒ සියල්ලන්ටම මග හැරිය නොහැකි එක් විශේෂ කරුණක් තිබේ. එය නම් 2004 වන විට, ශ්‍රී ලංකාව ලෝකයේම ඇති දුප්පත් රටවලින් එකක් බවට පත්වී ඇති බවය. එහෙත්, මීට වසර 50 කට පෙර 1954 දී ශ්‍රී ලංකා ආර්ථිකය මුලු ආසියාවේම ආර්ථිකයන් අතරින් ඉතා ඉහළ මට්ටමක පැවැත්වුණු ආර්ථිකයක් බව යම් සතුටකින් සහ අසතුටකින් අප මතක් කරගත යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුවේ 1954 වාර්තාව මෙම තත්ත්වය සනාථ කරන දත්ත කිපයක් පමණක් පහත පරිච්ඡේදයේ උපුටා දැක්වීමට මා කැමැත්තෙමි.

1954 දී, ශ්‍රී ලංකාවේ විදේශීය වෙළඳ අනුපාතය ඊට පෙර වසරට වඩා 22% කින් ඉහළ නැගුණි. එම වසරේදී වෙළඳ අතිරික්තය (Trade surplus) රුපියල් මිලියන 402 ක් හෝ ඇමෙරිකානු ඩොලර් මිලියන 86 ක් පමණ වුණි. එදා ඇමෙරිකානු

---

**2004.07.11 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙයි පළවූ ලිපියකි.**

ඩොලරයක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 4.76 ක් පමණය. වසර තුළ අපනයනවල වටිනාකම රුපියල් මිලියන 241 කින් වැඩිවූ අතර, ආනයනයවල අගය රුපියල් 7 මිලියන 211 කින් අඩු වුණි. ඒ තුළින්, අය වැය පරතරය අඩුකර ගැනීමට රජය සමත් වුණි. ඒ අතරම, 1954 දී කොළඹ පාරිභෝගික මිල දර්ශක අගය, 1953 අගයට වඩා 0.5% කින් අඩුවුනි. නියම වේතන (Real wages) පෙර වසරට සාපේක්ෂව 2.5% කින් වැඩිවුණි. වර්ෂයේ අය වැය අතිරික්තයක් (Budget surplus) ඇති වූ නිසා, රාජ්‍ය ණය (Public debt) රුපියල් මිලියන 91 කින් අඩුවීමෙන් 1954 වර්ෂය අවසානය වන විට, රාජ්‍ය ණය රුපියල් මිලියන 885 ක් දක්වා පහත වැටුණි. භාණ්ඩාගාර බිල්පත්වල පොළී අනුපාතය වසරේ මාස හයක කාලයකදී 2.5% ක් පමණ පැවතුණද, වර්ෂයේ අග භාගය වන විට, 0.85% තෙක් අඩුවුණි. ඒ හරහා බැංකු අනුපාතය (Bank rate) 2.5% ක අගයක පමණ පැවතුණු අතර, ඊට සාපේක්ෂව වාණිජ බැංකු තම ගණුදෙනුකරුවන්ට ණය ලබා දීමේදී අයකරගත් පොළී අනුපාතය බෙහෙවින් අඩුවිය. ඒ අතර, වසරේ ජාතික ආදායම, පෙර වසරට වඩා 5% ක වර්ධනයක් දැක්වූයේය. විරැකියාව මුලු වැඩකරන පුද්ගලයින් සංඛ්‍යාවෙන්, 6.6% ක් බවට අඩු විය.

ඉහත කී දත්ත විදහා දක්වන්නේ ස්ථාවර, ශක්තිමත් ආර්ථිකයකි. එසේ නම්, වසර 50 කට පසු, අකමැත්තෙන් වුවද අපට පිළිගැනීමට සිදුවන්නේ එදා සිට අද වන විට, අප රට ආර්ථිකව ඉතා පහළ තත්ත්වයකට ඇද වැටී ඇති බවය. එපමණක් නොව, එම තත්ත්වයෙන් ඉක්මණින්ම මිදෙනු වෙනුවට, අද සිදුකෙරෙන සමහර ක්‍රියාවලියන් තව දුරටත් අප රටේ ආර්ථිකය පරිහානියට භාජනය කරනු මිස, නංවාලීමකට නම් තුඩු දෙන බවක් නොපෙනේ.

2004 දී, ලෝක ආර්ථිකය දැනට වසර 50 කට පෙර තිබූ තත්ත්වයට වඩා බෙහෙවින් සංකීර්ණ සහ වෙනස් බව අප අවිවාදයෙන්ම පිළිගනිමු. එහෙත් ඉකුත් කාලය තුලදී රටක ආර්ථිකයක්, ස්ථාවර ලෙස නංවාලීමට රජයක් අනුගමනය කළ යුතු ගුණාත්මක සිද්ධාන්ත සහ සාධකවල වැඩි වෙනසක් ඇති වී

නැත. සාර්ථක රටවල් විසින් පිළිපදින ලද ක්‍රියාවලියන් සලකා බැලුවොත් අපට අවබෝධ කරගත හැක්කේ, ඔවුන්ගේ ආර්ථික සැළසුම් සහ ක්‍රියාවලින් හි මූලික පදනම වී ඇත්තේ මූල්‍ය විනය. (Financial discipline) කාර්යක්ෂමතාවය (Productivity) සහ සාර්ව ආර්ථික සාධකවල (macro-economic factors) ගුණාත්මකභාවය රැකගැනීම බවය.

වර්තමානයේ මුලු ලෝකයේම පැතිර ඇති ගෝලියකරණයට රටවල් ගොදුරු වන යුගයක, කිසිම රටකට තම ආර්ථිකය හුදකලාව ශක්තිමත් කරගැනීමට නොහැකිය. විවිධාකාර බලපෑම්වලට භාජනය වීම තුළින් පැණ නගින තර්ජන, අවස්ථා බවට පරිවර්තනය කර ගනිමින්, තම ආර්ථිකයන් සූක්ෂමව හසුරවා ගැනීම, යුගයේ අවශ්‍යතාවයය. එවැනි ක්‍රියාවලියක් අඛණ්ඩව කරගෙන යෑමට නම්, ආර්ථිකයට අනුබලයක් වන යටිතල පහසුකම් වර්ධනය කර ගනිමින්, ආර්ථිකය කෙරෙහි ඇති ජාත්‍යන්තර විශ්වාසය ක්‍රමානුකූලව නංවා ගැනීමේ ප්‍රයත්නයන් අත්‍යවශ්‍යය. රටක ආර්ථිකයක් හරියාකාරව කළමණාකරණය කිරීම, රජයක විශේෂ යුතුකමක් ලෙස විශේෂඥයින් හඳුන්වති. ඒ අතරම, සියලුම ජන කොටස් වලට ආර්ථික ප්‍රතිඵල සහ ප්‍රතිපාදන ඉක්මණින් සහ සාධාරණව සේන්දු වන ලෙසද ආර්ථික ව්‍යුහය සකස් කර ගැනීම රජයේ තවත් විශේෂ යුතුකමකි.

පුරා වසර 50ක් තිස්සේ ශ්‍රී ලංකාවේ බොහෝ රජයන් දේශපාලනික පටු වාසින් අත්කර දෙන නමුත් ආර්ථිකයට අහිතකර විපාක ලබාදෙන කටයුතු වලට යොමු වීම මහත් කණගාටුවට කරුණකි. එවැනි අවස්ථාවාදී පරමාර්ථ හරහා ක්‍රියා කිරීමෙන්, කෙටි කාලීන දේශපාලනික වාසි ලබා ගත හැකි වුවද, ඒවා තුළින් රටේ ආර්ථික දිගු කාලීන පැවැත්මට සහ වර්ධනයට ඉසිලිය නොහැකි තරමේ දරුණු පහර එල්ල වී ඇත. එසේ නම්, ඉදිරියේදිවත් ශ්‍රී ලංකාව වැටී ඇති මෙම අවාසනාවන්ත සහ ලැජ්ජා සහගත තත්ත්වයෙන් ගැලවී, වඩාත් වගකීමකින් සහ දිගුකාලීන දැක්මකින් කටයුතු කිරීමට නම්, මනා ආර්ථික අවබෝධයක් පමණක් නොසෑහේ. දේශපාලනිකව තරමක් අවාසි වුවත්, ආර්ථිකයට හිතකර ලෙස කටයුතු කිරීමට දැඩි දේශපාලනික කැපවීමක්ද,

එවැනි හිතකර ප්‍රතිපත්ති මත දිගින් දිගටම රැඳී සිටීමට ශක්තියක් සහ ධෛර්යයක්ද, අප නායකයින් බිහිකර ගැනීම, එවැනි පුනර්ජීවනයකට අවශ්‍ය වන්නේය.

රටට හිතකර, දිගුකාලීන සහ පුළුල් ක්‍රියාමාර්ග ප්‍රායෝගිකව දියත් කරන්නට නම් රජය සහ විපක්ෂය, රටේ ඉදිරි ආර්ථික ගමන් මාර්ගය ගැන යම් එකගත්වයකට එළඹිය යුතුය. ඒ සඳහා සාකච්ඡාවේ යෙදෙමින්, ජාතික ප්‍රතිපත්ති සකස් කර ගත යුතුය. රටේ ආර්ථිකය දේශපාලනික කෙළිබිමක් කර නොගනිමින් සියලුම අදාළ පාර්ශවයන් එම කාර්යයයේ අවංකව නිරත විය යුතුය. රටේ අවශ්‍යතාවය මෙය වුවද, අද රටේ පවතින අර්බුදකාරී දේශපාලනික තත්ත්වය දෙස අපගේ සිත් යොමු කරන විට, අපට පැහැදිලි වන්නේ එවැනි එකගත්වයක් සිදුවීම බොහෝ දුරට සිහිනයක් පමණක් වන බවය, එවැනි ආවාසනාවන්ත වාතාවරණයක අනිවාර්යයෙන්ම සිදුවනුයේ 2054 දී 1954 ට සහ 2004 ට සාපේක්ෂව එවකට ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව පසු විපරම් කරද්දී, එසේ විග්‍රහ කරන අය අන්ත කම්පාවට පත්වීම නොවේද?

# 1.2

# ආර්ථිකය ප්‍රාණවත් කිරීමට විශේෂ 'තල්ලුවක්'

ප්‍රධාන අවයව රැසක්ම ඉතා භයානක ලෙස හානියට පත්වී හුස්ම පොදක් ගැනීමට වෙර දෙමින් ශල්‍යාගාරයේ මේසය මත සිටින රෝගියෙකුට අපගේ ආර්ථිකය සමාන කළ හැකිය. ඒ අතරම, එම රෝගියාට ප්‍රතිකාර කිරීමට බලාපොරොත්තු වන වෛද්‍යවරයා අත ඇත්තේ ඉතා අබලන් තත්ත්වයේ පවතින උපකරණ සහ අවශ්‍ය ඖෂධ නොමැති ශල්‍යාගාරයකි. තත්ත්වය මෙසේ තිබියදී රෝගියා ජීවත් කරවීම සඳහා ප්‍රමාණවත් ඔක්සිජන් සැපයුමක් ලබා දීමට ද, ලේ ගැලීම නැවතීමටද, ඉතා දරුණු ලෙස හානි වු අවයව යථා තත්ත්වයට පත් කිරීමටද යන සියල්ලම එකවිටම වාගේ කිරීමට වෛද්‍යවරයාට සහ ඔහුගේ කණ්ඩායමට සිදු වී තිබේ.

2001 වසරේදී දළ දේශීය නිෂ්පාදිතය සංකෝචනය වු අපේ ආර්ථිකයට වහාම ජීවය ලබා දීමට රජයට සිදුවුණි. එසේ කරන අතරම, දේශීය මෙන්ම විදේශීය ආයෝජකයන් අතර අපේ ආර්ථිකය කෙරෙහි දිගු කාලීන උනන්දුවක් ඇති කිරීම සඳහා විශ්වාසය ගොඩ නැගීමේ ක්‍රියාමාර්ග කිහිපයක් ගැනීමට ද රජයට සිදුවුනි. ඉන් පසුව, රටට නව කර්මාන්ත හඳුන්වා දීමටත්, නවෝත්පාදක සංවර්ධන උපාය මාර්ග ආරම්භ කිරීමටත්, ඒ ප්‍රයත්නයන් කාලයක් පවත්වාගෙන යාමත් අත්‍යවශ්‍ය වුනි.

පසුගිය වසර පහළොවක පමණ අතීතය දෙස බලනවිට, අද අපේ රටේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරයක් බවට පත් වී ඇති ඇගලුම් කර්මාන්තය අතීතයේ අප රටේ තිබුණේ ඉතා සුලු ලෙස බව අපට පෙනෙනු ඇත. එසේ නම් වසර 2000 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 2 ක කර්මාන්තයක් බවට එය පත් වුයේ

---

**2003.07.13 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවු ලිපියකි.**

කෙසේද? කම්හල් දෙක තුනක් පමණක් තිබූ කර්මාන්තයක්, අද වන විට පුද්ගලයින් දශ ලක්ෂයකට පමණ රැකියා සපයන, රටේ මුලු කාර්මික අපනයනවලින් 60% කට පමණ වගකියන, ජාත්‍යන්තර තරගකාරීත්වයට මුහුණ දීමට සමත්, ශ්‍රී ලංකාවේ සමස්ත කම්හල් සංඛ්‍යාවට ඇඟලුම් කම්හල් 891 ක් එකතු කළ ව්‍යාපාරයක් බවට එබඳු කෙටි කාලයක දී පත්වුයේ කෙසේද? මේ සුවිශේෂ පරිවර්තනය සිදු වුයේ මැජික් (Magic) බලයකින් නම් නොවන බව පැහැදිලිය. එය සිදු වුයේ එවකට ජනාධිපතිව සිටි රණසිංහ ප්‍රේමදාස මහතාද, කර්මාන්ත අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති ලක්ෂමන් වටවල මහතා ද, ඔවුන්ගේ කණ්ඩායමද කර්මාන්තයන් ආරම්භක අවදියේ දී, ඒවා ඉතා සැලකිල්ලෙන් පෝෂණය කරමින්, ඒවා ස්ථාවරව හා කඩිනම්ව වර්ධනය කිරීමට අවශ්‍ය හැම යටිතල පහසුකමක් සහ උපකාරයක්ම ඒවාට ලබාදීමෙන්ය. අද අප සැබැවින්ම කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳව ඉගියක් අපට එම සිදුවීමෙන් ලබා ගත හැක.

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය වසර 2002 දී 4% ක් යැයි ශ්‍රී ලංකා මහ බැංකුව පවසා ඇත. වර්තමාන ලෝක ආර්ථික පසුබිම සහ රටේ ඇති තත්ත්වය සලකන විට එය යම් තරමින් වත් යහපත් එකක් යැයි මම විශ්වාස කරමි. කෙසේ වුවද, අප දැනට හිරවී සිටින ආර්ථික විලංගුවෙන් මිදීමට නම්, නොකඩවා ඊළඟ වසර 10 තුළ වසරකට 9-10% බැගින් වූ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතයක් ශ්‍රී ලංකාව පවත්වාගෙන යා යුතුය. පවුල් 21 ලක්ෂයක් (පුද්ගලයින් 90 ලක්ෂයක් පමණ) අද සමෘද්ධි ප්‍රතිලාභ ලබති. එයින් පෙනෙන්නේ අපේ දිළිඳු ජනයා සාපේක්ෂ වශයෙන් වඩ වඩා දුප්පත් වෙමින් සිටින අතර, අපේ කෘෂිකර්ම හා ධීවර පදනම සාපේක්ෂ වශයෙන් දුර්වල වන බවය. කුමන කෝණයකින් බැලුවත් මේවා පිළිගත නොහැකි සමාජීය සාධක වන නිසා එම තත්ත්වයන් වහාම නිවැරදි කරගත යුතුය.

එසේ කිරීමට නම් අපේ ආර්ථිකයට විශේෂ සහ හදිසි 'තල්ලුවක්' (Kickstart) අවශ්‍යය. අපේ ආර්ථිකයට 'තල්ලුවක' දී පණ

ගැන්වීමට නම් අප ආරම්භ කළ යුතු විශේෂිත ක්‍රියා මාර්ග කිහිපයක් දැන් සලකා බලමු. ඇත්තෙන්ම ඉන් පළමු වැන්න වන්නේ ලැබිය යුතු ප්‍රමුඛතාව දැන් ලැබී තිබෙන, සාම ප්‍රයත්නය ය. එය සාර්ථක මාර්ගයකට අවතීර්ණ වීම ඉතා විශාල ජයග්‍රහණයකි. එහෙත් එය දුෂ්කරතාවලින් ගහන වූත්, අපහසු වූත් දිගු ගමනකි. ඒ මාර්ගයේ යා යුත්තේ ඉවසීමෙන් හා අවබෝධයකින් යුතුව ය. ජාතියක් වශයෙන් මේ මාවතේ ඉදිරියට ම යාමේ ධෛර්යය හා ඉවසිල්ල අපට තිබිය යුතුය. ඊළඟ වැදගත් කාර්යය වන්නේ අපේ ආර්ථිකයට නව කර්මාන්ත හා අංශ හඳුන්වා දීමය. වර්තමාන රජයේ 2001 මැතිවරණ ප්‍රකාශනයේ නව ක්‍රියාමාර්ග කිහිපයක් ම පැහැදිලිව හඳුනාගනු ලැබ ඇති අතර රජය හැකි ඉක්මනින් ඒවා ආරම්භ කරනු ඇතැයි මම උදක් ම බලාපොරොත්තු වෙමි. ආර්ථිකයට 'තල්ලුවක්' දී පණ ගැන්වීම සඳහා සාර්ථකව ආරම්භ කළ හැකි කල්වේලා ඇතිව සූදානම් වී ඇති ප්‍රධාන ව්‍යාපෘති හා කර්මාන්ත තුනක් තිබේ යයි මම විශ්වාස කරමි.

ඉන් පළමුවැන්න හම්බන්තොට වරාය සහ ඊට සම්බන්ධ යටිතල ව්‍යුහයන් ඉදිකිරීම ය. දෙවැන්න අති විශාල ගෝලීයකරණය වූ බුද්ධි ආර්ථිකයට සම්බන්ධ වීමය. තුන්වැන්න ඉන්දියන් සාගරයේ සුවිශේෂ ආර්ථික කලාපයේ සම්පත් ප්‍රයෝජනයට ගැනීම ය. මගේ අදහස නම් මේ ව්‍යාපෘති තුන සඳහා බෙහෙවින් නිපුණත්වයක් ඇති ක්‍රියාශීලි කැබිනට් අමාත්‍යවරුන් තිදෙනෙකුගේ පූර්ණ කාලීන අවධානය යොමු විය යුතුය. මහවැලි ව්‍යාපාරයේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා, අමාත්‍ය ගාමිණී දිසානායක මහතාට වගකීම පැවරූ ආකාරයටම මෙම අමාත්‍යවරුන්ගේ කාර්ය විය යුත්තේ මෙම විශේෂ ව්‍යාපෘති තුන සාර්ථකව හසුරුවීමෙන් ඒවා ක්‍රියාවට ලක් කිරීමය. ඒවා ගැන නිරන්තරයෙන්ම කථා කරනවා වෙනුවට, ඒවා ක්‍රියාවට පරිවර්තනය කොට ඒවායේ ප්‍රතිඵල ආර්ථිකයට ලබාදීමට ඔවුන් කටයුතු කළ යුතුය. එය සිදුවූ විට, පසුගිය වසර පහළොව තුළ ඇඟලුම් කර්මාන්තය තුළින් ආර්ථිකයට සිදුවූ පිබිදීමට වඩා විශාල විශ්වාස නොකළ හැකි තරමේ ආර්ථික ප්‍රාතිහාර්යයක් මේ රටට ලබා ගත හැක.

# 1.3

## ආර්ථිකයට අවශ්‍ය ශ්‍රම බලකායක් බිහි කරමු

අප රටේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය නොමිලේ දෙනු ලැබේ යැයි අපේ මතයයි. කෙසේ වුවද, මේ ප්‍රකාශය සැලකිල්ලෙන් අධ්‍යයනය කළහොත් අපට පැහැදිලි වන්නේ මේ 'නිදහස' අධ්‍යාපනයේ සමාජ පිරිවැය ඉතා ඉහළ බවත්, එය ලබාගත හැකි වන්නේ ද්විතිය අධ්‍යාපනය ලබාගත් පසු තෘතිය අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාල වලට ඇතුළත් වන අය 2% කටත් අඩු පිරිසකට පමණක් බවත්ය. එසේ නම් ඉතිරි 98% ට සිදුවන්නේ කුමක්ද?

විශ්ව විද්‍යාලවලට ඇතුල් නොවන 98% ක පිරිස ඇතුළත් වන 2% තරම් ම දක්ෂ නොවන්නට පුලුවන. එසේනම් එම 98% ට තෘතිය අධ්‍යාපනය නොමිලේ ලබා දීම වඩාත් අවශ්‍ය වේ යැයි යමෙකුට තර්ක කළ හැකිය. එබැවින්, අපේ තරුණ තරුණියන්ට සමාන ඉඩ ප්‍රස්ථා සලසනු පිණිසත්, සැම ජන කොටසකටම අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා සම කරනු පිණිසත් ද්විතිය අධ්‍යාපනය සම්පූර්ණ කරන සියලුම දෙනාට තෘතිය මට්ටමේ අධ්‍යාපනය නොමිලේ ලබා දීම සඳහා ප්‍රවේශයක් ඇතිකිරීම සැබැවින් ම රජයක වගකීමකි.

එවැනි වගකීමක් සපුරාලන්නේ කෙසේදැයි සැලකීමේදී අපට පෙනෙන එක් අංගයක් නම් කායික ශ්‍රමය අවශ්‍ය වන සමහර ආකාරයේ කාර්යයන් අප විසින් තවමත් පහත් කොට සළකන බවයි. සමහර විට අද මේ සංකල්පය පවතින්නේ, අනෙක් අයට වඩා යම් යම් කාණ්ඩ වල රැකියා කරන්නන් අඩු වැදගත් කමක් ඇති අය වශයෙන් සමාජය සළකන නිසා විය හැකිය.

හෝටල් ව්‍යාපාරය, ආයතන ගත වීමට පෙර සහ හෝටල් ව්‍යාපාරයත් ඒ හා ආශ්‍රිත කාර්යයන්ටත් නව සමාජීය පිළිගැනීමක්

---

2003.08.10 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

ලැබීමට පෙර වසර 30කට පමණ උඩදී, අරක්කැමියන්, වේටර්වරුන්, පිළිගැනීමේ නිලධාරීන් ආදීන්ගේ කාර්යය බොහෝ දෙනා විසින් සළකන ලද්දේ පහත් පෙළේ රැකියා වශයෙනි. එහෙත්, පිළිගත් ආයතන වලින් විශේෂිත නිපුණතා පිළිබඳ සහතික නිකුත් කිරීම ආරම්භ කරනු ලැබීමත් සමගම එකී වෘත්තීන් සඳහා ව්‍යුහගත අධ්‍යාපනය හා පුහුණුව ලබාදෙන විධිමත් හෝටල් පාසලක් පිහිටවනු ලැබීමෙන් පසු මේ රැකියා වල තත්ත්වය සැළකිය යුතු පරිවර්තනයකට භාජනය විය. එබඳු රාජකාරීන් පහත් ඒවා ලෙස අඩුවෙන් සැළකීමක් හෝ ඒ කාර්යයන් නුගත් හෝ අඩු වරප්‍රසාද ලත් අයට සීමා වූ රැකියා ලෙස සැලකීමක් හෝ තවදුරටත් සිදු නොවීය. එසේම එබඳු රැකියා සමාජයේ පිළිගැනීමක් ඇති රැකියා බවට පත්විය.

අප එසේ කරන්නේ නම්, විධිමත් ලෙස අධ්‍යාපනයක් ලත් වෘත්තිය වශයෙන් පුහුණු වූ සහතික ලත් පෙදරේරුවන්, වඩුවන්, විදුලි කාර්මිකයන්, නැවියන්, ගෘහ සේවිකාවන්, අතුරු වෛද්‍ය වෘත්තිකයින්, පයිප්ප වැඩකරුවන්, පෞද්ගලික බස් අයිතිකරුවන් ධාවනය කරන්නන්, විශ්‍රාම ශාලා පවත්වාගෙන යන්නන්, ඇඳුම් මසන්නන්, එළවලු වෙළෙන්දන්, සාප්පු හිමියන්, සංචාරක මාර්ගෝපදේශකයින් ආදීන් බිහි කිරීමේ පළමු පියවර ගැනීමට අපට හැකි වනු ඇත.

මෙවැනි ක්‍රමයක දී, තමන් තෝරා ගන්නා වෘත්තීන්හි භෞතික අංග සම්බන්ධයෙන් පමණක් නොව, තනි පුද්ගලයකු සතු ව්‍යාපාරයක් මෙහෙය වන්නේ කෙසේද, වඩා ඵලදායී විය හැක්කේ කෙසේද, තමාට සහාය වීම සඳහා ආධුනික වෘත්තිකයකු සේවයේ යොදවන්නේ කෙසේද, සිය සේවාවන් අලෙවි කරන්නේ කෙසේද, බැංකු ණයක් ලබා ගන්නේ සහ ගෙවන්නේ කෙසේද, යන කරුණු ඇතුළු පාඨමාලාවක් හරහා ඔවුනට අධ්‍යාපනයක් ලබා දිය යුතුය. තමන්ගේම වෘත්තිය සංවිධානය පිහිටුවා ගැනීමට එසේ සුදුසුකම් ලබන පුද්ගලයින් පසුව දිරි ගැන්වෙනු ඇති අතර තමන්ගේම අනාගත පශ්චාත් සුදුසුකම් ලැබීමේ පුහුණුව මෙහෙයවීමටත් ඔවුන්ට හා ඔවුන්ගේ වෘත්තීන් හි පොදු ගැටලු නිරාකරණය කර ගැනීමට කටයුතු කිරීමටත්, එබඳු සංවිධාන

වල සාමාජිකයින්ට හැකිවනු ඇත. ඊට අමතරව, සුදුසුකම් ලත් සහ ඒ බවට සහතික ලත් එබඳු අය බැංකුවෙන් ණය ලබා ගැනීමට සුදුසු අය ලෙස බැංකුව සලකනවා ඇත. එසේම, සිය වෘත්තියට අවශ්‍ය මෙවලම් හා උපකරණ ලබා ගැනීම සඳහා බැංකු ණය පහසුකම් ලබා ගැනීමට ද එසේ සුදුසුකම් සහ සහතික ලත් පුද්ගලයින්ට ඉඩ ලැබෙනු ඇත.

දැනට ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන එක් අවාසනාවන්ත යථාර්ථයක් වන්නේ තමන්ගේම ව්‍යාපාර අරඹන අය, සිය මෙහෙයුම් ආරම්භ කොට කෙටි කාලයකින් ම අසාර්ථක වීම ය. බොහෝ විට එසේ වන්නේ නිපුණත්වයෙන් හෝ වෘත්තිකත්වයෙන් යුතුව මේ නව ව්‍යාපාරය කළමණාකරණය කිරීමට ඔවුන් අසමත් වීමය. සිය ව්‍යාපාර සහ එහි සංකීර්ණතා පිළිබඳ හොඳ අදහස් ඔවුන් සතුව තිබුණද, කළමනාකරණය, මූල්‍ය පාලනය, මානව සම්පත් කලමනාකරණය සහ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ අනෙකුත් මූලික නිපුණතා පිළිබඳ ඔවුන්ට සාමාන්‍යයෙන් ඇත්තේ ඉතා සුලු දැනීමක් පමණකි. ඒ නිසා, මෙහෙයුම් කටයුතු කිරීමේ දී ගැටලු හෝ සංකීර්ණතා මතුවන විට ඒවාට සාර්ථකව මුහුණ දී ඒවා නිරාකරණය කර ගැනීමට නව ව්‍යවසායකයින් බොහෝ දෙනෙකුට නිපුණතාවක් නැති වීම ස්වාභාවිකය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේ දී ඒ ගැටලු, නව ව්‍යවසායකයින් අභිබවා ගොස් කෙටි කාලයකදී ඔවුන්ගේ ව්‍යාපාර කඩා වැටීමට තුඩු දේ. කළමනාකරණය සම්බන්ධ ගැටලුවලට සහ නිපුණතාවන්ට අදාළ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දීමෙන්, රටේ ශ්‍රම බලකායේ සහ ආර්ථික සැකැස්මේ පවතින මූලික ඌණතාවක් නිරාකරණය කර ගත හැකි වනු ඇත. මෙවැනි වැඩ පිළිවෙලක් වහාම සකස් කොට දියත් කිරීම රජයේ, පෞද්ගලික අංශයේ සහ බැංකුවල විශේෂ වගකීමක් ලෙස මම දකිමි.

# 1.4

## බුද්ධි ආර්ථිකයට අප සම්බන්ධ වීමට නම්...

ආර්ථිකයට අප රට සම්බන්ධ කිරීමේ වාසි වර්ණනා කරමින් අපගේ ප්‍රතිපත්ති සම්පාදකයින්, ව්‍යාපාරික නායකයන් සහ දේශපාලඥයන් බෙහෙවින් සිත් ගන්නා සුලු විචිත්‍ර ප්‍රකාශ බොහෝ විට අපට ඉදිරිපත් කර ඇත. ඒ සඳහා සැලසුම්, පත්‍රිකා, සම්මන්ත්‍රණ, සමුලු සහ ලිපි සංඛ්‍යාව නිමක් නැත. එහෙත් කණගාටුවට කරුණක් වන්නේ ශ්‍රී ලංකාව බුද්ධි ආර්ථිකයට 'ඵලදායි ලෙස' සම්බන්ධ කිරීම උදෙසා දැනෙන සහ පැහැදිලි ක්‍රියාකාරීත්වයන් ගෙන් තොර ඒ ප්‍රශංසනීය අරමුණු හුදෙක් අපේක්ෂාවන් පමණක් වී තිබීමය. කෙසේ වුවත්, එම අරමුණ ඉෂ්ට කර ගැනීමට අපට තවමත් කාලය තිබෙන අතර රජයත්, අධ්‍යාපන අංශයත්, පෞද්ගලික අංශයත් මේ අභියෝගය වගකීමකින් භාර ගන්නේ නම් මේ අවස්ථාවට ප්‍රතිචාර දැක්වීමට අපට හැකි වනු ඇත.

වසර 2002 දී, විද්‍යුත්වාණිජ කටයුතු හරහා ලැබූ වාර්ෂික ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 1000 ක් පමණ ලෙස ගණනය කොට ඇත. ඒ අනුව, ලෝක විද්‍යුත් වාණිජ වෙළඳාමෙන් 1% කින් දහයෙන් පංගුවක් තරම් ඉතා සුලු කොටසක්වත් ලබා ගැනීමට අපට හැකි වුවහොත්, එහි වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 1000 ක ඉලක්කයකි. එබඳු වෙළඳ හා වාණිජ කටයුතු හරහා අප රටේ ආර්ථිකය කෙරෙහි කොතරම් විශාල බලපෑමක් කරනු ඇත්දැයි ඕනෑම කෙනෙකුට වැටහෙනවා ඇත. එම වෙළඳ හා වාණිජ කටයුතු සියල්ලම 'ලාභය' නොවෙන බව සත්‍යයය. එහෙත් ලෝක ආර්ථිකයට ප්‍රවේශ වීමේ ප්‍රතිලාභ අපේ දේශීය ව්‍යාපාරවලට හා ව්‍යවසායකයින්ට ලැබෙන පරිදි නිදහස් වෙළඳ හා වාණිජ කටයුතු වලට දොර ඇරීමක් සිදුවුවහොත් එය අපේ ආර්ථිකයට මහත් සේ වාසිදායක ද

---

**2003.08.24 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

ඵලදායි ද වනු ඇත. එසේ නම් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කුමක් කළ යුතු දැයි සලකා බලමු.

පළමුව, මේ නව දැනුම් යුගයට ගැලපෙන පරිදි, පොදු අධ්‍යාපන ක්‍රමයට අවශ්‍ය වෙනස්කම් කිහිපයක් හඳුන්වා දිය යුතුය. අවාසනාවකට මෙන් දැනුම් ආර්ථිකය තුළ ලබාගැනීමට ඇති රැකියා සහ ඉඩ ප්‍රස්තා සඳහා අපේ දරුවන් සූදානම් කිරීමට, අපේ පාසල් තවමත් හැඩ ගැසී නැත. අපගේ රටවැසියන් බොහෝදෙනා නියැලී සිටින කාර්මික යුගයේ රැකියා සහ 'අතින් කරන වැඩ', අද ලෝක රැකියා වෙළඳපොළේ පහළ මට්ටමක පවතින අතර සමහර විට ඒවා ලෝකයේ අඩුම වැටුප් ලැබෙන රැකියා බවටද පත්වී ඇත. නව යුගයේ අවශ්‍යතාව වන්නේ වඩා ස්වාධීන සහ දක්ෂතාවෙන් යුත් හුදෙක් කම්හලක යන්ත්‍රයක කොටසක් පමණක් නොවන 'දැනුම් වැඩකරුවෙකි'. එබඳු පුද්ගලයෙකුට යම් විෂයක් විශේෂයෙන් උගන්වනු නොලැබුවද, තමා විසින් ම 'ඉගෙන ගැනීමේ' හැකියාවක් සතු ඇත්තකු වනු ඇත. දැනුම් යුගයේ දී, සමාගම් මගින් මිනිසුන් සේවයේ යොදවන්නේ ඔවුන්ගේ කායික හැකියාව නිසා නොව ඔවුන් සතු දැනුම නිසාය. තාක්ෂණයේ සහ දැනුම භාවිතයෙන් කලින් ලබා ගත් ඵලදාවට වැඩි ඵලදාවක් ලබා ගත හැකි වන පරිදි තමා දැනුම්වැඩකරුවකු බවට පත්වීමට ගොවියෙකුට පවා හැකි වනු ඇත. එබඳු අධ්‍යාපන මට්ටමක් ළඟා කර ගැනීම සඳහා නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය සහ පර්යේෂණ හැකියාව කෙරෙහි අවධානය යොමු කරන, පුද්ගලයින් කෙරෙහි යොමු වූ අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම අත්‍යාවශ්‍යය.

දෙවනුව, 'දැනුම් වැඩකරුවන්' නව නිපුණතා ඉල්ලුම් කරන ලෝකයේ, නව ක්‍රියාකාරීත්වයන් අප රට තුළ පුළුල් වශයෙන් ප්‍රචාරය කළ යුතුය. මේවාට ඇතුලත් වන ක්ෂේත්‍ර වන්නේ විදුලි සංදේශ, මෘදුකාංග සංවර්ධනය, දත්ත විශ්ලේෂණය, ලේඛණාගාර හා දත්ත සමුදානයන් පවත්වාගෙන යාම, පරිගණකය සහයෙන් කෙරෙන සැලසුම්, අධ්‍යයන සිතියම් ගත කිරීම, දුරස්ත අධ්‍යාපනය, සංකල්පනය, ප්‍රචාරණය, අධි තාක්ෂණ ආරක්ෂක පද්ධති, ජෛව තාක්ෂණය, පරිගණක චිත්‍රකල පරිගණක ක්‍රීඩා, සංගීතය සහ කලාව ආශ්‍රිත ක්‍රියාකාරීත්වයන්, චිත්‍රපටකරණය, අන්තර්ජාලය

පදනම් කරගත් වෙළඳාම, දත්ත නිවේශන මෙහෙයුම්, ක්‍රීඩා ආශ්‍රිත ක්‍රියාකාරිත්වයන් ආදිය ය. අප හොඳින් දන්නා පරිදි මේ වර්ගයේ 'නව' ක්‍රියාකාරිත්වයන් හිදී ශ්‍රී ලංකාවේ හිඳිමින් ලෝකයේ වෙනත් ප්‍රදේශයක ගණුදෙනු කරුවෙකුට සේවා සලසන අතරම, ගෝලීය සයිබර් ගම්මානයේ වෙනත් කොටසක අදාළ ක්‍රියාකාරිත්වයේ යෙදීමට 'දැනුම් වැඩකරුවෙකුට' හැකියාව ලැබේ.

තෙවනුව, දැනට තර්ජනයට ලක්වී ඇති 'කාර්මීකරණ යුගයේ' කර්මාන්ත ප්‍රතිව්‍යුහගතකිරීමට සහ දැනුම පදනම් කරගත් නවෝත්පාදනයන් ග්‍රහණය කර ගැනීමෙන් ඒවායේ හැකියාවන් වර්ධනය කිරීමට හා ඒ කර්මාන්ත දිරි ගැන්වීමට උපකාරී වීම සඳහා ක්ෂණික පියවර ගත යුතුය.

සිව් වනුව, දැනුම් යුගයට සම්බන්ධ නව ජීවන රටාවට පරිවර්තනය වීම සඳහා අපගේ තිබෙන ශ්‍රම බලකායට උපකාර කළ යුතුය. මෙය කළ යුතුව ඇත්තේ දැනට ඌණ සේවා වියුක්ත පුද්ගලයින්ට නව දැනුම් යුගයට ගැලපෙන පරිදි 'නැවත පුහුණුව' සහ/හෝ 'නැවත අධ්‍යාපනය' ලබා ගැනීමට උපකාරී වීමෙනි. නව ලෝකයේ අවශ්‍ය වන්නේ නව ප්‍රතිමානයන් (norms) සහ ප්‍රමිතින්ය. 'කාර්යය' හෝ 'රැකියාව' යන්නෙහි පැරණි නිර්වචනය පවා දැන් අභියෝගයට ලක් වෙමින් තිබෙන නිසා අද හැම දෙනාටම ලබාගත හැකි ලෝක ගම්මානයේ නව රැකියා භාරගැනීමට අවශ්‍ය පුහුණුව ජනතාවට ලබා දිය යුතු අතර ඒ පිළිබඳ විශ්වාසයක් ද ඔවුන් තුළ ගොඩ නැංවිය යුතුය.

පස්වනුව, දැනුම් ආර්ථිකයට බද්ද කිරීම සඳහා අපගේ තරුණ පරම්පරාව වහාම පුහුණු කළ යුතු අතර ඊට පූර්ණ අවශ්‍යතාවක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීනත්වයක් ලබා ගැනීම සඳහා ඔවුන්ට කඩිනමින් උපකාර කළ යුතු ය. අනාගත දැනුම් වැඩකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් හොඳින් අදහස් ප්‍රකාශ කිරීමට හැකි විය යුතුය. එසේ නම්, ඔවුන් ප්‍රමාණවත් පරිදි සන්නද්ධ කිරීම සඳහා ඉංග්‍රීසි අධ්‍යාපනයක් ඔවුන්ට ලබා දිය යුතුය. මෙය කඩිනමින් කළ හැකි එක් ක්‍රමයක් නම් අප රටේ හැම පාසැලකම අඩුතරමින් එක් පන්ති කාමරයකටවත් රූපවාහිනී යන්ත්‍රය බැගින් ලබා දීමෙන් ඒ තුළින් විශිෂ්ට ඉංග්‍රීසි ඉගැන්වීමේ වැඩ පිළිවෙළක් වහාම දියත් කිරීමය.

# 1.5

## වැඩෙන ආදායම් පරතරය භයානකය

මෑතක සිට ශ්‍රී ලංකාවේ ඉහල තලයේ පවතින ව්‍යාපාර සියල්ලම පාහේ අති විශිෂ්ට ව්‍යාපාරික වර්ධන ලබාගෙන ඇති බවට වාර්තා දිනෙන් දිනෙම පහල වනු ඇත. කොළඹ කොටස් වෙළෙඳපොලේ මිල දර්ශකය පුදුමාකාර ලෙස ඉහළ නගිමින් පවති. නව ව්‍යාපාර පටන් ගැනිමට ආයෝජකයින් ප්‍රයත්නයන් දරණ බව පෙනේ. විදේශ රටවලින් සහ සමාගම් වලින් ආයෝජන අප රටට ගලා ඒමේ ලකුණු අද පෙනෙන්නට ඇත. ඒ අතරම, අප රටේ ප්‍රධානතම සමාගම් වල සභාපතිවරුන් තමන්ගේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරද්දී පුන පුනා කියා සිටින්නේ එම සමාගම් වල පුදුමාකාර ප්‍රගතියට රටේ පවත්නා සාම වාතාවරණය විශාල ලෙස දායක වී ඇති බවය. ඔවුන්ගේ ව්‍යාපාරික ජයග්‍රහනයේ පදනම සාමය යැයි ඔවුහු සෘජුවම පවසති. ඒ අය තව දුරටත් ඉතා සන්තෝෂයෙන් පවසන්නේ තමන්ට මෙම සාමයේ වාසි සහ සාමයේ ලාභාංශය භුක්ති විඳීමට සහ එල නෙලා ගැනීමට දැන් අවකාශය ලැබී ඇති බවය. මෙම තත්ත්වය තුළින් අපට පැහැදිලි වන්නේ අද ශ්‍රී ලංකාවේ එක්තරා කොටසක ආදායම් දෙගුණ තෙගුණ හෝ කිප ගුණයකින්ම වැඩි වී ඇති බවය, නැතහොත් වැඩි වෙමින් පවතින බවය.

මෙසේ මෙම ජන කොටස් ඇත්ත වශයෙන්ම සාමයේ ප්‍රතිඵල යහමින් භුක්ති විඳීම ඉතා යහපත් ප්‍රතිඵලයක් බවට අපට පිළිගැනීමට අපහසුතාවයක් නොමැත. එහෙත්, මෙම තත්ත්වයට තවත් අයහපත් පැත්තකුත් අද වර්ධන වෙමින් පවති. එනම්, ස්ථිර වැටුප් ලබන රජයේ සහ පෞද්ගලික අංශයේ සමහර සේවකයින්ද, බැංකුවක හෝ මූල්‍ය ආයතනයක මුදල් තැන්පත් කොට එයින් පොළියක් ලබාගෙන යැපෙන අයද, විශ්‍රාම වැටුප්

---

2003.11.02 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

ලබන්නන් ද අද වන විට තමන් පෙර සිටි තත්ත්වයට වඩා අසිරු තත්ත්වයකට වැටී ඇත. ඔවුන්ගේ ආදායම් තත්ත්වයේ කිසිඳු වර්ධනයක් සාමය උදාවූවායින් පසුව දක්නට ලැබී නැත. එපමණක් නොව, අප රටේ ගොවීන්ගේ තත්ත්වයද තව දුරටත් පහළ බසිමින් පවතී. ඔවුන්ගේ ආදායම් මට්ටමද ජීවන තත්ත්වයද භයානක ලෙස තර්ජනයට භාජනය වී ඇත. මේ සියලුම දෙනා තමන්ගේ ජිවිතය ඉදිරියට ගෙන යන්නේ ඉතා අමාරු අන්දමකින් බවද ඔවුන් අප රටේ විශාල ජන කොටසක් බවද අප අමතක නොකළ යුතුය.

මෙම ප්‍රශ්නය හේතුකොටගෙන, සමාජිය පීඩනය තවදුරටත් වැඩි කිරීමට තුඩු දෙන තවත් කරුණක් ඇත්තේය. එනම්, සමාජයේ එක් කොටසක් ඉතා සීඝ්‍රයෙන් තමන්ගේ සම්පත් වර්ධනය කර ගනිමින් අලුත් සුඛෝපභෝගී ලෝකයකට පිවිසෙන ආකාරය, එවැනි වරප්‍රසාද වලට කිට්ටු වීමටවත් නොහැකි තවත් කොටසකට, දිනෙන් දිනම නිරීක්ෂණය කිරීමට සිදුවීමය. මෙම තත්ත්වය ආර්ථික කෝණයකින් හඳුන්වන්නේ නම්, අපට කිව හැක්කේ අප රටේ ආදායම් පරතරය ඉතා දරුණු අන්දමට වර්ධනය වීම නිසා, දුප්පත් පොහොසත් පරතරය වේගයෙන් වර්ධනය වන බවය. මෙලෙස පැණ නැගෙන මෙම සමාජිය සහ ආර්ථික ප්‍රශ්නය රටේ සහ සමාජයේ සාමයට සහ ඉදිරි ගමනට දැවැන්ත පහරක් එල්ල කිරීමට ඉඩ ඇත. පොහොසත් පුද්ගලයින්ගේ ආදායම් තව තවත් සීඝ්‍රයෙන් වර්ධනය වන අතර දුප්පතුන්ගේ 'සත්‍ය' ආදායමේ බැසීමක් ඇති වන විට හටගන්නා ආදායම් පරතරය වර්ධනය වීම, හුදෙකලාව දිළිඳුකම වර්ධනය වීමටත් වඩා අසතුටුදායක සහ අවාසනාවන්ත ගැටලුවකි. ආයුධ සන්නද්ධ සහ ලේ වැගිරීම් සහිත විප්ලව වල මූලික හේතුවක් වන්නේ ද, මෙලෙස ආදායම් පරතර වර්ධනය වීම බව ඉතිහාසයේ පාඩම් ගණනාවක්ම ඇති බව අපි දනිමු.

රටක හෝ රජයක පැවැත්ම රඳා පවතින්නේ ව්‍යාපාරයට සම්බන්ධ පොහොසත් ජන කොටස් මත පමණක් නොවේ. පොහොසත් ජන කොටස් ඡන්ද කාල වල සෑම දේශපාලන පක්ෂයකටම තමන්ගේ අනුග්‍රහය දක්වන බව අප දනිමු. එම සම්පත් සහ මුදල් වල

බලපෑම හරහා, සියලුම ජන කොටස් වල මතයන් සහ අදහස් යම්කිසි මට්ටමකට වුවද වෙනස් කල හැකි බව ද අප සියලු දෙනාම දන්නෙමු. එහෙත් අවසානයේදී රජයන් පත්කරන්නේද, නෙරපා දමන්නේද සාමාන්‍ය ජනතාවමය. මෙම සාමාන්‍ය ජනතාවගේ සිතුම් පැතුම්ද ඉෂ්ට කිරීම රජයක සහ ව්‍යපාරික ක්ෂේත්‍රයක වගකීම් ලෙස මට පෙනේ. එසේ නම්, සාමයේ වරප්‍රසාද විඳිමින් ඒ ගැන ප්‍රීතිඝෝෂා නගන සමාගම් වලට, තමන්ගේ පැවැත්ම උදෙසාම, ආත්මාර්ථකාමීව වුවද මෙම ගැටලුව දෙස තම සිත් යොමු කිරීමට සිදුවන්නේය. තමන්ගේ ලාභාංශ සහ ව්‍යාපාරික වර්ධනය ගැන පමණක් සිතමින්, තම සමාගම් පමණක් දිගින් දිගටම වර්ධනය කර ගැනීමට ඔවුන් කටයුතු නොකල යුතුය. තමන්ගේ පැවැත්ම ස්ථිර කර ගැනීමට නම් තම පරිසරය, තම සමාජය සහ තම රටේ ප්‍රශ්න ගැනද, අද මෙම සමාගම් වගකීමකින් බැලිය යුතුය. අද බොහෝ රටවල සමාගම් අනුගමනය කරන ප්‍රතිපත්ති මාලාවන්ට එකතු වන එක් නව විශේෂ අංගයක් නම්, එම සමාගම් වල සමාජීය වගකීම් (Corporate Social Responsibility) ගැන සෝදිසියෙන් කටයුතු කිරීමය. ව්‍යාපාර ක්ෂේත්‍රයේ අඛණ්ඩව පැවැත්ම ගැන කටයුතු කරන පුද්ගලයින් එම ක්ෂේත්‍රයේ පවතින සමාජය, පරිසරය සහ රට ගැන කැක්කුමක් ඇතිකර ගත යුතුය. ඔවුන් එසේ කරන්නේ නම් තම තමන්ගේ ප්‍රතිඵල සහ ලාභාංශ ඍජුව සහ වක්‍රාකාරව සමාජය සමග බෙදා ගැනීමටද කටයුතු කිරීමට පෙළඹෙනු ඇත.

එහෙත්, අද අවාසනාවකට මෙන් සිදු වන්නේ අප රටේ බොහෝ සමාගම් තමන්ගේ ව්‍යාපාරික සහ සමාගම් වල ප්‍රගතිය හැරුණු විට, තම සමාජයේ සහ රටේ ප්‍රශ්න සහ ගැටලු ගැන කිසිදු සැලකීමක් හෝ පැකිලීමක් ඇති නොකර ගැනීමය. ඔවුන් සිතන්නේ තමන්ගේ තත්ත්වය ඉහළ ගෙනයාම ගැන පමණයි. ඔවුන්ට මෙවැනි 'ආදායම් පරතරය' වැනි ප්‍රශ්න ඉදිරිපත් කළහොත්, ඔවුන් බොහෝ විට කියා සිටින්නේ එය රජයේ ප්‍රශ්නයක් බවත්, ඒ ගැන ඔවුන්ට කරන්නට යමක් නැති බවත්ය. මෑතකදී, ශ්‍රී ලංකා වාණිජ සංගමයේ වාර්ෂික සැසි වාරයකදී, ශ්‍රී ලංකාවේ ඉහළ පෙළේ සමාගම් රාශියක නියෝජිතයින් එකතු වී සාකච්ඡා කලේ තම සමාගම් වලට අදාළ වන පරිසරය දියුණු කරගැනීමේ

ක්‍රම ගැන සහ ව්‍යාපාර වලට සම්බන්ධ ප්‍රශ්න ගැන පමණය. දින දෙකක් මුලුල්ලේ සංකීර්ණ සාකච්ජා වල යෙදෙමින් මෙම අරමුණ ඉෂ්ට කරගැනීම සඳහා රජයෙන් සහ අභිකුත් පාර්ශව වලින් ලබා ගත හැකි සම්පත් සහ දිරිගැන්වීම් ගැන ඔවුන් ඉතා උනන්දුවකින් තම සිත් යොමුකළහ. එහෙත්, තමන් ව්‍යාපාර කරගෙන යන පරිසරයේ, සමාජයේ සහ රටේ අඛණ්ඩ පැවැත්ම ගැන ද, සමාජය තුළ යටින් පැතිරීගෙන යන, නොපෙනෙන භයානක තත්ත්වය ඔවුන් අමතක කිරීම දැඩි කණගාටුවට කරුණකි.

මත්ස්‍යයකුගේ පැවැත්ම සඳහා ජලය සහිත වැවක් අවශ්‍යය. කුමන හේතුවක් නිසා හෝ වැව සිඳුණ හොත්, මත්ස්‍යයා කොපමණ ශක්තිමත් වුවද, මත්ස්‍යයාගේ පැවැත්ම අවසන් වන්නේය. එම සරළ සත්‍යය අපගේ පාලකයින්, සමාගම් වල නායකයින් සහ රජයේ නිලධාරීන් හොඳින් මතක තබා ගත යුතුය.

# 1.6

## බැංකු ප්‍රතිසංස්කරණයට මැලේසියාවෙන් ආදර්ශයක්

බොහෝ ආයතන තම කාර්යභාරයන් ඉටු කර ගැනීමට බැංකු ණය ලබා ගනිති. එමෙන්ම බැංකුද බැඳී සිටින්නේ ණය ලබාදෙමින්, ඒ සඳහා පොලියක් අයකර ගනිමින් ආදායමක් ලබා ගැනීමටයි. එහෙත් අප දන්නා පරිදි සැම අවස්ථාවකදීම සිතූ ආකාරයටම බැංකු ණය පියවීමට ණය ලබාගන්නා අය අපොහොසත් වෙති.

එවැනි අවස්ථා වලදී බැංකු වලට සිදුවන්නේ ණය ගත් පුද්ගලයා හෝ ආයතනය ඇපයට තබා ඇති දේපළ විකුණා හෝ ඇපකරුවන්ගෙන් එම ණය සහ පොලිය අයකර ගැනීමටය. එබඳු අවස්ථා රාශියක් අපි දිගින් දිගටම දකිමු. ඒ අතරම රටක ආර්ථිකයක වර්ධනය අඩාල වන කාලයක හෝ ආර්ථිකයේ යම් අර්බුදයක් ඇතිවන කාළයක ව්‍යාපාරිකයන්ට තම ව්‍යාපාර කාර්යක්ෂමව කරගැනීමට හැකිවනු ඇත. ඒ නිසා තම ණය පියවීමට ඔවුන්ට නොහැකි වනු ඇත. එවන් අවස්ථා වලදී බැංකුවලට සිදුවනුයේ එම ණයගත් අයගේ දේපළ බැංකු සංතක කර ගැනීමටයි. එම දේපළ විකිණීමෙන් හෝ වෙනත් ආකාරයකින් මුදල් වලට නැවත පරිවර්තනය කිරීමයි.

එහෙත් අවාසනාවකට මෙන් මෙවන් දේපළ රාශියක්ම එකවරම බැංකු කිහිපයක්ම දේපළ වෙළඳ පොළට යොමු කිරීමට තැත් කළහොත්, දේපළ වෙළඳපොළ බොහෝ අවස්ථා වලදී කඩාකප්පල් විය හැකිය. එසේ වීමට හේතුව නම් දේපළ සැපයීම ඉල්ලුමට වඩා බොහෝ සේ වැඩි වීමයි. එවැනි අර්බුදයක් වූවිට බැංකුවලට උගස් කරනලද දේපළවල වටිනාකම දැඩි ලෙස පහළ බසිනු ඇත. එම සිදුවීමේ විපාකයක් වශයෙන් දුන් ණය වශයෙන් බැංකු සතුව ඇති ඇපවල වටිනාකම සැලකිය යුතු අන්දමකට

---

චමින්ද මුණසිංහ මහතා සමග පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරින් 2002.08.14 දින ලංකාදීප පුවත්පතෙහි පළවූ ලිපියක් ආශ්‍රයෙනි

අඩුවනු ඇත. එවිට සිදුවන්නේ ණය ගත් පුද්ගලයාට හෝ ව්‍යාපාරයට මුහුණ දීමට සිදුවන අර්බුදයටය වඩා විශාල අර්බුදයකට බැංකුවලට මුහුණ දීමටය.

බැංකු විසින් දෙන ලද ණයෙහි වටිනාකම පහළ බසිනවාත් සමගම බැංකුවල ශේෂ පත්‍රද දැඩි ප්‍රහාරයකට පත්වෙනු ඇත. එහි අඩංගු සම්පතක් වශයෙන් පෙන්වන, දුන් ණයෙහි වටිනාකම දැඩි ලෙස පහත බැසීමෙන් බැංකුවට විශාල තර්ජනයක් ඇතිවනු ඇත. ඒ අතරම සාමාන්‍යයෙන් හරියාකාරව ගෙවන ණය සඳහා අයවන පොළිය වැඩි කිරීමටද මේ තත්ත්වය තුඩුදෙනු ඇත. ඒ මන්ද කිවහොත් දුන් ණය සම්භාරයෙන් සැහෙන කොටසක් බැංකුවට පොළියක් ලබා නොදෙන්නේ නම් එම පාඩුව පියවීමට බැංකුවට සිදු වන්නේ හරියාකාරව ගෙවනු ලබන ණය සඳහා වැඩි පොළියක් අය කිරීමෙන් පළමු කී පාඩුව පියවා ගැනීමටය. මේ තත්ත්වය නිසා බැංකුවල පොළී අනුපාතය ඉහළ නැගීමද ඉබේම වාගේ සිදුවෙනු ඇත.

අද අප රටේද මෙවැනි තත්ත්වයක් උද්ගත වෙමින් පවතින බව බැංකු ක්ෂේත්‍රය ගැන විශ්ලේෂණයක් කරන ඕනෑම අයෙකුට පැහැදිලිය. එය සාමාන්‍යයෙන් අහිතකර සිදුවීමක් වුවත් අප අවබෝධකරගත යුත්තේ මෙවැනි ආර්ථික තත්ත්වයන් අප රටට පමණක් සීමා වූද, ආවේනික වූද තත්ත්ව නොවන බවයි. මෙවැනි අර්බුදකාරී තත්ත්වයන්ට ලෝකයේ දියුණු වන හා දියුණුවෙමින් පවතින රටවලට සහ ආර්ථිකවලට අතීතයේදීද වර්තමානයේදීද මුහුණ දීමට සිදුව ඇත. අනාගතයේදී ද එවැනි තත්ත්ව මතුවනු නොඅනුමානයි. ඒ අය මෙවන් අවස්ථා වලදී එවකට අලුත් ක්‍රියාමාර්ග හරහා බැංකු ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණයකට ලක් කළ අයුරු අපට දැක ගත හැකිය. අප රටටත් මෙම අත්දැකීම් වලින් සහ ක්‍රියාවේ යෙදුනු නව ක්‍රම වලින් පාඩම් ඉගෙන ගැනීමට හැක. ඕනෑම අයෙක් අර්බුදයකට මුහුණ පාන අවස්ථාවකදී ඒ සඳහා ප්‍රතිචාරයක් නැතහොත් විසඳුමක් ලබාදිය යුත්තේ අර්බුදය පටන්ගත් අවස්ථාවේදීමය. එම ප්‍රතිචාරය කාලෝචිත වුයේ නැතිනම් එම ප්‍රතිචාරයෙන් සමහර විට ලබා ගත හැකි ප්‍රයෝජන අවම වනු ඇත. අද බැංකු මුහුණ දී ඇති

ප්‍රශ්නයටද විසඳුමක් ලබාදීමට නම් එම විසඳුම කාලෝචිත එකක් විය යුතුය. එමෙන්ම එම විසඳුම අත්හදා බලාඇති වෙනත් රටක හෝ ක්ෂේත්‍රයක හෝ කාර්යක්ෂම සහ සාර්ථකව දියත් කරන ලද එකක් නම් ඊටත් වඩා වාසියකි. එසේ නම් අපට අද මැලේසියානු තත්ත්වය දෙස බලා එයින් උපුටා ගත හැකි අප රටට අදාළ ක්‍රම සාර්ථකව දියත් කිරීමට කාළය එළඹ ඇත. එය ඉතා ඉක්මණින් දියත් කළ යුතුය. මේ අවස්ථාවේදී එම ක්‍රමය ගැනද යම් අවබෝධයක් ඇතිකර ගැනීම මෙම විග්‍රහයට අදාළ යැයි මා සිතමි.

මැලේසියාවේදී සිදුවුයේ මෙම බැංකු අභියෝගයට මුහුණ දීමට සම්පත් පාලනය "ධනහර්තා" යන ආයතනයක් රජයේ පනතක් යටතේ පිහිටු වීමය. එම ආයතනයේ කාර්යභාරය වුයේ බැංකුවල ඇති කාලසීමා ඉක්මවා ගිය ණය නොහොත් කල් ඉකුත් වූ ණය, බැංකු වලින් මුදලට ගැනීමය. එසේ ගත්තේ ඒවා තක්සේරු කොට වෙළඳ පොලේ පවත්නා අගයටය. එවිට සිදු වුයේ මෙවැනි කල් ඉකුත් වූ ණය වලින් මිදි බැංකුවට තම බැංකු සේවාව වෙත අවධානය යොමු කරගෙන වඩා කාර්යක්ෂමව තම සේවාව කර ගැනීමට හැකි වීමය. ඒ අතරම එම ණය මිලදී ගත් සම්පත් පාළනය කරන ධනහර්තා සමාගම එම ණයට සම්බන්ධ දේපළද, සම්පත්ද කාර්යක්ෂමව හසුරුවමින් හොඳ වටිනාකමක් ලබා ගැනීමට උත්සහ කළේය. එසේ කිරීමෙන් මැලේසියාවේ ආර්ථිකයට විශේෂ දීමනා දෙකක් ලැබුණි. එකක් නම් බැංකු වලට බරක් වී තිබූ, නොගෙවන කල් ඉකුත් වූ ණය බැංකු ක්ෂේත්‍රයෙන් ඉවත් වීමෙන් බැංකුවලට විශේෂ සහනයක් සහ නව අවස්ථාවක් ලැබීමයි. ඒ හරහා බැංකුවල පිරිවැයද සැළකිය යුතු අන්දමකින් අඩුවුණි. දෙවනුව බැංකු ක්ෂේත්‍රයට බරක්ව තිබූ ණය සහ දේපළ විශේෂ වශයෙන් සැළකිල්ලට සහ පාළනයකට යටත් වූ නිසා එම දේපළ සහ සම්පත්ද වඩාත් සාර්ථකව පාලනය වුනි.

මැලේසියාව 1998 දි ඔවුන් මුහුණ පා ඇති උග්‍ර ආර්ථික අර්බුදයෙන් ගැලවීමට මෙම ප්‍රතිසංස්කරණ ක්‍රමය විශේෂ සාධකයක් විය. ඒ අතරම, මැලේසියානු මහ බැංකුවද රජයද

තවත් ප්‍රතිසංස්කරණ රාශියක් දියත් කළ බව කිව යුතුය. ඒවා සියල්ලම ආර්ථිකයේ ප්‍රසංස්කරණයට දිරිගැන්වීමක් කළ බව සත්‍යයකි. එහෙත් මේ අවස්ථාවේදී අප විග්‍රහ කරන මාතෘකාවට අදාළ වන විශේෂ සාධකය නම් මෙම ඉකුත් වූ ණය හරහා කරන ප්‍රතිසංස්කරණ බව නිසා ඒ ගැන විශේෂ විග්‍රහයක් නොකරනු ඇත.

එසේ නම්, මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඉතා ඉක්මණින්ම අප රටට ඔබින ලෙස වෙනස් කරමින් අප දියත් කළ යුතුය. එසේ කිරිමෙන් අද ලංකාව මුහුණ පා ඇති මෙම බැංකු අර්බුදයට අපට සාර්ථකව මුහුණ දීමට හැකි වන්නේය.

# 1.7

## ප්‍රමුඛ බැංකු සිද්ධියෙන් මහ බැංකුව පාඩම් උගත යුතුය

ලොව ඕනෑම රටක ජනතාව සහ මූල්‍ය ආයතන අතර සබැඳියාවක් ගොඩනැගෙන්නේ දෙපාර්ශවය අතර ඇතිවන පූර්ණ විශ්වාසය මතයි.

විශ්වාසය පදනම් කොට ගොඩනැගෙන මෙම සබඳියාව කවර පාර්ශවයක හෝ බිඳවැටීමෙන් විනාශ වී යෑම නොවැළැක්විය හැකි දෙයක් වන්නේය. මෙහිදී ජනතාවටත් වඩා මූල්‍ය ආයතනික පාර්ශවයෙන් සිදුවන විශ්වාසය කඩවීම ජනතාවට පමණක් නොව රටේ සමස්ත ආර්ථිකයටම අහිතකර ලෙස බලපාන්නේය යන්න කවුරුත් එකහෙළා පිළිගන්නා සත්‍යයකි.

මෙපරිද්දෙන් විශ්වාසය බිඳ වැටී අහිතකර තත්ත්වයක් මතුවීමට මත්තෙන් එය වළක්වාලීම සඳහා රටක මහ බැංකුවකට යම් යම් පියවර ගැනීමට ඉඩකඩ ඇත්තේය. පසුගියදා ප්‍රමුඛ බැංකුව වසා දැමීමට ශ්‍රී ලංකා මහ බැංකුව ගත් තීරණයට මත්තෙන් එවන් පියවර ගැනීමකට ශ්‍රී ලංකා මහ බැංකුව නොපෙළඹුණේ මන්ද යන්න අද ජනතාව අතර කතිකා වන මාතෘකාවකි.

ලොව ඕනෑම රටක ආර්ථිකයේ විශේෂ තැනක් ලබාගන්නා කෙෂ්ත්‍රය නම් එම ආර්ථිකයේ බැංකු හා මූලය කෙෂ්ත්‍රයයි. ආර්ථිකයක් දියුණු වන විට මූල්‍ය කෙෂ්ත්‍රය අනිවාර්යයෙන්ම ඊට සමීපව සම්බන්ධ වී දියුණු වන අතර එයම එම දියුණුවට රුකුලක් වන ඉතා විශේෂ සාධකයක් ද වන්නේය. ඒවාගේම ආර්ථිකයක් පිරිහෙන විට මූල්‍ය හා බැංකු කෙෂ්ත්‍රයේද යම් සංකෝචනයක් දක්නට ලැබෙන අතර, බැංකු කෙෂ්ත්‍රයට ඒ හරහා සැලකිය යුතු අභියෝග ද ඉදිරිපත් වනු ඇත. මේ දෙයාකාර ක්‍රියාවලියෙන් පෙනී යන්නේ

---

ජයසිරි මුණසිංහ මහතා සමග පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරින් 2003.12.26 දින දිනමිණ පුවත් පතෙහි පළවූ ලිපියක් ආශ්‍රයෙනි

යම් රටක බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රය ඒ රටේ ආර්ථිකයට ඉතාම සමීපව කටයුතු කෙරෙන බවයි. මේ නිසා සෑම රජයක්ම පාහේ තම රටේ බැංකු හා මූල්‍ය ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම ස්වාභාවිකය. එසේ කිරීමට මූලික හේතුව වන්නේ බැංකු ක්‍රමය කෙරෙහි යම් අවිශ්වාසයක් ජනතාවගේ සිත්වල පැණ නැගුණහොත් එම අවිශ්වාසය හරහා බැංකු ක්ෂේත්‍රයටත් එමගින් මුලු මහත් ආර්ථිකයටත් අහිතකර බලපෑමක් ඇතිවිය හැකි නිසාය.

මෙම හේතුව නිසා සෑම රටකම පාහේ මහ බැංකුවේ කාර්යභාරය වී ඇත්තේ ආර්ථිකයේ මුදල් පරිහරණයේ මුදල් පාලනයක්, උද්ධමනයේ පාලනයක් සහ විදේශ විනිමයේ පාලනයක් පොලී අනුපාතිකයේ පාලනයක් ඇති කිරීම වාගේ එම රටේ බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන කෙරෙහි ද යම් පාලනයක් හා නිරීක්ෂණයක් ලබාදීමය. බැංකු ක්ෂේත්‍රයේ ආයතන කොටස්කරුවන්ගේ ආයතන පමණක් නොවේ. එම ආයතන කොටස් කරුවන්ගේ ප්‍රාග්ධනයට වඩා අති විශාල සම්පත් සම්භාරයක් ජනතා තැන්පතු හරහා එක්රැස් කිරීම සිදු කරති. ඒ හේතුව නිසා එම ආයතනවලට සම්බන්ධ ගනුදෙනුකරුවන් සහ ඒ ආයතන මගින් තම ව්‍යාපාර කරගෙන යන ආයතන රැසක් ඇත. මේවා සියල්ලක්ම ආර්ථිකයට සම්බන්ධ නිසා මේවා සියල්ලක්ම ආර්ථිකයේ වර්ධනයට රුකුලක් වන නිසා බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රය නිසි ලෙස නිරීක්ෂණය කොට පාලනය කිරීම ඕනෑම රටක මහ බැංකුවක ඉතාමත්ම වැදගත් කාර්ය භාරයක් වන්නේය.

අද සාමාන්‍ය මතය වී ඇත්තේ මහ බැංකුවක් එම පාලනය සිදුකිරීමට ආරම්භ කළ යුත්තේ යම්කිසි මූල්‍ය ආයතනයක් අපහසුවට පත්වූ විට කියාය. ඒ මතය අනුව මහ බැංකුවක් මූල්‍ය ආයතනයක් අපහසුවට පත්වූ විට එම ආයතනය ගලවා ගැනීමට, එම ආයතනයට මුදල් ලබා දී පණ ගන්වා එම ආයතනයේ අධ්‍යක්ෂවරුන් නොරපා දමා ඊට පසු එම ආයතනය පැවති ආර්ථිකයට නිසියාකාරව සම්බන්ධ කළ යුතුය. යන්න ඔවුන්ගේ මතයයි. එහෙත් අද ලෝකයේ එවැනි තත්ත්වයකට පෙර මහ බැංකුවකින් සිදුවිය යුතු කාර්යභාරය ඉමහත්ය.

බොහෝ අවස්ථාවලදී මෙම තත්ත්වයට එළැඹෙන තෙක් මහ බැංකුවක් රටක ආර්ථිකයක වැදගත් කාර්යයක් ඉටු කරන බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් ගැන නිසි අවධානයකින් නොසිටියහොත්, එම දුෂ්කර අවස්ථාව එළඹි විට එම ආයතනය ගොඩනැගීමට මහ බැංකුවට පවා ඉඩක් නොලැබෙන අවස්ථා තිබේ. ඒ කරුණ නිසා මහ බැංකුවක් විශේෂයෙන්ම තම අවධානය යොමු කළ යුත්තේ යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් පාලනය කරන පුද්ගලයන්ගේ ව්‍යාපාර සාරධර්ම ගැනත්, එම ආයතනවල කටයුතු කරන ප්‍රධාන අණ දෙන නිලධාරි සහ අධ්‍යක්‍ෂක මණ්ඩලය පිළිපදින ව්‍යාපාරික පාලන ක්‍රම ගැනත්ය. ඒ අතර ම බැංකුවකට බලපත්‍රයක් ලබාදෙන අවස්ථාවක එම බැංකුව පාලනය කිරීමට ඉදිරිපත් වන අයගේ අත්දැකීම් ද, පෙර කටයුතු ගැනද ඉතා ක්‍රමවත්ව හා සූක්‍ෂමව සැලකිල්ලක් ද ලබා ගැනීම මහ බැංකුවේ ප්‍රධානතම වගකීමකි.

මෑතකදී ප්‍රශ්නවලට මැදිහත් වූ සමහර අධ්‍යක්‍ෂකවරුන් තම ආයතනවලින් ඉවත් වී අලුත් බැංකු ස්ථාපනය කිරීමට බලපත්‍ර ලබාගත් අවස්ථා අප රටේ ඇසීමට ඇත. සමහරු මූල්‍ය ආයතනවල තැන්පත්කරුවන්ට මුදල් ගෙවීමට අපොහොසත් වීමෙන් පසු එම ආයතන, මහ බැංකුවෙන් අත්පත් කරගත් නමුත්, ඒ ආයතනවලට සම්බන්ධ අය ඊට පසුවත්, නව බැංකු හා මූල්‍ය ආයතන ආරම්භ කළ අවස්ථා අප රටේ අසන්නට ඇත. මෙවැනි තත්ත්වයකින් පැහැදිලි වන්නේ මහ බැංකුව මෙවැනි බලපත්‍ර නිකුත් කිරීමෙන් ජනතාවට යම් අපහසුතාවයකට පත්වන ලෙස ආයතන බිහිවීමට අවස්ථා ලබාදී ඇති බවය. බොහෝ විට සාමාන්‍ය ජනතාව සිතන්නේ යම් ආයතනයක් මහ බැංකුවේ නිරීක්‍ෂණයට ලක් වන්නේ නම් එම ආයතනයේ තම මුදල් තැන්පත් කරන විට එය සුරක්‍ෂිත යන්නයි.

සාමාන්‍ය ජනතාවට බැංකු ක්‍ෂේත්‍රය ගැන පුළුල් අධ්‍යයනයක් කොට එහි ඇති සාධක සියල්ලක් ගැනම පසු විපරම් කිරීමට අවස්ථාවක් නොමැත. ඒ හේතුව නිසා ඔවුන් මහ බැංකුවක අධ්‍යයනය හා නිරීක්‍ෂණය කෙරෙහි තම විශ්වාසය මුලුමනින්ම පාහේ රඳා ගැනීම පුදුමයට කරුණක් නොවේ. මෙවැනි තත්ත්වයක්

තිබියදී මහ බැංකුව ප්‍රශ්න මතුවන විට තමන්ට ඒවා ගැන කටයුතු කිරීමට අපහසු යැයි පැවසීම ජනතාවගේ විශ්වාසය කඩාකප්පල් කිරීමක් වන්නේය.

මහ බැංකුව මුලින්ම නුසුදුසු පුද්ගලයින්ට බලපත්‍ර යොමු කිරීමෙන් තම කාර්ය භාරය හරියාකාරව ඉෂ්ට නොකිරීමත්, යම් ප්‍රශ්න මතු වූ පළමු අවස්ථාවේදීම ඒ සිද්ධීන් ගැන ජනතාව හරියාකාරව දැනුවත් නොකිරීමත්, සත්‍ය වශයෙන් ම ඔවුන්ගේ කාර්යභාරය අතපසු කිරීමකැයි මහජනතාව චෝදනා කළ හොත් එය නිවැරදි වීමට ඉඩ තිබේ.

විශේෂයෙන් ම අධ්‍යක්ෂකවරු දූෂිත හා වංක අන්දමට කටයුතු කරන්නේ නම් මහ බැංකුවක වගකීම විය යුත්තේ ඒවා ඉතා ඉක්මණින් හෙළිදරව් කොට එම පුද්ගලයින්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමයි. එසේ නොකොට ඔවුන්ට එම කටුයතු දිගින් දිගටම කරගෙන යෑමට ඉඩදීමෙන් මහ බැංකුවද යම්කිසි ආකාරයකින් නැතිනම් වක්‍රාකාරව මෙම තත්ත්වයට වගකිව යුත්තෙක් බවට පත්වන්නේය.

අද ශ්‍රී ලංකාවේ ද යම් අර්බුධකාරි තත්ත්වයක් විශේෂ බැංකුවක් කඩා වැටීමෙන් පැන නැගී ඇත. මෙම සිදුවීම පුලුල් ලෙස විග්‍රහ කළහොත් පැන නැගෙන විශේෂ ප්‍රශ්නය නම් මෙම ආයතනයට බලපත්‍රයක් මුලින් ම නිකුත් කලේ ඇයිද යන්නයි. එම ආයතනයට සම්බන්ධ අය කෙරෙහි යම් සැකයක් තිබුණා නම්, ඒ හරහා එවැනි බලපත්‍ර නිකුත් නොකොට සිටීමට මහ බැංකුවට අවස්ථාවක් තිබුණා යැයි බොහෝ දෙනා චෝදනා කරති.

ඒ ආකාරයටම තවත් ආයතනවල යම් ප්‍රශ්නවලට මැදිහත් වූ පුද්ගලයන්ට ද බලපත්‍ර නිකුත්කොට ඇතැයි තවත් සමහරු පවසති. මෙම තත්ත්වයෙන් ඉතා ඉක්මණින් මිදීමට මහ බැංකුව කටයුතු කළ යුතුය. එසේ කිරීමට නම්, ඊට වඩා වැඩි නිරීක්ෂණ ක්‍රමයක් ද බලපත්‍ර නිකුත් කිරීමට පෙර වඩාත් පුලුල් විග්‍රහයක් ද සිදු කළ යුතුය.

එසේ නොකරන්නේ නම්, මුලු මහත් බැංකු ක්ෂේත්‍රයට ම අති දැවැන්ත අභියෝගයක් ඇතිවනු නොඅනුමානය. මෙම තත්ත්වයෙන්

ඉතා ඉක්මනින් මිදී මුලු මහත් බැංකු ක්ෂේත්‍රයම අලුත් පදනමක් හරහා අධීක්ෂණය කිරීමට මහ බැංකුව කටයුතු කිරීමට මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතුය. පසුගියදා ප්‍රමුක බැංකුව වසා දැම්මේ අවාසනාවන්ත සිද්ධියෙන් පසු වුව යම් සතුටුදායක ප්‍රතිඵලයක් නැතිනම් පාඩමක් ලබා ගැනිමට අපේ රටට හැකියාව ලැබී ඇත. එනම් මින් ඉදිරියට එවැන්නක් ඇති නොවීමට බලධාරීන් දැනට වඩා ක්‍රියාශීලි විය යුතු බවයි.

# 1.8

## යුද්ධය නිමාවී වසරක් ගත වුවත් සාමයේ ලාභාංශ ජනතාවට නොලැබුණේ ඇයි?

වර්ෂ 2001, ශ්‍රී ලංකාව මෑත ඉතිහාසයේ දරුණුතම ප්‍රහාරයන්ට ලක් වූ වර්ෂය ලෙස අපට හැඳින්විය හැකිය. ත්‍රස්තවාදී යුද්ධයෙන් අති විශාල පාඩු සිදු වූ අතර, නියඟය හා අනෙකුත් හේතූන් නිසා අපේ ආර්ථිකය ඉතා අන්ත තත්ත්වයකට කඩා වැටුණි.

පළමු වරට ආර්ථිකය සංකෝචනය වූ අතර යුද්ධය වෙනුවෙන් වැය වූ මුදලද රුපියල් බිලියන 68ක් පමණ විණි. මෙම කරුණු දෙස බලන විට ශ්‍රී ලංකාවට ඉතාමත්ම අභියෝගාත්මක වර්ෂයක් ලෙස 2001 වර්ෂය හැඳින්විය හැක. 2001 දෙසැම්බර් මාසයේදී රජයේ වෙනසක් ඇති වීමෙන් පසුව ත්‍රස්තවාදී යුද්ධය නතර කෙරිනි. යුද්ධය නතර වීමෙන් පසු බොහෝදෙනාගේ මතය වුයේ යුද්ධයට වැයවන මුදල නැතිවීමෙන් විශාල වෙනසක් රට තුළ සිදුවෙනු ඇතැයි යන්නයි. ඉතා ඉක්මණින් ආර්ථිකය සංවර්ධන මාර්ගයට යොමු කොට, යුද්ධය නැතිවීමෙන් ඉතිරි වූ මුදල ජනතාවගේ සහන සඳහාද, සංවර්ධන වැඩපිළිවෙත් සඳහාද යොමු කිරීමට රජයට හැකිවේය යන්නයි. ඒ හරහා සාමයේ ලාභාංශ ඉතා ඉක්මණින් මුලු මහත් ජන සමාජයටම උරුම වනු ඇතැයි යන්නයි. එහෙත් යුද්ධය නතර වී වසරකට පසුවත් බොහෝ දෙනා අද ප්‍රශ්න කරන්නේ ආර්ථිකය තවමත් නව නැම්මකින් පිබිදී නැත්තේ ඇයිද? යන්න ගැනයි. ආරක්‍ෂාව සඳහා රජය විසින් වැය කරන මුදල 2002 වර්ෂය සඳහා සැලකිය යුතු අන්දමකින් අඩුනොවී ඇත්තේ මන්ද යන්න ගැනයි. එය අප ඉදිරියේ ඇති ප්‍රධාන ප්‍රශ්න දෙකයි.

මේ පිළිබඳව යම් විග්‍රහයක් කිරීම අප සියලු දෙනාටම අවශ්‍යය. පළමුවෙන්ම අපි දෙවන ප්‍රශ්නය කෙරෙහි සිත් යොමු කළ හොත්

---

ජයසිරි මුණසිංහ මහතා සමග පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරින් 2003.01.08 දින දිනමිණ පුවත් පතෙහි පළවූ ලිපියක් ආශ්‍රයෙන්

අපට පෙනෙන්නේ ආරක්‍ෂාව සඳහා 2002 වසරේදී රුපියල් බිලියන 64 ක පමණ මුදලක් රජය විසින් වැය කරන ලද බවයි. මෙසේ සිදුවීමට හේතු දක්වමින් රජය පවසා ඇත්තේ යුද්ධය නතර වුවත්, 2001 වසරේදී හා ඊට ප්‍රථමයෙන් ලබාගෙන ඇති ආයුධ හා අනෙකුත් උපකරණ වෙනුවෙන් රජය තවමත් මුදල් ගෙවීමට බැඳී සිටින බවය. ඒ හරහා විශාල මුදල් ප්‍රමාණයක් රජයට ගෙවීමට සිදුවී ඇත. වාසනාවකට මෙන් 2002 වසරේදී නව ඇණවුම් නොතිබුණ බැවින් මෙම මුදල් ප්‍රමාණය තව දුරටත් වැඩි නොවීම සිදුවිය. එසේ නොවුනානම්, සමහරවිට ආර්ථිකය 2002 වසරේදී ඉතා උග්‍ර ලෙස කඩා වැටීමට ඉඩ තිබුණි. සමස්තයක් වශයෙන් අපට පිළිගැනීමට සිදු වන්නේ යුද්ධය නතර වුවත්, තව වසර කිහිපයක් යනතුරු ආරක්‍ෂක වියදම සීඝ්‍රයෙන් අඩුකර ගත හැකි නොවන බවයි. ඒ කෙසේ වුවත් සාමකාමී තත්ත්තවය දිගින් දිගටම පවත්වා ගෙන යාමට හැකි වුවහොත් තව වසර කිහිපයකින් ආරක්‍ෂක වියදම බෙහෙවින් අඩුකර ගැනීමට රජයට හැකිවනු ඇත.

එසේ වුවහොත් එම මුදල් ආර්ථිකයේ සංවර්ධනය සඳහා වැය කිරීමට රජයට හැකි වනු ඇත. ඒ අතරම ඉහත කී පළමු ප්‍රශ්නය දෙස අප සිත් යොමු කරද්දී පෙනෙන එක් කරුණක් නම්, රජයට 2002 වසරේදී භාණ්ඩාගාරයේ ඇති හිස් මුදල් තත්ත්වය ඉතා උග්‍ර ලෙස බලපා ඇති බවයි. රජයේ ආයතන කිහිපයක්ම විශාල ලෙස ණය බරින් පෙළෙමින් සිටි ආයතන බවට පත්වී තිබුණි. විදුලිබල මණ්ඩලය, ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, වැනි සංස්ථා රජයේ ඇප සහිතව විශාල ලෙස ණය ලබාගෙන තිබුණි.

එම ණය පියවීම නව රජයට අතිවිශාල අභියෝගයක් විය. එසේ කරමින් පවත්වාගෙන යන රාජ්‍ය සේවයද කෙසේ හෝ පවත්වාගෙන යාමට සිදු විය. එම කාර්යය ඉතා දුෂ්කර එකක් වූ අතර, එසේ කිරීමේදී නව ව්‍යාපෘති වලට මුදල් වෙන් කිරීමට රජයට නොහැකි වීම පුදුමයට කරුණක් නොවිය. නව ව්‍යාපෘති දියත් කිරීමට අපොහොසත් වීම නිසා, නව ආදායම් මාර්ගද, නව රැකියා අවස්ථාද, මතු කරමින් වර්ධනය කරන්නට රජයට නොහැකි විණි.

එහෙත්, රජය විසින් සිදු කළ එක් විශේෂ කාර්යයක් නම්, සාමය පිළිබඳව ස්ථාවර අඩිතාලමක් සකස් කරන අතරම නව ආයෝජකයන් සමග සමීප සම්බන්ධතාවක් ඇතිකර ගැනීමයි. අද ලෝකයේ ආයෝජනය කෙරෙහි ඇති තියුණු තරගකාරීත්වය නිසා ආයෝජකයන් තම ආයෝජන රැගෙන එකවර හෝ ඉතා ඉක්මණින් හෝ රටකින් රටකට යන ස්වභාවක් දක්නට නොමැත. ඔවුන් බෙහෝ දෙනෙක් ආයෝජනයට සුදුසු රටක් තෝරා ගනිද්දි සාධක බොහෝමයක් විශ්ලේෂණය කරමින් යම් ආර්ථික හා දේශපාලනික ස්ථාවර තත්ත්වයක් එම රටේ පවතිද? නැද්ද? යන්න විමසා බලා තම ආයෝජනය සිදු කරති. එහෙයින් අප කොපමණ නොඉවසිලිමත්ව බලාසිටියත්, එම ආයෝජන ගලාඑන්නට යම් කාලසීමාවක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ. එම තත්ත්වය හරහා 2003 වසරේදී ආයෝජන ගලාඑන ලකුණු අද පවතිය යන්න බොහෝදෙනාගේ විශ්වාසයයි. සාම සාකච්ඡා තවදුරටත් වර්ධනය වෙමින් පවතිත්දී, ආර්ථිකයද දියුණු වන ලකුණු පහළ වුවහොත්, එම විශ්වාසය හරහා ඉතා පුළුල් ආර්ථික වර්ධනයක් ඉදිරි වසර දෙක තුන තුළ සිදුවනු නොඅනුමානයි.

ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් ඉතා අන්ත තත්ත්වයකට 2001 වසරේදී පහත වැටී තිබු බව අපි මුලින්ද සඳහන් කළෙමු. එවැනි තත්ත්වයකින් ගොඩ ඒමට නම්, නව ප්‍රතිපත්ති සහ නව ක්‍රම විශිෂ්ඨ කළමණාකාරීත්වයක් හරහා දියත් කළ යුතු වන්නේය. අභියෝග රාශියකට මුහුණ දීමට සිදුවන්නේය. ආර්ථිකය දියුණු කිරිමේ නව ක්‍රම උපයෝගි කර ගැනීමට සිදුවන්නේය. ජාත්‍යන්තර මට්ටමකට අප රටේ පාලන තන්ත්‍රය දියුණු කර ගැනීමට කටුයතු කිරිමට සිදු වන්නේය. කඩිනමින් වැඩ කිරිමට සිදුවන්නේය.

මේවා සියල්ලක්ම නිසියාකාරව සිදු වුවහොත් පමණක් ආර්ථිකය විශිෂ්ට ලෙස දියුණු වී අපට සුබිත මුදිත අනාගතයකට පිවිසීමට හැකි වන්නේය. වසර 2003 දී අප රටේ ආර්ථික පාලකයන්ට මුහුණ දීමට සිදුවන අභියෝග මොනවාද යන්න පිළිබඳ අපි මඳක් විමසා බලමු. එහිදී රටේ දළ දේශිය නිෂ්පාදිතය ඉතා ඉක්මණින් වැඩිකර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වන්නේය. එසේ

කරද්දී අප විශේෂයෙන්ම සැලකිය යුතුවන්නේ ජනතාවට වැඩියෙන්ම බලපාන ක්ෂේත්‍රයන් ය. මෙම ක්ෂේත්‍ර අතුරින් පැහැදිලිවම දියුණු විය යුතු ක්ෂේත්‍රය නම් කෘෂිකර්ම, ධීවර, ඉදිකිරීම් හා සංචාරක ක්ෂේත්‍රයන්ය. කර්මාන්ත, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍ර දියුණු වීමෙන් රටේ ආර්ථිකයට විශාල රුකුලක් සිදුවන අතරම, ඉහත කී ක්ෂේත්‍ර හතරේ විශේෂයෙන් ම ජනතාවට සමීප ක්ෂේත්‍ර ඉතාමත්ම කඩිනමින් වර්ධනය වන සැලසුම් අද දියත් කළ යුතුය.

අප රටේ කෘෂිකර්මය වෙනුවෙන් ලබාදී ඇති රාජ්‍ය අනුග්‍රහය එම ක්ෂේත්‍රයට සම්බන්ධ වී ඇති ජනගහනය සමග සසඳා බලන විට බෙහෙවින් අඩු එකකි. කෘෂිකර්ම හා ධීවර ක්ෂේත්‍රයේ සැලකිය යුතු දියුණුවක් ඇති කිරීමට හැකි වුවහොත්, ඒ හරහා රටේ බහුතර ජනතාවකට විශේෂ සහන ලැබෙන්නේය. ඒ නිසා එම ක්ෂේත්‍ර දියුණු කිරීම රජයේ විශේෂ වගකීමක් වන්නේය. එහෙයින්, 2003 වසරේදී වාරිමාර්ග ක්ෂේත්‍ර දියුණු කිරීමෙන්, ජල සම්පත් දියුණු කිරීමෙන්, තාක්ෂණ දැනුම උපයෝගී කොට ගැනීමෙන්, නව කෘෂිකාර්මික ක්‍රමවලට ගොවි ජනතාව යොමු කිරීමෙන් කෘෂිකර්මය නැංවිය හැකිය. ඉන්දියන් සාගරයේ සුවිශේෂ සාගර කලාපය හරියාකාරව ප්‍රයෝජනයට ගනිමින් ධීවර ක්ෂේත්‍ර බෙහෙවින් දියුණු කිරීමට රජයට හැකි වන්නේය. ඒ අතරම රටේ පවතින ගොඩනැගිලි හා යටිතල පහසුකම් දියුණු කිරීමට යම් රුකුලක් ලබා දීමෙන් රජයට හැකිවන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට විශේෂ දිරි ගැන්වීමක් ලබාදීමට ය.

ඉදිකිරීම් ක්ෂේත්‍රයට විශාල සමාගම් සම්බන්ධ වන අතරම, රටේ බහුතර ජනතාවක් ඒ හරහා නව ජීවන වෘත්තියේ නිරත වනු ඇත. ඉදිකිරීම් ක්ෂේත්‍රය වර්ධනය වනවාත් සමග ම ඒ අයගේ ජීවන තත්ත්වය ද කඩිනමින් සංවර්ධනයක් කරා ළගා වනු ඇත. එසේ නම්, ඉහත කී ක්ෂේත්‍ර තුනේම වර්ධනයක් ඇතිවීමෙන් සිදුවන්නේ රටේ බහුතරයක් වන සාමාන්‍ය හා ගැමි ජනතාවගේ අත්වලට වැඩි මුදලක් ලබා ගැනීමට හැකිවීමය. එසේ සිදු වීමෙන් ගැමි ආර්ථිකයටද පුලුල් පුණර්ජීවයක් දැනෙනු ඇත. එසේ සිදු වුවහොත් පමණක් අප රටේ සාමාන්‍ය ජනතාවට

ආර්ථික වර්ධනයෙහි සිදුවන ප්‍රතිලාභය දැනෙන්නට පුලුවන.

ආර්ථිකයේ වර්ධනයේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාවට නොදැනෙන්නේ නම්, ආර්ථිකයේ වර්ධනයෙන් බහුතරයකට ප්‍රයෝජනයක් සිදු නොවන්නේ ය. එසේ නම් අප රටේ සිදුවිය යුතු විශේෂ වැඩපිළිවෙත් සියල්ලක්ම පාහේ මෙම පදනම හරහා දියත් කිරිමට පුරුදු විය යුතුය.

| වසර | යුද්ධයට වැය කළ මුදල රු. මිලියන | දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස | රාජ්‍ය ණය රු.බිලියන |
|---|---|---|---|
| 1983 | 1,735 | 1.4 | 98 |
| 1984 | 3,289 | 2.1 | 105 |
| 1985 | 5,853 | 3.6 | 130 |
| 1986 | 6,149 | 3.4 | 156 |
| 1987 | 8,978 | 4.6 | 191 |
| 1988 | 7,918 | 3.6 | 224 |
| 1989 | 7,810 | 3.1 | 274 |
| 1990 | 13,339 | 4.1 | 311 |
| 1991 | 14,941 | 4.0 | 367 |
| 1992 | 18,068 | 4.2 | 406 |
| 1993 | 20,781 | 4.2 | 484 |
| 1994 | 26,444 | 4.6 | 551 |
| 1995 | 42,660 | 4.4 | 632 |
| 1996 | 44,933 | 5.8 | 709 |
| 1997 | 45,262 | 5.1 | 764 |
| 1998 | 50,962 | 5.0 | 925 |
| 1999 | 48,717 | 4.4 | 1051 |
| 2000 | 70,773 | 5.6 | 1219 |
| 2001 | 68,290 | 4.9 | 1451 |
| 2002 | 64,050 | 4.0 | 1638 |

# 1.9

## ඉරාක යුද්ධයෙන් ඉගෙන ගත හැකි පාඩම්

මේ වනවිට ඉරාක ප්‍රහාරය අවසන් වී ඇත. මෙම යුද්ධයෙන් ඉරාකයේ ගොඩනැගිලි රාශියක් සුන්බුන් වී තිබේ. ඉරාක ජාතිකයන් විශාල සංඛ්‍යාවක් මරණයට පත් වී ඇත. තුවාල තත්ත්වයට පත් වී ඇත. ඉරාක පාලන තන්ත්‍රය බිඳ වැටී ඇත. මෙසේ ඉරාකයට සිදුවී ඇති හානිය තක්සේරු කිරීමට අද ජාත්‍යන්තර සංවිධාන ඉදිරිපත්වී සිටී.

ඒ අතරම ලෝක ආර්ථිකයට මෙම යුද්ධයෙන් සිදුවී ඇති දැවැන්ත පහර ගැනද අද ආර්ථික විශේෂඥයින්ගේ අවධානය යොමු වෙමින් පවතී. මේ සම්බන්ධයෙන් සංඛ්‍යා ලේඛන සකස් වෙමින් පවතී. සමස්තයක් වශයෙන් මෙම තොරතුරු සහ දත්ත එකතු කරනවාත් සමගම එක් එක් රටවල් ද තම තමන්ගේ රටවල ආර්ථිකයට එල්ලවී ඇති පාඩු සහ අවාසි සම්බන්ධයෙන් අද විග්‍රහ පවත්වමින් සිටී.

අප සියලු දෙනාම දන්නා පරිදි ශ්‍රී ලංකාව වැනි තුන්වැනි ලෝකයේ රටකටත් මෙම කුරිරු යුද්ධයේ ඵල විපාක රාශියක් විඳින්නට සිදුවී ඇත. විශේෂයෙන්ම අප රටේ තේ අපනයනයටද විදේශ රැකියා අංශයටද තද පහර වැදුණි. මෙම විපාක සම්බන්ධයෙන් පැහැදිලි සංඛ්‍යාලේඛන හෝ තොරතුරු හෝ විග්‍රහයන් තවමත් සකස්වී නොතිබුණ ද එම සිදුවීම්වල ප්‍රති විපාක අපට දැනටත් දැනෙමින් පවතී.

එහෙත් අප රටේ එක් අති දුර්වල ලක්ෂණයක් නම්, සාමාන්‍යයෙන් යම් ප්‍රශ්ණයකට සෘජුවම මුහුණ දෙන අවස්ථාවේදී ඒ බව යම් උනන්දුවකින් සහ උද්යෝගයකින් ද කටයුතු කළත් එම ප්‍රශ්නය අපගේ සමීපතම වාතාවරණයෙන් ඈත්වූ විගසින් හෝ එහි

---

2003.05.04 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙත ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

බලපෑම් අඩු වූ පමණින් ඒ ගැන ඉතා ඉක්මණින් අමතක කොට වෙනත් දේවලට සිත යොමු කිරීමය. ඒ ආකාරයටම ඉරාක යුද්ධය පටන් ගන්නවාත් සමගම, එම යුද්ධයෙන් පැන නැගුණු අර්බුදකාරී තත්ත්වයකට කෙටි, මධ්‍යම සහ දිගුකාලීනව අප කෙසේ මුහුණ දිය යුතු දැයි බොහෝ දේශපාලඥයෝ සහ විශේෂඥයෝ තම දැඩි සැලකිල්ල යොමු කළහ. කඩිසර පියවර ගත්හ. දීර්ඝ සාකච්ඡාවල නිරතවූහ. සංකීර්ණ විග්‍රහවල යෙදුනහ.

එහෙත් අද වනවිට යුද්ධය නිමා වූ පමණින්, මෙම සැලසුම් දියත් කිරීම ගැන කිසිවෙක් කතා නොකරති. ප්‍රහාරය පැවති කාලයේදී දියත් කළ වැඩ පිළිවෙත් පවා දැනටමත් අමතක වෙමින් පවතී. මෙය ඉතා අවාසනාවන්තය. වර්තමාන ලෝකයේ පවතින තත්ත්වය අනුව මෙවැනි අර්බුද නැවත නැවතත් ඉස්මතු වීමටද ඉඩ ඇති බව දැනටමත් සියලු දෙනාටම පාහේ අමතකවී ඇත.

සැබැවින්ම අද යුගයේ අවශ්‍යතාව වනුයේ මෙවැනි තත්ත්ව මනාව තේරුම් ගෙන එම තත්ත්වයන්ට ඉදිරියේදී විශ්වාසයෙන් මුහුණ දීම සඳහා සුදුසු පියවර ගැනීමට ශක්තිය ඇති කර ගැනීම නොවේද? එසේ නම්, ඉරාක ප්‍රහාරයෙන් ඇති වූ වාතාවරණය නිසා අපට ඉගෙන ගත හැකි පාඩම් ගැනද අද අප අපේ සිත් යොමු කිරීම ඉතා යෝග්‍යය. නුවණට හුරුය. එම පාඩම් මොනවාද?

පළමු පාඩම නම් අප රටට අත්‍යවශ්‍ය භාණ්ඩ සහ සේවා අප රටේම නිෂ්පාදනය කර ගැනීමට අප ක්‍රම සහ විධි ඉක්මණින්ම දියත් කළ යුතු බවයි. සමහරවිට ජාත්‍යන්තර මූල්‍ය ආයතන මෙවැනි වැඩපිළිවෙත් වලට වැඩි කැමැත්තක් නොදක්වන්නට පුලුවන. එසේ නොකිරීමට හේතු සහ සාධක වශයෙන් ඔවුන් 'සාපේක්ෂ වාසි' (Comparative advantage) වැනි සංකල්ප ගැන දේශනා දුන්නද අප රටේ ස්ථාවර පැවැත්ම සඳහා අප රටට අත්‍යවශ්‍ය භාණ්ඩ සහ සේවා අප රටේම නිෂ්පාදනය කිරීම දිගින් දිගටම කළ යුතුය. මෙම සංකල්ප පිළිබඳව ඉරාක ප්‍රහාරය පටන්ගත් කාලයේදී නම් බොහෝ අය කථා කළාද අද

ඒ සම්බන්ධයෙන් ඒ කතා සියල්ලම අමතක වී ඇති බව පෙනේ. මෙම සත්‍යය අමතක කිරීම ඉතා භයානකය.

අප රටේ බහුතර ජනතාව නියැලී සිටින දේශීය ක්ෂේත්‍ර වන කෘෂිකර්මය, ධීවර සහ ඉදිකිරීම් ක්ෂේත්‍ර ඉතා ඉක්මණින් රැකගෙන දියුණු කිරීම දෙවැනි පාඩමයි. මේ ක්ෂේත්‍රවල දියුණුව හරහා ශ්‍රී ලංකාවේ බහුතර ජනගහනයේ ආදායම් ක්‍රම සහ ජීවන මට්ටම් ඉහළ යනු ඇත. මෙම ක්ෂේත්‍ර දිගින් දිගටම සංවර්ධනය කර ගැනිමට නම් කෘෂිකර්මයේ ඵලය වැඩි කිරීමේ ව්‍යාපෘතිද, අගය එකතු කිරීමේ ව්‍යාපාරයද දිනෙන් දිනම අප රටේ දියත් කළ යුතුය. ඒවාට රජය සහාය දිය යුතුයි.

ලෝක බැංකු වාර්තා අනුව 2002 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදය තම ගොවීන්ට ඇමෙරිකානු ඩොලර් බිලියන 300 ක සහන ලබා දී ඇත. දියුණු රටවල් යෙදී සිටින මෙවැනි ක්‍රියා මාර්ග අප ආදර්ශයට ගත යුතුය. ඒ අතරම, ශ්‍රී ලංකාවට අයත් සුවිශේෂ මුහුදු තීරයෙන් නිසි ප්‍රයෝජනයක් ලබාගෙන ධීවර කර්මාන්තය ඉතා ඉහළ මට්ටමකට වර්ධනය කරමින් මත්ස්‍යයන් ටින් කිරීමේ කර්මාන්තශාලා වහාම ආරම්භ කළ යුතුය. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා සෑම වර්ෂයකම නව අධිවේගී මාර්ගයක් හෝ වරායක් හෝ ගුවන් තොටුපළ වැනි මහා පරිමාණයේ ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. ඒවා හරහා අප රටේ ආර්ථිකයට දේශීය මට්ටමෙන් විශේෂ ගැම්මක් දිගින් දිගටම ලැබෙන අතර රැකියා විශාල ප්‍රමාණයක්ද බිහිවනු ඇත.

අප රටේ ආර්ථිකය තාක්ෂණ යුගයට හැකි ඉක්මණින් සම්බන්ධ කරවීම තුන්වැනි පාඩමයි. මෙයින් අදහස් කරන්නේ තරුණ පරපුරට පරිගණක පරිහරණය කියාදීම පමණක් නොව, පරිගණක සහ අන්තර් ජාලය හරහා ඇතිවන ව්‍යාපාර සහ වෙළෙඳ ක්‍රම තුළින් ආදායම් ලබාගත හැකි අවස්ථාවලට සම්බන්ධ වීමයි. විවිධ පළාත්වල යුද්ධය ක්‍රියාත්මක වෙමින් පැවැතෙන අවස්ථාවලදී ද, තාක්ෂණයට සම්බන්ධ ව්‍යාපාරවලින් නිපදවන භාණ්ඩ සහ සේවා කෙරෙහි ඇති ඉල්ලුම අඩුවන්නේ අල්ප වශයෙන් බව අද හෙළි වී ඇත. එසේ නම්, මෙවැනි තාක්ෂණ ව්‍යාපෘතිවලට අප

හැකිතාක් සමීප විය යුතුය. එහි යෙදෙන අය දිරිමත් කළ යුතුය.

හතරවැනි පාඩම නම්, ශ්‍රී ලංකාව සමග ගනුදෙනු කරන රටවල් අප කලාපයෙන්ම වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමයි. ආනයන අපනයනයද, නිෂ්පාදන සහ සේවා ව්‍යාපාර ද, තාක්ෂණ ව්‍යාපාර ද, සංචාරක ව්‍යාපාරද, අප දකුණු ආසියානු කලාපයේම වැඩි වශයෙන් සම්බන්ධතා ඇතිකර ගැනීමෙන් වර්ධනය කර ගත හැකි නම්, එම තත්ත්වය අපට මහත් වාසියක් වනු ඇත.

ඒ අතරම අපගේ සමීපතම රටවන ඉන්දියාව සමග අප ඉතා කිට්ටු සහ විශේෂ ආර්ථික සහයෝගිතාවකින් කටයුතු කළ යුතුය. ඉන්දියා-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ඉතා සාර්ථකව උපයෝගි කරගෙන, ඒ හරහා වෙළඳාම, තාක්ෂණ, සේවා සංචාරක ව්‍යාපාරය සහ කර්මාන්ත වර්ධනය කළ යුතුය. අප එසේ කළහොත් අප කලාපයෙන් බැහැර ඇති කලාපවල යම් අර්බුද ඇති වුවත් ඒවායින් අප රටට ඇතිවන බලපෑම් සෘජුවම බල නොපානු ඇත.

ඉහත කී පාඩම් ආර්ථික පාඩම්ය. ඒ අතරම දේශපාලන වශයෙන්ද ඉරාක ප්‍රහාරය කේන්ද්‍ර කරගෙන අපට ඉගෙන ගත හැකි පාඩම් රාශියක් ඇත. ඒ පාඩම ද නිසි ලෙස විග්‍රහ කරගෙන, හොඳින් අවබෝධ කරගෙන, අප නායකයන් අප රටේ ඉදිරි ගමන කල්පනාකාරීව හසුරුවා ගත යුතුය.

'නුවණ ඇත්තා අන් අයගේ අත් දැකීම් සහ වැරදි වලින් පාඩම් ඉගෙන ගනී. නුවණ මඳ පුද්ගලයා තමාගේ වැරදිවලින් පාඩම් ඉගෙන ගනී' මෙම පැරණි කියමන එදත් සත්‍යය, අදත් සත්‍යය.

# 1.10

## ජීවන වියදම අඩු කරමුද? පාලනය කරමුද?

භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ ගියත් එසේ ඉහළ යන මිල ගණන්වලට පහසුවෙන් ඔරොත්තු දිය හැකි වන පරිදි අපේ වැටුප් හා ආදායම් ඉහළ යන්නේ නම් ඉහළ නගින ජීවන වියදමේ බලපෑම එතරම් අහිතකරව නොදැනෙනු ඇත. සංවර්ධනය වූ බොහෝ රටවල ජනතාවගේ සාමාන්‍ය වැටුප් වලින් 20% ක් ආහාර පාන සඳහාද 25% ක් පමණ නිවාස සඳහා ද 10% ක් ඇඳුම් පැලඳුම් සඳහා ද 10% ක් අධ්‍යාපනය සඳහා ද 10% විවේකය හා සංචාරය සඳහාද, 15% ක් ඉතිරි කිරීම් සඳහාද වැය වන අතර ඉතිරි ප්‍රමාණය අනෙකුත් විශේෂ කාර්යයන් සඳහා වැයවේ. කෙසේ වුවද සාමාන්‍ය ශ්‍රී ලාංකිකයෙකුගේ වැටුපෙන් 80-90% ක් තරම් ප්‍රමාණයක් ආහාර පාන, නිවාස ආදිය සඳහා වැය වන අතර අනෙකුත් අත්‍යවශ්‍ය දේ සහ අනාගත ප්‍රයෝජන සඳහා ඔවුන්ට ඉතිරි කළ හැකි වන්නේ ඉතා සුළු කොටසක් පමණි. එවැනි වාතාවරණයක ජීවන වියදම ඉහළ යන විට ඊට ශක්තිමත්ව මුහුණ දීම සඳහා ශ්‍රී ලාංකික පුද්ගලයෙකුට ලැබෙන තම වැටුප් හා ආදායම් කිසිසේත් ප්‍රමාණවත් නොවේ.

මේ පිළිබඳව මගේ අදහස නම් අත්‍යවශ්‍ය වෙළඳ භාණ්ඩ හෝ සේවාවල ස්වල්පයක පමණක් විකුණුම් මිල ගණන් අඩු කර ගැනීම හෝ සංශෝධනය කිරීමෙන් හෝ පාලනය කිරීමෙන් පමණක් මේ ගැටලුව විසඳිය නොහැකිය යන්නය. මෙම ගැටලුවට සුදුසු ප්‍රතිචාරය වනුයේ බොහෝ අංශවලට යොමු වූ එකකි. එමෙන් ම අප මතක තබා ගත යුතු තවත් අත්‍යවශ්‍ය කරුණක් නම් මෙම ප්‍රශ්නයට එකම දිගු කාලීන විසඳුම වන්නේ රටේ ආදායම්

---

**2003.06.22 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

මට්ටම හා ඵලදායිකත්ව මට්ටම් ඉහළ නංවාලීම බවය. එබැවින් අපේ ආර්ථික ක්‍රියාකාරිත්වය සියලු අවස්ථාවන් හි දීම මේ අරමුණු දෙක කෙරෙහි යොමු විය යුතු බව පැහැදිලිය. දැනට නම් ආහාරපාන වියදම අප ජනතාව කෙරෙහි බරපතල බලපෑමක් ඇති කරයි. එහෙයින් සිය ඉපැයුම් වලින් දැනට වඩා අඩු කොටසක් වැය කොට ආහාරපාන අවශ්‍යතා සපුරා ගැනීමට අපේ සාමාන්‍ය පුරවැසියන්ට හැකිවන පරිදි ආදායම් මට්ටම් ඉහළ නැංවීමට ප්‍රයත්න දැරීම ඉතා වැදගත්ය. ඒ අනුව අනෙකුත් වියදම් සඳහා තම වැටුප්වලින් හෝ ආදායමෙන් සැලකිය යුතු කොටසක් ඔවුන් මෙතෙක් පාවිච්චි නොකළ භාණ්ඩ හා සේවා වෙනුවෙන් වැය කිරීම නිසා එම භාණ්ඩ හා සේවා සඳහා වන ඉල්ලුම ඉහළ නැංවීමටත් හැකි වනු ඇත. අපේ ජනතාවගේ වර්තමාන ආහාරපාන අවශ්‍යතා ඉටු කිරීම සඳහා රජය වසර 2000 දී රු. බිලියන 9.6 ක වටිනා තිරිඟුද, රු. බිලියන 10.8 ක් වටිනා සීනි ද රු. බිලියන 8.9 ක් වටිනා කිරි හා කිරි නිෂ්පාදන ද ආනයනය කලේය. ඒ ආනයන වල මුලු වටානාකම අප නිතරම කතා කළ යුද්ධයේ වාර්ෂික පිරිවැය මෙන් තුන් ගුණයකටත් වඩා වැඩිය. ඇත්ත වශයෙන්ම ඒ අතිවිශාල මුදල් කන්දරාව අපේම ග්‍රාමීය ගොවීන් නොව පිටරටවල ගොවීන් සහ බහු ජාතික සමාගම් පොහොසත් කරන්නට වියදම් වූ එකක් වශයෙන් අපට හැඳින්විය හැක. මෙම දේ වෙත අපේ ග්‍රාමීය ගොවීන් යොමු කළ හැකි නම් අපේ ග්‍රාමීය කෘෂිකර්ම පදනම විශාල වශයෙන් සංවර්ධනය වනු ඇති අතර ඉහළ යන ජීවන වියදමට වැඩි විශ්වාසයකින් හා නිශ්චිත බවකින් යුතුව මුහුණ දීමට ද අප ජනතාවට හැකි වනු ඇත.

දිගු කාලීන විසඳුමක් වශයෙන් ආනයනය කල තිරිඟු පිටි පාන් වෙනුවට දේශීය වශයෙන් නිෂ්පාදනය වන කුරක්කන් පරිප්පු මුං ඇට සහ ධාන්‍ය වලින් සැදු ආහාර පරිභෝජනයට ශ්‍රී ලාංකිකයින් ක්‍රමයෙන් පුරුදු කර වීම වැදගත්ය. අපේ කෘෂිකර්මය දියුණු කිරීමේ ආරම්භක ක්‍රියා මාර්ගයකට සහය වීමට අප සැබැවින්ම උනන්දු වේ නම් සමාජයක් වශයෙන් අපි එබඳු ආකාරයේ සැලසුමක් දියත් කළ යුත්තෙමු. සංවර්ධිත රටවල් ඔවුන්ගේ ගොවීන් සහ ව්‍යාපාරිකයන් ආරක්ෂා කරති.

තමන්ගේ ම රටවල නිෂ්පාදිත භාණ්ඩ හා නිෂ්පාදන මිලදී ගන්නා ලෙස තම පුරවැසියන්ට එම රටවල නායකයින් උපදෙස් දෙති. ඇයි අප එසේ නොකරන්නේ? එබඳු කාරණාවලදී අපේ නායකයන් නිර්භයව මග පෙන්විය යුතුය. තමන් දේශනා කරන දෙය තමන් එසේම අනුගමනය කරත් නම් අප ජනතාවද ඉතා කැමැත්තෙන් එම නායකයින් අනුගමනය කරනු බව මට විශ්වාසය.

ඉහළ යන ජීවන වියදම පාලනය කිරීමට ප්‍රයත්න දැරීම යන කාරණය සම්බන්ධයෙන් අප කළ යුත්තේ මිල ගණන් අඩු කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමය පමණක් අනුගමනය කරනු වෙනුවට නව ක්‍රම ගැන සිතීමය. මා වරදවා තේරුම් ගැනීම වළක්වනු පිණිස පාරිභෝගිකයාට යම් සහනයක් සැළසෙන පරිදි මිල අඩු කිරීම්වලට මගේ විරුද්ධත්වයක් නැති බව කියනු කැමැත්තෙමි. අතිශයෙන් දිළිඳු අයට තෝරාගත් සහනාධාර ලබා දීමට සහ ආදායම් උපකාරක යෝජනා ඇති කිරීමට මම සම්පූර්ණයෙන් එකඟ වෙමි. අප රටේ දිළිඳු ජනයා විශාල සංඛ්‍යාවක් සිටින අතර ලිබරල්කරණය වූ ආර්ථිකයක අභියෝග වලට මුහුණ දීමට හැකි පරිදි දුප්පත් ම කොටස් ශක්තිමත් වන තුරු දිළිඳු ජනයාට ඍජු සහන සලසන උපාය මාර්ග දිගටම අනුගමනය කළ යුතුය. එහෙත් ජාතික ආර්ථිකයක් තුළ නිෂ්පාදකයන් පාරිභෝගිකයන්ද වන බව අප අමතක නොකළ යුතුය. එබැවින් නිෂ්පාදකයන් ආර්ථික වශයෙන් වඩා ශක්තිමත් වන විට ආර්ථික චක්‍රය වඩා ප්‍රාණවත් වන බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් දිගු කාලීනව හා මධ්‍යම කාලීනව හැම දෙනාටම ප්‍රතිලාභ ලැබෙන බවත් අපි මතක තබා ගත යුත්තෙමු.

# 1.11

# කොට් සංවිධානයේ ආර්ථික යෝජනාවලින් පාඩම් උගනිමු

2003 නොවැම්බර් මස මුල් කොටසේදී, කොට් සංවිධානය රජයට සහ රටට හෙළි කළ යෝජනා පද්ධතියේ මුල් පදනම වූයේ යෝජිත අන්තර් ස්ව පාලන අධිකාරියකට බලතල රාශියක් විමධ්‍යගත කිරීමේ ඉල්ලීමය. මෙම පදනම හරහා මෙම ඉල්ලීම් වලින් කිපයක්ම සෘජුවම දේශපාලනික යෝජනාය. ඒවා සම්බන්ධව මෙම විග්‍රහයේ කරුණු විශ්ලේෂනය කිරීමට මා බලාපොරොත්තු නොවෙමි. ඒ අතරම ඒවායින් සැලකිය යුතු කොටසක් මුලු රටේම ආර්ථිකයටද, මූල්‍ය පාලනයටද මුදල් විමධ්‍යගත කිරීමේ දී සැලකිය යුතු සාධක වලටද ඉතා වැදගත් බලපෑම් දක්වන ඒවා වනු ඇත. ඒ නිසා අපගේ සැලකිල්ල ඒවා දෙස ආර්ථික කෝණයකින් යොමු කිරීම වටී යයි මගේ හැගීමයි.

වාර්ෂික අයවැයක් පිළියෙළ කිරීම, පිටරට ආධාර සහ ණය සෘජුවම ලබාගැනීම සහ පුනුරුත්ථාපනය සඳහා උතුරට සහ නැගෙනහිරට ලැබීමට නියමිත මුදල් යෝජිත අධිකාරියට ලබා දීම, කොට් සංවිධානයේ යෝජනා වශයෙන් ඉදිරිපත් කොට ඇත. වර්තමාන පළාත් සභා වලට තම අයවැය පිළියෙල කරගැනීමේ බලය අද තිබේ. එහෙත් එම බලය පාවිච්චි කරමින් තම ප්‍රදේශවලට 'දැනෙන' සංවර්ධනයක් ඇති කිරීමට පලාත් සභා අපොහොසත් වී ඇත. සෑම විටම ඔවුන්ට සිදුවී ඇත්තේ තම වැඩ කටයුතු වලට මධ්‍යම රජයේ අනුග්‍රහය ලබා ගැනීමය. එහෙත් අවාසනාවකට මෙන්, බොහෝ අවස්ථා වලදී ඔවුන්ට එවැනි මුදල් මධ්‍යම රජය හරහා ලබාගැනීමට බැරිවී ඇත. අප රටේ පළාත් සභා ක්‍රමයක් තිබුණද, එම පාලන පද්ධතිය මග හරවා සංවර්ධන වැඩ පිළිවෙත් සෑම විටම පාහේ දියත් කරන්නේ

---

**2003.11.09 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

මධ්‍යම රජයයි. ඒ තුළින් පළාත් සභා, මේ වන විට එදිනෙදා කටයුතු සඳහා වැටුප් ගෙවන ආයතනයන් ලෙස ජනතාව දකිති. ආරම්භ වී අවුරුදු 15 ක් පසුව, පළාත් සභා වලට බලය විමධ්‍යගත කර ඇතැයි කොපමණ කිවත්, සෘජුවම සහ වක්‍රාකාරව මුදල් බලය තම අත තබා ගැනීමෙන්, මධ්‍යම රජය 'සත්‍ය බලය' තමා සතුවම තබා ගෙන ඇති බව, අකමැත්තෙන් හෝ අපට පිලිගන්නට සිදුවෙනු ඇත. එසේ නම්, මෙම තත්ත්වය සහ මධ්‍යම රජයක සාමාන්‍ය ආකල්පය හඳුනාගෙන ඇති කොට් සංවිධානය, සෘජුවම දේශීය හෝ විදේශීය ණය හෝ ආධාර ලබා ගැනීමේ බලය ඉල්ලා ඇතැයි අපට සිතිය හැක. තවද, එවැනි ආකල්පයක් හරහා මධ්‍යම රජයක් කටයුතු කරන තෙක් එම යෝජනාවේ සාධාරණත්වයක් ඇතැයිද අපට හැගෙනු ඇත.

යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් මධ්‍යම රජයට 'අකිකරු' එකක් ලෙස මධ්‍යම රජය සැලකුවහොත් හෝ පෙනුනහොත් එම ආයතනය, ජනතා ඡන්දයෙන්ම පත්වූ එකක් වුවද, එය 'මට්ටු' කිරීමේ කදිම 'ආයුධයක්' මධ්‍යම රජය සතුව තිබුණි. මෑත අතීතය දෙස බලන විට අපට පෙනී ගොස් ඇත්තේ සෑම රජයක්ම මෙම ආයුධය තම වාසියට පාවිච්චි කොට ඇති බවය. එවැනි 'සදාචාරයක්' රටේ පාලන තත්ත්වයේ පවතිත් දී, මධ්‍යම රජයක අනිසි තර්ජන වලට යටත් නොවී කටයුතු කිරීමට ක්‍රමයක් සොයා යෑම පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක ස්වභාවික ක්‍රියාවක් ලෙස සමහර විශ්ලේෂකයින් පෙන්වා දිය හැක. මෙවැනි වාතාවරණයක් හරහා හටගන්නා බියක් තමන්ට තිබියදී මුදල් සම්බන්ධව වැඩි බලතල කොට් සංවිධානය තම අධිකාරියට ඉල්ලා සිටීම පුදුමයට කරුණක් ලෙස මම නොදකිමි.

ඇත්ත වශයෙන්ම, පලාත් සභා ක්‍රමය ගැන ජනතා අප්‍රසාදය බොහෝ දුරට වර්ධනය වන්නට තුඩු දුන් විශේෂ කාරණයක් නම් 'අපේ පළාත් සභාවලට කිසිවක් කරන්න සල්ලි නැහැ', 'ඔවුන්ට මහ ආණ්ඩුවෙන් යමක් නොලැබුණ හොත් ඔවුන් ඉවරයි', යන හැගීම අද ජනතාව තුළ කාවැදී ඇති බැවිනි. මෙවැනි හැගීම් ජනතාව තුළ ඇති කිරීමට මූලික හේතුව හැටියට අපට දැක්විය

හැක්කේ මධ්‍යම රජයන්හි ආත්මාර්ථකාමී සහ අදූරදර්ශී ක්‍රියාවන්ය. එසේ ක්‍රියා නොකර ඔවුන් අවංකවම දේශපාලනික බලයට සමගාමීව සහ සමාන්තරව සංවර්ධනය සඳහා පළාත් සභාවලට අවශ්‍ය ආධාර සහ ණය යොදවා ඔවුන්ගේ බල ප්‍රදේශ සංවර්ධනය කිරීමට ශක්තිය සහ අවස්ථාව ලබා දුන්නා නම්, අද අප රටේ දේශපාලනික සහ ආර්ථික තත්ත්වය හාත්පසින්ම වෙනස් වීමට තිබුණි. එසේ වුවා නම්, පළාත් සභා ක්‍රමය රටේ සමතුලිත සහ සාධාරණ සංවර්ධනයක් සඳහා යෝග්‍ය, සහ සාර්ථක ක්‍රමයක් ලෙස වැඩී දෙනා දකින්නටද ඉඩ තිබුණි. එම අවස්ථා ලබා නොදී කෙටිකාලීන සහ පටු පක්ෂ දේශපාලනික වාසි පසුපස පන්නමින් මධ්‍යම රජයන් ජනයා තුළ ඇති කරවා ඇති අසතුටුදායක දේශපාලනික සහ සාමාජික හැගීම් නිසා අද අපට සිදු වී ඇත්තේ වර්තමාන ලෝකයේ පවතින ෆෙඩරල් ක්‍රම අතරින්, ඉහළම මට්ටමේ බලය සහ මුදල් විමධ්‍යගත කිරීමේ සහ බෙදා ගැනීමේ යෝජනා මාලාවකට ප්‍රතිචාර දැක්වීමටය. මධ්‍යම රජයේ මූල්‍ය පාලනයට යටත් නොවී සෘජුවම විදේශීය සහ දේශීය ආධාර සහ ණය ලබා ගැනීමේදී සැලකිය යුතු කරුණු සහ අභියෝග සංකීර්ණ ඒවාය. ඒවා පිළිබඳ පුලුල් සාකච්ඡාවක් අවශ්‍යය. එවැනි ක්‍රියාමාර්ගයකට පිවිසීමට පෙර අප කළ යුතු කාර්යයන් බොහොමය. සැළකිය යුතු සාධක බොහොමය. අවධානමට ලක් කළ යුතු කරුණු බොහොමය. ඒ අතරම, එවැනි යෝජනාවකට තුඩු දුන් හේතුන් අප හඳුනාගත හොත් එම හේතුන්වලට විසඳුම් වෙනත් විකල්පයන් හරහා අපට ලබා දිය හැකිද යන්නද අපට සැලකිය හැකිය. ඒ නිසා, කොට් සංවිධානයේ මෙම යෝජනාවේ අන්තර්ගත වී ඇති මෙම සැගවී ඇති බිය තුරන් කිරීමට වෙනත් ක්‍රමයන්ද අප සාකච්ඡාවට ලක් කළ යුතුය.

පුරා වසර 20 ක් මුලුල්ලේ සාගර නීතිය හරහා ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයට සාපේක්ෂව හත් ගුණයක් පමණ විශාල මුහුදු ප්‍රදේශයක් ශ්‍රී ලංකාවේ භුක්තියට යටත් වුනි. එම දශක දෙකක පමණ කාලය තුළදී මෙම විෂය සම්බන්ධව යම් දැනුමක් සහ අවබෝධයක් ඇති බොහෝ දෙනා මේ සම්පතින් නිසි ප්‍රයෝජන සහ ඵල නෙලා ගන්නා ලෙසට රජයට ඉල්ලීම් කර ඇතත් යෝජනා ලබා දී ඇතත් ඒවා ගැන අප රටේ

රජයන් වැඩි උනන්දුවකින් කටයුතු කර නැත. එහෙත්, කොටි සංවිධානය නම් තම යෝජනාවල අප මුහුදු කරයේ සම්පත් නෙලා ගැනීමේ බලතල ඉල්ලා ඇත. සමහරවිට, මෙම ඉල්ලීම කිරීමට, ඔවුන් තුළ ආර්ථික හේතුන් හැරුණු විට, වෙනත් නොකියන ලද හේතුන් තිබිය හැක. ඒ කෙසේ වුවත්, ඔවුන් මෙම සම්පත ගැන අපට මතක් කිරීමත් කර ඇති ලෙසද අපට සිතිය හැක. අද ලෝකයේ පවතින ෆෙඩරල් ක්‍රමයන් යටතේ සාමාන්‍යයෙන් මුහුදේ සහ වෙරළේ බලතල ප්‍රාන්ත රජයන්ට නොපැවරුවද, මෙවැනි ඉල්ලීමක් කිරීමෙන් කොටි සංවිධානය වක්‍රාකාරව පෙන්වා දෙන්නේ ඔවුන් මෙම සම්පතින් ඵල නෙලා ගැනීමට කටයුතු කිරීමට ලැස්ති බවය. අප රටේ මධ්‍යම රජයන් මෙම සම්පත පිළිබඳව අවශ්‍ය කැක්කුමක් නොදැක්වුවද ඒවායින් ඵල නෙලා ගැනීමට තවත් අය සිටින බව අප අමතක නොකළ යුතුය. මේ සම්බන්ධව කොටි සංවිධානය මතක් කරදීම ගැන අප සන්තෝෂ විය යුතු අතර දැන්වත් සාගර සම්පත පිළිබඳව පුලුල් වැඩ පිළිවෙලක් අප ආරම්භ කළ යුතුය. මෙම සම්පත හරහා දියත් කරන්නට හැකි සංවර්ධන ක්‍රියාවලින්, අප රටේ ඊළඟ වසර 20 තුළ ඇති කිරීමට බලාපොරොත්තු වන අවශ්‍ය ආර්ථික දියුණුවේ ඉතා විශේෂතම අංගයක් ලෙස මම දකිමි.

# 1.12

## යෝජිත ස්වයං විශ්‍රාම වරප්‍රසාද ක්‍රමයට විකල්පයක්

2000 වසරේදී ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය පිළිබඳව පුළුල් විග්‍රහයක් කරද්දී ලෝක බැංකුව උපුටා දැක්වූ එක් කරුණක් නම් අප රටේ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ නියැලී සිටින සේවක සංඛ්‍යාව ලක්ෂ 8 ක් පමණ බවත්, එය ජනගහන ප්‍රතිශතයක් වශයෙන් දක්වන විට, සෑම පුද්ගලයින් දහසකට 57 ක් පමණ වන බවත්ය. මෙම සංඛ්‍යාව ආසියාවේ ඉහළතම සංඛ්‍යාවක් වන අතර, දියුණු රටවල ඊට සමාන්තර අගය වන්නේ පුද්ගලයින් දහසකට 9 ක පමණ සංඛ්‍යාවකි. එසේ නම්, දියුණු රටක සාමාන්‍ය අගය සමග සන්සන්දනය කරන විට, අප රටේ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ සේවය කරන පිරිස ඒ රටවල සංඛ්‍යාව මෙන් 6 ගුණයකටත් වඩා අධික සංඛ්‍යාවක් බව පෙනේ. ඉන්දියාව සහ පාකිස්ථානයේ සෑම පුද්ගලයින් දහසකටම රාජ්‍ය සේවකයන් 19 ක් පමණ ඇති අතර, බංගලාදේශයේ එම සංඛ්‍යාව 10 කි. එහෙත්, ශ්‍රී ලංකාවේ මෙපමණ වැඩි සංඛ්‍යාවක් තිබියදීත්, ඕනෑම රජයේ ආයතනයක් ගැන තොරතුරු විමසද්දී එම ආයතන වල ප්‍රධානීන්ද, නිලධාරීන්ද, මැති ඇමතිවරුන්ද කියා සිටින්නේ 'අපට සේවකයන් හිගයක් ඇතැයි' කියාය. මෙයින් විදහා දැක්වෙන්නේ වැඩ රාජකාරී පිළිබඳව නිසි අවබෝධයක්ද, ඵලදායිතාවය ගැන දැනුමක්ද, වැඩ පිළිබඳව තිබිය යුතු ආචාරධර්ම (Work ethic) පිළිබඳව සැක්කුමක්ද, රාජකාරිය පිළිබඳව හැගීමක්ද, අප රටේ බොහෝ දෙනා තුළ නැති බවය.

සමහරවිට මෙම තත්ත්වය ගැන සැලකිලිමත්වූ රජය පසුගියදා ඉදිරිපත් කළ අයවැයෙන්, රාජ්‍ය සේවක සංඛ්‍යාව අඩුකර ගැනීම

---

**2003.11.30 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

සඳහා ස්වයං විශ්‍රාම වරප්‍රසාද ක්‍රමයක් යෝජනා කොට ඇත. එම යෝජනාව අනුව විශ්‍රාම යෑමට එකගවන රජයේ සේවකයින්ට එකවර වසරක වැටුපක්ද, ඉන්පසු අවුරුදු 55 වනතුරු ඔවුන් ලබමින් සිටි මාසික වැටුප ගෙදර සිටම ලබාගැනීමේ වරප්‍රසාදයද, ලබාදීමට යෝජනා වී ඇත. මෙම ක්‍රමය හරහා රජයේ සේවකයන් දෙලක්‍ෂයක් පමණ ඉදිරි වසර දෙක තුළදී විශ්‍රාම යතැයි රජය බලාපොරොත්තු වේ.

මෙම යෝජිත ක්‍රමය සියුම් සැලකිල්ලකට භාජනය කළහොත් අපට පෙනෙන්නේ, විශ්‍රාම යැවෙනවායි සැළකෙන පුද්ගලයින් සේවයට නොපැමිණියත්, ඔවුන්ගේ පඩි නඩි ගෙවන්නේ නම් අප කුමන දෙයක් අපටම කියා ගත්තත්, ඔවුන් ඇත්ත වශයෙන්ම 'සේවකයන්' බවය. එසේ නම්, ඒ තුළින් රාජ්‍ය සේවක සංඛ්‍යාවේ සත්‍ය අඩුවීමක් සිදුනොවීම, යථාර්ථයයි. තවද, මෙවැනි ක්‍රමයක් හරහා සේවකයින්ට විශ්‍රාම යාමේ අවස්ථාව ලැබෙන විට, අනිවාර්යයෙන්ම එම දීමනාවෙන් පළමුවෙන්ම ප්‍රයෝජනය ලබා ගන්නේ, වෙනත් රැකියාවලට හෝ අලුත් ව්‍යාපාර වලට යොමු වීමට හැකියාවක් සහ ශක්තියක් සහිත ඉහළ මානුෂික සහ දැනුම් මට්ටමක පසුවන සේවකයින්ය. එවැනි සේවකයින්, රාජ්‍ය සේවයෙන් ඉවත්ව යාමෙන් සැලකිය යුතු හිඩසක් කෙටි කාලීනව ඇතිවීමෙන්, ඒ තුළින් දැනටමත් දුර්වල රාජ්‍ය සේවය තව දුරටත් දුර්වල වනු නොඅනුමානය. එපමණක්ද නොව, ඒ ආකාරයට රාජ්‍ය සේවාවන් අඩපණ වුවහොත් පැණ නගින ප්‍රශ්න නිරාකරණය කරගැනීම සඳහා, පාලකයින් නැවතත් සේවකයින් සෘජුවම බඳවා නොගත්තත්, එම සේවාවන්ම 'කොන්ත්‍රාත්' ක්‍රමයට ලබාදීමට පෙළඹෙන්නට පුලුවන. එවිට, සමහරවිට විශ්‍රාම ගිය පුද්ගලයින්ම, ඔවුන් පෙර නිරතවී සිටි සේවයන්ම 'කොන්ත්‍රාත්' ක්‍රම හරහා සැපයීමට කටයුතු යොදවන්නටද බැරි නැත. තවද, කලක් ඇවෑමෙන් පසු, අනාගතයේදී පත්වන නව රජයන් නැවත වරක් දේශපාලනික හෝ අනිකුත් හේතුන් මත, 'අලුත්' සේවකයින් රජයේ සේවයට බඳවා ගැනීමට ද කටයුතු කිරීමට ඉඩ ඇත. එවිට, අද මෙම යෝජනාව හරහා 'අඩුකරගත්තායයි' කියන සේවක සංඛ්‍යාව නැවත වරක් පළමුවෙන් තිබූ සංඛ්‍යාවටම වැඩි වන්නටද පුලුවන.

එසේ නම්, විසඳුම කුමක්ද? විසඳුම සෙවීම සඳහා රජයේ යෝජනාවේ අන්තර්ගත ගැඹුරු පරමාර්ථ ගැන බිඳක් සොයා බලමු. රජයේ අරමුණ වී ඇත්තේ රාජ්‍ය සේවය ඵලදායි කිරීමත්, රජයේ සේවකයින්ට ඵලදායි ලෙස සේවයක් ඉටුකිරීමට ඇති හැකියාවන් සහ අවස්ථා පුලුල් කිරීමත් බව රජය පවසා ඇත. මෙය ඉතා නිවැරදි සහ වටිනා චේතනාවකි. ඒ අතරම, රජයේ පරමාර්ථය ඉෂ්ට කරගැනීමට යෝජනා කර ඇති ක්‍රියා මාර්ගය දියත් කිරීම සඳහා වැයකිරීමට බලාපොරොත්තු වන මුදල කොපමණදැයි ද සලකා බැලීම යෝග්‍යය. විශ්‍රාමගත වන එක් සේවකයෙකු සඳහා වසරක වැටුප දළ වශයෙන් රුපියල් ලක්ෂයක් යන පදනම මත සේවකයින් ලක්ෂයක් මෙම යෝජිත වරප්‍රසාදය ලබාගතහොත්, රජයේ යෝජනාව වෙනුවෙන් රුපියල් මිලියන 10,000 හෝ කෝටි 1,000 ක් වැයවේ. එමෙන්ම, මෙම යෝජනාව හරහා සේවකයින් දෙලක්ෂයක් විශ්‍රාම ගැනීම සඳහා ක්‍රියාත්මක වුවහොත්, ඒ සඳහා රජයට වැය කිරීමට සිදුවන මුදල රුපියල් කෝටි 2,000ක් පමණ වේ. ඒ අතරම, අප සියලු දෙනාම දන්නා පරිදි සාමාන්‍යයෙන් රජයේ ආයතනයක් සමග ගණුදෙනු කරන අයගේ මතය වන්නේ රජයේ සේවකයින් බොහෝ දෙනෙකුට 'වැඩ' කෙරෙහි ඇති ආචාරධර්ම ඉතා අඩු බවය. මෙම තත්ත්වය වෙනස් කිරීමට නම්, 'ප්‍රතිඵල' හරහා සකස්වී ඇති පාලන තන්ත්‍රයක්ද, සේවකයින් තුළ ආකල්ප වෙනස් කිරීමක්ද සිදුවිය යුතු බව ඔවුන්ගේ අදහසයි. එවැනි තත්ත්වයක් ඇතිකිරීමට නම් විශේෂ, සැලසුම් සහගත, දැවැන්ත පුහුණු වැඩ පිළිවෙලක් දියත් කළ යුතු වන්නේය. මෙම පුහුණු පාඨමාලාව සඳහා අවශ්‍ය වන මුදල ඉහත යෝජිත ස්වයං විශ්‍රාම වැඩ සටහන දියත් නොකරන්නේ නම් ඒ වෙනුවෙන් රජය වෙන් කිරීමට බලාපොරොත්තු වූ මුදලෙන් කොටසක් පහසුවෙන්ම ලබාගැනීමට හැකි වන්නේය. එසේ නම්, රජයේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන රුපියල් කෝටි 2,000 වෙනුවට, එම මුදල දැනට සේවයේ සිටින රාජ්‍ය සේවකයින් අටලක්ෂයේ අධ්‍යාපනය සහ පුහුණුව සඳහා යෙදවුවහොත්, එක් සේවකයෙකුගේ පුහුණුව වෙනුවෙන් රුපියල් 25,000 පමණ විශාල මුදලක් රජයට ආයෝජනය කිරීමට හැකි වන්නේය. එවිට රාජ්‍ය සේවකයන්ට මනා පුහුණුවක්

ලබාදීමට හැකිවන අතරම, ඔවුන්ගේ දැනුම සහ කාර්යක්ෂමතාවයද වර්ධනය කළ හැකි වන්නේය. ඒ අතරම, ප්‍රතිපත්තියක් වශයෙන් සෑම වසරකම විශ්‍රාම යන රාජ්‍ය සේවක පුරප්පාඩු නොපිරවීමටද රජය ඍජු තීරණයක් ගත යුතුය. එවිට, රාජ්‍ය සේවකයන්ගේ මුළු සංඛ්‍යාව වසර දෙක තුනකින් එක් ලක්ෂයකින් පමණ ඉබේම පාගේ අඩු වෙනු ඇත. එපමණක්ද නොව, දැඩි පුහුණුව තුළින් රජයේ සේවකයන්ගේ කාර්යක්ෂමතාවය සහ වැඩ පිළිබඳ ආචාරධර්ම වර්ධනය වනවාත් සමගම, නවත් නව වැඩපිළිවෙත් වලට ඒ අය යොමු කිරීමටද රජයට හැකි වන්නේය.

අද සිංගප්පූරුවේ සෑම පුද්ගලයින් දහසක් දෙනෙකුට ඇති රාජ්‍ය සේවකයන්ගේ සංඛ්‍යාව 37 කි. මෙම සංඛ්‍යාව, යම් ආකාරයකට ඉහළ සංඛ්‍යාවක් ලෙස පෙනුනත්, ජනතාව වෙනුවෙන් සිංගප්පූරු රජයෙන් සිදුවන කාර්යයන් ඉතා බහුලය. එසේ නම්, අප රටේ රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව ඉන්දියාවේ පවතින මට්ටමටම අඩු කිරීමට අප අපොහොසත් වූවත්, සිංගප්පූරුවේ පවතින අනුපාතය දක්වාවත් අඩුකර ගන්නා අතරම කාර්‍යක්ෂමතාවය සහ රාජකාරිය කෙරෙහි ආචාරධර්ම වර්ධනය කර ගැනීමට අපට හැකි වුවහොත්, අපගේ රාජ්‍ය සේවය දැනට වඩා සැලකිය යුතු ඉහළ තත්ත්වයකට පරිවර්ථනය කරගැනීමට අපට හැකිවනු ඇත.

# 1.13

## තවත් 60,000 ක් රජයේ සේවයට බඳවා ගැනීමට හැකිවේද?

අද, ශ්‍රී ලංකාවේ රජයේ සේවකයන් 800,000 කට අධික සංඛ්‍යාවක් සේවය කරන බව වාර්තා වී ඇත. රටේ ජනගහනයෙන් ප්‍රතිශතයක් වශයෙන් එම සංඛ්‍යාව විදහා දැක්වුවහොත්, එම ප්‍රතිශතය ලෝකයේ අනිකුත් රටවලට සාපේක්ෂව ඉහළතම ස්ථානයක පවතී. රජයේ දෙපාර්තමේන්තු වලින්ද, අනිකුත් පළාත් සභා සහ පාලන ආයතන වලින්ද, ශ්‍රී ලංකා රජයෙන්ද, සිදු කරනු ලබන සමස්ත සේවාවන් තක්සේරු කරන විට, එම කාර්යයන් කාර්යක්ෂමව ලබාදීම පිණිස සේවය කළ යුතු සේවකයන්ගේ සංඛ්‍යාව ඉහත කී 800,000 සංඛ්‍යාවෙන් අඩකටත් වඩා අඩුවිය යුතු යැයි ද, ඵලදායිතාව පිළිබඳව නිකුත් වී ඇති පිළිගත් තක්සේරු වලින් හෙලි වී ඇත. එපමණක්ම නොව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ සේවය කරන අධික සංඛ්‍යාව පිළිබඳව ලෝක බැංකුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද, අනිකුත් ණය දෙන රටවල් සහ ආයතනද තමන්ගේ දැඩි කණස්සල්ල විටින් විට ප්‍රකාශ කොට ඇති බව නොරහසකි.

පසුගිය මැතිවරණයේදී ජනතාවට දෙන ලද විශේෂ පොරොන්දුවක් අනුව, වර්තමාන රජය, උපාධිධාරීන් සහ තරුණයන් අතර විරැකියාව ප්‍රශ්නයට සෘජු පිළිතුරක් වශයෙන්, රැකියා අවස්ථා 60,000 ක් ඊළඟ මාස කිපය තුල රාජ්‍ය අංශයෙන් බිහිකිරීමට අදහස් කොට ඇති බව අපට දැන් වාර්තා වෙමින් පවතී. මෙම විරැකියා ප්‍රශ්නයට ප්‍රතිචාර වශයෙන් උත්සාහයන් ගැනීම ඉතා අගනා ක්‍රියාවලියක් වුවද, යෝජිත ක්‍රියාවලියේ මූල්‍යමය ඵල විපාක ගැන යම් පූර්ව තක්සේරුවක් කරන්නේ නම් එය නුවණට හුරුයයි මගේ මතයයි.

---

**2004.06.13 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

රජය දියත් කිරීමට බලාපොරොත්තු වන 'රැකියා 60.000' යෝජනාව පිළිබඳව ප්‍රාථමික විග්‍රහයක් කිරීමට සුදුසු පදනමක් ලෙස 2003 වසර ගැන නොබෝදා මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රජයේ මූල්‍ය තොරතුරු සලකා බැලීම අදාල යයි මා සිතමි. ඒ අනුව, 2003 වසර තුළ රජයේ මුලු වියදම රුපියල් බිලියන 418 ක් වූ අතර, එයින් රුපියල් බිලියන 92 ක් වැටුප් සඳහා ද, රුපියල් බිලියන 125 ක් පොලී ලෙසද, රුපියල් බිලියන 71 ක් සහනාධාර වෙනුවෙන් ද රජය විසින් වැය කරන ලදී. තවද, 2003 වසරේදී රජය විසින් එකතු කරන ලද මුලු බදු ප්‍රමාණය රුපියල් බිලියන 232 ක් වූ අතර, එයින් රුපියල් බිලියන 97 ක් වැට් බද්ද හරහා ද රුපියල් බිලියන 39 ක් ආදායම් බදු වලින් ද, රුපියල් බිලියන 34 ක් රේගු බදු වශයෙන් ද, රුපියල් බිලියන 51 ක් සුරා බදු ලෙස ද, රජය රැස් කලේය.

ඒ අතරම, පුද්ගලීකරණය හරහා භාණ්ඩාගාරයට ලැබුනු මුලු පිරිවැටුම රුපියල් බිලියන 10 ක් ද, අය වැය පරතරය පියවීම සඳහා රජය දේශීයව ගත් ණය රුපියල් බිලියන 80 ක් ද, විදේශීයව ගත් ණය රුපියල් බිලියන 43 ක් ද, ආධාර වශයෙන් ලබාගත් මුදල රුපියල් බිලියන 8 ක් ද වුනි.

රජයේ අය වැය තත්ත්වය මෙසේ පවතිත්දී, වර්තමාන රජය, රාජ්‍ය සේවයට තවත් 60,000 ක පිරිසක් බඳවා ගනිමින්, ඒ අය වෙනුවෙන් අවම වශයෙන් රුපියල් 7,000/- ක වැටුපක් වත් ගෙවුවහොත් ඒ සඳහා වසරකට රුපියල් බිලියන 5 කට වැඩි වියදමක් රජයට දරන්නට සිදු වන බව අපට ගණනය කළ හැක. එම නව වියදම පියවීම සඳහා නව ආදායම් මාර්ගයන් රජය සොයා නොගතහොත්, ඒ සඳහා අවශ්‍ය වන මුදල, ආදායම් හෝ වැට් හෝ සුරාබදු හෝ රේගු බදු හරහා, එකතු කරගන්නට සිදු වන්නේය. උදාහරණයක් වශයෙන් වැට් බදු තුළින් එම රුපියල් බිලියන 5 ක පමණ මුදල ලබා ගන්නට රජය අදහස් කළ හොත්, රජයට සිදු වන්නේ දැනට පවතින වැට් ගෙවන්නන්ගේ දැල තව 6% කින් පමණවත් පුලුල් කිරීමට කටයුතු කිරීමටය. එසේ නැතහොත්, දැනට පවතින 15% වැට් බදු අනුපාතය 16%

දක්වාවත් ඉහළ නැංවීමටය. එවැනි විකල්පයන් රජය තෝරා නොගතහොත්, වෙනත් බද්දක් වැඩි කිරීමට හෝ පෞද්ගලිකරණයෙන් එම අමතර මුදල ලබා ගැනීමට සිදුවන්නේය. නව රජය ජනතා බදු ලිහිල් කිරීමටද, සහනාධාර වැඩි කිරීමටද, පෞද්ගලිකරණය නැවැත්වීමටද බැඳී සිටී. එබැවින්, අවශ්‍ය අමතර මුදල් සොයා ගැනීම සඳහා, වෙනත් විකල්පයන්ට යොමු වීමට රජයට සිදුවනු ඇත. එහෙත් අද ලෝකයේ පවතින ආර්ථික සහ අය වැය සම්ප්‍රදායන් සහ ක්‍රම අනුව රජයකට මුදල් උපයාගැනීමේ ක්‍රම සීමිත බව අප අමතක නොකළ යුතුය. එපමණක්ද නොව, ජනතාවගෙන් අයකර ගත හැකි බදු ප්‍රමාණය ද සීමිතය. තවද එසේ එකතු කර ගන්නා බදු ප්‍රමාණය රටේ ආර්ථික වාතාවරණයට සහ වර්ධනයට සාපේක්ෂ විය යුතුය. එවැනි පසුබිමක, නව අමතර වැයක් වශයෙන් රුපියල් බිලියන 5 කට අධික මුදලක් රජය සොයාගැනීමට නම්, බොහෝවිට, දැන් පවතින තත්ත්වය අනුව, එම මුදල දේශීයව හෝ විදේශීයව ණය වශයෙන් රජයට ලබා ගන්නට සිදු විය හැක. ඒ අතරම, වැය කිරීමට බලාපොරොත්තු වන මුදල් තුළින් යම් ස්ථිර ප්‍රතිඵලයක් හෝ වාසියක් ලැබෙන බව පැහැදිලිව විදහා දැක්වීමට රජය අපොහොසත් වුවහොත්, විදේශ ණය දෙන ආයතන වලින් හෝ රටවලින් එවැනි මුදලක් ණයට ගැනීමට ඇති අවස්ථාවන් බොහෝ දුරට අඩු වනුද නොඅනුමානය. ඒ නිසා, රජයට නිසැකයෙන්ම පාහේ සිදුවිය හැක්කේ එවැනි මුදලක් දේශීයව ණයට ගැනීමටය. එසේ වුවහොත් දේශීය ණය කෙරෙහි ඇති ඉල්ලුම වැඩි වීම හේතුකොටගෙන, ණය අනුපාතය ක්‍රම ක්‍රමයෙන් ඉහළ නැංවීමේ ප්‍රවණතාවයකට බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍ර යොමු වන ලකුණු පහළ වෙනු නියතය. ඒ අතර, උද්ධමනයේ ඉහළ යෑමකටද ආර්ථිකය යොමු වීමට හැකි නිසා, රටේ ව්‍යාපාර, වෙළඳ සහ කර්මාන්ත ක්ෂේත්‍රයන්ට තියුණු අභියෝග එල්ල වීමද සිදුවිය හැකිය. මේ සියලුම දේ තුළින් ආර්ථික වර්ධන වේගය සැළකිය යුතු පසුබෑමකටද ලක් විය හැකිය.

ඉහත කී විග්‍රහයෙන් පැහැදිළිවන එක් මූලික කරුණක් නම් රටක් තුළ රැකියාවන් හිස් අවකාශයක හෝ පදනම් රහිතව හෝ කෘතිමව නිර්මාණය කිරීමට උත්සහ දැරුවහොත්, ඒ තුළින්

පැන නගින අවාසිදායක ප්‍රතිඵල ඉමහත් බවය. ආදායම් මාර්ගයක හෝ රැකියාවක දිගු කාලීන පැවැත්ම රැඳෙන්නේ ආයෝජනයක් හරහා සහ අවශ්‍ය කාර්යයක් සඳහා එම ආදායම් මාර්ගය හෝ රැකියාව බිහි වන එකක් වීම තුලය. එසේ නැතිව, දේශපාලනික හේතූන් මත, විජ්ජාවෙන් මෙන් කෘතිමව රැකියා අවස්ථා නිර්මාණය කිරීමෙන් සිදු වන්නේ රටේ ජාතික කාර්යක්‍ෂමතාවය සහ ඵලදායිතාවය තවදුරටත් පහත වැටීමය. එලෙස පදනම් විරහිත රැකියා බිහි කිරීමෙන් රටේ ආර්ථිකයට උසුලන්නට බැරි තරම් බර පැටවුවහොත් ඒ තුළින් පැණ නගින විපාකයන් අතිශයෙන් දරුණු විය හැකි බවද අප මතක තබා ගත යුතුය. එපමණක්ද නොව, එවැනි වැඩ පිළිවෙත් හරහා රටේ කාර්යක්‍ෂමභාවය සහ ආර්ථික පැවැත්මද නොදැනුවත්වම පාහේ තියුණු තර්ජනයකට ගොදුරු වනුද නොඅනුමානය. අප රටේ රැකියා වෙළඳ පොළට ප්‍රවේශ වන සියලුම තරුණ තරුණියන්ට සහ උපාධිධාරීන්ට ආදායම් අවස්ථාවන් ආර්ථිකය තුළ බිහි විය යුතුය. බිහි කල යුතුය. එහෙත්, එම අවස්ථාවන් ස්ථිරවම සහ දිගු කාලීනව පවත්වාගෙන යා හැකි වන්නේ ඒවා ආයෝජනයක් හරහා හෝ කාර්යක්‍ෂම කෝණයකින් බලන විට, අත්‍යවශ්‍ය හේතූන් මත බිහිවන ඒවා වුවහොත් පමණක් බව අප හොඳින් තේරුම් ගත යුතුය. දේශීයව සහ විදේශීයව ආයෝජනය වර්ධනය කිරීමට කළ හැකි සෑම ක්‍රියාවක් සහ කටයුත්තක්ම රජයද, ව්‍යාපාර ප්‍රජාවද අප සියලු දෙනාද දියත් කළ යුතුය. එම සාමූහික ප්‍රයත්නයේ මූලික කොටස් කරු සහ නිර්මාතෘ වන රජයේ මූලික වගකීම විය යුත්තේ රැකියා බිහිවෙන තත්ත්වයකට තුඩු දෙන සහ අනුබල දෙන ආර්ථික වාතාවරණයක් රටේ කඩිනමින් සකස් කර රැක ගැනීමය.

# 1.14

## ණයපත් හිතකරද? අහිතකරද?

වර්තමාන යුගයේ, විශේෂයෙන්ම නාගරික පරිසරයේ බොහෝ දෙනා අතැති එක් ආර්ථික මෙවලමක් නම් ණය පත්‍රය (Credit Card). සැම බැංකුවක්ම පාහේ ණය පත් පහසුවෙන් නිකුත් කරන අතර, යම් පුද්ගලයෙකුට ස්ථිර වැටුපක් හෝ ආදායම් මාර්ගයක් ඇත්නම්, බොහෝ බැංකු එම ආදායම් මාර්ග වලට සාපේක්ෂව, විවිධ සීමාවන්ට යටත්ව ණය පත් නිකුත් කරති. ණය පත් නිකුත් කිරීම සඳහා බැංකු අතර තියුණු තරගකාරීත්වයක් පවතින බවද නොරහසකි. ඒ නිසා, බැංකු විශේෂ දීමනා සහ වාසි ලබාදෙමින් තව තවත් ණය පත් නිකුත් කරමින් වඩ වඩාත් ගෙවීම් තම බැංකු ණය පත් හරහා කරවීමට ගණුදෙනුකරුවන් පොළඹවන ස්වභාවයක් අපි දකිමු.

මෙසේ ණය පත් ක්‍රමයේ ශීඝ්‍ර වර්ධනය හේතුකොටගෙන අද බොහෝ දෙනා අත විවිධ බැංකු මගින් නිකුත් කරන ලද ණය පත් කිපයක්ම තිබෙනු දක්නට ලැබේ. ඒ අතරම, ණය පත් හරහා තම භාණ්ඩ හා සේවාවන් සඳහා ගෙවීම් අයකරගනිමින්, ආයතන බොහෝ සංඛ්‍යාවක් තමන්ගේ පිරිවැටුම් ද ශීඝ්‍රයෙන් වර්ධනය කරගෙන ඇත. ඒ තුළින්, ඒ ආයතනවල සැළකිය යුතු දියුණුවක් සහ වර්ධනයක්ද සිදුවී ඇති බව අපට පෙනේ. තවද ණය පත් ක්‍රමය නිසා සිදුවෙන ණය වර්ධනය හේතු කොට ගෙන, බොහෝ පාරිභෝගිකයින් අතට භාණ්ඩ හා සේවාවන් විශාල ප්‍රමාණයක්ද ලැබෙමින් ඔවුන් යම් තෘප්තියක් විඳින ආකාරයක්ද, දැකිය හැකිය.

මෙම තත්ත්වය සාමාන්‍යයෙන් අප රටේ ආර්ථිකයට හිතකර තත්ත්වයක් ලෙස අපට හැඳින්වීමට අපහසුතාවයක් නැත. භාණ්ඩ සහ සේවා වලට ඇති ඉල්ලීම වර්ධනය වනවාත් සමගම එම

---

**2004.01.04 දින ලංකාදීප පුවත්පතෙහි 'දුවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

භාණ්ඩ සහ සේවාවල නිෂ්පාදනයද රට සාපේක්ෂව වර්ධනය වීම ස්වභාවිකය. එසේ වන විට රටේ ආර්ථික ක්‍රියාවලියන්ද ඒ හා සමාන්තරව වර්ධනයක් ලබන බවද පැහැදිලිය. මෙසේ වැඩෙන ඉල්ලීම සපුරාලීම සඳහා අවශ්‍ය වන නිෂ්පාදන සහ සේවා ඇතිකිරීමට තව තවත් ආයෝජන යොමුවෙන අතර, ඒවා හරහා නව අතුරු ව්‍යාපාරද, රැකියාවන්ද බිහිවනු ඇත. එසේ නම්, සමස්තයක් වශයෙන් ණය පත් ක්‍රමය තුළින් බැංකු වලට සහ ණය පත් නිකුත් කරන ආයතනවල ලාභාංශ වැඩිවනවාත් සමගම භාණ්ඩ සහ සේවාවලට ඇති ඉල්ලීම වර්ධන වීම තුළින් ව්‍යාපාරවල වර්ධනයක්ද, ණය පත් ඇති ජනතාවට අවශ්‍ය වන භාණ්ඩ සහ සේවාවන් තව තවත් ලබාගැනීමට ඇති අවස්ථාවල ප්‍රසාරණයක්ද පෙනේ.

ඉහත කී ප්‍රතිඵල සතුටුදායක ඒවා බව අපට පෙනේ. එහෙත් මෙම ක්‍රියාවලිය තුළ යම් අහිතකර බලපෑම් තිබේද, ඒවා යනු මොනවාද යන්න සළකා බැලීමද නුවණට හුරුය. අද පවතින ණය පත් ක්‍රමයේ ඇති එක් දුර්වලතාවයක් නම් බොහෝ අවස්ථාවලදී ණය පත් තුළින් බැංකු 'ණය' ලබාදෙන විට, බැංකු කිපයක්ම එකම පුද්ගලයාට ණය පත් කිපයක් නිකුත් කරමින් ණය ලබාදෙන වාතාවරණයක් අපි දකිමු. එවිට, ඒ අය එම ණය ලබාගනිමින් දිගින් දිගටම ණය බරින් මිරිකෙන තත්ත්වයකට පත්වෙන තෙක් 'ණය' භුක්ති විඳින ස්වභාවයක් අප දකිමු. අද ලෝකයේ දියුණු රටවල බොහෝ පාරිභෝගිකයින් නොදැනුවත්වම පාහේ මුහුණ දෙන විශේෂ ප්‍රශ්නයක් නම් මෙයයි. යම් අවම සුදුසුකමක් ඇත්නම්, ඔවුන්ට පහසුවෙන්ම ණය ලබා ගත හැකි නිසා, එම ණය ලබාගනිමින්, ක්‍රම ක්‍රමයෙන් තමන්ගේ ණයගැති භාවයේ මට්ටම (Level of Indebtedness) ඉතා උග්‍ර මට්ටමකට පත්වෙන තෙක් ණය ලබාගැනීමට ඔවුන් පෙළඹෙති. මෙලෙස භාණ්ඩ සහ සේවාවන් භුක්ති විඳින ණය වන සමාජයක් (Debt-based Consumer Society) ගොඩනැගෙන නිසා, සැම භාණ්ඩයක්ම සහ සේවයක්ම පාහේ ණය පත් තුළින්ද, පහසු ගෙවීමේ ක්‍රම හරහාද ලබා ගැනීමට ඔවුන් පුරුදු වෙති. එසේ සැම භාණ්ඩයක් සහ සේවාවක්ම තමන්ගේ ආදායම් කිප ගුණයකින්ම ඉක්මවෙන ලෙස ලබාගැනීමෙන් තමන්ගේ ණය උපරිම මට්ටමට පත්වූවිට

එම ණය ගෙවා ගැනිමට නොහැකි වන තත්ත්වයකටම ඔවුන් ඉක්මණින්ම වැටෙති. ඒවිට ණයපත් කොන්දේසි අනුව ගෙවිය යුතු අවම මුදල පවා ගෙවා ගැනිමට අපොහොසත් වන තත්ත්වයට පත්වී, ඔවුන් අන්ත ආර්ථික ගැටලුවලට ගොදුරු වන අතර, එයින් ගැලවීම සඳහා තමන් සතු අනෙකුත් වත්කම්ද විකිණිමට සිදු වන්නේය. මෙවැනි පුද්ගලයන් රාශියක් අද ලෝකය පුරාම බිහිවෙමින් සහ බිහිවී ඇති අතර, එවන් පුද්ගලයන් දිනෙන් දිනම ශ්‍රී ලංකාවේද සංඛ්‍යාත්මකව ශීඝ්‍රයෙන් වර්ධන වනු දක්නට ඇත. අද ශ්‍රී ලංකාවේ බැංකු මගින් ලබාගත් ණයපත් හරහා මෙවැනි ණය ගෙවීමට අපොහොසත් වූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණ දුරට වර්ධනය වී ඇත්දැයි කිවොත් එවැනි පුද්ගලයන්ට විරුද්ධව පවරා ඇති නඩු විභාග කිරීම සඳහා පමණක් විශේෂ උසාවියක් ස්ථාපනය කිරීමටද සිදුවී ඇත.

එහෙත්, මට පෙනෙන අන්දමට මෙම ගැටලුවට අවශ්‍ය විසඳුම ඇත්තේ උසාවි මාර්ගයෙන් නොවේ. ඇත්ත වශයෙන්ම එම ප්‍රශ්නයට, විසඳුමක් සැකසිය යුත්තේ එහි ආරම්භයේදීමය. එනම්, බැංකුවක ගණුදෙනුකරුවාට ණය සීමාව පනවන විට සහ ණය පත් නිකුත් කරන අවස්ථාවේදීම, එම ණයපත් නිකුත් කරන බැංකුව අනිකුත් බැංකු සමග යම්කිසි දත්ත හුවමාරුවක් ඇති කර ගනිමින් එම සීමාව වඩාත් සීරුවෙන් තිරණය කළ යුතුය. එපමණක්ද නොව, ණය ලබාගන්නා පුද්ගලයන්ට මෙම ණය නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම හරහා තමන්ට සිදුවිය හැකි ආර්ථික ගැටලු ගැනද යම් දැනුවත් කිරීමක් සහ අධ්‍යාපනයක් බැංකු හෝ වෙනත් පොදු මාධ්‍යයක් තුළින් ලබා දිය යුතුය.

බොහෝ අයට තමන්ගේ මූල්‍ය කළමණාකරණය කාර්යක්ෂම අන්දමකට කරගැනීමට තරම් දක්ෂතාවයක් සහ විනයක් නොමැත. එහෙත් ඔවුන්ට යම් සරල දැනුවත් කිරීමක් ලබා දුනහොත් හෝ බාහිර විනයකට ඔවුන් යටත් කළහොත්, ඒවා තුළින් ඔවුන්ගේ මූල්‍ය කළමණාකාරිත්වය විශේෂ ලෙස දියුණු වනු ඇත. එවැනි පුලුල් ක්‍රියා මාර්ගයක් දියත් කිරීම රටේ සුලු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන් ඇතුලු සියලු දෙනාගේම යහපතට හේතුවක් වනු ඇත. මෙවැනි ක්‍රියාමාර්ගයක් දියත් කළ යුත්තේ

රජය පමණක් නොව, බැංකු සියල්ලේම සහභාගිත්වය ඇතිව පවත්වාගෙන යන යම් වගකිවයුතු ආයතනයක් හෝ ආයතනයන් හරහා එසේ වුවහොත්, ණය පත් තුළින් ලැබෙන ඉහත කී වාසින් ලබාගන්නවාත් සමගම ණයපත් ක්‍රමයෙන් සිදුවන අයහපත් විපාකවලටද යම් සුදුසු ප්‍රතිචාරයක් ලබාදෙමින් මෙම ණය පත් ක්‍රමය වඩාත් සාර්ථකව රටේ දියත් කිරීමට හැකි වන්නේය.

# 1.15

## අක්‍රිය ගිණුම් අනතුරු දායකයි... පරිහරණය පරිස්සමින් !

සේවකයින්ගේ සේවය අත්හිටුවීමක් කරන විට ගෙවිය යුතු වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් නිකුත් වූ ගැසට් නිවේදනය මෑතකදී අප රට තුළ විශාල ආන්දෝලනයක් පැණ නැංවීමට හේතු වුණි. මෙම ගැසට් නිවේදනය නිකුත් වූ අවස්ථාවේදීම වාගේ රජය ප්‍රකාශ කළ තවත් නිවේදනයක් වූයේ, යම් සේවක පිරිසකගේ සේවය අත්හිටුවන්නේ නම් එම සේවකයන් පිණිස 'ජාතික ආරක්‍ෂක දැලක්' ද (National Safety Net) රජය ඉදිරියේදී සකස් කරන බවය. මෙම ආරක්‍ෂක දැල හය මසක කාලයක් මුලුල්ලේ සේවකයාගේ වැටුප් ගෙවීම් පැවැත්වීම ලෙස තිරණය කොට ඇති බවද දැනුම් දෙන ලදී.

මෙලෙස 'ආරක්‍ෂක දැලක' සකස් කිරීම ඉතා යෝග්‍ය ක්‍රියාවකි. එහෙත්, එය ස්ථාපනය කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය ලබා ගැනීමට රජය තිරණය කර ඇත්තේ සේවක අර්ථ සාධක අරමුදලින් කොටසක් විසර්ජනය කර ගැනීමෙන් බව අපට අසන්නට ලැබුණි. සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල යනු සේවකයන්ගේ පඩි නඩි වලින් මාසිකව කොටසක් අඩු කර ගනිමින් සහ සේව්‍යයාගෙන් තවත් කොටසක් ලබා ගනිමින් ස්ථාපනය කරගන්නා ලද අරමුදලකි. එම අරමුදල සහ එයට දිනපතාම එකතු වන පොලිය සහ අනිකුත් ආදායම් සේවකයා සතුය. එය පරිහරණය විය යුත්තේ සමස්ත සේවකයන්ගේ යහපත සඳහාය. සමස්ත සේවකයන්ගේ එක් කොටසකගේ යහපත සඳහා පමණක් නොවේ. එසේ නම්, එම අරමුදලෙන් කොටසක් ආරක්‍ෂක දැලක් සඳහා වෙන් කිරීමෙන් සිදු වන්නේ එම කොටසේ ප්‍රයෝජනය සුලු සේවක පිරිසකගේ භුක්තිය සඳහා පමණක් යොමු වීමය. ඇත්තවශයෙන්ම යම් සේව්‍යයෙකු තම ආයතනයේ සේවක පිරිසෙන් කොටසක වැඩ

---

2004.02.22 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

නතර කරන්නේ නම්, ඒ ක්‍රියාවලියට අදාළ වන්දියද, ආරක්‍ෂක දැලද එම සේව්‍යයාගේ වගකීම විය යුතුය. සේව්‍යයෙකු තම සේවක පිරිස අඩු කර ගන්නේ (down-sizing or re-trenching) තමන්ට යම් කෙටි හෝ දිගු කාලීන වාසියක් ඒ තුළින් ලැබෙන නිසාය. එසේ නම්, සේව්‍යයාගේ ඉදිරි වැඩ පිළිවෙතට රුකුලක් හෝ සහනයක් වන ලෙස, තමාගේ සේවක පිරිස මේ ආකාරයට අඩු කරගන්නේ නම්, ඉදිරියේදී තමාට අත්වන වාසිය සඳහා එම සේව්‍යයා ආයෝජනය කළ යුතු මුදල, අන් අය මත පැවරීම ඉතා අසාධාරණය. එවැනි කෝණයකින් මේ තත්ත්වය විග්‍රහ කරමින්, මෙම ප්‍රශ්නයට විසඳුමක් රජය සොයන්නේ නම්, එය අතිශයෙන්ම වැදගත්ය; ප්‍රායෝගිකය; සාධාරණය.

දැනට හඳුන්වා දී ඇති වන්දි ක්‍රමය සහ ආරක්‍ෂක දැල යෝජනා වූ අවස්ථාවේදී මතුවූ තවත් අදහසක් නම්, මෙම යෝජිත ආරක්‍ෂක දැල සඳහා, සේවක අර්ථ සාධක අරමුදලේ 'අක්‍රිය ගිණුම්වල' (dormant accounts) ඇති ශේෂයන් උපයෝගී කරගත හැකි බවය. මෙම අදහස රජයට ඉදිරිපත් කළ අය, එම යෝජනාවේ ඇති බරපතල කමද, එහි භයානක භාවයද සමහර විට අවබෝධ නොකරගෙන තිබීමට පුලුවන. ඕනෑම බැංකුවක සේවය කරන පුද්ගලයෙකුගෙන් බැංකුවේ ගිණුම් සම්බන්ධයෙන් ඇති ආරක්‍ෂක කටයුතු (security measures regarding customer accounts) ගැන විමසුවහොත්, ඔවුන් අනිවාර්යයෙන්ම පවසන එක් වැදගත් කරුණක් නම්, අක්‍රිය ගිණුම් ඉතා තියුණු සහ සහ සූක්‍ෂම පාලනයකට යොමු කළ යුතු බවය. එසේ කිරීමට මූලික හේතුව නම්, වංචා සහ දූෂණ බොහෝ විට සිදු වන්නේ අක්‍රිය ගිණුම් ආශ්‍රිතව නිසාය. අක්‍රිය ගිණුම්වලට යම් වාංචනික ගණුදෙනු භර හෝ බැර කිරීමෙන් විශාල පාඩු බැංකුවලට සිදු කිරීමට සමහරුන්ට හැකි වීම ගැන ජාත්‍යන්තර සහ දේශීය බැංකු ඉතිහාසයේ බහුලව වාර්තා වී ඇති බව අප හොඳින් දනිමු.

අක්‍රිය ගිණුම් පිළිබඳ මෙවැනි වාතාවරණයක් පවතිත්දී වගකිව යුතු අංශයක්, අක්‍රිය ගිණුම්වල සෘජු පරිහරණය ආශ්‍රිතව යම් යෝජනාවක් දියත් කිරීමට තැත් කිරීමෙන් ප්‍රසිද්ධ වන පූර්වාදර්ශය අයහපත් සහ භයානක එකකි. අක්‍රිය ගිණුම් සම්බන්ධයෙන් විවිධ මත ඉදිරිපත් කරමින්ද, විවිධ ක්‍රම උපයෝගී කර ගනිමින්ද,

බැංකු සහ අනිකුත් තැන්පතු ලබන ආයතන, මෙම 'අක්‍රිය' ශේෂයන් යොදවමින් බාහිර අරමුණු ඉෂ්ට කරගැනීමට යම් සම්ප්‍රදායක් මේ පූර්වාදර්ශය හරහා ආරම්භ කළහොත්, එයින් මුලු මූල්‍ය සහ ව්‍යාපාර සමාජයටම අතිශයින් හානිකර ප්‍රතිඵල විඳින්නට සිදුවිය හැක. යම් ගිණුමක් අක්‍රිය වූ පමණින් එම ගිණුම වෙනත් බාහිර ප්‍රයෝජන වලට යෙදවීමට කුමන ආයතනයකටවත් බලයක් හෝ අවස්ථාවක් නොතිබිය යුතුය නොදිය යුතුය. අක්‍රිය යයි කියන ගිණුම් යම් දිගු කාලීන ප්‍රතිපත්තියක් හරහා එම ආයතනයේම මතු දියුණුවට තුඩු දෙන ලෙස ප්‍රාග්ධනයට හෝ අරමුදලට එකතු කරනවා මිස, එම ආයතනයේ හෝ වෙනත් ආයතනයක හෝ වෙනත් අරමුණකට යෙදවීමට නව සම්ප්‍රදායක් අප රටේ ඇති කර ගතහොත්, වැඩි කලක් යන්නට පෙර එම අහිතකර සම්ප්‍රදාය දැවෙන ආර්ථික ප්‍රශ්නයක ආරම්භය වනු නොඅනුමානය.

සමහරවිට, අප රටේ ආර්ථික ප්‍රතිපත්ති දියත් කරද්දී මූල්‍ය කළමණාකාරිත්වය පිළිබඳව මනා දැනුමක් හෝ පසුබිමක් නොමැති පුද්ගලයින් කඩි මුඩියේ යම් වැඩ කටයුතු කරගැනීමට සූදානම් වෙද්දී මෙවැනි අසාධාරණ, අඥානවන්ත සහ කෙටිකාලීන ක්‍රියාවන් වල යෙදෙනු දැකීම පුදුමයට කරුණක් නොවේ. එපමණක්ද නොව, තම රටවල මෙවැනි අවදානම් ක්‍රියාමාර්ග යෝජනා නොකළද, ශ්‍රී ලංකාව වැනි තුන් වැනි ලෝකයේ රටක් යයි සැළකෙන රටවලට මෙවැනි ක්‍රියා මාර්ග දියත් කිරීමට උපදෙස් ලබා දෙන්නට විදේශික 'විශේෂඥයින්' උත්සහ කරනු දැකීමද කණගාටුවට කරුණකි. සමහරවිට මෙවැනි යෝජනා තමන්ගේම රටවල යෝජනා කිරීමට පෙර ශ්‍රී ලංකාව වැනි රටවල දියත් කිරීමෙන් එම යෝජනාවල ප්‍රතිඵල සහ ප්‍රතිචාර අත්හදා බැලීමක් කරගැනීමට ඔවුන්ට හැකිවනු ඇත. එවැනි උපදෙස් අපට ඉදිරිපත් කරද්දී ඒවායේ ඇති දැවැන්ත අඩු පාඩු පෙන්වා දෙමින්, ඒවා වෙනස් කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අවශ්‍ය ශක්තිය සහ දැනුම අප රටේ මූල්‍ය කළමණාකාරිත්වයේ යෙදෙන පුද්ගලයින් වර්ධනය කර ගත යුතුය. එසේ නොවුවහොත්, අප රටේ ඉදිරි පරම්පරාවලට මෙවැනි යෝජිත ක්‍රියාවලින් හරහා අතිවිශාල පාඩු විඳීමට සිදුවනු ඇත.

# 1.16

## මතුවට අපට විදුලි බල හිඟයක් ඇතිවේද ?

2003 ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අප රටේ විදුලි බල තත්ත්වය ගැන මෙසේ පවසයි.

"2003 දී මුලු ස්ථාපිත විදුලි බල ධාරිතාවය මෙගා වොට් 2,223 දක්වා 15% කින් වර්ධනය විය. මෙම වර්ධනයට මෙගා වොට් 70 කින් යුත් ලංකා විදුලි බල මණ්ඩලය සතු කුකුලේ ගඟ ජල විදුලි බලාගාරය සහ මෙගාවොට් 165 කින් යුත් පෞද්ගලික අංශය සතු ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය ආරම්භ කිරීම දායක විය. මුලු විදුලිබල ධාරිතාවේ පෞද්ගලික අංශයේ දායකත්වය 2002 දී 24% සිට 2003 දී 26% වැඩි විය. තාපබල ධාරිතාවය පුලුල්වීම නිසා විදුලිබල පද්ධතියෙහි ජල විදුලිය මත ඇති රැඳියාව 2002 දී 61% සිට 2003 දී 56% දක්වා පහත වැටුණි. ධාරිතාවය ප්‍රසාරණය වුවද, වර්ෂයේ දෙවන භාගයේ පැවැති නියගය ජල විදුලිබල උත්පාදනයට අහිතකර ලෙස බලපෑ හෙයින් අඛණ්ඩව විදුලිබල සැපයුම අවදානම්කාරී තත්ත්වයක පැවතිණි. නියගය හේතුවෙන් ජලාශවල ජල ධාරිතාවය වර්ෂයේ දෙවන භාගයේ මුලුල්ලේම 42% කට වඩා පහල මට්ටමක විය. 2003 දී මුලු විදුලිබල පරිභෝජනය ගිගාවොට් පැය 6,208 දක්වා 13% කින් වර්ධනය විය. විදුලිබලය කපා හැරීම හේතුවෙන් පෙර වර්ෂයෙහි විදුලිය පරිභෝජනය වර්ධනය වුයේ 5% කින් පමණි. ගෘහස්ත, කර්මාන්ත සහ පොදු සේවා අංශයන් හි විදුලිය පරිභෝජනය පිළිවෙලින් 11%, 16% සහ 13% කින් ප්‍රසාරණය විය. වාර්ෂික ඒක පුද්ගල විදුලිය පාරිභෝජනය ඒකක 322 දක්වා 11% කින් ඉහළ ගියේය."

"අනිකුත් රටවල් සමග සසඳා බලන විට ලංකාවේ වර්තමාන විදුලි ගාස්තු ඉහළ මට්ටමක පවතින බැවින් ලංකා විදුලි බල

---

**2004.06.20 දින ලංකාදීප පුවත්පතෙහි 'දෑවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

මණ්ඩලයේ අලාභ ලැබීමේ ස්වභාවය-ප්‍රධාන වශයෙන්ම තීරණය වී ඇත්තේ විදුලිබල උත්පාදනය සඳහා දැරීමට සිදුවන අධික පිරිවැය මගිනි. විදුලි ඒකකයක් සඳහා ලංකා විදුලි බල මණ්ඩලයේ සාමාන්‍ය පිරිවැය 2002 දී රුපියල් 7.78 සිට 2003 දී රුපියල් 7.98 දක්වා වැඩිවිය. 2003 දී සාමාන්‍ය විදුලි බල ගාස්තුව එක් ඒකකයක් සඳහා රුපියල් 7.68 ක් විය. ශ්‍රී ලංකාවේ විදුලි බල පද්ධතිය ප්‍රධාන වශයෙන් ජල විදුලිබල උත්පාදනයේ සිට තාපබල උත්පාදන ක්‍රමයක් දක්වා ක්‍රමිකව පරිවර්තනය වෙමින් පවතින නිසා ගල් අඟුරු වැනි අඩු පිරිවැයකින් යුතු බල ශක්ති මූලාශ්‍රයක් කරා පරිවර්තනය වීම විදුලි බල අංශයේ දිගුකාලීන පැවැත්ම සඳහා සහ අවසන් පාරිභෝගිකයාට සාධාරණ මිලකට විදුලිය සැපයීම සඳහා අත්‍යවශ්‍යය. විදුලිබලය අනිකුත් කර්මාන්ත සඳහා අත්‍යවශ්‍ය යෙදවුමක් වන බැවින් විදුලි බල උත්පාදනය සඳහා ඉහළ පිරිවැයක් දැරීම අනෙකුත් සියලුම කර්මාන්තවල නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතුවන අතර එමගින් ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය කෙරෙහි විශාල බලපෑමක් ද කරණු ඇත."

ශ්‍රී ලංකා මහ බැංකුවේ එම වාර්තාවෙන් පැහැදිලි වන්නේ අප රට ඉදිරියේදී විදුලි බල හිගය හරහා අති විශාල ආර්ථික ප්‍රශ්නයකට මුහුණ දෙන බවය. සාමාන්‍යයෙන්, ආර්ථිකයේ 1% ක වර්ධනයක් සඳහා විදුලිබල ධාරිතාවේ වර්ධනය අවම වශයෙන් 1.5% වත් විය යුතුය. ඒ අතරම, රටේ අනිකුත් නිෂ්පාදන සහ සේවාවන් තරගකාරී මිල මට්ටමකට දේශීය හෝ ලෝක වෙළඳ පොළට ඉදිරිපත් කරන්නට නම්, රටේ නිෂ්පාදනය වන විදුලිය සඳහා සාධාරණ සහ තරගකාරී මිලක් ස්ථාපිත විය යුතුය. පකිස්ථානය හැරුනු විට විදුලිය සඳහා මුලු ආසියාවේම අධිකතම මිල පවතින්නේ ශ්‍රී ලංකාවේ බව වාර්තා වී ඇති බව නොරහසකි. ඒ අතරම, රට තුළ තම කටයුතු කිසිඳු බාධාවක් නොමැතිව කරගෙන යාම සඳහා, විදුලිය අඛණ්ඩව ලැබෙන බවට ව්‍යාපාරිකයන්ට සහ කර්මාන්තකරුවන්ට විශ්වාසයක් තිබිය යුතුය. අද ලෝකයේ ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතින ඛනිජ තෙල් මිල දෙස අපගේ අවධානය යොමු කළහොත් අපට පෙනී යන්නේ තාප බලාගාර හරහා අපට ඉදිරි අනාගතයේදී තරගකාරී මිලකට

# 1.17

## පිරමීඩ ශ්‍රී ලංකාවේත් ?

පැරණි ලෝකයේ පුදුම හතෙන් එක් පුදුමයක් ලෙස සැළකෙන ඊජිප්තුවේ පිරමීඩ නිරීක්ෂණය කිරීම සඳහා වසරකට සංචාරකයින් කෝටියක් පමණ පිවිසෙන බව වාර්තාවේ. ඒ අතරම, ඊජිප්තුවේ පිරමීඩ වලට හාත්පසින්ම වෙනස් පිරමීඩයන් ගැන මෑතකදී ශ්‍රී ලාංකිකයින් කතා කිරීමට පටන් ගෙන ඇති බවද පෙනේ. මේ "ශ්‍රී ලාංකික පිරිමීඩ" මොනවාද?

අද ව්‍යාපාරික සහ අනිකුත් ක්ෂේත්‍ර වල පුද්ගලයින් රැසක්, ක්ෂණිකව මුදල් එකතු කළ හැකැයි යන චේතනාවෙන් විවිධ නම් වලින් හඳුන්වන, "පිරමීඩ" මූල්‍ය ක්‍රම වලට සහභාගි වන්නට ප්‍රිය මනාපයක් පෙන්වති. කලින් සම්බන්ධවූ සාමාජිකයන්ට පසුව සම්බන්ධවන සාමාජිකයින් විසින් මුදල් ගෙවන පදනමක් හරහා මෙම පිරමීඩ ක්‍රියාවලියන් සාමාන්‍යයෙන් දියත් වේ. ඒ අන්දමට, පිරමීඩයේ පහළ මට්ටම් වලින් මෙම ක්‍රමයට එකතු වන නව සාමාජිකයන්ගේ ඍජු හෝ වක්‍රාකාර මුදල් දායකත්වය මත, ඉහළ මට්ටමක සිටින 'පැරණි' සාමාජිකයින්ට මුදල් හෝ වෙනත් ප්‍රතිලාභ ලැබීම පිරමීඩ ක්‍රමයේ මූලික ලක්ෂණයයි. පිරමීඩ ක්‍රමය විධිමත්ව විග්‍රහ කළහොත්, අපට පැහැදලි වන්නේ, එහි පැවැත්ම පදනම් වී ඇත්තේ ගුණෝත්තර ශ්‍රේණියක (Geometrical Progression) සිද්ධාන්තයන් මත බවයි. ඉතා සරළතම ගුණෝත්තර සාධකයක් ලෙස සැළකිය හැකි සංඛ්‍යාවක් වන 2, එම සංඛ්‍යාවෙන්ම වැඩිකෙරෙන ගුණෝත්තර පදනම් කොටගෙන ශ්‍රේණියක් වර්ධනය කළහොත්, පළවෙනි මට්ටමේදී 2 ක්ද දෙවැන්නේදී 4 ක්ද තුන්වැන්නේදී 8 ක්ද, හතරවෙනි වර්ගයේදී 16 ක්ද, පස් වැන්නේදී 32 ක්ද, හය වෙනි වර්ගය වන විට 64 ක්ද, හත්වන අදියරයේදී 128 ක්ද, 8 වන මට්ටම වන විට 256

---

2004.06.27 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

ක්ද, 9 වන තලයේදී 512 ක්ද, 10 වෙනි වර්ගය වන විට 1,024 ක්ද, පද්ධතියේ එක් එක් මට්ටමේ අගයන් වශයෙන් ගණනය කළ හැක. ඒ අතර, ගුණෝත්තර සාධකය 3 ක් වූ, විට, 3න් ගුණ කෙරෙන ශ්‍රේණියක 1 සිට 10 වෙනි මට්ටම් වෙනුවෙන් ඊට සමාන්තර සංඛ්‍යාවන් 3, 9, 27, 81, 243, 729, 2,187, 6,561, 19,683 සහ 59,049 වන්නේය. ඒ ආකාරයට "4" ආශ්‍රිත ශ්‍රේණියක අගය, 10 වැනි මට්ටමේදී 1,048,576 ක්ද, වනු ඇත. මෙම සංඛ්‍යාවලින් පැහැදිළි වන්නේ ආරම්භක මට්ටම්වලදී ශ්‍රේණියේ අගය සරළ ලෙස පෙනුනද, ක්‍රමයෙන් මට්ටම් වැඩි වන විට එහි අගය ඉතා විශාල ලෙස වර්ධනය වන බවය.

පිරමීඩ වැනි ගුණෝත්තර මූලය පද්ධති ක්‍රමයක් දියත් කරද්දී, බොහෝවිට සිදු වන්නේ පළමු හෝ දෙවැනි අදියරේ පුද්ගලයින් ඉක්මණින්ම වාසින් ලබා ගත්තද, එම පිරමීඩයට පහළ මට්ටම් වලදී එකතු වන පුද්ගලයින්ට අනිවාර්යයෙන්ම මෙන් නව සාමාජිකයින් බඳවා ගැනීමට අතිශතයන් අපහසු වීමය. ඒ නිසා, ඒ අයට තමන් ගෙවූ මුදල පවාද බොහෝ විට එකතු කර ගැනීමට නොහැකි වනු ඇත. එහෙත්, මෙසේ තමන්ගේ මුදල් බොහෝ විට නැතිවිය හැකි තත්ත්වය ගැනද නොසලකා, විශාල මුදලක් ඉදිරි කාලයකදී තමන්ට ලැබේ යයි යන බලාපොරොත්තුවෙන් මත්වූ පුද්ගලයින් රාශියක්ම මෙවැනි පිරමීඩ දියත් කරන ආයතන වල දක්‍ෂ සහ සියුම් ප්‍රචාරක කටයුතු ඉදිරියේ රැවටී ඇති අවස්ථා අප්‍රමාණය.

මෙම පිරමීඩ ක්‍රමය රඳා පවතින්නේ යම් භාණ්ඩයක හෝ සේවාවක අලෙවිය මත නොවේ. නිෂ්පාදනයක් හෝ වෙළඳාමක් හරහා නොවේ. සාමාන්‍ය වාණිජමය සිද්ධාන්ත මත ගොඩනැගුන හෝ ගොඩනැගෙන ආර්ථික ක්‍රියාවලියන් මත නොවේ. පිරමීඩ ක්‍රමයේ පැවැත්ම රඳා පවතින්නේ, මට්ටමින් මට්ටමට, එකතු වන්නාවූ නව සාමාජිකයින්ගේ දායකත්වය හරහාය. එසේ නම්, මා මුලින් පෙන්වාදුන් අන්දමට, ඉතාමත්ම සරළ සාධකය වූ දෙදෙනෙක් බඳවා ගනිද්දීත් දහවෙනි මට්ටම වන විට 1,024 දෙනෙකුද, තිදෙනෙකු බඳවා ගන්නා ක්‍රමයක 10 වැනි මට්ටමේදී 59,049 ක්ද, සිව් දෙනෙකු බඳවා ගන්නා ක්‍රමයක 10

වැනි මට්ටමේදී 1,048,576 දෙනෙකුද, පිරමීඩයට සම්බන්ධ වීම අත්‍යාවශ්‍යය. එසේ නොවුවහොත්, පිරමීඩය බිඳ වැටීමෙන් පහළ මට්ටම් වල පසුවෙන සියලු දෙනාම තම මුදල් නැතිකර ගනී. මෙවැනි පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් ක්‍රමවත්ව එකතු කර ගැනීම ප්‍රායෝගිකව සිදු කළ හැකි කාර්යයක් නොවන බව අපට වටහා ගැනීමට දුෂ්කර නොවන්නේය. එසේ නම්, මෙවැනි ක්‍රමවලට නොරැවටී වඩාත් බුද්ධිමත්ව කටයුතු කිරීමට අප වග බලා ගත යුතුය. එපමණක්ද නොව, මෙවැනි ක්‍රම ගැන ජනතාව දැනුවත් කිරීමටද අප රටේ මූල්‍ය පාලනය ගැන වගකීමක් දරන ආයතන ඉදිරිපත් විය යුතුය. මෙම පිරමීඩ ක්‍රමවල අඩුපාඩුකම් සහ සැබෑ තත්ත්වය පැහැදිලිව විදහා දක්වමින් ඒවායෙන් වැලකී සිටීමට උපදෙස් දීමටද, එවැනි ක්‍රම වලින් සමාජය රැවටීමට තැත්කරන පුද්ගලයින්ට සහ ආයතනවලට විරුද්ධව කටයුතු කිරීමට අවශ්‍ය නීති රීති සකස් කිරීමටද, අදාළ ආයතන කටුයතු කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් නොබෝදා මෙවැනි පිරමීඩ ක්‍රම වලට එරෙහිව කටයුතු කරන බවට දැන්වීම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පල කිරීම, ඉතා අවශ්‍ය සහ කාලෝචිත ක්‍රියා මාර්ගයකි.

අප රටේ සැළකිය යුතු පිරිසක් අද සූදුවට ඇබ්බැහි වී ඇති බව නොරහසකි. විවිධ නම්වලින් හඳුන්වන සූදු ක්‍රම අද මුලු රටේම පැතිරී ඇත. සූදුව කෙරෙහි ඇති සමාජයේ වක්‍රාකාර පිළිගැනීම කොපමණදැයි කියතොත්, රජය විසින් පවත්වාගෙන යන එක් ලොතරැයියක වර්ධනය සඳහා කෙරෙන වෙළඳ දැන්වීමකින් පෙන්වන්නේ රැකියා ඇබෑර්තුවකට අයදුම් පතක් යැවීමට පාවිච්චි කිරීමට අදහස් කළ රුපියල් 10 මුදලක් යම් තරුණයෙක් ලොතරැයි පත්‍රයක් වෙනුවෙන් යොදවා, ක්ෂණික දිනුමක් ලබා ගත් වගයි. එසේ නම්, මේ ආකාරයට අවංක රාජකාරියක වටිනාකම පහළ හෙළමින්, සූදුවේ වාසිය ඉස්මතු කරන යුගයක වෙසෙන අප සමාජය පිරමීඩ ක්‍රම ඉක්මනින් වැළඳ ගැනීම පුදුමයට කරුණක් නොවිය යුතුය.

අද අප සියලු දෙනාම ඉදිරියේ ඇති එක් විශේෂ වගකීමක් නම් වටිනාකමක් සහ අගයක් ඇති කාර්ය භාරයන් වල යෙදෙමින්

දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීමය. ඒ අතරම, සමාජයක් වශයෙන් ආර්ථික පදනමක් නොමැති, කෘත්‍රිම ලෙස මුදල් උපයෝගී කර ගැනීමේ පිරමිඩ වැනි ව්‍යාජ වැඩ සටහන් වලින් අප ඈත්වී සිටිය යුතුය.

පිරමිඩ ඊජිප්තුවට ආවේනික මුළු ලෝකයම අගය කරන පුරා වස්තූන්ය. ඒවා එලෙසම රැකගැනීමට මුළු ලෝකයාම පුරුදු වන්නේ නම් අප සියලු දෙනාම පිරමිඩ වලින් ලබා ගත යුතු නියම තෘප්තිය ලබා ගනු නියතය.

කොටින්ම කිවහොත්, පිරමිඩ අනුකරණ වලට රැවටෙන්න එපා.

# 1.18

## පංගු ක්‍රමය අහෝසි වීම තර්ජනයක් නොව අවස්ථාවකි

2004 අවසානයේදී බහු කෙඳි වැඩපිළිවෙළ (Multi-fibre agreement) යටතේ ඇඟලුම් පංගු ක්‍රමය (quota system) අහෝසි වීමත් සමගම ඇඟලුම් කර්මාන්තයේ විශාල වෙනසක් සිදුවන බව අප සියලු දෙනාම පාහේ දනිමු. එම පංගු ක්‍රමය යටතේ ලැබුණු රැකවරණය නිසා ඇමෙරිකා එක්සත් ජනපදයට ඇඟලුම් අපනයන කරද්දී, චීනය වැනි රටවල් සමග සෘජුවම තරග කිරීමට අපට යම් ශක්තියක් ලැබුණු බවද අප දනිමු. එසේ නම්, මෙම රැකවරණ දැළ, 2004 වසර අන්තයේදී ඉවත් වීම ගැන අද වන විට මුලු රට පුරාම විශාල ආන්දෝලනයක් පැතිරෙමින් තිබීම පුදුමයට කරුණක් නොවේ.

සමහර ආර්ථික විශේෂඥයින් පවසන අන්දමට මේ හේතුව නිසා, ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනයන සැළකිය යුතු ප්‍රමාණයකට අඩාල විය හැකි අතර රැකියා අවස්ථාවන් 150,000 ක් පමණ රටට අහිමි විය හැක. තවත් අය පවසන්නේ මෙම ආවරණය නැතිවී ගියද, ශ්‍රී ලංකාවට නව අවස්ථා ඇතිවන නිසා ඒවා තුළින් මෙම කර්මාන්තය වැඩි දියුණු කිරීමට අපට කටයුතු කළ හැකි බවය. මෙම පරස්පර විරෝධී තර්කවල පදනම් කුමක් වුවත්, වර්තමාන තත්ත්වය දෙස අප සිත් යොමු කළහොත් අපට පෙනී යන්නේ ඇඟලුම් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඉතා විශාල බලපෑමක් සහ විශිෂ්ට දායකත්වයක් ඇති කරන එකක් නිසා, රජයද, පෞද්ගලික ක්ෂේත්‍රයද, වෘත්තිය සමිතිද ඒ ගැන විශේෂ සැළකිල්ලක් යොමු කළ යුතු බවය. එසේ නම්, මෙම අභියෝගයට සෘජුවම මුහුණ දෙමින් එම අභියෝගය වාසියක් සහ අවස්ථාවක් බවට හරවා ගැනීමට මේ සියලු

---

**2004.08.01** දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

දෙනාම කටයුතු කළහොත් මෙම භීතිය අවම කරගෙන ඉදිරියට යෑමට අපට හැකිවන්නේය.

මේ පිළිබඳව අපට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක්ම ඇත. ඒවායින් මූලික එකක් නම්, ඇඟලුම් කර්මාන්තයට සම්බන්ධ උපකාරක සේවා (ancilliary services) සහ පසුපස සබඳතා (backward integration) ක්ෂේත්‍ර ශක්තිමත් කිරීමය. අද, අප රට ජාත්‍යන්තර ඉහල තත්ත්වයක ඇඟලුම් නිෂ්පාදන කිරීම සඳහා කීර්තියක් දිනා ඇති වුවද, එම කර්මාන්තයට සම්බන්ධ අනිකුත් උපකාරක සේවාවන් සහ කර්මාන්තයට සැපයුම් ලබාදෙන කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳව වැඩි උනන්දුවක් අප ව්‍යාපාරිකයින් දක්වා නොමැත. බොත්තම්, සිපර්, ලේබල්, කොළර් සහ කෆ් සඳහා ඇති ස්ටිෆ්නින් සහ නූල් වැනි උපකාරක ද්‍රව්‍ය නිපදවීම සඳහා අප දැන්වත් වැඩි උනන්දුවක් දැක්විය යුතුය. ඒ අතරම, තාක්ෂණය උපයෝගී කරගෙන අපගේ ඵලදායිතාවය ජාත්‍යන්තර මට්ටම්වලට ඉහළ නැංවීමටද අප කටයුතු කළ යුතුය. එසේ කරද්දී, සුලු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපෘතිවලට ශක්තියක් ලබාදෙන ලෙස එම ව්‍යාපාරිකයන්ට උපදෙස් ලබාදීමද, තරගකාරීත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය වන ශක්තීන් ලබා දීමද, රජය සහ කර්මාන්ත නායකයින් කළ යුතු කාර්යයන් වන්නේය.

පුරා අවුරුදු 20 ක පමණ කාළයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තය සංවිධානාත්මක ලෙස වර්ධනය වී ඇත. සාමාන්‍යයෙන් එවැනි කාළයක් තුළදී ඕනෑම කර්මාන්තයක සාර්ථකත්වයට අවශ්‍ය වන පුලුල් දැනුම, සහකාර සේවාවන්, අත්දැකීම් සහ යටිතල පහසුකම් ඉහළ මට්ටමකට දියුණු වී තිබිය යුතුය. තවද, එම කාළය තුළදී, සමස්තයක් වශයෙන් කර්මාන්තය ඉගෙන ගෙන ඇති පාඩම් රාශියකි. ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය කළමණාකාරීත්වයද, යටිතල දැනුමද, සේවකයන්ගේ සහ පාලකයන්ගේ අත්දැකීම්ද, පුහුණුවද, ජාත්‍යන්තර පිළිගැනීමද ඇතුලු ශක්තීන් රාශියක් ශ්‍රී ලංකාව තුළ දැන් පවතින බව අප අමතක නොකළ යුතුය. එසේ නම්, 2004 අවසානයේදී පංගු නැතිවීමේ අභියෝගයට අපට

එඩිතරව මුහුණ දීමට ශක්තියක් ඇති බව පිළිගෙන අප ධෛර්යමත් විය යුතුය.

දැනටමත්, මෙම ප්‍රශ්නයට මුහුණ දීම පිණිස රජය සහ පෞද්ගලික අංශය එකතු වී, පස් අවුරුදු උපාය මාර්ග සැළසුමක් සකස්කොට ඇත. එහෙත්, මීට පෙරද අප රටේ බොහෝ පුරාපේරුවෙන් සකස් කර තිබූ සැළසුම් ක්‍රියාත්මක නොවූ අයුරු අප දැක ඇත්තේ කණගාටුවෙනි. එසේ නම්, මෙම තීරණාත්මක පස් අවුරුදු සැළසුම ක්‍රියාත්මක කිරීම අපගේ විශේෂ වගකීමකි. එම සැළැස්ම තුළින් රට බළාපොරොත්තු වන්නේ, වර්තමානයේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 ක් වශයෙන් පවතින ඇගලුම් අපනයන අගය, 2007 වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5 ක් දක්වා වැඩිකර ගැනීමය. එවැනි ඉලක්කයකට පිවිසෙන්නට නම්, දැනට පවතින සාම්ප්‍රදායිය ඇගලුම් නිෂ්පාදනය දිගින් දිගටම කරනවාත් සමගම, ඉහළ වටිනාකමක් ඇති ඇගලුම් (high value garments) වෙළඳපොළට ඉදිරිපත් කිරීමටද අප කටයුතු කළ යුතුය. වර්තමාන ලෝකයේ ක්‍රීඩා ඇඳුම්, සාමාන්‍ය පහසු (casual) ඇගලුම්, ළමා ඇඳුම්, විලාසිතා යටි ඇඳුම්, තොප්පි, සම් ඇඳුම්, වැනි ඇගලුම් වලට විශේෂ ඉල්ලුමක් වර්ධනය වී ඇත. සමහර ඇගලුම් නිෂ්පාදනය කරන ආයතන දැනටමත් මේ ක්ෂේත්‍රවලට ඉතා සාර්ථක ලෙස පිවිසී ඇත. එසේ නම්, අපගේ විශේෂිත ක්‍රියාමාර්ගයන් විය යුත්තේ එවැනි සමාගම්වල දායකත්වය සහ මගපෙන්වීම හරහා අනිකුත් ආයතනවලටද මෙවැනි වැඩි අගයක් ඇති ඇගලුම් ක්ෂේත්‍රවලට පිවිසීමට දිරි ගැන්වීමය. රටේ නිෂ්පාදනය වන ඇගලුම් වල ගුණාත්මකභාවය, තරගකාරී මිල, කළට වේලාවට සැපයීමේ හැකියාව, වැනි සාධක ගැන විශේෂ සැළකිමකින් ක්ෂේත්‍රයට අයිති සියලුම ආයතන කටයුතු කරන්නට ආරම්භ වීම තුළින්, ජාත්‍යන්තර වෙළඳ පොළේ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය තවදුරටත් ප්‍රවර්ධනය වනු ඇත. එවිට ලෝක වෙළඳපොළේ ඉහළ තැනකට පිවිසීමට ශ්‍රී ලංකාවේ ඇගලුම් කර්මාන්තයට හැකි වන්නේය.

රටක් වශයෙන්ද, ජාතියක් වශයෙන්ද, කර්මාන්තයක් වශයෙන්ද අභියෝගවලට මුහුණ දීමට අප පුරුදු විය යුතුය. අද අත්‍යවශ්‍ය

වන ක්‍රියාවලිය නම්, ඉදිරියේදී සිදුවන්නට නියමිත ජාත්‍යන්තර වෙනසට සෘජුවම මුහුණ දී, එම තත්ත්වය හොඳින් අවබෝධ කරගෙන, නව ඉලක්ක වලට පිවිසීමට කටයුතු කිරීමය. බහු කෙළී වැඩපිළිවෙළට නොබියව, එය අවස්ථාවක් ලෙස සළකමින් ඉදිරියට යාමට රජයද, ඇඟලුම් ක්ෂේත්‍රයද කැපවීමකින් ක්‍රියා කළහොත්, අද සියලු දෙනාම පාහේ බියවී බලා සිටින මෙම දැවෙන ආර්ථික ප්‍රශ්නයෙන් අපට ජය ගැනීමට හැකි වන්නේය.

# 1.19

## පෞද්ගලික අංශය යනු කොටස් වෙළඳ පොළේ ලොකු සමාගම් විතරද?

1977 දී ශ්‍රී ලංකා ආර්ථිකය විවෘත අර්ථිකයක් බවට පත්කරන ලදී. එතැන් පටන්, රාජ්‍ය අංශයේ ඇති බලපෑම ක්‍රමයෙන් අඩු කිරීමක් සිදුවිය. ඒ තුළින් "පෞද්ගලික අංශයට" ව්‍යාපාරික සහ කාර්මික කටයුතු වැඩි වැඩියෙන් පැවරිණි. පෞද්ගලික අංශයේ කාර්යභාරයේ වැදගත්කම කොපමණද කිවහොත්, එය විදහා දැක්වීම පිණිස පෞද්ගලික අංශයට දෙනු ලැබූ ලේබලය වූයේ, සංවර්ධනයේ යන්ත්‍රය [Engine of Growth] යයිය. මේ ආකාරයට පෞද්ගලික අංශය හඳුන්වමින්, මහා පරිමාණයේ සමාගම් නියෝජනය කරන වාණිජ මණ්ඩල බොහෝ අවස්ථාවලදී විවිධ දීමනා, බදු සහන, ගනුදෙනු පහසුකම් සහ අනිකුත් වාසීන් රජයෙන් දිනා ගැනීමට සමත් වී ඇති බව නොරහසකි. මෙවැනි වාතාවරණයක, සමහර සුලු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර කෙරෙහි ඇති අවධානය බොහෝ දෙනා තුළ අද අවම වී ඇති බවක් පෙනේ. එපමණක් නොව, "පෞද්ගලික අංශය" ගැන සළකා බලන විට, සුලු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර ගැන සිතන්නටවත් බොහෝදෙනා අද පෙළඹෙන්නේවත් නැත.

අප රටේ "පෞද්ගලික අංශය" යනු කුමක්ද? 2002 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දියත් කරන ලද සුලු සහ මධ්‍යම පරිමාණයේ කාර්මික ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයට අනුව, උතුරු සහ නැගෙනහිර පළාත් හැරෙන්නට, අනිකුත් පළාත්වල සුලු සහ මධ්‍යම පරිමාණයේ කාර්මික ව්‍යාපාර 64,000 ක් පමණ ඇති බව හෙළි විය. මෙම ව්‍යාපාර, රට පුරාම විහිදී ඇති අතර, ඒවායේ කාර්යභාරය අනුව වර්ගීකරණය කරනු ලැබුවහොත් එම ලැයිස්තුව මෙසේය: වී මෝල් - 12%; ලී බඩු සහ වඩු

---

2004.08.15 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙලෙහි පළවූ ලිපියකි.

කර්මාන්ත - 10%; බේකරි - 8%; යකඩ ලියවන පට්ටල් ඇතලු සුලු කර්මාන්ත - 8%; කුඩා මැහුම් ආයතන - 8%; උළු, ගඩොල් හා සිමෙන්ති බ්ලොක් ගල් නිපදවන ආයතන - 6%; රූපලාවන්‍ය සහ කොණ්ඩා කැපීමේ ආයතන - 6%, අනිකුත් වෙනත් ව්‍යාපාර - 44% ඉහත කී ආයතන 64,000 න් 93% කම සේවය කරන පුද්ගලයින්ගේ සංඛ්‍යාව 5 දෙනෙකුට අඩු වන අතර, ඉතිරි ආයතන 7% හි පමණක් සේවය කරන සංඛ්‍යාව 5 දෙනෙකුට වැඩිවිය.

මෙම සුලු සහ මධ්‍යම පරිමාණයේ කාර්මික ආයතනවල දැනට 250,000 ක පමණ පුද්ගලයින් සංඛ්‍යාවක් සේවය කරතැයි අපට තක්සේරු කළ හැක. ඒ සමගම, මෙම ආයතන මුලු රට පුරා සැම ගමක් පාසාම විහිදී ඇති බැවින් ඒවායෙන් ඉටුවන ආර්ථික මෙහෙවර සැම පළාතකම ජන ජීවිතය වෙනුවෙන් ඉතා වැදගත් ලෙස බලපාන බවද අපට නිගමනය කළ හැක. තත්ත්වය මෙසේ වුවද, අප රටේ පාළකයින් සහ නිලධාරීන් පෞද්ගලික අංශය ගැන කතා කරද්දී මෙම ඉතා වැදගත් කොටස ගැන සම්පූර්ණයෙන්ම පාහේ අමතක කොට ඇත. ඇත්තවශයෙන්ම, මේ ක්ෂේත්‍රය දෙස කල්පනාකාරීව සිත් යොමු කළහොත්, අපට වටහා ගත හැකි වැදගත් කරුණු කිහිපයක්ම ඇත. මේවායින් සමහරක් නම්:

(අ) මුලු රට පුරාම ඇති මෙම සුලු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවල සේවයේ යෙදී සිටින අයගේ සංඛ්‍යාව එක් අයෙකුගෙන් වැඩිකර ගැනීමට තුඩු දෙන ආර්ථික සැළැස්මක් දියත් කළ හැකි වුවහොත්, ඒ තුළින් අලුත් රැකියා අවස්ථා 64,000 ක්, උතුරු සහ නැගෙනහිර පළාත් හැරෙන්නට අනිකුත් පලාත්වල, බිහිකළ හැක. සමහර විට, මුලු ලංකාවේම මෙම සංඛ්‍යාව ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් වීමටද ඉඩ ඇත.

(ආ) සුලු සහ මධ්‍යම පරිමාණයේ කාර්මික ව්‍යාපාරවලින් නිෂ්පාදනය වන අගය එකතු කිරීම, (Value addition) 10% ක් වැනි සුලු ප්‍රතිශතයකින් හෝ වර්ධනය කර ගැනීමට හැකි වුවහොත්, එම වර්ධනයේ ප්‍රතිඵලය

නිසැකයෙන්ම ග්‍රාමීය ආර්ථිකයට විශාල ශක්තියක් වනු ඇත. එවිට නොදැනුවත්වම වාගේ, දිලිඳුකමේ අඩුවීමක් එම ගම්බද ප්‍රදේශයන්හි ඇතිවනු නියතය.

(ඇ) යම් නිශ්චිත සැලැස්මක් හරහා කුඩා සහ මධ්‍යම පරිමාණයේ කාර්මික ආයතනවල ආර්ථික කටයුතුවල වර්ධනයක් සිදුවුවහොත් ඒ හරහා ගැමි බැංකු ක්‍රමයද, දළ ඉතිරි කිරීමේ ශක්තියද, (savings capacity), දළ දේශීය නිෂ්පාදිතයද, ඒක පුද්ගලික ආදායමද, සැළකිය යුතු අන්දමකට වාසිදායි වෙනස්කම් වලට භාජනය වනු ඇත.

ඉහත විස්තර කර ඇති තත්ත්වයන් බිහිකර ගැනිමට නම් අප පාලකයන්ගේ සහ නිලධාරීන්ගේ ආකල්පයන් තුළ තියුණු වෙනසක් නිසැකයෙන්ම ඇතිවිය යුතුය. ගැමි ආර්ථිකයේ කේන්ද්‍රස්ථානයක් වන ගමේ වී මෝලද, තරුණ තරුණියන් නිතර ගැවසෙන රූපලාවන්‍ය ආයතනයද, පාර අයිනේ ඇති වාහන රෙපෙයාර් කිරීමේ ගරාජයද, පෞද්ගලික අංශයේ වැදගත් කොටස් බව පිළිගන්නට ඔවුන් පුරුදු විය යුතුය. ඔවුන්ගේ සිතුවිලි තුළ මෙවනි ආකල්ප වෙනසක් අවංකව සිදුවුවහොත් පමණක්, මෙම සුලු සහ මධ්‍යම පරිමාණයේ "ගැමි පෞද්ගලික අංශයටත්" දිරි ගැන්විම් අවශ්‍ය බව ඔවුන්ට වැටහෙනු ඇත. අද සුලු සහ මධ්‍යම ක්ෂේත්‍රයට අයත් කාර්මික ව්‍යාපාර කටයුතු කරන්නේ දැවෙන ආර්ථික ප්‍රශ්න මධ්‍යයේය. එහෙත්, ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට සංවිධානාත්මකව කිසිවෙකු ඉදිරිපත් නොවීම දැඩි කනගාටුවට කරුණකි. කළමනාකාරීත්වය ගැන දැනුමක් ලබාදෙන්නට ඔවුන්ට කිසිවෙකු නැත. බැංකුවකට ගොස් ණයක් ලබා ගැනිම ගැන ඔවුන්ට උපදෙස් දීමට ඇත්තේ කිප දෙනෙකු පමණකි. තාක්ෂණය පිළිබඳව ඔවුන්ට අවබෝධයක් ලබාදීමට ඉදිරිපත් වී ඇත්තේ අතලොස්සකි. මානව සම්පත් පුහුණු කිරිම ගැන හෝ මූල්‍ය කළමනාකරණය ගැන ඔවුන්ට ඉගැන්වීමට කිසිවෙකු නැත. ගිණුම් සහ පොත් තැබීම ගැන උපදෙසක් දීමට හෝ ඵලදායිතාවය වර්ධනය කරගැනිමට මගපෙන්වීම් ලබා දීමට ඉදිරිපත් වී ඇත්තේ දෙතුන් දෙනෙක් පමණකි. තමන්

නිෂ්පාදනය කරන භාණ්ඩ සහ සේවාවල අලෙවිය දියුණු කරගත හැක්කේ කෙසේද යන්න ගැන හෝ සාර්ථක ව්‍යාපාරයක් කරගෙන යාමට අවශ්‍ය සම්පත් හසුරුවා ගන්නේ කෙසේද යන්න ගැන උපදෙස් ඔවුන්ට ලැබෙන්නේද කලාතුරකිනි.

අද ශ්‍රී ලංකාවේ පවතින අවශ්‍යතාවය මහා පරිමාණයේ කොටස් වෙළඳපොළේ ව්‍යාපාරවලට තව තවත් දිරිගැන්වීම් ලබාදීම නොවේ. දැනටමත් ඔවුනට අවශ්‍ය සම්පත්, ප්‍රාග්ධනය, දැනුම, තාක්ෂණය, බදු සහන සහ රාජ්‍ය සහය ඇතුලු යෙදවුම් බහුලව ලැබී ඇත. එසේ නම් වර්තමාන අවශ්‍යතාවය වන්නේ මෙතෙක් කල් අමතක කර ඇති, සුලු සහ මධ්‍යම මට්ටමේ පෞද්ගලික අංශයට, විශේෂ යෙදවුම්, සහන සහ උපකාර ලබාදීමය.

දෙවන ලෝක යුද්ධයෙන් පසු, ජපානයේ සිදු වූ ආර්ථික ප්‍රාතිහාර්යයේ පදනම වුයේ ගම් මට්ටමේ පිහිටි කුඩා පරිමාණයේ ආයතනවලට සේන්දු වන පරිදි සහන සහ දිරි ගැන්වීම් රජය සහ මහා පරිමාණයේ සමාගම් මගින් දියත් වීමය. එම ක්‍රියාමාර්ගයන් හරහා, ඉතා කෙටි කාළයක් තුලදී පහළ මට්ටමේ දිළිඳුකමින් පෙළෙමින් තිබූ ආයතනවලට වාසිදායක ආර්ථික ප්‍රතිඵල ලැබුණි. අද ශ්‍රී ලංකාවේද අවශ්‍ය වී තිබෙන්නේ කෘෂිකර්ම, ධීවර සහ ඉදිකිරීම් ක්ෂේත්‍රවලට විශේෂ අනුබල ලබා දෙවාත් සමගම, "ගම්බද පුද්ගලික අංශය" දෙසද පාලකයින්ගේ සිත් යොමු වීමක්ය. සමෘද්ධිය බෙදාදීමෙන් පමණක් දිළිඳුකම අවම කිරීම කරගත නොහැකි බව අප හොඳින් වටහා ගත යුතුය. දිළිඳුකම සමාජයෙන් අවම කිරීමට නම්, වගකිවයුත්තන් තෝරාගත් වැඩපිළිවෙත් දිළිඳු භාවයේ රැඳී තිබෙන ක්ෂේත්‍රවල දියත් කිරීම ඉතා වැදගත්ය. එසේ වුවහොත් පමණක්, සමස්ත පෞද්ගලික අංශය මුලු රටේම සහ සමාජයේ, වර්ධනයේ යන්ත්‍රය, වනු ඇත. එසේ නැතිව, අද සිදුවන්නාක් මෙන්, ඉහළ පෙළේ පෞද්ගලික අංශය තෝරාගත් කිපදෙනෙකුගේ වර්ධනයේ යන්ත්‍රය ලෙස දිගින් දිගටම ක්‍රියා වුවහොත් එමගින් මුලු රටටම සිදුවන ආර්ථික සහ සමාජීය අවාසිය දැවැන්ත එකක් වන්නේය.

# 1.20

## 100% ඉඩම් පැවරුම් බද්දෙන් විදේශ ආයෝජනයට දරුණු පහරක්

ඉඩම් පැවරීමේදී සියයට සියක පැවරුම් බද්දක් අයකිරීමේ නීතියක් නැවත බදු ක්‍රමයට එකතු කිරීම සඳහා රජය කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇති බව වාර්තා වී ඇත. එවැනි නීතියක් හරහා විදේශිකයෙකු ශ්‍රී ලංකාවේ ඉඩමක් මිලදී ගනිද්දී, එම ඉඩම වෙනුවෙන් ගෙවන මුළු මුදල හා සමාන මුදලක් "පැවරුම් බද්දක්" වශයෙන් රජයට ගෙවීමට ඔහුට නියම වන්නේය. මෙම බද්ද හරහා රජය අදහස් කරන්නේ අප රට තුළ තිබෙන ඉඩම් ශ්‍රී ලාංකිකයන්ගේ අයිතියෙහි පමණක් රඳවා ගැනීම බව පැහැදිළිය. මෙම අරමුණ මතුපිටින් කොපමණ දේශප්‍රේමී සේ පෙනුනද, එවැන්නක් ඉෂ්ටකර ගැනීමට යෑමෙන් අප රටේ ආර්ථික සහ ව්‍යාපාර ක්ෂේත්‍රයට කුමන අන්දමේ බලපෑමක් ඇතිවේද යන්න සහ විදේශීය ආයෝජන ශ්‍රී ලංකාවට ගලා ඒමේ ප්‍රවණතාවට කුමන අන්දමේ අවාසියක් ඇතිවේවිද යන්න ගැන අප සිරුවෙන් අවධානය යොමුකළ යුතුය.

ශ්‍රී ලංකාවේ මතු දියුණුව සඳහා දැවැන්ත දේශීය සහ විදේශීය ආයෝජන ඉතා ඉක්මණින්ම අත්‍යාවශ්‍යය. වාර්ශිකව 7% ක හෝ 8%ක දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයක් අප ඉලක්ක කරගෙන කටයුතු කරන්නේ නම්, එවැනි වර්ධනයකට සාපේක්ෂ ආයෝජනයක් ආර්ථිකයට සම්බන්ධ වීම අවශ්‍ය වන්නේය. අප රටෙහි ඇති දේශීය ආයෝජකයන් අත එවැනි ප්‍රාග්ධනයක් හෝ ආයෝජන ශක්තියක් නොමැති බව අප සියලු දෙනාම පාහේ අවිවාදයෙන්ම පිළිගත යුතුය. එසේ නම්, විදේශික ආයෝජකයින්ගේ සහ ආයතනවල ආයෝජනය සහ සහයෝගය අපගේ මෙම වර්ධන ප්‍රයත්නයට අතිශයෙන්ම අවශ්‍ය වන බව පැහැදිළිය.

---

**2004.08.22 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

කිසිඳු විදේශිකයෙකු ශ්‍රී ලංකාවට ඇති ආදරය නිසා මෙරටට පැමිණ ආයෝජනය කරන්නේ යැයි අපට සිතිය නොහැක. ඔවුන් මෙරටට පැමිණ ආයෝජන කරන්නට නම්, ඒ සඳහා ඔවුන්ට විශේෂ වාසින් ලැබේ යැයි ඔවුන් විශ්වාස කළ යුතුය. අප රටේම ජිවත් වන, දේශප්‍රේමී යයි හඩනගා පවසන ශ්‍රී ලාංකිකයන්ද මෙරට තුළ ආයෝජනය කරද්දී විශේෂ වරප්‍රසාද සහ දීමනා රජයෙන් බලාපොරොත්තු වෙති. එපමණක්ද නොව, ඔවුන් තමන්ගේ ආයෝජනය දුෂ්කර පළාතකට යොමුකරන්නේ නම්, අමතර විශේෂ දීමනාද රජයෙන් තරයේම ඉල්ලති. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේදී දුෂ්කර පළාත්වල ඇගලුම් කර්මාන්ත 200 ක් ඇරඹීම සඳහා නා නා ප්‍රකාර දිරිගැන්වීම්, රාජ්‍ය සහ යටිතල උපකාර, සහ බැංකු පහසුකම් අපගේම දේශිය ආයෝජකයන්ට ලබාදීමට රජයට සිදුවිය. මෙයින් පෙනෙන්නේ දේශිය ආයෝජකයන්ද සහන සහ වාසීන් රජයෙන් ලැබුණහොත් පමණක්, තම ආයෝජන, දුෂ්කර හෝ අවදානම් මට්ටමේ පවතින ක්ෂේත්‍රවලට හෝ පළාත්වලට යොමුකරන බවය. ආයෝජිකයන්ට ආදායම් බදු වලින් නිදහස, ආයතනයට දිගු කාලින බදු නිවාඩු, රේගු බදු සහන, අඩු මිලට ඉඩම්, සහන මිලට යටිතල පහසුකම්, කඩිනම් රාජ්‍ය ආයතන ප්‍රතිචාර, තිරු බදු වලින් නිදහස් සුබෝපභෝගි වාහන ආනයනය කිරිමට බලපත්‍ර ඇතුලු විවිධ වාසීන් ආයෝජිකයින් නිරන්තරයෙන්ම රජයෙන් පුන පුනා ඉල්ලති; රජයන්ද ඒවාට බොහෝ දුරට එකග වෙති. කවුරු කෙසේ පැවසුවත්, යථාර්ථය වන්නේ රජයන් මෙවැනි වාතාවරණයක් පිහිටුවීමට සමත් නොවුවහොත් දේශිය හෝ විදේශිය ආයෝජන ශ්‍රී ලංකාව වැනි රටවල වර්ධනය නොවීමය. මෙම තත්ත්වය තේරුම් ගැනිමට අප යථාර්ථවාදී විය යුතුය.

මෙම ආයෝජන දිරිගැන්වීමේ ප්‍රයත්නය අප තව දුරටත් පුලුල්ව විග්‍රහ කළහොත් අපට පෙනෙන්නේ ආයෝජනයට බලපාන්නේ ඉහත කී සෘජු සාධක පමණක් නොවන බවය. බොහෝවිට, ජාත්‍යන්තර ආයෝජකයන් ආයෝජන තීරණ ගැනිමේදී තමන්ගේ පෞද්ගලික පහසුකම් ගැනද අවධානය යොමු කරති. තම දරුවන්ගේ ඉගෙනිම සඳහා ජාත්‍යන්තර පාසැල්, තම පවුල්වල ජිවත් විම සඳහා සුබොපභෝගි ගොඩනැගිලි සහ නිවෙස්, තමන්ගේ

සුපුරුදු ක්‍රීඩාවල යෙදිය හැකි පහසුකම්, තමන් ප්‍රිය කරන විනෝදාංගවල නිරත වීමට හැකියාව, රටතුළ සංචාරය සඳහා සහ විදේශගත වීමේ ගමනා ගමන පහසුකම්, සොර සහ සතුරු බියෙන් තොරව ජීවත් වීමේ හැකියාව සහ සාධාරණ ජීවන වියදම් මට්ටම වැනි චක්‍රාකාර "මානුෂික" සාධක ගැනද ආයෝජිකයින් අනිවාර්යයෙන්ම තම සිත් යොමු කරති. එසේ නම්, ආයෝජිකයන්ගේ පැසසුමට ලක්වෙන සතුටුදායක වාතාවරණයක් සකස් කිරීම සඳහා බොහෝ රජයන් අද ක්‍රියාමාර්ග දියත් කිරීම පුදුමයට කරුණක් නොවිය යුතුය. ඉහත කී සාධක අතරින් වැදගත් එකක් වන්නේ විදේශිකයන්ට රටක් තුළ ජීවත් වීමට හෝ විනෝද වීමට ඉඩමක් හෝ නිවෙසක් හෝ ගොඩනැගිල්ලක් සාධාරණ මිලකට ලබාගැනීමට ඇති හැකියාව සහ පහසුකමය. තමන් ආයෝජනය කරන්නට බලාපොරොත්තු වන රටක ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් මිලදී ගැනීමට බොහෝ ආයෝජකයින් කැමැත්තක් දක්වති. එවැනි ක්‍රියාවක් තුළින් එම විදේශික ආයෝජිකයින් රට තුළ යම් ස්ථාවර භාවයකට පත්වෙති. තවද, ඔවුන්ගේ ව්‍යාපාරික ආයෝජනද එම තත්ත්වය හරහා යම් ස්ථිර භාවයට පත්වෙනු ඇත. ඒ නිසා, ඔවුන්ට එවැනි අවස්ථාවන් වැඩි බාධාවක් නැතිව ලබාදීමට බොහෝ රටවල් ක්‍රියා කිරීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත. එවැනි ක්‍රියා මාර්ග තුළින් රටෙහි දේපළ වෙළඳ පොළෙහිද සැලකිය යුතු වර්ධනයක් සිදුවීම තවත් යහපත් අතුරු ප්‍රතිඵලයක් ලෙසද හැඳින්විය හැක.

විදේශිකයන් වැඩිදෙනෙක් යම් රටකට පැමිණීමේ ප්‍රවණතාවයක් ඇතිවන විට ඒ තුළින් සමහර අයහපත් බලපෑම්වල වර්ධනයක් සිදුවිය හැක. එහෙත්, එවැනි අභියෝගයන් ඉදිරියෙහි රටක පාලකයින්ගේ දක්ෂතාවය විය යුත්තේ එම අයහපත් බලපෑම් අවම කර ගනිමින්, ප්‍රශ්න මතුවන අවස්ථාවලදීම ඒවාට විසඳුම් ලබාදීමෙන් ඉදිරියට යැමය. එමගින්, ආයෝජකයන්ගේ විශ්වාසය නොකඩවා රඳා පවත්වා ගනිමින්, තම ආර්ථිකය ඉදිරියට ගෙන යාමට රජය වගබලා ගත යුතුය.

ශ්‍රී ලංකාව ලෝකයේම ඇති උතුම් රට බව ආඩම්බරයෙන් ප්‍රකාශ කිරීමට අප කැමතිය. එහෙත්, අප රටේ වෙසෙන

ජනගහනයෙන් අඩකට වඩා සංඛ්‍යාවක් ජීවත් වන්නේ දිනකට ඇමෙරිකානු ඩොලර් එකකටත් වඩා අඩු ඒක පුද්ගලික ආදායමක් ඔස්සේ බව අප අමතක නොකළ යුතුය. ලෝක ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ එවැනි අය හැඳින්වෙන්නේ අන්ත දුගී දුප්පත් අය වශයෙනි. එවැනි දුගී භාවයකින් අප රට වැසියන්ගෙන් වැඩි සංඛ්‍යාවක් පෙළෙමින්, බඩගින්නේ දුක් විඳින අතර ශ්‍රී ලංකාවේ උතුම් භාවය ගැන හෝ යහපත් සෞන්දර්යත්වය ගැන හෝ පවසමින් ඔවුන් පැහැදීමකට ලක් කිරීමට නොහැකි බව අප තේරුම් ගත යුතුය. එසේ නම්, රට පෙරට ගෙන යනු වෙනුවට රට පසුපසට ඇද දමන මෙම පැවරුම් බද්ද වැනි ප්‍රතිපත්ති අප තරයේම ප්‍රතික්ෂේප නොකළහොත් ඇත්තවශයෙන්ම අප රට විදේශීය ආයෝජකයන්ගේ අප්‍රසාදයට භාජනය වීම තුළින් ඔවුන් ඉක්මණින්ම අප රටෙන් පිටවී යෑමෙන් පාඩු විඳින්නේ අපගේම දුප්පත් ජනතාව බව අප හොඳින් අවබෝධ කරගත යුතුය.

අද යුගයේ අවශ්‍යතාවය වන්නේ ආයෝජකයන්ට හිතකර (investor friendly) ප්‍රතිපත්ති රටක් තුළ ක්‍රියාත්මක කිරීමය. ඒ සඳහා ආයෝජකයින් දිරිමත් කරන නීති රීති සහ පහසුකම් ස්ථාපනය කිරීම රජයේ වගකීමය. පසුගිය වසර 50 තුළදී අගනා අවස්ථාවන් රැසක් අප නෙත් ඉදිරියේම ගිලිහී ගොස් ඇත. ඒවායින් බුද්ධිමත්ව ප්‍රයෝජනය ගත් වෙනත් ආසියාතික රටවල් සංවර්ධනය අතින් අද ඉතා ඉදිරියට ගමන් කොට ඇත. 1950 දී අපට වඩා බෙහෙවින් පහළ මට්ටමක තිබුණු සිංගප්පූරුව, තායිලන්තය, කොරියාව වැනි රටවල් ආර්ථිකව අප රට ගව් ගණනකින්ම අභිබවා ඇත. එහෙත්, අදත් අතීතයේ පාඩම් ඉගෙන නොගනිමින්, අනුවණ හා අවාසනාවන්ත තීරණ ගනිමින්, එම පහත් ආර්ථික තත්ත්වයේ විහින්ම වාගේ රැඳී සිටීමට අප පාලකයින් තැත් කිරීම මහත් කණගාටුවට කරුණකි.

# 1.21

## ආබාධිත යයි කියන පුද්ගලයන් ආර්ථිකයට සම්බන්ධ කර ගනිමු

සමස්තයක් වශයෙන් ශ්‍රී ලාංකිකයන් මෙත්තාව සහ කරුණාව යන උදාර ගතිගුණ බහුලව ඇති පුද්ගලයින්ය. යම්කිසි කෙනෙකු අන්තරාවට හෝ අපහසුතාවයට හෝ වෙනත් අකරතැබ්බයකට පත්වුවහොත් එම පුද්ගලයාට ඉක්මණින්ම පිහිට වීමට හා සහය වීමට අප සමාජයක් වශයෙන් පුරුදු වී සිටිමු. මෙම විශිෂ්ඨ පරාර්ථකාමී ලක්‍ෂණය හරහා ආබාධිතයන්ට පිහිට වීමටද අප බොහෝ අවස්ථාවලදී ඉතා ඕනෑකමකින් කටයුතු කරමු. යම් අන්ධයෙකු, බිහිරෙකු හෝ ගොලුවෙකු හෝ ඇවිදීමට නොහැකි පුද්ගලයෙකු හෝ වෙනත් ආබාධිත තත්ත්වයකින් දුෂ්කරතාවයට පත්වූ කෙනෙකු මුණ ගැසුණු විට, එම පුද්ගලයාට කෑම බීම සැපයීමට හෝ වෙනත් අන්දමකට හෝ මුදලින් හෝ උපකාර කිරීමට අප කිසි විටෙකත් පැකිලීමක් නොදක්වමු. ඇත්ත වශයෙන්ම එවන් අවස්ථාවලදී අපගේ හදවත් උණු වී, ඔවුන් කෙරෙහි දැඩි අනුකම්පාවකින් අප ඔවුන්ට සළකමු. තවද අපගේ උපන් දිනය වැනි විශේෂ දිනයන්හිදී හෝ අපගේ පරලොව සැපත්වූ ඥාතීන්ට පිංදීම සඳහා හෝ ආබාධිතයන් වෙසෙන පොදු නිවෙස් වලට දානය සහ වෙනත් උපකාරද අප දැඩි ආදරයකින් ලබා දෙන්නෙමු.

එහෙත්, අප දක්වන මෙම වටිනා ප්‍රතිචාරය දෙස යථාර්ථවාදීව සිත් යොමු කළ හොත්, අපට පෙනී යන්නේ අප ආබාධිතයන්ට කෙතරම් අනුකම්පාව දැක්වුවත්, වෙන කෙනෙකුට අතනොපා තමන්ගේ ජීවිත, ගෙනයෑම පිණිස ඔවුන්ට අවස්ථාවන් ලබාදීමට නම්, අප එතරම්ම කැපවීමකින් ක්‍රියා නොකරන බවය. අපගේ ආයතන වලට සේවකයන් බඳවා ගනිද්දීද අපගේ කාර්යාලවලට ආබාධිතයන්ගේ පැමිණීම පහසුකර දීමටද, අබාධිත අයට විශේෂ

---

**2004.09.19 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබාදීමටද අප එතරම්ම උද්යෝගයක් නොදක්වමු. අද අප රටේ ආබාධිතයන් දස ලක්ෂයක් පමණ සිටින බව ඇස්තමේන්තු කර ඇත. එම සංඛ්‍යාවෙන් වැඩි කොටසක් ඉතා දුගී සහ අසරණ තත්ත්වයක සිටිති. තමන්ගේ එදිනෙදා යැපීම සඳහා රැකියාවක හෝ වෘත්තියක හෝ ව්‍යාපාරයක යෙදී සිටින්නේ අතලොස්සක් පමණය. එහෙත් බොහෝ විට එවන් පුද්ගලයන් කිසියම් ශාරීරික හෝ මානසික අබාධිත තත්ත්වයකින් පෙලුනද, වෙනත් ආකාරයකට දක්ෂතාවයන් රාශියක් සහිත අය විමට පුලුවන. එසේ නම්, සිදුවිය යුත්තේ ඒ අයගේ එවන් දක්ෂතාවයන් සහ හැකියාවන් සැළකිමට ගෙන, ඔවුන්ගෙන් ලබාගත හැකි සේවයන් අප හොඳින් වටහාගෙන, ඒවාට සරිලන සහ ඒවා ඉස්මතු කරන අවස්ථා සකස් කර දීම බව පැහැදිළිය.

බොහෝ දියුණු රටවල ආබාධිතයන් කෙරෙහි එම රට වැසියන් දක්වන අනුකම්පාව අප රටේ පවතින මට්ටමට වඩා බෙහෙවින් අඩු විය හැකිය. එහෙත්, එවන් සමාජයන් නිති හරහාද, සමාජීය මට්ටමෙන්ද, ආබාධිතයන්ට තමන්ගේ සේවය ආත්ම ගෞරවයකින් යුතුව, සමාජයටද විවිධ ව්‍යාපාර වලටද, රජයටද ලබාදීමට අවස්ථා සහ ක්‍රම රාශියක් බිහිකර ඇත. සමහර රටවල ඕනෑම ව්‍යාපාරයක හෝ ආයතනයක් අවම වශයෙන් 5% ක වත් පුද්ගලයින් සංඛ්‍යාවක් ආබාධිත පුද්ගලයින් විය යුතු යයි අනිවාර්ය කෙරෙන නිති පනවා ඇත. එපමණක් නොව, ආබාධිතයන්ට පොදු කාර්යාලයකට හෝ ගොඩනැගිල්ලකට ස්වශක්තියෙන්ම පිවිසෙන්නට හැකිවන ලෙසද, ඔවුන්ට පහසුවෙන් පාවිච්චි කළ හැකි වැසිකිළිද එම ගොඩනැගිලිවල අඩංගු විය යුතු යයි නිති සහ රෙගුලාසි අනිවාර්ය කොට ඇත. මෙවැනි ක්‍රියාමාර්ග තුළින් අබාධිතයන්ට ආර්ථිකයට සාජුවම සම්බන්ධ විමට හැකිවන ලෙස අවස්ථාවන් එම රටවල් සකසා ඇත. එසේ කිරීමෙන් ආබාධිතයන්ට තමන්ගේ රටේ දළ දේශිය නිෂ්පාදනයට දායක විමට අවස්ථා රාශියක් බිහිවේ. රජයේ අයවැයට බරක් වනවා වෙනුවට ඔවුන් රටේ ආදායමට දායකත්වයක් ලබාදෙති. අද ශ්‍රී ලංකාවේ සිදුවී ඇත්තේ ආබාධිතයන් වෙනුවෙන්, අප පෞද්ගලිකව "පිණට" මුදල් වෙන් කරනවා මෙන්, රජයද ඔවුන්ගේ එදිනෙදා නඩත්තුව සඳහා යම් සොච්චමක් වෙන් කිරීමය. මනුෂ්‍යත්වයේ නාමයෙන්,

මෙසේ කිරීම ධර්මිෂ්ඨ ක්‍රියාවක් වුවත්, බොහෝවිට එම ක්‍රියාවලියෙන් සිදුවන්නේ, ආබාධිත අය දිගින් දිගටම ඉතා දුගී දුප්පත් භාවයේම රැඳී සිටීමත්, ඔවුන්ගෙන් ලබාගත හැකි නිසි ඵල සමාජයට සහ රටට අහිමි වීමත්ය. මෙම ප්‍රශ්නය මතුපිටින් බලන විට සමාජීය ප්‍රශ්නයක් පමණක් ලෙස පෙනුනත්, එය ඇත්ත වශයෙන්ම ආර්ථිකයටද සෘජුවම බලපාන ප්‍රශ්නයකි. මක්නිසාද යයි කිවහොත්, එක් පැත්තකින් කිසිඳු ආර්ථික වාසියක් නොමැතිව පිං පඩියක් රජය ආබාධිතයන් වෙනුවෙන් වෙන් තරනවාත් සමගම, අනික් පැත්තෙන් ආබාධිත යයි කියන පුද්ගලයින්ගෙන් ලබාගත හැකි නිසි ඵලදායී සේවයද, රටට නොලැබේ. එසේ නම්, රටේ ආර්ථිකයටද බලපාන මෙම ප්‍රශ්නයට අප මුහුණ දී එය රටේ සහ ආබාධිතයින්ගේ වාසියට පරිවර්තනය කර ගැනීමේ ක්‍රියාමාර්ගයකට පිවිසීම ඉතා යෝග්‍යය. එවැනි ක්‍රියාවලියක් සාර්ථක කර ගැනීමට අපට අනුගමනය කළ හැකි උපාය මාර්ග කිහිපයකි.

පළමුව, කිසියම් ආයතනයක හෝ සංවිධානයක සේවකයන් 20 ක් ඉක්මවන්නේ නම් එවැනි ආයතනයක සේවය කිරීම සඳහා ආබාධිත පුද්ගලයන් අවම වශයෙන් 5% කට අවස්ථා දිය යුතු යැයි නීතියක් පාර්ලිමේන්තුව සම්මත කළ යුතුය. එකී ආයතනය, රජයේ හෝ රාජ්‍ය නොවන හෝ ආගමික හෝ පෞද්ගලික අංශයේ හෝ විය හැකිය.

දෙවනුව, ආබාධිත දරුවෙකු පාසැල් අධ්‍යාපනය හමාර කොට පාසැලෙන් ඉවත්ව යන අවස්ථාවේදී එම දරුවාට සුදුසු රැකියාවක් කිරීමට හැකිවන සේ තෘතිය මට්ටමේ අධ්‍යාපනයක් සහ පුහුණුවක් අනිවාර්යයෙන්ම ලබාදීම වෙනුවෙන්, අවම වශයෙන් රුපියල් ලක්ෂයක මුදලක් වසර 2ක හෝ 3ක කාලයක් ඔස්සේ ලබාදීමට රජය කටයුතු කළ යුතුය. මේ සඳහා සාර්ථකව පාවිච්චි කළ හැකි එක් ක්‍රමයක් නම් රුපියල් ලක්ෂයක වටිනාකමක් අඩංගු 'කලින් ගෙවා ඇති දුරකථන කාඩ්පත්' (pre-paid telephone cards) හා සමාන විද්‍යුත් කාඩ්පතක් සෑම ආබාධිත දරුවෙකුටම නිකුත් කිරීමය. එවිට, එම විද්‍යුත් කාඩ්පත පාවිච්චි කරමින්, දරුවා තමාට සරිලන යම් වෘත්තියක් හැදෑරීමට හෝ

තමාගේ තත්ත්වයට ආවේනික යම් රැකියාවක් සඳහා විශේෂ අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා ගැනීමට හැකිවේ. එසේ කරද්දී රජය යෙදිය යුතු එක් කොන්දේසියක් නම්, එම අධ්‍යාපන විද්‍යුත් කාඩ්පත් භාරගත හැකි පුහුණු සහ අධ්‍යාපන ආයතන රජයෙන් කලින් තෝරාගෙන යම් ප්‍රමිතියකට අනුව නිර්දේශ කොට ඇති ආයතන පමණක් වීමය. මේ ආකාරයට ආබාධිත දරුවන් එවැනි අධ්‍යාපන සහ පුහුණු ආයතන හරහා විශේෂ පුහුණුවක් ලබාගෙන, ඊට පසු සාමාන්‍ය ව්‍යාපාර සහ අනිකුත් ආයතනවල සහ කාර්යාලවල සේවය කිරීමට ශක්තියක් ලබාගනු ඇත.

තෙවනුව, ආබාධිත පුද්ගලයන්ට සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට පහසුවන ලෙස ගොඩනැගිලි වලට සහ අනිකුත් කාර්යාලවලට පිවිසීමේ පහසුකම් සළස්වන ලෙස පහසුකම් සහිත පොදු ගොඩනැගිලි සකස් කරන නීති ක්‍රියාවේ යෙදවිය යුතුය.

ඉහත දක්වා ඇති යෝජනා සමහරක් ක්‍රියාත්මක කිරීමට යම් මුදලක් වෙන් කිරීමට රජයට සිදුවන්නේය. එහෙත්, මාගේ මතය අනුව, එවැනි මුදලක් ආබාධිතයන් වෙනුවෙන් වෙන් කිරීමෙන් අප කරන්නේ අප රටේ මෙතෙක් අමතක කොට ඇති විශේෂිත ජන කොටසක් වෙනුවෙන් යම් ඵලදායි ආයෝජනයක් කිරීමය. එසේ වෙන්කරන මුදල, 'අනුකම්පාව හරහා අපගේ සමාජීය ආත්මය ගලවා ගැනීමේ චේතනාවෙන් කරන පිණක්' ලෙස අප නොසැලකිය යුතුය. එම මුදල ආයෝජනයක් ලෙස සලකමින්, එම ආයෝජනය වර්තමාන සමාජයේ ආර්ථිකය තව දුරටත් ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියක් ලෙස තේරුම් ගනිමින් මෙම වැඩපිළිවෙත සාර්ථකව දියත්කර ගතහොත්, ඒ තුළින් අප රටේ ආර්ථිකයට සැළකිය යුතු ශක්තියක් අනිවාර්යයෙන්ම ලැබෙනු ඇත.

# 1.22

## රුපියලේ අගය සහ ආර්ථිකය ආරක්‍ෂා කරගන්නට නම් ඉන්ධන භාවිතය අඩුකර ගනිමු

අප එදිනෙදා පාවිච්චි කරන යම් භාණ්ඩයක මිල වැඩිවූ විට අප කරන්නේ කුමක්ද? අනිවාර්යයෙන්ම එම භාණ්ඩය පාවිච්චි කරද්දී යම් පිරිමැස්මකින් එසේ කිරීමටද, එම භාණ්ඩය පරිහරණය කරන අපගේ පවුලේ අයට සහ/හෝ සේවකයන්ට පිරිමැස්මකින් එය පාවිච්චි කරන්නට යැයි උපදෙස් දීමටද අපි පෙළඹෙමු. අප අත ඇති සම්පත් සීමිත නිසා එසේ කිරීමෙන් එම භාණ්ඩය වෙනුවෙන් වෙන් කරන අපගේ සම්පත් කොටස හැකිතාක් ප්‍රමාණයකට පෙර මට්ටමේම පවත්වා ගැනීමට වෙහෙස ගනිමු. මෙම ක්‍රියාවලිය ඕනෑම කෙනෙකුට තේරුම්ගත හැකි සරල සහ සාමාන්‍ය ක්‍රියා මාර්ගයකි. භාණ්ඩයක මිල වැඩිවෙන අවස්ථාවක සාමාන්‍ය බුද්ධියක් ඇති පුද්ගලයින් ඉහත කී අන්දමට හැසිරෙන්නේ නම්, ලෝකයේ ඉන්ධන මිල වේගයෙන් ඉහළ නගින අවස්ථාවක ඊට සාපේක්‍ෂව ඉන්ධන පාවිච්චිය අඩුකර ගන්නා ප්‍රයත්නයක් අප රටේ සිදු නොවීම පුදුමයට කරුණකි. එපමණක් නොව, ඒ ගැන සාකච්ඡාවක් වත් මතු නොවීම, ඊටත් වඩා පුදුමයට කරුණකි.

පසුගිය මාස කීපය තුලදී, ඉරාකයේ සහ සෞදි අරාබියේ ගැටලු හේතුකොටගෙන ලෝක ඉන්ධන මිල ඉතා ශීඝ්‍රයෙන් සහ විශාල පරිමාණයකින් වැඩි විය. 2002 වසරේදී, බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල වුයේ ඇමෙරිකානු ඩොලර් 25 කි. 2003 දී එම මිල ඇමෙරිකානු ඩොලර් 29 දක්වා ඉහළ නැගුණි. 2004 වසරේදී බොර තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 45 සහ 50 අතර වෙනස් වෙමින් පවතී. එනම්, පසුගිය වසරට සාපේක්‍ෂව 50% කටත් වඩා වැඩි ප්‍රතිශතයකින් 2004 වසරේදී

---

**2004.09.26 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුළිපි පෙළෙහි පළවූ ලිපියකි.**

තෙල් මිල ඉහළ ගොස් ඇත. මෙම ඉහළ යෑම ශ්‍රී ලංකාව ඇතුළු රටවල් රාශියකගේ විදේශ සහ දේශීය අය වැය ගිණුම්වලට දැවැන්ත පහරක් සහ තර්ජනයක් එල්ල කොට ඇත. ඒ අතරම, ඉන්ධන මිලදී ගැනීම පිණිස ඇමෙරිකානු ඩොලර් පාවිච්චි කළයුතු බැවින්, ශ්‍රී ලංකාවේ ඉන්ධන බිල්පත්‍ර පියවීම සඳහා ඇමෙරිකානු ඩොලර්, පෙර වර්ෂවලට වඩා වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමට රජයට දැන් සිදුවී ඇත. ඒ නිසා, ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු ඩොලර් වලට ඇති ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ යෑමක්ද සිදුවී ඇත. එසේ සිදුවීමෙන් රුපියලේ අගය දැඩි පීඩනයකට ලක් වී, ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම බාල්දු වීම, උද්ගත වී ඇති තත්ත්වයේ අපේක්ෂා කළ හැකි ප්‍රතිඵලයක් වශයෙන් අපට හැඳින්විය හැකිය.

මෙම දැවෙන ප්‍රශ්නය පිළිබඳව සියලු දෙනාම පාහේ දැන සිටියද, කථා කළද, විග්‍රහ කළද, විවාද පැවැත්වුවද, ඒ වෙනුවෙන් ඇති මූලික ප්‍රායෝගික සහ යථාර්ථවාදී විසඳුම වන ඉන්ධන පාවිච්චිය හැකිතාක් දුරට අවමකර ගැනීම ගැන නම් අවධානය තවමත් යොමු වී නොමැති තරම්ය. තවද, එසේ කිරීමට රටවැසියන් පොළඹවනු පිණිස කිසිඳු වගකිව යුතු මූල්‍ය පාලකයෙකු තවමත් කිසිඳු නිල අභියාචනයක් කර නොමැත. අද වන විට ඉන්ධන ආශ්‍රිත විදුලි බලාගාර ක්‍රියාත්මක වීමෙන් නිෂ්පාදනය කරන විදුලිය පාවිච්චිය අප අඩු කර නැත. කිසිඳු පැකිලීමකින් තොරව රට පුරාම ගමනා ගමනයේ යෙදෙන ලක්ෂ සංඛ්‍යාත වාහන දවන පෙට්‍රල් සහ ඩීසල් වල ඉල්ලුමේද කිසිඳු අඩුවක් සිදුවී නැත. විවිධ අවශ්‍යතාවයන් හරහා භූමිතෙල් සහ ෆර්නස් තෙල් පාවිච්චියේද අඩුවක් වී නැත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2003 දී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද මුලු ඉන්ධන ප්‍රමාණය වෙනුවෙන් වැයවූ මුදල, ඇමෙරිකානු ඩොලර් මිලියන 838 කි. එවිට, බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල වූයේ ඇමෙරිකානු ඩොලර් 29 ක් පමණි. ලෝක ඉන්ධන මිල ඇමෙරිකානු ඩොලර් 45 - 50 අතර පවතින වර්තමාන යුගයේදී අපගේ ඉන්ධන පාවිච්චිය අඩු නොකරගතහොත්, බොරතෙල් වෙනුවෙන් අප රටට ගෙවීමට

සිදුවන මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 1,200ක් පමණ විය හැකිය. එවැනි විදේශ විනිමයක් අප රටට වැය කරන්නට සිදුවුවහොත් එයින් උද්ගත වන අර්බුදය අප ආර්ථිකයට ඉතා අහිතකර වනු නියතය. එමගින්, සිදුවෙන ආර්ථික පීඩනය අඩුකර ගැනීමට නම්, අප දියත් කළ යුතු අත්‍යවශ්‍ය ප්‍රතිචාරය වන්නේ, හැකි සෑම අන්දමකටම, ඉන්ධන වෙනුවෙන් 2004 වසරේදී වැයවන ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණය කෙසේ හෝ 2003 දී තිබූ මට්ටමට කිට්ටුවෙන්ම තබා ගැනීම පිණිස ඉන්ධන පාවිච්චිය අඩු කර ගැනීමය. ඒ සඳහා අප සියලු දෙනාටම අනුගමනය කළහැකි හොඳම ක්‍රියාමාර්ග නම්, විදුලිය පාවිච්චිය, වාහන පාවිච්චිය යනාදී ඉන්ධන ආශ්‍රිත සේවාවන් දැඩි උනන්දුවකින් 15% සිට 20% කින් වත් අඩුකර ගැනීමය. එවැනි ප්‍රයත්නයක් සාර්ථකව දියත් කිරීමට අපට හැකි වුවහොත් වර්තමානයේදී පවතින ඉන්ධන අර්බුදයට යම් තීරණාත්මක සහ දැනෙන විසඳුමක් අපට දක්වන්නට හැකිවනු ඇත.

ඉන්ධන පාවිච්චිය ක්‍රම රාශියකින් අප රට වැසිටන්ට අඩුකර ගත හැක. විදුලිය පිරිමැසීමෙන්ද, ගමන් බිමන් සැළසුම් සහගතව, ක්‍රමානුකූලව සහ අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් යොදවා ගැනීමෙන්ද සැහෙන ඉතිරියක් අත් කරගත හැක. වාහන තදබදයක් ඇති අවස්ථාවලදී, ඉන්ධන නිකරුණේ නාස්ති නොවන ලෙස, ගමන් සැළසුම්කර ගනිමින්ද, ගමන් කීපයක්ම එක අවස්ථාවකදීම යොදවා ගැනීමෙන්ද ඉතිරි කරගත හැකි කාලයද, ශ්‍රමයද, ඉන්ධන ප්‍රමාණයද, අප සිතනවාට වඩා බෙහෙවින් වැඩි විය හැකිය. මෑත කාළයේදී පැණ නැගුණු මෙම ඉන්ධන අර්බුදය ආරම්භ වුවායින් පසුව මා පෞද්ගලිකව පාවිච්චි කරන විදුලිය සහ ඉන්ධන ප්‍රමාණය 20% කින් පමණ ක්‍රමානුකූලව අඩුකර ගැනීමට සමත් වූයේ ඒ පිළිබඳව විශේෂයෙන් සිතාමතා සැලැස්මක් සකස් කර එය යම් විනයක් සහිතව දියත් කිරීමෙනි. මාගේ මතය අනුව, එවැනි ඉතිරි කිරීම් අප සියලු දෙනාටම වැඩි දුෂ්කරතාවයකින් හෝ අපහසු තාවයකින් තොරව කළ හැක. එහෙත්, අප රටේ අප සාමාන්‍යයෙන් පුරුදු වී ඇත්තේ යම් ඉල්ලීමක් හෝ මග පෙන්වීමක් රටේ නායකත්වයෙන් ලැබුණු විට පමණක් මෙවන් ජාතික හැගීමක් ඇති ක්‍රියාමාර්ග වල යෙදීමටය.

අප රටේ "චාරිත්‍රය" එසේ වන නිසා, එවැනි නිල ඉල්ලීමක් හෝ මග පෙන්වීමක් රජය වෙනුවෙන් මුදල් ඇමති ඉතා ඉක්මණින්ම කළ යුතුයයි මා සිතමි.

ඉන්ධන අර්බුදය හේතුකොටගෙන, ලෝකයේ විවිධ මූල්‍ය ආයතන වලින් සහන ක්‍රම යටතේ ණය මුදල් ලබා ගැනීම වැනි ක්‍රියාමාර්ග කිපයක්ම රජය අනුගමනය කරනු අපි දකිමු. ඒවායේ යම් යහපත් ප්‍රතිඵල තිබුණද, අප අමතක නොකළ යුතු එක් වැදගත් කරුණක් නම්, එම ණය හරහා ලබා ගන්නා මුදල් අපගේ ඉදිරි පරම්පරාවන් ගෙවිය යුතු බවය. එම ක්‍රියාමාර්ගවල ගුණ අගුණ කුමක් වුවත්, ඒවා කෙසේ ක්‍රියාවේ යෙදුවත්, ඉහත කී "පිරිමැසීමේ ක්‍රියාවලිය" ඉතා පුළුල්ව හා ඉක්මණින්ම අප රටේ දියත් කළහොත් නම්, මෙම දැවෙන ප්‍රශ්නයට සැළකිය යුතු යහපත් බලපෑමක් ඇතිකර ගැනීමට අප සියලු දෙනාටම හැකි වනු නිසැකය.

# 1.23

## චිත්‍රපට, ටෙලිනාට්‍ය, විලාසිතා සහ ආර්ථිකය

චිත්‍රපට ගැන කතා කරද්දී සැනෙකින්ම සිතට පැණ නගින නගරය නම් ඇමෙරිකා එක්සත් ජනපදයේ "හොලිවුඩ්" නගරයයි. පුරා ශත වර්ෂයකට කිට්ටු කාළයක පමණ සිට මුලු ලෝකයේම ප්‍රසිද්ධතම චිත්‍රපටි නිර්මාණය කරන ලද්දේ හොලිවුඩ් නගරයේය. හොලිවුඩ් නගරය එවැනි ප්‍රසිද්ධත්වයක් දිගින් දිගටම ලබා තිබුණද, පසුගිය වසර 10 සිට 20 තුලදී, ඉන්දියාවේ මුම්බායි නගරය හොලිවුඩ් නගරය අභිබවා යන්නට තරම් ශක්තියක්, ප්‍රසිද්ධියක් සහ වැඩ කොටසක් කරගෙන යන බව ආර්ථික සහ කලා විචාරකයන් පවසති. "බොලිවුඩ්" නමින් හැඳින්වෙන මෙම අති දැවැන්ත චිත්‍රපට සහ ටෙලිනාට්‍ය ව්‍යාපාරය අද ඉන්දියාවේ ආර්ථිකයේ මුල් තැනක් රැගෙන ඇති බව සියලු දෙනාම දැන් පිළිගනිති. මෙම චිත්‍රපට සහ ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයට කිට්ටුවෙන්ම සම්බන්ධ සංගීතය, විලාසිතා, නැටුම්, ආදී අතුරු ක්ෂේත්‍රද අද ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවති. තවද, එම ව්‍යාපාරයන්ට ශක්තිය හා සහයෝගය ලබාදෙන පුහුණු කිරිමේ මධ්‍යස්ථානද, නාට්‍ය සහ සංගිත පාසැල්, පසුතල නිර්මාණ, ගමනා ගමන පහසුකම්, නාට්‍ය කණ්ඩායම්, ඇඳුම් නිර්මාණ සහ මැසීම් ශිල්පීන්, කොණ්ඩා සැකසුම් සහ අංග රචන ශිල්පීන්, හඬ කැවීමේ ශිල්පීන්, සංස්කරණ ශිල්පීන්, පරිගණක නිර්මාණ ඇතුලු දහසක් උපකාරක සේවාවන්ද ඉන්දියාවේ බහුලව ව්‍යාප්ත වී ඇත.

මෙම ක්ෂේත්‍ර තුලින් ලක්ෂ ගණන් පුද්ගලයින් ජිවනෝපායන් ලබාගන්නා අතර, අප රූපවාහිනියෙන් ආශ්වාදයක් ලබා ගන්නා සෑම චිත්‍රපටයකම හෝ ටෙලිනාට්‍යයකම හෝ සංගිතයකම හෝ නැටුමකම පිටුපස දහස් ගණන් පුද්ගලයින් රැකියාවන් වල සහ වෙනත් ජිවනෝපායන් වල නිරත වී එම දස්කම් අපට ඉදිරිපත්

---

**2004.10.03 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තිරුලිපි පෙලෙහි පළවූ ලිපියකි.**

කරනු ඇත. ඒ හරහා නොදැනුවත්වම වාගේ, ඉන්දියාවේ බොලිවුඩ් සහ සම්බන්ධ ක්ෂේත්‍රයන්, ඩොලර් බිලියන 50 ක් ඉක්මවන දැවැන්ත ව්‍යාපාරයක් බවට දැන් පරිවර්ථනය වී තිබේ. එසේ නම්, අපගේ අසල්වාසි රටක මෙවැනි ක්ෂේත්‍රයක් මෙපමණ දියුණුවක් ලබා තිබියදී එම ක්ෂේත්‍රයෙන් අපට යම් වාසියක් ගත හැකි දැයි විග්‍රහ කිරීම වැදගත් යයි මා සිතමි.

ආර්ථික කෝණයකින් විග්‍රහ කරන විට ශ්‍රී ලංකාවේ ඉතා අලංකාර දර්ශණ පසුබිම්, අප රටේ නිෂ්පාදනය වන සිංහල චිත්‍රපට සහ ටෙලිනාට්‍ය කිහිපයකට පමණක් සීමා වීම විශාල පාඩුවකි. අප රටේ ඇති අලංකාර දර්ශණ උපයෝගී කර ගනිමින් හින්දි සහ ද්‍රවිඩ චිත්‍රපට සහ ටෙලිනාට්‍ය ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලැබුවහොත්, ඒ තුළින් විශාල අදායමක් සහ විදේශ විනිමයක් අපට උපයෝගී කරගත හැකිය. එපමණක් නොව, අපගේ නාට්‍ය, සංගීත සහ තාක්ෂණ කණ්ඩායම්, නළු නිළියන් සහ අනිකුත් උපකරණ ක්‍රියාකරන්නන් ඇතුලු දහසක් දෙනෙකුට නව ආදායම් මාර්ගද, අවස්ථාවන්ද බිහිවෙනු ඇත. තවද, ඉන්දියාවේ දැනට දියුණු වී ඇති මෙම සේවාවන් සමග ශ්‍රී ලාංකික සේවාවන් එකතු වී කටයුතු කිරීමෙන්, ශ්‍රී ලංකාවේ එම සේවාවන්ද ඉහළ මට්ටමකට දියුණු වනු නොඅනුමානය.

අද ශ්‍රී ලංකාවේ කලාවට සම්බන්ධ බොහෝ දෙනෙක් පවසන්නේ තමන්ගේ වෘත්තින් තමන්ට සෑහෙන අදායම් ලබා නොදෙන බවය. මෙසේ වීමට මූලික හේතුව නම්, එවැනි දක්ෂතාවයන් වලට වෙළඳ පොලේ ඉහළ ආදායමක් ලබාදෙන අවස්ථාවන් ශ්‍රී ලංකාවේ බෙහෙවින් අඩු වීමය. මේ ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ඇති මූලික වෙනස නම්, ඉන්දියාවේ කලාකරුවන්ට, සංගීත සහ නැටුම් කණ්ඩායම් වලට, නළු නිළියන් සහ අනිකුත් කණ්ඩායම් වලට, බහුලව වැඩ සහ වාණිජ අවස්ථා ඇති වීමය. චිත්‍රපටි, ටෙලිනාට්‍ය, රූපවාහිනී වෙළඳ දැන්වීම්, විලාසිතා සංදර්ශණ ආදිය ඉන්දියාවත් සමග එකට ඉදිරිපත් වුවහොත්, අප රටේ මෙම ක්ෂේත්‍රයන් ශක්තිමත් වීමෙන් අප රටේ කලාකරුවන්ට විශේෂ අත්වැළක් ලැබෙනු ඇත. එම ශක්තියෙන් නිසි ප්‍රයෝජන ලබාගන්නට නම්, ඉන්දියාව සමග හවුල් වී

ගමන් කිරීම අත්‍යවශ්‍ය බව අප හොඳින් මතක තබා ගත යුතුය.

අප රට භූගෝලීයව පිහිටා ඇත්තේ ඉන්දියාවට ඉතා සමීපවය. එපමණක්ද නොව, අපගේ ඉතිහාසය ලියවුණු කාලය සිටම, සෑම ක්ෂේත්‍රයකින්ම මෙම සම්පත්වය තහවුරු වී, අද විශේෂයෙන්ම ආර්ථික අතින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ඉතා කිට්ටුවෙන් සම්බන්ධ වන ලකුණු දැකගත හැක. 2000 වසරේදී, මෙම ආර්ථික සම්පත්වය සහ සම්බන්ධය තහවුරු කිරීම සඳහා ක්‍රියා මාර්ග තුනක් මා යෝජනා කළෙමි. ඒවා නම්, පළමුව, කලින් නිකුත් කරන ලද වීසා බලපත්‍ර රහිතව ඉන්දියානු ජාතිකයන්ට ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩ සැළැස්වීම; දෙවනුව, ඉන්දියානු ප්‍රාන්ත ගුවන් තොටුපොළ හරහා ශ්‍රී ලාංකික ගුවන් තොටුපොළ වලට ගුවන් සේවාවන් ආරම්භ කිරීම; සහ තෙවනුව, අප රටේ භාණ්ඩ සහ සේවාවන් මිලදී ගැනීමට ඉන්දියානු මුදල් භාවිත කිරීමට අවසරය සහ ඉඩ ප්‍රස්ථාව ලබා දීමය. මෙම යෝජනා තුනෙන් දෙකක් දැනටමත් ශ්‍රී ලංකා රජය ක්‍රියාවේ යෙදීම තුළින් අප රටේ සංචාරක ව්‍යාපාරයට සහ ඉන්දියානු ආයෝජනය වෙනුවෙන් විශේෂ අනුබලයක් ලැබී ඇත. මාගේ මතය අනුව, තෙවැනි යෝජනාවත් ශ්‍රී ලංකා රජය ඉදිරි කාළය තුළදී ක්‍රියාවේ යෙදවුවහොත් ශ්‍රී ලංකාව ඉන්දියාවට තවදුරටත් ආර්ථිකව සමීප වනු ඇත. එවැනි සම්බන්ධයක් හරහා අප රටට ලබාගත හැකි වාසින් ඉමහත්ය.

දැනට ක්‍රියාත්මක වන ඉන්දියානු ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුමට අමතරව, මෙහි යෝජිත වැඩපිළිවෙත් අප දියත් කිරීමට සමත් වුවහොත් අප රටේ මෙතෙක් ජාත්‍යන්තර තත්ත්වයකට දියුණු වී නොමැති චිත්‍රපටි, ටෙලිනාට්‍ය, සහ විලාසිතා සේවාවන් ඉතා පුලුල් දියුණුවකට පත්වෙනු නොඅනුමානය. ඒ අතරම, අප රටේ සංචාරක ක්ෂේත්‍රයට එය වටිනා අත්වැළක්ද වනු ඇත. අද ඉන්දියාවේ මධ්‍යම පන්තිය යුරෝපයේ මධ්‍යම පන්තියනටත් වඩා ශක්තිමත්ද පුලුල්ද වූ එකකි. තවද, ඉන්දියානු සමාගම් සැළකිය යුතු සංඛ්‍යාවක් ලෝකයේ ඉහළ පෙළේ සමාගම් බවට පත්ව ඇත. ඉන්දියාවේ හෝටල් වල සහ විවිධ සේවාවන් වල දැනට පවතින මිල මට්ටම් සන්සන්දනය කරද්දී ශ්‍රී ලංකාව

තරඟකාරී තත්ත්වයක පවතිනු ඇත. මෙවැනි අවස්ථා වලින් නිසි ප්‍රයෝජනය ලබාගැනීමට අප දක්ෂ වුවහොත් ඒ තුලින් අප රටේ වැදගත් වෙනසක් ඇතිකර ගැනීමට අපට හැකිවනු ඇත. එවැනි වෙනසක් ඉබේම සිදු නොවනු ඇත.

එවැනි වෙනසක් ඇතිකිරීමට නම්, ඒ සඳහා අවශ්‍ය තීරණ හරහා වැඩපිළිවෙත් දියත් කළ යුතුය. එවැනි වැඩපිළවෙත් රජය සහ අදාල ක්ෂේත්‍රවල හවුල්කරුවන් එකතු වී දියත් කිරීම ඉතා වැදගත්ය. මෙහි පෙන්වා දී ඇති වැඩ පිළිවෙත් රජයටවත්, පෞද්ගලික ක්ෂේත්‍රයටවත් තුදෙකලාව කළ හැකි දේ නොවේ. ඒවා රජය සහ පෞද්ගලික අංශය එකතු වී සාමූහික චේතනාවෙන් දියත් කළ යුතු වැඩ පිළිවෙත්ය. එසේ නම්, රජය සහ අදාළ පාර්ශවයන් එකතු වී මෙවැනි සංකල්පයන් දියත් කිරීමට වැඩකටයුතු ආරම්භ කළ හොත් අප රටේ මෙතෙක් නිසි ප්‍රයෝජනයක් ලබා නොගෙන ඇති ක්ෂේත්‍රයක් වන සිනමා, ටෙලිනාට්‍ය සහ විලාසිතා ක්ෂේත්‍ර පුදුමාකාර ආකාරයකට පුබුදු කරවීමට අපට අවස්ථාවන් උදාවෙනු ඇත.

# 2

## දෙවන කොටස

# ව්‍යාපාර

# 2.1

# අප රට ව්‍යාපාරිකයින් දෙස නව කෝණයකින් බැලිය යුතුයි

සමාජයක් වශයෙන්, ගුරුවරුන් ඉතා ගෞරවනීය ලෙස අපි සළකමු. ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් එකතුවන ඕනෑම සාදයක හෝ රැස්වීමකදී අපට අධ්‍යාපනය ලබාදුන් ගුරුවරුන් ගැන ඉතා භක්තියෙන් අපි කථා කරමු. ඔවුන්ගේ ගුණ වර්ණනා කරමු. ඔවුන්ට කෘතඥතාවය දක්වමු. කුඩා වියේ සිට අප මනස පෝෂණය කරමින්, වර්තමානයේ අප පත්ව තිබෙන තත්ත්වයන්ට එළඹීම සඳහා අතීතයේදී ගුරුවරු අපට ලබා දුන් දායකත්වය ගැන අපි ආඩම්බරයෙන් සැමදෙනාටම පවසමු. මෙසේ ගුරුවරුන්ගේ ගුණ සැමරීම සහ කෘතඥතාවය දැක්වීම, ලාංකික සමාජයේ ඉතා අගනා සහ විශිෂ්ට ගුණාංගයක් ලෙස මම දකිමි.

ඒ අතරම, අප රටේ ව්‍යාපාරිකයන් අප දකින්නේ කෙසේද යන්න ගැන ද සොයා බැලීම වැදගත් යැයි මා සිතමි. ව්‍යාපාරිකයන් යනු බහුතර ජනතාවට රැකියා අවස්ථා ලබාදෙන, ව්‍යාපාර ක්ෂේත්‍රයේ අවධානම (Business Risk) දරණ ජන කොටසය. ඔවුහු, තම අතැති ප්‍රාග්ධනය ව්‍යාපාරයට යොදවමින්, සතු දේපළ උගසට තබා, බැංකු සහ අනිකුත් අයගෙන් ණය ලබා ගනිමින්, පැය 14 ක් හෝ 18 ක් පමණ තම ව්‍යාපාරය වෙනුවෙන් කැප කරමින්, දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරති. කුඩා කඩයක් පවත්වාගෙන යන 'ගමේ මුදලාලි' යැයි හැඳින්වෙන සුලු පරිමාණයේ ව්‍යාපාරිකයා සිට, ඉතා ඉහළ මට්ටමේ ජාත්‍යන්තර තලයේ වෙළෙඳ සහ කර්මාන්ත කටයුතු වල නිරත වන සමාගමක සභාපතිවරයා දක්වා, මෙවැනි පුද්ගලයන් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු වල යෙදේ. බෝහෝ අවස්ථාවලදී, ඔවුන් තම කාර්යයන් කරන්නේ තමන්ගේම සෘජු ලාභය සහ වාසියට වුවද, වක්‍රාකාරව එම කාර්යයන් තුළින් රටටද, ආර්ථිකයටද විශාල දායකත්වයක්

---

**2003.12.21 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

ලැබෙන බව අපට පිළිගන්නට සිදුවනු ඇත. එවැනි කටයුතු හරහා, 'වර්ධනයේ යන්ත්‍රය' ('Engine of growth') යැයි සියලු දෙනාම හඳුන්වන, සුලු, මධ්‍යම සහ මහ පරිමාණ පුද්ගලික ව්‍යාපාරික අංශය, රටේ ආර්ථික සැලැස්මේ අත්‍යවශ්‍ය කාර්ය භාරයක් ඉටු කරමින්, රටේ දළ ජාතික නිෂ්පාදනයේ සැළකිය යුතු කොටසක් සපයති.

මේ ආකාරයට පෞද්ගලික ක්ෂේත්‍රයේ ව්‍යාපාරිකයන්ගේ කටයුතු හේතුකොටගෙන, රටේ බහුතර ජනතාව තමන්ගේ ශ්‍රමය සහ සේවය ක්‍රමවත්ව රටට සහ ආර්ථිකයට ලබාදෙනු ඇත. තවද, ව්‍යාපාරිකයින් තුළින් මෙවන් නායකත්වයක් සහ සේවයක් නොවන්නට, අප රටේ ආර්ථිකයේ විශාල හිඩසක් හෝ හිගයක් ඇතිවන බව අප වටහා ගත යුතුය. මෙසේ, ව්‍යාපාරිකයින්ගෙන් මහගු සේවයක් සිදු වුවද, ඔවුන් ගැන අප සියලු දෙනා තුළ සාමාන්‍යයෙන් ඇති අදහස කුමක්ද? ඇත්තෙන්ම, එය පහළ මට්ටමක පවතින ප්‍රතිචාරයක් බව නොරහසකි. අපට අධ්‍යාපන ලබා දුන් ගුරුවරු ගැන බෝහෝවිට අප ආදරයෙන් මතක් කලද, අපගේ රැකියාවල පඩි නඩි සහ වෙනත් දීමනා ලබා දෙමින්, අප පවුල් නඩත්තු කිරිමට අපට සම්පත් ලබාදෙන ව්‍යාපාරික හාම්පුතුන් ගැන අප තුළ ඇති හැගීම් බෝහෝ විට එතරම් ගෞරවනිය හෝ ආදරණීය ඒවා නොවන්නේය. සමහර විට, මෙවැනි හැගීම් නොදැනුවත්ම පාහේ අප සිත් තුළ පැණ නගින්නේ, අප සමාජය ව්‍යාපාරිකයන් 'තරබාරු, ජනතාව සූරාකන, රලු උඩු රැවුල් ඇති, කලු කබා ඇඳගත්, නපුරු පුද්ගලයන්' හැටියට කථා බහෙන්ද, විකට චිත්‍ර හරහාද දිගින් දිගටම දැකිමට පුරුදු වී ඇති නිසා විය හැකිය. මෙම අවාසනාවන්ත හැගීම් තුළින් ව්‍යාපාරිකයන් සහ හාම්පුතුන් කෙරෙහි බෝහෝවිට යම් අප්‍රසාදයක් ජනතාවගේ සිත් තුළ අද කා වැදී ඇත. සමහරවිට මේ හැගීම් නිසා බෝහෝ දක්ෂ පුද්ගලයින් ව්‍යාපාර ජිවිතයකට පිවිසිමට යම් අකමැත්තක් දක්වන්නටද පුලුවන.

එහෙත්, ලෝකයේ බොහෝ දියුණු රටවල පවතින තත්ත්වය අප රටේ පවතින තත්ත්වයට වඩා හාත්පසින්ම වෙනස්ය. ඒ රටවල, ව්‍යාපාරිකයින් හෝ හාම්පුතුන් පිළිගැනෙන්නේ සමාජයට විශේෂ දායකත්වයක් ලබාදෙන එලදායි පුද්ගලයන් ලෙසය. ඔවුන්ගේ

කැපවීම සහ සේවය සමාජය අගය කරන අතර, තවත් සමහර රටවල ව්‍යාපාරිකයන්, සපයන රැකියා සංඛ්‍යාව සහ ගෙවන බදු ප්‍රමාණය අනුව, විශේෂ දිමනා වලටද හිමිකම් කියති. එපමණක්ද නොව, ව්‍යාපාර සෙෂ්ත්‍රයට අවශ්‍ය ලොකු සහ කුඩා හාම්පුතුන් බිහි කිරීම සඳහා විශේෂ අධ්‍යාපන ක්‍රමද, පුහුණු පාඨමාලාද ඒ රටවල බෙහෙවින් දක්නට ලැබෙනු ඇත. ඒ අතරම, ඕනෑම වෘත්තිකයෙකුට හෝ ශිල්පියෙකුට තම වෘත්තිය හෝ ශිල්පය සාර්ථකව කර ගැනීම සඳහා 'ව්‍යාපාර' දැනුමක් සහ පුහුණුවක් (Business Training) ලබා දීමේ වැඩ පිළිවෙත්ද ඒ රටවල ඇත. එවැනි වැඩසටහන් තුළින්, යම් පුද්ගලයෙක් මේසන් වරයෙක් වුවද, ධීවරයෙක් වුවද, වඩු කාර්මිකයෙක් වුවද, දන්ත ශල්‍ය වෛද්‍ය වරයෙක් වුවද, කළා කරුවෙක් වුවද, සංගීතඥයෙක් වුවද, නීතිඥයෙක් වුවද, තමාගේ වෘත්තිය හෝ ශිල්පය යම් ව්‍යාපාරික පසුබිමක් සහිතව 'ව්‍යාපාරයක්' ලෙස පවත්වාගෙන යෑමට, පුහුණුවක් ලබයි. අප රටේද, එවැනි පුහුණුවක් ලබාදෙන අතරම, ව්‍යාපාර සහ ව්‍යාපාරිකයින් කෙරෙහි නව කෝණයකින් බැලීමට සමාජය හුරු කරවීමෙන්, ව්‍යාපාරිකයින් කෙරෙහි ඇති සමාජීය ආකල්ප සහ ප්‍රතිචාර ද ක්‍රමයෙන් සතුටුදායක සහ ශුභවාදී අතට හරවා ගත හැක.

ඉහත සඳහන් ආකල්ප වෙනස් කිරීමේ ප්‍රයත්නය සාර්ථක වුවහොත්, ඕනෑම මට්ටමක පවතින 'ව්‍යාපාර', යනු රටට අවශ්‍ය, රටේ ආර්ථිකයට රුකුලක් ලබාදෙන, ආර්ථික ඒකක බව ද, 'ව්‍යාපාරිකයින්' යනු සමාජයේ වටිනා, අවශ්‍ය කොටසක් බවද, යන්න ගැන යම් වැටහීමක් ජනතාව තුළ පැන නගිනු ඇත. තවද, රටට සහ සමාජයට අවශ්‍ය රැකියා බිහි වන්නේත්, ඒවා දිගින් දිගටම පවතින්නේත්, ව්‍යාපාරිකයන්ගේ ක්‍රියාවන් හරහා බවත්, අප සියලු දෙනාම අවබෝධ කරගනු ඇත. එවිට, අප සමාජයේ දැනට පවතින ව්‍යාපාරිකයන් ගැන ඇති අප්‍රසන්න අදහස් ක්‍රමයෙන් අඩු වීමට ඉඩ ඇත. එසේ වීමෙන්, ව්‍යාපාර සෙෂ්ත්‍රයට නව පුනර්ජීවනයක් සහ ප්‍රතිචාරයක් ලැබෙනවාත් සමගම, වඩාත් දක්ෂ පුද්ගලයින් ව්‍යාපාර සෙෂ්ත්‍රයට පිවිසීමටද පෙළඹෙනු ඇත. එවිට ව්‍යාපාර සෙෂ්ත්‍රය තව දුරටත් දියුණු වෙමින්, රටේ ආර්ථිකයටද විශේෂ දිරි ගැන්වීමක් අනිවාර්යයෙන්ම ලබාදෙනු නොඅනුමානය.

# 2.2

## සුළු සහ මධ්‍යම ව්‍යාපාර සුරකිමු

ශ්‍රී ලංකාවේ සුළු සහ මධ්‍යම පරිමාණයේ කෘෂිකර්ම, ධීවර, කර්මාන්ත සහ වෙළෙඳ ව්‍යාපාරයන්හි අප රටේ ජනතාවගෙන් 50% ක වැඩි පිරිසක් අද නියැලි සිටිති. ඒ අය කුඩා ඉඩමක ගොවිතැන් කරමින් හෝ සුළු ධීවර ව්‍යාපාරයක හෝ නිෂ්පාදනයක හෝ සේවාවක යෙදෙති. මේ අයගේ ජීවන තත්ත්වය සහ මට්ටම සළකා බලන විට අපට පැහැදිලි වන එක් කරුණක් නම්, බොහෝ ගොවීන් සහ ධීවරයන් සාමාන්‍යයෙන් දුගී තත්ත්වයක සිටින බවය. ඔවුහු ණයෙන් මිරිකී අසරණ බවට පත්වී සිටිති. ඒ අතරම, සුළු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවල නිරත වී සිටින අයද තම ව්‍යාපාරයන් ඉතා දුෂ්කරව කරගෙන යන බවද පෙනී යන්නේය.

දැනට අප සතු දත්ත අනුව මෙවැනි සුළු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවලින් 80%ක් වැනි විශාල කොටසක් ව්‍යාපාර ආරම්භ කොට වසර 2 කට අඩු කාලයක් ඇතුළතදී ව්‍යාපාර පවත්වාගෙන යා නොහැකි තත්ත්වයට පත්වේ. මෙයින් පෙනෙන්නේ මෙවැනි සුළු සහ මධ්‍යම ව්‍යාපාර රාශියක්ම දැඩි දුෂ්කර මට්ටමක දිගින් දිගටම පවතින අතර, ඒවා කඩා වැටීමෙන් සුළු ව්‍යාපාරිකයාට හානියක් සහ පාඩුවක් වනවා වගේම එම ව්‍යාපාරය බිඳ වැටීම හේතුකොටගෙන රටේ ආර්ථිකයටද යම් අවාසියක් සිදුවන බවය. මෙම අවාසිය ක්‍රම දෙකකින් සිදුවේ. පළමුව ව්‍යාපාරිකයාගේ ශ්‍රමය සහ නිෂ්පාදනය ආර්ථිකයට අහිමි වේ. දෙවනුව, එම ව්‍යාපාරිකයාට තම ජීවන ක්‍රමය නැතිවන නිසා ඔහු වෙනුවෙන් රජයට සහන සපයන්නට සිදුවේ. එසේ නම්, මෙවැනි සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර ආරක්ෂා කිරීම අප රටේ අත්‍යවශ්‍ය කරුණක් බව ඕනෑම කෙනෙකු පිළිගන්නවා නොඅනුමානය. ව්‍යාපාරිකයෝ නව ව්‍යාපාරයන් පටන් ගන්නා විට බලාපොරොත්තු

---

**2003.05.18 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

රාශියක් සහිතවද, එම ව්‍යාපාරයන් හරහා විශේෂ දියුණුවක් ලබා ගැනීමේ චේතනාවෙන්ද, පසුවෙති. එම අපේක්ෂාවන් නිසා තම ව්‍යාපාරය දැඩි උනන්දුවකින් හා ආශාවකින් ඔවුහු ආරම්භ කරති. එහෙත් වැඩි කාලයක් ගතවීමට පෙර තම ව්‍යාපාර ආශ්‍රයෙන් පැන නගින ගැටලුවලට ඔවුන්ට මුහුණදීමට නොහැකිවීම නිසා ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් කඩා වැටේ.

මෙසේ ව්‍යාපාර බිඳ වැටෙන්නේ ඇයි? කෙසේද? මේ සම්බන්ධයෙන් පුළුල් විග්‍රහයක් කොට එම ප්‍රශ්නවලට විසඳුම් සොයා ගැනීම අප රටේ ආර්ථිකය හසුරවන අයගේ විශේෂ වගකීමක් විය යුතුය. එවැනි විග්‍රහයක් කරන විට අපට දැන ගැනීමට ලැබෙන සාමාන්‍ය කරුණක් නම් ව්‍යාපාරයක් කඩා වැටීමට මූලික හේතුවක් වන්නේ එම ව්‍යාපාරයේ කාර්ය භාරය සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ව්‍යාපාරිකයාට නැතිවීමය. ඇතැම් විට ව්‍යාපාරිකයාට ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ මූලික සිද්ධාන්ත ගැනවත් අවබෝධයක් නැතිවීමට පුළුවන. ව්‍යාපාරයක් පවත්වාගෙන යාම පහසු කාර්යයක් නොවේ. ඒ සඳහා අනිවාර්යයෙන්ම විශේෂ දැනුමක් සහ පුහුණුවක් අවශ්‍යය. කළමනාකාරිත්වය පිළිබඳවද, මුදල් පාලනය හා මූල්‍ය විනය ගැනද, මූලික දැනුමක්වත් ව්‍යාපාරිකයා සතුව තිබිය යුතුය. තම ව්‍යාපාරයේ දෙතුන් දෙනෙක් පමණක් සේවය කළද, එම සේවකයින් හොඳින් හසුරුවා ගෙන ඔවුන්ගේ සේවයෙන් නිසි ප්‍රතිඵල ලබාගෙන හොඳ ඵලදායිතාවයක් ඇතිව ව්‍යාපාරය පවත්වා ගෙන යාමටද, ව්‍යාපාරිකයාට දැනුමක් දක්ෂතාවයක් සහ ශක්තියක් තිබිය යුතුය. එසේම ව්‍යාපාරය සාර්ථකව ඉදිරියට ගෙන යාම සඳහා නවීන ක්‍රම ගැනද, ව්‍යාපාරිකයා දැනුවත් විය යුතුය. යම් අවස්ථාවකදී ව්‍යාපාරය ගැටලුවකට ගොදුරු වුවහොත් එයින් ජය ගැනීමට අවශ්‍ය වන ශක්තියක්ද, එම කාලය තුළදී ව්‍යාපාරයේ ප්‍රාග්ධනය ආරක්ෂා කරගෙන, ව්‍යාපාරය රැක ගැනීමට මූල්‍යමය ශක්තියක් ද ව්‍යාපාරිකයා සතුව තිබිය යුතුය. ව්‍යාපාරයේ දියුණුව සඳහා බැංකුවකින් හෝ වෙනත් ආයතනයකින් හෝ යම් ණය මුදලක් ලබා ගතහොත් එම ණය සහ පොලිය ගෙවීමට හැකිවන ලෙස කටයුතු සංවිධානය කර ගැනීමටද, හැකියාවක් ව්‍යාපාරිකයා වර්ධනය කර ගත යුතුය. ව්‍යාපාරයේ සේවය කරන සේවකයින්

දිගින් දිගටම පුහුණු කරවමින් ව්‍යාපාරයෙන් සැපයෙන සේවා හෝ භාණ්ඩ මට්ටම ක්‍රම ක්‍රමයෙන් දියුණු කර ගැනීමටද ව්‍යාපාරිකයා වෙහෙස විය යුතුය. තරගකාරී තත්ත්වයකට මුහුණදීමට හැකියාවක් ඇති කරගත යුතුය. ව්‍යාපාරය වර්ධනය කර ගන්නා විට එම වර්ධනයට සාපේක්ෂව ප්‍රාග්ධනයක් වර්ධනය කරගැනීමට ව්‍යාපාරිකයා දැනුවත් විය යුතුය.

මූල්‍ය සහ අනෙකුත් ප්‍රශ්නවලට සහ අභියෝග ඉදිරියේ කඩා වැටුණු සුළු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර රාශියකට උපදෙස් ලබාදීමට පසුගිය දශක දෙක තුළ මට අවස්ථා රාශියක් ලැබුණි. මේ අත්දැකීම් දෙස මා පසු විපරම් කර බලන විට මට වැටහෙන්නේ එම සෑම අවස්ථාවලදීම ව්‍යාපාරයන් සමහරවිට හරියාකාරව දැනුමක් ඇතිව පුහුණුවක් ඇතිව වෘත්තියමය ආකාරයට ව්‍යාපාරය හසුරුවනු ලැබුවා නම් එවැනි අවාසනාවන්ත තත්ත්වයන්ට එම ව්‍යාපාර බොහෝ දුරට නොවැටීමට ඉඩ තිබුණු බවය. බොහෝ විට මෙම නොදැනුවත් කම නිසා හෝ අවශ්‍යය උපදෙස් නිසි වේලාවට ලබා ගැනීමට නොහැකි වීම නිසා හෝ වැරදි ක්‍රමවල ඇබ්බැහිවීම නිසා හෝ ව්‍යාපාරිකයින් තම ව්‍යාපාරයන් නැතිකර ගනිමින් තමන් සතු පෞද්ගලික දේපල පවා අහිමිකර ගෙන ඇත.

යම් සංකීර්ණ ව්‍යාපාරික ප්‍රශ්ණයක් මතු වුවිට මහ පරිමාණයේ දියුණු ව්‍යාපාරවලට ඉහළ පෙළේ උපදෙස් ලබා දෙන ආයතනවලින් උපදෙස් ලබා ගැනීමට හැකි වෙනු ඇත. එහෙත් සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර ගැටලුවකට මුහුණපාන අවස්ථාවලදී, ඔවුන්ට මග පෙන්වීමට අද කිසිවෙක් ඉදිරිපත් නොවෙති. ඔවුන් ණය ලබාගෙන ඇති බැංකු පවා ඔවුන් සතු දේපල සින්නකර ගන්නවා හැර වෙනත් විකල්ප හෝ එම උගුලෙන් ගැලවීමට ඇති මග ඔවුන්ට කියා නොදෙනු ඇත. මෙම තත්ත්වය ඉතා භයානක එකකි. මෙම තත්ත්වය දිගින් දිගටම ක්‍රියාත්මක වීමට ඉඩ තැබුවහොත් අප රටේ විශේෂ සහ අගනා සම්පත් වන ව්‍යාපාරිකයන් නැතිවී රටේ ආර්ථිකයට විශාල පහරක් වැදෙනු ඇත. මේ සම්බන්ධයෙන් රජයටත් රටේ ආර්ථිකයට සම්බන්ධ අනිකුත් සංවිධාන වලටත් විශේෂ වගකීම් ඇත.

# 2.3

## ව්‍යාපාරයක මුදල් ද්‍රවශීලතාව රැක ගැනීම අත්‍යවශ්‍ය කාර්යයකි

සුලු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර නොයෙක් ගැටලු වලට මුහුණ පාන බව අප දනිමු. ඒවා ප්‍රධාන වශයෙන් වර්ග කරන්නේ නම් එම ගැටලු කාණ්ඩ කිපයකට දළ වශයෙන් වෙන් කළ හැක. අවශ්‍ය මුදල් ඇතුලු අනිකුත් සම්පත් නිසි වේලාවට හෝ ප්‍රමාණයට නොමැති වීම, ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවශ්‍ය පරිසරය නිසියාකාරව සකස් වී නොතිබීම හෝ සකස් කර නොගැනිම, සහ ව්‍යාපාරයේ සාර්ථකත්වයට අවශ්‍ය වන උපදෙස් සහ කළමණාකාරිත්වය නිසි කලට නොතිබීම මේවායින් සමහරකි. මෙවැනි ගැටලු රාශියක් තිබුණද, ඒවායෙන් ඉක්මණින් සහ තිරණාත්මක ලෙස අති දරුණු බලපෑම් ඇතිකර විය හැකි එක් සාධකයක් නම්, ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු වලට අවශ්‍ය මුදල් නිසි වේලාවට සහ නිසි කලට නොතිබීමය. ඕනෑම ව්‍යාපාරයක ඉදිරි පැවැත්ම රඳා පවතින්නේ එම ව්‍යාපාරයට අවශ්‍ය මුදල් අවශ්‍ය වේලාවට සහ අවශ්‍ය ප්‍රමාණයට සැම විටම ව්‍යාපාරය සතුව තිබීම මතය. එලෙස කලට වේලාවට අවශ්‍ය මුදල් නොතිබුණහොත් එම ව්‍යාපාරයේ ණය පියවීමටද, අනිකුත් අවශ්‍ය වියදම් කර ගැනිමටද, ව්‍යාපාරිකයා අපොහොසත් වනු ඇත. එසේ වුවහොත් ව්‍යාපාරයේ පැවැත්ම අනිවාර්යයෙන්ම සැකසුරු සහ අවදානම් තත්ත්වයකට පත් වන්නේය.

මෙවැනි පසුබිමක මුදල් ද්‍රවශිලත්වයේ පාලනය, ව්‍යාපාරයක කලමණාකාරීත්වයේ ඉතා විශේෂ අංගයක් වනු ඇත. යම් ව්‍යාපාරයක හෝ ආයතනයක කෙතරම් සම්පත් තිබුණද එම ආයතනයේ එදිනෙදා කළ යුතු ගෙවීම් ගණුදෙනුකරුවන්ට සහ ණය හිමියන්ට නිසි වේලාවට ගෙවීමට අපොහොසත් වුවහොත්

---

2004.02.01 දින ලංකාදීප පුවත්පතෙහි 'දුවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

එම තත්ත්වය ආයතනයේ ඉදිරි පැවැත්මට හානිකර වන්නේය. ඕනෑම ආයතනයක මූල්‍ය පාලනයෙන් සිදු විය යුතු එක් අත්‍යවශ්‍යම කාර්යයක් නම් මුදල් ද්‍රවශීලත්වය නිසියාකාරව පාලනය කර ගැනීම සහ රැක ගැනීමය. ඒ සම්බන්ධයෙන්, විශාල ව්‍යාපාර සහ ආයතන එම කාර්ය භාර්ය සහ වගකීම ඉෂ්ට කර ගැනීමට විශේෂ දෙපාර්තමේන්තු පවා ස්ථාපනය කොට ඇති අතර, මධ්‍යම සහ කුඩා ව්‍යාපාර මෙම අවශ්‍යතාවය සපුරා ගැනීමට විවිධ ක්‍රම සහ ක්‍රියා මාර්ග අනුගමනය කරනු අපි දකිමු.

ද්‍රවශීලතාවය පිළිබඳව අවධානය යොමුකරන ව්‍යාපාර සාමාන්‍යයෙන් තම ව්‍යාපාරයන් දිගින් දිගටම සාර්ථකව පවත්වාගෙන යාමට සමත් වන අතර, මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැඩි අවධානයක් නොදක්වන ව්‍යාපාර බොහෝ අවස්ථාවලදී දුෂ්කරතාවයන්ට පත්වෙති. මෙසේ ආයතනයේ ද්‍රවශීලතාවය සාර්ථකව රැක ගැනීමට නම්, යම් ව්‍යාපාරයක් පළමු කොටම තම ආයතනයට ගලා ඒමට නියමිත මුදල් සහ ගෙවන්නට නියමිත මුදල් (Expected cash Inflows and Outflows) පිළිබඳව හැකිතාක් නිවැරදි ඇස්තමේන්තුවක් සකස් කරගැනීමට කටයුතු කළ යුතුය. ඒ අතරම, එලෙස ගෙවීමට සහ ලබා ගැනීමට නියමිත මුදල් දින සහිතව සටහන් කර ගැනීමද අවශ්‍යය. එවිට මුදල් වශයෙන් ගෙවීම් සහ ලබා ගැනීම් අතර යම් පරතරයක් ඇත්නම්, ඒ ගැන නිසි අවබෝධයක් ව්‍යාපාරිකයාට ලැබෙන්නේය. මෙම අනාගත මුදල් ප්‍රකාශය සුපරීක්ෂාකාරව විශ්ලේශණය කිරීම හරහා එහි දැක්වෙන මුදල් පරතරය, හිගය හෝ අඩුපාඩු හොඳින් උපුටා දැක්වෙනු ඇත. ඒ අතරම, මෙලෙස දැක්වෙන මුදල් පරතරය හෝ අඩුපාඩුව ඇතිවන කාලයද ව්‍යාපාරිකයාට පෙනී යනු ඇත. ඒ ආකාරයට දත්ත ලබා ගත් විට, එම තත්ත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම සඳහා කුමන ක්‍රම සහ මාර්ග දියත් කළ හැකිද යන්න තීරණය කර ගත හැක. එවිට මුදල් ද්‍රවශීලත්වයේ පාලනය කාර්යක්ෂමව කර ගැනීම පහසු වන්නේය.

අද ශ්‍රී ලංකාවේ පවතින වස්තු භංගත්ව නීති රීති අනුව, යම් ව්‍යාපාරයක්, ගෙවීමට නියමිත මුදලකින් රු. 500 ක් වැනි සුළු

මුදලක් හෝ පැහැර හැරියහොත්, එම ව්‍යාපාරය වස්තු භංගත්ව තත්ත්වයට පත්වී ඇතැයි චෝදනාවක් ඉදිරිපත් කරමින්, ඒ කරණ කොට ගෙන එය වසා දැමිය යුතු යයි උසාවියට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඕනෑම ණය හිමියෙකුට පුලුවන. මෙම නීතිය ඉතා යල් පැණ ගිය නීතියක් වුවද, අද අප රටේ නීති පොතේ එවැනි නීතියක් අඩංගු නිසා එවැනි තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු නොවන ලෙස කටයුතු කිරීමට ව්‍යාපාරිකයන් වගබලා ගත යුතුය. එවැනි තත්ත්වයක් ඇති කර ගැනීමට නම් තම ආයතනයේ මූල්‍ය සම්පත් කාර්යක්‍ෂමව කළමණාකරණය කළ යුතු අතර විශේෂයෙන්ම මුදල් පරිහරණය සහ මූල්‍ය ද්‍රවශීලත්වය පිළිබඳව තියුණු අවධානමක් යොමු කළ යුතු වන්නේය. එසේ කරන්නට නම්, එම කාර්යය සාර්ථකව කර ගැනීමට තම ආයතනයේ පාලන පද්ධතින් නිසියාකාරව සකස් කර ගැනීම ඕනෑම ව්‍යාපාරිකයෙකුගේ විශේෂ වගකීමක් වන්නේය.

බොහෝ ආයතන කඩා වැටෙන්නේ මෙම මුදල් ද්‍රවශීලතාව පාලනය ඉතා අඩු මට්ටමක පැවැත්වීම හේතුකොටගෙනය. කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර වලින් 80% ක් පමණ විශාල ප්‍රතිශතයක්, තම ව්‍යාපාරවල ඉදිරි ගමන පවා සැකකාරී සහ අවිනිශ්චිත මට්ටමකට පත් කරන ප්‍රශ්න වලට භාජනය වන්නේ මෙම හේතුව නිසාය. එසේ නම්, මෙම තත්ත්වයෙන් ගැලවීම සඳහා, සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සියලුම ආයතන සහ ව්‍යාපාර නිසි ලෙස කටයුතු කිරීම මුලු ව්‍යාපාර ලොකයේම ඉදිරි ගමනට විශේෂ රැකුලක් වනු නොඅනුමානය.

# 2.4

# ව්‍යාපාරයක නායකත්වයේ අනුප්‍රාතිකය ගැන කලින්ම සිතමු

මගේ ව්‍යාපාරය මගේ කාලයෙන් පසුව කවුරු පාලනය කළ යුතුද? කවුරුන්ට පැවරිය යුතුද? කවුරු ඉදිරියට ගෙන යා යුතුද?

අප රටේ බොහෝ ව්‍යාපාරිකයන් මෙම ප්‍රශ්නය ගැන යටි සිතින් සිතුවද, ඒ ගැන විශේෂ අවධානමක් යොමු කරමින් එම ප්‍රශ්නයන්ට අවශ්‍ය නිසි ඍජු සහ කාලීන පිළිතුරු හෝ විසඳුම් සොයා යන්නේ කලාතුරකිනි. මේ හේතුව නිසා අවුරුදු ගණනාවක් තිස්සේම තම ව්‍යාපාරයන් ඉතා සාර්ථකව ගොඩනගාගෙන, දැඩි මහන්සියෙන් ඉදිරියට ගෙන ගියද, බොහෝ ව්‍යාපාරිකයින් තම ව්‍යාපාරයන් ඊළඟ පරම්පරාවට පැවරිය හෝ භාරදිය යුතු අවස්ථාවේදී එම කාර්යය ප්‍රමාදව හෝ හරියාකාරව ඉෂ්ට නොකරන නිසා, එම තත්ත්වය හරහා තම ආදරණීය ව්‍යාපාරයන් නොදැනුවත්වම පාහේ පිරිහිමකට භාජනය කරනු ඇත. මෙලෙස ව්‍යාපාරයන් පිරිහිමකට ලක් වන්නට මූලික හේතුවක් වන්නේ නායකත්වයේ පැවරීම බොහෝ ව්‍යාපාර අයිතිකරුවන් සාමාන්‍යයෙන් සිදු කරන්නේ එම කාර්යය 'නොකරම බැරි' අවස්ථාවට පත්වන විට බැවිනි. තම ව්‍යාපාරය තමන් විසින්ම කරගෙන යා හැකැයි හැඟෙන තෙක්ම ව්‍යාපාරයේ මුල් පුටුවේ රැඳී සිටිමින්, එය දිගටම පාලනය කිරීමට බොහෝ ව්‍යාපාරිකයන් ආසාවක් දක්වති. මගේ දරුවා හෝ මගේ දෙවැනියා මෙම වගකීම භාර ගැනීමට තවම සුදුසු නැතැයි සමහරු පවසති. නායකත්වය පැවරීමට කෙනෙක් තවමත් සොයාගැනීමට නොහැකි යයි තවත් සමහරු කියති. මේ භාරදූර කාර්ය මා වගේම වෙනත් කෙනෙකුට කරන්නට බැරියයි තවත් ව්‍යාපාරිකයන් ආන්දෝලනය කරති. මෙවැනි විවිධ මත

---

2004.01.11 දින ලංකාදීප පුවත්පතෙහි 'දුවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

පලකරමින්, තම පාලන හැකියාවන් දිනෙන් දිනම අඩාල වෙමින් පවතිත්දීත්, ඒ තුළින් ව්‍යාපාරයට සිදුවන අවාසි ගැන නොතකා, පාලන බලය තම අතෙහිම තබා ගන්නා ව්‍යාපාර අයිතිකරුවන් බහුලය. නිසි කලට මෙම අනුප්‍රාප්තිකය සිදු නොවන විට ඒ තුළින් අනිවාර්යයෙන්ම උදාවන විට ගැටලු නිසා ව්‍යාපාරය ක්‍රමයෙන් පිරිහීමකට ලක්වීම ද බෙහෙවින් දකින්නට ලැබෙන තවත් ලක්‍ෂණයකි.

පුලුල් ආර්ථික කෝණයකින් බලන විට, මෙම ප්‍රශ්නය සියලුම ව්‍යාපාරවලට විශේෂ ලෙස බලපාන එකක් බැවින් ලෝකයේ ඉහළ තලයේ ව්‍යාපාරික විශ්ව විද්‍යාල මෑත කාලයක සිට මෙම ගැටලුවට විසඳුම් සෙවීමට දැඩි උත්සාහයක් ගන්නා බවක් පෙනේ. මානුසික හෝ ව්‍යාපාරික හේතුන් නිසා, ව්‍යාපාරයක නිර්මාතෘ හෝ අයිතිකරුගේ අනුක්‍රමණය සිදුවෙන විට ගැටලු රාශියක් පැණ නගිනු ඇත. මේවාට මුහුණ දීමට හැකිවන ලෙස ව්‍යාපාරයක පදනම සහ වාතාවරණය කලින්ම සකස් කර ගැනීමට පුහුණුවක් සහ දැනුමක් ව්‍යාපාරිකයන්ට ලබාදීම ව්‍යාපාර ක්ෂේත්‍රයේ වගකිවයුත්තන්ගේ වැදගත් කාර්ය භාරයක් ලෙස මා දකිමි.

අද ශ්‍රී ලංකාවේ පවතින ව්‍යාපාරවල බහුතරයක් සකස් වී ඇත්තේ එක් අයිතිකරුවකු හෝ එක් පවුලක කිප දෙනෙකුගේ හවුල් ව්‍යාපාරයක් ලෙසය. මේ ව්‍යුහය තුළ බොහෝ ව්‍යාපාර සාර්ථකව තම කටයුතු කරගෙන යනු අප දකිමු. එහෙත්, ඒවායේ මූලික අයිතිකරු හෝ නිර්මාතෘ වයසින් මුහුකුරා යන අවධියක හෝ හදිසි අසනිප තත්ත්වයන්ට පත්වෙන අවස්ථාවක එම ව්‍යාපාරවලට එවැනි ප්‍රශ්නවලට මුහුණ දෙමින් ඉදිරියට යෑමට අවශ්‍ය ශක්තින් සමහරවිට නොමැති බව අපට පෙනේ. එනම්, ව්‍යාපාරයක දිගු කාලින පැවැත්ම සඳහා අවශ්‍ය වන නායකත්වයේ අනුප්‍රාප්තිකය (Succession) පිළිබඳව ඔවුන් කලින්ම කටයුතු යොදා නැත. ව්‍යාපාරිකයින් තම ව්‍යාපාරවල විවිධ අංශවල සේවය කරන පුද්ගලයන්ගේ අනුප්‍රාප්තිකය ගැන තියුණු අවධානමකින් සිටියද ව්‍යාපාරයේ අධිපති වන තමන්ගේම පුරප්පාඩුව යම් දිනයක පුරවන්නේ කෙසේද යන්න ගැන අවශ්‍ය සැලකිම නොකිරීම ඉතා විශාල දුර්වලතාවයකි. මේ හේතුව නිසා ව්‍යාපාරයේ ප්‍රධානියා

කලුරිය කරන අවස්ථාවකදී හෝ අසනීප වන අවස්ථාවකදී එම ව්‍යාපාරයන්හි නායකත්වයේ දැවැන්ත හිඩසක් හෝ අපැහැදිලිතාවයක් ඇතිවීම නිසා ඒවා ඉතා ඉක්මණින් කඩාවැටෙන තත්ත්වයකට පත්වෙනු අප කණගාටුවෙන් දැක ඇත. එපමණක්ද නොව, සමහර ව්‍යාපාරවල අයිතිකරුවන්ගේ අභාවය සිදුවන අවස්ථාවන්හිදී ඔවුන්, තමන්ගේ අන්තිම කැමැත්තවත් නිත්‍යානුකූලව ප්‍රකාශයට පත් නොකර ඇත. මේ හේතුව නිසා, ඔවුන්ගේ දූ පුතුන්ද ඥාති සහෝදරයින්ද ව්‍යාපාරයන්ට විවිධ හිමිකම් දැක්වීම මත, ව්‍යාපාරයන් කඩා වැටීම ඇතුලු දරුණු උවදුරු වලට මුහුණ දෙන්නට සිදුවීම් ගැනද අප විටින් විට අසා ඇත. ඉහත කී තත්ත්වය අප සියලුදෙනාම පාහේ දැන සිටියද, අත්දැකීම් ලෙස විඳ තිබුණද, අපගේ ව්‍යාපාරවලද එවන් දේ සිදුවිය හැකි යයි නිරන්තරයෙන්ම කථා බහ කළද, එම තත්ත්වයට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය ප්‍රායෝගික ක්‍රියා මාර්ග කාලෝචිතව ගන්නේ කලාතුරකිනි.

එසේ නම්, මෙම ප්‍රශ්නයට අප මුහුණ දිය යුත්තේ කෙසේද? පළමුව, සෑම ව්‍යාපාරයක්ම එම ව්‍යාපාරයේ අයිතිකරුගේ හෝ මූලික අණදෙන නිලධාරිගේ නිල සේවාකාලය අවසන් වීමට වසරකටවත් පමණ පෙර, අනුප්‍රාප්තිකයා තෝරා ගැනීමට සහ පත්කිරීමට කටයුතු කළ යුතුය. දෙවනුව, අනුප්‍රාප්තිකයා තෝරාගැනීමේදී පවුල් සම්බන්ධතා මත නොව යුගයේ අවශ්‍යතාවයන් අනුව, එම පුද්ගලයා තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. බොහෝ පවුල් ව්‍යාපාරවල පැණ නගින විශේෂ ප්‍රශ්නයක් නම් පවුලේ කෙනෙක් ව්‍යාපාරයේ ප්‍රමුඛ ස්ථානයට පත්කර ගැනීමට ඇති අභිලාෂයයි. මෙම තත්ත්වය ව්‍යාපාරයේ දිගුකාලීන සාර්ථකත්වයට යම් බාධාවක් විය හැකි වුවද, විවිධ හේතුන් නිසා ව්‍යාපාරවලට සම්බන්ධ පවුල් වලට අකමැත්තෙන් වුවද එවැනි ප්‍රතිපත්ති අනුගමනය කිරීමට සමහර විට සිදුවනු ඇත. එසේ නම්, එවැනි අවස්ථාවල ගත හැක හොඳම ක්‍රියා මාර්ගය නම්, පවුලේ එවැනි සුදුසු පුද්ගලයෙකු සිටී නම්, ඒ අයට අවශ්‍ය වන පුහුණුව, අත්දැකීම් සහ අධ්‍යාපනය කලින්ම ලබාදීමය. තෙවනුව, ව්‍යාපාරයේ මූලික විධායක හෝ අයිතිකරු සේවයෙන් ඉක්මයාමට පෙර, අවම වශයෙන් මාස තුනක කාලයක්

ඇතුලතදී වත් ඔහුගේ අනුප්‍රාතිකයා වැඩ භාරගැනීමය. සෑම අනුප්‍රාතික තත්ත්වයකදීම මෙම අවශ්‍යතාවය මෙම අවශ්‍යතාවය මේ ආකාරයටම සපුරාලීමට අපහසු වුවත්, එය එසේ කළ හැකි නම් ඉතා යෝග්‍යය.

ඉහත කී ව්‍යාපාරික අනුප්‍රාතික සිද්ධාන්ත සරළ ඒවාය. එහෙත් අවාසනාවකට මෙන් ඒවා ගැන අප රටේ ව්‍යාපාර ක්ෂේත්‍රය දක්වන අවබෝධය සහ ප්‍රතිචාරය ගැන අපට සෑහීමකට පත් විය නොහැක. මෙම අවබෝධය ක්‍රමවත්ව වර්ධනය කරගැනීමට අපට හැකි වුවහොත් අපගේ ව්‍යාපාර ප්‍රජාවේ දිගු කාලීන පැවැත්ම සහ ස්ථාවරත්වය තහවුරු කර ගත හැක. එවිට අපගේ ආර්ථිකයේ 'යන්ත්‍රය' ලෙස හඳුන්වන පෞද්ගලික අංශයට මුහුණදීමට ඇති තියුණු නමුත් සමහරවිට නොපෙනෙන ප්‍රශ්නයකට අපට වැඩි විශ්වාසයකින් මුහුණ දීමට හැකි වනු ඇත.

# 2.5

## වැටෙන ව්‍යාපාරවලට නව ජීවයක්

අද අප රටේ ව්‍යාපාර පටන් ගැනිමටත්, ඒවා දිගින් දිගටම පවත්වා ගැනිමටත්, ඒවාට අභියෝග ඇතිවන විට, එම අභියෝගවලින් ජය ගැනිමටත්, විශේෂ උදව් උපකාර, උපදෙස් හා නීති පද්ධති අප ඇති කළ යුතුය. රටක ආර්ථිකයක් වර්ධනය වනවා යැයි කියන්නේ, එම රටේ ආර්ථික ක්ෂේත්‍රයේ කටයුතු කරන සියලු දෙනාම වර්ධනය වීමය. එසේ වර්ධනය නොවන්නේ නම්, රටක ආර්ථිකය, දිගින් දිගටම සංවර්ධනය වෙමින් පවත්වා ගැනිමට රජයට අපහසු වනු ඇත.

බොහෝ අවස්ථාවලදී අලුත් ව්‍යාපාර අරඹන විට එම ව්‍යාපාර පටන් ගන්නා අය ඒවා පටන් ගන්නේ දැඩි බලාපොරොත්තු වෙකිනි. ව්‍යාපාරය ආරම්භ කළ අවස්ථාවේදී සියලුම චාරිත්‍ර අනුව හා නැකත් අනුව ඔවුන් ඒවා පටන් ගන්නේ තමන්ගේ ව්‍යාපාරය, තමන්ට හොඳ ආදායමකුත්, හොඳ අනාගතයකුත් ලබාදේ යැයි යන විශ්වාසය සිතේ ඇතිකර ගනිමිනි. එහෙත් දැනට ප්‍රසිද්ධ වී ඇති සංඛ්‍යා ලේඛන අනුව මෙසේ දැඩි බලාපොරොත්තුවකින් පටන් ගැනෙන, ව්‍යාපාර වලින් 80% ක් වසර දෙකක් ඇතුළතදී කඩා වැටී ඇත. ඒවා ආරම්භ කළ අයට ඒවා හරහා දැඩි පාඩු විඳීමට සිදුවී ඇත. සමහර අය තමන්ගේ දේපළ පවා උකසට තබා ඒවාද අහිමිකරගත් අවස්ථාවන් ගැන අපට දැකගන්නට ඇත. මෙයින් පෙනි යන්නේ දැඩි බලාපොරොත්තු ඇතිව ව්‍යාපාර පටන් ගත්තත්, ඒ අවස්ථාවලදී ඒවා සාර්ථක යැයි පෙනුනත්, හේතූන් රාශියක් නිසා ව්‍යාපාර කඩා වැටීමට හැකි වන බවයි.

සාමාන්‍ය මතය වන්නේ ව්‍යාපාර කඩා වැටෙන්නේ, මුදල් ප්‍රශ්න නිසා බවය. මේ මතයේ යම්කිසි සත්‍ය තාවයක් තිබුණද, එය

---

2003.03.17 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

බොහෝ අවස්ථාවලදී මූලික හේතුව නොවන්නේය. ව්‍යාපාරයක් කඩාවැටීමට හේතූන් රාශියක් තිබිය හැකිය. මේවා අතුරින් සමහරක් නම් ප්‍රාග්ධනය අඩුවීම, භාණ්ඩ හෝ සේවා අලෙවිය ගැන මනා අවබෝධයක් නොතිබීම, කළමණාකාරීත්වයේ දුර්වලතා, භාණ්ඩය නිපදවීමේ හෝ සපයන සේවා සකස් කිරීමේ ඇති දුර්වලතා, සේවකයන් මනාව පාලනය කරගැනීමට නොහැකිවීම, තම තොග සුරක්‍ෂිතව තබා නොගැනීම, මූල්‍ය විනයක් නොතිබීම, අවශ්‍ය ලියකියවිලි හරියාකාරව නඩත්තු නොකිරීම මේවායින් සමහරකි. ඒ කෙසේ වුවද ව්‍යාපාරයක් පිරිහීමට පටන් ගත් විට එම තත්ත්වයෙන් මිදෙන්නට හෝ ව්‍යාපාරය නැවත වරක් පුනර්ජීවනය කර ගැනීමට හෝ අවශ්‍ය ශක්තිය සහ දැනුම බෙහෝ අවස්ථාවලදී ව්‍යාපාරය පටන් ගත් අය සතුව නොපවතී. මෙවැනි තත්ත්වයක් යටතේ ව්‍යාපාර පරිහීමට ලක්වූ විට, බොහෝ අවස්ථාවලදී කඩාකප්පල් වන ස්වභාවයට හෝ වස්තු භංගත්වය යන තත්ත්වයට වැටෙති. මෙම තත්ත්වයෙන් පැනනගින විපාක කිහිපයකි. පළමු කොට ව්‍යාපාරය කඩාවැටීමෙන් හා එය වස්තුභංගත්ව තත්ත්වයට වැටීමෙන්, එම ව්‍යාපාරයේ අයිතිකරුවන්ට හෝ කොටස්කරුවන්ට පාඩුවක් විඳගන්නට සිදුවන්නේය.

ඒ අතරම ඕනෑම රටක දුර්ලභ ගණයක්ව පවතින ව්‍යාපාරිකයන්ගේ සංඛ්‍යාව පහළ වැටීමක් සිදුවන්නේය. අප බොහෝදෙනා සාමාන්‍යයෙන් කැමැත්තක් දක්වන්නේ රජය හෝ පුද්ගලික ආයතනයක රැකියාවක් කරමින් ජීවිතය ගොඩනගා ගැනීමටය. එසේ කරද්දී ඒ අයට මුහුණදීමට සිදුවන්නේ රැකියාවල ප්‍රශ්න මිස, ව්‍යාපාරයක ඇති අවදානම් තත්ත්වයකට නොවේ. ව්‍යාපාරයක් යනු අවදානමක් සහිතව කරගෙන යන ක්‍රියාවලියකි. මෙසේ අවදානමක් ගෙන කටයුතු කිරීමට පෙළඹෙන පුද්ගලයන් ඕනෑම රටක සුලුතරයකි. එවැනි අය වස්තු භංගත්වයට පත්වීමෙන් හෝ තම ව්‍යාපාර කඩාකප්පල් වීමෙන් සමාජයට අහිමි වන්නේ නම්, එයින් සිදුවන්නේ රටට අවශ්‍යවන ව්‍යාපාරිකයන්ගේ සංඛ්‍යාවේ යම් හිඩැසක් ඇතිවීමයි. එසේ නම් මෙම තත්ත්වය අයහපත් ලෙස රටටද බලපානු ඇත. එපමණක්ද නොව, මෙලෙස ව්‍යාපාරිකයන් රාශියක් දිනෙන් දිනම දුෂ්කර

තත්ත්වයට පිවිසුනහොත්, රටේ ආර්ථිකයට එය ප්‍රශ්නයක් විය හැකිය. එසේ නම්, මෙලෙස ව්‍යාපාර කඩාවැටීම සමස්තයක් වශයෙන් අඩු කර ගැනීම අප රටේ ආර්ථිකයටත්, සමාජයටත් ඉතා හිතකර ප්‍රයත්නයක් වන්නේය. එසේ කිරීමට නම් මේ ප්‍රශ්නය දෙස දැඩි සැලකිල්ලකින් හා වෘත්තිය තත්ත්වයකින් බැලිය යුතුය.

ව්‍යාපාරයක් කඩා වැටුණු විට, එසේ නැතහොත් පිරිහෙමින් පවතින විට එය ගොඩනැගීම පහසු කාර්යයක් නොවේ. එසේ කිරීමට විශේෂ දැනුමකුත්, විශේෂ කැපකිරීමකුත් අවශ්‍ය වනු ඇත. මෙම උපදෙස් ලබාදිය හැක්කේ එම විෂය සම්බන්ධව හොඳ අධ්‍යාපනයක් ලබාගෙන ඇති පුද්ගලයන් හරහාය. එපමණක්ද නොව, එම කාර්යභාරය හරි ආකාරව කර ගැනීමට අවශ්‍ය නීති පද්ධතියක් රටේ ස්ථාපනය විය යුතු වේ.

දැනට පවතින නීතිය අනුව අප රටේ ඇත්තේ ව්‍යාපාරයක් පිරිහුණු විට එය වස්තු භංගත්වයට පත්කරන ක්‍රියාවලිය සම්බන්ධවයි. එහෙත්, ලෝකයේ බොහෝ දියුණු රටවල පවතින නීති අනුව වස්තු භංගත්වයට පත් නොවී, ව්‍යාපාරය නැවත ප්‍රතිසංස්කරණය කිරීමට දායක වන ක්‍රියාමාර්ගවලට නීතියෙන් විශේෂ සහන ලබාදී ඇත. උදාහරණයක් වශයෙන් පිරිහීමට පත්වූ ව්‍යාපාරයකට අලුතින් ප්‍රාග්ධනයක් හෝ ණයක් යම්කිසි පුද්ගලයෙකු හෝ බැංකුවක් විසින් ලබාදෙන්නේ නම්, එසේ ලබාදෙන නව මුදල ව්‍යාපාරයේ එතෙක් කල් පැවති මුදල්වලට වඩා ඉහළ මට්ටමකින් ආපසු ගෙවීම පිළිබඳ වර්ග කිරීමක් එම නීති මගින් ලබා දී ඇත. ඒ අතරම ව්‍යාපාරය පිරිහීම නිසා අර්ථසාධක මුදල්, බදු වැනි අනිවාර්ය ගෙවීම් නොකර තිබුණේ නම්, එවැනි ගෙවීම්වලින් පැන නගින නෛතික ප්‍රශ්න එම ව්‍යාපාරයේ අධ්‍යක්ෂක මණ්ඩලයකට බැඳෙන නව අධ්‍යක්ෂ මණ්ඩලයකට බලනොපාන ලෙසද කටයුතු කිරීමටද එම නීතිවලින් බලය ලබාදී ඇත.

මෙවැනි නීති, ව්‍යාපාරයක් නැවත ගොඩනැගීමට අතිශයින් උපකාරී වනු ඇත. අවාසනාවකට මෙන් මෙවැනි නීති අද අප රටේ නොපවතී. අද අප රටේ පවතින්නේද ව්‍යාපාරිකයනට සාමාන්‍යයෙන්

අහිතකර වන ව්‍යාපාරික උනන්දුව හීන කරන තත්ත්වයකි. උදාහරණයක් වශයෙන් බෙහෝ දෙනෙක් ව්‍යාපාරිකයන් දෙස බලන්නේ ජනතාව සූරාකන අතිවිශාල ලාභ ලබන දරුණු කණ්ඩායමක් ලෙසය.

විකට චිත්‍රපටයකින් වුවද, ව්‍යාපාරිකයා අර්ථ දක්වන්නේ බඩ මහත, කලු කෝට් එකකින් සැරසුණු, භයානක උඩු රැවුලක් ඇති පුද්ගලයෙක් හැටියටය. මෙම චිත්‍රවලින්ද ව්‍යාපාරිකයන් පහත හෙළා දැකීමේ ස්වභාවයක් නොදැනුවත්වම වාගේ රටේ ඇති කර ඇත. එහෙත්, එම පුද්ගලයන් තම සේවය ලබාදීමට ගන්නා අවදානම ද, තම ව්‍යාපාරය, කඩාකප්පල් වීමෙන් වැටෙන භයානක තත්ත්වය ගැන කිසිවකු අවබෝධ කරගන්නේ නැත.

මෙයද ව්‍යාපාරවලට අහිතකර තත්ත්වයකි. අද අප රටේ ව්‍යාපාර පටන් ගැනීමටත්, ඒවා දිගින් දිගටම පවත්වා ගැනීමටත්, ඒවාට අභියෝග ඇතිවන විට, එම අභියෝගවලින් ජය ගැනීමටත්, විශේෂ උදව් උපකාර, උපදෙස් හා නීති පද්ධති අප ඇති කළ යුතුය. රටක ආර්ථිකයක් වර්ධනය වනවා යැයි කියන්නේ, එම රටේ ආර්ථික ක්ෂේත්‍රයේ කටයුතු කරන සියලු දෙනාම වර්ධනය වීමය. එසේ වර්ධනය නොවන්නේ නම්, රටක ආර්ථිකය, දිගින් දිගටම සංවර්ධනය වෙමින් පවත්වා ගැනීමට රජයට අපහසු වනු ඇත.

එසේ නම්, ව්‍යාපාර කඩාකප්පල්වීමෙන් ඒවා ආරක්ෂා කර ගැනීමට අප සියලු දෙනාම අපට අයත් වෙන් වෙන් කාර්යභාරයන් හරියාකාරව ඉෂ්ඨ කිරමට කටයුතු කළ යුතුය. සෑම බරක්ම රජයට පමණක් පැවරීම අසාධාරණය. මෙම හේතුව නිසා මෑතකදී ව්‍යාපාර පුනර්ජීවනය සහ වස්තු භංගත්වය පිළිබඳ ශ්‍රී ලංකා වෘත්තිකයන්ගේ සංගමයක් පිහිටුවන ලදී. ඔවුන්ගේ එක් වැදගත් කාර්යයක් වී ඇත්තේ, වැටෙන ව්‍යාපාර නංවාගැනීමට අවශ්‍ය නීති පද්ධති ගැන රජයට දැනුම්දීමත්, පිරිහෙන ව්‍යාපාරවලට වැදගත් වන ක්‍රම හා විධි ගැන විශේෂ විග්‍රහයක් කිරීමත්ය.

මෙම ක්‍රියාවලිය සාර්ථකව සිදුවුවහොත් ඒවා හරහා විශේෂ පිබිදීමක් රටේ ව්‍යාපාර තුළ සිදුවනු නොඅනුමානය. අප මුලින්

කිවාක් මෙන් පටන් ගැනෙන ව්‍යාපාරවලින් 80% ක්ම පරිහානියට පත්වෙයි. එහෙත් යම් උපාය මාර්ගයක් හරහා මෙලෙස පරිහානියට පත්වන ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් සැලකිය හැකි කොටසක්වත් අපට පුනර්ජීවනය කර ගැනිමට හැකි වුවහොත් එම ප්‍රයත්නය මුළු ආර්ථිකයටම දැඩි රුකුලක් වන්නේය.

# 3

## තෙවන කොටස

# කෘෂිකර්මය සහ ධීවර

# 3.1

## වැවිලි කර්මාන්තයට නව දැක්මක්

ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තය ගැන දැනට අවුරුදු 50කට පමණ පෙර සහ වර්තමානයේ පවතින තත්ත්වයන් පිළිබඳව අප සංසන්දනාත්මක විග්‍රහයක් කළහොත් අපට පෙනී යන්නේ පසුගිය දශක 5 තුළදී මෙම කර්මාන්තයේ සිදුවී ඇති ගුණාත්මක සහ සංඛ්‍යාත්මක වෙනස ඉතා අල්ප ඒවා බවය. තේ, පොල්, රබර්, වී යනාදී භෝගවල වැවීමේ ක්‍රම, නෙලීමේ ක්‍රම, නිෂ්පාදනය කිරීමේ ක්‍රම, හසුරුවීමේ ක්‍රම සහ අලෙවි කිරීමේ ක්‍රමවල සිදුවී ඇති වෙනස්කම් ඉතා ස්වල්පය. එපමණක්ම නොව, එම ක්ෂේත්‍රවල නිරත වී සිටින පුද්ගලයන්ගේ ජීවන මට්ටම්වල විශේෂ වෙනසක්ද සිදුවී නොමැති බවද අපට අකමැත්තෙන් පිළිගන්නට සිදුවේ. විටින් විට රජය විසින් සිදුකරන ලද නීති සහ ප්‍රතිසංස්කරණ හරහා ඉඩම් හිමියන්ගේ වෙනස්කම් ඇති වුවද, ඒ තුළින් අපේක්ෂිත විශේෂ වාසින් රටට හෝ ඉඩම් හිමියන්ට හෝ සේවකයන්ට හෝ එම පළාත්වලට ලැබී ඇතැයි අපට පිළිගත නොහැක. ඇත්ත වශයෙන්ම මෙම වැවිලි ක්ෂේත්‍රය දෙස අප විග්‍රහශීලි ඇසකින් බැලුවහොත්, පසුගිය දශක 5 තුළ එම ක්ෂේත්‍රයේ ප්‍රගතිය සම්බන්ධයෙන් අපට සතුටුවන්නට හේතූන් නැති තරම්ය. අවාසනාවකට මෙන් අද පවතින වාතාවරණය දෙස බලන විට ඉදිරියේදීද මෙවැනිම මන්දගාමී සහ අරමුණු රහිත වැඩපිළිවෙතක් අප අනුගමනය කරතැයි සැකයක් පහළ වනු ඇත. එසේ සිදුවුවහොත්, මෙම ක්ෂේත්‍රයේ පිරිහීම තවදුරටත් සිදුවනු නොඅනුමානය. එසේ නම්, විශාල ඉඩම් ප්‍රමාණයකින් සමන්විත මෙම ජාතික සම්පතින් නිසි ප්‍රයෝජනයක් ලබාගැනීම සඳහා ක්ෂේත්‍රයට අදාළ සියලු දෙනාම නව දැක්මකින් සහ උද්යෝගයකින් කටයුතු කිරීම අත්‍යවශ්‍යය.

---

**2004.08.29 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙත ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

ඒ අතර, ශ්‍රී ලංකාවේ භූගෝලීය සහ භූමි ලක්ෂණ වලට බොහෝදුරට සමාන මැලේසියාවේ වැවිලි ක්ෂේත්‍රයේ පසුගිය දශක දෙක තුල අධික දියුණුවක් ඇති වූ බව අපට පෙනේ. එවැනි දියුණුවක් ඇතිකර ගැනීම සඳහා ඒ රට අනුගමනය කළ වැඩපිළිවෙත් සහ සාර්ථක අත්දැකීම් වලින් අපට ප්‍රයෝජනවත් පාඩම් කිපයක් ඉගෙන ගත හැකිවේ යයි මා සිතමි. ඒ නිසා මැලේසියාවේ එම වැඩපිළිවෙත ගැන කෙටි විග්‍රහයක් කිරීම වටී. 1985 දී මැලේසියාවේ වැවිලි කර්මාන්තයේ "අගය එකතු කිරීම" (Value Addition) මැලේසියානු රින්ගිට් බිලියන 11.9 ක් වුනි. ඒ අවධියේදී එනම් 1985 දී ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් (National Agricultural Policy) එළි දක්වමින්, මැලේසියානු රජය ඊළඟ අවුරුදු 10 තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන සැළැස්මක් රටට හෙලි කලේය. අනතුරුව, එම සැළසුම ඉතා ඕනෑකමකින් ක්‍රියාවේ යොදවමින් 1995 වනවිට, වැවිලි ක්ෂේත්‍රයේ "අගය එකතු කිරීම" 61% කින් වර්ධනය කරගැනීමට ඔවුහු සමත් වූහ. මෙම විශිෂ්ඨ වර්ධනය ඉතා සතුටුදායක එකක්

වුවත්, මැලේසියානු රජය එම වර්ධනයෙන් සෑහීමකට පත් නොවී, 1995 දී තවත් නව ජාතික කෘෂිකාර්මික සැළැස්මක් ඊළඟ වසර 10 තුළ අනුගමනය කිරීම සඳහා ඉදිරිපත් කළේය. එම නව සැළැස්මෙන් ඔවුන් බළාපොරොත්තු වූයේ ඉඩම් ප්‍රයෝජනය සහ පාවිච්චිය (land utilization) වඩාත් කාර්යක්ෂම කරගැනීම සහ එම කාර්යක්ෂමතාවය හරහා ලැබෙන අස්වැන්න, අඩු භූමි ප්‍රමාණයක් සහ අඩු සේවක පිරිසක් යොදවමින් උපුටා ගැනීමය. ඒ අතර, වැවිලි ක්ෂේත්‍රය වෙනුවෙන් එතෙක් වෙන්කර තිබූ ඉඩම් වලින් තෝරාගත් කොටසක් වෙනත් නවීන ප්‍රයෝජන සඳහා යොමු කිරීමටද ඔවුන් කටයුතු කළහ. තවද, රටේ ආහාර ආරක්ෂාව (Food security) රැකගැනීම පිණිස රටවැසියන් සාමාන්‍යයෙන් අනුභව කරන ආහාර භෝග නිෂ්පාදනය ක්‍රමවත්ව වැඩි කිරීම පිණිසද මෙම සැළැස්මේ විශේෂිත ක්‍රියාමාර්ග අඩංගු විය. මෙවන් ක්‍රියා මාර්ග සියල්ලම ක්‍රියාවේ යෙදවීමේදී නව තාක්ෂණය වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ කිරීම, ක්ෂේත්‍රයේ නියැලි සිටින මානව සම්පත් පුහුණු කිරීම, වැවිලි ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් දියුණු කිරීම, ක්ෂේත්‍රයට අවශ්‍ය බැංකු සහ ව්‍යාපාරික සහයෝගිතා

ආයතන කාර්යක්ෂමව හසුරවීම සහ මූල්‍ය සම්පත් වඩාත් පහසුවෙන් ක්ෂේත්‍රයට යොමු කිරීම වැනි ක්‍රියාමාර්ග කෙරෙහිද මෙම පුළුල් සැළැස්ම අවධානය යොමු කොට තිබුණි.

පශු සම්පත්, පළතුරු, එළවලු, වනාන්තර, දැව කර්මාන්තය වෙනුවෙන් වැවිලි, පාම් තෙල්, රබර්, කොකෝ සහ අනිකුත් වැවිලි භෝග වෙනුවෙන් වෙන් වෙන්ව ශීර්ෂ යටතේ ක්‍රියාමාර්ග රාශියක්ද මෙම සැළැස්මේ අඩංගු කිරීමට ඔවුන් වගබලා ගත්හ. මේවා අතර, කෘෂි ජීව තාක්ෂණය (bio technology), සුරතල් මසුන්, අශ්වයන් ඇතිකිරීම, (horse breeding) අශ්ව දිවීමේ තරගවලට පුහුණු කඳවුරු (horse training Camps) සංවිධානය කිරීම, කෘෂි සහ පරිසර සංචාරක (agri and eco tourism) වැනි නව ව්‍යාපාර විය. මෙලෙස හඳුනාගෙන ඇති නව ක්‍රියාවලි සහ ව්‍යාපාර ඔස්සේ සමස්ත වැවිලි ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය සහ ආදායම සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩිකර ගැනීමට මැලේසියාව කටයුතු කළ බව ඉතා පැහැදිළිය.

මෙපමණ සාර්ථක පාඩම් සහ අත්දැකීම් අප අත ළඟ තිබියදීම, මැලේසියාවේ ක්‍රියාවලියට හාත්පසින්ම පාහේ වෙනස් අන්දමකට ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රය කටයුතු කිරීම ගැන අප සියලු දෙනාම දැඩි කනගාටුවට පත්විය යුතුය. බොහෝ කළක් තිස්සේ කිසිඳු අරමුණක් හෝ ඉලක්කයක් නොමැතිව ඉබේම පාහේ පාවෙන්නට ඉඩ හරින ලද ශ්‍රී ලංකා වැවිලි ක්ෂේත්‍රයේ ගමන අපට ඉතා අවාසනාවන්ත එකක් වී ඇත. ඵලදායීතාවය සහ ආදායම වැඩි කරවන ක්‍රියා මාර්ග, අගය එකතු කිරීමේ ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා වැවිලි ක්ෂේත්‍රයේ පාලකයින් දියත් කොට ඇත්තේ දුර්ලභ අවස්ථාවලදීද අඩුපාඩු සහිතවය.

අප රටේ වැවිලි අංශය අනිත් රටවල වැවිලි ක්ෂේත්‍රවලට සාපේක්ෂව දියුණු මට්ටමකට ගෙන එන්නට නම් ක්ෂේත්‍රයේ නායකයින් සහ පාලකයින් සිතෙහි තබා ගත යුතු මූලික කරුණ නම් වැවිලි ක්ෂේත්‍රය දෙස ඔවුන් නව කෝණයකින් බැලීමට පුරුදු විය යුතු බවයි. යම් භූමියක හෝ ඉඩමක එක්තරා භෝගයක් සාම්ප්‍රදායිකව පැලකරනු ලැබුවද, එම භෝගය පමණක්ම දිගින් දිගටම වැවීමෙන් සමහර විට එම භූමියෙන්

ලබාගත හැකි උපරිම ප්‍රයෝජනය නෙලාගැනීමට බාධාවක් විය හැකිය. උදාහරණයක් වශයෙන්, යම් ඉඩමක තේ වැවීම වෙනුවට, ඊට වඩා වාසියක් ඇතිව අපනයනය කළ හැකි යම් මල් වර්ගයක් වැවීමට එම භූමිය සුදුසු වන්නට පුලුවන. එවිට එහි වගාව වෙනස් කිරීමෙන් දිගුකාලීනව වඩාත් අධික වාසියක් ලබාගත හැකි වන්නේය. මෙවැනි යථාර්ථවාදී තීරණ ගැනීමට නම්, විවෘත මනසක් ඇතිව රටේ භූමි සම්පත් දෙස සිත් යොමු කිරීමට වැවිලි ක්ෂේත්‍ර නායකයින් තමන්ගේ ආකල්ප වෙනස්කර ගැනීම යෝග්‍යය. එසේ කරන අතරම, ක්ෂේත්‍රයට අදාළ සියලු දෙනාගේම සහභාගීත්වයෙන් සහ එකගත්වයෙන් වැවිලි ක්ෂේත්‍රය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු ඇති අතර, නිශ්චිත ඉලක්ක, කාල සීමා, ඇතුලු කරුණු එහි අඩංගු විය යුතුය.

අප රටේ විදේශ විනිමයෙන් වැඩි ප්‍රතිශතයක් ලබාදීමට වැවිලි ක්ෂේත්‍රය දායක වුවද එහි නිරත වී සිටින සේවකයන්ගේ ආදායම සහ ජීවන මට්ටම තවමත් පවතින්නේ පහළම මට්ටමකය. ඉඩම් අයිතිකරුවන්ද භුක්ති විඳින ලාභාංශද වෙනත් රටවල් සමග සංසන්දනය කරන විට බෙහෙවින් අඩුය. මෙවැනි තත්ත්වයක් තුළ මෙම ක්ෂේත්‍රයේ නියම ජාතික ආර්ථික පිබිදීමක් අපට ගොඩනංවා ගැනීමට නොහැකි වන අතර, සමාජීය සහ දේශපාලනික වශයෙන්ද, එම තත්ත්වය අපට අවදානම් සහ අර්බුදකාරී එකක් වන්නේය. මෙම දැවෙන ප්‍රශ්නයෙන් මිදෙන්නට නම් අප ඉක්මණින්ම සැළසුම් සහගතව මෙම ප්‍රශ්නයට මුහුණ දීමට අධිෂ්ඨාන කරගත යුතුය.

# 3.2

## වැව්ලි ක්ෂේත්‍රයේ ගැටලු වලට පිළියම්

වතුහිමියන්, වැව්ලිකරුවන් සහ ගොවීන් බොහෝ දෙනා මුහුණ පාන ගැටළුවක් වනුයේ සොරුන්ගෙන් තම අස්වැන්න ආරක්ෂා කර ගැනීමයි. අස්වනු නෙළන කාලවලදී බෝග හොරකම් කිරීම හෝ බලෙන් පැහැරගෙන යැම නිසා වතු හිමියෝ, වැව්ලිකරුවෝ සහ ගොවීහු බොහෝ දෙනෙක් අද කෘෂිකර්මය සඳහා සැලකිය යුතු ආයෝජනයක් කිරීමට මැලිවෙති.

නීතිය ක්‍රියාවේ යොදවන බලධාරීන් ද බොහෝ අවස්ථාවල දී ඒ ගැන උනන්දුවක් නොදක්වන බව පෙනේ. ඔවුන් සමහරවිට ගන්නා ස්ථාවරය වනුයේ අස්වැන්න ස්වල්පයක් වතුහිමියාට හෝ ගොවියාට අහිමිවුවා, ඔහුට වැඩි පාඩුවක් වන්නේ නැතැයි ද ඒ නිසා ප්‍රශ්න ගැන ඔවුන් විශේෂ අවදානමක් යොමු නොකළ යුතුයි ද යන්නය. මේ නිසා සමහර අවස්ථාවලදී ඔවුහු එම ගැටලුව නොදැක්කා සේ සිටිති.

බලධාරීන්ගේ මේ පැහැදිලිවම පෙනෙන උදාසීනකම ගොවියා සහ වතුහිමියා අධෛර්යමත් කරන්නක් වන අතර තමා මහන්සියෙන්, අවදානම් රාශියක් දරමින් වගා කළ බෝග ගමේ චන්ඩින් හෝ සංවිධානාත්මක බෝග හොරුන් තමාගේ නෙත් ඉදිරියේම කොල්ලකෑම හෝ සොරා ගැනීම නිසා තමාගේ උනන්දුව දිනෙන් දිනම හීන වී යයි. මේ ගැටලුව සාර්ථක ලෙස විසඳීමට නම් බෝග හා වැව්ලි වගා ආරක්ෂා කිරීම සඳහා ඇති නීති නිසියාකාරව ක්‍රියාත්මක විය යුතු අතර, වැරදිකරුවන්ට තදබල දඬුවම් ද සිදු විය යුතුය. එකී නීති සාධාරණව හා හරියාකාරව ක්‍රියාත්මක කිරීමේ වගකීම නීතිය ක්‍රියාවේ යොදවන අයට සාජුවම පැවරිය යුතුය.

---

2003.06.08 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙත ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

අප රටේ කෘෂිකර්ම අංශයේ ව්‍යාපෘතියක් නිසියාකාරව වර්ධනය වීම වළක්වන තවත් බාධාවක් නම් කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධයෙන් පවත්නා පුලුල් ආකාරයේ මිල විකෘති වීමත්ය. එම දරුණු තත්ත්වයට චක්‍රාකාරව සහයෝගය දෙන ආණ්ඩුව බොහෝ විට එසේ කරන්නේ අස්වනු නෙලා ගැනීමට ඔන්න මෙන්න කියා තිබියදී, පාරිභෝගිකයන්ට මිළ ස්ථාවර කමක් අවශ්‍යයැයි කියමින්, එම බෝගය විශාල වශයෙන් ආනයනය කිරීමට අවසර දීමය. මෙවැනි අවස්ථා රාශියක් ගැන අපි දනිමු.

ඇත්තෙන්ම පාරිභෝගිකයාගේ කෝණයෙන් නම්, එවැනි ප්‍රතිපත්තියක් කෙටිකාලීනව වාසියක් ලෙස පෙනෙන්නට හැකිය. එහෙත් එම ක්‍රියාවෙන් සිදු වන්නේ දිගු කාලීනව එම බෝග වර්ග වගා කිරීමෙන් ගොවීන් වැළකී සිටීමයි. තවද, වසර කිපයක් තුළදී ගොවීන් අසාර්ථක සහ අධෛර්යමත් කරන මෙවැනි සිද්ධීන් කිහිපයකට ගොදුරු වූ පසු, තම ගොවිතැනෙන් ලැබීමට තිබූ ලාභය අත ළඟින්ම ගිලිහී යනු දකින ගොවියා ද පාඩු විඳිමින් සම්පූර්ණයෙන්ම පාහේ ණය දැලේ පැටලෙනු ඇත. එවිට රජයත් සාමාන්‍යයෙන් කරන්නේ ගොවීන් මෙසේ පැටලී සිටින මෙම විෂම දැලෙන් මුදා ගැනීම සඳහා විශේෂයෙන් මැතිවරණ කාලවලදී, රජයේ බැංකු වලට එම ණය කොටසක් කපා හැරීමට නියෝග බිරීමයි. ඒ නිසා සමස්තයක් වශයෙන් ගත් විට මේ විටින් විට බෝග ආනයනය කිරීමේ කෙටි කාලීන ජනප්‍රිය ප්‍රතිපත්තිය අප රටේ කෘෂිකර්ම අංශයට බරපතල ප්‍රශ්නයක් ඇති කරයි. මෙම කරුණු හොඳින් සලකා බලා මේ ප්‍රතිපත්තිය ගැන අප රටක් වශයෙන් නැවත සිතා බැලිය යුතුයි.

මේ පමණක්ම නොවේ, තවත් විකල්ප වන ඉදිරි විකුණුම් සහ මිලදී ගැනීම් ගිවිසුම් (Forward Sales and Purchases Contracts) බෝග රක්ෂක යෝජනා ක්‍රම බෝග නිෂ්පාදන සඳහා සුදුසු ගබඩා පහසුකම්, විශේෂ දිගුකාලීන අරමුදල් යෝජනා ක්‍රම මගින් මූල්‍ය සම්පාදනය කිරීම ආදී වෙනත් නිෂ්පාදනයට හිතකාමී වෙළඳ පොළ ප්‍රතිපත්ති හඳුන්වා දීමට ද ඒ සමගම ඉක්මන් ක්‍රියා මාර්ග ගත යුතුය.

සාමාන්‍යයෙන් අප රටේ නගරයේ වෙළඳ පොළේ පොල් ගෙඩියක් අලෙවි වන්නේ එම නගරයට සැතපුම් 60ක් හෝ 80ක් පමණ ඈත ස්ථානයක ඒ පොල් ගෙඩියට ගොවියාට ලැබෙන මිල මෙන් දෙගුණයක් වන මිලකටය. මෙවැනි විශාල මිල පරතරයක් ඇති වන්නේ අපේ කෘෂිකාර්මික නිෂ්පාදන එක්රැස් කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීමේ ක්‍රියාමාර්ගවල ඇති බරපතල අඩුපාඩු නිසාය. ගොවියා සහ පාරිභෝගිකයා යන දෙදෙනාම අපහසුවට පත් කරමින් අතරමැදියා පොහොසත් වන මේ ක්‍රමය නිවැරදි කිරීම සඳහා අත්දැකීම් ඇති පලපුරුදු පුද්ගලයින් කිහිප දෙනෙකුම බොහෝ උපාය මාර්ග යෝජනා කර තිබුණත් සුලු ප්‍රමාණයක් හැරුණු විට මෙම ප්‍රශ්නය එසේම පවතී.

මැතකදී මීගොඩ නගරයේ ස්ථාපනය කරන ලද වෙළඳ පොළ මෙම ප්‍රශ්නයට යම් තරමින් වත් කරනු ලැබූ ප්‍රතිකර්මයක් ලෙස අපට හැඳින්විය හැක. මෙවැනි ව්‍යාපෘති රාශියක්ම අප රටේ දියත් කළ යුතු වන්නේය. එසේ සිදු නොවුවහොත් දිගින් දිගටම නිෂ්පාදකයන්ට මෙන්ම පාරිභෝගිකයන්ට ද බොහෝ විට මුහුණ දීමට සිදුවන්නේ අහිතකර දසාවකටය.

# 3.3

## වී ගොවිතැන සඳහා නව දැක්මක්

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ එක් සුවිශේෂ අංගයක් නම් වී ගොවිතැනයි. වී ගොවිතැනෙහි ගොවීන් දොළොස් ලක්ෂයක් පමණ නිරත වී සිටින අතර, ඔවුන් සාමූහිකව කුඹුරු හෙක්ටයාර් 550,000 පමණ වගා කරති. ඒ තුළින්, අප රටේ ජනගහනයෙන් පහෙන් එක් පංගුවක් ක් පමණ අය සෘජුව හෝ වක්‍රාකාරව වී ගොවිතැනෙහි නියැලී සිටිති. තත්ත්වය මෙසේ නම්, මෙම ක්ෂේත්‍රයේ යම් පිබිදීමක් ඇති කළහොත් අප රටේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසකට විශේෂ ධෛර්යයක් ලැබෙන බව අපට තේරුම් ගැනීම අපහසු නොවේ. තවද, වී ගොවිතැනෙහි නියැලී සිටින පුද්ගලයින්ට, වී ගොවිතැන ලාභ ලබා ගත හැකි ව්‍යාපාරයක් ලෙස සකස් කර ගැනීමටද, ඒ තුළින් තමන්ගේ ජීවන මට්ටම සැළකිය යුතු අන්දමකට ඉහළ නංවා ගැනීමටද අප පසුබිමක් නිර්මාණය කළහොත්, එය අප රටේ ආර්ථිකයේ ඉදිරි ගමනට ඉතා අත්‍යවශ්‍ය රුකුලක්ද වන බවද පැහැදිළිය.

අප රටේ ඇති මුලු භූමි ප්‍රමාණය නොවෙනස්ව පවතින්නකි. එම භූමි ප්‍රමාණයට ඇතිවන විවිධාකාර ඉල්ලීම් සහ බලපෑම් හේතුකොටගෙන, අනාගතයේදී ගොවිතැන වෙනුවෙන් වෙන් කළ හැකි භූමි ප්‍රමාණය තව දුරටත් වැඩි කිරීමට දුෂ්කර වනු ඇත. එසේ නම්, අප සැමවිටම වෑයම් කළ යුත්තේ ගොවිතැනට යොමු වී ඇති මෙම සීමිත භූමියෙන් ලැබෙන ආර්ථික සහ සමාජීය ප්‍රතිඵල වල ඵලදායීතාවය සහ වාසිය හැකිතාක් දියුණු කර ගැනීමටය. අද අප රටේ සාමාන්‍ය වී අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 3.8 ක් වැනි අඩු මට්ටමක පවතී. එහෙත්, නවීන ක්‍රම අනුගමනය කරන කෘෂිකාර්මික රටවල වී අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 10 ඉක්මවා යන

---

**2004.06.06 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

බව අප දනිමු. අප රටේ කෘෂිකාර්මික ඵලදායිතාවයද ඉතා ඉක්මනින් වර්ධනය කරගනිමින්, එය අවම වශයෙන් ඊළඟ වසර 3 හෝ 4 තුළදී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 5.5 ක ඉලක්කයකටවත් වර්ධනය කර ගැනීම කරා අප සිත් යොමු කළ යුත්තෙමු. එසේ කිරීමට නම්, වී ගොවිතැනට අත්‍යවශ්‍ය සම්පත් වන ජලය, බීජ, තාක්ෂණය, පොහොර සහ අනිකුත් යෙදවීම් ඉහළ මට්ටමකට ගෙන ඒමට කඩිනම් ක්‍රියාවලින් අප දියත් කළ යුතුය. අවුරුදු 2,500 ක පමණ කාලයක් මුලුල්ලේ, අප රටේ වැව් 30,000 කට අධික සංඛ්‍යාවක් ඉදිකෙරී ඇත. ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට මෙය අතිශයින්ම වටිනා සම්පතකි. එහෙත්, එම සම්පතෙහි ඇති වැදගත්කම අප වර්තමාන යුගයේදී හරියාකාරව අවබෝධ කරගෙන නොමැත. අප රටේ වැව් නිසියාකාරව නඩත්තු නොකරමින්, ඒවා පිරිහීමට ඉඩ දෙමින්ද, ඒවාට සම්බන්ධ වාරි මාර්ග කඩාකප්පල් වීමට ඉඩ හැරීමෙන්ද, අප අපේම සම්පත් ලැජ්ජා සහගත ලෙස නාස්ති වීමට ඉඩ දී ඇත. වැව් ප්‍රතිසංස්කරණය, වාරි මාර්ග දියුණු කිරීම, ඉහළ මට්ටමක බීජ නිෂ්පාදනය කිරීම, කුඹුරු පස කාර්යක්ෂමව සහ මනා අන්දමට සකස් කිරීම, නව ක්‍රම හරහා වගා කිරීම සහ පැල සත්කාර කිරීම ඇතුලු විවිධ අත්‍යවශ්‍ය ක්‍රියාවලින් අප රටේ දියත් වන්නේ ඉතා ස්වල්ප අන්දමකට පමණය.

අද බොහෝවිට, තරුණ තරුණියන් වී ගොවිතැන් ක්ෂේත්‍රයෙන් ඉවත් වී අනිකුත් ක්ෂේත්‍ර වලට පිවිසෙති. ඔවුන් එසේ කරන්නේ වී ගොවිතැන් ක්ෂේත්‍රය තුළින් ඔවුන්ට අද ඇති තත්ත්වය අනුව, යහපත් අනාගතයක් හෝ හොඳ ආදායමක් බලාපොරොත්තු විය නොහැකි නිසා, බව පැහැදිළිය. එහෙත් දියුණු රටවල තත්ත්වය මීට වඩා හාත්පසින්ම පාහේ වෙනස්ය. ඒ රටවල ගොවිතැන්, කෘෂි ක්ෂේත්‍රයේ නියැලි සිටින අයට ඉහල මට්ටමේ ආදායම් ලබා ගැනීමට අවස්ථාවන් බහුලව ඇත. ඒ නිසා එම රටවල මෙම ක්ෂේත්‍ර වලට දක්ෂ තරුණ තරුණියන් අනිවාර්යයෙන්ම එකතු වීමේ ප්‍රවණතාවයක්ද පවතී.

අපගේ ගොවීන් ශක්තිමත් කිරීම සඳහා යම් සහනාධාරයක් හෝ වියදමක් අප රජය දරන්නේ නම්, එවැනි සහනාධාරයක් මා

හඳුන්වන්නේ රටේ අනාගතය කෙරෙහි අප යොමු කරන ආයෝජනයක් ලෙසය. අපගේ දූ පුතුන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට අප විශාල මුදලක් ආයෝජනය කරමු. අපගේ රට වැසියන් රෝගී වූ විට ඔවුන්ට සුවය ලබා දීමට අප සෞඛ්‍ය වෙනුවෙන් විශාල මුදලක් වැය කරමු. එසේම, අපට උරුම ගොවිතැන රැකගැනීම සඳහාද, ගොවිතැනින් යැපෙන අපගේ අති විශාල ජනතාවට ශක්තියක් ලබා දීම සඳහාද, රජය මුදල් යොමු කරන්නේ නම්, එයද එවැනිම ක්‍රියාවලියක් ලෙස මම දකිමි.

ඉහත පෙන්වා දී ඇති ක්‍රියාවලීන්ට සමාන්තරව, අප රටේ සහල් අනුභව කිරීමේ ප්‍රවණතාවද අප නොයෙකුත් ක්‍රම සහ විධි හරහා වර්ධනය කළ යුතුය. ඒ අතරම, පිට රට වලින් ආනයනය කරන තිරිඟු පිටි වලට ඇති ඉල්ලුම අවම කිරීමටද අප කටයුතු දියත් කළ යුතුය. සහල් වලට ඇති ඉල්ලීම වර්ධනය වනවාත් සමගම, එම ඉල්ලුම සපුරාලීම සඳහා (මා තක්සේරු කරන අන්දමට) සහල් නිෂ්පාදනය තව 50% කින් පමණ වර්ධනය වීමට අවකාශය පහසුවෙන්ම අප රටතුළ බිහි වනු ඇත. එම ඉල්ලුම නිසා හට ගන්නා අවකාශය පියවීම සඳහා අප රටේ දැනට වී ගොවිතැනෙහි යෙදී ඇති හෙක්ටයාර් 550,000 තුළ අස්වැන්න දියුණු කිරීමට අපට අනිවාර්යයෙන්ම සිදු වනු ඇත. එසේ සිදු වුවහොත්, අපගේ ගොවීන්ගේ ආදායම් ඉතා ඉක්මනින්ම සැළකිය යුතු අන්දමකින් වර්ධනය කිරීමට තුඩු දෙන ආර්ථික මාර්ගයක් බිහි වනු ඇත. මෙලෙස ගොවීන්ගේ ආදායම් වර්ධනය වනවාත් සමගම රටේ බහුතර ජනතාව දුප්පත් කමින් මිදී, ඔවුන් වඩාත් පොහොසත් මධ්‍යම මට්ටමේ ආදායම් හිමි අය (Middle-income Earners) බවට පරිවර්තනය වනු ඇත. එසේ වුවහොත්, මුලු රටේ ආර්ථිකයටම ඔවුන්ගෙන් වන ආර්ථික ශක්තිය සහ "භාණ්ඩ මිලදී ගැනීමේ ශක්තිය" (Purchasing Power) හරහා විශාල ගැම්මක් රටේ ආර්ථිකයට ලබා දෙනු ඇත.

රටක ආර්ථික ප්‍රතිපත්තීන් සකස් විය යුත්තේ රටේ සුලුතර සංඛ්‍යාවක් වන ඉහළ පෙළේ යැයි සාලකෙන ජනතාවගේ ආදායම් සහ ධනය තව තවත් ඉහළ මටටමකට යොමු කිරීමට නොවේ.

ඒවා සකස් විය යුත්තේ බහුතර ජනතාවගේ ජීවන තත්ත්වය සහ මට්ටම ක්‍රම ක්‍රමයෙන් වර්ධනයට භාජනය කිරීම සඳහාය. එවැනි සිදුවීමකට තුඩුදෙන ආර්ථික වාතාවරණයක් සහ ව්‍යුහයක් සකස් කිරීම සහ පවත්වාගෙන යාම රජයක විශේෂ වගකීමකි කාර්යයකි.

අප රටේ වී ගොවීන්ගේ ජීවන තත්ත්වය ගැන විග්‍රහයක් කරද්දී, අපට පෙනෙන්නේ අප රට නිදහස ලැබුවායින් පසු පළමුවෙනි දශකයේදී පමණක් ගොවිතැන අවංකවම වර්ධනය කිරීමේ ප්‍රතිපත්ති අනුගමනය කළ බවය. ඊට පසු පත්වූ සියලුම රජයන් පාහේ නොදැන්වත්ව හෝ නොසැලකිලිමත්ව, එම වගකීම සහ කාර්යභාරය පැහැර හැර ඇති බව අපට පවසන්නට සිදු වන්නේ කනගාටුවෙන්ය. ආර්ථික හෝ සමාජීය කෝණයකින් සලකා බලද්දී, මෙම තත්ත්වය අප ඉක්මණින් වෙනස් නොකළහොත්, එයින් අප රටට සිදුවන විපාක අප රටේ සමාජීය සහ ආර්ථික අඩිතාලම දෙදරන්නට තුඩු දෙන තත්ත්වයක් බිහි කිරීමට ඉඩ දී ඇති බවද අප තේරුම් ගත යුතුය.

# 3.4

## වී ගොවියා දිරිගන්වමු

දැවෙන ආර්ථික ප්‍රශ්න ගැන සෑම සතියකම කරුණු ඉදිරිපත් කරද්දී, අප උපුටා දැක්වූ එක් විශේෂ තේමාවක් නම් අප රටේ කෘෂි කර්මය සහ ගැමි ආර්ථිකය නංවාලීමට අප දැරිය යුතු ප්‍රයත්නයන්ය. අප රටේ ගොවීන්ට අවශ්‍ය සම්පත්, දැනුම සහ සහයෝගය ලබා දීමෙන් ඔවුන් දිරිමත් කළ හැකි ක්‍රම ගැන අප විටින් විට සාකච්ඡා කළෙමු. ගොවීන්ට ලබා දෙන පොහොර සහ අනිකුත් සහනාධාර ආයෝජනයක් ලෙස සැළකීමේ අවශ්‍යතාවයද අප බොහෝ විට පෙන්වා දුන්නෙමු. එමෙන්ම, වැව් ප්‍රතිසංස්කරණය, අස්වැන්න ඉක්මණින් සහ ඵලදායි ලෙස පාරිභෝගිකයාට ලබා දීමේ ක්‍රම, ණය පහසුකම් සරළ ලෙස සහ අවශ්‍ය වෙලාවට ලබා දීම, අත්‍යවශ්‍ය සහනාධාර සැපයීම, අස්වැන්න සොරුන්ගෙන් සහ අනෙකුත් උවදුරු වලින් ආරක්ෂා කිරීම, වැනි අත්‍යවශ්‍ය වැඩපිළිවෙත් ගැනද අප සාකච්ඡා කොට ඇත. එහෙත්, එවන් යෝජනා සියල්ලම පාහේ සළකන විට අපට වැටහෙන එක් කරුණක් නම් ඒවා සියල්ලම 'සැපයුම්' කෝණයකින් පැන නගින ක්‍රියාවලින් බවය. ඒවායේ වැදගත්කම අනිවාර්යයෙන්ම ඉතා ඉහළ මට්ටමක පවතින අතර, ඊට අමතරව, මෙම ප්‍රශ්නය දෙස වඩා පුලුල්ව බලන විට, එවැනි ක්‍රියාවලින් පමණක් මෙම දැවෙන ප්‍රශ්නයට සාර්ථක විසඳුමක් ලබා නොදෙන බවද අපට සමහර විට වැටහෙනු ඇත.

අප සියලු දෙනාම දැන් දන්නා පරිදි, ඇමෙරිකානු එක්සත් ජනපදයේ ගොවීන් වසරකට ඩොලර් බිලියන 300 ක් පමණ සහනාධාර විවිධ ක්‍රම සහ අංග හරහා ලබා ගනිති. එවැනි යුගයක, අප රටේ කෘෂිකර්මයේ යෙදෙන ගොවීන් ශක්තිමත් නොකළහොත් ඔවුන්ට මෙවැනි අසාමාන්‍ය තරග පිටියක ක්‍රියා

---

2003.08.31 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

කරමින් ජය ගැනීමට අපොහොසත් වීම ප්‍රදුමයකට කරුණක් නොවන්නේය. මා සිතන අන්දමට, අප රටේ ගොවීන් ශක්තිමත් කිරීම රජයේත්, පෞද්ගලික අංශයේත්, සෑම පුරවැසියකුගේත් විශේෂ වගකීමකි. එම වගකීම ඉෂ්ඨ කරන්නට නම්, ගොවීන්ගේ අස්වැන්න සැපයුම දිරිමත් කිරීම දෙස පමණක් නොව, අස්වැන්න සඳහා 'ඉල්ලුම' දෙසද අපගේ සිත් යොමු කිරීම නුවණට හුරුය. එම කෝණයෙන් සලකන විට, රජය විසින්, මෑතකදී වැඩි වැඩියෙන් බත් කෑමට ජනතාව පෙළඹවීම සඳහා දියත් කරන ලද මාධ්‍ය වැඩ සටහන ඉතා වටිනා එකක් ලෙස මට පෙනේ අප රටේ ජනතාව පාන් අනුභව කරන විට ඔවුන් වක්‍රාකාරව කරන්නේ ඇමෙරිකානු ගොවීන්ට වසරකට රුපියල් බිලියන 8 ක පමණ මුදලක් ලබා දීමය. අප රටේ ජනතාව පිටිකිරි පානය කිරීමෙන් කරන්නේ, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය සහ නෙදර්ලන්තය ඇතුලු රටවල සත්ත්ව පාලනයේ යෙදෙන ගොවීන්ගේ පසුම්බි වලට වසරකට රුපියල් බිලියන 10 ක් පමණ දෑමීමය. අප සියලු දෙනාම අපගේම පහසුව ගැන කල්පනා කරමින් වසරකට රුපියල් බිලියන 5 ක පමණ ටින් මාලු පාරිභෝජනය කරන විට අප කරන්නේ චිලි සහ නෝර්වේ වැනි රටවල ධීවරයන්ගේ පොකැට්ටු වලට විදේශ විනිමය එකතු කිරීමය. එහෙත් අප මතක තබා ගත යුතු අති විශේෂ කරුණක් තිබේ. එනම්, අප රටේම නිෂ්පාදනය වන සහල් සහ මත්ස්‍යයන් අප පරිභෝජනය කරන්නේ නම් ද, අප රටේ එළදෙනුන්ගේ කිරි අපම පානය කරන්නේ නම්ද, අප රටේ ගොවීන් සහ කිරි ගොවීන් ධෛර්‍යමත් කරමින් ඔවුන්ගේ නිෂ්පාදන වලට වැඩි ඉල්ලුමක් ඒ තුළින් ඇති කරන බවය. එසේ නම් දිගින් දිගටම සෑම වේලකටම අප බත් හෝ සහල් ආශ්‍රිත කෑම අනුභව කිරීමට පුරුදු වීම ඉතා අත්‍යවශ්‍ය සහ අගනා ක්‍රියාවක් ලෙස මට පෙනේ.

ඇමෙරිකා එක්සත් ජනපදය තම ධාන්‍ය නොයෙකුත් ආකාර වලට ජනතාවට කෑමට පහසු වන ලෙස සකස් කර ඇත. ඔවුන් නිෂ්පාදනය කරන පිටි හැම්බර්ගර්, පේස්ට්‍රීස්, කේක්, ඩෝනට්ස්, බනිස්, පයිස්, ස්පැගෙටි, නූඩ්ල්ස්, පැන්කේක්ස්, යනාදී නොයෙකුත් වෛවාරණ ආහාර වශයෙන් සෑම වේලකටම මුලු ලෝකයේම පාහේ ජිවත් වන ජනතාවට කැවීමට පුරුදු කොට ඇත. මෙම

ක්‍රියා මාර්ග වලින් අප හොඳ පාඩම් ඉගෙන ගත යුතුය. අප රටේ නිෂ්පාදනය වන සහල් පහසු ලෙස ජනතාවට ලබා දීමට නම් එම සහල් විවිධ ආහාර ලෙස ඉදිරිපත් කිරීමට පර්යේෂණ හරහා අප නව ක්‍රම සොයා ගත යුතුය. එවිට ජනතාව නොදැනුවත්වම වාගේ තමන්ගේ කෑම වේල් තුනටම සහල් ආශ්‍රිත ආහාර කෑමට පෙළඹෙනු ඇත. එසේ කිරීමෙන් දැනට දේශීය සහල් සඳහා ඇති ඉල්ලුම සමහර විට 50% කින් පමණ වැඩි කර ගැනීමට අපට හැකි වනු ඇත. එසේ සිදුවීමෙන් අප රටට ලැබෙන ආර්ථික වාසිය ඉමහත්ය. සහල් සඳහා ඉල්ලුම වැඩිවනවාත් සමගම සහල් මිලද ක්‍රමයෙන් වැඩි වෙනු ඇත. ඒ තුළින් ගොවීන් අතට වැඩි මුදලක් ලැබෙනවාත් සමගම, ඔවුන්ගේ ආර්ථික ශක්තියද වැඩිවෙනු ඇත. ඒ සමගම රටේ ජනගහනයෙන් 50% ක් පමණ සංඛ්‍යාවකගේ ජීවන මට්ටම ඉහළ නගිනවාත් සමගම, අප රටේ ආර්ථිකයට සිදුවන විප්ලවය ඉමහත් එකක් වනු නොඅනුමානය. ඒ තුළින්, රටේ ආර්ථිකයට පුදුමාකාර පිබිදීමක් ඇති වනු ස්ථිරය.

එසේ නම්, මේ සරළ අදහස හරහා දේශීය සහල් වලට ඇති ඉල්ලුම වැඩි කිරීමට අපගේ සාමූහික ප්‍රයත්නයන් දිගින් දිගටම දියත් විය යුතුය. මෙම උත්සාහය තවදුරටත් සාර්ථක කර ගැනීමට අපට කළ හැකි තවත් ක්‍රියාවලියක් මා යෝජනා කිරීමට කැමතියි. එය නම් රජයේ සේවකයන්ට සහ පුද්ගලික අංශයේ සේවකටයන්ට, මුළු මාසයටම අවශ්‍ය සහල්, මාසයේ මුලදීම මිලදී ලබා ගැනීම සඳහා අත්තිකාරමක් වශයෙන් වැටුපෙන් කොටසක් ගෙවිය යුතුයි යන්නය. එසේ කිරීමෙන් මුලු ජනගහනයෙන් විශාල කොටසක නිවෙස් වල මුළු මසටම වේල් තුනටම අනුභව කිරීම සඳහා අවශ්‍ය වන සහල් සැමවිටම පවතියි. මෙලෙස එක වරට සහල් ලබා දිමට ස.තො.ස සහ හෝ ගමේ සමුපකාරය හරහා පහසු ක්‍රමයක් දියත් කළ හැක. එසේ කිරීමෙන් සහල් පහසුවෙන්ම පාරිභෝගිකයාට ලබා දෙන ක්‍රමයක් ඇතිකරනවාත් සමගම දේශීය ගොවීන්ගෙන් මිලදී ගන්නා සහල් වලට පහසු අලෙවියක්ද ඇති වනු ඇත. මේ තුළින් සහල් අනුභව කිරීමට විශාල ජන කොටසක් නොදැනුවත්වම පාහේ පෙළඹවීමක් වන අතරම, ගොවීන්ගේ නිෂ්පාදනයට අති දැවැන්ත

රුකුළක්ද ඇති වන්නේය. මෙසේ ඉල්ලුම වර්ධනය වනවාත් සමගම රට තුළ, විශේෂයෙන් ගම තුළ, පරිහරණය වන මුදල් ප්‍රමාණය වැඩි වෙමින් සහ වඩාත් සීඝ්‍රයෙන් සිදු වීමෙන්, ගැමි ආර්ථිකයට විශේෂ පිබිදීමක් ඇති වේ.

# 3.5

# නියගය ප්‍රයෝජනයට ගෙන ගොඩ වී ඇති වැව් හාරමු

වාරි ජල සම්පාදනය සහ එදිනෙදා භාවිතය සඳහා ජල අවශ්‍යතාවයන් සපුරා දුන් වැව් දහස් ගණනක් පුරාතනයේ සිට ශ්‍රී ලංකාවේ තිබුණි. දැනටත් තිබේ. මේවා දිවයින පුරා විසිරී ඇති අතර උතුරේ සිට දකුණටත් නැගෙනහිර සිට බස්නාහිරටත් හැම ගමකම පාහේ මේවා දක්නට ලැබේ. මේ වැව් වලින් වැඩි සංඛ්‍යාවක් අපේ පැරණි රජ දරුවන් සමයේ ඉදිකරන ලද අතර ඒවා අපේ ගොවීන්ට මහත් සේ උපකාරී විය. ඇත්ත වශයෙන්ම අතීතයේදී අප රටේ ප්‍රජාවන් ගොඩනැගුණේ 'වැවයි දාගැබයි, ගමයි පන්සලයි' යන පදනම මතය. එය අද පවා අපේ ග්‍රාමීය සමාජවල විවිධ මට්ටම්වලින් දක්නට ලැබේ. එහෙත් අවාසනාවකට මෙන් අපේ වැව් දහස් ගණනක් අද ඉතා අසතුටුදායක තත්ත්වයක පවතින අතර සියවස් ගණනක් මුලුල්ලේ වැව් පතුල් වල තැන්පත් වූ රොන්මඩල සේදී විත් රැඳී ඇති පස් සහ අනිකුත් ද්‍රව්‍ය නිසා ඒවායේ ජල ධාරිතාව සැලකිය යුතු තරමකින් අඩු වී ඇත. ඒ අතරම, ඒවාට ලැබෙන ජල ප්‍රමාණය බෙහෙවින් අඩාල වී ඇති නිසා නියං කාලවලදී ඒවායේ එකතු වෙන ජලය ඉතා ශීඝ්‍රයෙන් සිඳී යාම ද අපි දකිමු. එබඳු අවස්ථා වලදී පරාර්ථකාමී ශ්‍රී ලාංකිකයන් වශයෙන් අප බොහෝ විට කරන්නේ බවුසර්, පනිට්ටු, භාජන ආදිය ජලයෙන් පුරවාගෙන, නියගයෙන් පීඩා විඳින අයට ආධාර දීමට කඩිමුඩියේ ඉදිරිපත් වීමය. මෙවැනි මානුෂික ප්‍රතිචාර ප්‍රශංසනීය ඒවා බවට සැකයක් නැත. එහෙත්, ඒවා තාවකාලික ක්‍රියාමාර්ග මිස ගැඹුරට කා වැදී ඇති ගැටලුවට ස්ථිර විසඳුමක් නොවේ. සැබෑ ගැටලුවට පිළියම් සොයා, ඊළඟ නියගය එළඹෙන විට ජනතාවට ජල හිඟයෙන් නැවත නැවතත් පීඩා විඳීමට සිදු නොවන පරිදි වැව්වල රොන්

---

2004.02.08 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

මඩ සහ අපද්‍රව්‍ය ඉවත් කිරීමට සමාජයක් වශයෙන් අප දැනෙන යමක් නොකිරීම සැබැවින්ම කණගාටුවට හේතුවකි. 2001 දී ද අප රටේ දකුණු සහ වෙනත් ප්‍රදේශවල වැව් සියල්ලම පාහේ සිඳී ගොස්, වැව් පතුලේ රොන්මඩ සහ අනිකුත් දෑ පැහැදිලිව මතුවූ අවස්ථාවේදී ඒවා ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක් අප අනුගමනය නොකළෙමු. ඒ අවස්ථාවේදී බුල්ඩෝසර් සහ පොළොව සැරීමට වෙනත් උපකරණ යොදාගෙන පහසුවෙනුත්, ඉක්මනිනුත්, ආර්ථික වශයෙන් ඵලදායී ආකාරයෙනුත් වැව් සැරිය හැකිව තිබුණි. සියවස් ගණනක් මුලුල්ලේ තැන්පත්ව තිබූ රොන්මඩ ඉවත් කිරීමෙන් පසු ඒවා වැව් බැම් උස් කිරීමට හෝ වගාවලට පොහොරක් වශයෙන් හෝ භාවිත කළ හැකිවද තිබුණි. එහෙත් අද සියලු දෙනාම දන්නා පරිදි එබඳු වැඩ පිළිවෙලක් ඒ කාලයේදී ක්‍රියාත්මක නොවූ අතර, ඒ හෙයින් මෙම ප්‍රශ්නයට දැනෙන ප්‍රතිචාරයක් දැක්වීමට තිබුණු මහඟු අවස්ථාවක් එයින් අහිමි වී ගියේය.

අද, නැවත වරක් ශ්‍රී ලංකාව නියගයකට මුහුණ දෙමින් පවතී. ඒ කරණ කොටගෙන බොහෝ ප්‍රදේශවල වැව් සිඳී ගොස් ඇති බව අපට දිනෙන් දිනම වාර්තා ලැබේ. මෙම තත්ත්වය රටට ඉතා අහිතකර වුවත්, එයින් යම් ප්‍රයෝජනයක් ගත හැකි නම් එම ප්‍රයෝජනය ලබා ගැනීම අප සියලු දෙනාගේම නුවණට හුරුය. එසේ නම්, රොන්මඩ සහ අනිකුත් ද්‍රව්‍ය වලින් පිරී ගොස් ඇති වැව් වඩාත් කාර්යක්ෂම ලෙස හැරීමෙන් ඒවා පවිත්‍ර කර ගැනීමට සහ ප්‍රතිසංස්කරණය කර ගැනීමට අද කදිම අවස්ථාවක් එළඹී ඇත. එයින් ප්‍රයෝජනය ගත හොත්, අඩු තරමින් මේ අවස්ථාවේදී වත් නියගයෙන් රටට සෙතක් ලබා ගත්තා යැයි අපට කිවහැකි වන්නේය. එසේ කිරීමෙන් අප රටේ සමස්ත කෘෂිකර්මයට මහඟු දායකත්වයක් ලැබෙන අතරම රටේ පවතින දැවෙන ආර්ථික ප්‍රශ්නයකටද වටිනා ප්‍රතිචාරයක් ලැබෙනු ඇත.

අද අප රටේ කෘෂිකර්මයට රජයෙන් සහ අනිකුත් අංශවලින් ලැබෙන දායකත්වය අප්‍රමාණවත් බව විශේෂඥයින් සහ ගොවීන් ඇතුලු සියලු දෙනාම පුන පුනා කියති. ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ඉතා දියුණු රටවල් තම ගොවීන්ට අති විශාල සහනාධාර

සහ දිරිගැන්වීම් සෘජුව සහ වක්‍රාකාරව ලබාදෙති. 2002 වසරේදී ලෝක බැංකුව විසින් පවත්වන ලද සමීක්ෂණයක් අනුව, එම දිරිගැන්වීම් සහ සහනාධාර වල අගය ඇමෙරිකානු ඩොලර් බිලියන 300 ක් පමණ යයි වාර්තා වී ඇත. එවැනි දැවැන්ත සහනාධාර සහ තාක්ෂණ දියුණුව උපයෝගී කර ගනිමින් ලෝකයේ අනිකුත් රටවල ගොවීන් සමග පහසුවෙන්ම තරග කිරීමට ඇමෙරිකාවේ ගොවීන්ට ශක්තිය ලැබෙනු පුදුමයට කරුණක් නොවේ. තවද, එවැනි දිරිගැන්වීම් සහ සහයෝගයන් හරහා ඒ රටවල ගොවීන් අප රටේ ගොවීන්ට වඩා ප්‍රමාණයෙන් සහ ගුණාත්මක භාවයෙන් වැඩි අස්වැන්න සහ ඵල නෙලා ගන්නට කටයුතු කිරීමට හැකියාවක් ඇතිකර ගැනීමද, විශ්මයට කරුණක් නොවේ. ලෝක තත්ත්වය එසේ තිබියදී අප රටේ ගොවීන්ට ලබාදිය හැකි සෑම සහයෝගයක්ම හැකි තරමින් වත් අප ලබා නොදෙන්නේ නම්, ඔවුන්ට රට වෙනුවෙන් මෙම කාර්යය කරගෙන යාමට බොහෝ අපහසුතා ඇති වන්නේය. එසේ නොවී, ඔවුන්ට මෙම ජාතික කාර්යය සාර්ථකව කරගෙන යාමට අනුබල නොදුනහොත්, ඒ තුළින් සිදුවන විපාකය ඔවුනට පමණක් නොව, ශ්‍රී ලංකාවේ අප සියලු දෙනාටම ඉතා දරුණු ලෙස බලපානුද නොඅනුමානය.

අප රටේ කෘෂිකර්ම අංශය නගා සිටුවීමට රටක් සහ ජාතියක් වශයෙන් අපට අවශ්‍ය නම් අප කළ යුතු ක්‍රියාවලි රාශියක් ඇත. ඒවායින් විශේෂ ක්‍රියාවලියක් වන්නේ වැව් ප්‍රතිසංස්කරණය හා පුනුරුත්තාපනය ය. එසේ කිරිම අත්‍යවශ්‍ය වැඩ සටහනක් යයි සළකමින්, එය වහාම ඉටු කිරීම වැදගත් බවත් අප දැන්වත් වටහා ගත යුතුය.

# 3.6

# පිටි සහනාධාරයට වැයකරන මුදල වැව් නඩත්තුවට වෙන් කරමු

ඈත අතිතයේ සිටම ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය හැඩ ගැසී තිබුණේ ජලය නිසි වේලාවට සහ ප්‍රමාණයට ගොවීන්ට ලබාදීමේ පදනම මතය. අතීත රජවරුන්ගේ සාර්ථකත්වය හෝ ධර්මිෂ්ටභාවය ජනතාව තක්සේරු කළේ නිසි වේලාවට වැසි ලැබීම හරහාය. ඒ හේතුව නිසා ජලය, වැසි, වැව්, ඇළ දොළ යනාදිය රටේ දේශපාලනයට සම්පව පැවතුණි. එහෙත් අවාසනාවකට මෙන් ශ්‍රී ලංකාව අධිරාජ්‍ය වාදීන්ට යටත් වුවායින් පසුව "වැවයි දාගැබයි: ගමයි, පන්සලයි" යන උදාර සංකල්පය ක්‍රමයෙන් පරිහානියට පත්විය. එපමණක් නොව, 1948 දී අප නිදහස ලැබුවායින් පසුවද පළමු දශකය තුළ හැරෙන්නට, ඉතිරි වර්ෂ වලදී අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ පැවති කෘෂි ප්‍රතිපත්තියට බොහෝ සෙයින් සමාන ප්‍රතිපත්තියක් අප නායකයින්ද අනුගමනය කිරිම කනගාටුවට හේතුවකි. ඔවුහු, ලෝක බැංකුවේ සහ අනිකුත් ණය දෙන රටවල "සාපේක්ෂ වාසිය" යන මන්ත්‍රය වැළඳ ගනිමින්, ශ්‍රී ලංකාවේ ආහාර ආරක්ෂාව (Food Security) සහ බහුතර ජනතාව නොතකා, වසර 40 ක් තිස්සේම කෘෂිකර්මයට කුඩම්මාගේ සැළකිල්ල ලබා දුන්හ.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් අඩකට වඩා කෘෂිකර්මයෙහි නිරත වෙති. කෘෂිකර්මය සාර්ථකව කරගැනීම සඳහා අත්‍යාවශ්‍ය වන්නේ ජලයයි. නිසි වේලාවට, ප්‍රමාණයට සහ ආකාරයට ජලය ලැබෙන්නේ නම්, කෘෂිකර්මය සාර්ථකව කර ගැනීමට හැකි වන්නේය. තවද, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයේ යෙදී සිටින පුද්ගලයන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවුවහොත් සමස්තයක් වශයෙන් රටේ බහුතරයක ජීවන තත්ත්වයද බෙහෙවින් ඉහළ

2004.09.05 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

යනු ඇත. එසේ නම්, ජලය ගොවීන්ට කාර්යක්ෂමව ලබාදීම අප සමාජයේ ඉදිරි අනාගතයට සහ ආර්ථිකයේ ස්ථාවර වර්ධනයට වැදගත් සාධකයක් වන්නේය. 2001 වසරේ ඇතිවූ දරුණු නියං කාලයේ සිටම මා මෙම අවශ්‍යතාවය පිළිබඳව පුවත්පත් සහ විද්‍යුත් මාධ්‍ය තුළින් පුලුල් සංවාදයක් ආරම්භ කළෙමි. තවද, මෙම අවශ්‍යතාවය සපුරාලීමට තුඩු දෙන එක් තිරසාර ප්‍රතිචාරයක් ලෙස "වැව් ප්‍රතිසංස්කරණය" මා පෙන්වා දුනිමි. එහෙත්, අප රටේ අවාසනාවට එම යෝජනාව ඒ කාලයේදීම ක්‍රියාත්මක නොවුණි. ප්‍රමාද වුවත්, අද එවැනි වැව් ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙතක් රජය විසින් දියත් කිරීම ගැන මා අතිශයෙන් සංතෝෂ වන අතර, එසේ කරද්දී අප සිත් යොමු කළ යුතු වැදගත් කරුණු කිපයක් ඇති බවද මතක් කිරීමට මා කැමතිය.

පළමුව, මෙම වැඩපිළිවෙතට සියලුම දේශපාලන පක්ෂවල සහයෝගය ලබාගැනීම අත්‍යාවශ්‍යය. එවැනි සහයෝගයක් ලබාගතහොත් රජයන් වෙනස් වුවද, ඉදිරි දශකය තුළ මෙම වැඩපිළිවෙත නොකඩවා කරගෙන යාමට හැකි වන්නේය. අප රටේ වැව් 30,000 කට අධික සංඛ්‍යාවක් ඇත. මෙම වැඩපිළිවෙත කෙතරම් කාර්යක්ෂම ලෙස කළත්, වැව් සියල්ලම ප්‍රතිසංස්කරණය කිරීමට නම්, අවම වශයෙන් දශකයක පමණ කාලයක්වත් අවශ්‍ය වන්නේය. ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක්ද, ජනතා සහයෝගයක්ද, ප්‍රතිසංස්කරණයෙන් පසු ඒවා දිගින් දිගටම නඩත්තු කිරීමේ වැඩපිළිවෙතක්ද, අවශ්‍යය. එවැනි වැඩපිළිවෙතක් නියත වශයෙන්ම දියත් වේ යයි විශ්වාසයක් තබාගැනීමට නම්, ප්‍රධාන දේශපාලන පක්ෂ මෙම වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තමන්ගේම සහ ජාතික එකක් ලෙස සැළකීම ඉතා වැදගත්ය.

දෙවනුව, එක් එක් වැවක ප්‍රතිසංස්කරණය ආරම්භ කරන අවස්ථාවට වඩා උත්කර්ෂවත් අන්දමින් රට වැසියන්ට විදහා දැක්විය යුත්තේ ප්‍රතිසංස්කරණයෙන් පසුව අදාල වැව ජනතා අයිතියට පැවරීමේ අවස්ථාවය.

ප්‍රේමදාස ජනාධිපතිතුමා "ඇගලුම් කර්මාන්ත 200" ව්‍යාපෘතිය දියත් කරද්දී ජනතාවට නිතරම පාහේ පෙන්වා දුන්නේ ඒවා නිමකර විවෘත කිරීමේ අවස්ථාවන්ය. එලෙස ව්‍යාපෘතියක්

සාර්ථකව නිමකිරීම තුළින් එයට සෘජුවම හා වක්‍රාකාරව සම්බන්ධ සියල්ලන්ටම පාහේ විශාල තෘප්තියක්ද, ධෛර්යයක්ද, ඉදිරි ගමනට ශක්තියක්ද ලැබෙන්නේය.

තෙවනුව, වැව් ප්‍රතිසංස්කරණය කිරීමෙන් රටට අත්වෙන සමාජ සහ ආර්ථික වාසින් පිළිබඳව නිරන්තර ප්‍රචාරයක් තිබිය යුතුය. "ඇගලුම් කර්මාන්ත 200" වැඩපිළිවෙත දියත් වන විට, ඒ තුළින් සමාජයට ලැබෙන යහපත් ප්‍රතිඵල පිළිබඳව දිනෙන් දිනම වැඩසටහන් ඉදිරිපත් විය. සමහරු එවැනි මාධ්‍ය වැඩසටහන් විවේචනය කළද, ඒවා හරහා කර්මාන්ත ගමට ගෙන යාමේ සංකල්පයේ වටිනාකමද, වාසිද මුලු ජනතාවටම පැහැදිලි වුණි. ඒ ආකාරයටම, වැව් ප්‍රතිසංස්කරණය හරහා දිළිඳු ගම්බද ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාමේ ප්‍රවණතාව ගැන මුලු ජනතාවටම අවබෝධයක් ලබා දීමෙන් මෙම නව වැඩපිළිවෙතෙහි ඇති සමාජීය සහ ආර්ථික වටිනාකම රට වැසියන්ට පෙන්වාදීම වැදගත්ය.

සිව්වනුව, මෙම ජාතික ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන යාම සඳහා ඉදිරියේදී අවශ්‍ය වන සම්පත් කලින්ම සුදානම් කරගත යුතුය. අවශ්‍ය සම්පත්වල හිරවීමක් නිසා මෙම ව්‍යාපෘතිය යම් හෙයකින් අඩාළ හෝ නතර වුවහොත්, එය නැවත දියත්කර ගැනීමට බොහෝ වෙහෙසක් දරන්නට සිදුවනු ඇත. ඒ නිසා, මෙම වැඩපිළිවෙත ගැන ලෝක බැංකුව සහ අනිකුත් ණය හා ආධාර දෙන ආයතන සමග සාකච්ඡා කොට, එම ආයතනවල එකඟත්වය ලබා ගැනීමෙන් ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අවශ්‍ය සම්පත් සහතික කරගත යුතුය.

පස්වනුව, රටේ ඉහළ පෙළේ පෞද්ගලික සමාගම් සහ බැංකු මෙම ව්‍යපෘතියට සෘජුවම සම්බන්ධ කර ගත යුතුය. වැව් ප්‍රතිසංස්කරණයේ වාසි සහ ඵලයන් අයත් වන්නේ ගමේ ගොවි ජනතාවට පමණක් නොවේ. ව්‍යාපෘතියේ සාර්ථකත්වය තුළින් ගැමි ජනතාවගේ ආර්ථික ශක්තිය වර්ධනය වනවාත් සමගම ඉහළ පෙළේ සමාගම්වලට සහ බැංකුවලට ආර්ථික වාසින් රාශියක් භුක්ති විඳීමට හැකිවන්නේය. එවැනි අනාගත ආර්ථික ප්‍රතිඵල සලකා බලන විට ඔවුන්ගෙන් අපේක්ෂිත දායකත්වය

සහනාධාරයක් නොව ආයෝජනයක් බව පැහැදිලි කරමින්, ඒ අයගේ සහයෝගය තහවුරු කර ගත හැක.

හයවනුව, වැව් ප්‍රතිසංස්කරණය අවසන් වූ පසුව ඒවා දිගින් දිගටම උසස් තත්ත්වයකම නඩත්තු කිරීමේ ක්‍රියාවලියක් දැන් සිටම ආරම්භ කළ යුතුය. මේ සඳහා එකි වැව් පිහිටි පළාත්වල පළාත් පාලන ආයතන හරහා එම නඩත්තු සේවය දියත් කිරීම වැදගත්ය. වැවක නඩත්තුව සඳහා, සෑම වසරක් වෙනුවෙන් රුපියල් ලක්ෂයක පමණ සම්පත් රජය වෙන් කරත් නම්, සමස්ත ප්‍රාදේශීය සභා සහ නගරසභා වලට ඒ සඳහා වෙන්වන මුදල රුපියල් මිලියන 3,000 ක් පමණය. එම මුදලට සමාන මුදලක් අප වසරකට තිරිඟු පිටි සහනාධාරයක් ලෙස විදේශ සමාගමට ගෙවමු. එසේ නම්, අපගේ කෘෂි ආර්ථිකය වර්ධනය කර ගැනීම සඳහා එවැනි මුදලක් අපගේ පළාත් පාලන ආයතන හරහා අපට වෙන්කර දීමට නොහැකිද? සමහර විට, ඉහළ මට්ටමක පවතින වැව් නිසා, ජලය අඛණ්ඩව ලැබීම තුළින් ගොවි ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ යනවාත් සමගම, දැනට පවතින සමෘද්ධි ගෙවීම්ද වැඩි කළක් යන්නට මත්තෙන් සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුවන්නට ඉඩ ඇත. ඒ ඉතිරි කිරීම තුළින්ද, මෙම යෝජිත වැව් නඩත්තු ක්‍රියාවලියට අවශ්‍ය වන මුදල් අනාගතයේදී නොදැනුවත්වම පාහේ උතනු නොඅනුමානය.

# 3.7

## සාගර ආර්ථිකයට යොමු වෙමු

එක්සත් ජාතීන්ගේ සමුද්‍ර කටයුතු සහ සාගර නීතිය සම්මුතිය වෙරළාසන්න රාජ්‍යයන්ට වැදගත් වන්නේ ඇයි? ඒ ප්‍රශ්නය නිසි පරිදි සලකා බැලීම පිණිස මේ සම්මුතියේ මූලික ලක්ෂණවලින් කිහිපයක් පරීක්ෂා කර බලමු. මුහුදු පතුළට ආසන්නයේ සහ යටි පසේ ඇති සියලුම ජීවී සහ අජීවී ස්වභාවික සම්පත් සම්බන්ධයෙන් සහ කලාප ගවේෂණය කිරීම සහ එහි සම්පත් නෙළා ගැනීම සඳහා යම් ආර්ථික ක්‍රියාකාරීත්වයන් හි නියැළීම සම්බන්ධයෙන් නාවික සැතපුම් 200 ක අනන්‍ය ආර්ථික කලාපයක ස්වෛරී හිමිකම් මේ සම්මුතියෙන් එකී වෙරළාසන්න රාජ්‍යයන්ට පැවරේ. එසේම, සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ සහ ඒ ප්‍රදේශය තුළ පාරිසරික ආරක්ෂක කටයුතු පිළිබඳව අධිකරණ බලය පාවිච්චි කිරීම ද වෙරළාසන්න රාජ්‍යයන්ට ඒ සම්මුතියෙන් බලය පැවරේ. ඒ හැරුණු විට, රටේ භූමි ස්කන්ධයේ ම කොටසක් වන සාපේක්ෂ වශයෙන් නොගැඹුරු මුහුදු පතුළ වන 'මහද්වීපික තටකය' (Continental Shelf) ප්‍රයෝජන ගැනීමේ පූර්ණ අයිතිය ද වෙරළාසන්න රාජ්‍යයන්ට ලැබේ.

කුඩා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෙයින් අදහස් වන්නේ කුමක්ද? ඉතා සරලව කිවහොත් ඉන් අදහස් වන්නේ වර්ග කිලෝමීටර 65,525 ක් පමණ භූමි ප්‍රමාණයක් ඇති ශ්‍රී ලංකාවට දැන් ඉන්දියානු සාගරය තුළ දළ වශයෙන් වර්ග කිලෝමීටර 517,400 ක අනන්‍ය ආර්ථික කලාපයක් ද තිබෙන බව ය. එය රටේ විශාලත්වය මෙන් හත් ගුණයක් විශාල ප්‍රදේශයකි. මේ කලාපය තුළ සමුද්‍ර ජල තිරයේත් සාගර පතුළේත්, යටි පසේත් ඇති සියලු ම ආර්ථික සම්පත් පිළිබඳ සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකාව සතු වේ. ඒ හැරුණු විට, අවට මුහුදු ප්‍රදේශය තුළට සහ ඒවා

---

2003.09.07 දින ලංකාදීප පුවත්පතෙහි 'දෛවෙත ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

යටින් විහිදෙන, දිවයිනේ මහද්වීපික භූමි ස්කන්ධයෙන් ඔබ්බට ස්වාභාවිකව විහිදෙන භූමි ප්‍රමාණය ඇතුළත් වන මුහුදු පතුළේ සහ යටි පසේ සම්පත් පිළිබඳ පූර්ණ අයිතියද ශ්‍රී ලංකාවට ලැබේ. 1976 අංක 22 දරණ සමුද්‍ර කලාපීය නීතියේ නිර්වචනය වන පරිදි, මේ භූමි ප්‍රදේශය හැඳින්වෙන්නේ උප සමුද්‍ර දේශය (sub-marine territory) වශයෙනි. උප සමුද්‍ර දේශයේ බාහිර සීමාව ස්ථාපනය කිරීමේ දී භාවිතා කළ යුතු විශේෂ ක්‍රමය සම්බන්ධයෙන්, සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 3 වැනි සම්මන්ත්‍රණයේ දී සම්මත කරගනු ලැබූ විශේෂ අවබෝධාත්මක ප්‍රකාශනයක් තුළින් දැන් ඉහත කී සම්මුතියෙන් පැවරෙන සාගර ප්‍රමාණයටත් වඩා විශාල මහාද්වීපික ප්‍රදේශයක 'අයිතිය' ශ්‍රී ලංකාවට ලැබුණි. මේ ප්‍රකාශනය අනුව දළ වශයෙන් වර්ග කිලෝමීටර 1,400,000 ක (රටේ ප්‍රමාණය මෙන් 21 ගුණයක් පමණ විශාල ප්‍රදේශයක්) සමස්ත මහද්වීපික ආන්තික ප්‍රදේශයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතු අයිතිය ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා ලදී. ඊට හේතුව දිවයිනේ ගිනිකොණ දිග ප්‍රදේශයට වන්නට ශ්‍රී ලංකාවේ මහාද්වීපික පර්යන්තය (සීමාව) වෙරළේ සිට දළ වශයෙන් නාවික සැතපුම් 700 ක් දක්වා ව්‍යාප්ත වීමය. ඒ නිසා, අප මෙතෙක් සිතූ අන්දමට ශ්‍රී ලංකාව එතරම් කුඩා රටක් නොවේ.

මෙලෙස ශ්‍රී ලංකාවේ පාලනය යටතට පැවරී ඇති අනන්‍ය ආර්ථික කලාපයේ ඇති සම්පත් මොනවා ද? ඒවායින් කුමක් කළ හැකිද? ඉහත පැහැදිලි කරනු ලැබූ පරිදි ඒ වටිනා සම්පත්වල අනාගත ප්‍රයෝජනය ඇස්තමේන්තු කිරීම පිණිස අප ඉතා ඉක්මණින්ම ගැඹුරු අධ්‍යයනයක් කළ යුතුව ඇත. දැනට ලබාගත හැකි තොරතුරු අනුව, ශ්‍රී ලංකාවේ බල ප්‍රදේශය තුළ ඇති මුහුදු ප්‍රදේශයේ බෙහෙවින් ඉහළ මට්ටමකින් සජීවී සම්පත් ඒකරාශි වී ඇත. නාවික සැතපුම් 200 සීමාව ඇතුළත පිහිටි මහද්වීපික තටකය ලෝක සාමාන්‍යයට වඩා තරමක් පටු වුවද, එය පමණක් ගත් විට බෙහෙවින් ඵලදායි සම්පත්වලින් ගහන වන අතර වාර්ෂිකව මාලු මෙට්‍රික් ටොන් දෙලක්ෂයකටත් වැඩි ප්‍රමාණයක් අඛණ්ඩව ලබා දිය හැකි තරම්ය.

ශ්‍රී ලංකාවේ වෙළඳ පොළකට යන්නන් බොහෝ දෙනෙකු පළමුවෙන්

මිල දී ගන්නා එක් ආහාරයක් වන්නේ 'ටින්වල අසුරන ලද' මාලුය. ටින් මාලු ශ්‍රී ලංකාවේ කෙතරම් ජනප්‍රිය වී තිබේ ද කිවහොත්, අප වසරකට පරිභෝජනය කරන ටින් මාලු ප්‍රමාණය ටොන් 50,000 කට වැඩිය. එහෙත්, අප මෙසේ පරිභෝජනය කරන මුලු ටින් මාලු තොගයම පාහේ අප පිට රටවලින් ගෙනෙන ඒවාය. ඇත්ත වශයෙන් ම 2000 වසරේදී මාලු ආනයනය සඳහා අප වැය කළ මුදල රුපියල් බිලියන 5 ද ඉක්මවිය. පැහැදිලිව ම මේ කරුණ සැලකිය යුත්තේ රටේ සමස්ත ආර්ථික හා කාර්මික උපාය මාර්ගයේ විශාල බේදවාචකයක් වශයෙනි. මේ අඩුපාඩුව වහාම නිවැරදි කිරීමට නම් ධීවර වරායවලට හෝ නැංගුරම් පොලවලට ආසන්නයේ වෙරළ තීරය දිගේ සුදුසු ස්ථානවල මාලු ටින් කිරීමේ මහා පරිමාණ කර්මාන්ත ශාලා හැකි ඉක්මනින් පිහිටුවීමට පියවර ගත යුතු බව පැහැදිලිය. එබඳු වරායවල් හෝ නැංගුරම් පොලවල් දැනටමත් තිබේ. පළපුරුදු සහ දක්ෂ විදේශීය හවුල්කරුවන්ගේ ශිල්පීය විශේෂඥතාව සහ ප්‍රාග්ධන දායකත්වය ඇතිව හොඳින් විවිධාංගකරණය වූ අපගේ ම වෙළෙඳ සමාගම්වලට මේ ටින් කිරීමේ කම්හල් ආරම්භයේ දී පිහිටුවිය හැකිය. මේ මාලු ටින් කිරීමේ අලුත් කම්හල්වලට අවශ්‍ය මාලු සැපයීම සඳහා ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තයක් ආරම්භ කළ යුතුය. ඒ සඳහා මහා පරිමාණ ව්‍යාපාර ද සම්බන්ධ කර ගත යුතු අතර ඒවා පිහිටුවීම දිරි ගැන්වීමට කටයුතු කළ යුතුය. ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්ත ක්ෂේත්‍රය තුළට විවිධාංගකරණය වීමට මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ ජාතික සමාගම් වල පෙළඹවීමෙන් සහ ඔවුන්ගේ සහ ඔවුන්ගේ විදේශ හවුල් ව්‍යාපාරික පාර්ශවයන් මාර්ගයෙන් අවශ්‍ය විශාල ප්‍රමාණයේ අරමුදල් ආයෝජනය කර ගත හැකි වනු ඇත. එසේ කළ හොත් සැළකිය යුතු මට්ටමකට ළගා වීමට මෙම ධීවර ව්‍යාපාරයට හැකි වීම පිළිබඳ සැකයක් නැත. මේ ද්විත්ව සංවර්ධනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් අපගේ අනන්‍ය ආර්ථික කලාපය තුළ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය සම්බන්ධ පහසුකම් හා යටිතල ව්‍යුහ සංවර්ධනය ඇති වන අතරම මේ නව අවශ්‍යතා සපුරාලිය හැකි වන පරිදි අපගේම ධීවරයන්ට ද පුහුණුව ලබා දී ඔවුන්ගේ තත්ත්වය උසස් කළ හැකි වන්නේය.

# 3.8

## අප ධීවරයන් ශක්තිමත් කළ යුතුයි

අප පසුගිය සතියේ විමසුමට ලක්කල 'සාගර ආර්ථිකයට යොමු වෙමු' යන මාතෘකාව ඔස්සේ ශ්‍රී ලංකාවේ ඇති මුහුදු බල ප්‍රදේශය තුළ ඇති සම්පත් නිසි පරිදි කළමණාකරණය කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කර දුන්නෙමු. එම ශක්තිය හරහා අප රටේ සමස්ත ආර්ථික හා කාර්මික අංශවලට ඇතිවිය හැකි ප්‍රබෝධය ගැන මෙන්ම එම කාර්යභාර්ය ඉටු කිරීමේ වැදගත්කම ගැන අප සාකච්ඡා කළෙමු. මෙසේ ඉෂ්ට විය යුතු කාර්යය ගැන සාකච්ඡා කරද්දී අපට වැටහෙන්නේ, එය සාර්ථක කර ගැනීමට නම්, අප රටේ ධීවර කර්මාන්තය සහ අප ධීවරයින් අලුත්ම අදියරයකට ප්‍රවේශ කළ යුතු බවය.

එසේ කිරීමට නම් සමුපාකාර ණය යෝජනා ක්‍රම මගින් හෝ බදු පහසුකම් මගින් හෝ ව්‍යාපෘති ආධාර යෝජනා ක්‍රම යටතේ බෙදා දෙනු ලබන අරමුදල් මගින් හෝ අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සහ ප්‍රාග්ධන අවශ්‍යතා ඔවුන්ට සැපයිය යුතුය. එවිට අප කලින් යෝජනා කළ මාලු ටින් කිරීමේ කම්හල්වලට මාලු සැපයීමෙන් සාගරයේ සම්පත්වලින් බිහිවෙන නව ව්‍යාපෘතිවල ප්‍රතිලාභ සහ වාසි ලැබීමටද, මෙම නව සමාගම්වල විධිමත් හා හොඳ රැකියා ලබා ගැනීමටද අපේ ධීවරයින්ට බොහෝ අවස්ථා ඇතිවේ.

'නව' ධීවර කර්මාන්තය සඳහා මිනිස් බල සැපයීම සඳහා විශේෂ අධ්‍යයන හා පුහුණු ආයතන පිහිටුවීම අද යුගයේ අවශ්‍යතාවයකි. මේ සම්බන්ධයෙන්, මෑතක දී තංගල්ලේ සාගර විශ්ව විද්‍යාලයක් පිහිටුවීම නිවැරදි පියවරක් වශයෙන් පැසසුමට

---

**2003.09.14** දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙත ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙලෙහි පළවූ ලිපියකි.

ලක් කළ යුතුය. එහෙත් අපේක්ෂිත පරිදි ධීවර කර්මාන්තයේ 'නව' සංවර්ධනයට උපකාරී වීමට නම් එබඳු ආයතන තවත් රාශියක් ම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ අප තුළ ඇති එක්තරා ආකල්පයක් නම් අපගේ ධීවරයින් නිතරම 'දුප්පත්' විය යුතුය යන්නය. අන් රටවල් හා සසඳන කල අපගේ ධීවරයන් ඉතාමත් දිළිඳු මට්ටමක පසුවෙති. අපේ ධීවර ජනතාවට ධීවර කර්මාන්තයේ නවතම තාක්ෂණය හා නූතන ක්‍රම පිළිබඳ විධිමත් පුහුණුවක් සහ දැනුමක් ලබා දීමෙන්ද, ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා හොඳ වෙළෙඳ පොළක් සැලසීමෙන්ද, මේ 'දුප්පත්' ධීවරයා පිළිබඳ සංකල්පය අතුරුදහන් කළ හැක. එපමණක් නොව, ධීවර කර්මාන්තය පිළිබඳව ශ්‍රී ලංකාවේ දැනට තිබෙන ආකල්පය ද සදහටම වෙනස් වී යාමට ද එබඳු ක්‍රියා මාර්ගයක් හේතු විය හැකිය.

ධීවර අංශය රටේ ආර්ථිකයේ වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. දළ දේශීය නිෂ්පාදිතයෙන් 3% කට පමණ දායක වන එය, ධීවරයින් සහ මසුන් ඇති කරන්නන් 1,50,000 ක් වැඩි දෙනෙකුටද, බෝට්ටු ඉදි කිරීම, දැල් සහ අනෙකුත් ආම්පන්න නිෂ්පාදනය, වෙළෙඳාම සහ රාජ්‍ය අංශයේ නියෝජිතායතන වැනි ආශ්‍රිත ක්ෂේත්‍රයන් හි තවත් 1,00,000 කට ද සෘජු රැකියා අවස්ථා සලසයි. වෙරළබඩ ප්‍රජාවන්හි පුද්ගලයින් දශ ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් සිය ජීවනෝපාය සඳහා ධීවර කර්මාන්තය මත යැපෙතැයිද ඇස්තමේන්තු කර ඇත.

පසුගිය දශක කිහිපය තුල දී වර්ධනය වී බෙහෙවින් සාර්ථක වූ රටට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් උපයා දීමට සාම්ප්‍රදායික නොවන නව කර්මාන්ත කිහිපයකට හැකි විය. මෙබඳු කර්මාන්ත කිහිපයක් ලෙස සංචාරක ව්‍යාපාරය, ඇඟලුම් නිෂ්පාදනය සහ පුහුණු ශ්‍රමය 'අපනයනය' කිරීම හඳුන්වා දිය හැකිය. ආරම්භක අවස්ථාවේ සිට පරිණත බවට පත් වීමට මේ ව්‍යාපාර වලට ගත වූයේ වසර 5-10 තරම් සාපේක්ෂ වශයෙන් කෙටි කාල සීමාවන්ය. ඒ ආකාරයට ම ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ සහ මාලු ටින් කිරීමේ 'නව' සහ 'නැවත ශක්තිමත් වූ' කර්මාන්තයේ වර්ධන රටාව ද ඉහත දැක්වූ සාර්ථක උදාහරණවලට සමාන

වනු ඇතැයි මගේ විශ්වාසයයි. මැද කාලයේ සිට දිගු කාලීනව එනම් අවුරුදු 15-20 පමණ කාලයක් තුළ දී අස්වනු නෙලීමේ සහ ටින් කිරීමේ අංගවලින් සමන්විත ශ්‍රී ලංකාවේ ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය අප රටේ විශාලතම විදේශ විනිමය උපයන සහ රැකියා සපයන කර්මාන්තවලින් විශාලම එකක් බවට පත් වනු ඇති බවද මගේ විශ්වාසයය.

ඒ සමගම, කෙටි කාලීන ව, එනම් පළමු අවුරුදු 7-10 ඇතුලත, මේ නව ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තයට උපකාරී වීමට දේශීය යටිතල ව්‍යුහය සහ ධීවර ට්‍රෝලර් යාත්‍රා සමුහය සැබැවින් ම ප්‍රමාණවත් නොවනු ඇත. එබැවින් ඒ අතුරු කාල සීමාවේදී අපගේ අයිතිය යටතේ ඇති යම් නිශ්චිත සාගර ප්‍රදේශ තුළ මසුන් ඇල්ලීමේ අයිතිය ගාස්තුවක් අය කරගෙන කීර්තිමත් මහා පරිමාණ ධීවර සමාගම්වලට පැවරීමේ කොන්දේසි සහිත බදු ගිවිසුම්වලට එළඹීමට රජය කටයුතු කිරීම වැදගත් වනු ඇත. එසේ කිරීමේ දී, එක් කොන්දේසියක් වශයෙන් එලෙස අල්ලා ගනු ලබන මුලු මාළු ප්‍රමාණය ම අප රටේ වෙරළවලට ගෙනැවිත් ඒ සඳහා පිහිටුවා ඇති කම්හල්වල සකස් කොට අපනයනය කළ යුතුය යන කොන්දේසිය පැනවිය හැකිය. මේ සම්බන්ධයෙන් අමතර කොන්දේසිද, එනම්, එබදු ධීවර යාත්‍රා වල කාර්ය මණ්ඩලයට අවම වශයෙන් ශ්‍රී ලාංකිකයින් 70% ක් වත් ඇතුලත් විය යුතුය, සහ/හෝ කර්මාන්තශාලාව, ශ්‍රී ලාංකිකයින් 90% ක් පමණවත් සේවයේ යොදා ගත යුතුය, වැනි කොන්දේසි ද පැනවීමෙන් අප රටේ තරුණයන්ට හොඳ රැකියා අවස්ථා ද උදා කර ගත හැක.

බදු දීමෙන් ලැබෙන මුදල් උපයෝගී කරගෙන හෙලිකොප්ටර්, සැහැල්ලු ගුවන් යානා සහ අධිවේගී නිරීක්ෂණ බෝට්ටු ආදියෙන් සමන්විත කාර්යක්ෂම හා ඵලදායි වෙරළාරක්ෂක සේවයක් ඇති කර පවත්වාගෙන යා හැකි වනු ඇති අතර නීති විරෝධීව මසුන් ඇල්ලීම හොරෙන් මසුන් ඇල්ලීම, හෝ ඛනිජ ද්‍රව්‍ය ලබා ගැනීම වැනි කටයුතු වැළැක්වීම සඳහා ද අපගේ අනන්‍ය ආර්ථික කලාපය තුළ නිරීක්ෂණ චාරිකා කිරීමට ද ඉන් හැකියාවක් ලැබෙනු ඇත.

# 4

## සිව්වන කොටස

# විදේශ ආධාර සහ ණය

# 4.1

## අප රට නැවත පුබුදුකරවීමට නම්..

නොබෝ දිනකින් පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකාවට ආධාර දෙන සම්මේලනයේ දී, ඉතා විශාල මුදල් කන්දරාවක් අප රටට ලැබෙන බව අපට අසන්නට ලැබුණි. මෙම ආධාර සහ ණය අපට ලැබෙන්නේ සාමය උදා වීමෙන් පසු ශ්‍රී ලංකාව කෙරෙහි ජාත්‍යන්තර ප්‍රජාවේ ඇති මහත් විශ්වාසය සහ ආර්ථිකයේ ඇති සුබදායක ලකුණු නිසා බවද පැවසුණි. මෙවැනි පුවත් අසද්දී අපි සියලු දෙනාම පාහේ සන්තෝෂයට පත්වෙමු. එහෙත්, තත්ත්වය සැබැවින්ම එතරම් සතුටුදායකද?

මෑතකදී මා යොවුන් දේශපාලනඥයන්ගේ සම්මේලනයකට දේශකයකු ලෙස සහභාගී වූ විට මෙම විදේශ ණය ආධාර ගැන තියුණු සාකච්ඡාවකට මැදිහත් වුණෙමි. එහිදී යොවුන් දේශපාලනඥයන් කිප දෙනෙකුම කියා සිටියේ සෑම වසරකම කියවෙන පරිදි මෙපමණ විශාල මුදලක් ශ්‍රී ලංකාවට ලැබෙන්නේ නම් මේ මුදල් කොතනට සහ කා හරහා යෙදෙන්නේ ද යන්න ඔවුන්ට රහසක් බවයි. ඔවුන් එක හෙළා කියා සිටියේ ඔවුන්ගේ ගම් සහ ප්‍රදේශවලට නම් මෙවන් මුදල්වලින් කිසිම කොටසක් සැළකිය යුතු අන්දමකට ලැබී නැති බවයි. එසේ නම්, එම මුදල් කවුරු කොතැනට යොදවන්නේද යන්න ඔවුන්ට ප්‍රහේලිකාවක් යැයි ඔවුහු තවදුරටත් කීහ. රටකට ලැබෙනවා යැයි කියන මෙම ආධාර සහ ණය මුදල් ඇත්ත වශයෙන්ම රටේ වැසියන්ට දැනෙන, පෙනෙන, භුක්ති විඳිය හැකි, අන්දමකට නොලැබෙන්නේ නම් එයින් ඇති ඵලය කුමක්දැයි කෙනෙකුට සාධාරණව ප්‍රශ්න කළ හැක. සත්‍ය වශයෙන්ම සිදු වන්නේ කුමක්ද?

මගේ අත්දැකීම් අනුව පෙර කී යොවුන් දේශපාලනඥයන්ගේ ප්‍රශ්න සහ හැගීම්වල සාධාරණ අංග කිපයක් ඇත. පළමුව,

---

2003.04.27 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

සෑම වසරකම ලැබෙන්නට නියමිතව ඇති ආධාර සහ ණය මුදලින් අප ප්‍රායෝගිකව රටට ලබාගන්නේද භුක්ති විඳින්නේද ඉතා කුඩා කොටසක් පමණි. මෙම කරුණ හරියාකාරව තේරුම් ගැනීමට සරළ උදාහරණයක් සලකා බලමු. යම් පුද්ගලයෙකු නිවසක් තැනීමට ණයක් ලබා ගන්නා විට එම ණය ලබා ගැනීම සඳහා ඔහු බැංකුව සමග කොන්දේසි මාලාවකට එකඟ වනු ඇත. එම කොන්දේසි වලින් අනිවාර්යය එකක් වනුයේ මුදල් ලබාදෙන අදියරයන් නොහොත් පියවරයන්ය. බැංකුව මුදල් ලබා දෙන්නේ එම නිශ්චිත පියවර හරියාකාරව ණය ලබා ගන්නා විසින් ඉෂ්ට කළ විටය. මෙම උදාහරණයේ අදියර වලින් සමහරක් පහත සඳහන් ඒවා විය හැක. නිවසේ අවසරලත් සැළසුම ඉදිරිපත් කළ විට ණය මුදලින් 10%ක්ද, අත්තිවාරම සම්පූර්ණ කළවිට 20%ක්ද, බිත්ති බැඳීමෙන් පසු තවත් 25%ක් වැනි ආකාරයට එම අදියරයන් සකස් වී තිබිය හැක. එවැනි අන්දමට රටක් ණය ලබා ගන්නා විට ද ණය හෝ ආධාර ලැබෙන්නේ රජය යම් අදියරයන් හෝ කාර්යයන් ඉෂ්ට කරන විටය. එහෙත් අවාසනාවකට මෙන් බොහෝවිට අප රටේ සිදුවන්නේ එවැනි අදියරයන් හෝ කාර්යයන් සුදුසු අන්දමට සහ කාර්යක්ෂමව ඉෂ්ට නොවන නිසා එම ණය හෝ ආධාර ලබාගැනීමට ඇති සුදුසුකම අපිට අහිමි වීමයි. මෙම හේතුව නිසා සමස්තයක් වශයෙන් අප රටට ලබාගැනීමට නියමිත මුලු ආධාර සහ ණය ප්‍රමාණයෙන් අප ඇත්ත වශයෙන්ම ලබා ගන්නේ 14% පමණ අල්ප ප්‍රතිශතයක් පමණකි.

දෙවනුව, බොහෝ ණය හෝ ආධාර දෙන ආයතන තම මුදල් රටකට ලබාදීමට පෙර විදේශ හෝ ජාත්‍යන්තර විශේෂඥයන් හරහා එම රට උපදෙස් ලබා ගත යුතු යැයි කොන්දේසියක් දමති. එම කොන්දේසිය හරහා විදේශ විශේෂඥයින් රාශියක් ණය ලබා ගන්නා රටට පැමිණ බොහෝවිට එම රටේම දේශිය විශේෂඥයින්ගෙන්ම අදහස් රාශියක් ලබා ගෙන ඒවා ඉතා ක්‍රමවත්ව සහ දක්ෂ ලෙස වාර්තාවකට අඩංගු කරති. මේ සඳහා ඔවුහු මුලු ණය හෝ ආධාර මුදලින් සැළකිය යුතු කොටසක් නැවත වරක් එම රට වලටම ලැබෙන්නට සලස්වති. සමහර අවස්ථා වලදී මෙම ප්‍රයත්නය හරහා යහපත් ප්‍රතිඵල ලැබුණද

සමස්ථයක් වශයෙන් ගෙවන මුදලට අදාල වන ප්‍රතිඵල නම් නොලැබෙනු ඇත.

තෙවනුව, බොහෝ රටවල් ණය හෝ ආධාර ලබා දෙනවිට එම මුදල් යොදවන ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා තම රටේ සමාගමක් හෝ කොන්ත්‍රාත්කරුවෙක් තෝරා ගත යුතු යැයි පවසති. එසේ කරන විට එම ව්‍යාපෘතිය වඩාත්ම යෝග්‍ය ලෙස නිම කළ හැකි සමාගම වෙනුවට එම ව්‍යාපෘතිය මුදල් ලබා දෙන රටෙහි කොන්ත්‍රාත්කැරුවන්ට ලබාදීමට සිදුවන්නේය. ඒ තත්ත්වය හරහාද රටකට ලබාගතහැකි වාසි තරමක් දුරට අඩුවිය හැක.

මෙවැනි බලපෑම් වලට ශ්‍රී ලංකාවටද මුහුණ දීමට සිදුවීම පුදුමයක් නොවේ. එසේ මුහුණ දීමට පහසු නොවේ. එහෙත් අඩු තරමින් ඉහත කී තත්ත්වයන් කෙරෙහි අප රටේ නායකයින් සහ පාලකයින් තමන්ගේ අවධානය යොමු කළ යුතු වන්නේය. විදේශ ණය සහ ආධාර මතුපිටින් බලනවිට රටට හිතකර ලෙස පෙනෙන්නට පුලුවන. එහෙත් ඒවා පරිහරණය කිරීමේදීත් හසුරුවීමේදීත් ලබාගැනීමේදීත් අභියෝග මාලාවක් මතුවනු ඇත. බොහෝ රටවල් අපට ණය සහ ආධාර ලබාදෙන්නේ අපට ඇති ආදරය නිසා හෝ අප රට වැසියන් කෙරෙහි ඇති ලැදියාව නිසා යැයි අප නොසිතිය යුතුය. විදේශ ණය සහ ආධාර වලට සම්බන්ධ වන පෙනෙන සහ නොපෙනෙන කොන්දේසි හොඳින් අවබෝධ කරගෙන එම ගැටලු සහ අභියෝග නිසි ලෙස නිරාකරණය කරගෙන ඉදිරියට යාම රජයක විශේෂ වගකීමකි. පෙනෙන තත්ත්වයට වඩා නොපෙනෙන තත්ත්වයට අපගේ සිත් යොමු කිරීමට දැන් කාලය එළඹී ඇත.

# 4.2

# ආධාර මුදල් කාර්යක්ෂමව හසුරුවීම යුගයේ අවශ්‍යතාවයයි

මෙවර ටොකියෝ නගරයේදී පැවතුණු ආධාර සමලුවෙන් ශ්‍රී ලංකාවට ඉතිහාසයේ මෙතෙක් නොලැබූ ප්‍රතිචාරයක් ලැබිණ. ඊළඟ වසර තුනේදී ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන හතරක පමණ අති විශාල මුදලක් රටට ගලා එන්නේ නම් එය රටේ ආර්ථිකය විශේෂ වශයෙන් පිබිදවීමට හේතු වනු ඇත. ඒ තුළින් අප රටේ දැවෙන ආර්ථික ප්‍රශ්න බොහෝ දුරට සමතයකට පත් කර ගැනීම හැකිවේ යයිද බොහෝ දෙනා දැන් විශ්වාස කරති. මෙවැනි වාතාවරණයක මෙම තත්ත්වය ගැන පුලුල් විග්‍රහයක් කිරීම කාලෝචිතය.

විදේශාධාර සම්බන්ධ ප්‍රශ්නය සලකා බැලීමේදී එය අංශ කිහිපයක් හරහා කළ හැක. එයින් පළමුවැන්න නම් එම ආධාර පාවිච්චි කිරීම සඳහා අපට ඇති ශක්තියයි. බොහෝවිට වර්ෂයක් වර්ෂයක් පාසා මෙරටට අප ලබා ගන්නා ණය සහ ආධාර වලින් අප පාවිච්චියට ගන්නේ 14% ක් පමණ ඉතා අල්ප ප්‍රතිශතයක් පමණි. ලබා ගන්නා මුදල් කඩිසරව හා ඵලදායිව වියදම් කිරීමට අවශ්‍ය වන ක්‍රියාකාරී පරිපාලන යන්ත්‍රයක් අද අප රටේ ක්‍රියාත්මක වන්නේ යයි අපිට කිසිසේත් කිව නොහැක. මෙම පාලන තන්ත්‍රය වඩාත් කාර්යක්ෂම කොට, වගකීමකින් මුදල් වැය කිරීමේ ශක්තියක් අප රටේ සෑම පාලන මට්ටමක් තුළම තහවුරු කර ගැනීම අත්‍යවශ්‍යය. එසේ නොකරන්නේ නම් අපට ලැබීමට නියමිත ණය සහ ආධාර වලින් විශාල ප්‍රමාණයක් පාවිච්චි නොවී, අවිච්ඡේද වනු ඇත.

අප ඊළඟට සලකා බැලිය යුතු අංගය නම් ආධාර මුදල් වලින් කෙරෙන ව්‍යාපෘති සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා සහ ගැමි

---

**2004.06.15 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

පරිසරයේ ඇති ආර්ථිකයට සෘජුව හෝ වක්‍රාකාරීව ක්‍රමවත් දියුණුවක් ඇති වන ලෙස පාවිච්චි වන්නේද යන්නයි. අද වන විට සාමයේ ප්‍රතිඵල (Peuce dividened) ශ්‍රී ලංකාවේ කටයුතු කරන ඉහළ මට්ටමේ සහ ජාත්‍යන්තර සමාගම් බොහොමයක් නෙළාගෙන ඇත. පසුගිය වර්ෂයේ මෙම සමාගම්වල ලාභ පෙර වර්ෂවලට වඩා සැලකිය යුතු කොටසකින් වර්ධනය වී ඇති බව වාර්තා වී ඇත. එහෙත් ශ්‍රී ලංකාව පුරාම ඇති විශේෂයෙන්ම ගම්බද කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයන් මෙම සාම ප්‍රයත්නයේ වාසි තවමත් භුක්ති විඳ ගැනීමට පොහොසත් වී නොමැත. එහෙයින්, මෙම අංශය ගැන විශේෂ සැලකිල්ලක් යෙදවීම රජයේද අන් සෑම වගකිව යුතු ක්ෂේත්‍රවල නිලධාරීන්ගේ ද අත්‍යාවශ්‍ය වගකීමක් වන්නේය.

අපගේ අවධානය යොමු විය යුතු ඊළඟ අංශය නම් අපගේ පාලන තන්ත්‍රවල ඇති කාර්යක්ෂමභාවයයි. ලෝක බැංකුව ද අනෙකුත් ණය සහ ආධාර දෙන සංවිධානද, ශ්‍රී ලංකාවේ විශේෂඥයින් පෙන්වා දී ඇති අන්දමට අප රටේ පාලන තන්ත්‍රයෙහි අඩුපාඩු සහ දුර්වලතා රාශියක් ඇත. මෙම අඩුපාඩු බොහෝ අවස්ථාවලදී නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය වන්නේ ආකල්ප වල වෙනසකි. (Attitudinal Change) බොහෝ දෙනා සිතන්නේ යම් පද්ධතියක් වෙනස් කිරීමට විශාල මුදලක් හෝ අනිකුත් බාහිර සම්පත් අවශ්‍ය බවයි. එහෙත් ඇත්ත වශයෙන්ම බොහෝ අවස්ථාවලදී අවශ්‍ය වනුයේ පරිකල්පනයන් සහ පද්ධතිය වෙනස් කිරීමට අවශ්‍ය වන පැහැදිලි චේතනාවක් පමණි. මෙම මෘදු වෙනස ඉතා ඉක්මණින් ඇති කර ගැනීමට අද අප රටේ පාලකයින් සහ නිලධාරීන් කටයුතු කළ යුතුය. මේ සඳහා ප්‍රතිඵල හරහා ඇතිවන කළමනාකරණ පද්ධතියක් දියත් කිරීම ඉතා යෝග්‍යය.

බොහෝ ආධාර ලබාදෙන රටවල් අත්‍යාවශ්‍යයි සලකන තවත් අංගයක් නම්, නාස්තිය මැඩ පවත්වා ගැනීමය. බොහෝ විට ණය සහ ආධාර හරහා ලැබෙන මුදල් විශේෂයෙන්ම ක්‍රම දෙකකින් නාස්ති වන බව විශ්ලේෂණ පෙන්වා දෙයි. එයින් පළමුවැන්න නම්, මුදල් වැය කිරීමේදී ඇතිවන සෘජු නාස්තිය, බොහෝ අවස්ථාවලදී ලැබෙන මුදල්වලින් සෑහෙන කොටසක්

මේ ආකාරයට නාස්ති වනු ඇත. දෙවනුව ආධාර හරහා ලැබෙන මුදල් අනවශ්‍ය ව්‍යාපෘතීන් සඳහා සමහර විට යෙදවීමද තවත් අනිකුත් කරුණු නාස්තිය ලෙස හැඳින්විය හැක. සමහර විට යම් කෙටි කාලසීමාවකදී මෙම මුදල් පාවිච්චි කළ යුතු වීම නිසා හදිසියෙන් සහ මනා අවබෝධයකින් තොරව ව්‍යාපෘතීන් තෝරා ගැනීමක් සිදුවේ. එවිට අත්‍යාවශ්‍ය ව්‍යාපෘතීන් වෙනුවට අනවශ්‍ය ව්‍යාපෘතීන් වලට මුදල් යෙදෙනු දක්නට ලැබේ. තවද තවත් සැලකිය යුතු ආධාර කොටසක් 'තාක්ෂණ සහාය' (Technical Assistance) යනුවෙන් හැඳින්වෙන ජාත්‍යන්තර උපදේශකවරුන්ගේ උපදෙස් සඳහා ගෙවීම්වලටද වැය වනු දක්නට ලැබේ. මෙම ද්විනාස්ති ක්‍රමවලින් යම් ප්‍රමාණයකට හෝ මිදෙමින් වඩාත් කාර්යක්ෂමව මුදල් පාවිච්චි වන ලෙස කටයුතු කිරීම රජයේ වගකීමකි.

ඊළඟ අත්‍යාවශ්‍ය අංගය වන්නේ අපේ පළාත් සභා පාලන තන්ත්‍රය සහ ක්‍රම තව දුරටත් දියුණු කිරීමයි. ලැබෙන ප්‍රතිපාදන සහ ආධාර මුදල් පළාත් සභා සහ පළාත් ආයතන තුළින් යම් තරමකින්වත් දියත් කිරීමට හැකි වන්නේ නම් එම ක්ෂේත්‍රවලින් සැපයෙන කාර්යභාරයේ යම් දියුණුවක් ඇති වනු දැකිය හැකිය. මෙලෙස මුදල් මෙම දේශපාලනික යන්ත්‍රය හරහා කාර්යක්ෂම ලෙස දියත් කිරීමට අපට හකි වුවහොත් එම පාලන තන්ත්‍රය සහ ක්ෂේත්‍ර කෙරෙහි ජනතා විශ්වාසයක් ගොඩනැගෙනු ඇත. අද පවතින ඉතා අහිතකර තත්ත්වය නම් පළාත් සභා සහ පළාත් පාලන දේශපාලන තන්ත්‍ර කෙරෙහි විශ්වාසය දිගින් දිගටම පිරිහී යාමය. මෙවැනි තත්ත්වයක් පවතිත්දී බලය තව දුරටත් විමධ්‍යගත කිරීමක් ගැන කතා කරද්දීම බොහෝ දෙනා එය දකින්නේ නාස්තිය සහ දූෂණය කරන තවත් ක්‍රියාපටිපාටියක් ලෙසය. මෙම තත්ත්වය අවම කරවීමට අප දේශපාලඥයින් සහ නිලධාරීන් තවමත් කිසිදු සැලැස්මක් දියත් කොට නැත. එසේ කිරීමට ඔවුන්ට හැකි වුවහොත් ණය සහ ආධාර මුදල් හොඳින් හසුරුවීමෙන් මේ තරමකටවත් ආර්ථික ප්‍රශ්න විසඳනවා පමණක් නොව බලය බෙදීමේ දේශපාලනික ගැටලුවේ ප්‍රධානතම අංගයක් වන මුදල් පළාත් හරහා විමධ්‍යගත කිරීමද අවම කර ගැනීමට තුඩු දෙන පාලන ව්‍යුහයක් අප රටේ ඇති කර ගත හැකි වෙනු ඇත.

# 4.3

## ගන්නා ණය ගෙවිය යුතු බව මතක තබා ගනිමු

සැම පුද්ගලයෙක්ම පාහේ කවර හෝ අවස්ථාවක කාගෙන් හෝ ණයක් ගැනීම ස්වභාවික සිද්ධියකි. එහෙත්, ගත් ණය පොළියත් සමග යම් දිනෙක ආපසු ගෙවීමට සිදුවෙන බවත් අපි සියලුදෙනාම දන්නෙමු. ඒ නිසා ණය ගැතියාගේ ණය ආපසු ගෙවීමට ඇති හැකියාව සළකා බැලීම වැදගත් කරුණක් වේ. රටක් වශයෙන් අපේ ණය ගෙවීමට අපට හැකිද ? ශ්‍රී ලංකාවේ ණය තත්ත්වය සමාලෝචනය කිරීමේ දී පැහැදිලි වන්නේ ණය බර දිගින් දිගටම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බවත් තවමත් ඉහළ යන බවත්ය. මහ බැංකු වාර්තාවලින් උපුටා ගත් පහත දැක්වෙන වගුව ඒ කතන්දරය හොඳින් විදහා දක්වයි.

රාජ්‍ය ණය තත්ත්ව

| | 1977 | 1993 | 2001 | 2002 |
|---|---|---|---|---|
| දේශිය ණය | 14.4 | 213.7 | 76.7 | 948.4 |
| විදේශිය ණය | 10.6 | 270.2 | 542.0 | 720.9 |
| මුළු ණය | 25.0 | 483.9 | 1218.7 | 1669.3 |
| ද. දේ. නි. | 73% | 91% | 98% | 105% |

ශ්‍රී ලංකාව, සිය රාජ්‍ය ණය කළමණාකරණයේදි බරපතල අභියෝගයකට මුහුණ දෙමින් සිටින බව ඉහත වගුවෙන් පැහැදිලිවේ. 1977 දි රු බිලියන 14.4 ක් පමණක් වූ සමස්ත දේශිය ණය ප්‍රමාණය, වසර 2002 වන විට රු. බිලියන 948.4 ක් දක්වා (66 ගුණයකින්) ශීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. 1977 දි රු. බිලියන 10.6 ක් පමණක් වූ සමස්ත විදේශිය ණය 2002 දි

---

**2004.06.29 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

රු බිලියන 720.9 දක්වා (68 ගුණයකින්) ඉහළ නැග තිබුණි. ඒ අනුව 1977 දී රු බිලියන 25.0 ක් වූ ආණ්ඩුවේ මුලු ණය ප්‍රමාණය වසර 2002 වන විට රු. බිලියන 1669.3 ක් (67 ගුණයකින්) තරම් අති විශාල ප්‍රමාණයකින් දක්වා ඉහළ නැග ඇත. සමහර විට ඊටත් වඩා වැදගත් කරුණ නම් 1977 දී සමස්ථ රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශිය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 72% ක් වූ අතර වසර 2002 වන විට මේ ප්‍රතිශතය 105% තරම් තියුණු සහ අභියෝගාත්මක මට්ටමකට ඉහළ නැග තිබීමය. මේ තත්ත්වය අපේ ආර්ථිකය මුහුණ දෙන ඉතා දැවැන්ත ප්‍රශ්නයකි.

සෑම වසරක් පාසාම, පාර්ලිමේන්තුවේ දී අය වැය ඉදිරිපත් කරමින් මුදල් අමාත්‍යවරයා ප්‍රකාශ කරන්නේ රාජ්‍ය ණය ප්‍රමාණය ඉතා තියුණු මට්ටම් වලට ඉහළ ගොස් ඇති බවත් එය අපේ වර්තමාන දළ දේශිය නිෂ්පාදිතයෙන් ඉතා අධික කොටසක් වශයෙන් වැඩිවී ඇති බවත් ය. ඉන් අනාවරණය වන්නේ ණය ප්‍රශ්නය අර්බුදකාරී මට්ටමකට ළගා වෙමින් තිබෙන බවත් යැයිද ඔහු සැමවිට නොවරදවාම ප්‍රකාශ කරයි. එසේම 1977 දී, ක්‍රමක්ෂය වීම සහිත ණය පොළී ගෙවීමත් සමග රු. බිලියන 1.2 ක් වූ සංඛ්‍යාව වසර 2000 වන විට රු. බිලියන 175.0 ක මට්ටමකට ළගා වී තිබූ බව ද අපට පෙනී යයි. ශ්‍රී ලංකාව වගකිව යුතු ජාතියක් බවත් එබඳු ණය හා පොළී ගෙවිය යුතු අවස්ථාවේදී ඇය සිය බැඳීම් ඉටු කරනු ඇති බවත් ශ්‍රී ලංකාවට ණය දෙන ප්‍රජාවට අග්‍රාමාත්‍යවරයා විටින් විටම පවසා ඇත. කෙසේ වුවද මේ ණය තත්ත්වය දිගු කාලීන සැලැස්මක් හරහා යම් පාලනයකට භාජනය නොකළහොත් මෙසේ ණය ලබා ගැනීමේ සහ ගෙවීමේ තත්ත්වය දිගින් දිගටම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දැඩි පීඩනයක් ඇති කරනු ඇත. අනිවාර්යයෙන්ම මේ ප්‍රවණතාව පාලනය කිරීම සඳහා වඩාත් උචිත හා කඩිනම් ක්‍රියාමාර්ග නොගතහොත් බරපතල අර්බුදයකට මුහුණ පෑමට ජාතියක් වශයෙන් අපට සිදු වනු ඇත.

රටක රාජ්‍ය ණය සාර්ථකව පාලනය කිරීමට සහ කලමණාකරණය කිරීමට යම් ජාතියකට නොහැකි නම් ආර්ථික වශයෙන් ප්‍රගතියක්

ලබා ගැනීමට එරටට අපහසුය. රාජ්‍ය ණය නිරන්තරයෙන් ඉහළ යාම අනාගත ජාතික අයවැය වලට සහ රජයේ ආර්ථික කළමනාකරණ ව්‍යුහයට හා පද්ධතීන්ට අති විශාල බරක් වනු ඇත. ඒ නිසා මේ අභියෝගයට එලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ඉතා ඉක්මනින් කටයුතු කළ යුතුය. මේ අභියෝගයට මුහුණ දීමේ දී අප ලබන සාර්ථකත්වය අපේ අනාගත පරම්පරාවන්ට වඩා හොඳ ජීවිතයක් ලබා දීමට අපට කොතරම් සාර්ථකව හැකි වේදැයි යන නිගමනයට පිළිතුරක් වෙනු ඇත. මේ අභියෝගයට මුහුණ දීම සඳහා වගකිවයුතු ආණ්ඩුවකට අනුගමනය කළ හැකි ප්‍රවේශයන් දෙකකි. ඉන් එක් ප්‍රවේශයක් වන්නේ ණය ගැනීම අවුරා විදේශ විනිමය අනුපාතය අඩු නොවන ලෙස ආර්ථිකය හසුරවීමය. එබඳු උපාය මාර්ගයක් මගින් අඩු තරමින්වත් පවත්නා මට්ටම්වලවත් විදේශ විනිමය අනුපාතය රඳවා ගැනීමෙන් ඉදිරියේ දී ගෙවීමට ඇති ණය ප්‍රමාණය පාලනය කර ගැනීමට උත්සාහ ගත යුතුය. අනෙක් ප්‍රවේශය වන්නේ ඉතා සැලකිල්ලකින් ණය ගන්නා අතර ඒ තුලින් ක්‍රමක්‍රමයෙන් ආර්ථිකය ප්‍රසාරණය කිරීමය. මෙම උපාය මාර්ගය සාර්ථකව ක්‍රියාත්මක කළහොත් දිනෙන් දින ඉහළ යන රජයේ ආදායමෙන් වඩා අඩු ප්‍රතිශතයකින් ණය පොළී ගෙවීම සඳහා යෙදවීමට රටට හැකි වනු ඇත. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටකට මේ දෙවැනි විකල්පයත් ඉතා වැදගත් සහ යෝග්‍ය බව පෙනේ. මෙම ක්‍රියා මාර්ගයට ඉතා උනන්දුවෙන් පිවිසී පැහැදිලි ප්‍රතිපත්තියක් තුළින් මෙම ණය තත්ත්වය පාලනය කිරීම අප ඉතා ඉක්මණින්ම සිදු කළ යුතුය.

# 4.4

## විදේශාධාර මතම යැපෙමින් රටක් දියුණු කළ හැකිද?

විදේශාධාර ලබා ගැනීම බලයේ සිටින රජයේ හපන්කමක්, ජයග්‍රහනයක් ලෙස සලකන්නට තරම් අද දිළිඳු රටවල් දුරදිග නොබලන තත්ත්වයකට පත්ව සිටිති. ණය ගැනීමත් ණය ගෙවීමත් මහ බරක් වන අතරම එය දැන් නිට්ටාවට සුවකළ නොහැකි රෝගී තත්ත්වයක් කරා ගමන් කර ඇත.

පවත්නා ලෝක තත්ත්වය යටතේ තනි රටක් වශයෙන් දියුණුව කරා ළඟා වීම ඉතාමත් දුෂ්කර වුවකි. මේ නිසාම එක් එක් රටවල් අතර අන්තර් සබඳතා ගොඩනගා ගනිමින් සංවර්ධනය වීමට උත්සහ කිරීම වත්මන් ලෝක ස්වභාවය බවට පත්වී තිබේ. විශේෂයෙන්ම තුන්වැනි ලෝකයේ රටවල් දියුණු ලෝකයේ රටවල් මත යැපෙන තත්ත්වයකට පත්වී තිබෙන ආකාරයක් පෙනෙන්නට තිබේ. මෙය එක් ආකාරයකට දියුණු රටවල බල පරාක්‍රමය නොදියුණු රටවල් වෙත යොමුකර තිබීමකි.

හුදෙක් විදේශාධාර මතම රටක් සංවර්ධනය කළ හැකිද යන්න බරපතල ප්‍රශ්නයකි. වර්තමානය වන විටත් ශ්‍රී ලංකාව විශාල ණය බරකින් පීඩාවට පත්වී තිබේ. මෙම තත්ත්වයෙන් මිදීමට කටයුතු කිරීම වෙනුවට තව තවත් ණය මුදල් ලබාගෙන රට සංවර්ධනය කළ හැකිද යන්න ගැන දෙවරක් සිතිය යුතුය.

සාමාන්‍යයෙන් ණය හා ආධාර ලැබෙන විට එයේ ලබාගැනීම රජයේ විශාල ජයග්‍රහනයකැයි සැළකේ. සෑම රජයක්ම සෑම වසරකම ණය සහ ආධාර සමුළුව දෙස ඉතා ඕනෑකමකින් සහ නොඉවසිල්ලකින් බලා සිටී. එයට හේතුව වනුයේ ඊළඟ වසරේදී රටේ සංවර්ධනයට අවශ්‍ය මුදල් ලැබෙන්නේ එම ආධාර සමුලුව

---

චම්ත්ද මුණසිංහ මහතා සමග පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරින් 2003.04.26 දින ලංකාදීප පුවත්පතෙහි පළවූ ලිපියක් ආශ්‍රයෙන්.

හරහා බව මුදල් අමාත්‍යාංශයේ සාමාන්‍ය මතය වීමයි. වසරින් වසර ණය ගන්නා ප්‍රමාණය මේ ආකාරයට වැඩි වෙමන් පවතී. මෙම කාලයේදී ණය වැඩිවීම ගැන කිසිවෙකු කතා නොකර සාමාන්‍යයෙන් කතා කරන්නේ ණය හා ආධාර ලබා ගැනීමෙන් අප රටගැන තිබෙන විශ්වාසය තහවුරු වන බව කියා තව තවත් වාසි ලබා ගැනීමය.

එහෙත් මේ කාලයේ ණය ලබාගැනීම විශාල ජයග්‍රහනයක් ලෙස සැලකුවද අයවැය සකස් කරන කාලයේදී නම් මේ ණය ගැන එතරම් පැසසුමකින් කතා කරන්නේ නැත. ඒ කාලයේදී රජය සාමාන්‍යයෙන් කියා සිටින්නේ අප රටට විඳිය නොහැකි ණය ලබාගෙන ඇති බවත් එය නැවත ගෙවීම විශාල අභියෝගයක් වන බවකි. අපගේ අනාගත පරම්පරා මේ ණය නිසා අතිවිශාල අර්බුදයකට මුහුණුපාන බවත්, මේ ණය හා පොලී නිසා රටේ අනිකුත් සංවර්ධන ව්‍යාපෘති වලට විශාල බාධාවක් වන බවත්ය. මේ ණය බර ලිහිල් කර ගැනීමට සියලුම රටවැසියන් සහයෝගයෙන් කටයුතු කරමින් ණය අඩුකර ගැනීමට වෑයම් කළයුතු බව රජය නිතරම පවසන්නකි.

මෙම තර්ක දෙකම එකම රජයක් විසින් එකම වර්ෂයක වෙනත් කාලවලදී පවසන විට බොහෝ රටවැසියන් විශ්මයට පත්වීමට පලුවන. මෙම පරස්පර විරෝධී තර්ක දෙකම සත්‍ය බවත් ඒවාට අදාළ වන කරුණු විශේෂඥයන්ට වැඩි අපහසුතාව නැතිව සොයාගත හැකි බව අප පිළිගත යුතුය. එක් එක් කාලවලදී වෙනස් විශේෂඥයෝ මෙම තර්ක දෙක ඉදිරිපත් කරමින් ඉතා දීර්ඝ දේශනා ඉදිරිපත් කරති. මේවායින් ජනතාවගේ මනස අවුල්වීමද පුදුමයක් නොවේ. අප රටේ බොහෝ දෙනා මෙවැනි අපැහැදිලි තත්ත්වය සකස් කිරීමට දක්ෂ බව පෙනෙන්නට තිබෙන සාධකයකි. ණය සහ ආධාර ලබා ගන්නා කාලයේදී අප සංතෝෂ වන අතරම ණය සහ පොලී ගෙවීම අයවැයට ඇතුළත් කරන විට ණය ලබාගත් අයට චෝදනා කිරීමද සාමාන්‍ය දෙයකි. එමෙන්ම එක් දවසක සාමය අවශ්‍ය යැයි කියා කෑගසන අතරම තවත් දවසක යුද්ධය අවශ්‍යයයි කියා හඬනගන අයද සිටිති. මෙවැනි උදාහරණ රාශියක් ඕනෑම අයෙකුට ඉදිරිපත් කළ

හැකිය. මේ ප්‍රශ්න සියල්ල මතුවන්නේ දේශපාලනීකරණයෙන් තොරව එකඟවිය හැකි ප්‍රතිපත්ති නොමැතිවීමෙන්ය. ආරක්ෂාව, මුදල්, අධ්‍යාපනය, වාරිමාර්ග, ප්‍රවාහනය ආදී කවර ක්ෂේත්‍රයක් වෙනුවෙන් වුවද ජාතික ප්‍රතිපත්තියක් නොතිබීම කණගාටුවට කරුණකි.

ණය සහ ආධාර සම්බන්ධයෙන්ද තවමත් අපට ජාතික ප්‍රතිපත්තියක් නොමැත. සෑම වසරකම විවිධ කොන්දේසි වලට යටත් වී කොතැනකින් හෝ මුදල් ලබාගැනීම අපගේ ජාතික ප්‍රතිපත්තිය ලෙස දැනට පෙනේ. 2001 වසරේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන කීපයක් ලබා ගැනීමට ඛනිජ තෙල් මිල වැඩි කිරීමටද අනික් අංශවලින් ජනතාවට ලැබී තිබූ සහන ඉවත් කිරීමටද රජය එකඟවුණි. මේවා විවේචනය කළද ඒවායින් පසුව ගැලවීමක් නොමැති බව නව රජයටද ඉක්මණින් වැටහී තිබේ. එසේ නම් අප සියලු දෙනා උගත යුතු පාඩම නම් ණය හා ආධාර සම්බන්ධයෙන් අපට දේශපාලන වශයෙන් තාවකාලික වාසි ලබා ගැනීම නුවණට හුරු නොවන බවය.

ණය දෙන සමුලුවලට විපක්ෂයේ නියෝජිතයන්ද සහභාගිවීම අවශ්‍යය. ණය දෙන සාකච්ඡාවලට එල්.ටී.ටී.ඊ. සංවිධානය සම්බන්ධකර ගන්නේ නම් ඔවුන්ගේ මතයද අප සවන්දෙන්නේ නම් විපක්ෂයේ මතයට සවන්දීමටද ජාතික වශයෙන් එකඟවිය යුතුය. කුමන රජයක් ණය ලබාගත්තද ඒවා ගෙවන විට මතුවන ගැටලුවලට මුහුණ දීමට සිදුවන්නේ එකී පක්ෂයේ රජයටම නොවේ. එම වකවානුවේදී වෙනත් පක්ෂයක් පිහිටවූ රජයකට සහ ජනතාවට බර පටවනවා නම් අඩුතරමින් එම බරපැටවීම සිදුවිය යුත්තේ ජාතික සැළසුමක් හරහා විය යුතුය. එසේ නම් රජයක් ණය ගන්නා විට මුලු රටම අවුරුදු හතළිහකට හෝ පනහකට එම ණය හා පොලී ගෙවීමේ රැහැනට හසුවෙන බැවින් එම තීරණය ඉතා කල්පනාකාරීව හා සහයෝගයකින් ගත යුතුය.

අද ලෝකය ගෝලීයකරණය වී තිබේ. රටක ශක්තිය පවතින්නේ මුදල් බලයෙනි. යම් රටක් මූල්‍යමය වශයෙන් ශක්තිමත් නම් ඒ

හරහා දිගින් දිගටම වර්ධනය විමට හැකිය. දිගින් දිගටම අප කියා සිටින්නේ දියුණු රටක් බවට පත්විය යුතු බවකි. පසුගිය වසර 30 දෙස බලන විට දළ දේශිය නිෂ්පාදිතයේ සාමාන්‍ය වර්ධනය ඉන්දියාවටත් වඩා අඩුය. ඉදිරි වසර 10 කදී දළ දේශිය නිෂ්පාදිතයේ වර්ධනය 8%-10% දක්වා වර්ධනය කළ යුතුය. එසේ කිරිමට හැකිනම් ඒක පුද්ගල ආදායම දෙගුණයකින් වර්ධනය කර ගැනිමට හැකිවනු ඇත. මෙය ඉතා දුෂ්කර වූවකි. එවැන්නක් විමට අප රටේ ආර්ථිකය ඉතා සාර්ථක හා උද්යෝගයකින් හසුර විය යුතුය. මෙසේ කළ හැක්කේ විශාල ආයෝජනයක් රටට ගලා එන්නට සළස්වන අතර නව ව්‍යාපෘති රැසක් එකවිටම දියත් කිරිමෙනි. මෙවැනි වැඩපිළිවෙලක් උද්දමන වේගය වැඩිකර විමට තුඩුදිය හැකි වුවද එය දක්ෂ ලෙස පාලනය කරමින් රටේ සංවර්ධනය ඇතිකර විම ආර්ථිකය හසුරුවන්නන් ඉදරියේ ඇති අභියෝගයකි. වගකිමකි.

මෙම කටයුතු කළ නොහැකි ඒවා නොවේ. එහෙත් ඉඳහිට මෙම ගැටළු දෙස බලන්නේ නම් ඒවාට සාර්ථක විසඳුම් සෙවිය නොහැක. සමස්තයක් ලෙස මේ ගැටළු සියල්ල එකවර විග්‍රහ කරමින් දිගුකාලින ප්‍රතිපත්ති හා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් නොකර රටක් වශයෙන් මුහුණු දීමට නොහැක. බොහෝවිට අප කරන්නේ එදිනෙදා පැණ නගින ප්‍රශ්නයට හෝ ගැටළුවට එදිනෙදාට ඔබින ප්‍රතිකාර කිරිමකි. ඊළග දවසේදි ඒ නිසාම තවත් ගැටළු පැණ නගිද්දි එයටත් වෙනත් ප්‍රතිකර්ම කරති. මෙලෙස දිගින් දිගටම කරන්නේ දවසින් දවස මතුවන ගැටළු වලට තාවකාලික විසඳුම් සොයා ඒවායින් ටික කලකට තෘප්තිමත් විමයි. මෙම ණය ප්‍රශ්නය අප රටට බලපාන ඉතාම උග්‍ර ප්‍රශ්න වලින් එකකි.

මේ ප්‍රශ්නයට අදාළ අංග රාශියක් පවති. එම අංග සියල්ලම එකවරටම සලකා බලමින් ජාතික ප්‍රතිපත්තියක් සැකසිම අත්‍යවශ්‍ය වුවකි. බොහෝ රටවල් එවැනි ප්‍රතිපත්ති සකසා තිබේ. ඒ හරහා කළ හැකි දේ හා නොකළහැකිදේ සැම රජයකටම පැහැදිලි කර ගැනිමට පුලවන. එවිට එකි රාමුව තුළ තම දිගුකාලින විසඳුම් හා ක්‍රියාමාර්ග ගැනිමට හැකිවනු ඇත. මේ අභියෝගය රජයට

සහ විපක්ෂයට හිමි ඉතා සුවිශේෂ කාර්යයකි. එය වගකීමකින් හා ජාතික කැක්කුමකින් ඉටුකිරීම මෙම දෙපාර්ශවයෙන්ම රටවැසියන් බලාපොරොත්තු වීම සාධාරණය. මෙය කළ හැක්කේ කෙසේද, ණය හා ආධාර සම්බන්ධයෙන් විශේෂ අදියර කීපයක්ම තිබේ. ණය ලබාගැනීම ප්‍රථම අදියර වශයෙන් පෙන්වාදීමට පුලුවන. මෙම කටයුත්ත දෙස බොහෝවිට රජය බලන්නේ කෙසේ හෝ වැඩියෙන් මුදල් ලබා ගැනීමටය. ණය ලබා ගන්නා විට එයට බැඳී ඇති කොන්දේසි වඩාත් හොඳින් අධ්‍යයනය කිරීමට රජය බොහෝ අවස්ථාවලදී උනන්දුව ඉතා අඩුය. බොහෝ රජයන් පුන පුනා බලා සිටින්නේ ණය ප්‍රමාණය හැකි ආකාරයකින් වැඩිකර ගෙන ඒ ගැන ජනතාවට ජයග්‍රාහිව දැන්වීමටය. එසේ ණය ලබා ගැනීම රජයට විශාල ජයග්‍රහණයකැයි කියා එයින් සෑම රජයක්ම පාහේ දේශපාලනික වාසියක් ලබා ගැනීමට උත්සහ කරති. මෙය සෑම රජයක්ම කරන අතර, එම භයානක අදහස නිසා ඇතැම් විට රටට නොගැලපෙන ණයත්, නුසුදුසු කොන්දේසිවලට යටත් වීමටත් සිදුවනු ඇත. මේවා ගැන පසුතැවිලි වන්නේ එම ණය ගෙවීමට පටන්ගත් පසුවය. ණය නැවත ගෙවන්නට සිදුවන විට එවකට ඇති රජය ණය ලබාගත් රජයට බැණ වදියි. ඒ නිසා ප්‍රශ්න ඇතිවී ඇති බවද පවසමින් තවත් දේශපාලන වාසියක් ලබා ගැනීමට එවකට බලයේ සිටින අය උත්සහ කරති. මෙයත් දිගින් දිගටම සිදුවන ආකාරයක් පෙනෙන්ට තිබේ.

ණය සම්බන්ධයෙන් දෙවැනි අදියර වනුයේ ගන්නා ණය නිසි පරිදි හා ලැබී ඇති කලාසීමාව තුළ පාවිච්චි කිරීමය. මෙහිදීද ශ්‍රී ලංකාව අතිවිශාල දුර්වල තත්ත්වයකට පත්වී ඇත. අප රටේ ණය දායක කර ගැනීමේ ප්‍රතිශතය 14% වැනි ඉතා අඩු මට්ටමක පවතී. මේ සම්බන්ධයෙන් සෑම රජයක්ම පාහේ වගකිව යුතුය. ණයක් ලබාගැනීමට වඩා එම ණයෙන් දියත්කර දීමට වැයම් කරන වැඩ කොටසින් නිසි ඵල නෙලා ගැනීමට නම් එය කාලෝචිතව පාවිච්චි කිරීම අත්‍යවශ්‍ය වුවකි. එසේ නැතිනම් එම ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව අඩුවන අතරම බොහෝ අවස්ථාවලදී එම ණය අහෝසි විය හැකිය. මේ අංශයෙන්ද ශ්‍රී ලංකාව ඉහළ මට්ටමක පවතී.

ණය පාවිච්චි කිරීමේ ප්‍රතිශතය ලෝකයේ අඩුම ප්‍රතිශතයක් වීම ශ්‍රී ලංකාවේ ආඩම්බරයට හේතු වන්නක් නොවේ. එම තත්ත්වය දෙස රජයේ විශේෂ අවධානය යොමුවීමද, අත්‍යවශ්‍ය වූවකි.

තෙවනුව සෑම ණයකටම ගැටගසා ඇති කොන්දේසි හා ළණු ඉතා හොඳින් විග්‍රහ කළ යුතුය. මෙම විග්‍රහයද, අපක්ෂපාතිව හා දේශපාලනීකරණයෙන් තොරව කළ යුත්තකි. තවද, ණයෙන් වැඩි කොටසක් ණය දෙන රටවලටම උපදෙස්වලට යැයි කියමින් නැවත ගෙවයි නම් එයින් ලැබෙන්නේද, අවම ප්‍රතිඵලයකි. ඇතැම් රටවල් තමන්ට අවශ්‍ය සේවා හෝ ව්‍යාපෘති නොදියුණු රටවලට තල්ලු කර ආර්ථික වාසියක් ලබා ගන්නා අතරම ජාත්‍යන්තර කීර්තියක් ලබා ගැනීමට දක්ෂ වන්නේය. මෙම උගුලෙන් ගැලවීමට අප නැණවත්ව ක්‍රියා කළ යුතුය. අපගේ ඉදිරි පරම්පරා යම් ණයකට ගැටගසන විට එම මුදල් රටේ ජනතාවට දෑනෙන පෙනෙන ව්‍යාපෘතිවලට යෙදවීමට දක්ෂ විය යුතුය.

හතරවෙනුව රටේ සංවර්ධනයට සාපේක්ෂව ණය මුදල් ලබාගත යුතුය. ණය ලබාගත හැකි යම් සීමාවක් මෙන්ම විනයක් පනවා ගැනීමද, අත්‍යවශ්‍ය වූවකි. මූල්‍ය විනයක් නොමැතිව ලැබෙන්නන් වාලේ ණය මුදල් හෝ ආධාර ලබා ගැනීමට යොමුවුවහොත් එම ප්‍රතිපත්තිය මගින් රටටත් ජනතාවටත් දරුණු ප්‍රතිවිපාකවලට මුහුණ දීමට අනිවාර්යයෙන්ම සිදුවණු ඇත. ණය මුදල් ලබාගන්නා අවස්ථාවේම මෙම අයහපත් ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවන්නේ නැත. ඇතැම් විට දශක කීපයකට පසුව මෙම ප්‍රතිඵල විඳීමට සිදුවිය හැකිය. පරම්පරා ගණනක් වුවද, මෙකී අයහපත් ප්‍රතිඵල බලපැවැත්විය හැකි වීම මෙහි පවත්නා ඉතාමත් කනගාටුදායක තත්ත්වයකි. වර්තමානය වනවිටත් මුල් කාලයේදී ලබාගෙන තිබෙන ණය මුදල්වල අහිතකර බලපෑම්වලට අප රට මුහුණ දී සිටී.

2002 වසරේ අයවැය ලේඛණය ඉදිරිපත් කළ අවස්ථාවේදී ඒක පුද්ගල ණය බර රුපියල් හැත්තෑ දහසක් පමණ වී ඇති බවට මුදල් ඇමතිවරයා ප්‍රකාශ කළේය. සංවර්ධනය වන රටක් වශයෙන් සිටින ශ්‍රී ලංකාවට මෙය එතරම් හිතකර තත්ත්වයක්

නොවන බව සක්සුදක් සේ පැහැදිලි කරුණකි. ඇතැම් විට මෙම ඒකපුද්ගල ණය ප්‍රමාණය මේ වසරේ අයවැය ලේඛණය ඉදිරිපත් කරන විට මීට වඩා ඉහළ ප්‍රතිශතයක් වනු ඇත. එනම් දිනෙන් දිනම මෙරට සාමාන්‍ය ජන ජීවිතය පරිහානියට පත්වෙන බවකි. මේ ආකාරයෙන් ජන ජීවිතය පහළට ඇද වැටෙන්නේ පරිපාලනමය වශයෙන් පවත්නා දුර්වලකම්වල ප්‍රතිඵලයක් වශයෙනි. නමුත් රට පාලනය කල කිසිම රජයකින් මේ තත්ත්වය පාලනය කර ජනතාවගේ ඒක පුද්ගල ණය බර සැහැල්ලු කිරීමට කටයුතු කර තිබෙන ආකාරයක් පෙනෙන්නට නැත.

කුමන ක්‍රමයකින් හෝ ණය මුදලක් හෝ ආධාර මුදලක් ලබා ගැනීම හපන්කමක් නොවන්නකි. ලබාගත් ණය මුදල් රටේ ජනතාවට බරක් නොවී නැවත ගෙවීම සත්‍ය හපන්කම වශයෙන් පෙන්වාදිය හැකිය. මෙම සාධකය රටේ සමස්ත පරිපාලන රටාව මෙන්ම සාමාන්‍ය ජන කොටස්ද අවධානයට ගත යුතුය. ලබා ගත් ණය මුදල් නැවත ගෙවීමත් ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රියාමාර්ග ගැනත් රජය සිරුවෙන් පරීක්ෂණයක් කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් පෙන්වාදීමට පුලුවන. එවැනි පියවරක් අනුගමනය කරන්නේ නම් ණය ගෙවීමේ අභියෝගය ජය ගැනීම එතරම් අපහසු වන්නේ නැත. එමෙන්ම නැවත ගෙවීම්වල යම් ප්‍රතිසංස්කරණයක් කිරීමට අවශ්‍ය නම් එයද පහසුවෙන්ම කර ගැනීමට මෙමගින් හැකියාව ලැබෙනු ඇත.

මෙම සාධක අප වැනි රටකට සුවිශේෂී වන්නක් වශයෙන්ද පෙන්වා දිය හැකිය. ණය නැවත ගෙවීමේ කාලසීමාවද අය කෙරෙන පොලී අනුපාතයද ඒ ඒ රටවල් සමග සාකච්ඡා කර වෙනස් කර ගැනීමට හැකිවන අවස්ථා තිබේ. එමගින් රටට සැහෙන ප්‍රතිලාභයක් ලබා ගැනීමට පුලුවන. මෙවැනි විසඳුම් ලබාගැනීමට අන්තිම මොහොත දක්වා බලා නොසිට කටයුතු කිරීම කෙරෙහි වගකිව යුතු අංශවල අවධානය යොමුවිය යුතුය. මේ දක්වා රට පාලනය කළ දේශපාලන නායකයන් මෙවැනි අංශ කෙරෙහි අවධානය යොමුකර කටයුතු කර තිබෙන ආකාරයක් පෙනෙන්නට නැත. එසේ කළේ නම් ශ්‍රී ලංකාව යනු මීට වඩා බොහෝසෙයින්ම වෙනස් වූ රටකි.

විදේශ රටවලින් ණය මුදල් හෝ ආධාර මුදල් ලබා ගැනිමත් එමගින් රටට තාවකාලිකව ඇතිවන වාසියට වඩා රටේ දිගුකාලින සංවර්ධනයට තුඩු දෙන අංශ කෙරෙහි යොමු වී කටයුතු කිරිමත් අත්‍යවශ්‍ය සාධකයකි. මෙකි සාධක සියල්ල නිවැරදිව අවබෝධ කරගනිමින් දිගුකාලිනව රටේ සංවර්ධනයට සෘජුවම හේතුවන ණය ප්‍රතිපත්තියක් සකස් කර ගැනිමට රජයට හැකි නම් එය අතිවිශාල ජයක් වශයෙන් පෙන්වාදිය හැකිය.

# 4.5

# විදේශ ණය ලබාගනිද්දී බලපෑම් අවමකර ගැනීමට නම්

අප සියලු දෙනාම පාහේ යම් යම් අවස්ථාවලදී, විවිධ ව්‍යාපෘති සඳහා බැංකුවකින් හෝ වෙනත් ආයතනයකින් ණය ලබාගෙන ඇත. එවැනි අවස්ථාවලදී බැංකුව අපගේ ව්‍යාපෘතිය පිළිබඳව ගැඹුරු ලෙස තොරතුරු විමසන අතර අදාළ ව්‍යාපෘතිය දියත් කරගෙන යාමට එහි නියමුවන්ට ඇති හැකියාව ගැනද, ආයතන ව්‍යුහය ගැනද ආයතනයේ ප්‍රධානීන් අතර ඇති කළමණාකාර දක්ෂතාවය සහ ආයෝජන හැකියාව ගැනද, ව්‍යාපෘතියේ ශක්තීන් සහ දුර්වලතාවයන් ගැනද වෙනත් සාධක රාශියක් ගැනද, තියුණු විග්‍රහයක් කරති. ඒ අතරම, බැංකුව ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා දෙන විට, ඒ සඳහා ණය ගන්නා ආයතනය එකඟ විය යුතු කොන්දේසි කවරේද සහ ණය මුදල කොටස් වශයෙන් ලබාදෙන්නේ නම්, එක් එක් අදියරයකට අදාළ මුදල් මුදා හරිද්දී බැංකුව අපේක්ෂා කරන ප්‍රතිඵල කුමන ඒවාද යන්නද, ණය ගනුදෙනුවේ සටහන් කරනු ඇත. එසේ නම්, යම් ව්‍යාපෘතියක් වෙනුවෙන් ණය මුදලක් ගැනීමට අප අදහස් කරන්නේ නම්, අප ගත යුතු වැදගත් තීරණයක් වන්නේ, බැංකුව ඉදිරිපත් කරන කොන්දේසි වලට අප එකඟ වී මුදල් ලබා ගන්නේද නැද්ද යන්නය. යම් හෙයකින්, බැංකුව යෝජනා කරන කොන්දේසි වලට අප එකඟ නොවන්නේ නම් අප ඉදිරියේ ඇති විකල්පය වන්නේ, එවැනි ණයක් ලබා නොගැනීම බව පැහැදිලිය.

රටක් වශයෙන් ශ්‍රී ලංකාව ඉදිරියේ ඇති විකල්පයද එවැනි එකකි. අද අප රට තුළ පවතින ආර්ථික තත්ත්වය අනුව විදේශ රටවලින් සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් ණය සහ ආධාර ලබාගැනීමට අපට සිදු වී ඇත. එසේ ණය සහ ආධාර

---

**2004.08.08 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

ලබා නොගතහොත්, යම් අවම මට්ටමකවත් අප රටේ ආර්ථිකය පවත්වාගෙන යාමට අපට ශක්තියක් නොමැත. එලෙස රටේ ආර්ථිකය දුර්වල වීමට හේතු රාශියක් තිබුණද ඒවා ගැන පසු විපරම් කරමින් අතීතයේ එරී සිටිනු හැරෙන්නට අපට ලබාගත හැකි කිසිඳු වාසියක් නොමැත. එසේ නම්, අප ඉදිරියේ ඇති අභියෝගය වන්නේ දැනට පවතින අර්බුදකාරී තත්ත්වයෙන් මිදී, ආර්ථිකය කෙසේ වර්ධනය කරගත හැකිද යන්නය.

1948 දී අප රට නිදහස ලබාගෙන ස්වාධීන රටක් බවට පත්වුණි. එහෙත් දේශපාලනික සහ සමාජීය වශයෙන් අප නිදහස ලබාගත්තත්, වර්තමානය වන විට ආර්ථික වශයෙන් ශ්‍රී ලංකාව සත්‍ය නිදහසක් ලබා ඇතැයි අපට කිව නොහැක. අද වන විට, අපගේ ආර්ථිකය හැම පැත්තකින්ම පාහේ විවිධ බලපෑම් වලට ගොදුරු වී ඇත. එම බලපෑම් හරහා ආර්ථික නිදහස අපට බොහෝ දුරට අහිමි වී ඇත. ඒ බව දැන දැනත් අප තවමත් එම තත්ත්වයෙන් මිදෙන්නට කටයුතු නොකරමින් විවිධ පීඩනවලට ගොදුරු වීම කණගාටුවට කරුණකි. එසේ වුවද එම පීඩනයෙන් ගැලවෙන්නට අපට එක් දිගුකාලීන මාර්ගයක් ඇති බව අප අමතක නොකළ යුතුය. එම මාර්ගය නම් ආර්ථික වගකීමක් සහ විනයක් සහිතව කටයුතු කිරීමය. එවැනි වගකීමක් සහ විනයකින් තොරව දශක කීපයක් මුලුල්ලේම, රටේ දිගුකාලීන අභිවෘද්ධිය නොතකා, අපගේ එදිනෙදා අවශ්‍යතාවයන් වෙනුවෙන් අප විදේශීය රටවලින් හෝ ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් ණය ලබාගැනීමට පුරුදු වී ඇත. එසේ කිරීමෙන් අපගේ ආර්ථික විනය සම්පූර්ණයෙන්ම පාහේ අප විසින්ම හීනකර ගෙන ඇත.

අප රටට යම් ආයතනයක් ණය ලබාදෙන්නේ නම්, එම ණය ලබා ගැනීම සඳහා ඒ අයගේ කොන්දේසි වලට යටත් වන්නට සිදුවීම ස්වභාවිකය. එවැන්නක් කිරීමට අප අකමැති නම් අප ඉදිරියේ ඇති විකල්පය වන්නේ ණය හෝ ආධාර නොගෙන සිටීමය. අනුන්ගේ සම්පත් ලබා ගන්නටත්, තමන්ට අවශ්‍ය ආකාරයට කටයුතු කිරීමටත්, යම් කෙනෙකුට කළ හැක්කේ කළාතුරකිනි. එහෙත්, බොහෝවිට අප රටේ පෙනෙන්නේ රජය හැකි සෑම අංශයකින්ම ණය ලබාගැනීමට තැත් කරන අතරම,

එම ණය ලබාදෙන ආයතනවල කොන්දේසි ගැන ප්‍රසිද්ධියේ කණස්සල්ල පළකරමින් ඔවුන් අප රටට බලෙන්ම ණය දෙන්නට තැත් කරනවා වැනි යථාර්ථයක් ජනතාවට පෙන්වා දීමේ වෑයමකි. මෙම තත්ත්වය අපගේ සාමාන්‍ය ජීවිතයේ සිදුවීමකට සංසන්දනය කරන්නේ නම්, ගමේ පොළී මුදලාලිට බැණ වදිමින්, පොළී මුදලාලිගෙන්ම දිගින් දිගටම ණය ලබාගන්නා වැනි තත්ත්වයක් ලෙස කෙනෙකුට පෙන්වා දිය හැක.

මෙහිදී අප ඉගෙන ගත යුතු වැදගත්ම පාඩම වන්නේ අහිතකර කොන්දේසි වලට අප අකමැති නම්, අපගේ ආර්ථිකය හසුරුවා ගැනිමට වඩා විනයකින් සහ වගකීමකින් කටයුතු කිරීමට අප අධිෂ්ඨාන කර ගත යුතු බවය, කැප විය යුතු බවය. අවාසනාවකට මෙන්, එවැනි විනයක් හෝ වගකීමක් අප රජයේ ක්‍රියා පටිපාටිය තුළ අපට පෙනෙන්නට නොමැත. එවැනි වගකීමකින් ක්‍රියා නොකරනවා පමණක් නොව, ආර්ථිකයේ සත්‍ය තත්ත්වය සහ ආර්ථිකය ඉදිරියේ ඇති දැවැන්ත අභියෝගවල බැරෑරුම් භාවයද ජනතාවට හෙළිකිරීමට රජය අකමැත්තක් දක්වන බව අපට පෙනේ. මේ පිළිබඳ බොහෝ නිදසුන් තිබුණද, උදාහරණ දෙකක් පමණක් අපට සැළකිය හැකිය. මෑතකදී ලෝක බණිජ තෙල් මිල ශිඝ්‍රයෙන් වැඩිවූ විට රජය පුන පුනා කියා සිටියේ එම මිල වැඩිවීම කිසිදාක ජනතාව මත නොපවරන්නේය කියාය. තවද, අප රටේ රාජ්‍ය සේවයේ නිරත වී ඇති සේවකයින් සංඛ්‍යාව සහ රටේ ජනගහනය අතර අනුපාතය මුලු ලෝකයේම ඉහළතම අනුපාතය වුවත්, රජය කියා සිටින්නේ තවදුරටත් රාජ්‍ය සේවයට හැට දහසක් පමණ පුද්ගලයින් සංඛ්‍යාවක් බඳවා ගන්නා බවය. මෙවැනි, ජනප්‍රිය, ක්‍රියා මාර්ග, කෙටි කාලීනව දේශපාලනික වාසි ලබා දෙන ඒවා වුවද, ඒවායේ බලපෑම ආර්ථිකයට ඉතා අනතුරුදායක ඒවා වනු ඇත. එවැනි ක්‍රියා මාර්ගවල ප්‍රතිඵල දිගුකාලීනව, රටේ ආර්ථිකයට දැඩි ලෙස බලපාන අතරම, දේශපාලනිකවද රටට අතිශයෙන් අහිතකර වනු නොඅනුමානය.

ඉහත සඳහන් ක්‍රියාමාර්ග වැනි අදූරදර්ශී වැඩපිළිවෙත් අනුගමනය කිරීමෙන් අප මුලු ලෝකයටද, ණය දෙන සංවිධානවලටද පෙන්වා දෙන්නේ අප රටේ ආර්ථිකය වගකීමකින් තොරව හසුරුවෙන

බවය. එවැනි අයහපත් තත්ත්වයක් උද්ගත වන විට අප රටට ණය සහ ආධාර ලබාදෙන්නන් අනිවාර්යයෙන්ම අප ආර්ථික කළමණාකාරිත්වය පිළිබඳව තියුණු සැකයක් ඇතිකර ගනිමින්, අනාගතයේදී ණය සහ ආධාර ලබාදීමේ කොන්දේසි තවදුරටත් තද කිරීමට පෙළඹෙනු ඇත. ඒ තුළින් රජය අසීරු භාවයකට පත්වනවා පමණක් නොව, මැතිවරණ සමයේදී ලබා දුන් පොරොන්දු ඉෂ්ට කිරීමට අවශ්‍ය වන ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීමටද අපොහොසත් වනු ඇත. එසේ වුවහොත්, රටතුළ දැවැන්ත සමාජීය අර්බුද මතු වන්නටද අවකාශය වර්ධනය වන්නේය. එසේ නම්, දැන්වත් ආර්ථිකයේ සත්‍ය තත්ත්වය සහ අභියෝග වටහා ගෙන එම තත්ත්වය පිළිබඳව ජනතාවට පහදා දෙමින් රජය වඩා වගකීමකින් සහ විනයකින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය ය. එසේ නොකොට, පවත්වාගත නොහැකි, ස්ථාවර පදනමක් නොමැති, ආර්ථික මිරිගුවක් පසුපස රට ගෙන යාමෙන් අප සියලු දෙනාටම සිදුවන්නේ නුදුරු අනාගතයේ විසඳාගත නොහැකිවන පරිමාණයේ ආර්ථික ප්‍රශ්න වලට ගොදුරු වී, අතරමං වීමය.

# 5

## පස්වන කොටස

# බදු

# 5.1

## බදු දැල පුළුල් කිරීමට නම්......

අයවැය ගැන සාකච්ඡා වන සම්මන්ත්‍රණ වලදී නිතරම පාර්ශව දෙකකින් අසන්නට ලැබෙන දුක් ගැනිවිලි දෙකක් තිබේ. එයින් එකක් නම්, 'බදු දැලට' හසුවීමට තරම් තමන් අවාසනාවන්ත යැයි සිතන අතලොස්සක් වූ බදු ගෙවන්නන්ගේ දුක් ගැනවිල්ලයි. ඔවුන්ගේ අඳෝනාව වන්නේ 'දහස් ගණන් පුද්ගලයින් බදු නොගෙවා නිකම් ම බේරී යද්දී අපට පමණක් තව තවත් බදු ගෙවන්නැයි කියනවා. අනෙක් අයගෙනුත් ඒ බලධාරීන් බදු අය නොකරන්නේ ඇයි?' යන්නය. දෙවැනි පාර්ශවය නම්, කෝපයට පත් බදු නිලධාරීන් නගන අඳෝනාවය. ඔවුන් පවසන්නේ 'බදු පැහැර හැරීම විශාල ලෙස පැතිර තිබෙනවා. බදු නොගෙවන අය විශාල සංඛ්‍යාවක් සිටින බව අප දන්නවා වුණත් අපට ඔවුන් අල්ලා ගන්න බැහැ. ඒ නිසා දැනට ලිපි ගොනු තිබෙන අය සම්බන්ධයෙන් අපට ක්‍රියා කරන්න සිදුවෙනවා' කියාය.

මේ ප්‍රශ්ණය නිරාකරණය කිරීම සඳහා යම් ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක්, කාලය ගෙවීමත් සමගම ගනු ලැබේ යැයි හැම අවුරුද්දක ම මම අපේක්ෂා කළෙමි. නමුත් අවාසනාවකට මෙන් එය සිදු වීමක් නොපෙනේ. තත්ත්වය කොතරම් බරපතල ද යත් අප රට ලෝකයේ පටු ම බදු පදනම ඇති රටක් වශයෙන් ශ්‍රී ලංකාව හැඳින්විය හැකිය. එබැවින්, බදුගෙවන්නන් සංඛ්‍යාව වැඩි කර ගැනීමටත්, වඩා පුලුල් බදු පදනමක් ඇති කර ගැනීමටත් යම් නව ක්‍රියා මාර්ගයක් අප ඉතා උනන්දුවෙන් සෙවිය යුතුය. යම් බරපතල හා නිදන්ගත ප්‍රශ්නයකට විසඳුමක් සෙවීමට නම් සාම්ප්‍රදායික නොවන නව දෘෂ්ටියකින් ඒ දෙස බැලිය යුතු බව බොහෝ විට පෙනී යයි. බොහෝවිට ඒ විසඳුම් ද සාම්ප්‍රදායික නොවන තවමත් අත්හදා බැලීමට ලක් නොවූ ඒවා විය හැකිය.

---

2004.08.08 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

අපේ බදු පදනම පුලුල් කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳ අදහස් කිහිපයක් අද මම ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. මා එසේ කරන්නේ නිදන් ගත සහ ගැඹුරට කා වැදී ගිය ගැටලු වලට මුහුණ පෑම සඳහා නැවුම් සහ අලුතින් සිතන ආකාරයේ ප්‍රතිචාර අවශ්‍ය බව සිහි තබාගෙනය. එයින් පළමු පියවර වශයෙන් මා යෝජනා කරන්නේ අවුරුදු දෙකක් යනතුරු ආදායම්බදු දෙපාර්තමේන්තුවල දැනට ලියාපදිංචි බදු ගෙවන්නන්ගෙන් ප්‍රශ්න කිරීමක් නැතිව ලැබිය යුතු අය බදු භාරගත යුතු යන්නය. නමුත් ඒ සඳහා, අදාළ තක්සේරු වර්ෂයේ ප්‍රමාණයටත් සමාන විය යුතුය. එබඳු සරල පරිපාලන ක්‍රියාදාමයක් අනුගමනය කළහොත්, දැනට බදු ගෙවීම් පිළිබඳ වාර්තා දහස් ගණනක් පෙරළා පෙරළා පරීක්ෂා කරමින් කාලය ගත කරන බදු නිලධාරීන් සංඛ්‍යාවෙන් අඩු ගණනේ භාගයක්වත් මා මෙහි යෝජනා කරන නව ආකාරයක 'බදු පදනම් පුලුල් කිරීමේ' වැඩවලට යෙදවිය හැකි වනු ඇත.

බදු ගෙවිය යුතු, නමුත් එසේ නොකරන පුද්ගලයින් 'බදු දැලට' හසු කර ගැනීම සඳහා ක්‍රියාශිලීව කටයුතු කිරීමට මේ 'අලුතින් මුදාහරිනු' ලබන බදු නිලධාරීන් යොමු කළ යුතුය. ක්ෂේත්‍ර සංචාර මගින් දත්ත එකතු කිරීම, ව්‍යාපාර කටයුතු හා ප්‍රචාරණයක් අධීක්ෂණය කිරීම, නිතිපතා බදු පැහැර හරින්නන් අල්ලා ගැනීම සඳහා ක්‍රම හා ක්‍රියා මාර්ග හඳුන්වා දීම, දැනුමක් නැතිකම නිසා බදු පැහැර හරින්නට ඉඩ ඇති අයට සහාය වීම, ආයතනවලට හා සමාගම් වලට ගොස් නිවැරදි බදු මුදල් ප්‍රමාණය ගෙවීම පිළිබඳව ප්‍රධාන පෙළේ නිලධාරීන් සහ අනෙකුත් අය සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, ආදී කටයුතු ඔවුන්ගෙන් බලාපොරොත්තු විය හැකිය. ඔවුන්ට මේ නව ප්‍රවේශය සම්බන්ධයෙන් සැළකිල්ලෙන් පුහුණුව ලබාදිය යුතුය. එහෙත් ඔවුන් දැනටමත් බදු නිලධාරීන් වශයෙන් කටයුතු කරන නිසා අලුතින් පුද්ගලයින් බඳවාගෙන බදු නිලධාරීන් වශයෙන් පුහුණු කරනවාට වඩා ඔවුන් පුහුණු කිරීම ඇත්තෙන්ම වඩා පහසු වනු ඇත.

යම් යම් කාණ්ඩවල පුද්ගලයින් සම්බන්ධයෙන් අනිවාර්යයෙන් ම බදු ලිපිගොනු තිබිය යුතු යැයි දැක්වෙන ඉන්දියානු ක්‍රමය

සමහර විට මෙහිදි අපට ප්‍රයෝජනවත් ආරම්භයක් වනු ඇත. මේ ආකෘතිය පදනම වී ඇත්තේ පහත සඳහන් අදාළ සුදුසුකම් 4න් ඕනෑම දෙකක් යම් පුද්ගලයෙකුට අදාල නම්, ඔහු බදු වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවය. ඒ කරුණු හතර නම්, යම් පුද්ගලයෙකුට නිවසක්, මෝටර් රථයක් හෝ දුරකථනයක් තිබීම හෝ පසුගිය වසර ඇතුළත පිටරට සංචාරයක යෙදී සිටීමය. ඒ අනුව බදු වාර්තා ගොනු කිරීමේ වගකීම අදාළ පුද්ගලයාට පැවරෙන අතර එසේ නොකිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. නිවසක්, වාහනයක් මිලදී ගන්නා පුද්ගලයින් යම් නිවසක් මිලදී ගන්නා විට පැවරුම් ඔප්පුවේ ද, වාහනයක් මිලදී ගන්නා විට වාහන පැවරීමේ ආකෘති පත්‍රයේ ද, දුරකථනයක් සඳහා ඉල්ලුම් කරන විට එකී ඉල්ලුම් පත්‍රයේ තමාගේ ආදායම් බදු අංකය සඳහන් කිරීම අනිවාර්යය කිරීමෙන් මේ ක්‍රමය පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකිය. මේ සියලු පුද්ගලයින් සඳහා ආදායම් බදු ලිපිගොනු විවෘත කරනු ලබන බව සහතික කිරීමට මේ සරල ක්‍රියා මාර්ගය නිසා හැකි වනු ඇත. ඉඩම් නිවාස පැවරීම් ලියාපදිංචි කරන පළාත් පාලන බල මණ්ඩලවලදී ඒ අදාළ ආදායම් බදු ලිපිගොනු අංක සඳහන් කිරීම නීතියෙන් අනිවාර්ය කිරීමෙන් එය ක්‍රියාත්මක වීම සහතික කළ හැකිය. වාහන හිමිකම් ලියාපදිංචි කරන අවස්ථා වලදී හෝ නව දුරකථන ලබාදෙන අවස්ථාවලදී පිළිවෙලින් මොටර් රථ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයාට සහ ස්ථිර දුරකථන මාර්ග හෝ සෙලියුලර් දුරකථන මාර්ග සම්බන්ධතා සපයන අයට මේ හා සමාන ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ හැකිය. සමහරවිට මේ ආකාරයේ ක්‍රමයක් ව්‍යාප්ත කිරීම මගින් කාලයක් යන විට 'මාර්ගස්ථ' (on-line) බදු ක්‍රමයක් වුවත් ආරම්භ කළ හැකි වනු ඇත. එහිදී බදු ගෙවන්නන්ගේ මෙන්ම ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ද පහසුව සඳහා විද්‍යුත් කේත ක්‍රමයක් සහිත කාඩ්පත් බදු ගෙවන්නන් සියලු දෙනාටම නිකුත් කළ හැකිය. එබඳු තොරතුරු පද්ධතියකින් බදු ගෙවන්නන් සහ දෙපාර්තමේන්තුව අතර සම්බන්ධතාවයට විශාල පහසුවක් සැලසෙනු ඇත.

වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් තමාගේ වගකීම ජනතාවට නිරන්තරයෙන් මතක් කර දීම සඳහා එබඳු යෝජනා ක්‍රමයක්

ක්‍රියාත්මක වීම පිළිබඳව මාධ්‍ය මගින් නිති පතා ප්‍රචාරයක් ලබා දිය යුතුය. බදු ලිපිගානුවක් ඇති විට බදු ගෙවන්නා සම්බන්ධයෙන් කටයුතු කිරීමට බදු නිලධාරිනට පහසු වන බව බදු නිලධාරීහු සියල්ලෝම දනිති. එබැවින්, බදු වාර්තා ඉදිරිපත් කිරීමට ජනතාවට බල කරන, සාපේක්ෂ වශයෙන් පහසු මේ ක්‍රමය මගින් බදු දැල, ක්‍රමයෙන් පුලුල් වූ විට, තක්සේරු කරන්නාගේ රාජකාරිය අඩු වශයෙන් තරමක් හෝ සරළ වනු ඇත.

# 5.2

# බදු ගෙවන්නන් ගණුදෙණුකරුවන් ලෙස සැලකිය යුතුය

'පෞද්ගලික අංශය ආර්ථික වර්ධනයේ යන්ත්‍රණය' යැයි ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් පවසනු අපට ඇසේ. එහෙත්, පෞද්ගලික අංශයේ කවරකු හෝ ආදායම් බදු දෙපාර්තමේන්තුව ඇතුලු රජයේ ඕනෑම ආයතනයකට ඇතුලු වුවහොත් ඔහු හෝ ඇය සැලකුම් ලබන්නේ මේ වර්ධන යන්ත්‍රයේ වැදගත් කොටසක් වශයෙන් නොව, කඩාකප්පල්කාරයකු හැටියටය. ඒ නිසා ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග කිසිඳු ගනුදෙනුවක් කිරීමට බොහෝ දෙනෙකු අකමැති වීම පුදුමයක් නොවේ.

ගණුදෙනුකරුවන් අපගේ කාර්යාලයකට ආ විට අපි ඔවුන් පිළිගෙන හොඳින් සලකන අතර ඔවුන්ට පහසුවත්, සංග්‍රහයත්, මිත්‍රත්වයත් ලබා දෙන්නෙමු. එහෙත්, රජයට හා රටට ආදායම් උපයන 'ගනුදෙනුකරුවන්' ආදායම් බදු දෙපාර්තමේන්තුවට පැමිණෙන විට, එබඳු පිළිගැනීමක් ලැබෙන්නේ නැත. ඊට හේතුව, දෙපාර්තමේන්තුව සමග ගනුදෙනු කරන පුද්ගලයින් 'ගණුදෙනු කරුවන්' වශයෙන් සැලකීමේ පුරුද්දක්, පුහුණුවක් හෝ ආකල්පයක් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට ලැබී නොතිබීමය. නිසි පරිදි උපදෙස් දීමෙන් මේ අඩුපාඩුව පහසුවෙන් ම නිවැරදි කළහැකි අතර එය හැකිතාක් ඉක්මනින් කිරීම අත්‍යාවශ්‍යය.

බදු ගෙවන්නන් සහ ආදායම් බදු දෙපාර්තමේන්තුව අතර වඩා හොඳ සන්නිවේදනයක් සහ සම්බන්ධයක් ගොඩනැගිය හැකි ක්‍රම රාශියක් ඇත. එයින් එකක් වන්නේ විද්‍යුත් තැපෑල සහ අන්තර්ජාලය වැනි ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් උපයෝගී කර ගැනීමය. එමගින් බදු සහ පරිපාලනය පිළිබඳ විමසීම් ද කළ

---

**2003.10.19 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

හැකි වනු ඇත. ආරම්භයේ දීම මේ ක්‍රමය ඉතාම පුළුල්ව භාවිත නොවිය හැකි වුවද මේ මාධ්‍ය උපයෝගී කරගෙන සන්නිවේදනය කිරීමට බදු ගෙවන්නන්ට සහ උපදේශකයින්ට අමතර ඉඩ ප්‍රස්ථාවක් සැලසෙන පරිදි මේ නව සංවර්ධනයන් ප්‍රායෝජනයට ගන්නේ නම් එය සැබැවින්ම උපකාරී වනු ඇත. ජනතාවට ප්‍රවේශය ලද හැකි විද්‍යුත් තැපැල් ලිපිනයක් සඳහා ප්‍රචාරය ලබා දීමට ආදායම් බදු දෙපාර්තමේන්තුව ඉදිරිපත් වන්නේ නම්, ආදායම් බදු ගෙවන්නන්ගේ අවශ්‍යතාවලට දෙපාර්තමේන්තුව ප්‍රතිචාර දක්වන බවට එය ඉඟියක් වනු ඇත. ආදායම් බදු නිලධාරීන් බදු ගෙවන්නන්ට උපකාරී වීමට සැදී පැහැදී සිටින බවත්, එසේ කිරීමට ඔවුන්ට හැකියාවක් ඇති බවත් බදු සම්මන්ත්‍රණ වලදී පැවසෙනු ඇසේ. කෙසේ වුවද එබඳු සේවාවක් ගැන දැනුමක් ලබා දීමට නම් බදු ගෙවන්නන්ට උපකාරී වීමට හැකි බදු නිලධාරීන්ගේ නම්, ධුරයන්, ඔවුන්ගේ දුරකථන අංක සහ හමුවිය හැකි ස්ථාන සඳහන් කළ යුතුය. ඒ හැරුණු විට, එබඳු උපකාර සහ පහසුකම් ලබාගත හැකි බවට නිසි ප්‍රතිචාරයක් ද ජාතික පුවත්පත්, රූපවාහිනිය හා ගුවන් විදුලිය මගින් ලබා දිය යුතුය.

වැදගත් ස්වරූපයේ විවාදාත්මක අපැහැදිලි බදු ගැටලු, බදු විශේෂඥයින් කණ්ඩායමකට යොමු කොට ගාස්තුවක් ගෙවා තීරණයක් හෝ අර්ථ නිරූපණයක් ලබා ගැනීමේ 'හදිසි ගැටලු නිරාකරණය කිරීමේ ඒකකයක්' පිහිටුවීමට ද බදු දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුය. එබඳු යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වුවහොත් බදු වාර්තා ගොනු කිරීමට පෙර, නිශ්චිත හා කලාත්මක අර්ථ නිරූපනයක් ලබා ගැනීමට බදු ගෙවන්නාට හැකි වනු ඇති අතර එය ඔහුට/ඇයට සිතේ සහනයක් ගෙන දෙනු ඇත. එවිට, ආදායම් බදු දෙපාතමේන්තු අඳුරේ සිට තමා අල්ලා ගැනීමට බලා සිටින්නේ යැයි බදු ගෙවන්නන් තුළ ඇතිවන බියමුසු හැඟීම පහ වනු ඇත. බදු අත්පොත් විධිමත් පරිදි ප්‍රකාශයට පත් කොට ඒවා පුළුල් ලෙස බෙදා හැරීමත් සිදුවිය යුතුය. ඒවා මිලදී ලබා ගත හැකි ස්ථාන පිළිබඳ පොදු මහජනතාවට දැනුම් දිය හැකි අතර ඒ සඳහා අන්තර්ජාලය ද භාවිත කළ හැකි වනු ඇත.

බදුකරණ ක්ෂේත්‍රයට අදාළ චින්තනය සහ නව නිති රීති පිළිබඳව බදු ගෙවන්නන්ට මෙන් ම උපදේශකයන්ට අවබෝධයක් ඇති කර ගත හැකි වන පරිදි, බදු ගෙවන මහජනයාට ද ආරාධනය කරගෙන සම්මන්ත්‍රණ හා සාකච්ඡා ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් නිතිපතා සංවිධානය කරනු ලැබිය යුතුය. මුදල් ඇමතිතුමා විසින් හැම අයවැය කතාවක දීම නව බදු යෝජනා ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසු, බොහෝ සංවිධාන හා සංගම් විසින් සම්මන්ත්‍රණ හා සාකච්ඡා සංවිධානය කරනු ලැබුවත්, ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් එවැන්නක් සිදු නොවේ. බදු පිළිබඳ වඩා හොඳ අවබෝධයක් සහ අනුකූලතාවක් සඳහා මහජනතාවට මේ පිළිබඳ තොරතුරු ලබා දීමේ මූලික වගකීම සැබැවින් ම පැවරී ඇත්තේ ඒ දෙපාර්තමේන්තුවට ය. ඒ නිසා තමන් ම සම්මන්ත්‍රණ සංවිධාන කිරීමෙන් මේ සම්බන්ධයෙන් සෘජු ප්‍රතිචාරයක් දැක්වීම මහජනතාවගේ ප්‍රශංසාවට නිසැකවම හේතු වනු ඇත.

පෞද්ගලික අංශයේ විශ්වාසය දිනා ගැනීම කෙරෙහි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා ද උනන්දුවක් දැක්විය යුතුය. ඊට හේතුව ඔහුගේ දෙපාර්තමේන්තුවේ ආදායම් පදනම පවත්වාගෙන යාම සහතික වනුයේ පෞද්ගලික අංශයේ අඛණ්ඩ වර්ධනය සහ ඵලදායී බව මගින් වීමය. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා පෞද්ගලික අංශයේ සියලුම ව්‍යාපාර ආයතනවල සැලකිය යුතු 'නින්දට වැටුණු' හවුල්කරුවකු වන නිසා, පෞද්ගලික අංශයට වැඩි ලාභ ලැබීම යන්නෙන් අදහස් වන්නේ ඔහුට ලැබෙන කොටස ද ඉහළ යාම ය.

බදු නිලධාරීන් ඉතිහාසය පුරාම ප්‍රසාදයට ලක් වූ පිරිසක් නොවේ. බයිබලයේ පවා ඔවුන් විස්තර වන්නේ එතරම් ප්‍රියජනක ආකාරයකින් නොවේ. එහෙත් ඔවුන්ගේ අඩු ජනප්‍රියත්වය සහ ඔවුන්ගේ රාජකාරියේ ප්‍රියජනකකම අඩුවීම කෙසේ වුවත් ඔවුන් සමාජයට කරන සේවය වැදගත් ය. විශේෂයෙන් ම අති විශාල ආරක්ෂක වියදම් මෙන් ම සෞඛ්‍යය, අධ්‍යාපනය, ආහාර සහනාධාර ආදී සමාජ ශුභසාධන වියදම් අධික අප වැනි රටක ඔවුන් සතු කාර්යභාරය විශාලය. අප සියලු දෙනාම දන්නා පරිදි ශ්‍රී ලංකාවේ ප්‍රධාන අභියෝගය වන්නේ රටේ අයවැය හිඟය අඩු කිරීමය.

ඒ නිසා දැනට සිටින සහ අනාගත බදු ගෙවන්නන්ට අනවශ්‍ය හිරිහැරයක් හෝ අපහසුවක් නොවන ආකාරයෙන් ආදායම් බදු එකතු කර ගැනීම යහපත් ආකාරයකින් වෙනස් වේ නම් එය සැබැවින් ම රටට බෙහෙවින් ඵලදායි වනු ඇත. එබැවින් බදු පදනම පුලුල් කිරීමේ අරමුණ උදෙසා බෙහෙවින් ම අවශ්‍ය වන සියලු ක්‍රියාමාර්ග ක්‍රියාශිලිව ගැනීමත් අඛණ්ඩව පවත්වාගෙන යාමත් වැදගත්ය.

# 5.3

## බදු සහන බදු ගෙවන්නන්ට පමණයි!

ශ්‍රී ලංකාවේ ආර්ථිකය 1977 දී විවෘත කිරීමෙන් පසුව, සෑම වසරක් පාසාම ආදායම් බදු ව්‍යුහය සරළ කිරීම සහ බදු අනුපාතය අඩු කිරීම සිදුවෙනු අප දැක ඇත. එම ද්විත්ව ක්‍රියාවලියන් තුළින්, සමස්තයක් වශයෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එකතු කර ගන්නා ලද මුලු ආදායම් බදු ප්‍රමාණයේ වර්ධනයක් සෑම වසරකම සිදු වී ඇති බවද අප දනිමු. මෙසේ බදු අනුපාතය අඩු කරනවාත් සමගම රැස්කර ගන්නා මුලු බදු ප්‍රමාණය වැඩි වීමේ ප්‍රවනතාවය, අප රට ඇතුලු බොහෝ රටවල අත්දැකීමය. මෙම ලක්ෂණය පරස්පර විරෝධී ලෙස පෙණුනද, රජයන් එම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට මූලික හේතුව වන්නේ බදු ව්‍යුහය සහ අනුපාතය ලිහිල් කරද්දී බදු ගෙවීට ඇති කැමැත්ත වැඩි වීමය. එහෙත් සෑම විටම පාහේ, අප රටේ ආදායම් බදු අනුපාතය අඩු කරන විට හෝ බදු සහන ලබාදෙන විට පැණ නගින මූලික චෝදනාවක් වන්නේ බදු සහන හෝ බදු අනුපාත අඩු කිරීම තුළින් "පොහොසත් සමාජය" වාසි භුක්ති විඳින අතර ඊට සාපේක්ෂව "දුප්පත් ජනතාවට" වාසි නොලැබෙන්නේ යයිය. මතුපිටින් විග්‍රහ කරන විට මෙම තර්කයේ යම් සත්‍යතාවයක් හෝ සාධාරණත්වයක් පෙනෙන්නට පුලුවන. එහෙත්, ඒ පිළිබඳව වඩාත් ගැඹුරුව සිතන්නට හැකිවන පරිදි පහත දැක්වෙන සරළ කතාව උපයෝගී කර ගතහොත්, බදු සහනවල සත්‍ය තත්ත්වය වඩාත් හොඳින් වටහා ගැනීමට පහසු වේ යයිද මා සිතමි.

සතියකට වරක් මිතුරන් දස දෙනෙකු රාත්‍රී භෝජනය සඳහා භෝජන ශාලාවකට යෑමට පටන් ගත්හ. භෝජනය සඳහා වැය වූ මුලු මුදල රු. 1,000 ක් විය. තමන්ගේ මූල්‍ය ශක්තිය අනුව

---

2004.07.25 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

එම මුදල මිතුරන් දස දෙනා අතර බෙදා ගැනීමට ඔවුන් එකඟ වූහ. ඒ අනුව, මිතුරන් අතරින් දුප්පත්ම පස්දෙනා කිසිවක් නොගෙවූහ. ඊට පසු, හය වැනියා රු. 20 ක්ද, හත් වැනියා රු. 40 ක්ද, අට වැනියා රු. 90 ක්ද, නව වැනියා රු. 270 ක් ද, දහ වැනියා (පොහොසත්ම පුද්ගලයා) රු. 580 ක්ද ගෙවූහ. මේ ආකාරයට බිල්පත බෙදාගෙන මිතුරන් දස දෙනා සතිපතා රාත්‍රී ආහාරය ලබා ගත්හ. වසරකට පමණ පසු අවන්හලේ අයිතිකරු, මිතුරන් දස දෙනාගේ දායකත්වය ගැන පැහැදී ඔවුන්ට වට්ටමක් දීමට තීරණය කළේය. ඒ අනුව, ඉදිරියේදී මුලු බිල්පත් අගය රු. 1,000 සිට රු. 800 දක්වා අඩු කරන බව ඔහු දැන්වූයේය. එවිට ලැබුණු රු. 200 ක වට්ටම මිතුරන් දස දෙනා අතර කෙසේ බෙදාගත යුතුද යන්න ප්‍රශ්නය පැණ නැගිය. පළමු පස්දෙනා මුල සිටම කිසිවක් නොගෙවූ නිසා එම වට්ටම ඔවුන්ට අදාල නැතැයිද, එය ඉතිරි පස්දෙනා අතර බෙදීම සුදුසු යයිද තීරණය විය. තවද, හය වැනියා කලින් ගෙවූ රු. 20 වෙනුවට, දැන් කිසිවක් නොගෙවීමෙන් තමා ගෙවූ කොටසෙන් 100 කින් ම නිදහස් වුණි. හත් වැනියා ගෙවූ රු. 40 වෙනුවට දැන් රු. 20 ක් පමණක් ගෙවීමෙන් 50% ක ඉතිරියක් ලබා ගත්තේය. අට වැනියා ගෙවූ රු. 90 වෙනුවට නව ක්‍රමය යටතේ රු. 60 ක් පමණක් ගෙවීමෙන් 33% ක ඉතිරියක් ලබාගත්තේය. ඒ අතර නව වැනියා ගෙවූ රු. 270 වෙනුවට අලුත් එකගත්වය යටතේ රු. 220 ක් පමණක් ගෙවීමෙන් 18% ක ඉතිරියක්ද "පොහොසත්ම පුද්ගලයා" වන දහ වැනියා කලින් ගෙවූ රු. 580 වෙනුවට දැන් රු. 500 ක් පමණක් ගෙවීමෙන් 14% ක ඉතිරියක්ද ලබා ගත්හ.

ඉහත කී ආකාරයට සති දෙකක් පමණ නව බිල්පත බෙදා ගනිමින් මිතුරන් දස දෙනා රාත්‍රී භෝජනය භුක්ති විඳිමින් සිටියදී එක් දවසක්, වට්ටම නිසා එකිනෙකාට හිමිවූ පෞද්ගලික වාසින් ගැන මිතුරන් සාකච්ඡාවේ යෙදුනහ. එවිට, හත් වැනියා කියා සිටියේ, මුලු වට්ටම වූ රු. 200 යෙන් මට ලැබුණු වට්ටම රු. 20 ක් පමණක් වූ අතර, දහ වැනියාට රු. 80 ක වට්ටමක් ලැබුණා කියාය. "ඔයා හරි" මල්ලි, යැයි හය වැනියා පැවසුවේය. "මටත් ලැබුණේ රු. 20 ක වාසියක් පමණයි. මගේ වාසියට

වඩා හතර ගුණයක් දහ වැනියාට ලැබිලා තියෙනවා". ඒ අතර අට වැනියා පැවසුවේ, "මට ලැබුණු වට්ටම රු. 30 ක් පමණයි" දහ වැනියාට රු. 80 ක ඉතිරියක් ලැබුනා. ඒක ඉතා අසාධාරණයි කියාය. නව වැනියාද, චෝදනා කලේ තමාට ලැබුණු ඉතිරියට වඩා දෙගුණයක් පමණ වට්ටමක් දහ වැනියාට ලැබුණු අතර එම තත්ත්වය ඉතා අසාධාරණ බවය. එවිට, මෙම ප්‍රකාශන වලට හොඳින් සවන් දී සිටි පළමු මිතුරන් පස් දෙනා කියා සිටියේ, "අපට කිසිම වාසියක් මේ වට්ටමෙන් ලැබුණේ නෑ. මේ ක්‍රමයෙන් පහර වැදුනේ දුප්පත් අපටයි. මේ වාසියෙන් අපට කිසි එලක් නෑ. මේක අපට විරුද්ධ කුමන්ත්‍රණයක්" කියාය. ඒ අනුව, මිතුරන් නව දෙනාම එකතු වී, දහ වැනියා වට කරගෙන ඔහුට පහර දුන්හ. ඊළඟ සතියේ, සුපුරුදු පරිදි රාත්‍රී භෝජනය සඳහා මිතුරන් නැවතත් රැස් වූහ. එහෙත්, එදින දහ වැනියා පැමිණ සිටියේ නැත. එසේ වුවද, ඉතිරි මිතුරන් නව දෙනා අවන්හලේ තම රාත්‍රී වේල ගත්හ. එහෙත්, භෝජනයෙන් පසු බිල්පත ගෙවීමේ අවස්ථාව එළඹුණු විට, ඔවුන්ට වැටහුණේ එම බිල්පතින් තුනෙන් පංගුවක්වත් ගෙවා ගැනීමට තමන් අත මුදල් නොමැති බවය.

ඉහත කී සරල කතාවෙන් පෙනුණු අන්දමට බදු සහනයක් ලබාදෙන විටද එහි වැඩි වාසිය අනිවාර්යයෙන්ම ලැබෙන්නේ වඩාත්ම බදු ගෙවන අය හෙවත් පොහොසත්ම අයටය. මෙම යථාර්ථය නිවැරදිව තේරුම් ගැනීමට අප පුරුදු විය යුතුය. අද අප රටේ බදු ගෙවන්නන් දෙස අප සියලු දෙනාම පාහේ බලන්නේ වපර ඇසකිනි. බොහෝ මැති ඇමතිවරුන්ද, රජයේ වගකිවයුතු පුද්ගලයන්ද ආදායම් බදු දෙපාර්තමේන්තුවද බදු ගෙවන ව්‍යාපාරිකයන් දකින්නේ ජාවාරම් කරුවන්, සොරුන්, වංචා කරුවන්, ශ්‍රමය සූරා කන්නන්, අහිංසක වැඩ කරන ජනතාව සූරා කන්නන්, දූෂිතයන්, අයුතු ලාභ ලබන කලු කඩ කරුවන් හෝ සමාජයට ද්‍රෝහි කරන පුද්ගලයන් ලෙසය. එවැනි වාතාවරණයක් නිසා, බොහෝ ව්‍යාපාරිකයන් ආදායම් බදු දෙපාර්තමේන්තුව ඇතුලු රජයේ ආයතන ගැන දැඩි කළකිරීමෙන් පසුවෙති. "පෞද්ගලික අංශය ආර්ථික වර්ධනයේ යන්ත්‍රය" යැයි ජ්‍යෙෂ්ඨ දේශපාලඥයින් සහ රාජ්‍ය නිලධාරීන් පවසති. එහෙත්,

යථාර්ථය නම් පෞද්ගලික අංශයේ කවරකු හෝ ආදායම් බදු දෙපාර්තමේන්තුවට හෝ රජයේ ඕනෑම ආයතනයකට ඇතුලු වුවහොත් ඔහු සැලකුම් ලබන්නේ මේ වර්ධන යන්ත්‍රයේ කොටසක් වශයෙන් නොව, කඩාකප්පල් කාරයකු හැටියටය. ඒ නිසා, ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග කිසිඳු ගනුදෙනුවක් කිරීමට බොහෝ දෙනෙකු අකමැති වීම පුදුමයක් නොවේ.

මෙම අශුභදායි පරිසරය වෙනස් කිරීමට නම්, ඉතා ඉක්මණින්ම බදු ගෙවන්නා යනු "සතුරකු" නොව, ගනුදෙනුකරුවකු යන හැඟීමෙන් බදු නිලධාරිහු බදු ගෙවන්නන් සමග කටයුතු කළ යුතුය. එසේ නම්, එවැනි ආකල්ප බදු නිලධාරීන් තුළ ඇති කිරීම දැන් ඉතා අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි.

සමහරුන්ගේ සිත් තුල සැඟවී ඇති "ධනවත්කම අපරාධයකි" යන අදහස දැන්වත් අප සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ යුතුය. අප බොහෝ දෙනා පොහොසත් වන්නට කැමතිය. පොහොසත්කම නැති කිරීමෙන් දිළිඳුකම තුරන් කරගත නොහැකි බව අප පිළිගත යුතුය. එපමණක් නොව, ව්‍යාපාරික ප්‍රජාව ඇත්ත වශයෙන්ම ඕනෑම රටක විශේෂ තැනක් ගත යුතු බවද, එය රටේ වැදගත් සම්පතක් බවද අප හොඳින් වටහා ගත යුතුය. රටේ බහුතර දෙනාට රැකියා සපයන්නේද, භාණ්ඩ සහ සේවාවන් සපයන්නේද, අවශ්‍ය විදේශ විනිමය ලබාදෙන්නේද, ආර්ථික වර්ධනයට දායක වන්නේද, තමන් සතු දේපොළ උකසට යට කරමින් ව්‍යාපාරික අවදානම (Business risk) විඳින්නේද, ඔවුන්ය. ව්‍යාපාර ප්‍රජාව හීන කිරීමෙන් හෝ දුර්වල කිරීමෙන් හෝ අධෛර්යමත් කිරීමෙන් රටක් ගොඩනැංවීමට නුපුලුවන. හැකි සෑම ක්‍රමයක් සහ උපාය මාර්ගයක් හරහාම අප රටේ ව්‍යාපාරිකයන් දිරිගැන්වුවහොත් රටේ දැවෙන ආර්ථික ප්‍රශ්න රාශියකටම නොදැනුවත්වම වාගේ විසඳුම් ලැබෙනු ඇත. එම යථාර්ථය අප කිසිදාක අමතක නොකළ යුතුය.

මේ සම්බන්ධයෙන් ඒබ්‍රහම් ලින්කන් ජනාධිපතිගේ වචන අදාළ යයි මා සිතමි. "සමහරෙකු ධනවත් වීමෙන් පෙන්නුම් කරනුයේ අනෙක් අයටද ධනවත් විය හැකි බවය. ඒ නිසාම, මහන්සි වී වැඩ කිරීමට එය ආදර්ශයක් විය යුතුය".

# 6

හයවන කොටස

# කළමනාකාරීත්වය

# 6.1

# මනා කළමණාකාරිත්වය සෑම මට්ටමකින්ම සිදුවිය යුතුය

2000 වසරේදී ශ්‍රී ලංකාවේ ගැටලු ගැන සඳහන් කරමින් ලෝක බැංකු උප සභාපතිනි මිකෝ නිෂිමුසු මහත්මිය පැවසුවේ ශ්‍රී ලංකාව මුහුණ දෙන බරපතලම ප්‍රශ්නය අයහපත් පාලනය බවය. මම ඊට සම්පූර්ණයෙන්ම එකඟ වෙමි. පලාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් "ඇතුලේ සිට" නිරීක්ෂණය කළ අයකු හැටියට අපේ පාලන ක්‍රමවල සහ ව්‍යුහයන් හි නාස්තිය, අකාර්යක්ෂමතා සහ අකර්මන්‍යභාවය මම දැක ඇත්තෙමි. මේ ව්‍යුහයන් නැවත සකස් කොට ප්‍රාණවත් කළ යුතුය යන්න පසුගිය වසර කිහිපය තුළම මා පෙන්වා දී ඇති අතර "නිමැවුම් පදනම් කරගත් ක්‍රම" (output based system) පසු සමාලෝචනය කිරීම, ක්‍රියා මාර්ග සරළ කිරීම, (simplificaltion) මෙහෙවර අනුව ක්‍රියාත්මක වන ආයතන බවට සංවිධාන පත්කිරීම, (mission driven organisations) ක්‍රියාකාරිත්වය පදනම් කරගත් පිරිවැය කරණය (Activity based costing) සහ ශූන්‍ය පාදක අයවැය (zero based budgeting) ආදිය ඇතුළත් විධිමත් පරිදි වගකීමේ ක්‍රමවේදයන් අනුව කටයුතු කිරීම මෙම විවිධ ක්‍රියා මාර්ග වලින් සමහරකි.

එහෙත් පවත්නා තත්ත්වය වෙනස් කිරීම සඳහා මේතාක් කල් සැළකිය යුතු කිසිවක් ම සිදු වී නැති තරම්ය. කෙසේ වුවද, පසුගිය වසරේ අයවැය ඉදිරිපත් කරමින්, මුදල් අමාත්‍යවරයා කළ ප්‍රකාශයක් මගේ දැඩි සතුටට හේතු විය. එහිදී එතුමා සඳහන් කලේ "නිමැවුම් පදනම් කරගත්" ක්‍රමයක් කරා රජය යොමු කිරීමට ඔහු තැත් කරන බවය. මෙය බෙහෙවින් ප්‍රමාද වී ඇති ප්‍රතිචාරයක්

---

**2004.07.27 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

වුවද, එය ඉක්මණින්ම ක්‍රියාවට නැංවිය හැකිනම් ඉතා යෝග්‍ය යයි මගේ අදහසයි.

ශ්‍රී ලංකාව යථා තත්ත්වයට පත් වීමට නම් නව ක්‍රියා මාර්ග සහ උපාය මාර්ග අත්‍යාවශ්‍ය ය. ඒ සමගම, ඉදිරි වර්ෂ කිහිපය තුළ දී සැබෑ ආකාරයේ තිරසාර සංවර්ධනයක් ලබාගැනීමට නම් අප අනලස්ව අනුගමනය කළ යුතු පූර්ව කොන්දේසි දෙකක් තිබේ. ඉන් පළමු වැන්න අපේ ඵලදායකත්වයේ වැඩි දියුණුව සහතික කිරීමය. මනා පුහුණුව ලබා දීමෙන් සහ මනා පිළිගැනීමට ලක් වූ ඵලදායකත්ව ප්‍රතිමානයන් හා ශිල්ප ක්‍රම, පූර්ණ තත්ත්ව කළමනාකරණ ක්‍රියාමාර්ග හා තත්ත්ව කව හඳුන්වා දීමෙන් සහ අපේ ශ්‍රමික පිරිස තුළ මනා කාර්ය සදාචාරයන් ඇති කිරීමෙන් අපට මෙය කළ හැකිය. ඊළග වැදගත් පූර්ව කොන්දේසිය වන්නේ අපේ කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට පාලනය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දීමය. අපේ සුලු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් බොහෝ දෙනා සිය ව්‍යාපාර පිළිබඳ යමක් දැන සිටියත් පාලනය හෝ මූල්‍ය කළමනාකරණය, පිළිබඳව ඔවුන්ට ඇත්තේ ඉතා අල්ප දැනුමකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් වැඩි දෙනා ඉක්මණින්ම කරදරයට පත් වන අතර සිය ව්‍යාපාරවලින් පාඩු ලබා අනෙකුත් වත්කම් හා දේපළ ද අහිමි කර ගනිති. බොහෝ දෙනෙකුට එය සිදුවනු මම දැක ඇත්තෙමි. ණය ලබා දීමට පෙර මූල්‍ය කළමනාකරණය, අලෙවිකරණය, සහ අනෙකුත් කළමනාකරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කෙටි කාලීන පුහුණු පාඨමාලා පැවැත්වීමෙන් සියලුම බැංකු මේ ගැටලුවට ධනාත්මක ප්‍රතිචාරයක් දක්වනු දැකීමට මම කැමැත්තෙමි. ඒ හරහා සුලු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට හොඳ පුහුණුවක් ලැබේ නම්. ඉදිරියේ ඇති අභියෝග වලට සැබෑ ලෙසම මුහුණ දීම සඳහා පෞද්ගලික අංශය සූදානම් කිරීමට එය බෙහෙවින් ඉවහල් වනු ඇත.

පසුගිය 25 වසර දෙස ආපසු හැරී බලන කළ සතුටු වීමට තරම් දෙයක් ශ්‍රී ලංකාව ලබා නොමැත. ඇත්තෙන්ම, අප රටේ ජනතාවගේ ජීවන තත්ත්වය වඩා යහපත් කිරීමට අපි සෑහෙන

යමක් කර නැත්තෙමු යි යන හැගීම නිසා අප ලැජ්ජා විය යුතුය. කෙසේ වුවත්, පසුගිය වසර 25 න් පාඩම් උගෙන, අප සියල්ලන්ටම ආඩම්බර විය හැකි රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා වඩා මහන්සියෙන් හා හොඳින් වැඩ කිරීමට අපි අදිටන් කර ගත යුතුය. අපේ දරුවන් කුසගින්නේ දුක් විඳිද්දී බණ කීම හා නිදහසට කරුණු කීම නිෂ්ඵලය. අවශ්‍ය වන්නේ පූර්ව සැලසුම් සහිත නිමැවුම් ඇති කිරීමත් අප ජනතාවට පුලුල් වශයෙන් අවස්ථා ලබා දීමය. අප සියල්ලන්ම, විශේෂයෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයන් මෙය සිහි තබා ගත යුතු ය, අප රට වැසියන්ගේ කුසට අහරත් අතට වැඩත් ලැබීම සහතික කිරීම සඳහා තමන්ට හැකි හැම දෙයම අපේ ප්‍රතිපත්ති සම්පාදකයින් ඉටු කළ යුතුය. එසේ වන්නේ නම්, කවර හෝ වෙනස්කම් තිබුණත්. ජාතියේ සමස්ත ආදායම ඉහළ නංවන අතරම ජාතිය ගොඩ නැගීමේ ප්‍රයත්නයට පූර්ණ වශයෙන් සහභාගි වීමට ඒ හැම දෙනාටම හැකි වනු ඇත.

# 6.2

# ප්‍රතිඵල ඉලක්ක කරගත් පාලනයකට පිවිසෙමු

වර්තමාන යුගයේ පාලනය හරහා ජනතාව අපේක්ෂා කරන්නේ ප්‍රතිඵලය. එහෙත් අද ශ්‍රී ලංකාවේ පවතින පාලනයේ දී සැබැවින් ම සමස්තයක් වශයෙන් සිදු වන්නේ එක් එක් ආයතන පාලනයක් සිදු කරනවා යයි කියමින්, සම්පත් රාශියක් පරිහරණය කිරීම යයි බොහෝ දෙනාගේ මතයයි. රජය සහ රජයේ නියෝජිතායතන සෑම අවස්ථාවකදීම පාහේ තමන්ගේ අවධානය යොමු කරන්නේ 'නිමැවුම' (output/outcome) කෙරෙහි නොව, 'යෙදවුම්' (input) කෙරෙහි බව අපට පෙනේ. නිදසුනක් වශයෙන් රෝහල්වල තිබෙන ගොඩනැගිලි, වැටුප් ලේඛනයේ අඩංගු කාර්ය මණ්ඩලය සහ අපේක්ෂිත රෝගීන් සංඛ්‍යාව පදනම් කර ගෙන රෝහල්වලට අරමුදල් වෙන් කරනු ලැබේ. එසේ නැත්නම් අපරාධවලට එරෙහි ව කටයුතු කිරීමට අවශ්‍යයැයි සැලකෙන, සේවයේ යොදවනු ලැබ ඇති පොලිස් නිලධාරීන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය පදනම් කර ගෙන පොලිස් දෙපාර්තමේන්තුවට මුදල් වෙන් කරනු ලැබේ. මේ හැම අවස්ථාවක දීම ප්‍රතිඵල හෝ නිමැවුම් කෙරෙහි යොමු වන්නේ ඉතා මද අවධානයකි. රෝගීන් ගැන සැලකිල්ලක් නැතුව ඔවුන් මිය ගියත් සමහර විට රෝහල් ඒ ගැන නොසැලකිමටත්, ඉහළ යන අපරාධ රැල්ල ගැන පොලිසිය නොසැලකිමටත් මෙම ක්‍රමය තුඩු දී ඇත. එය පුදුමයක් නොවේ. එයට හේතුව යම් 'ප්‍රතිඵල' ලබා දෙන, එබඳු නිර්ණායක මත ආයතනයේ සේවකයන්ගේ කාර්ය සාධනය අගැයීමට ලක් කරන ලෙස කවුරුවත් පෙළඹී වීමක් නොවීම ය. මෙම ක්‍රමය යටතේ සමහර විට, රෝගීන් සුවකිරීමට අසමත් රෝහලකට මෙන්ම ප්‍රදේශයේ අපරාධ මර්දනයට අසමත් අකාර්යක්ෂම පොලිසියකටද

---

2004.07.25 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

වෙන් කෙරෙන මුදල් ප්‍රමාණය වැඩි වීමටද ඉඩ ඇත. ඊට හේතුව, වැඩියෙන් මුදල් ලබා දුනහොත් වඩා හොඳ ප්‍රතිඵල පෙන්වීමට ඒවාට හැකි වනු ඇතැයි අද සමාජයේ සහ රජයේ සිතිම විය හැකිය.

ඒ නිසා අද අපට අවශ්‍යව ඇත්තේ 'යෙදවුම්' මත අරමුදල් ලබා දීමේ ක්‍රමයක් නොව 'ප්‍රතිඵල' මත අරමුදල් ලබා දීමේ ක්‍රියාපටිපාටියකි. බලාපොරොත්තු වන ප්‍රතිඵල අනුව ආයතනවලට අරමුදල් සැපයේ නම්, සිය කාර්ය සාධනය ගැන සැලකිලිමත් වීමට ඒවාට අනිවාර්යයෙන්ම සිදු වේ. අද ශ්‍රී ලංකාවේ ප්‍රතිඵල මැනෙන්නේ කලාතුරකිනි. ඒ හැරුණු විට, රජයේ කිසිවකුත් ප්‍රතිඵල හෝ සාධනයන් ගැන කනස්සලු නොවන අතර, සිය සේවකයින්ට ප්‍රතිලාභ පිරිනමන්නේ ඔවුන්ගේ සේවා කාලය හෝ සුදුසුකම් හෝ ඔවුන්ගේ මට්ටම් හෝ අනුවය. ඒ නිසා රජයේ සේවකයින් ප්‍රතිඵල ගැන අනවශ්‍ය ලෙස කනස්සලු නොවී තම සුදුසුකම් වැඩිදියුණු කොටගෙන ප්‍රතිලාභ ලැබීමට ක්‍රමයෙන් හිණි, මගේ ඉහළට නැගීමට තැත් කිරිම ගැන අප පුදුම විය යුතු නැත. ඔවුන්ගේ දෘෂ්ටි කෝණය අනුව, පවත්තා ක්‍රමය ඔවුන් යොමු කරන්නේ ඒ දිශාවට ය. ඒ නිසා ඔවුන්ගේ දොස් දැකිම අසාධාරණය. වරද ඇත්තේ අනුගමනය කරනු ලබන පාලනය සහ අප හැඩ ගැසී ඇති පාලන ක්‍රමය තුළ ය.

'නිමැවුම්' හෝ 'ප්‍රතිඵල' පදනම් කර ගත් ආදර්ශ පාලන ක්‍රමයක් නවසිලන්තයේ ඉතා හොඳින් වර්ධනය වී තිබේ. 1996 දී නවසිලන්ත භාණ්ඩාගාරය සිය සමස්ථ පාලන ක්‍රමයේම අවධානය 'යෙදවුම්' මගින් මෙහෙය වනු ලැබීමේ සිට 'නිමැවුම් සහ ප්‍රතිඵල' පදනම් කරගත් ක්‍රමයක් දක්වා වෙනස් කළේ ය. 'යෙදවුම්' යන්න හඳුනා ගනු ලැබ ඇත්තේ භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා වන සම්පත් වශයෙනි. 'නිමැවුම්' යනු අදාළ අමාත්‍යාංශවලින් අරමුදල් සැපයෙන හා අපේක්ෂිත භාණ්ඩ හා සේවා ය. 'ප්‍රතිඵල' යනු සමාජය අපේක්ෂා කරන හෝ සැලකිල්ලක් දක්වන පරිදි ප්‍රජාවන් කෙරෙහි එකී නිමැවුම් වල බලපෑම් ය. 'නිමැවුම්' වලට රජයෙන් අරමුදල් සැපයිම මගින්, බදු සහ අනෙකුත් ගාස්තු වශයෙන් සමාජය විසින් ගෙවනු ලබන මුදල් සහ ප්‍රතිඵල අතර

සෘජු සම්බන්ධයක් ගොඩනැගේ. රජය ක්‍රියාත්මක වන්නේ අතරමැදියා හෝ භාණ්ඩ හා සේවා වශයෙන් නිමැවුම් මිලදී ගන්නා වශයෙනි. තමන්ට පවරනු ලබන අරමුදල් භාවිත කරමින් එකී නිමැවුම් ලබා ගන්නා බව සහතික කිරීමේ වගකීම් කැබිනට් අමාත්‍ය වරුන්ට තනි තනිව පැවරේ. උදාහරණයක් වශයෙන් 'මාර්ග අනතුරු සංඛ්‍යාව' අඩු කිරීම හෝ 'අපරාධ අඩු කිරීම' යන ප්‍රතිඵල ලබා ගැනීම පිණිස පොලිස් දෙපාර්තමේන්තුවේ 'නිමැවුම්වලට' අරමුදල් සැපයීම හෝ ගෙවීම් රජයෙන් සිදුවනු ඇත. එසේම, 'ළදරු මරණ අනුපාතිකය අඩු කිරීම' හෝ 'ක්ෂය රෝග හෝ මැලේරියා පැතිරීම අඩුකිරීම' සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ 'නිමැවුමට' රජය අරමුදල් සම්පාදනය කළ හැකිය. ඇත්ත වශයෙන්ම, ඉලක්කයක් පැහැදිලිව නිශ්චය කරගනු පිණිස මේ විශේෂිත නිමැවුම් වල යම් ප්‍රමාණාත්මක වටිනාකම්ද ඇතුළත් විය හැකිය. ඒ අනුව සමස්ත සංකල්පයම කලින් ප්‍රකාශ කරන ලද 'රෝහල් වලට අරමුදල් සැපයීමේ' හෝ 'පොලිස් ස්ථාන රාශියකට අරමුදල් සැපයීමේ' තත්ත්වයේ සිට ලබා ගැනීමට අපේක්ෂිත අලුතින් විශේෂිතව සඳහන් වන සහ මැනිය හැකි ප්‍රතිඵල සහ නිමැවුම් දක්වා සමස්ත සංකල්පයම දැන් වෙනසකට භාජනය වනු ඇත. මේ අනුව, අදාළ අමාත්‍යාංශයෙන් හෝ දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත නිමැවුම් වලට වැඩියෙන් ලබා ගෙන ඇති නිමැවුම් හා ප්‍රතිඵල අනුව එය තක්සේරුවට ලක් වෙනු ඇත අදාළ කැබිනට් අමාත්‍යවරයා සමග භාණ්ඩාගාරය වාර්ෂික ගිවිසුමකට එළඹීමෙන් නවසීලන්තයේ වගකීමේ රාමුවක තව දුරටත් නිළ තත්ත්වයක් ලැබේ. ඒ ගිවිසුමේ පැහැදිලිව සඳහන් වන්නේ, එහි විශේෂිතව සඳහන් කර ඇති 'නිමැවුම්' ලබා ගැනීමට අරමුදල් සම්පාදනය කරනු පිණිස අදාළ අමාත්‍යාංශයට භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා දෙන බව ය.

බොහෝ ජාතීන්, රාජ්‍ය ආණ්ඩු සහ පළාත් පාලන අධිකාරීන් අද මේ සංකල්පය සහ ආකෘතිය අනුගමනය කරනු පෙනේ. ඒ අතරම, මේ පසුබිම තුළ පාලනයට සම්බන්ධ වී සිටින අය සිය කාර්ය සාධනය මැනීමට ලක් වන බව දන්නා විට, වඩා හොඳින් කාර්ය භාරය ඉටු කිරීමට ද පෙළඹෙති.

ප්‍රතිඵල ඉලක්ක කරගත් පාලන ක්‍රමයක් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන්නේ නම්, එබඳු ක්‍රියා මාර්ගයක් මුලින් ක්‍රියාත්මක කළ හැකි ප්‍රධාන ආයතන කිහිපයක් අප තෝරා ගත යුතුයැයි මම යෝජනා කරමි. ඒ ආයතන රටේ ආර්ථිකය සහ/හෝ ජනතාවගේ සමාජ ජීවිතය කෙරෙහි විශාලම බලපෑම ඇති කරන ඒවා විය යුතු ය. එවිට, 'නිමැවුම්' පදනම් කරගත් ආකෘතියක් අනුව ක්‍රියාත්මක වන පරිදි ඒවා 'ප්‍රතිනිර්මාණය' කළ හැකිය. ඉන් පසුව, කල් යාමේ දී ශ්‍රී ලංකාවේ පාලන ක්‍රියාවලිය ප්‍රතිඵල ඉලක්ක කර ගත් ක්‍රියාවලියක් කරා පරිවර්ථනය විය හැකි පරිදි, අනෙකුත් ආයතනවලට අනුගමනය කළ හැකි ආදර්ශයන් බවට පත් විය හැකි ය.

# 6.3

## අවදානම ගැන අවධානය යොමු කරමු...

'මගේ ව්‍යාපාරය දරුණු අකරතැබ්බයකට හසුවුණා' 'මම මේ ගැන සිතලා සිටියා නම් මට එයින් ගැලවෙන්න තිබුණා.... අනේ! අපරාදේ!' ව්‍යාපාරිකයන්, දරුණු ගැටලු වලින් මිරිකෙන අවස්ථාවලදී මෙවැනි විලාප නගනවා අප අසා තිබේ. අද ලෝකය නිරන්තරයෙන්ම වෙනස් වෙමින් පවතී. මෙම වෙනස්කම් හරහා ව්‍යාපාරවලට මුහුණ දෙන්නට සිදුවන අවදානම් බහුලය, පුලුල්ය, දරුණුය, සංකීර්ණය. සමහර අවදානම් හරහා ව්‍යාපාරයට සිදුවිය හැකි අවාසින් සහ විපාක සුලු හෝ මධ්‍යම පරිමාණයේ ඒවා විය හැකි වන අතර, තවත් සමහර සිද්ධීන් හරහා ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම පාහේ වැටෙන තත්ත්වයකටද පත්විය හැකිය.

මෙවැනි වාතාවරණයක් ලෝකයේ පැවතුණද අවදානම පිළිබඳව අප රටේ ව්‍යාපාරිකයන් තුල ඇති අවධානය ඉතා අඩු එකක් වීම කණගාටුවට කරුණකි. අවදානම තුරන් කිරීමට අපට නොහැකිය. එහෙත්, අවදානම පිළිබඳව අපගේ විශේෂ සැළකිල්ල යොදවමින්, එයින් සිදුවිය හැකි පාඩු සහ අවාසි ගැන සුපරීක්ෂාකාරී විග්‍රහයක් කරමින්, අවදානම යම් මට්ටමකට හෝ පාලනය කර ගැනීමට අපට හැක. ඒ අතරම, අවදානමෙන් සිදුවිය හැකි පාඩුව හෝ අවාසිය විඳදරා ගැනීමට හැකිවන පරිමාණයට අවම කර ගැනීමටද අපට කටයුතු කළ හැකිය. මේ ආකාරයට, අවදානම් පාලනය (Risk Management) අද ව්‍යාපාර ලෝකයේද බොහෝ රටවලද, ආයතනවලින්ද සිදුවන විශේෂ කාර්ය භාරයකි.

අවදානම ගැන විශේෂ විග්‍රහයක් කරන්නේ නම් අපට පෙනෙන්නේ ඕනෑම ව්‍යාපාරයක් ඉදිරියේ ප්‍රශ්න රාශියක් තිබිය හැකි බවය. ඒවා අතර, සාමාන්‍යයෙන් වැදගත් යයි සැලකෙන සමහර අවදානම්

---

2004.01.25 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙලෙහි පළවූ ලිපියකි.

පිළිබඳව යම් දැනුමක් ඇතිකර ගැනීම යෝග්‍ය යයි මා සිතමි. ව්‍යාපාරික අවදානම (Business Risk) නම් එම ව්‍යාපාරයට අදාළ වෙනත් තරගකරුවන්ගේ, සැපයුම්කරුවන්ගේ සහ ගණුදෙනුකරුවන්ගේ කටයුතු කිරීමේ ස්වභාවයේ වෙනස්කම් ඇතිවීම හේතුකොටගෙන පැණ නගින අවදානම්ය. රටේ අවදානම (Country Risk) ලෙස හැඳින්වෙන්නේ රටතුල පවතින දේශපාලනික සහ සමාජීය තත්ත්වය හරහා පැණ නගින අවදානම් තත්ත්වයන්ය. වෙළඳ පොලේ සහ බැංකු ක්ෂේත්‍රයේ පවතින අවදානම නම් පොළී අනුපාත, විනිමය අනුපාත, රක්ෂණ අනුපාත බදු සහ අනිකුත් ගාස්තු වල සිදුවිය හැකි අඩු වැඩි වීම් හරහා ඇතිවිය හැකි වෙනස් වීම්ය. ණය අවදානම (Credit Risk) ලෙස අදහස් කෙරෙන්නේ ණය ලබාදීම සහ ණය ආපසු නොගෙවීම නිසා පැණ නගින අවදානම් තත්ත්වයන්ය. ද්‍රවශීලතා අවදානම (Liquidity Risk) නම්, මුදල් පාලනය දුර්වල මට්ටමකට වැටීම හේතුකොටගෙන සිදුවිය හැකි මුදල් ද්‍රවශීලතා අවදානමය. මෙහෙයුම් අවදානම (Operational Risk) ලෙස හඳුන්වන්නේ ව්‍යාපාරයේ කටයුතු සහ අභ්‍යන්තර පාලනයේ යම් කඩා වැටීමක් හරහා සිදුවිය හැකි වංචා සහ දූෂණ වලින් පැණ නැගිය හැකි අවදානම්ය. නීති අවදානම (Legal Risk) නම් යම් කොන්ත්‍රාත්තුවක් හෝ වගකීමක් පැහැර හැරීම හෝ නිසි පරිදි සිදු නොවීම නිසා ව්‍යාපාරයට මුහුණ දෙන්නට සිදුවිය හැකි අවදානම්ය. ඉහත පැහැදිලි කොට ඇති ආකාරයට සහ තවත් විවිධ ආකාර වලට, අවදානම් රාශියකට ඕනෑම ව්‍යාපාරයක් භාජනය විය හැකිය. ඒ අතරම එම අවදානම් පිළිබඳව මනා අවබෝධයක් ඇතිකර ගනිමින් ඒවාට සුදුසු ප්‍රතික්‍රියා කල් සිටම සකස් නොකර තිබුණේ නම්, ඒවා හරහා ව්‍යාපාරයකට දරුණු ප්‍රශ්න මතුවිය හැකිය.

එසේ නම්, මෙවැනි අවදානම් වලට මුහුණ දීමට ව්‍යාපාරිකයන් කුමක් කළ යුතුද? අවදානම් පාලනය යන විෂය පිළිබඳව පුලුල් විග්‍රහයන් කොට ඇති විශේෂඥයින්ගේ මතය අනුව, ව්‍යාපාරිකයන් පළමුකොටම අවදානම ගැන මනා අවබොධයක් ඇතිකර ගත යුතුය. දෙවනුව, ව්‍යාපාරය ඉදිරියේ ඇති අවදානම් ඉතා දරුණු (High risk), තරමක් දරුණු (Medium risk) සහ අඩු දරුණු (Low risk) යනාදි වශයෙන් ඒවා වර්ග කර ගත යුතුය. තෙවනුව,

එම අවදානම් වලට මුහුණදීමට සිදුවුවහොත් ඒවායින් පැණ නගින විපාක වල දරුණු භාවය (Impact of risk) අනුව, ඒවා වර්ග කිරීමකට භාජනය කළ යුතුය. ඒ ආකාරයට සිදුවිය හැකි විපාක, ඉතා දරුණු, තරමක් දරුණු, සහ සුලු විපාක වලට තුඩුදෙන අවදානම් ලෙස වර්ග කළ යුතුය. සිව්වෙනුව, වඩාත්ම දරුණු විපාක වලට ව්‍යාපාර ලක් කළ හැකි දරුණු අවදානම් (High risk/High impact) ගැන ඉතා කිට්ටු අවධානයක්ද, අවදානම්වල දරුණු භාවය සහ එවායින් සිදුවන විපාක වල බැරෑරුම් භාවයේ අඩුවීමත් සමගම, එම අවදානම් වලට දක්වන අවධානය ක්‍රමයෙන් අඩුකර ගැනීමෙන්ද, සැළැසුම් සහගතව මෙම ගැටලුව දෙස ව්‍යාපාරිකයාට තම සිත් යොමු කළ හැකි වන්නේය. එසේ කිරීමෙන් තම ව්‍යාපාරයන්ට අහිතකර වන යම් විපාක වලින් මිදෙන්නට හෝ වැලකෙන්නට ඔවුන්ට ක්‍රම සහ විධි නිර්මාණය කර ගැනීමට හැකි වන්නේය. එවැනි ක්‍රියා මාර්ගයකට හෝ විනයකට ව්‍යාපාරිකයින් පුරුදු වීමෙන් තමන්ගේ ව්‍යාපාර කටයුතු වඩාත් සාර්ථක ලෙස කරගෙන යාමටද ඔවුහු පෙළඹෙන්නෝය.

අවදානමක් නොමැති ව්‍යාපාරයක් නොමැත. සෑම ව්‍යාපාරයකම අවදානමක් අඩංගුය. එහෙත් එම අවදානම හැකි පමණින් අවම කර ගැනීමට හෝ පාලනය කර ගැනීමට සෑම විටම ව්‍යාපාරිකයින් කටයුතු කළ යුතුය. එලෙස කටයුතු කරද්දී, සාමාන්‍යයෙන් භාවිතා කළ හැකි මෙවලම් කිපයකි. ඒවායින් විශේෂ එකක් නම් ව්‍යාපාරය වෙනුවෙන් සෑම අංගයක්ම ආවරණය වන ලෙස සකස් කරන දිගු කාලීන සැළැස්මකි. එවැනි සැළැස්මක් පිළියෙළ කරද්දී ව්‍යාපාරය ඉදිරියේ ඇති අවදානම අවම කෙරෙන ලෙස කටුයතු ඉබේම පාහේ සකස් වීම ස්වභාවිකය. ව්‍යාපාරයේ ණය දීම, සම්පත් ආරක්ෂා කර ගැනීම සහ සේවක සහ ගණුදෙනු පද්ධතීන් තුළ තිබිය යුතු අභ්‍යන්තර පාලන (Internal control) ක්‍රම සහ කටයුතු මාර්ග ශක්තිමත් කර ගැනීමෙන්, මෙම අවදානම් තත්ත්වයන් අවම කර ගත හැකිය. ඒ අතරම, සමහර අවදානම් සඳහා රක්ෂණ ලබාගත හැක. ඒවා සඳහා අවශ්‍ය රක්ෂණ කල් තියාම ලබා ගැනීම කාර්යක්ෂම ව්‍යාපාරයක් පවත්වාගෙන යන ඕනෑම කෙනෙකු සැළකිල්ලකින් කරන ක්‍රියාවකි. අද ව්‍යාපාර

සමාජයේ අවදානම් රාශියක්ම රක්‍ෂණයට යටත් කළ හැක. එසේනම්, එම අවදානම් රක්‍ෂණ ක්‍රම වලින් ආවරණය කරමින් තම ව්‍යාපාරයන් අවශ්‍ය ලෙස සුරැකීමටද, ව්‍යාපාරිකයින් වගබලා ගත යුතුය.

ව්‍යාපාරයක කඩා වැටීම මුලු රටේ ආර්ථිකයටම ප්‍රශ්නයකි. ව්‍යාපාර නිසිලෙස පවත්වාගෙන යාම තුළින් මුලු රටටම ප්‍රයෝජනයක් ඇති වන්නේය. ව්‍යාපාර සුදුසු ලෙස රැකගනිමින්, ඒවා ආරක්‍ෂා කර ගනිමින් රටේ ආර්ථික පදනම ශක්තිමත් කර ගැනිමට අප කටයුතු කරන්නේ නම්, අප සියලු දෙනාටම එය විශේෂ වාසියක් වන්නේය.

# 7

හත්වන කොටස

# අධ්‍යාපනය සහ රැකියා

# 7.1

## විරැකියා උපාධිධාරීන්ට වැයවූ කෝටි 900 යේ වගකීම කාටද?

අප සියලු දෙනාම විටින් විට අපේ සිත් යොමු කරන අප රටේ පවතින එක් දැවෙන ප්‍රශ්නයක් නම් විරැකියාවෙන් පෙළෙන උපාධිධාරීන්ය. පසුගිය දශක දෙක තුල රට පාලනය කළ රජයන් සියල්ලම පාහේ මෙම ගැටළුවට ප්‍රතිචාර දැක්වීමට උත්සාහ දරනු පෙනුනි. මෙම උත්සාහයන් සියල්ලම පාහේ පදනම් කොට තිබුණේ විරැකියාවෙන් පෙළෙන උපාධිධාරීන්ට 'නව' අරමුණු සහ ආකල්ප ලබාදීමටත්, රටේ රැකියා වලට අවශය දක්ෂතාවයන් ඔවුන්ට පුහුණු කිරීමත්ය. එවැනි ප්‍රයත්න සාර්ථක වී, මෙම දරුණු ප්‍රශ්නය යම් තරමකටවත් විසඳේයයි අප සියලු දෙනාම බලාපොරොත්තුවෙන් සිටිමු.

මෙම ප්‍රශ්නය විසඳීමට විවිධ ප්‍රයත්න දරණ අතරම, මෙම ප්‍රශ්නය නැවත මතු නොවන ලෙසද, එසේ වුවහොත් ඒ පිළිබඳව යම් කෙනෙකු වගකිව යුතු වන ලෙසද කටයුතු කිරීම වැදගත් යයි මා විශ්වාස කරමි. මෙම ප්‍රශ්නය ගැන කරුණු දක්වන බොහෝ අය පෙන්වා දෙන්නේ විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය සහ පුහුණුවල රටේ ආර්ථිකයේ සහ අනිකුත් ක්ෂේත්‍රවල රැකියා අවස්ථා වලට සෘජුවම සම්බන්ධ විය යුතු බවය. එසේ නම්, විෂය මාලාවල ශිෂ්‍ය දැනුම සහ ශිෂ්‍ය පුහුණුව සකස් කළ යුතු වන්නේ එවැනි අරමුණක් ඉෂ්ට කිරීමට බව අපට පැහැදිලිවම වැටහෙනු ඇත.

තත්ත්වය මෙසේ තිබියදී අද මම මේ මාතෘකාව 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තිරුවේ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වුයේ වෙනත් කරුණක් ඉස්මතු කිරීම සඳහාය. එනම්, රජයක් හෝ

---

2003.11.23 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

අමාත්‍යාංශයක් හෝ යම් ආයතනයක් හෝ යම් ක්‍රියාවලියක් අනුගමනය කළ විටල එම ක්‍රියා පටිපාටිය දෙස ආර්ථික කෝණයකින් බලා, ප්‍රතිඵල විශ්ලේෂණය කරද්දී, ඒ ක්‍රියාපටිපාටිය හරහා අතිවිශාල පාඩුවක් රටට සිදුවී ඇත්නම්, ඒ පිළිබඳව කුමණ පියවර ගත හැකිදල කවුරු වගකිව යුතුද යන්න විග්‍රහ කිරීමටය.

මෙම ප්‍රශ්නයට අදාල දත්ත දැන් අප සලකා බලමු. එක් විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු වෙනුවෙන් අප රජය වසරකට රුපියල් 60,000ක් පමණ මුදලක් වැය කරනු ඇත. එසේ නම්, වසර 4 ක කාලයක් තුලදී අප රටේ සම්පත් වලින් සෘජුවම එක් උපාධිධාරියෙකු බිහිකිරීම සඳහා රුපියල් 240,000ක් වැය කෙරෙනු ඇත. එපමණක් නොව, එම ශිෂ්‍යයන් සඳහා, අවුරුදු ගණනාවක් ඔස්සේ ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ යනාදිය වෙනුවෙන් අතිවිශාල ප්‍රාග්ධන සම්භාරයක්ද රජය ආයෝජනය කර ඇත. එම ප්‍රාග්ධන ආයෝජනය ඉතා අවම ලෙස ක්ෂයවීමකට භාජනය කලත්, මාගේ ඇස්තමේන්තුව අනුව, එම වසර 4 සඳහා රුපියල් 60,000ක් පමණ අගයක්වත් වෙන් කළ යුතුය. එසේ නම්, සමස්තයක් වශයෙන්, එක් උපාධිධාරියෙකු බිහිකිරීම සඳහා අප සියලු දෙනාම, අප ගෙවන වැට් සහ අනිකුත් බදු හරහා, අවම වශයෙන් රුපියල් 300,000 ක් වත් අප රජයට ලබා දී ඇත. තවද, අපට ලැබෙන තොරතුරු අනුව, අප රටේ උපාධිධාරීන් 30,000 ක් පමණ විරැකියාවෙන් පෙළෙති. එසේ නම්, උපාධිධාරීන් 30,000 ක් බිහිකිරීම වෙනුවෙන් අප සියලු දෙනාම ආයෝජනය කොට ඇති මුදල රුපියල් මිලියන 9,000ක් හෝ රුපියල් කෝටි 900 කි. මෙම මුදල, අප විශ්ව විද්‍යාල පද්ධතියට, රජයේ අයවැය තුළින් රටේ ජනතාව ලබා දී ඇත්තේ රටට අවශ්‍ය පුද්ගලයන් සහ උපාධිධාරීන් බිහි කිරීම සඳහාය. එම වගකීම පැවරු තැනැත්තන් එම කාර්යය නිසි ලෙස ඉෂ්ට නොකිරීමෙන්, අප රට තුළ විශාල දේශපාලනික සහ සමාජීය අර්බුධයක් ඇතිවීමට තුඩු දුන් උගත් තරුණ පිරිසක් අතරමං කළා පමණක් නොව, ඒ වගකිව යුත්තන් අප රටේ සීමිත සම්පත් වලින් අති දැවැන්ත රුපියල් කෝටි 900 ක මුදලක්ද නාස්තියට පත්කොට ඇත.

අප රටේ ආයතන වල නාස්තිය සහ දූෂණය ගැන කතා කරන විට අප පුරුදු වී තිබෙන්නේ සාමාන්‍යයෙන් පෙනෙන නාස්තිය සහ දූෂණය ගැන විග්‍රහය කිරීමටය. එහෙත් මෙහිදී මා උපුටා දැක්වූ අති මහත් නාස්තින්, නාස්තින් වශයෙන් අපට පෙනෙන්නේ කලාතුරකිනි. මේ නාස්තිය සඳහා කවුරු වගකිව යුතුද? මා දකින අන්දමට මෙම නාස්තිය සඳහා මෙම කාල පරිච්ඡේද වල කටයුතු කළ අධ්‍යාපන ඇමතිවරුන්ද, අමාත්‍යාංශද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවල සේවය කළ සියලු සාමාජිකයන්ද, විරැකියාවෙන් පෙළෙන උපාධිධාරීන් බිහි කල විශ්වවිද්‍යාල වල උපකුලපතිවරුන්ද වගකිව යුතුය. ඔවුන්, කෙසේ තමන්ගේ නිදහසට කරුණු කිවත්, යථාර්තය වන්නේ ඔවුන්ගේ ක්‍රියාවන් හෝ අක්‍රියාවන් හරහා රටේ රැකියා අවස්ථාවලට නොගැලපෙන, බුද්ධිමත් පුද්ගලයන් බිහිකිරීමය. ඒ තුළින් අප රටේ ජනතාවගේ මුදල් නාස්තියකටද, රටේ ආර්ථිකයටද යොමුවූ දැවැනත් පහරකටද ඔවුන් වගකිව යුතුය. සාමාන්‍ය පුද්ගලයෙකු, ආයතනයකට තම ක්‍රියාවකින් හෝ අක්‍රියාවකින් යම් පාඩුවක් සිදුකළ විට, එම පාඩුව ඔහුගෙන් අයකර ගැනීමට එම ආයතනය කටයුතු කරනු ඇත. සමහර විට මේ නිසා සමහර අයගේ මුලු ජීවිත ඉතිරි කිරීම් පවා ඔවුනට අහිමි වී යනු මම දැක තිබේ. එහෙත්, මෙහි පෙන්වා දෙනු ලැබූ දැවැන්ත නාස්ති වලට වගකිව යුතු පුද්ගලයින් කිසිදු ප්‍රශ්නයක් නැතිව, සියලු වගකීම් වලින් මිදී, නිදැල්ලේ පසුවීම කණගාටුවට කරුණකි. මෙවැනි පාඩුවලට වගකිව යුත්තන්, වගකීම් දැලට එක්කාසු කරවීමට, දැනට අපට නොහැකි වුවත්, ඉදිරියේදීවත් අපගේ පාලන යන්ත්‍රයේ අවශ්‍ය වෙනස්කම් ඇතිකොට, මෙවැනි අපරාධ වැළැක්වීමට අප කටයුතු කළ යුතුය.

මා දන්නා පරිදි, සමහර දියුණු රටවල විශ්ව විද්‍යාල වලින් සමත්වන උපාධිධාරීන්ගෙන් 10% කට වැඩි සංඛ්‍යාවක් උපාධි ලැබ, එක් වසරක් තුලදී රැකියා ලබා ගන්නට අපොහොසත් වුවහොත්, එම විශ්ව විද්‍යාලයේ උපකුපතිවරයාගේ සේවය නතර කරනු ලැබේ. එම ප්‍රතික්‍රියාව පිටුපස තිබෙන සිද්ධාන්තය නම්, රැකියා අවස්ථාවලට යොමු විය හැකි උපාධිධාරීන් බිහි කිරීම උපකුලපතිවරයාගේ වගකීම බවයි. රැකියාවක් ලබා ගන්නට

අපොහොසත් වුවිට, අප එම උපාධිධාරියාට දොස් පැවරීම සාධාරණ නොවේ. ඇත්ත වශයෙන්ම, එම වගකීම යොමු විය යුත්තේ රුපියල් 300,000 ක් පමණ වැය කොට, ඔහු එම තත්ත්වයට පත්කළ පුද්ගලයන්ටය. තමාගේ මූලික වගකීම වන්නේ ලෝකයට, රටට සහ ආර්ථිකයට අවශ්‍ය වන උපාධිධාරීන් පිළියෙල කිරීම බව උපකුලපතිවරයා හොඳින් අවබෝධකරගත් විට, ඔහු එම ඉලක්කය කරා කටයුතු කිරීමට තම පාලන පද්ධති සහ අධ්‍යාපන පද්ධති සකස් කර ගන්නේය. එවිට විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේ කටයුතු කරන සියලුම දෙනාද, තමන්ගේ වගකීම් හරියාකාරව තේරුම් ගනු ඇත. මෙලෙස මුල් අවස්ථාවේදීම උපකුලපතිවරුන් තම වගකීම් ඉෂ්ට කරත් නම්, පසු දිනයක තව තවත් මුදල් සහ ශ්‍රමය යොදවමින්, උපාධිධාරීන් නැවතත් පුහුණු කිරීමට වෙනත් කෙනෙකුට හෝ ආයතනයකට අවශ්‍යතාවයක් උදා නොවන්නේය.

අපගේ 'වගවීම් සංකල්ප' වෙනස් කිරීමෙන්, අපට මෙවැනි ප්‍රශ්න දෙස අනාගතයේදී වඩාත් නැනවත් අන්දමට බැලීමට හැකිවනු ඇත. මේ ආකාරයට 'ප්‍රතිඵල' හරහා ක්‍රියාත්මක වන ක්‍රමවලට අප අනාගතයේදීවත් යොමු නොවුවහොත්, මා ඉහත පෙන්වා දුන් නාස්තීන්ද, ප්‍රශ්නද අපට වළක්වා ගත නොහැක.

# 7.2

# රැකියා විසිහත් දහසක් එකවර බිහිකිරීම සිහිනයක්ද?

ප්‍රශ්නය :

පසුගිය මහ මැතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානය දුන් එක් පොරොන්දුවක් වුයේ මුලින් උපාධිධාරීන් 27.000 කට රැකියා ලබාදී පසුව උසස් පෙළ සමත් තවත් 30.000 කට පමණ රාජ්‍ය අංශයේ රැකියා ලබා දෙනවාය යන කාරණාවයි. සැබැවින්ම මෙතරම් විශාල පිරිසකට රැකියා දෙන්න තරම් අපේ රටේ රාජ්‍ය අංශය තුළ ධාරිතාවක් තිබෙනවාද? එසේ තිබෙනවා නම් මෙතෙක් පැවති රජයන් මේ සම්බන්ධයෙන් කටයුතු නොකළේ මන්ද?

අප රටේ රාජ්‍ය අංශය දෙස බලනවිට ඒ තුළ ලක්‍ෂ අටක් පමණ සේවය කරති. අපේ ජනගහනය එක්ක බලන විට එම ප්‍රතිශතය 1000 කට 57 ක් වැනි තත්ත්වයකි. මෙය ලෝකයේම තිබෙන ඉහළම ප්‍රතිශතයක් ලෙස දැක්විය හැක. ඉන්දියාවේ මේ තත්ත්වය 1000 ට 22 යි. පාකිස්ථානය 1000 ට 20 යි. රාජ්‍ය අංශය බලවත් වන සිංගප්පූරුවේද මෙම තත්ත්වය ඉන්දියාවේ හා පාකිස්ථානයේ අගයට වඩා වැඩි වුවත් ශ්‍රී ලංකාවේ තරම් දක්නට නැත. මෙවැනි ඉහළ සංඛ්‍යාත්මක අගයක් රාජ්‍ය අංශය තුළ තිබුණත් අප හැමෝම දන්න කාරණයක් වන්නේ රාජ්‍ය අංශයේ කාර්යක්‍ෂමතාවය අඩුයි කියන කාරණාව. එවන් තත්ත්වයක සිටියදී තවත් 60.000 ක් මෙයට ඔබ්බවන්න පුලුවන් නම් එයින් අපට සිදුවන්නේ කුමක්ද යන්න සිතන්නටත් නොහැක. එමෙන්ම අපට ණය දෙන ආයතන. රටවල් පසුගිය කාළයේ දිගින් දිගටම මතුකළ කාරණයක් වන්නේ රාජ්‍ය අංශය තවදුරටත් අඩු

---

චාමර ලක්‍ෂාන් කුමාර මහතා සමග පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරින් 2004.07.20 දින ලක්බිම පුවත් පතෙහි පළවූ ලිපියක් ආශ්‍රයෙනි

කළ යුතුයි යන්නයි. එසේ නම් සංඛ්‍යාත්මකව ඉහළ කාර්යක්ෂමතාවයෙන් අඩු රාජ්‍ය අංශයට අප කළ යුත්තේ කුමක් ද? මේ අය පුහුණු කර තව දුරටත් කාර්යක්ෂම කිරීම එක් විසඳුමක්. එසේ නොමැති නම්, රාජ්‍ය අංශයේ නියුතු වුවන් විශ්‍රාම යන විට එම පුරප්පාඩු පුරවන්නේ නැතුව ඉතුරු වන පිරිසගෙන් වැඩ කටයුතු කරගෙන යන්න අපි ලැහැස්ති විය යුතුයි. එසේ නොකර තවත් 60,000 ක් රාජ්‍ය අංශයට බඳවා ගන්නවා කියන්නේ මුලු රාජ්‍ය අංශයම අඳුරෙන් අඳුරට දැම්මක් ලෙස දැක්විය හැකිය. මෙසේ එක්වරම රාජ්‍ය සේවයට අටතින් 60,000 ක් ගත්තෝතින් අපි ඔවුන්ව ස්ථානගත කරන්නේ කෙසේද යන්න අප කල්පනා කළ යුතුයි. උදාහරණයක් ලෙස මහජන බැංකුවේ ශාඛාවන් 350 ත් 400 ත් අතර ගනණක් රටපුරා ඇති අතර අවරුදු 45 ත් 50 ත් තිස්සේ මේ බැංකුව ව්‍යාප්ත වී තිබේ. අද මහජන බැංකුවේ එක් එක් ක්ෂේත්‍ර වල සේවය කරන්නේ සේවකයන් 11,000 ක් වගේ සංඛ්‍යාවකි. මහජන බැංකුව වගේ 5 ගුණයක් නැත්නම් ඊටත් වැඩි ප්‍රමාණයක් මාස 3 ත් 4 ත් ඇතුළතදී බඳවා ගන්න යනවා නම් කොහේටද මොවුන් ස්ථානගත කරන්නේ? ඔවුන්ගෙන් බලාපොරොත්තු වන්නේ මොනවාද? මහජන බැංකුවට මෙතරම් ආදායමක් තිබියදීත් එයට බඳවා ගත හැකි වු උපරිම සංඛ්‍යාව 11,000 යි. දැන් මෙසේ අටතින් බඳවා ගන්න උදවියට පඩි ගෙවන්න පමණක් කොපමණ මුදලක් අවශ්‍ය දැයි බැලුවහොත්. ඔවුන්ට අවම වශයෙන් රුපියල් 7,000 ගණනේ පඩි ගෙවුවහොත් පඩිවලට පමණක් රුපියල් බිලියන 5ක් වාර්ශිකව වැයවේ. වසරකට අප සියයට 15 වන වැට් බද්දෙන් එකතු කර ගන්නේ රුපියල් බිලියන 5යි. එයින් සියයට 5 කට වැඩි ගණනක් මොවුනට වැටුප් ගෙවන්න වැයවෙනවා නම් අපි මෙම ඉතිරි මුදල් හොයන්න අලුත් බද්දක් හඳුන්වා දිය යුතුයි. නැත්නම් වැට් බද්ද සියයට 15 සිට සියයට 16 හරි 17 හරි කරන්න අවශ්‍ය වේ. එසේ නොමැතිනම්. එම මුදල් වෙනත් ක්‍රමයකින් හොයාගන්න නම් අපට සිදුවන්නේ සල්ලි අච්චු ගැසීමයි. එසේ අච්චු ගැසුවෝතින් උද්ධමනකාරී බලපෑම් ඇතිවී තත්ත්වය තවත් බැරෑරුම් වනු ඇත. මේ සියල්ලෙන්ම නොහැකි නම් වෙනත් කටයුත්තකට යොදවන මුදල් මෙයට යොදවන්න සිදුවනු ඇත. පොහොර

සහනාධාරය හෝ වෙනත් සහනාධාරයක් කපා දැම්මෙන් අපට මෙය කිරීමට හැකිවුවත් එය කළ හොනැක්කකි. සහනාධාරයක් කැපීමට මේ රජය එකග වී නොමැත. එසේ නම් මේ සඳහා අවශ්‍ය මුදල් අප සොයා ගන්නේ කෙසේද? මෙය යථාර්ථයක් බවට පත්වීමට නම් ප්‍රාතිහාර්යයක්ම සිදු විය යුතුයි.

එමෙන්ම අලුතින් 60.000 ක් නව බඳවා ගැනීම් කරද්දි එම 60.000 ක් දෙනාට මේසයකුයි පුටුවකුයි අවශ්‍යවේ. ඒ වෙනුවෙන් මෙතෙක් ටෙන්ඩර් කැඳවලා තිබේද? මේ වෙනතෙක් එබඳු කිසිවක් සිදු වී නොමැත. සැබැවින්ම ආණ්ඩුව සිදුකර ඇත්තේ එවැන්නක් කරනවා යැයි ජනතාවට හැගවීම පමණි. ඊට අමතරව මේ වෙනුවෙන් වූ පැහැදිළි වැඩපිළිවෙළක් මෙතෙක් දක්නට නොමැත. කිසියම් ආයතනයකට 50 දෙනෙකු බඳවා ගන්නවා නම් ඔවුනට අවශ්‍ය කරන කාර්යාල පහසුකම් හා ඔවුනට පැවරෙන කාර්යභාරයන් සම්බන්ධයෙන්ද යම් වැඩපිළිවෙළක් අවශ්‍යයෙන්ම තිබිය යුතුය. සාමාන්‍යයෙන් එක් පුද්ගලයෙකුට කාර්යාලයක සිට තම වැඩකටයුතු පහසුවෙන් කිරීමට වර්ග අඩි 20 ක වත් ඉඩකඩ අවශ්‍යවේ. ඒ අනුව 60.000 ක් බඳවා ගැනුනහොත් ඔවුන්ට වර්ග අඩි දොළොස් ලක්‍ෂයක් අවශ්‍යයි. වර්ග අඩි දොළොස් ලක්‍ෂයක් කියලා කියන්නේ අපේ ලෝක වෙලඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වගේ හතර ගුණයක ඉඩකඩක්. මේ ආකාරයට සැම අතින්ම බලන විට අපිට මේ සම්බන්ධව සාධාරණ සැකයක් ස්වභාවිකවම මතුවේ. මේ නිසා මා දකින ලෙසින් මෙය කරන්න බළාපොරොත්තු වෙන දෙයක් නොවේ.

ප්‍රශ්නය :-

රාජිත සේනාරත්න හිටපු ඇමතිවරයා පවසා තිබූ පරිදි එ.ජා.ප. ආණ්ඩුව දිගටම තිබෙන්නට ඉඩදුන්නා නම් උපාධිධාරීන් 10.000 කට රැකියා රාජ්‍ය අංශයෙන් ලබාදීමට තමන් සූදානමින් සිටි බවට. නමුත් ඊට පෙර විධායකය ඒ අවස්ථාව උදුරාගත් බවත් එතුමා චෝදනා කොට තිබුණා. නමුත් ඔබතුමා මීට පෙර පෙන්වා දුන්නා මෙතරම් විශාල පිරිසකට රැකියා සපයන්නට තරම් රාජ්‍ය අංශය ශක්තිමත් නොමැති බව. ඔබේ මේ චෝදනාවන් රාජිත සේනාරත්න මහතාටත් වලංගුද?

පිළිතුර :-

එතුමාගේ ප්‍රකාශයේ පදනම කුමක් දැයි සැබැවින්ම මට පැවසිය නොහැකිය. උපාධිධාරීන් 10.000 කට වගේ සංඛ්‍යාවකට පසුගිය රජය රැකියාවල් ලබාදෙන්න බලාපොරොත්තු වුණේ රාජ්‍ය අංශයෙන් පමණක්ම නොවෙයි.

මේ සඳහා සෑහෙන අවස්ථාවක් පැහැදිලිවම තිබුණා. ඩොලර් බිලියන 4 1/2 මුදල නිසි පරිදි ආයෝජනය වුවා නම් උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නයට සෑහෙන විසඳුමක් ලැබෙන්නට ඉඩ තිබුණි. විශේෂයෙන් තොරතුරු තාක්‍ෂණ අංශයේ. උදාහරණයක් ලෙසට හොංකොං ෂැංහයි බැංකුව කෝට්ටේ ප්‍රදේශයේ දැවන්ත දුරකතන ඇමතුම් මධ්‍යස්ථානයක් ඇරඹීමට වැඩකටයුතු ආරම්භ කර තිබූ අතර. එම දැවැන්ත ව්‍යාපෘතිය හරහා රැකියා 25,000 ක් වගේ වැඩපිළිවෙළක් තිබුණා. ඒ රැකියා 25,000 ලැබෙන්නේ කිසිදෙයක් නොදන්න කෙනෙකුට නොවෙයි. පැහැදිලිවම යම්කිසි මට්ටමක උගත් පුද්ගලයන්ට. එවැනි රැකියාවක් උපාධිධාරීන්ට ලබා ගැනුමට ඉඩ තිබුණා. අන්න එබඳු රැකියා පිළිබඳව රාජිත මන්ත්‍රීතුමා සමහර විට අදහස් කරන්න ඇති.

ප්‍රශ්නය :-

පසුගිය කාළයන්හි උපාධිධාරීන්ට රැකියා ලබා නොදුන්නත් පැවති හැම රජයක්ම අඩු වැඩි වශයෙන් කිසිඳු අධ්‍යාපනික සුදුසුකමක් නොමැති තම දේශපාලන හෙංචයියන්ට රැකියා ලබා දුන්නා. විශ්ව විද්‍යාල උපාධිධාරීන් යනු පැහදිළිව බුද්ධිමත් කොට්ඨාශයක්. ඔවුන්ව මැතිවරණ සමයන්හි දී ඒ ඒ පක්‍ෂවල ප්‍රතිපත්ති අලංකාර කෙරුමට පමණක් යොදා ගන්නවා. මෙයින් ඔබ්බට ගොස් උපාධිධාරීන්ගේ සේවය සමාජයට රටට ඵලදායි අන්දමට යොදාගත හැක්කේ කෙසේද? යන්න පිළිබඳව කතා කළහොත්?

පිළිතුර :-

එය ඉතාම වැදගත් ප්‍රශ්නයක්, බොහෝවිට අපි හිතන්නේ උපාධිධාරියෙකු බිහිකරනවාය කියන එක හුදකලා සිදුවීමක් ලෙසට. නමුත් එහෙම කරන්න බැහැ. අපි ජිවත් වෙන්නේ මේ සමාජයේ,

ඒ සමාජ අවශ්‍යතාවන් පිළිබඳව සලකාබලා ඊට ගැලපෙන උපාධිධාරියෙකු අප බිහි කළ යුතුයි. උදාහරණයක් ලෙස නවසීලන්තයේ විශ්වවිද්‍යාලවල උපාධියක් තියෙනවා අශ්වයන් පුහුණු කිරීම පිළිබඳව. ඒ එය රටේ තියෙන බහුලතම රැකියාව වන නිසා. ධීවර කර්මාන්තය ගත්තොතින් නෝර්වේ වගේ රටවල ධීවර කර්මාන්තය පිළිබඳ උපාධියක් තියෙනවා. ඒ පිළිබඳව දැනුවත් වන අය රටට අවශ්‍ය නිසා ඔවුන් එසේ කරනවා. අපේ පුංචි දූපත වටේටම මහ මුහුද තිබුණත්, මෑතකදී මහින්ද රාජපක්ෂ මහත්මයා පටන් ගන්න තෙක්ම සාගර විශ්ව විද්‍යාලයක් මෙහේ තිබුණේ නැහැ. ඒ වෙනුවට අප රටේ දක්නට ලැබෙන්නේ පාලි, සංස්කෘත, බෞද්ධ ශිෂ්ටාචාරය වැනි දේවල් අධ්‍යයනය කිරීම. මෙහිදී එබඳු විෂයයන් අධ්‍යයනය කිරීම වැරදි යැයි මා කිසි ලෙසකින්වත් අදහස් නොකරන අතර, ඒවායින් රැකියා අවස්ථා උත්පාදනය කර ගැනීම පැහැදිලිවම දුෂ්කර වුවක්ය යන්න අද යථාර්ථයක් වී ඇත.

ප්‍රශ්නය:-

ඔබ අවධාරණය කරන්නේ විශ්ව විද්‍යාල පාඨමාලා ශාස්ත්‍ර ගවේෂණය වෙනුවට වෘත්තිමය පුහුණුව ඉලක්ක කොට ගෙන ඇරඹිය යුතු බවද?

පිළිතුර:-

මුලින් පෙන්වා දුන් ආකාරයට මූලික වශයෙන් වෘත්තියමය අවශ්‍යතා පාදක කොට ගෙන විශ්ව විද්‍යාලවල කටයුතු සිදුවේ. උපාධිධාරියෙකු බිහිකෙරුමට රජයෙන් ලක්ෂ 03ක් වැනි විශාල මුදලක් වැය කරයි. ඒ අර්ථයෙන් බැලුවාහම දැනට රැකියා විරහිතව සිටින උපාධිධාරීන් 30,000 ක වෙනුවෙන් රුපියල් මිලියන 9,000 ක් පමණ අප රජය ආයෝජනය කොට තිබෙනවා. නමුත් එහි නියම ප්‍රතිඵල නොලැබීම හේතුවෙන් මේ මුදල් සියල්ලම පාහේ අපතේ යැවීමක් සිදු වී තිබේ. මේවට වගකිව යුත්තේ කව්ද? අපි මේ මුදල් ලබාදෙන්නේ විශ්ව විද්‍යාල උපකුලපතිවරයාට. ඒ මුදල් යොදාගෙන රටට අවශ්‍ය පන්නයේ උපාධිධාරීන් බිහිකෙරුම ඔහුගේ වගකීමක්. මා වරලත් ගණකාධිකාරීවරුන්ගේ

ආයතනයේ සභාපතිව සිටි කාලයේ මම කරපු පළමු දේ තමයි රැකියා නොමැතිව වරලත් ගණකාධිකාරිවරුන් සිටිනවාද යන්න සොයා බලන එක. එහිදී රැකියා විරහිත වරලත් ගණකාධිකාරිවරු නව දෙනෙකු සිටින බව මට දැනගන්නට ලැබුණි. ඉන් පසුව මේ නව දෙනාට රැකියා නැත්තේ ඇයි කියලා මම සුපරික්ෂාකාරීව හොයා බැලුවා. මන්ද එය අපිට විශාල අඩුපාඩුවක්. මුදල් වියදම් කරලා. ශ්‍රමය වැය කරලා. අපි කිසියම් පුද්ගලයෙකු බිහිකරනවා නම් ඇයි ඔහුට රැකියාවක් නැත්තේ යන්න පිලිබඳව සොයා බැලීම සහතිකවම අපේ වගකීමක්. ඉන් පස්සේ අපි ඔවුන් තුළ තිබූ යම් යම් අඩුපාඩු නිවැරදි කර ගන්නට කටයුතු සැළැස්සුවෙමු. වර්තමානයේ කිසිඳු වගකිව යුතු ප්‍රධානියෙක් මේ උපාධිධාරීන්ට රැකියාවල් නොමැති වීම පිළිබඳව සොයන්නේ නැත. යමක් කමක් ඇති අයට රැකියා හිමිවෙනවා නම් ඇයි උපාධිධාරීන්ට රැකියාවල් හම්බ නොවෙන්නේ. පැහැදිලිවම කොතැනක හෝ වැරදීමක් සිදුව තිබේ. මෙයට හේතු හොයලා බැලුවිට නම් දක්නට ලැබෙන්නේ උපාධිධාරීන්ට දී තිබෙන දැනුම පුහුණුව රැගෙන රැකියාවකට යා නොහැකි තත්ත්වයක් විශ්ව විද්‍යාලය තුළින් බිහිකර ඇති බවයි. මෙතැනදී රැකියාවක් ලබා ගන්නට නොහැකි වීම සම්බන්ධයෙන් එම උපාධිධාරියාට දොස් පැවරීමෙන් වැලක් නැත. එම වැරැද්ද ඇත්තේ ඔවුන්ව පුහුණු කරන අය තුළයි. මම ඇත්තටම යෝජනා කරනවා විශ්ව විද්‍යාලයකින් උපාධිධාරියෙක් පිට වී වසරක් ඇතුළත ඔවුන්ගෙන් 90% ක් වැනි පිරිසකට රැකියාවක් සොයාගැනුමට නොහැකි නම්, ඒ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාව අස් කළ යුතුයි කියා, ඊට හේතුව එම උපකුලපතිවරයා තමන් සතු වගකීම් පැහැර හැරීමයි. උපකුලපතිවරයාගේ වගකීම වන්නේ සමාජයට අවශ්‍ය කරන උපාධිධාරීන්ව බිහි කිරීමයි. ඒ වෙනුවෙන් ඔහු වක්‍රලේඛ, විවිධ ක්‍රමෝපායන් සකසමින් උපාධිධාරීන් නිසි මගට ගැනීමට කටුයුතු කළ යුතුයි. උපකුලපතිවරුන් එම කාර්යය නිසි ලෙස ඉෂ්ට නොකිරීමෙන් අප රට තුළ විශාල දේශපාලනික හා සාමාජික අර්බුධයක් මේ වන විට පැන නැගී ඇත. එපමණක් නොව උගත් තරුණ පිරිසක් අද රැකියා නොමැතිව අතරමං වී ඇත. මේ සියල්ලටම වගකිව යුත්තන් අප රටේ සීමිත සම්පත්වලින්

රුපියල් කෝටි 900 ක් පමණද නාස්තියට පත්කොට ඇති බව කණගාටුවෙන් වුවත් පැවසිය යුතුමයි. මේ දුර්වලතා මගහැරුමට තවම අපට ශක්තියක් නොමැති නම් අපි නිර්හිත නැත්නම් වෙනත් ක්‍රමයකින් හරි එය සොයා ගත යුතුමය. එතැනදී කර්මාන්ත අංශය. වාණිජ්‍ය හා විශ්ව විද්‍යාල යන ත්‍රිත්වයම ඒකාබද්ධ විය යුතුය. ඒ සම්බන්ධතාවය නොමැති වීම පැහැදිලිව බරපතල ගැටලුවක්. මේ සම්බන්ධතාවය ඇති වුවහොත් කෙළින්ම අපි විශ්ව විද්‍යාල හරහා බිහිකරනුයේ සමාජයට අවශ්‍ය පුද්ගලයන්ම පමණක් බැවින් මෙවන් ප්‍රශ්න එතැනදී ඇතිවීමට ඉඩක් නොමැත. වර්තමානයේ, මොරටුව වැනි විශ්ව විද්‍යාලවල මෙය ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වනු දැකගත හැකිය. ඒක ඉතාම වැදගත් පියවරක්, මෙරට විශ්ව විද්‍යාල පද්ධතියේ සෙසු විශ්ව විද්‍යාලත්, මේ උපාය මාර්ගය අනුගමනය කළහොත් ස්ථිරවම ලොකු වෙනසක් රටතුළ ඇතිවනු ඇත.

ප්‍රශ්නය :-

කොහොම නමුත් දැනටමත් සැහෙන පිරිසක් මේ ප්‍රශ්නයේදී ඒ වෙනුවෙන් වන්දි ගෙවනවනේ. එතැනදී ඒ සම්බන්ධව ඔබ තුමා යම් යම් කරුණු කාරණා කිහිපයක් මතු කළා. අනාගතයේ මෙවැන්නක් ඇති නොවීම සම්බන්ධයෙන් ඔබතුමාගේ ආර්ථික විද්‍යා ඥාණයට අනුව දැනට රැකියා විරහිතව සිටින උපාධිධාරීන්ගේ අනාගතය සම්බන්ධයෙන් යෙදිය යුතු පිළියම් කවරේද?

පිළිතුර :-

පැහැදිලිවම මොවුනට නැවත වෘත්තියමය පුහුණුවීම් ලබාදිය යුතුය. කිසිම කෙනෙකු යමකුව සේවය යොදවන්නේ නැහැ ඔහුගෙන් ප්‍රයෝජනයක් නැත්නම්, මිනිහෙක්ව අපි සල්ලි දීලා පොල්ගහකට පොල් කඩන්න යවන්නේ, ඔහුට ඒ පිළිබඳව විශේෂඥතාවයක් තිබෙන නිසා. ඒ ආකාරයට ඕනෑම අයෙක් තවත් කෙනෙකුගේ සේවය ලබාගන්නේ, එමගින් තමන්ට ප්‍රයෝජනයක් ඇත්නම් පමණි. එසේ නම් අපි මේ 30,000 නැවතවරක් පුහුණුකළ යුතුයි. ඒ සඳහා විශේෂ සහ කඩිනම් ක්‍රමයක් අවශ්‍යයි. එබඳු දේ අප

පසුගිය කාලවලදී සිදුකළත් එම ව්‍යාපෘතිවල කිසිඳු සැළසුමක් දක්නට නොලැබිණි. එසේ නොවන අඛන්ඩ වැඩපිළිවෙළක් මේ සම්බන්ධව ක්‍රියාත්මක කළ යුතුය. පක්ෂ භේදයක් නොමැතිව ප්‍රධාන පක්ෂ දෙකම වඩාත් වගකීමෙන් යුතුව මේ කාරණය සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. එසේම මොවුන්ව ඉංග්‍රිසි භාෂාව, තාක්ෂණ ඥාණයෙන් පෙහොසත් කොට රැකියා වෙළඳ පොළට පහසුවෙන් අන්තර්ග්‍රහණය කළ හැකි ආකාරයේ වැඩපිළිවෙළක්ද තිබිය යුතුමය. එයට අමතරව ආකල්පමය වෙනසක් සිදුවීමද අවශ්‍යම වූවකි. පෞද්ගලික අංශය සාමාන්‍යයෙන් උපාධිධාරීන් සම්බන්ධයෙන් දක්වනුයේ යහපත් ආකල්පයක් නොවේ. මේ තත්ත්වයෙන් අප මිදිය යුතුමය. අපට එකපාරටම 30,000 ක් වගේ පිරිසක් විජ්ජාවක් මගින් වෙනසකට ලක්කර හැකි යැයි මා කිසිවිටෙකත් නොසිතමි. සහතිකවම එය දුෂ්කර වූවක්. එය සාධනය කරගත හැක්කේ ක්‍රමානුකූලවූ විශේෂ වැඩපිළිවෙළක් හරහා පමණයි එතැනදී කෙටි පාරක් අනුගමනය කිරීමේ හැකියාවක් නොමැත.

ප්‍රශ්නය:-

මේ වන විට උපාධිධාරීන්ට රැකියා ලබාදීම සම්බන්ධයෙන් සුභදායී බලාපොරොත්තුවක් සමාජය තුළ නිර්මාණය වී තිබෙනවා. රැකියා විරහිත උපාධිධාරීන් සේම ඔවුන්ගේ හිතවතුන්ද මේ පිළිබඳව තබා තිබෙන්නේ සුන්දර බලාපොරොත්තුවක්. ඔවුන්ගේ මේ සුන්දර සිහිනය බොඳවෙලා යයිද නැද්ද යන්න අවසාන වශයෙන් පැවසුවහොත්?

පිළිතුර:-

සැබැවින්ම මෙය යථාර්තයක් වනු දැකීම මාගේ අභිලාශයයි. විශ්ෂයෙන් ශ්‍රී ලාංකිකයකු ලෙස දැවැන්ත සමාජ අසහනයක් බවට පත්ව ඇති මෙම බරපතල ගැටලුවට යමෙකුට විසඳුමක් ලබාගත හැකි නම් මම ඉතාම සතුටු වෙමි. එහෙත්, මේ ක්ෂේත්‍රය පිලිබඳව අවබෝධයෙන් සිටින්නෙකු ලෙස රැකියාවල් බිහිවන ක්‍රමයක් පිළිබඳ හොඳ හැටි හැදෑරූ පුද්ගලයෙකු ලෙස මෙබඳු දේ සිදුවෙන්නේ නැති වග අපිට යම් යම් දේ වලින් සිතාගත

හැක. නිදසුනක් ලෙස මම මගේ පරණ කාර් එක අරගෙන ෆෝමියුලා 1 බාණ්ඩයේ තරගයකට ගියොත් මම දන්නවා මට දිනන්න බැහැ කියලා. ඒත් තරගයට යන්න පුලුවන්. ඉතින් ඒ නිසා අපි බොරුවට මේ වගේ ආකර්ෂණ වැඩපිළිවෙළවල් ඉදිරිපත් කිරීමෙන් කිසිඳු ප්‍රයෝජනයක් සිදු නොවේ. පැහැදිළිවම මෙයින් වෙන්නේ තව තවත් අර සමාජ අසහනය වැඩි වීම පමණයි. තවත් වතාවක් තමන්ව මුලාකළා යන හැඟීම ඇතිවීම පමණි. අපි හැමෝම විශ්වාස කරන්න කැමති දේවල් විශ්වාස කරනවා. එතැනදී තමන්ගේ හිත රවටා ගැනීම පමණයි සිදුවන්නේ. කිසිඳු පැහැදිලි දැක්මක්, සැළැස්මක්, සම්බන්ධතාවයක් නොමැතිව මෙවැනි වැඩපිළිවෙළවල් ඉදිරිපත් කිරීම කණගාටුවට කරුණක්. මේ වගේ දේශපාලන ව්‍යාපෘතිවල ප්‍රතිඵලයක් ලෙස විශාල වශයෙන් පාඩු ලබන, ලබපු රටක් ලෙස ශ්‍රී ලංකාව දැක්විය හැකිය. CTB, වරාය වැනි ආයතනවල වැඩි වැඩියෙන් රැකියා ලබාදී වුණ දේ බලන්න. අද වරායේ වැඩ කටයුතු දැඩි දුෂ්කරතා මැද්දෙයි පවත්වාගෙන යන්නේ, අපේ වරායේ 18,000 ක් සේවය කරනවා. අපේ වරායේම ධාරිතාවයෙන් යුත් එංගලන්ත වරායක ඉන්නේ 700 යි. අපේ ශ්‍රම ඵලදායිතාවය ගත්තෝතින් ලංකාවේයි. ජපානෙයි ශ්‍රම ඵලදායිතාවය සංසන්දනය කරන විට 1:16 යි. අපි 16 දෙනෙකු කරන වැඩ තමයි. ජපානයේ එක්කෙනෙක් කරන්නේ. එහෙම වෙනකොට අපිට ඉදිරියට යැමට අමාරුයි. රැකියාවල් මැජික්පොල්ලෙන් මවන්න පෙර අපි මේ ගැන සිතිය යුතුයි. "My heart tells me it is good if it can be done, but my brain tells me it can't be done" ලෙස අවසාන වශයෙන් මට පැවසිය හැකිය.

# 7.3

## උපාධිධාරීන්ට රජයේ රැකියා දෙමුද? ජීවනෝපායක් ලබා දෙමුද?

පසුගිය මැතිවරණයේදී දුන් පොරොන්දුවක් අනුව විරැකියාවෙන් පෙළෙන උපාධිධාරීන්ට රැකියා ලබාදීමට රජය බැඳී සිටී. එම පොරොන්දුව ඉෂ්ට කිරීම සඳහා කෙසේ හෝ මුදල් වෙන්කරගෙන කටයුතු කිරීමට රජය ප්‍රයත්නයන් දරණ අන්දම අපට පෙනේ. මෙලෙස කෙසේ හෝ දුන් පොරොන්දු ඉෂ්ට කිරීමට උනන්දුවීම ගැන අප සන්තෝෂ වනවාත් සමගම, එම ප්‍රයත්නය තුළින් පැණ නගින ප්‍රශ්නය නම් මෙම යෝජිත ක්‍රියාමාර්ගය කෙතරම් දුරට අප රටට හිතකරද යන්නය. එම ප්‍රශ්නය විග්‍රහ කරද්දී, අප සැලකිය යුත්තේ, එම අරමුණ දැනට යෝජිත ක්‍රමයට වඩා ප්‍රයෝජනවත් සහ ඵලදායි අන්දමකට රජයට ඉෂ්ට කරගැනිමට හැකිද යන්නය.

දැනට අපට ලැබී ඇති තොරතුරු අනුව, රජයේ ඉලක්කය වී ඇත්තේ විරැකියාවෙන් පෙළෙන උපාධිධාරීන් 30,000 කට පමණ රජයේ රැකියාවන් ලබාදීමෙන් ඔවුන්ට ආත්ම ගරුත්වයකින් කටයුතු කිරීමට අවස්ථාවක් ලබා දීමය. ඒ සඳහා, රජයේ උපාය මාර්ගය වී ඇත්තේ එම උපාධිධාරීන්ට මසකට රුපියල් 6,000 බැගින් ගෙවීමක් කරන අතර, ඔවුන්ට රාජ්‍ය සේවය පිළිබඳව පුහුණුවක් ලබාදී, ඊට පසු රජයේ ස්ථිර සේවයට අනාගතයේදී බඳවා ගැනීමය.

අද වන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ සේවකයින් සංඛ්‍යාව 800,000ක් පමණය. එම සංඛ්‍යාව, අප රටේ ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් උපුටා දක්වන විට මුලු ලෝකයේම ඉහළතම අගයක් බව විශේෂඥයින් පෙන්වා දෙති. තවද, රාජ්‍ය සේවයේ

---

**2004.09.19 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවු ලිපියකි.**

සේවක සංඛ්‍යාවේ අධික භාවයේ ප්‍රශ්නය විසඳීම සඳහා, එම සංඛ්‍යාව 30% කින් වත් අඩුකළ යුතු බවද විශේෂඥයින් පෙන්වා දෙති. එවැනි අවශ්‍යතාවයක් පවතින අවස්ථාවක තවත් 30,000 ක් පමණ එම සේවයට බඳවා ගැනීමෙන් සිදුවන්නේ, රටේ දැවෙන එක් ප්‍රශ්නයක් විසඳීමට ගන්නා වෑයමක් හරහා, තවත් දැවෙන ප්‍රශ්නයක් වඩාත් උග්‍ර කරගැනීම බව ඕනෑම කෙනෙකුට අනිවාර්යයෙන්ම පැහැදිලි වනවා ඇත.

රටේ සම්පත් විශාල ප්‍රමාණයක් වැය කොට උපාධිධාරීන් බිහි කිරීමෙන් පසු ඔවුන් නිකරුණේ සිටීම ඔවුනටද රටටද විශාල පාඩුවක් බව අප සියලු දෙනාම පිළිගනිමු. එසේ වුවද, රජය දියත් කිරීමට තැත් කරන මෙම ක්‍රියා මාර්ගය, අකමැත්තෙන් හෝ අපට හැඳින්වීමට සිදුවන්නේ, නිසි සැළැස්මක් හෝ කලින් නිශ්චිතව සකස් කරන ලද පුරප්පාඩු හඳුන්වා ගැනීමක් නොමැතිව, පුද්ගලයන් රාශියක් රජයේ සේවයට පදනමක් රහිතව බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගයක් ලෙසය. රජයේ මැතිවරණ පොරොන්දුවක් ඉෂ්ට කරගැනීම කෙතරම් ප්‍රශංසනීය වුවත්, මෙපමණ පුද්ගලයින් සංඛ්‍යාවක් බඳවා ගැනීමට තැත් කරන මෙම ප්‍රයත්නය හරහා රාජ්‍ය සේවයට සිදුවන විපාක ගැන සලකා බැලීම නුවණට හුරු බවද, වෙනත් විකල්පයක් ඇත්නම් එයද පරීක්ෂණයකට ලක් කිරීම, රජයේ විශේෂ වගකීමක් බවද, රජය තීරණය කළ යුතුය.

තත්ත්වය මෙසේ තිබියදී රටේ පවතින අනිකුත් ප්‍රශ්න උග්‍ර නොකර ගනිමින්, අප කළ යුත්තේ කුමක්ද? මාගේ යෝජනාව සරළ එකකි. එනම්, විරැකියාවෙන් පෙළෙන සෑම උපාධිධාරියෙකුටම දැනට රජයෙන් මාස් පතා ගෙවීමට නියමිත රුපියල් 6,000 ක මුදල වෙනුවට, ඔවුනට මාස 25 ක් තුළ ගෙවීමට නියමිත මුදල වන රුපියල් 150,000, එකවරම ඔවුන්ට විශේෂ ප්‍රාගධනයක් ලෙස ලබාදීමය. එවිට, එම උපාධිධාරීන්ට එසේ ලබාදෙන්නා වූ ප්‍රාග්ධන මුදල, තමන්ගේම ව්‍යාපාරයක් හෝ වෘත්තියක් හෝ වෙනත් ආදායමක් ලබාගත හැකි ව්‍යාපෘතියකට යෙදවීමට අවකාශය ලැබෙනු ඇත. එවැනි ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා කෙටි පුහුණුවක්ද, උපදෙස්ද, විවිධ වෘත්තිය ආයතන හරහා

හෝ වෙළඳ සංගම් හරහා හෝ වෙනත් උපදේශකයන් හරහා හෝ එම උපාධිධාරීන්ට ලබාදීමට සමාන්තර වැඩපිළිවෙතක්ද රජය ආරම්භ කළ යුතුය. මෙවැනි ක්‍රියා පටිපාටියක් සඳහා රජයට රුපියල් මිලියන 4,500 ක පමණ මුදලක් එකවර වැය වන බව සත්‍යය. එහෙත්, එම මුදල, වසරක් පාසා උපාධිධාරීන් සේවයේ රඳවා ගැනීමට රජය වැය කරන්නට අපේක්ෂා කරන රුපියල මිලියන 2,160 පමණ මුදලක් සමග සංසන්දනය කරද්දී, එතරම්ම විශාල මුදලක් නොවන බවද අපට වැටහෙනු ඇත.

මෙවැනි ක්‍රියාවලියක් දියත් කරද්දී උපාධිධාරීන් කිප දෙනෙකු එකතු වීමෙන් හවුල් ව්‍යාපාරයන් ආරම්භ කිරීමෙන්, තමන්ට ලැබෙන සාමූහික ප්‍රාග්ධනය, එක් තෝරාගත් ව්‍යාපෘතියකට යොදවන්නටද අවකාශයන් ලැබෙනු ඇත. ඒ සමගම, තමන්ගේ ප්‍රාග්ධනයට අමතරව, බැංකුවලින් ණය මුදලක් ලබා ගනිමින්ද සාර්ථක ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට, ඔවුන්ට ඉඩ ඇත. මෙලෙස ඵලදායි ආකාරයට රට පුරාම විවිධ ක්ෂේත්‍රයන් සහ විවිධ මට්ටම්වල ව්‍යාපාර, වෘත්තීන් සහ ව්‍යාපෘති ආරම්භ වීම හරහා ගැමි සහ පළාත් ආර්ථිකයන්ටද යම් දිරියක් ලැබෙනු ඇත.

බොහෝ අවස්ථාවලදී, අපට ඇසෙන අප රට වැසියන්ගේ එක් මැසිවිලියක් නම්, තමන්ට අදහස් සහ දක්ෂතාවයන් තිබුණත්, ඒවා ක්‍රියාත්මක කරගැනීමට තමන් අත ප්‍රාග්ධනයක් නොමැති බවය. අප රටේ උපාධිධාරීන් යනු අප රටේ සම්පත් වලින් පෝෂණය වූ, උගත් පිරිසකි. සමස්තයක් වශයෙන් ඔවුන්ගේ දැනුම සහ හැකියාව සාමාන්‍ය ශ්‍රී ලාංකිකයෙකුට වඩා වැඩි බව පිළිගැනේ. එසේ නම්, ඒ අයට රජය සහ සමාජය ලබා දිය යුත්තේ ඔවුන්ගේ දැනුම සහ හැකියාව පාවිච්චියට යොදවමින්, ඔවුන්ට සමාජයට සහ රටට ප්‍රයෝජනයක් ලබාදීම සඳහා අවශ්‍ය වන ප්‍රාග්ධනයය. එම ප්‍රාග්ධනය ඔවුන්ගේ සහජ දක්ෂතාවයන් වලට සහ අධ්‍යාපනයට සම්බන්ධ කරමින්, එයින් රෝපනය වන යහපත් ප්‍රතිඵල, දැනට යෝජිත නිශ්චිත ඉලක්කයක් නොමැති පුහුණු පාඨමාලාවන් හරහා උපාධිධාරීන්ට පඩි ලබාදීමට සීමිත වූ වැඩ පිළිවෙතට වඩා අතිශයෙන් ප්‍රයෝජනවත් වනු ඇත.

මෙහිදී කල් සිටම අප සැළකිය යුතු එක් සාධකයක් ඇත. ඒ නම්, සමහරවිට සමහර උපාධිධාරීන්ගේ ව්‍යාපෘති අසාර්ථක වන්නට ඉඩ ඇති බවය. එවැනි අවස්ථා වලදී, මෙම ප්‍රාග්ධන ලබාදීමේ ව්‍යාපෘතිය දිගින් දිගටම රජය කරගෙන යායුතු යයි බලපෑම් ඇතිවේ යයි සමහරු සැක කළ හැක. එහෙත්, එහිදී අප මතක තබාගත යුතු විශේෂ කරුණක් නම්, සමාජයක පැවැත්ම සඳහා එම සමාජයේ කොටස්කරුවන් වෙනුවෙන් යම් වගකීමක් දරන්නට යම් නිශ්චිත අවස්ථාවලදී සිදුවුවත්, එම වගකීම සදාකාලිකවම දරන්නට කිසිම සමාජයකට ශක්තියක් නොමැති බවය. තමන්ගේ බදු හරහා, අප රටවැසියන්, රටේ උගත් තරුණ තරුණියන් උපාධිධාරීන් බවට පත්කිරීමට, එක් අයෙකුට අවම වශයෙන් ලක්ෂ 3 ක පමණ මුදලක් වැය කොට ඇත. ඊට අමතරව, එම උපාධිධාරීන්ට තමන්ගේම ව්‍යාපෘතියක් කර ගැනීමට තවත් ප්‍රාග්ධනයක් සහ විශේෂ පුහුණුවක් ලබාදීම, තවත් දීමනාවකි. එසේ කරනවාත් සමගම එම උපාධිධාරීන් කෙරෙහි සමාජයේ වගකීම සම්පුර්ණ වී ඇතැයි නිගමනය කිරීම සාධාරණය. එසේ නම්, එතැන් පටන්, එම උපාධිධාරීන්, සමාජයෙන් ඔවුනට ලැබී ඇති නිදහස් අධ්‍යාපනය සහ (මෙම යෝජනාව සනාථ වුවහොත්) සමාජයෙන් ලැබෙන නව නිදහස් ප්‍රාග්ධනය පාවිච්චි කරමින් තමන්ගේ ඉදිරි ජිවිත සාර්ථක කර ගැනීමට වගබලා ගත යුතුය. සමාජයෙන් විශේෂ අත්වැළක් නොලත් අය බොහෝ දෙනෙකු අද අප රටේ තම ජිවිත සාර්ථක තත්තවයන් වලට පත්කර ගැනීමට පොහොසත් වී තිබේ. එසේ නම්, කිසි විශේෂ උපකාරයක් නැතිව, අප රටේ වරප්‍රසාද නොළත් අයට දියුණු වන්නට හැකිවුවා නම්, ඊට වඩා වැඩි උගත් කමක් සහ වරප්‍රසාදලත් උපාධිධාරීන්ට, සාර්ථකව ඉදිරියට යා හැකි බව ශ්‍රී ලාංකික උපාධිධාරින් තේරුම් ගෙන එම අවබෝධයෙන් ධෛර්‍යයක් ලබාගෙන ඉදිරියට යා යුතුය.

# 8

අටවන කොටස

# ඵලදායීතාවය සහ වගකීම

# 8.1

## ඵලදායිතාවය වැඩි නොකර රට සංවර්ධනය කළ හැකිද?

මෑතකදී මා නවසීලන්තයේ සංචාරයක යෙදුණු අවස්ථාවකදී, ඔක්ලන්ඩ් නගරයේ සිට නිව් ප්ලිමත් නගරයට බස් රථයකින් යාමට සිදු විය. ඒ සඳහා සවස 6.00 ට පිටවීමට නියමිතව තිබූ බස් රථයට සම්බන්ධ වීම සඳහා මම බස් නැවතුම්පළට ගියෙමි. එහිදී මා මුදල් ගෙවා ප්‍රවේශ පත්‍රය ලබාගන්නා විට, එහි සිටි ප්‍රවේශ පත්‍ර නිකුත් කරන නිලධාරී මහතා, මාගේ ගමන් මලුව බස් රථයේ එක් පසකින් තබන්නට යැයි කිවේය. එසේ කී එම පුද්ගලයා සවස 6.00 වන විට ප්‍රවේශපත්‍ර කවුලුව වසා බස් රථය දෙසට පැමිණ අසල තිබූ ගමන් මලු සියල්ලම බස් රථයට පැටවීය. එසේ කිරීමෙන් පසු ඔහු රථයට නැග එය ක්‍රියාත්මක කිරීමට පටන් ගත්තේය. මෙම ක්‍රියාවලිය එම රටේ ඉතා සාමාන්‍ය සිද්ධියක් වුවද එය මාගේ මනසේ ඉතා දැඩි ලෙස සලකුණු වුණි. එම සිද්ධිය විග්‍රහ කරන විට මට වැටහුණේ නවසීලන්තයේ තනි පුද්ගලයා කළ එම කාර්යයන් අප රටේ කෙරුණා නම් අඩු වශයෙන් හතර දෙනෙකුවත් විවිධ තනතුරු හරහා බෙදා ගෙන එම කාර්යයම කරන බවයි.

මෙම සරළ අත්දැකීමෙන් පැන නගින කරුණු දෙකක් අපට සැලකිය හැක. පළමුව, නවසීලන්තයේ සිදුවූ ඒ කාර්යය ඉහළ මට්ටමක ඵලදායිතාවක් හරහා සිදුවුණු එකක් බවයි. දෙවනුව, ඵලදායිතාව සහ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක ඇති නිසා එම කාර්යයන්හි යෙදෙන අයට ඉහළ වැටුප් ගෙවීමට හැකි වන බවයි.

ඒ අතර, ආසියානු ඵලදායිතා සංවිධානය මගින් දැනට වසර

---

**2004.05.11 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

කිහිපයකට පෙර නිකුත් කරන ලද දත්ත පරීක්ෂා කරද්දී අපට දැන ගැනිමට සිදුවු එක් කරුණක් නම් ජපානයේ ඵලදායිතාවය ලංකාවේ ඵලදායිතාවය හා සසඳන විට 16 ගුණයකින් වැඩි බවයි. එමෙන්ම, පසුගිය සතියේදී මා උපදෙස් ලබාදෙන ඉහළ පෙළේ යැයි සැළකෙන සමාගමක ඵලදායිතාව මැනිමෙන් පසු අපට දැනගැනිමට සිදුවු අශුභ ආරංචිය නම් ඇමෙරිකා එක්සත් ජනපදයේ ඒ හා සමාන කර්මාන්තශාලාවක ඵලදායිතාවයට වඩා අප රටේ කර්මාන්තශාලාවේ ඵලදායිතාව 83% කින් අඩු බවයි.

ඉහත කී දත්ත සහ තොරතුරු සමහරවිට අප සියලු දෙනාම දන්නා ඒවාය. සැක කරන ඒවාය, අසා ඇති ඒවාය. මේවා ගැන විටින් විට ආර්ථික විශේෂඥයෝ කතා කරති. මැති අමැතිවරු දේශනා පවත්වති. එහෙත් පසුගිය දශක දෙක දෙස පසු විපරම් කොට විග්‍රහ කරන විට සමස්තයක් වශයෙන් අප රටේ ඵලදායිතාව ගැන සාකච්ජා කරද්දී අපගේ සැලකිල්ලට භාජනය විය යුත්තේ රජයේ අංශවල සහ දෙපාර්තමේන්තු, පෞද්ගලික අංශය සහ රජයේ නොවන අංශ ලාභයක් බලාපොරොත්තු නොවන සංවිධානයන් (Non Profit Organisations) යන සියලුම අංශයන්ය.

මේ සම්බන්ධයෙන් විග්‍රහයන් හිදී සමහර අය අප රටේ බහුලව ඇති නිවාඩු දිනයන්, අඩු ඵලදායිතාවයට හේතුවක් යැයි කියති. තවත් සමහරු පවසන්නේ අප නිෂ්පාදනයන්හි සහ සේවාවන්හි ද යොදන ක්‍රම සහ පිළිපදින මුලධර්ම අද ලෝකයට නොගැලපෙන ඒවා කියාය. තවත් සමහරු කියා සිටින්නේ අප රටේ හාම්පුතුන්, කළමනාකරුවන් සහ සේවකයින් මනා ලෙස පුහුණුවී නොමැති බවය. තවත් සමහරු පෙන්වා දෙන්නේ අප රට වැසියන් උනන්දුවෙන් හා කැපවීමකින් තම කාර්යයන්වල නොයෙදෙන නිසා අඩු ඵලදායිතාවක් ඇතිවනු කියාය. මේ සියලුම හේතුන්වල යම් සත්‍යයක් තිබෙන්නට හැක. එහෙත් මේවා සියල්ලම පාහේ අප දැනටමත් දන්නා හේතුන්ය. ඒ නිසා අද යුගයේ අත්‍යවශ්‍ය කාර්යය වන්නේ මෙම දුර්වලතා ගැන දිනෙන් දිනම කතා කිරීම නොව ඒවා ජය ගැනිමට ක්‍රියා මාර්ග යෙදවීමයි.

සෑම ගමේ කඩේක, සුලු හෝ විශාල සමාගමක රජයේ සංස්ථාවක සහ දෙපාර්තමේන්තුවක යම් ප්‍රතිඵලයක් හෝ සේවයක් ලබාදෙන ඕනෑම සංවිධානයක, ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වර්ධනය කළ යුතුය. එසේ කිරීමට නම්, සෑම ආයතනයකම සේවය කරන අවම සේවකයා සිට ඉහළතම පාලන නිලධාරියා දක්වා ඵලදායිතාව සහ කාර්යක්ෂමතාවය ගැන හොඳ අවබෝධයක් සහ දැනුමක් ලැබෙන්නට සැලැස්විය යුතුය. කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ගැන රූපවාහිනි සහ ගුවන් විදුලි නාලිකා හරහා වැඩ සටහන් ක්‍රියාත්මක විය යුතුය. තම තමන්ගේ පුද්ගලික ඵලදායිතාවද, ආයතනවල ඵලදායිතාව ද දියුණු කර ගැනීමේ නවීන ක්‍රම සහ විධි රාශියක් ජාත්‍යන්තරව සොයාගෙන ඇත. ඒවා අද බහුල ලෙස පාවිච්චියේ යෙදේ. මේවා ගැන විද්‍යුත් මාධ්‍යයන් හරහා ජනයා දැනුවත් කිරීමක් සිදුවිය යුතුය. මෙම කාර්යය රජය පමණක් නොව පෞද්ගලික අංශයද, රාජ්‍ය නොවන අංශයද භාරගත යුතුය.

අප රටේ ඵලදායිතාව පහළ මට්ටමක පසුවීම අප සියලු දෙනාටම ලැජ්ජාවට කරුණකි. මෙම උග්‍ර ප්‍රශ්නයට මුහුණ දී දිනෙන් දිනම වර්ධනයක් ඇති කිරීම අප සියලු දෙනාගේම විශේෂ කාර්ය භාරයකි. අද සිට, ඒ වෙනුවෙන් අපි කැප වෙමු.

# 8.2

# සුළු ව්‍යාපාරිකයන්ගේ ආදායම සහ ඵලදායිතාව වර්ධනය කරමු

ශ්‍රී ලංකාවේ අප තුළ ඇති අමුතු මාදිලියේ ආකල්පයක් නම් අපගේ පෙදරේරුවන්, වඩුවන්, ධීවරයින්, විදුලි කාර්මිකයින්, ගෘහ සේවිකාවන්, පයිප්ප වැඩකරුවන්, ගොවියන් හා ඒ සමාන අය නිරන්තරයෙන් දුප්පත් විය යුතුය යන්නය. ඒ නිසාම සියලුම වර්තමාන ආර්ථික උපාය මාර්ග යොමු වී තිබෙන්නේ යන්තම් ආදායමක් උපයා ගැනීමට ඔවුනට උදව් කළ යුතුයි යන රාමුව තුළය. ඒ අනුව ඔවුන් සදාකාලිකවම දුප්පත්කම නැමැති උගුලට සිරවී සිටීම අප කිසිවෙකුට ප්‍රශ්ණයක් වී නැත. මෙම සම්ප්‍රදාය සහ හැඟීම තුළ අද ලෝකයේ සිදු වෙමින් පවතින අති විශාල තාක්ෂණික සංවර්ධනය පිළිබඳ ඔවුන්ට අවබෝධයක් ලබාදී ඔවුන්ට ද ඒවායේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මේ දක්වා කටයුතු සිදු වී ඇත්තේ බෙහෙවින්ම අල්ප වශයෙනි. එසේ කරන්නේ නම් ඔවුන් ජීවන රටාවන් සහ ඉපැයීමේ හැකියාවන් සැලකිය යුතු ආකාරයකින් ඉහළ යන බව අප අමතක නොකළ යුතුය. එසේ නම් අප රටේ එවැනි ක්ෂේත්‍රවල නිරතවී ඇති අය තුළ නවතම තාක්ෂණයෙන් හා නූතන ක්‍රම පිළිබඳ විධිමත් පුහුණුවක් හා දැනුමක් ලබාදීමෙන් ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවාවන් ඵලදායිව කරගෙන යාමට අවස්ථාවක් ලබාදීමෙන් මේ දුප්පත් යයි කියන පුද්ගලයින් පිළිබඳව ශ්‍රී ලංකාවේ දැනට තිබෙන ආකල්පයන් ද සදහටම වෙනස් වී යාමටද එම ක්‍රියා මාර්ගය හේතු විය හැකිය.

සමහරවිට අද අප රටේ මේ සංකල්පය පවතින්නේ යම් ක්ෂේත්‍රවල රැකියා කරන්නන් අඩු වැදගත්කමක් ඇති අය වශයෙන් සමාජය සලකන නිසා විය හැකිය. එබඳු ආකල්පයක් නිසා මේසන් වැඩ,

---

**2003.06.25 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

වඩුවැඩ හෝ පයිප්ප වැඩ උසස් ශිල්පයක් වෘත්තියක් හෝ රැකියාවක් වශයෙන් නොසැලකෙනවා විය හැකිය. ඒ අතරම සමහරවිට මීට වසර 20 කට පමණ පෙර හෝටලයක කෝකියෙකුට ලැබුන සැලකිල්ල හා පිළිගැනීම ගැන සලකන විට අපට වැටහෙන්නේ එදාට වඩා වැඩි සැලකිල්ලක් අද හෝටලයක අරක්කැමියෙකුට ලැබෙන බවයි. එසේ වන්නේ ඇයි? හෝටල් ව්‍යාපාරය ආයතනගත වීමට පෙර සහ හෝටල් ව්‍යාපාරයත් ඒ හා ආශ්‍රිත කාර්යයන්ටත් නව සමාජීය පිළිගැනීමක් ලැබීමට පෙර කාලයේදී අරක්කැමියන් ද, වේටර් වරුන්, පිළිගැනීමේ නිලධාරීන් ආදීන්ගේ කාර්යයන් බොහෝ දෙනා සැලකුවේ පහත් පෙළේ රැකියා වශයෙනි. එහෙත් පිළිගත් ආයතන වලින් විශේෂිත නිපුණතා පිළිබඳ සහතික නිකුත් කිරීම ආරම්භ කරනු ලැබීමත් සමගම සහ එකී වෘත්තීන් සඳහා ව්‍යුහගත අධ්‍යාපනය හා පුහුණුව ලබාදෙන විධිමත් හෝටල් පාසලක් පිහිටුවනු ලැබීමත් සමගම මේ රැකියාවල තත්ත්වය සැලකිය යුතු පරිවර්තනයකට භාජනය විය. එබඳු රාජකාරී පහත් ඒවා ලෙස අඩුවෙන් සැලකීමක් හෝ ඒ කාර්යයන් නුගත් හෝ අඩු වරප්‍රසාද ලත් අයට සීමා වූ රැකියා ලෙස සැලකීමක් හෝ තවදුරටත් සිදු නොවිය. ඒ හරහා එබඳු රැකියා සමාජයේ 'පිළිගැනීමක් ඇති' රැකියා බවට පත්විය. යම් නිශ්චිත ක්ෂේත්‍රයක නිපුණතාවක් කේන්ද්‍ර කරගෙන සහතිකයක් ලබාදීමෙන් ඇතිවන වෙනසේ කදිම උදාහරණයක් හැටියට මෙම පරිවර්තනය පෙන්වා දිය හැක. එහෙත් අවාසනාවකට මෙන් කොණ්ඩා මෝස්තර දැමීම ගුවන් ටිකට් පත් නිකුත් කිරීම වැනි ක්ෂේත්‍ර කිහිපයක් හැරුණු විට මේ සාර්ථක ආදර්ශය අනෙකුත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන්ද යොදා ගැනීමට අපට නොහැකි වී තිබේ.

රාජ්‍ය අනුග්‍රහය ලත් සහතික දීමේ අධිකාරී ආයතනයන් හරහා හෝටල් ක්ෂේත්‍රයේ ආදර්ශය අනුව අනෙකුත් අවශ්‍ය වෘත්තීන් සම්බන්ධයෙන් ද එවැනි ක්‍රියා මාර්ගයක්ම අනුගමනය කිරීම ඉතා වැදගත්ය. අප එසේ කරන්නේ නම් විධිමත් ලෙස අධ්‍යාපනයක් ලත් වෘත්තිය වශයෙන් පුහුණු වූ සහතික ලත් පෙදරේරුවන්, වඩුවන්, විදුලි කාර්මිකයන්, නැව්යන්, ගෘහ සේවිකාවන්, අතුරු වෛද්‍ය වෘත්තිකයන්, පයිප්ප වැඩකරුවන්, පෞද්ගලික බස් අයිතිකරුවන්, ධාවනය කරන්නන්, විශ්‍රාම ශාලා

පවත්වාගෙන යන්නන්, ඇඳුම් මසන්නන්, එළවළු වෙළෙන්දන්, සාප්පු හිමියන් සංචාරක මාර්ගෝපදේශකයින් ආදීන් බිහි කිරීමේ පළමු පියවර ගැනීමට අපට හැකිවනු ඇත.

මෙවැනි වෘත්තිමය පුහුණු ක්‍රමයකදී තමන් තෝරා ගන්නා වෘත්තීන්හි භෞතික අංග සම්බන්ධයෙන් පමණක් නොව තනි පුද්ගලයකු සතු ව්‍යාපාරයක් මෙහෙය වන්නේ කෙසේද? වඩා ඵලදායි විය හැක්කේ කෙසේද? තමාට සහාය වීම සඳහා ආධුනික වෘත්තිකයතකු සේවයේ යොදවන්නේ කෙසේද? සිය භාණ්ඩ හෝ සේවාවන් අළෙවි කරන්නේ කෙසේද? බැංකු ණයක් ලබා ගන්නේ සහ ගෙවන්නේ කෙසේද? යන කරුණු සම්බන්ධයෙන් ද ඔවුන්ට අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලැබෙනු ඇත. ඉන්පසු තමන්ගේම වෘත්තිය සංවිධාන ද පිහිටුවා ගැනීමට එසේ සුදුසුකම් ලබන පුද්ගලයන් තමන්ගේ අනාගත පශ්චාත් සුදුසුකම් ලැබීමේ පුහුණුව මෙහෙයවීමටත් ඔවුන්ගේ වෘත්තීන්හි පොදු ගැටලු නිරාකරණය කර ගැනීමටත් ඔවුන්ට එබඳු සංවිධානවල සාමාජිකයින් හැටියට හැකිවෙනු ඇත. ඊට අමතරව සුදුසුකම් ලත් සහ ඒ බවට සහතිකලත් එබඳු අය වඩා හොඳ අවදානම් දරන්නන් වශයෙන් බැංකු විසින් ද සැලකෙනු ඇත. එසේම සිය වෘත්තියට අවශ්‍ය මෙවලම් සහ උපකරණ ලබා ගැනීම සඳහා බැංකු ණය පහසුකම් ලබා ගැනීමටද, එසේ සුදුසුකම් සහ සහතික ලත් පුද්ගලයන්ට ඉඩ ලැබෙනු ඇත. ඒ අනුව දන්ත සායන පුටුවක් මිලදී ගැනීම සඳහා දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකුට බැංකු ණයක් ලබාගත හැකි පරිදිම කුඩා පරිමාණයේ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් ගැනීම සඳහා පෙදරේරුවකුට ද නැතහොත් විදුලි කියතක් හෝ ආයුධ මුවහත් කරන උපකරණයක් ගැනීම සඳහා වඩු කාර්මිකයකුටද බැංකු ණයක් ගත හැකි වනු ඇත.

අප රටේ දැවැන්ත ප්‍රශ්ණයක් වී ඇත්තේ ඵළදායිතාවය වැඩි කොට ඒ හරහා රටේ සාමාන්‍ය ජනතාවගේ ආදායම වැඩි කිරීමයි. ඉහත පහදා දී ඇති ක්‍රමයට දැනට දුප්පත් යයි සැලකෙන අපගේ රටේ වැඩි බහුතරයක ආදායම අවම වශයෙන් දෙගුණ කර ගැනීමටවත් හැකි වන්නේ නම් එයින් සිදුවන ආර්ථික ප්‍රාතිහාර්යය අතිමහත් එකක් වන්නේය. ආදායම ඵලදායිතාව

හරහා වැඩි කිරීමට හැකි වුවොත් එයින් ලැබෙන අතුරු ඵලය වන්නේ රටේ නිෂ්පාදනය වන භාණ්ඩ සහ සේවාවන්වලට ඇති ඉල්ලුම අති විශාල ලෙස වැඩි වීමය. රටේ ප්‍රගතිය ඒ හරහා ද ඉතා ශීඝ්‍ර ලෙස දියුණු වනවා නොඅනුමානය.

# 8.3

# ඵලදායිතාව වර්ධනය කිරීමට සිත් යොමු කරමු

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට නම් සලකා බැලිය යුතු ඉතා වැදගත් සහ තිරණාත්මක සාධකයක් වන ඵලදායිතාවය ගැන අප අද සළකා බලමු.

ලෝකයේ අනෙකුත් ආසියානු රටවල් හා සසඳන විට, ශ්‍රී ලංකාවේ ඵලදායිතා මට්ටම් ඉතා පහළ මට්ටමක පවති. වෙනත් බොහෝ රටවල ජනතාව ශ්‍රී ලාංකිකයින්ට වඩා හොඳින් වඩා මහන්සියෙන් හා ඵලදායි ලෙස වැඩ කරන බවත් විවිධ විශේෂඥයින් බොහෝ අවස්ථාවල දී අපට පවසති. එබඳු ප්‍රකාශන ඇසෙන විට අපේ ජාතිමාමක හැඟීම් ඉස්මතු වී අපි තරමක් කලබලයටත්, ආවේගයටත් පත් වෙමු. සමහර විට, එසේ කියද්දී ලැජ්ජාවට පත්වන අප එය එසේ නොවේ යැයි දැඩිසේ තර්ක කරමින් 'නිදහසට කරුණුද' හේතු ද ඉදිරිපත් කරමු. එහෙත්, අපගේ ඉමහත් අවමානයට මේ තත්ත්වය සත්‍ය බව අපට පිළිගන්නට වෙනු ඇත.

මහාචාර්ය ඒ.වී.ද.එස්. ඉන්ද්‍රරත්න විසින් ලියන ලද, මෑතකදී පළ කරනු ලැබූ ලිපියක දැක්වෙන ඵලදායිතාවය ගැන තුලනාත්මක සංසංදනයකින් මෙම සැබෑ තත්ත්වය පැහැදිවේ. ඔහුගේ ලිපියේ දැක්වෙන වගුවකින් තෝරා ගත් උධෘතයක් මෙහි පහත දක්වමි.

---

**2003.09.28 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙත ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

ශ්‍රී ලංකාවට සාපේක්ෂව තෝරාගනු ලැබූ ආසියාතික රටවල ජාතික ඵලදායකත්ව මට්ටම්

| | 1981<br>ශ්‍රී ලංකාව මෙන්<br>වාර ගණන | 1994<br>ශ්‍රී ලංකාව මෙන් රට<br>වාර ගණන |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 1.0 | 1.0 |
| ජපානය | 20.0 | 17.0 |
| හොංකොං | 11.0 | 2.1 |
| කොරියාව | 4.7 | 6.1 |
| සිංගප්පූරුව | 12.8 | 13.1 |
| ඉන්දුනීසියාව | 1.3 | 1.2 |
| මැලේසියාව | 5.1 | 4.8 |
| පිලිපීනය | 2.2 | 1.0 |
| පකිස්ථානය | 0.9 | 0.8 |
| චීනය | 7.1 | 8.5 |

1981 දී, ජපානයේ ඵලදායකත්වය ශ්‍රී ලංකාවේ මෙන් දළ වශයෙන් විසි ගුණයක් තරම් වූ බවත් 1994 වන විට මේ විශාල අසාමානත්වය 17 ගුණයක් තරම් මට්ටමකට අඩු කිරීමට අපට හැකි වී තිබෙන බවත් ඉහත වගුවෙන් පෙනෙනු ඇත. කෙසේ වුවද, 1981 දී අපගේ ඵලදායකත්වය මෙන් 12.8 ගුණයක ඵලදායකත්වයක් තිබූ සිංගප්පූරුව, 1994 දී ශ්‍රී ලංකාවේ ඵලදායකත්වය මෙන් 13.1 ගුණයක් ලබා ගනිමින් ඵලදායකත්වය අතින් සිය උසස් තත්ත්වය තවත් වර්ධනය කරගෙන තිබේ. ශ්‍රී ලංකාවට වඩා අඩු ඵලදායකත්වයක් ඇත්තේ රටවල් ස්වල්පයක් පමණක් වීම ද බෙහෙවින් කණස්සල්ල ඇති කරන්නකි. ඒ නිසා, අඩු වශයෙන් ලෝකය පුරා පිළිගැනෙන මට්ටමකටවත් ළඟා වීම සඳහා ජාතියක් වශයෙන් අපේ ඵලදායිතා මට්ටම් නගා සිටු වීමට අප බොහෝ දේ කළ යුතු බව පැහැදිලි ය.

මේ ප්‍රශ්නය පිළිබඳව උනන්දුවක් දැක්වූ පුද්ගලයින් කිහිප දෙනෙකුම බොහෝ කාලයක් තිස්සේ අපේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට මේ පිළිබඳ අනතුරු අඟවා ඇති නමුත් කිහිප දෙනෙකු හැරුණු විට

බොහෝ දෙනා මේ ඵලදායකත්වය පිළිබඳ ගැටලුව ගැන උනන්දුවක් නොදක්වති. ප්‍රතිපත්ති සම්පාදකයන් යම් ක්‍රියාමාර්ගයක් ගෙන ඇති අවස්ථා ස්වල්පයේදී පවා, එසේ කර ඇත්තේ දැනෙන සුලු ප්‍රතිඵල නැතිව ප්‍රධාන වශයෙන්ම සංකේතාත්මක ආකාරයකින් පමණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අප රටේ නිමැවුම් ආයෝජන අනුපාතය සහ යම් නිශ්චිත ආයෝජන මට්ටමකට ආර්ථික වර්ධන අනුපාතයන් දශක කිහිපයක් තිස්සේම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට වඩා බොහෝ සෙයින් පසු පසින් සිටී. ඒ නිසා මේ මූලික ගැටලුව සම්බන්ධයෙන් යොමු විය යුතු හදිසි හා බරපතල අවධානය ඒ කෙරෙහි යොමු කොට ඊට ප්‍රතිචාරයක් දැක්වීමටත් ඵලදායකත්වය සහ අප රටේ වැඩ කිරීමේ සදාචාරය (work ethic) වැඩි දියුණු කිරීමේ මූලික පියවර ගැනීමටත් දැන් කාලය එළඹ ඇත. ලෝකයේ අන් රටවල් සමග වාසිදායක ආකාරයකින් තරග කිරීමටත් මහන්සියෙන් වැඩ කරන දක්ෂ පුද්ගලයින් සිටින ජාතියක් වශයෙන් අපේ හිස් කෙළින් තබාගෙන කටයුතු කිරීමටත් අපට හැකි වන්නේ එවිට පමණි.

මේ අරමුණ සපුරා ගැනීමේ පළමු පියවර වශයෙන් රාජ්‍ය අංශයේ ප්‍රමුඛ ආයතනවල ඵලදායිතා මට්ටම් මැනීම සහ ඒවා ප්‍රකාශයට පත් කිරීම අප ආරම්භ කළ යුතු අතර එබඳු දත්ත ප්‍රසිද්ධියට පත් කළ යුතුය. එබඳු ක්‍රියාවලියක් තුළින් නිරන්තර අවබෝධයක් ඇතිවන අතරම සහභාගී වන ආයතන අතර තරගකාරීත්වය පිළිබඳ හැඟීමක්ද ඇති වනු ඇත. එබඳු අධ්‍යයනයන් කිරීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන හෝ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන තුළ මනාව පුහුණු වූ ඒකකයන් ආරම්භ කළ හැකි වනු ඇත. ඉලක්කයක් කරා වැඩ කිරීමෙන් පරමාර්ථය පිළිබඳ හැඟීමක් ඇතිවේ. ඒ අනුව වර්තමාන ඵලදායකත්ව මට්ටම පිළිබඳ දත්ත පදනමක් හැටියට ගෙන ඵලදායකත්වයේ වර්ධනයන් මැනීමටත් ඒ සඳහා ප්‍රදානයන් කිරීමටත් හැකි වේ. එය අනිවාර්යයෙන්ම වාසිදායක ප්‍රතිඵල ගෙන දෙනු ඇත. ඊට අමතරව වර්තමානයේ ක්‍රියාත්මක වන ඵලදායිතා ත්‍යාග ප්‍රදාන යෝජනා ක්‍රම, සම්මන්ත්‍රණ, සාකච්ඡා, තත්ත්ව කව ආරම්භ කිරීමේ කටයුතු ආදිය ද ක්‍රියාශීලීව දිගටම කරගෙන යා හැකිය. හැකිනම් එබඳු වැඩසටහන් වල ක්‍රියාශීලීත්වය

වැඩි කළ හැකිය. 'ඵලදායකත්වය කර්මාන්ත වලට පමණක් අදාළ වන එකකි' යන වැරදි අවබෝධයක්ද අප රටේ පවතින බව පෙනේ. ඒ නිසා, සියලුම වර්ග වල සේවාවන්හි හා සංවිධාන වල ඵලදායකත්වය මැනීමටත්, වැඩි දියුණු කිරීමටත් හැකි බව මාධ්‍ය තුළින් අවධාරණය කළ යුතු අතර ප්‍රධාන පෙලේ ආයතන සඳහා යෝජනා කරන ලද ඵලදායකත්ව මැනීමේ ක්‍රියා මාර්ගය ඉතා ප්‍රයෝජනවත් ව්‍යායාමයක් වන්නේ මේ පසුබිම අනුවය.

# 8.4

# ක්‍රියාකාරීත්වය පදනම් කරගත් පිරිවැයකරණ ක්‍රමයකට රජය පිවිසිය යුතුයි

අද රාජ්‍ය අංශයේ පවතින පාලන සහ මූල්‍ය ක්‍රමයේ විශාල අඩුපාඩුවක් වශයෙන් මා දකින්නේ එහි විවිධ ක්‍රියාකාරීත්වයන්ගේ පිරිවැය කිසිවකු හරියාකාරව නොදැන සිටීම ය. 1991දී, ඉන්ඩියානාපොලිස් හි නගරාධිපතිවරයා වන ස්ටීවන් ගෝල්ඩ්ස්මිත් ඔහුගේ ප්‍රධාන මාර්ග නඩත්තු ඉංජිනේරුවරයා සහ ගණකාධිකරුවාගෙන්, 'පාරේ ඇති වළක් පිරවීමට කොපමණ මුදලක් වැය වේද?' යයි ඇසුවේ ය. එහෙත් එම ප්‍රශ්ණයට පිළිතුරු දීමට ඔවුන්ට නොහැකි විය. සිය කාර්යයන්ගේ සැබෑ පිරිවැය කොපමණදැයි නොදැන සිය කාර්ය සාධනයන් වැඩි දියුණු කිරීමට ඔවුන්ට කිසි දින නොහැකි වේයැයි ඔවුන්ට වැටහුණේ එවිට ය. යම් සංවිධානයක් එහි ඒ ඒ ක්‍රියාකාරීත්වයන්හි පිරිවැය දැන සිටිය යුතු ය යන්න අද මනාව පිළිගනු ලැබ ඇති සිද්ධාන්තයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංවිධාන රාශියක් මෙන් ම ප්‍රගතිශීලි රාජ්‍ය නියෝජිතායතන කිහිපයක් ම දැන් මෙම සිද්ධාන්තය ජාත්‍යන්තරව අනුගමනය කිරීමට පෙළඹී සිටී.

රජය විසින් සපයනු ලබන සේවාවන් පිරිවැයකරණය කිරීමේ ක්‍රියාවලිය, ක්‍රියාකාරීත්වය පදනම් වූ පිරිවැයකරණ ක්‍රමයක් (Activity Based Costing- ABC) බවට වෙනස් කෙරෙන්නේ නම්, සමහර විට බෙහෙවින් අඩු අරමුදල් වලින් සපුරා ගත හැකි ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන විශාල මුදල් ප්‍රමාණයන් වැය කරණ බවට අනාවරණය වනු ඇත. උදාහරණයක් වශයෙන්, අප රටේ පළාත් සභා සිය මුදල් ප්‍රතිපාදනවලින් 86% තරම් විශාල මුදල් ප්‍රමාණයක් වැටුප් සහ සේවකයින් සම්බන්ධ අනෙකුත් වියදම් වෙනුවෙන් වැය කරණ අතර, ඒවායින් පෙන්වන

---

**2003.10.05** දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

'ප්‍රතිඵල' ඉතා සුලු යයි ජනතාවගේ හැඟීමයි. ක්‍රියාකාරීත්වය පදනම් කරගත් පිරිවැයකරණ ක්‍රමයක් (ABC) පළාත් සභා වලත් ක්‍රියාත්මක වේ නම්, ලැබෙන ප්‍රතිඵල හරහා පවත්නා පාලන ව්‍යුහය පිළිබඳව නැවත සිතීමට ජනතාව වහා පෙළඹෙනු ඇතැයි මම සිතමි. පළාත් සභා වලට මා වඩාත් සමීප නිසා මා මෙසේ පැවසුවද, වඩා ඉහළ ජාතික මට්ටම්වල දී ද, ඊට පහළ නගර සහ ප්‍රාදේශිය මට්ටම්වල දී ද, ආණ්ඩුවේ වියදම් සම්බන්ධයෙන් මෙය එසේ ම සත්‍ය යයි මගේ හැඟීමයි.

සේ නම් මෙබඳු ABC ක්‍රමයක් අපට ක්‍රියාත්මක කළ හැකි වන්නේ කෙසේද? ක්‍රියාකාරීත්වය පදනම් කරගත් පිරිවැයකරණය යනු ඒ පිරිවැය දැරීමට හේතු කාරක වන නිෂ්පාදන හා සේවා කරා යම් සංවිධානයක පිරිවැය, අවසානයේ දී යොමු කරන ක්‍රමයක් නිර්මාණය කිරීමේ මාර්ගයකි. ක්‍රියාකාරීත්වයන්හි පිරිවැය මෙසේ හඳුනා ගනු ලැබීමෙන් පසු, පළමුව, දරන ලද පිරිවැයට එබඳු ක්‍රියාකාරීත්වයක් සැබැවින් ම ඉටු කළ හැකිද, සහ දෙවනුව වඩා හොඳ සහ වඩා ලාභ ආකාරයකින් එය ඉටු කළ හැකි ද යනුවෙන් තක්සේරුවක් කළ හැකි ය. විධිමත් ABC ක්‍රමයක් ක්‍රියාත්මක වේ නම්, අතිරික්තය කපා හැරීම පහසුවෙන් ම කළ හැකි තරම් විශාල අතිරික්ත ප්‍රමාණයක්, රජයේ සියලු ම වර්තමාන ක්‍රියාකාරීත්වයන් තුළ ඇති බව පැහැදිලි වීම මට නිසැක ය.

සාමුහික ආයතන රාශියක් ම දැන් මේ ක්‍රියාකාරීත්වය පදනම් කර ගත් පිරිවැයකරණ ක්‍රම අනුගමනය කරයි. එසේම, ලෝකය පුරාම, මේ ABC ක්‍රමය දැන් අනුගමනය කරනු පෙනේ.

උදාහරණයක් වශයෙන්, පාරවල් නඩත්තු භාරව සිටින පළාත් පාලන බල මණ්ඩලයක් දැනට සිය වියදම් පහත දැක්වෙන ආකාරයට ප්‍රකාශ කරනු ඇත.

| වැය අයිතමය | වියදම රු. '000 |
|---|---|
| වැටුප් | 372 |
| සේ.අ./සේ.භා.අ. | 118 |
| සැපයුම් | 77 |
| උපකරණ | 24 |
| එකතුව | 591 |

ක්‍රියාකාරිත්වය පදනම් කර ගත් පිරිවැයකරණ ක්‍රමයකට මාරු වීමෙන් පසු සිය පිරිවැය සමහර විට පහත දැක්වෙන ආකාරයෙන් ප්‍රකාශ කරනු ඇත.

| නිමැවුම | පිරිවැය රු. '000 |
|---|---|
| වළවල් අලුත්වැඩියාව | 131 |
| මතුපිට නැවත සැකසීම | 241 |
| පදික වේදිකා සැකසීම | 175 |
| පැලුම් සකස් කිරීම | 44 |
| එකතුව | 591 |

ඉහත උදාහරණයේ දී පළාත් බල මණ්ඩලයේ 'නිමැවුම්' ප්‍රකාශ වන අතර එකී නිමැවුම් ඇති කිරීමේ පිරිවැය ද ප්‍රකාශ වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ණය දෙන ආයතන ශ්‍රී ලංකාවේ පාලනය දුර්වල බවට නිරන්තරයෙන් ම මැසිවිලි නගති. එය එසේ බව අපි හැම දෙනා ම දනිමු ! ඔවුන් එසේ කරනවාත් සමගම, ක්‍රියාකාරිත්වය පදනම් කරගත් පිරිවැය ක්‍රමවලට මාරු වීමට අප ආණ්ඩුවේ ආයතන වලට බලපෑම් කරන්නේනම්, එය ඉතා යෝග්‍යයයි මගේ මතයයි. මේ සඳහා අඩු ගණනේ මුල් පෙළේ ආයතන කිහිපයක්වත් ප්‍රතිසංස්කරණය කිරීමට ඔවුන් ආණ්ඩුවට ක්‍රියාශීලී ලෙස සහාය දිය යුතුය. මෙබඳු නව කාර්යයන් දියත් කිරීමට හැකියාවක් ඇති පුද්ගලයින් රාශියක් ශ්‍රී ලංකාවේ සිටින අතර, බාහිර සහාය ඇතිව හෝ නැතිව රජය මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නේ නම් ඉදිරි වසර කිහිපය තුළ දී ඉන් ලද හැකි ප්‍රතිලාභ විශ්මයජනක වනු ඇත. එසේ කරනු වෙනුවට රජයේ සාම්ප්‍රදායික ප්‍රයත්නය සහ ප්‍රතිචාරයන් වශයෙන් අපට පෙනෙන්නේ, සපයනු ලබන සේවාවල ස්වභාවය පිළිබඳ කවර හෝ ආකාරයකින්වත් කල්පනා නොකොට, අත්තනෝමතික ලෙස පූර්ව නිශ්චිත ප්‍රතිශතයන්ගෙන් ඒවායේ වියදම් කපා හරින ලෙස අමාත්‍යාංශවලින් හා දෙපාර්තමේන්තු වලින් හුදෙක් ඉල්ලා සිටීම පමණි. මේ ආකාරයේ යල් පැන ගිය වෘත්තිය නොවන ආකාරයේ ප්‍රවේශයන්ගෙන් අප

ඉක්මනින් ඈත්වන තරමට අපගේ පාලන ව්‍යුහයන් වඩා යහපත් වනු ඇත.

බස්නාහිර පළාත් සභාව හරහා වැයවන වාර්ෂික මුදල රුපියල් බිලියන 10 කට වැඩි ය. එහෙත්, එම මුදල ප්‍රකාශ වන්නේ වැටුප්, වේතන, උපකරණ, සැපයුම් ආදී වැය අයිතමයන් වශයෙනි. සේවකයින් දහස් ගණනකගෙන් අපේක්ෂිත 'නිමැවුම' ගැන හෝ ඔවුන් ලබා දිය යුතු 'ප්‍රතිඵල' ගැන හෝ පැහැදිලි සඳහනක් නැත. මෙය පළාත් සභාවලට පමණක් සත්‍ය වූවක් නොවේ. මුලු රජයේම ආයතන සියල්ලෙහිම පාහේ මේ අඩුපාඩුව පවතියි. ඒ නිසා අප රටේ මූල්‍ය පාලනය රටේ පවතින මූලික ගැටලු වලින් එකක් බවට පත්ව තිබේ යැයි ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි බාහිර ආයතන පවා එළිපිට ප්‍රකාශ කර තිබීම පුදුමයක් නොවේ.

# 8.5

## අයවැය හරහා වගකීම් පැවරීමේ ක්‍රමයක්

සෑම වසරක් පාසාම ශ්‍රී ලංකාවේ අයවැය, මුදල් ඇමතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අප රටේ ජනතාවට දැන් හුරුවී ඇත. අයවැයක් ඉදිරිපත් කෙරෙන අවස්ථාවන්හිදී ජනතාව සාමාන්‍යයෙන් පුන පුනා බලා සිටින්නේ, නව අයවැය තුළින් තමන්ගේ පඩි නඩි වැඩි වේද, ජීවන වියදම අඩුවේද, නව පහසුකම් සහ දිරිගැන්වීම් ලැබේද, තමන්ගේ ජීවන මට්ටම තවදුරටත් ඉහළ යයිද, කියාය. දැනෙන, පෙනෙන සහන අයවැයෙන් තමන්ට ලැබුනහොත්, එය 'ශුභ' අයවැයක් යැයිද, එසේ නොවුවහොත් එය 'අශුභ' එකක් යැයි සිතිමටද, අප බොහෝ දෙනා දැන් පුරුදු වී තිබේ. එහෙත්, එය එසේද? රටක අයවැයක් යනු කුමක්ද? අයවැයෙන් කෙරෙන්නේ රජයේ ආදායම එකතු කොට, එම සංඛ්‍යාවෙන් රජයේ වියදම අඩු කොට, සාමාන්‍යයෙන් ලැබෙන සෘණ අගය පියවීමට මුදල් ඇමති කරන්නට අපේක්ෂා කරන ගණන් හිලව් කිරීම අඩංගු යෝජනා මාලාවක් පමණක්ද? ඇත්ත වශයෙන්ම අයවැයක් එලෙස පෙනුනත්, අයවැයකින් සිදුවන කාර්යභාරය ඊට වඩා විශාල ලෙස වෙනස් බව අප අවබෝධ කරගත යුතුය.

රටක අයවැයක් යනු, එම රටේ රජය, ඉදිරි වසර සහ ඊලඟ වසර කිපය වෙනුවෙන් දියත් කිරීමට බලාපොරොත්තු වන සේවාවන්, සංවර්ධන කටයුතු සහ අනිකුත් සැලසුම් (සංඛ්‍යාත්මක අගයන්ද සමග), විදහා දක්වන උපාය මාර්ග අඩංගු ප්‍රකාශනයකි. රටේ ඉදිරි ගමන කෙසේ විය යුතුද? කුමන වේලාවන්හිදී සංවර්ධන යෝජනා දියත් කිරීමට බලාපොරොත්තු වන්නේද? කවුරුන් හරහා එකී ක්‍රියාවන් කිරීමට නියමිතද? එම ක්‍රියාවන් තුලින් සමාජයට භුක්ති විඳීමට හැකිවන වාසි සහ ප්‍රතිඵල මොනවාද? මෙවැනි

---

**2003.11.16 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

ප්‍රශ්න වලට පිලිතුරු සාමාන්‍යයෙන් අයවැය ප්‍රකාශනයේ අඩංගු වනු දකින්නට ඇත. එසේ කරද්දී, මුදල් ඇමති සාමාන්‍යයෙන් රටේ පවතින ආර්ථික සහ සාමාජීය තත්ත්වය විග්‍රහයකට ලක් කරන අතර, රටේ ශක්තීන් සහ දුර්වලතා ද, රටට වාසි ලබා ගත හැකි අවස්ථාද, මුහුණ දිය යුතු අභියෝගද, උපුටා දක්වයි.

ඉහත පෙන්වා දී ඇති අන්දමට, අයවැයක් යනු සංවර්ධනයට දායක වන ප්‍රකාශනයක් නම්, ජනතාවක් වශයෙන් අපට අයවැයකින් බලාපොරොත්තු විය හැක්කේ කුමක්ද? පළමුව රටේ සංවර්ධන සැලැස්ම සහ එම සැලැස්ම දියත් කිරීමට අවශ්‍ය සම්පත් ගැන පුලුල් විග්‍රහයක් අයවැය තුළින් අපට අපේක්ෂා කළ හැක. දෙවනුව, රජයේ සැළසුම් තුලින් බලාපොරොත්තු වන ඉලක්කද, ප්‍රතිඵලද එයින් හෙළි විය යුතුය. තෙවනුව, සෑම අමාත්‍යාංශයකටම වෙන් කරන මුදල කුමන සමාජීය සහ/හෝ ආර්ථික ප්‍රතිඵලයන් අපේක්ෂාවෙන් කරන්නේද යන්න පැහැදිලි විය යුතුය.

සමහර දියුණු රටවල මහ භාණ්ඩාගාරයෙන් අමාත්‍යාංශ වලට මුදල් වෙන් කරන විට, භාණ්ඩාගාරය සහ අදාල ඇමතිවරුන් අතර විශේෂ ගිවිසුම් ඇති කරගනු ඇත. එවැනි ගිවිසුම් වලින් විදහා දැක්වෙන්නේ සමාජය විසින් අමාත්‍යාංශයන්ට ලබා දෙන මුදල් හරහා, එම අමාත්‍යාංශයන් සමාජයට ලබාදීමට නියමිත ප්‍රතිඵල කවරේද, එම ප්‍රතිඵල සාර්ථකවේ යයි පිළිගැනීමට නම්, ඉෂ්ට විය යුතු නිශ්චිත ඉලක්ක කුමක්ද, ඒවා ක්‍රියාත්මක වන්නේ කුමන දිනයන්හිද යන තොරතුරුය. නිදසුනක් වශයෙන්, පොලිස් දෙපාර්තමේන්තුවට මුදල් වෙන් කරන විට, පොලිසිය භාර ඇමතිවරයා එම මුදල් උපයෝගී කරමින්, රටේ පවතින අපරාධ මට්ටම යම් පෙර නිශ්චිත මට්ටමකට අඩු කිරීමේ වගකීම භාර ගන්නා ලෙස, භාණ්ඩාගාරය ඉල්ලා සිටියි. එවිට ඇමතිවරයාගේ කාර්ය භාරය වන්නේ අයවැයෙන් සම්මත වී සමාජයෙන් ඔහුට පවරන මුදල් සහ අනිකුත් සම්පත් පාවිච්චි කරමින් රටේ පවතින අපරාධ සංඛ්‍යාව (අඩු තරමින් භාණ්ඩාගාරයත් සමග එකගත්වයකට එලඹෙන ප්‍රමාණයට වත්) අඩු කිරීමය. ඒ තුළින් ඔහු තම වගකීම සහ කාර්යය ඍජුවම

සහ පැහැදිලිව භාරගනු ඇත. මේ ආකාරයට සමාජය, භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශයන් අතර සෘජු බැඳීමක් සහ වගකීම් පැවරීමක් සිදු වන්නේය.

වසර 50 කටත් අධික කාලයක් තිස්සේ අප රට අනුගමනය කල අයවැය ක්‍රමය තුළින් අමාත්‍යාංශවලට පැහැදිලි වගකීම් සෘජුවම නොපැවරුනි. වසරක් පාසා අමාත්‍යාංශ වලට මුදල් සහ අනිකුත් සම්පත් විශාල ප්‍රමාණයන් වෙන් වුවද, එම මුදල් සහ සම්පත් තවත් භෞතික ගෙවීම් වලට සහ සම්පත් වලට යෙදෙනු හැරුණු විට, ඒ තුළින් සෘජුවම සමාජයට දැනෙන, බලපාන ප්‍රතිඵල දැඩි ලෙස සහ පැහැදිලිව පිළිඹිබු වන ක්‍රමයක් අපි නොදැක්කෙමු. ඒ නිසා, දැනට පවතින මූල්‍ය සහ අයවැය ක්‍රමය හරහා අපගේ ඇමතිවරුන්ට සහ පාලකයින්ට අවුරුදු 50 කටත් අධික කාලයක් තිස්සේ තම වගකීම් දැනුවත්ව හෝ නොදැන්වත්ව පැහැර හැරීමට පහසු වුනි. මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා නවීන ලෝකයේ 'වගකීම් හරහා සකස් කෙරෙන පාලන පද්ධති' (Governance Systems that ensure Accountability) අද නිර්මාණය කොට ඇත. මෙවැනි නවීන, ප්‍රගතිශීලි පාලන පද්ධති සහ ක්‍රම දියත් කිරීම සමහරු සිතන තරම් අපහසු නැත. ඔවුන් පෙන්වා දීමට වෑයම් කරන තරම් වැඩි වියදමක්ද ඒ සඳහා අවශ්‍ය නැත. ඒ සඳහා අවශ්‍ය වන්නේ අප සියලු දෙනා තුළම ආකල්පිය වෙනසක්ද, සියුම් පාලන ප්‍රතිසංස්කරණයක් ද, නිලධාරි සහ සේවකයන්ට මෙම සංකල්පය තේරුම් කර දීමට අධ්‍යාපන ක්‍රමයක්ද මෙම සංකල්පයට පක්ෂ දේශපාලනික කැපවීමක් ද පමණි. එවැනි පරිසරයක් හරහා, මෙහි විස්තර කර ඇති පාලන පද්ධතින් සාර්ථකව දියත් කිරීමට හැකි වුවහොත්, ඒ තුළින් නෙළා ගත හැකි ආර්ථික වාසි අප්‍රමාණය. එසේ කරද්දී එම නව ක්‍රම අප රටේ වඩාත් මුදල් වැය කිරීමට නියමිත අමාත්‍යාංශ වලට පළමුව හැඳින්වුවහොත් එම අත්දැකීම් පාඩමට ගෙන, අනිකුත් අමාත්‍යාංශ වලට ද මෙම සංකල්පය ටික කලකින් හැඳින්වීමට හැකි වන්නේය. මෙලෙස මෙම සංකල්පය දියත් කිරීමෙන් අප අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ සංස්ථා තුළ සිදුවන නාස්තිය, දූෂණය සහ අතපසු වීම් බොහෝ දුරට අවම කරගැනීමට අපට හැකි වනු ඇත.

රටක අයවැයක්, ජනතාවට දැනෙන, හැගෙන ජිවමාන සංවර්ධන සැලැස්මක් අඩංගු ප්‍රකාශනයක් විය යුතුය. එය සකස් කිරීමේදී ද දියත් කිරීමේ දී ද අභියෝග රාශියක් මතුවනු ඇත. එහෙත්, ප්‍රතිඵල හරහා මුදල් වෙන් කිරීමක් (output-based allocations) සිදු වන්නේ නම්, අප රටේ පාලන යන්ත්‍රය වගකීම් සහිත එකක් බවට පිවිසෙනු ඇත. එසේ නොවන්නේ නම්, දුර්වලතා බහුලව ඇති දැනට පවතින අයවැය ක්‍රමයෙහිම රැඳී සිටිමින්, අප රටේ ආර්ථික තත්ත්වය ඉහල තත්ත්වයකට නංවාලීමට අපට අතිශයෙන් අපහසු වන්නේය.

# 8.6

# ඵලදායිතා වර්ධනය සඳහා වැටුප් දෙසතියකට වරක්?

අප රටේ මාසික වැටුප් ලබන බොහෝ දෙනා මුහුණ පාන එක් දැවැන්ත ගැටලුවක් නම් මාසය පුරා තමන්ගේ වැටුප කෙසේ ආවරණය කරගත හැකිද යන්නය. සාමාන්‍යයෙන් සේවකයෙකු හෝ විශ්‍රාමිකයෙකු තම මාසික වැටුප ලබාගෙන සති දෙකක පමණ කාලයක් ගත වුවායින් පසු එම මුදල සම්පූර්ණයෙන්ම පාහේ වියදම් කරගෙන ඇති නිසා, මාසයේ ඉදිරි සති දෙක තුළ තමන් අතෙහි මුදල් නැති ස්වභාවයකට පත්වෙති. ඒ හේතුව නිසා මාසයේ අවසාන සති දෙක තුලදී ඔවුන් ඉතා උග්‍ර ආර්ථික සහ මානුෂික ප්‍රශ්න වලට මුහුණ දෙමින් බොහෝ විට අධික පොලියට මුදල් ගැනීමටත්, අත මාරුවට යයි කියමින් තම හිතවතුන්ගෙන් මුදල් ණයට ගැනීමටත් දැන් පුරුදු වී තිබේ.

මෙම තත්ත්වයට තුඩු දෙන හේතුන් විග්‍රහ කරද්දී අපට පෙනෙන එක් කරුණක් නම් බොහෝ දෙනා තමන්ට ලැබෙන මුදල සම්පූර්ණ මාසය ආවරණය වන ලෙස පාලනය කර ගැනීමට අපොහොසත් වන බවය. මෙසේ සිදුවන්නේ මුදල් කළමනාකරණය කර ගැනීමට ඔවුන්ගේ ඇති නොදැනුවත්කම සහ දුර්වලතාවය යැයි අපට සමහර විට සිතන්නට ඉඩ ඇත. මගේ අත්දැකීම අනුව, දක්ෂ සහ උගත් යැයි සැළකෙන වෘත්තිකයන් සේවය කරන ඉහළ පෙලේ සමාගම්වල පවා, මුදල් පාලනය සහ මූල්‍ය විනය සාර්ථකව ඉෂ්ට නොවන අවස්ථා බහුලය. එසේ නම්, මුදල් පාලනය සම්බන්ධයෙන් විශේෂ දැනුමක් හෝ පුහුණුවක් නැති සාමාන්‍ය ජනතාවට මුදල් පාලනයක් සහ මූල්‍ය විනයක් ඇතිකර ගනිමින් තමන්ගේ

---

**2003.12.14 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙත ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

මූල්‍ය ප්‍රශ්න වලට මුහුණ දීමේ හැකියාව නැතිවීම හෝ අඩුවීම විශ්මයට කාරණයක් නොවන බව අපට පැහැදිලි විය යුතුය.

මුදල් කළමණාකරණය සහ පාලනය, යම් විනයක් සහිතව ද, සැළැස්මක් හරහා ද, සිදු කළ යුතු වගකීම් බහුල කාර්යයන්ය. කුමන මට්ටමක මෙම මුදල් කළමනාකරණ ක්‍රියාවලිය සිදු වුවද, එම කළමනාකරණය සිදුකළ යුතු කාල පරතරය ක්‍රමයෙන් දීර්ඝ වන විට, එය සාර්ථකව කර ගැනීමට ඇති හැකියාව ද ඊට සාපේක්ෂව අභියෝගාත්මක වන්නේය. යම් ආයතනයකට මුදල් ගලා ඒමේ කාල පරතරය මසකට වරක් හෝ කාර්තුවකට වරක් පමණක් සිදු වන්නේ නම්, එවැනි පරිසරයක මුදල් පාලනය කිරීම ස්වභාවයෙන්ම තියුණු සහ අපහසු කාර්යයක් වන්නේය. එමෙන්ම, සාමාන්‍ය ජනතාවගේ අතට මුදල් ලැබෙන දින පරතරය ද මසකට වරක් පමණක් වන විට, ඔවුන්ට තමන්ගේ අතැති මුදල කළමනාකරණය කර ගැනීමට ඇති අභියෝගයද ඉතා තියුණු වන බව අපට නිගමනය කළ හැක. බොහෝ විට මෙම අභියෝගයට මුහුණ දී, එයින් ජය ගැනීමට දැනුමක් සහ විනයක් නැති අය ඒ හරහා ආර්ථික මෙන්ම මානුෂික සැලීමකට භාජනය වනු අප නිතරම දකිමු.

ආයතනයකට වුවත් දෙසතියකට වරක් හෝ සතිපතා හෝ දෛනිකව හෝ මුදල් ගලා එන්නේ නම්, මසකට වරක් පමණක් මුදල් ලැබෙන තත්ත්වයට වඩා එම ආයතනයේ මුදල් පාලනය බෙහෙවින් පහසු වන්නේය. මේ බව මූල්‍ය පාලනයෙහි යෙදෙන ඕනෑම විශේෂඥයෙකු සාක්ෂි දරනවා ඇත. එම තර්කය අනුව, සෑම සාමාන්‍ය පුද්ගලයෙකුටමද තමන්ගේ වැටුප සති දෙකකට වරක් ලබෙන සේ ගෙවීම් සිදු වුවහොත්, තමන්ගේ මුදල් පරිහරණය වඩා ක්‍රමවත් සහ සාර්ථක ලෙස කර ගැනීමට අනිවාර්යයෙන්ම හැකි වන්නේය. එසේ වුවහොත්, ඔවුන්ට තම මුදල් පාලනය කර ගැනීමට අවශ්‍ය වන දින පරතරය දැනට පවතින දින 30 වෙනුවට දින 15 කට පමණ අඩු දින ගණනකට සීමා වන්නේය. එවිට තමන්ගේ මූල්‍ය කටයුතු වර්තමානයට වඩා සාර්ථකව කර ගැනීමට ශක්තියක් සහ පහසුකමක් ඇතිවේය යන්න මගේ මතයයි.

දැනටමත් මෙම සිද්ධාන්තය තේරුම් ගෙන තිබෙන සමහර ආයතන මාසයේ 10 වැනිදා පමණ වැටුපෙන් අත්තිකාරම් මුදලක් ගෙවීමෙන්ද, මාසයේ 20 වැනිදා පමණ අතිකාල මුදල ගෙවීමෙන්ද, මාසයේ 30 වැනිදා පමණ ඉතිරි වැටුප ගෙවීමෙන්ද, චක්‍රාකාරව හෝ සේවකයන්ගේ මූල්‍ය පාලන කටයුත්ත වඩාත් ලිහිල් වන ලෙස කටයුතු යොදා ඇත. එම සේවායෙන් මෙවැනි වැටුප් ගෙවන ක්‍රමයක් තුළින් ලබා දෙන්නට බලාපොරොත්තු වන ප්‍රතිඵලය නම් සේවකයන් අතට විටින් විට මුදල් ලබාදීමෙන් ඔවුන්ගේ මුදල් කළමණාකරණය පහසු කරවීම යයි අපට සිතිය හැක. ඒ ආකාරයට හෝ වෙනත් ආකාරයකට සැමවිටම පාහේ යම්කිසි මුදලක් සේවකයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ අතෙහි රැඳෙන ක්‍රමයක් අප රටට හඳුන්වා දීම ඉතා යෝග්‍ය යයි මා සිතමි. එසේ කළ හැකි නම්, ඒ හරහා සේවකයන්ගේ මානසික පීඩනය සැළකිය යුතු අන්දමකින් අවම කර ගත හැකිය. අද ලෝකයේ බොහෝ දියුණු රටවල සේවායෙන් තම සේවකයන්ගේ පඩි නඩි ගෙවන්නේ සතියකට වරක්ය. ඒ අතරම, එම රටවල සම්ප්‍රදාය වී ඇත්තේ ගෙවල් කුලි, පහසුගෙවීමේ ක්‍රම, ණය වාරිකයන්, යනාදී ගෙවීම් සතිපතා ගණුදෙනු කිරීමය. එවැනි ක්‍රමයක් හරහා, සේවකයන්ගේද, සේවකයන්ගෙන් ගෙවීම් ලබන අනිකුත් පුද්ගලයින් සහ ආයතන වල වැඩ කටයුතුද, මාසිකව වෙනුවට සති පතා සිදුවන්නේය. නිදසුනක් වශයෙන් තම නිවස කුළියට දී කුලිය ලබාගන්නා විශ්‍රාමිකයෙකුට සති පතා තම ගෙවල් කුලී ආදායම ලැබෙන්නේ නම්, තමාගේ පෞද්ගලික මුදල් කළමනාකරණය පහසු වන්නේය. ඒ අතරම, සේවකයන්ගේ මානසික තත්ත්වය ද, ඔවුන්ගේ ඵලදායිතාවය ද, තමන්ගේ කාර්යය කෙරෙහි ඇති හැඟිම ද, තමන්ගේ වැඩ කෙරෙහි ඇති ආචාර ධර්ම ද දියුණු වන නිසා, සමස්තයක් වශයෙන් රටේ ආර්ථිකයටද විශේෂ වාසියක් ලැබෙනු ඇත. සමහරවිට, මෙවැනි ක්‍රමයක් නිසා, වැටුප් ලබන්නන්ගේ ඉතිරි කිරීමට ඇති හැඟිම සහ හැකියාව අඩාල වේ යයි සමහරු පවසන්නට පුලුවන. එහෙත් මෙහිදී අප තේරුම් ගත යුත්තේ ඉතිරි කිරීමට ශක්තියක් ඇති පුද්ගලයා තම වැටුප මාසිකව හෝ සතිපතා හෝ දෛනිකව හෝ ලැබුණද එසේ කිරීමට පෙළඹෙන බවයි. ඒ අතර, මෙම යෝජිත ක්‍රමය හරහා

වඩාත්ම සහනය ලබන්නේ ඉතිරි කිරීමට අපහසු තත්ත්වයක සිටින පුද්ගලයින් නිසා, මේ ක්‍රමයෙන් එවැනි අයට වාසියක් මිස අවාසියක් නොවනු ඇත.

අප රටේ පවතින සමස්ත ඵලදායිතා මට්ටම ඉතා පහළ එකක් බව අප හොඳින් දනිමු. එය වැඩි කළක් යන්නට මත්තෙන් ශීඝ්‍රයෙන් වර්ධනය කර, රටේ ආර්ථික පදනම බෙහෙවින් ස්ථාවර කර ගැනීම අද යුගයේ අවශ්‍යතාවයයි. එසේ කරද්දී එම තත්ත්වයට තුඩු දෙන ක්‍රියාමාර්ග රාශියක් සමාන්තරව ක්‍රියාත්මක කිරීමට අප කටයුතු කළ යුතුය. දම්වැලක ශක්තිය එහි දුර්වලතම පුරුකේ ශක්තිය බව අප අසා තිබේ. ඒ වගේම යම් රාජකාරියක් සාර්ථකව සහ ඵලදායිව කර ගැනීමට නම් එම කාර්යයට සම්බන්ධ සියලු දෙනාටම තමන්ගේ කාර්යයන් සාර්ථකව කර ගැනීමට අවශ්‍ය පරිසරය සහ වාතාවරණය අප බිහිකළ යුතුය. එසේ නොවුවහොත්, ඔවුන් දුර්වල පුරුක් බවට පත්වී මුලු දම්වැලේම ශක්තිය අඩාල වනු ඇත. අද පවතින ඉතා උසස් පෙළේ තාක්‍ෂණය උපයෝගි කරගෙන මෙවැනි ක්‍රියාවලියක් දියත් කිරීම අපහසු කාර්යයක් නොවේ. එලෙස, තාක්ෂණය පාවිච්චි කරමින් අප රටේ බහුතර ජන කොටසක මුදල් ප්‍රවාහය (Cash flow) සැළකිය යුතු අන්දමකින් වර්ධනය කරමින් ඒ තුළින් ඔවුන්ට විශේෂ සහනයක්ද, සාමාන්‍ය මුදල් කළමනාකරණයේ සැළකිය යුතු වර්ධනයක්ද, සමස්ත ඵලදායි මට්ටමේ දියුණුවක්ද ඇති කිරීමට අපට මෙය අවස්ථාවක් කරගත හැක.

# 8.7

## සේවක භාරකාර අරමුදල වැඩ දෙගුණ වීමක්ද?

බොහෝ අවස්ථාවලදී නාස්තිය ගැන සලකා බලන විට අප පුරුදු වී තිබෙන්නේ දැනෙන, පෙනෙන නාස්තිය ගැන පමණක් කථා කිරීමටය. එහෙත් බොහෝ අවස්ථාවලදී අපට නොපෙනුනත් විශාල ලෙස නාස්තිය ඇති කරන ව්‍යාපෘති සහ ආයතන නොදැනුවත්ම පාහේ දිගින් දිගටම ක්‍රියාත්මක වෙමින් පවතී. අද අප මෙවැනි එක් ක්ෂෙත්‍රයක් ගැන විග්‍රහයක් කරමු.

අප සියලු දෙනාම දන්නා පරිදි මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදලට සෑම සේව්‍යයෙකුම සිය සේවකයන්ගේ වැටුප් වලින් 8% ක් ද, සේව්‍යයාගේ කොටස වන 12% ක් ද වන ලෙස මුලු වැටුප් ප්‍රමාණයෙන් 20% කොටසක් ගෙවති. මේ සඳහා සෑම සේවකයෙකු වෙනුවෙන්ම විශේෂ ලේඛණ පවත්වාගෙන යන අතර මාසිකව, අර්ධ වාර්ෂිකව සහ වාර්ෂිකව ලියකියවිලි ඉදිරිපත් කිරීමට ද සේව්‍යයා බැඳී සිටිති. මෙම කාර්යය සඳහා ලිපි කරුවන් යොදවන්නටත්, එම ගණන් සහ ගෙවීම් ගණනය කිරීමටත් සේව්‍යයා බැඳී සිටී. ඒ අතරම, සේවක අර්ථ සාධක අරමුදල පාලනය කරන සහ ක්‍රියාත්මක කරන මහ බැංකුවේ කෝණයෙන් විග්‍රහ කරන විට අපට පෙනෙන්නේ, සේව්‍යයන්ගෙන් එකතු විය යුතු මුදල් එකතු කර ගැනීමටද, සෑම සේවකයෙකු වෙනුවෙන් ගිණුමක් පවත්වාගෙන යාම සඳහාද, හරියාකාරව සහ නිසි වේලාවට එම අරමුදලට මුදල් නොගෙවන අය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටද, සේවකයා විශ්‍රාම යනවිට ඔහුගේ/ඇයගේ අරමුදල් ශේෂය නැවත ලබාදීමටද, සේවකයෙක් එක් සේවා ස්ථානයකින් තවත් සේවා ස්ථානයකට පිවිසෙන විට එම පුද්ගලයාට අදාල ගිණුම නිවැරදිව පවත්වා ගැනීමටද, වාර්ෂිකව සේවකයන්ට

---

**2003.12.07 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

තම ගිණුම් ලබා දීමටද, ඊට අමතරව දහසක් රාජකාරීද, ඉතා විශාල වියදමක් දරමින් එම ආයතනය කරගෙන යන බවය.

ඒ අතරම, ඉහත කී කාර්යයන්ට බොහෝ සේ සමාන ක්‍රියා මාලාවක් තවත් රජයේ ආයතනයකින් ද ඒ ආකාරයටම වාගේ කෙරීගෙන යන බවත් අපට දක්නට ලැබේ. එම ආයතනය වනුයේ සේවක භාරකාර අරමුදල් ආයතනයයි. සේවක භාරකාර අරමුදලෙන් කෙරෙන සේවය සහ කාර්යයන් ගැන සලකා බලන විට, අපට පෙනෙන්නේ සේවක අර්ථ සාධක අරමුදල හරහා සිදුවන සෑම කාර්යයක්ම පාහේ සේවක භාරකාර අරමුදල ද කරන බවය. වෙනසකට පෙනෙන්නේ සේවක අර්ථ සාධක අරමුදලට මසකට මුලු වැටුප් අගයෙන් 20% ක් බැර වෙන අතර, සේවක භාරකාර අරමුදලට බැරවෙන මුදල එකී මුලු අගයෙන් 3% ක් වීමය. එසේ නම්, අපට පැහැදිලි වන්නේ එකවරම සේවක පඩි නඩි වලට අනුපාතිකව 23% ක මුදලක් එක් ආයතනයකට ගෙවනවා වෙනුවට, අද සිදුවන්නේ අතිවිශාල මුදලක් වැය කරමින් ද ඒ තුලින් අනවශ්‍ය නාස්තියක් ඇති කරවමින් ද, 20% ක සහ 3% ක කොටස් දෙකක් වෙන් වෙන් වශයෙන් අද සේව්‍යයන්ට රජයේ ආයතන දෙකකට ගෙවීමට සිදු වීමය. ඒ හේතුව නිසා සෑම සේවකයෙකු වෙනුවෙන්ම ලියකිවිලි සහිත ගිණුම් දෙකක් පැවැත්වීමටද, වාර්තා දෙකක් යැවීමටද, සේව්‍යයාට සිදු වේ. ඒ අතරම, නිලධාරීහු සිය ගණනක් සේවයේ යොදවා ගනිමින් ඉහළ පෙලේ කාර්යාල පවත්වා ගනිමින් මෙම අරමුදල් දෙකම එක සමාන ප්‍රයත්න වල යෙදී සිටිති. මෙලෙස අධ්‍යක්ෂ මණ්ඩලයක් සහ නිලධාරීන් රැසක් පත්කර ගනිමින්, විශාල මුදලක් ඒ අයගේ නඩත්තුව සඳහා වැය කරමින්, සේවක භාරකාර අරමුදල 3% ක මුදල එකතු කරමින් එය ආයෝජනය කිරීමට වෙහෙස ගනියි. ඇත්ත වශයෙන්ම මට මෙම දැවැන්ත අනුකරණය (duplication) පෙනෙන්නේ විශාල අපරාධයක් ලෙසය. එකවරම එක් ක්‍රියාවලියක් හරහා සේව්‍යයන්ට තම සේවක වැටුප් අගයෙන් 23% ක මුදලක් එක් ආයතනයකට පමණක් ගෙවන අන්දමට කටයුතු කිරීමට හැකි වුයේ නම්, මෙලෙස අනුකාරකව අනවශ්‍ය ලෙස මෙම මුදල් එකතු කිරීම සඳහා වැයවන දැවැන්ත මුදල, සේවක භාරකාර අරමුදල හරහා වැය නොවන්නේය.

එවිට ඔවුන්ට එම අරමුදලෙන් වැඩි ප්‍රතිශතයක් ඉතිරි කරගැනීමට හැකි වන්නේය. එසේ කෙරුණේ නම්, සෑම මසකදීම එම මාසය සඳහා සේවක භාරකාර අරමුදලට ලැබෙන මුලු ගෙවීම් වලින් සේවක අර්ථ සාධක අරමුදලට ලැබිය යුතු කොටස එක් චෙක් පතකින් යොමු කළ හැකිය. එවිට, සේවක භාරකාර අරමුදල නිසියාකාරව සහ වෘතිකව ආයෝජනය කිරීමට පමණක් දක්ෂ සහ උගත් නිලධාරීන් කිහිපදෙනෙකුට අවශ්‍ය ආර්ථිකමය තීරණ ගනිමින් අරමුදල වර්ධනය කර ගැනීමට ඉඩ කඩ සැළසෙන්නේය. තවද, සේවාදායකයන්ගෙන් මුදල් එකතු කිරීමේ ප්‍රයත්නයේ දැන් නියැලී සිටින සේවක භාරකාර අරමුදලේ සිය ගණන් නිලධාරීන් සහ සේවකයන් රැසක් අවශ්‍ය නොවීම හේතුකොටගෙන එහි කාර්ය මණ්ඩලය ඉතා අඩු මට්ටමකට ගෙන ඒමටද හැකි වන්නේය.

අවාසනාවකට මෙන් අද පවතින ක්‍රමය අනුව, අනවශ්‍ය ලෙස එකම කාර්යය මෙහි පෙන්වා දී ඇති පරිදි දෙවරක් බැගින් කෙරෙන නිසා, මෙම නාස්තිය දිගින් දිගටම පවතී. මෙම නාස්තිය අපට සෘජුවම නොපෙනුනත් එය අති විශාල එකක් වන්නේය. අවසානයේදී එහි ප්‍රතිඵලය වන්නේ අරමුදල ආයෝජනය කරණ ලැබෙන ලාභ සහ පොළී සේවකයන්ට බැර වීමෙන් ඔවුන්ට ලැබෙන්නට තිබූ වාර්ෂික පොළී අනුපාතය හෝ ලාභාංශය නිලධාරීන්ට සහ සේවකයින්ට වැටුප් වශයෙන් සහ එම කාර්යාල නඩත්තු කිරීම් වශයෙන් වැය වන නිසා සැළකිය යුතු මට්ටමකට අඩු වීමය. එසේ නම්, මා සිතන ආකාරයට ඉතා ඉක්මණින් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල යන අරමුදල් දෙකෙහි, අඩුතරමින් මුදල් එකතු කිරීමේ කාර්යයන්වත් සම්බන්ධ කිරීමක් සිදු විය යුතුය.

එලෙස කෙරුණ හොත් නවීන ක්‍රම තුළින් සේවකයන්ට නව තවත් පහසුකම් සහ අලුත් වාසි ලබා දෙන අතරම සෑම සේවකයෙකුටම තම ගිණුම අඩංගු ඉලෙක්ට්‍රොනික් කාඩ් පතක් ලබා දෙන ලෙසද එම කටයුත්ත සකස් කළ හැකිය. දුරකථන ඇමතුම් කාඩ්පත්, ලෙඩෙකුගේ සෞඛ්‍ය තත්ත්වය අඩංගු කාඩ්පත්, හැඳින්වීමේ කාඩ්පත්, සියලුම ගෙවීම් සඳහා ක්‍රෙඩිට් කාඩ්පත්

යනාදී ඉලෙක්ට්‍රොනික කාඩ්පත් භාවිත වන මෙම යුගයේ සේවකයන්ගේ තොරතුරු අඩංගු කාඩ්පත් පාවිච්චි කොට අන්තර් ජාලය හරහා තමාටම තම ශේෂය සහ අනිකුත් තොරතුරු පරීක්ෂා කර ගැනීමට හැකිවන ක්‍රමයක්ද, මේ අරමුදල් දෙක සම්බන්ධ කිරීමෙන් ඇතිවන මුදල් ඉතිරි කිරීමෙන් බොහෝවිට කළ හැකි වන්නේය. එවිට යම් සේවකයෙක් හෝ සේවක පිරිසක් වෙනුවෙන් සේවායෙක්, අරමුදලට මුදල් නොයවන්නේ නම්, ඒ පිළිබඳව වැඩි කලක් යන්නට මත්තෙන් බලපෑම් කිරීමට සහ පැමිණිලි කිරීමට සේවකයාට අවශ්‍ය දත්ත අන්තර් ජාලය හරහාම ලබා ගැනීමට හැකි වන්නේය. මෙවැනි ක්‍රියාවන් හරහා අප රටේ ඵලදායිතාවය සහ වගවීම දිනෙන් දිනම වර්ධනය කර ගැනීමට අපට හැකි වන්නේය. එසේ කිරීමෙන් අපගේ ආර්ථිකයටද විශේෂ ශක්තියක් වැඩි කලක් යෑමට මත්තෙන් ලැබෙනු ඇත.

# 9

නවවන කොටස

# දුම්රිය, මහාමාර්ග, සංචාරක හා ඉදිකිරීම් ක්ෂේත්‍රය

# 9.1

## ශ්‍රී ලංකා දුම්රිය සේවය යළි පණ ගන්වන්නට නම්.....

පසුගිය වර්ෂ කිහිපය මුලුල්ලේ සිට ම අපගේ දුම්රිය මාර්ග පද්ධතිය, භාණ්ඩාගාරයෙන් විශාල වශයෙන් සැපයෙන සහනාධාර මත යැපෙමින් පවතින එකක් බවට පත්වී ඇති බව අපි කවුරුත් දන්නෙමු. අනෙකුත් තරඟකාරී ප්‍රවාහන සේවාවලින් අය කරනු ලබන ගාස්තු වලට වඩා ප්‍රවාහන ගාස්තු සැලකිය යුතු තරම් අඩු වුවද, දුම්රිය මාර්ග කිලෝමීටර 1,500ක්ද, දුම්රිය පාලම් 1,000කට වැඩි සංඛ්‍යාවකද, සංකීර්ණ මාර්ග සංඥා පද්ධතියක්ද, අති වටිනා ඉඩම්ද, සතුව තිබෙන මෙම දුම්රිය සේවා සම්පතින් රටටත්, රජයටත්, පොදු මහජනතාවටත් ලැබෙන ප්‍රතිලාභ ඉතා කණගාටුදායක තත්ත්වයක පවතියි.

එම පසුබිම තුළ මේ අගනා ජාතික වස්තුවෙන් යම් ප්‍රයෝජනවත් කාර්ය භාරයක් ඉටුකරවා ගැනීමට සහ ජාතික ආර්ථිකයට ඉන් ක්‍රියාශීලී දායකත්වයක් ලබා ගැනීමට නම්, යම් ආකාරයක නිර්භය, අලුත් සහ නවෝත්පාදක චින්තනයකට එළඹීමට දැන් කාලය පැමිණ ඇතැයි මම විශ්වාස කරමි.

කලින් සිටි අපගේ යටත් විජිතවාදී පාලකයින්ට පින් සිදු වන්නට දකුණු ආසියාවේ, භූමියට සාපේක්ෂව ඉහළම දුම්රිය මාර්ග කිලෝ මීටර් අනුපාතයක් ඇති රට ලෙස ශ්‍රී ලංකාව අපට හැඳින්වීමට පුලුවන.

එහෙත්, ශ්‍රී ලංකා දුම්රිය සේවය අද ඉමහත් පාඩු පිට ධාවනය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් නව දුම්රිය එන්ජින් සහ මැදිරි සඳහා ආයෝජනය කිරීමට රජයට කිසිඳු හැකියාවක් නොමැත.

---

2003.08.17 දින ලංකාදීප පුවත්පතෙහි 'දූවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

දුම්රිය මාර්ග පද්ධතිය අලුත් වැඩියා කිරීමටද රජය මුදල් නැතැයි පවසයි.

එහෙත් තත්ත්වය මෙසේ තිබියදී බලපත්‍ර ගාස්තුවක් හෝ මාර්ග ගාස්තුවක් ගෙවා, තමන්ට අයිති දුම්රිය මාර්ග වල වෙනත් තෝරා ගනු ලැබූ ප්‍රවාහකයින්ගේ දුම්රිය යන්ත්‍ර, බඩු දුම්රිය සහ දුම්රිය මැදිරි ධාවනය කටයුතු කිරීමට අවසර දීමේ ක්‍රමයක් මෙම දුම්රිය සේවයට හඳුන්වා දිය හැක. ඒ තුළින් තම ආදායම බෙහෙවින් වැඩි කර ගත හැක. මෙසේ අලුතින් එක්වන දුම්රිය එන්ජින් සහ මැදිරි පවතින දුම්රිය මාර්ග පද්ධතිය හරහා ධාවනය වීමේදී, එයින් බිහිවෙන තරගකාරීත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ අංශවල සේවාද වැඩි දියුණු වීමක් ඇති වනු ඇත. මෙසේ කරද්දී, සමහරවිට එම නව ධාවකයින්ට 'සංචාරක' දුම්රිය මැදිරි, 'කන්ටේනර්' දුම්රිය මැදිරි, 'නිදන මැදිරි', 'භෝජන සහ අවන්හල්' මැදිරි 'ශීතකරණ' මැදිරි, 'සුඛෝපභෝගී' මැදිරි, ආදී විවිධාකාර පහසුකම් වලින් යුත් දුම්රිය සේවයක් ලබා දීමටද හැකි වනු ඇත. මේ 'නව' මාදිලියේ ප්‍රවාහනයට වැඩි පිළිගැනීමක් ලැබෙනවාත් සමගම ඒ ඒ ක්ෂේත්‍රවල ව්‍යාපාර කටයුතු දියුණු වීමෙන් දුම්රිය මාර්ග පාවිච්චි කිරීමට ඇතිවන ඉල්ලුම වර්ධනය වෙනු නොඅනුමානය. එවිට මහා මාර්ග ප්‍රවාහනයට ඇති ඉල්ලුම ද ක්‍රමයෙන් අඩු වනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහා මාර්ගවල තදබදය අඩු වීමක් ද ඇතිවනු ඇත.

ඉහත සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා සිය මූලික ප්‍රධාන කර්තව්‍යයන් දෙක අතර පැහැදිලි වෙනසක් ඇති කිරීමට ශ්‍රී ලංකා දුම්රිය සේවයට අවශ්‍යයෙන්ම සිදුවනු ඇත. එයින් පළමුව, දුම්රිය මාර්ග ඉදිකිරීමේ සහ නඩත්තු කිරීම සහ දුම්රිය මාර්ගවල දුම්රිය ගමනාගමනය විධිමත් අන්දමින් පාලන කිරීමේ කාර්යයයි. ඉන් අදහස් වන්නේ පිළිගත හැකි ඉහළ මට්ටමකින් දුම්රිය මාර්ග පවත්වාගෙන යාමේ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා දුම්රිය සේවය සතු ව තිබීමය. ආරක්ෂාකාරී ලෙස, පෙර නියම කරන ලද වේගවලට යටත්ව දුම්රිය ධාවනය කළ හැකි වන පරිදි, දුම්රිය මාර්ග සහ ඒ අවට පරිසරය නිතිපතා නඩත්තු කිරීම එම කාර්යයේ විශේෂ අංගයකි. පෞද්ගලික ධාවකයින්ගේ

අදහස් විමසා මෙහෙයුම් උපලේඛන සහ කාලසටහන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ එකඟත්වයකට එළඹීම ද, මෙහි දී අවශ්‍ය වනු ඇත. දෙවනුව, තම ආයතනයේම දුම්රිය සේවා මෙහෙය වීමේ කාර්යයයි. ඒ තුළින්, දැන් සිදුවන පරිදිම ශ්‍රී ලංකා දුම්රිය සේවය මේ දෙවන කාර්යය ඉටු කරන අතර, එම සේවය සමග තරගකාරීව ඉහත සඳහන් කළ අනිකුත් ධාවකයින්ද එම මාර්ගවලම දුම්රිය සේවා මෙහෙය වීමක් සිදුවනු ඇත. සමස්ත ප්‍රවාහන වෙළඳ පොළෙන් දුම්රිය අංශය සතු වර්තමාන වෙළඳ කොටස වන 7% ක පමණ අඩු මට්ටමක සිට 20% ක තරම් ඉහළ මට්ටමක් කරා එම කොටස ඉහළ නංවා ගැනීමට මෙම ක්‍රමය තුළින් දුම්රිය සේවයට බෙහෙවින් උපකාරී වෙතැයි මම අදහස් කරමි.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ පාලනය යටතේ පවතින ඉතා අල්ප ලෙස පාවිච්චි වන තවත් වටිනා සම්පතක් නම් එම සේවය සතුව ඇති ඉඩම්ය. 'දුම්රිය ස්ථාන' ලෙස හඳුන්වන පරණ ගරා වැටුණු ගොඩනැගිලි පිහිටා ඇති අක්කර ගණන් වලින් සමන්විත වන මෙම විශාල බිම් කොටස් වලින් කිසිදු සැලකිය යුතු ප්‍රයෝජනයක් දුම්රිය සේවය තවමත් ලබා නොමැත. අනෙකුත් රටවල 'දුම්රිය ස්ථාන' පරිශ්‍රයන් කොතරම් ඵලදායි ලෙස උපයෝගී කරගනු ලැබේ ද යන්න පිළිබඳව ලෝකයේ කාර්ය බහුල නගරවල සංචාරය කර ඇති ඕනෑම පුද්ගලයකු සාක්ෂි දරනු ඇත. මගින් දුම්රියට නැගීම හා බැසීම මෙන්ම බඩු බෑම හා පැටවීම සඳහා වූ කාර්යයන් වෙනුවෙන්, ගොඩනැගිලි භාවිතා වීමට අමතරව, මණ්ඩලීය බඩු ගබඩා, පාරිභෝගික සේවා මූලස්ථාන, ක්ෂණික ආහාර අලෙවිහල්, ක්‍රීඩාගාර, සමාජ ශාලා, විවේක මධ්‍යස්ථාන, සංගීත මධ්‍යස්ථාන, විනෝදාගාර ආදී නොයෙකුත් පහසුකම් වලින් සමන්විත 'වාණිජ කේන්ද්‍රස්ථාන' වශයෙන් ද ඒ ගොඩනැගිලි සමගාමීව යොදා ගැනෙන අයුරු ඒ රටවල දැකිය හැකිය. සමහර අවස්ථාවලදී හෝටල් කාර්යාල සංකීර්ණ ආදිය පවාද දුම්රිය ස්ථාන පරිශ්‍රයන්හි කොටසක් වී තිබේ. එසේ නම්, ශ්‍රී ලංකාවේද මේ වත්කම ඵලදායි ලෙස යොදා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය සේවය අදහස් කරන්නේ

නම් බහු කාර්ය ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩසටහන් වහාම ආරම්භ කළ යුතුය.

ඉහත සඳහන් ක්‍රියාමාර්ග වලින් සැළකිය යුතු අයුරින් මුදල් ගලා ඒම් ද නව දිරිගැන්වීමක් ද සිදු වනු ඇති අතර, මගින්ටද මහඟු ප්‍රතිලාභ සැලසෙනු ඇත. එසේ ලැබෙන නව ආදායම්වලින් වඩා හොඳ වැටුප් ගෙවා හොඳම ඉංජිනේරුවන් සහ කාර්ය මණ්ඩලයක් නඩත්තු කිරිමට ශ්‍රී ලංකා දුම්රිය සේවයට හැකි වනු ඇත. දුම්රිය මාර්ග කලට වෙලාවට නිසි පරිදි නඩත්තු කොට ආරක්ෂිත හා මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාමටද ඉන් ඉඩ සැලසෙනු ඇත.

# 9.2

# කටුනායක - කොළඹ අධිවේගී මාර්ගය වෙනුවෙන් විකල්ප සලකා බලමු

මෑත කාලයකදී සිට අප රටේ ආර්ථිකය ගැන විශ්ලේෂණය කරන සෑම අවස්ථාවකදීම පාහේ සාකච්ඡාවට භාජනය වූ කරුණු දෙකක් ඇත. එයින් එකක් නම් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ පාඩු අවම කරගන්නේ කෙසේද යන්නයි. අනෙක නම් කොළඹ-කටුනායක අධිවේගි මාර්ගය ඉදිකර ගත යුත්තේ කෙසේද යන්නයි. මෙම ද්විත්ව අභියෝගයන් දෙස මතුපිටින් බලන විට ඒවා අතර සම්බන්ධයක් නැතැයි සිතිය හැකි වුවද, ඒවා ගැඹුරු ආකාරයකින් විග්‍රහ කළහොත්, ඒවා යම් මට්ටමකට වක්‍රාකාරව කිට්ටුවෙන්ම සම්බන්ධ බව අපට පෙනී යනු ඇත.

කොළඹ සිට කටුනායකට අධිවේගි මාර්ගයක් ඉදිකිරීමේ මූලික අරමුණු ලෙස විශේෂඥයින් පෙන්වා දෙන්නේ කටුනායක ගුවන් තොටුපළින් විදේශ ගතවන සහ ගොඩ බසින මගීන්ට කොළඹ නගරයේ සිට කටුනායකට ගමන් කිරීමට ඇති පහසුකම සහ ගුවනින් ආනයනය සහ අපනයනය කරන භාණ්ඩ කොළඹ සහ කටුනායක අතර පහසුවෙන් පරිහරණය කර ගැනීමය. කොළඹ සහ කටුනායක අතර පහසුවෙන් ගමන් කළ හැකි සහ භාණ්ඩ පරිහරණය කළ හැකි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ප්‍රවාහන සේවයක් තිබීම, රටේ ආර්ථික සංවර්ධන සැලැස්මේ අත්‍යවශ්‍ය සාධකයකි. එසේ වුවද, කොළඹ සහ කටුනායක අතර ඇති දුර ප්‍රමාණය වන කිලෝමීටර 25 සම්බන්ධ කරන අධි වේගි මාර්ගයක් රුපියල් බිලියන 11 ක වියදමකින් ඉදිකිරීමේ ව්‍යාපෘතියක්, අද ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අවශ්‍යතාවයන්ගේ ප්‍රමුඛත්වයන් (Economic priorities) අනුව, අප මේ අවස්ථාවේදී ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතියක්ද යන්න සැක සහිත කරුණකි. එසේ නම්,

---

2004.07.04 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.

මෙම දැවෙන ආර්ථික ප්‍රශ්නය ඉස්මතු කරන පරස්පර විරෝධී සාධක සලකා බලමින්, රටට වාසිදායක වෙනත් විකල්පයක් තිබේද යන්න ගැනද සළකා බැලීම නුවණට හුරුය.

කොටුව දුම්රිය පොළ සහ කටුනායක අතර දැනටමත් පාවිච්චි වන දුම්රිය මාර්ගයක් ඇත. එම මාර්ගය ද්විත්ව පිලි පද්ධතියක් ලෙස ජාත්‍යන්තර මට්ටමකට ප්‍රතිසංස්කරණය කිරීම තුළින් අධි වේගී මාර්ගයකින් ලබා ගත හැකි වාසි සියල්ලක්ම පාහේ දිනා ගත හැක. එම 'දුම්රිය මාර්ග' විකල්පය සාර්ථකව දියත් කිරීමට නම්, කොටුව දුම්රිය ස්ථානය සඳහා, වෙන් වී ඇති විශාල භූමි ප්‍රදේශයෙන් කොටසක, ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් ඇතුලත් ටර්මිනල් ගොඩනැගිල්ලක්ද ඉදිකර ගත යුතු වන්නේය. එවිට ගුවන් මගියෙකුට තම විදේශීය ගමනට පිවිසීම සඳහා ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම, මලු භාරදීම, වැනි කාර්යයන් කොටුවේ පිහිටි ගුවන් තොටුපොළට සම්බන්ධ ටර්මිනල් ගොඩනැගිල්ලේදීම සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැළසෙනු ඇත. එමගින් ගුවන් මගියාට, තම විදේශ සංචාරය කටුනායකින් නොව කොළඹ කොටුවේ ටර්මිනල් ගොඩනැගිල්ලෙන්ම ආරම්භ කරමින් තම විදේශ සංචාරයට අදාල කටුයතු නිමකරගෙන සුඛෝපභෝගී දුම්රියකින් ඉතා කෙටි කාලයකදී කටුනායකට පිවිසිය හැකිය. මෙවැනි ක්‍රම, දියුණු රටවල් කිහිපයකම අද ක්‍රියාත්මක වනු ඇත. ශ්‍රී ලංකාවේද, කොළඹ කොටුව සහ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ අතර නියමිත කාලසටහනකට අනුව ධාවනය වන විශේෂ සුඛෝපභෝගී දුම්රිය සේවාවක්, ඒ ආකාරයකට සංවිධානය කළ හැක. මේ සඳහා මගින් මෙහෙයවීමේ සේවා සහ ප්‍රවාහනය පිළිබඳව මනා පළපුරුදු ඇති, විශේෂඥ ආයතනයන් හවුල් කරගනිමින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙන්ම මේ සේවාව ඉෂ්ටකරගත හැකි නම්, එවැනි ක්‍රියාවලියක් රටට අතිශයෙන් ඵලදායි වනු ඇත. එබඳු දුම්රිය/ගුවන් තොටුපළ හවුලකින් මගින්ට ප්‍රතිලාභ සැලසෙනු පමණක් නොව, ගුවනින් ප්‍රවේශ කරන ආනයන සහ අපනයන භාණ්ඩ සම්බන්ධිත සේවාවන්ද, එම පද්ධතිය ඔස්සේ ම ඉක්මණින් සහ පහසුවෙන් ලබාදීමට හැකි වනු ඇත.

කාලයක් ඇවෑමෙන්, මෙවැනි ක්‍රියාවලියක් දියත් කිරීමෙන් ලබා ගන්නා අත්දැකීම් පදනම් කරගනිමින්, එම සංකල්පය වර්ධනය කරගැනීමට අප සමත් වනු ඇත. එසේ වුවහොත්, ගුවන්/දුම්රිය හවුල් හරහා ප්‍රවාහන සේවාවන් රටේ ප්‍රධාන නගරයන්, කටුනායක ගුවන් තොටුපොළ සහ කොළඹ වරාය කේන්ද්‍ර කරගෙන පිහිටුවීමටද අපට හැකි වනු ඇත. ඒ තුලින් අපනයන නිපැයුම්, මහා මාර්ග ඔස්සේ අකාර්යක්ෂම ලෙසින් ප්‍රවාහනය වීම සැලකිය යුතු ආකාරයකින් අඩු කර ගත හැකි වනු ඇත.

ඉහත දැක්වූ අන්දමට කොළඹ/කටුනායක අධිවේගී මාර්ගය සඳහා රජය වැය කිරීමට අපේක්ෂිත මුදල රුපියල් බිලියන 11 ක් පමණ වන අතර එම ව්‍යාපෘතිය සඳහා අවුරුදු 3 ක කාලයක් ගතවීමට නියමිතය. ඒ හරහා සිදුවන පරිසර දූෂණයද, ජනතාවට විඳින්නට සිදුවන අපහසුතාවන්ද ඉමහත් වනු ඇත. එහෙත්, මෙහි විස්තර කොට ඇති ටර්මිනල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන්ද, කොළඹ/කටුනායක දුම්රිය මාර්ග පද්ධතිය අලුත් වැඩියා කිරීම සඳහාද නව දුම්රිය එන්ජින් සහ මැදිරි වෙනුවෙන්ද ආයෝජනය කිරීමට අවශ්‍ය මුලු මුදල රුපියල් බිලියන 5 කින් පමණ පිරිමහ ගත හැකි වනු ඇතැයි, මාගේ මතයයි. එසේ නම්, එවැනි විකල්ප යෝජනාවක් ක්‍රියාත්මක කළහොත් දැනට රජය වැය කිරීමට අදහස් කරන මුලු මුදලින් රුපියල් බිලියන 6 ක් වැනි විශාල මුදලක් ඉතිරි කරගෙන, වෙනත් අත්‍යවශ්‍ය ව්‍යාපෘතියකට එම මුදල යෙදවිය හැක.

අප සියලු දෙනාම දන්නා පරිදිද, මා අවුරුදු ගණනාවක් තිස්සේම පුන පුනා කියා ඇති පරිදිද, අප රටේ ඇති වැව් ප්‍රතිසංස්කරණ කිරීම, යුගයේ දැඩි අවශ්‍යතාවයකි. එසේ නම්, අධිවේගී මාර්ගයක් වෙනුවට, 'දුම්රිය' විකල්පය තෝරා ගනිමින්, ඉතිරි කරගන්නා එම රුපියල් බිලියන 6 ක පමණ මුදල යොදවා රටේ සෑම පළාතකම වැව් 270 බැගින් ප්‍රතිසංස්කරණය කර ගැනීමට අපට සම්පත් උපුටා ගත හැකි වන්නේය. එමගින්, එක් වැවක ප්‍රතිසංස්කරණය වෙනුවෙන් රුපියල් ලක්ෂ 25 ක් පමණ වෙන් කිරීමට හැකිවන නිසා, ශ්‍රී ලංකාවේ පලාත් 9 යේ සෑම පළාතකම වඩාත්ම ප්‍රයොජනවත් වැව් 270 ක් තෝරාගෙන වසරකට එක්

පළාතකින් වැව් 90 බැගින් වත් ප්‍රතිසංස්කරණය කර ගැනිමට මූලයමය ශක්තියක් ලැබෙන්නේය. ඒ තුළින්, අප රටේ ආර්ථිකයටද, බහුතර ජනතාවටද දැනෙන, හැගෙන ප්‍රතිඵල අත් වන්නේය. අප රටේ ජනතාවගෙන් අඩකටත් වඩා වැඩි සංඛ්‍යාවක් නිරත වී සිටින්නේ කෘෂි කර්මාන්තයේය. පහසු ගමනාගමනයට තුඩු දෙන මාර්ග පද්ධති සහ ඒ තුළින් ඇතිවන ආර්ථික ප්‍රතිඵල වැදගත් බව මා අවිවාදයෙන් පිළිගනිමි. ඒ අතරම, කෘෂිකර්මය නංවාලිමෙන් සහ වර්ධනය කිරිමෙන් අප ආර්ථිකයේ සමස්ථ පැවැත්මට ලැබෙන දායකත්වය ඊටත් වඩා කිප ගුණයකින්ම අධික වන බවද මා තරයේම ඉදිරිපත් කරන තර්කයකි. අප රජය, මෙම විකල්ප බුද්ධිමත්ව සැලකිල්ලට යොමු කරමින්, රටේ ආර්ථික ක්‍රියාවලියන් කාර්යක්‍ෂමව සහ ප්‍රායෝගිකව ඉදිරියට ගෙන ගියහොත් රට තුළ සැබෑ සහ සමතුලිත පිබිදිමක් ඇති වනු නියතය.

# 9.3

# සංචාරක ව්‍යාපාරයෙන් ආර්ථිකයට විශේෂ අත්වැලක්

1965 සිට ශ්‍රී ලංකාව සංචාරක ව්‍යාපාරයට ක්‍රියාශීලිව යොමු වෙමින් පැවතුණි. පසුගිය දශක 4 කට ආසන්න කාලය තිස්සේ එම ව්‍යාපාරය කෙරෙහි යොමුවූ දැවැන්ත ආයෝජන හේතුකොට ගෙන, අද වන විට, එය සැළකිය යුතු මට්ටමකට පත්වී තිබේ. ඒ හරහා වසර 2000 දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව දළ වශයෙන් 400,000 ක් වූ අතර සංචාරකයකුගේ දිනක සාමාන්‍ය වියදම ඇමෙරිකානු ඩොලර් 62 ක් පමණ බවට පත්වී තිබිණි. තවද, මෙම කර්මාන්තය නිසා පුද්ගලයින් 38,000 කට සෘජු රැකියා අවස්ථා ද 53,000 කට පමණ වක්‍ර රැකියා අවස්ථා ද ලැබී ඇති බවද වාර්තා වුණි. ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයෝ, දළ වශයෙන් රට තුළ තිබෙන හෝටල් කාමර 13,300 තුළ දින 10.1 ක පමණ සාමාන්‍ය කාල සීමාවක් ලැගුම් ගෙන ඇති අතර ජාතික වශයෙන් ලැගුම් ගැනීමේ (occupancy) ප්‍රතිශතය 52.3% ක් විය.

ඉහත කී දත්ත වලින් පෙනෙන එක් වැදගත් කරුණක් නම්, අප රටේ පවතින ඒක පුද්ගල සංචාරක දෛනික වියදම වන ඇමෙරිකානු ඩොලර් 62 ක ලෝකයේම ඉතා අඩු එකක් බවය. සමහරවිට, ඊට හේතුව පසුගිය දශක 2 තුළ රටේ පැවතුනු ත්‍රස්තවාදී යුද්ධය නිසා, ඉහළ පෙල් වඩාත් ආර්ථිකව ශක්තිමත් සංචාරකයින් ආකර්ශණය කර ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් වීම විය හැක. යුධ පරිසරය නිමා වූ පමණින්ම, 2002 වසරේදී සංචාරක ව්‍යාපාරය 28% කින් පමණ වර්ධනය වූ බවට සාක්ෂ්‍ය යුද්ධය මූලික හේතුවක් වූ බව සනාථ කරයි. එහෙත්, එය එසේ වුවද, අපගේ සංචාරක ක්ෂේත්‍රයේ ඉපැයුම් තව දුරටත් ඵලදායීව

---

**2003.07.20 දින ලංකාදීප පුවත්පතෙහි 'දවෙත ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

වැඩි කර ගැනීමට නම්, මෙම ක්ෂේත්‍රය තුළ පවතින අනෙකුත් අඩුපාඩු ද අවම කර යුතු බව අප අමතක නොකළ යුතුය. මේවා මොනවාදැයි අපි දැන් සලකා බලමු.

මේ දක්වා ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් වැඩි සංඛ්‍යාවක් පැමිණියේ යුරෝපයෙන්ය. එහෙත් ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම අනුව අපේ අසල්වැසි දැවැන්තයා ඉන්දියාවය. ඉන්දියාව සතු මධ්‍යම පාන්තික ජනගහනය කෝටි 20 කටත් වැඩිය. එම කරුණු සළකන විට අපට පැහැදිලි වන්නේ අපේ සංචාරක කටයුතු උත්පාදන ප්‍රභවය වශයෙන් අප ඉහළින්ම සැළකිය යුතුව ඇත්තේ ඉන්දියාව බවය. ඒ නිසා, ඉන්දියානු සංචාරකයින් මෙරටට පැමිණීම දිරිගැන්වීමට හැම උත්සාහයක්ම ගත යුතු අතර ඉන්දියානු සමාගම් වල සම්මන්ත්‍රණ අප රටේ පැවැත්වීම සඳහා අවශ්‍ය ප්‍රචාරාත්මක කටයුතු කිරීම ද වැදගත්වේ. එසේ කිරීම සඳහා, ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර ඉන්දියානු ජාතිකයන්ට වීසා ලබා ගැනීමේ අවශ්‍යතාව අහෝසි කළ යුතුයයි දැනට වසර දෙකකට පමණ පෙර 'ස්කල්' යන ප්‍රධාන පෙළේ සංචාරක සංවිධානයේ සැසිවාරයක මා කළ යෝජනාවක් රජය මේ වන විට ක්‍රියාවේ යෙදවීම සතුටට කරුණකි. ඒ අවස්ථාවේදී මා යෝජනා කළ අනෙකුත් යෝජනා නම් සංචාරක ව්‍යාපෘතියට සම්බන්ධ සියලු සේවාවල දී ඉන්දියානු මුදල් භාවිතය අප රට පිළිගත යුතු බවත් ඉන්දියාවේ ප්‍රාදේශිය ගුවන් තොටුපළවලින් පවා සංචාරකයින්ට ශ්‍රී ලංකාවට පැමිණීමට හැකි වන පරිදි, කොළඹ දක්වා ගුවන් ගමන් සේවා පැවැත්වීමට ඉන්දියාවේ ප්‍රාදේශිය ගුවන් සේවා වලට ශ්‍රී ලංකාව අවසර දිය යුතු බවත්ය. ඉන්දියානු ජාතිකයින්ට කලින් වීසා නිකුත් කිරීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකා රජය විසින් අහෝසි කරනු ලැබීමෙන් පසු ඉන්දියාන් ජාතිකයන් ශ්‍රී ලංකාවට පැමිණීම බොහෝ සේ පහසු වී අද ඒ සංඛ්‍යා ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. මෙම ප්‍රවණතාවයට තව දුරටත් අප දායක වීමෙන් සාර්ථක ප්‍රතිඵල නෙලා ගත හැකි බව නිසැකය. ඒ සමගම, ඉන්දියාන් චිත්‍රපට හා රූපවාහිනී කර්මාන්තය (Film and television industry) සහ බොහෝ සෙයින් දියුණු ඉන්දියානු විලාසිතා කර්මාන්තය (Fashion industry) වැනි කටයුතු වලටද සම්බන්ධ ආයතන සමග උපාය මාර්ගික

සන්ධානවලට (strategic allianes) එළඹෙන ලෙස අපේ සමාගම් අංශය දිරිගැන්වීමත් සහ පෙළඹවීමක් ද කළ යුතුය. ඉන්දියාවේ මෙම කර්මාන්ත අතිවිශාල ප්‍රගතියක් ලබා ඇති අතර සහයෝගිත්ව ප්‍රයත්නයක් තුළින් ශ්‍රී ලංකාවටද සැලකිය යුතු ප්‍රතිලාභ ලබාගත හැකිය. ඒ නිසා ඒ සඳහා ක්‍රියාශීලිව උත්සාහ ගැනිම ඉතා වැදගත්ය.

අප වහාම අවධානය යොමු කළ යුතු තවත් අංශයක් නම් ජාත්‍යන්තර තත්ත්වයන්ට අප රටේ ආකර්ෂණීය ස්ථාන (Tourist Attraction) සංවර්ධනය කිරීමය. පින්නවල අලි අනාථාගාරය, දෙහිවල සත්වෝද්‍යානය හා ඓතිහාසික සිගිරි බලකොටුව සංචාරකයින්ට බෙහෙවින් ආකර්ශණීය ස්ථාන වුවද, ඒ ඒ ස්ථාන වලදී සිය මුදල් 'වැය කිරීමට' සංචාරකයින්ට ප්‍රමාණවත් අවස්ථාවන් සැලසී නැත. අනෙක් අතට, බොහෝ රටවල් ඊට වඩා අඩු ආකර්ශණයක් ඇති දේ ආකර්ශනීය ඉදිරිපත් කිරීම් නිසා විශාල ආදායම් ලබා ගැනීමට සමත් වී තිබේ. ඒ රටවල් ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම, ක්‍රියාකාරකම් වල විවිධත්වය සහ වැඩසටහන් ආදිය හොඳින් පාවිච්චිකොට ඇත. සංචාරකයන්ගේ විනෝදය සඳහා ප්‍රමාණවත් අවස්ථාවන් සැපයේ නම්, ඒවා වෙනුවෙන් වැඩියෙන් විදේශ විනිමය වියදම් කිරීමට ඔවුන් අනිවාර්යයෙන්ම පෙළඹෙන අතර, එය ඒක පුද්ගල සංචාරක වියදම් කිරීම ඉහළ නැංවීමට හේතු වනු ඇත. මේ සම්බන්ධයෙන් විශේෂිත උපාය මාර්ගයක් වශයෙන් ඉදිරි වර්ෂ කිහිපය තුළදී තේමා උද්‍යාන (Theme Parks), මුහුදු විනෝද චාරිකා, (ocean cruises) සහ විවේක මධ්‍යස්ථාන (leisure centers) වැඩි දියුණු කිරීමට අප කටයුතු කළ යුතුය. ඒ සමගම, ශ්‍රී දළදා මාලිගය, ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය සහ අනෙකුත් විශිෂ්ට බෞද්ධ සිද්ධස්ථාන කේන්ද්‍ර කොට ගෙන 'බෞද්ධ' වන්දනා ගමන් ප්‍රවර්ධනය කිරීමට ද අප තානායම් කාර්යාල, විදේශ වෙළඳ මධ්‍යස්ථාන සහ පෞද්ගලික අංශය කටයුතු කළ යුතුය. එමගින් විශේෂයෙන්ම ජපානය සහ තායිලන්තය යන රටවල් ඇතුලු ලෝකයේ අනෙක් ප්‍රදේශ වලින් බෞද්ධයන් ශ්‍රී ලංකාවට ආකර්ශණය කර ගැනීමට ද අපට හැකි වනු ඇත.

# 9.4

## සංචාරක ව්‍යාපාරය යනු හෝටල් සහ බස් රථ පමණක් නොවේ

මාස විස්සකට වැඩි කාලයක් නොබිඳී ඉදිරියට ආ රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර අත්සන් තැබුණු 'අවබෝධතා ගිවිසුම' කරණ කොට අද වන විට මෙරට සමාජ, ආර්ථික දේහයන්ගේ විශාල පිබිදීමක් සිදු වී තිබේ. ඒ අතුරින් සංචාරක ව්‍යාපාරය, කර්මාන්ත අංශය සහ එතෙර මෙතෙර වෙළඳාම වැනි අංශ කැපී පෙනෙන වර්ධන හිමිකරගෙන ඇත යන්න ප්‍රසිද්ධ රහසකි. මේ වසර නිමා වන විට සංචාරකයින් ලක්ෂ පහකට අධික පිරිසක් මෙරටට කැඳවාගෙන රුපියල් කෝටි තුන්දහස් පන්සියකට ආසන්න විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීම සංචාරක ව්‍යාපාර අංශ ප්‍රධානින්ගේ බලාපොරොත්තුව වී තිබේ. මෙම බලාපොරොත්තුව සඵල කර ගැනීමට රජය, පෞද්ගලික අංශ සහ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ සියලු අංශ වෙනදාටත් වඩා සුහදශීලී ලෙස එකට අත්වැල් බැඳ දිගුකාලීන සැළසුමකට අනුව ක්‍රියාකළ යුතුමය.

ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමුවන වරට පසුගිය වසරේදී (2003) ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත සංචාරකයින්ගේ සංඛ්‍යාව ලක්ෂ පහක් ඉක්මවන බවට දැනට ඇස්තමේන්තු කොට ඇත. මේ සංඛ්‍යාව හරහා මෙරටට ලැබීමට නියමිත වන විදේශ විනිමය අමෙරිකානු ඩොලර් මිලියන 315 ක් පමණ වන බවද ඇස්තමේන්තු කොට තිබේ.

මෙම සංඛ්‍යාලේඛන 2001 සංඛ්‍යාලේඛන සමග සංසන්දනය කරන විට අපට පෙනෙන්නේ එය, ඉතා දැවැන්ත වර්ධනයක් බවය. මෙපමණ කෙටි කාලයක් තුළදී එවන් විශාල සංඛ්‍යාත්මක සහ

---

**ජයසිරි මුණසිංහ මහතා සමග පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරින් 2003.09.18 දින දිනමිණ පුවත් පතෙහි පළවූ ලිපියක් ආශ්‍රයෙන්**

ගුණාත්මක වර්ධනයක් සංචාරක ව්‍යපාරය තුළ ඇතිවීමට හේතුන් ගණනාවක් බලපා ඇත. ඒ අතුරින් අප සියලු දෙනාම දන්නා, සංචාරක ව්‍යපාරය වැනි ව්‍යපාරයක පදනම වනුයේ, යම් රටක ඇති සුන්දරත්වයත්, එම රටෙහි ඇති එම ව්‍යාපාරයට ඔබින යටිතල පහසුකම් සහ ඊට අමතරව ඉතා වැදගත් ලෙස සැලකෙන රටේ පවතින වාතාවරණයත්ය. මෙම කෝණයෙන් සලකන විට අපට පැහැදිලි වන්නේ වසර 20 ක පමණ කාලයක් තුලදී දිගින් දිගටම පැවතුණු 'බෙදුම්වාදී යුද්ධය' අප රටේ සංචාරක ව්‍යාපාරයට ඉතා තදබල පහරක් එල්ල කළ බවය. යුද්ධය නිසා සංචාරක ව්‍යාපාරය වසර 20 ක් තුලදී දිගින් දිගටම පිරිහුණද, යුද්ධය නැවැත්වුණු විටම නැවත පිබිදීමක් ඇති කරගෙන ඇති බවට අපට පැහැදිලි වේ.

යුද්ධය නතර වූ විගසින් සංචාරකයින් වැඩි වශයෙන් රටට පැමිණීමේ ස්වභාවයක් අද අපට දක්නට ලැබුණද එයින් නිසි ප්‍රයෝජන අප නොගන්නේ නම්, අප රටේ පාලකයින්ට එම තත්ත්වය ගැන වගකිම දරන්නට සිදුවනු ඇත. එසේ නම්, අද යුගයේ අවශ්‍යතාවය වනුයේ, මෙම මහගු අවස්ථාව හරියාකාරව ප්‍රයෝජනයට ගෙන සාම ප්‍රයත්නයේ ප්‍රතිලාභ සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ අතිමහත් සංඛ්‍යාවට දැනෙන ලෙස දියත් කිරීමය. එසේ කිරීමට තුඩුදෙන අදහස් කිපයක් අපි සාකච්ජා කරමු.

සංචාරක ක්ෂේත්‍රය ගැන සලකන විට අප සියලු දෙනාම තරයේ ම පිළිගත යුතු මූලික කරුණ නම්, කිසියම් කෙනකු තවත් රටකට තම මුදල් වැය කරගෙන යන්නේ හෝටලයකට ගොස් නිදා ගැනිමට හෝ බස් රථයකින් එක් තැනක සිට තව තැනකට යෑමට නොවන බවය. ඕනෑම කෙනෙකු අරමුණු කිහිපයක් හරහා විදෙස් සංචාර සිදු කිරීමට පුලුවන. සංචාරයේ යෙදෙමින් රටේ සුන්දරත්වය බැලීමට හෝ, ඒ රටේ පවතින යම් දර්ශනීය ස්ථානයන් නිරීක්ෂණය කිරීමට හෝ, ඒ රටේ වෙරළේ හෝ වෙනත් ස්ථානයක හෝ විනෝද වීමට හෝ, ඒ රටේ වසන සත්ත්වයන් හෝ රුක්ෂයන් බැලීමට හෝ, ඒ රටේ ව්‍යාපාරයක් කිරීමට හෝ ඒ රටේ පූජනීය ස්ථානයක් වැඳපුදා ගැනිමට හෝ ඒ රටේ පැවතෙන ක්‍රීඩාවකට සහභාගී වීමට හෝ නිරීක්ෂණය

කිරීමට හෝ යනාදී හේතූන් රාශියක් හරහා ඔවුන් ගමන් කිරීමට පෙළඹෙනු ඇත. එසේ නම්, මෙම තත්ත්වය උපයෝගී කොට ගෙන සංචාරකයන්ට අප රටට පිවිසීමට හේතූන් ජාත්‍යන්තරව පෙන්වා දෙන අතරම, ඔවුන් මෙරටට පැමිණෙන විට අප රටේ මෙවැනි ඉහත කී ක්‍රියාවලිවල යෙදෙන විට, මුදල් වියදම් කිරීමට අවස්ථාද, අප ඇති කළ යුතුය.

අමෙරිකාව සංචාරය කරන්නෙක් බොහෝ අවස්ථාවලදී යම් ආකර්ශනීය ස්ථානයකට යන විට එම ස්ථානයේදී මුදල් වියදම් කිරීම සඳහා කෑම බීම අලෙවි කරන ස්ථානද, ඉඳුම් හිටුම් ස්ථානද, සාප්පු ද විනෝද වීමේ ස්ථානද ඉතා අලංකාර ලෙස ඉදිරිපත් කොට ඇත. උපදෙස් දෙන පුද්ගලයින් හොඳින් පුහුණුව ලබා ඇති අය වන අතර, සෑම අවස්ථාවකදීම සංචාරකයින්ට නොදැනුවත්වම වාගේ මුදල් වියදම් කිරීමට එම ව්‍යාපාරය සකස් කොට ඇත. එහෙත් අපගේ ඉතා අලංකාර හා දැකුම්කළු ස්ථානවල සත්ත්ව උද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, සීගිරිය වැනි ස්ථානවල සංචාරකයින්ට තම මුදල් වියදම් කිරීමට අවශ්‍ය වන පසුබිමක් අපි තවමත් සංවිධානාත්මකව සකස් කොට නොමැත.

එවැනි තත්ත්වයක් පැවතීම දුරුකොට යම් තේමාවක් හරහා මෙම දැකුම්කළු ස්ථාන වලට පිබිදීමක් ඇතිකරවීම, එම ස්ථාන භාරව සිටින අයගේ සහ රජයේ විශේෂ වගකීමකි. අප සෑම විටම වෑයම් කළ යුත්තේ සංචාරකයින්ට විනෝද වීමට හෝ අප රටේ නිපැදවෙන භාණ්ඩ හා සේවා ලබාගැනීමට අවකාශය ඇති කිරීමටය.

සංචාරකයින්ට මෙරටට පැමිණ ඉඳුම් හිටුම් සහ යාන වාහනවලට පමණක් තම මුදල් වැය කරන්නේ නම් එයින් අප ව්‍යාපාරය පුලුල් නොවන්නේය. මෙම තත්ත්වය අප හොඳින් වටහා ගත යුතුය.

අපි අවධානය යොමු කළ යුතු ඊළඟ කාරණය නම්, අපගේ සංචාරක ව්‍යාපාරය ඉන්දියාවේ සංචාරක ව්‍යාපාරයට සහ ඉන්දියානු ජාතිකයන්ට මෙරටට පැමිණීමට තුඩුදෙන මාර්ගයක් ලෙස වැඩිදියුණු කිරීමටය. ඉන්දියාවේ ඉතා විශාල මධ්‍යම සහ

ඉහළ පංතියක් අද පවතී. ඔවුන් සියලු දෙනාටම වැඩි කරදරයකින් තොරව විදේශයන් වෙත යැමේ ශක්තියක් අද ඇත. එවැනි පිරිස් අපේ රටට කැඳවා ගැනීමට හැකි විශේෂ වැඩපිළිවෙලක් අප නොපමාව සකස් කළ යුතුය.

පෙර නිකුත් කරනු ලැබූ වීසා නොමැතිව මෙරටට දැන් පැමිණීමට ඉඩ ලබාදීම ඉතා වටිනා ක්‍රියාකාරකමකි. ඒ සමගම ඉන්දියාවේ ක්‍රියාත්මක වී ඇති දේශීය ගුවන් සමාගම් වලට මෙරටට ගොඩබැසීමේ අයිතියද, ඉන්දියාවේ සමහර කලාපීය ගුවන් තොටුපලවලින් මෙරටට ගුවන් යානා යොමු කරවීමට ඇති අයිතියද, සංචාරක කටයුතුවලට පැමිණෙන ඉන්දීය ජාතිකයන්ට මෙරටදී ලබාගන්නා භාණ්ඩ හා සේවාවලට ඉන්දියානු මුදලින්ම මුදල් ගෙවීමට ඉඩකඩද ලබාදිය යුතුයි යන්න අපගේ අදහසයි. එවිට ඕනෑම ඉන්දීය ජාතිකයෙකුට ඉතා පහසුවෙන් ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩකඩ ලැබෙනු ඇත. ඒ හරහා ඉන්දියානුවන් වැඩි පිරිසක් ඉදිරියේදී මෙරටට පැමිණෙනු නොඅනුමානය.

එයට අමතරව ඉන්දීය ව්‍යාපාරිකයින් බොහෝවිට තම ව්‍යාපාරික කටයුතු සමුලු හා උත්සව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට පියවර ගනු ඇත. ඉන්දියාවේ අතිශයින් දියුණු වී ඇති සිනමා සහ චිත්‍රපට කර්මාන්ත අංශය යම් යම් වැඩකොටස් වලට මෙරට යොදා ගැනීමට ඔවුන් පියවර ගනු ඇත. ඉන්දියාවේ ලාභදායි ව්‍යාපාරයක් වන විලාසිතා සහ මෝස්තර කර්මාන්තය මේ රටේ තවමත් ප්‍රමාණවත් අයුරින් ආරම්භ කොට නැතැයි යන්න අපගේ අදහසයි. එම අඩුවද සංචාරක ව්‍යාපාර අංශයේ වර්ධනයට යොදා ගත හැකි ඉඩක් නිර්මාණය කොට දී ඇත.

එපමණක් ද නොව බොහෝ ඉන්දීය ව්‍යාපාරිකයින් තම ව්‍යාපාර මෙරටේ පටන් ගැනීමෙන් අප රටේ රැකී රක්ෂා ප්‍රශ්නයට ද යම් විසඳුමක් ලැබෙනු ඇත.

අද ලෝකයේ මුලු සංචාරක ව්‍යාපාරයෙන් 10% ක් පමණ රඳා පවතිනුයේ ක්‍රීඩාව හරහාය. බොහෝවිට ක්‍රීඩා ලෝලීන් රටින් රටට පිවිසීමට මූලික හේතුව වන්නේ, එම රටවල ක්‍රීඩකයින් තවත් රටක තරගයකට සහභාගී වනු දැක බලා ගැනීමටය.

ඔලිම්පික් උළෙල, ජාත්‍යන්තර මලල ක්‍රීඩා සහ ලෝක කුසලාන තරඟ පැවැත්වෙන විට එම තරඟ වලට එක්වන ක්‍රීඩා ලෝලීන් ගණන අති මහත්ය. ඔවුහු බෙහෝවිට සාමාන්‍ය සංචාරකයින්ට වඩා අධික ලෙස මුදල් වියදම් කරති. ඉන් නොනැවති ඔවුහු උළෙල පවතින නගරයේ අනෙකුත් සංචාරක අවස්ථාවලට උනන්දුවකින් එකතු වනු ඇත.

මේවා සියල්ල තුළින් සංචාරක ව්‍යාපාරයට ගලා එන සමස්ත මුදල සැලකිය යුතු අන්දමකින් ඉහළ නගිනු ඇත. මෙම පාඩම අපි පළමු කොටම එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම දැනට අවුරුදු දෙකකට ඉහත මෙරට සංචාරය කළ අවස්ථාවේ අත් වින්දෙමු. ඒද, එංගලන්ත කණ්ඩායම මෙරටට පැමිණියායින් පසු ක්‍රීඩා ලෝලීහු අටදහසක් ශ්‍රී ලංකාවට පැමිණියහ. ඔවුහු අප රටේ සංචාරක ව්‍යාපාරයට විශේෂ පිබිදීමක් ඇති කළහ. තව මාස කිපයකින් නැවත වරක් එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇත.

එවිට ඔවුන් සමග පෙරදා මෙන් ම ඊටත් වඩා විශාල පිබිදීමක් අප රටේ සංචාරක ව්‍යාපාරයට ලැබෙනු ඇත. මෙම තත්ත්වය ගැන හොඳ අවබෝධයකින් ක්‍රීඩාවට සම්බන්ධ පාලක මණ්ඩලයද, ක්‍රීඩා අමාත්‍යාංශයද, සංචාරක මණ්ඩලයද, සංචාරක අමාත්‍යාංශය ද එකමුතු වී විශේෂ වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වෙයි. එසේ කිරීමෙන් ක්‍රීඩාව නංවනවාත් සමගම රටට අවශ්‍ය විදේශ විනිමය ලබා ගැනීමේ මහගු අවස්ථාවක් අපට සාර්ථකව ලගා කර ගැනීමට හැකි වනු ඇත. සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ තවත් විශේෂාංගයක් නම්, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සම්මේලන හැකි තරම් මෙරටේ පැවැත් වීමට අවශ්‍ය කටයුතු වර්ධනය කිරීමට පියවර ගැනීම බව අපගේ කල්පනාවයි. අද ලෝකයේ සම්මන්ත්‍රණ, සමුළු හා වැඩමුලු හරහා රටින් රටට පිවිසෙන විදේශිකයින් සංඛ්‍යාව අතිමහත්ය. බෝහෝවිට මෙවැනි සම්මේලන වලට සහභාගි වන පුද්ගලයන්ගේ ආදායම් තත්ත්වය ඉහළ එකක් වන බැවින්, ඔවුන් විශාල මුදල් ප්‍රමාණයක් රටකට යන විට වියදම් කිරීමට රැගෙන යනු ඇත. ඇතැම් විට ඔවුන් ගමන් කරනුයේ තනිවම නොව, තවත් පුද්ගලයෙකු හෝ පිරිසක් හෝ

සමගය. මේ හේතුව නිසා සමුලුව පවතින රටට විදේශ විනිමය සැලකිය යුතු අන්දමින් ගලා එනු ඇත. එසේ නම් මෙම අංශය ගැනද, රජයේ විශේෂ අවධානය යොමු විය යුතුය.

මේ සියලු දේ ගැන ම අප සකලා බලද්දී අප තේරුම් ගත යුතු තවත් එක් කරුණක් තිබේ. එනම් අප රට මෙන්ම අනිකුත් ආසියාතික රටවල්ද, එම රටවල්වලට වැඩි වශයෙන් සංචාරකයින් ගෙන්වා ගැනිමට දැවැන්ත උත්සහයක් දරණ බවය. අද තායිලන්තයට වසරකට සංචාරකයින් එක්කෝටි දස ලක්ෂයක් පිවිසෙන තත්ත්වයක් නිර්මාණය වී හමාරය. සිංගප්පූරුවට සංචාරකයින් දසලක්ෂ ගණනක් පැමිණෙනු දැකිය හැකිය. එවැනි තත්ත්වයක් ශ්‍රී ලංකාවටත් හිමිකර ගැනිමට අපට හැකි බව අපගේ විශ්වාසයයි. එහෙත් එසේ කිරිමට නම් අප රටේ ගුවන්තොටුපල දැනට තිබෙන තත්ත්වයට වඩා තුන් හතර ගුණයකින් කාර්යක්ෂම කළ යුතුය. එයටත් අමතරව සංචාරක ව්‍යාපාරයේ දැවැන්ත ආයෝජනයක් ඇති කිරිමට පුද්ගලික අංශය දිරිමත් කළ යුතුය.

සංචාරක ව්‍යාපාරය යනු හෝටල් හා බස්රථ පමණක් නොව, සැම අංශයකම පවතින විවිධ ආකර්ශණීය හා වැඩි දියුණු වූ යටිතල පහසුකම් මත පදනම් වු නිදහස් බව සපිරි එකක්ය. එය මතකයේ තබාගෙන අපි සංචාරක ව්‍යාපාරයේ දියුණුවට තවත් නව ගුවන්තොටුපලක් නිර්මාණය කළ යුතුය. මේවා සියල්ල මධ්‍යම රජයෙන් පමණක් කළ හැකි ක්‍රියාකාරකම් ම නොවේ.

අද අප රටේ 13 වන ආණ්ඩුක්‍රම සංශෝධනය හරහා සංචාරක ව්‍යාපාරය වුව ද වැඩි දියුණු කිරිමට පළාත් සභාවලට සහ පළාත් පාලන ආයතනවලට සිදුකිරිමට ඉඩකඩ ලබා දී තිබේ. එනමුත්, එම ආයතනවලින් ඒ පිළිබඳ අවධානය යොමු කොට තිබෙනුයේ ඉතා අල්ප වශයෙනි. පළාත් සභාවල පාලකයින් හා නිලධාරින් මෙම ව්‍යාපාරයේ ඇති වටිනාකම සහ මුදල් උපයා ගැනිමට ඇති අවස්ථා ගැන කිසිඳු අවබෝධයකින් කටයුතු කරන බවක් නොපෙනේ. පළමු කොටම තම පළාත්වල පවතින සංචාරක ආකර්ෂණීය ස්ථාන හොඳින් හඳුනාගෙන ඒවා දියුණු කර ගැනිමට

පුද්ගලික අංශයද සහභාගි කරගැනිමට පළාත් සභා කටයුතු කළ යුතුය.

සංචාරක ක්ෂේත්‍රයේ යෙදෙන සියලු පුද්ගලයින් හරියාකාරව පුහුණු කිරිමටද මෙම නිලධාරින් විසින් වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. එම වැඩ පිළිවෙළවල් සියල්ල ඒකාබද්ධ දිගුකාලින සැලැස්මක් අනුව මධ්‍යම රජයේ සහායද ලබාගෙන ආණ්ඩුව ක්‍රියාත්මක විය යුතු බව නම් කිවයුතුමය.

ඒ අතරම පළාත් පාලන ආයතනවල සේවයේ යෙදෙන සියලුම දෙනාද, සියලු ආයතනද සංචාරක ව්‍යාපාරයේ ඇති ශක්තින් සහ අවස්ථා පිළිබඳ හොඳ අවබෝධයක් ඇති කරගත යුතුය. එවැනි අවබෝධයක් ලබාදිම සංචාරක මණ්ඩලයේ වගකිම ලෙස අපි දකිමු.

සංචාරක අමාත්‍යාංශය සහ එම මණ්ඩලය තම වගකිම හරියාකාරව ඉෂ්ඨ කළහොත් පමණක් අප රටේ විශාලතම විදේශ විනිමය උපයන ව්‍යාපාරය බවට සංචාරක ව්‍යාපාරය පත්වනු නොඅනුමානය.

# 9.5

## සංචාරක ව්‍යාපාරයට ක්‍රීඩාව සම්බන්ධ කරමු

ටෙස්ට් සහ එක්දින තරග මාලාවක් සඳහා එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම 2001 දී ශ්‍රී ලංකාවට පැමිණි කාලය අප ඉතිහාසයේ ඉතාම දරුණු කාල පරිච්ඡේදයක් ලෙස අපට හැඳින්විය හැක. රට, එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග යුද්ධයකට පැටලී සිටි අතර, රටේ බොහෝ ප්‍රදේශවල නිතිපතා ම වාගේ ගැටුම් පැවතුණි. ඒ කාලයේදී රටේ ආර්ථිකය පරිහානිය කරා යමින් තිබුණි. රට පුරාම අවිනිශ්චිත, අඳුරු පරිසරයක් තිබුණි. මෙම තත්ත්වය සංචාරක ව්‍යාපාරයට දරුණු ලෙස බලපෑමක් සිදු කළ අතර, රට තුළට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු වී තිබුණි. යුධ තත්ත්වය නිසා සංචාරකයින් ශ්‍රී ලංකාවට පැමිණීමට තමන්ගේ සැලසුම් අවලංගු කිරීම නිරතුරුවම සිදුවිය.

එහෙත් එංගලන්ත ක්‍රිකට් ක්‍රීඩකයන් අප රටට පැමිණෙනවාත් සමග එංගලන්ත ක්‍රිකට් ලෝලීහු දස දහස් පමණ ඔවුන් සමග පැමිණියහ. ශ්‍රී ලංකාවට මෙසේ පැමිණි සංචාරකයෝ විවිධ පළාත්වල පාලුවට පත්ව තිබුණු හෝටල්වල ලැගුම් ගත්හ. ඒ හරහා, එම හෝටල් වලින් යැපෙන දහස් ගණන් පුද්ගලයින්ගේ ආදායම් ඉහළ නැගුණි. සැලකිය යුතු සංචාරකයන් සංඛ්‍යාවක් රටට ගොඩ බැසීම නිසා දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව පිළිබඳ පැතිර තිබූ අයහපත් ප්‍රචාරයන් යම් තරමින්වත් අඩු වුණි. සංචාරකයන්ගෙන් දහස් ගණනින් සැලකිය යුතු ප්‍රතිශතයක් නැවත ලංකාවට පැමිණීමේ ඉඩ කඩ ඇති නිසා එය හොඳ අනාගත පෙර නිමිත්තක් විය. එමෙන්ම සංචාරකයින්ගේ මෙසේ පැමිණීම දිවයිනේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය

---

**2003.08.03 දිත ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

කිරීමට නිසැකවම හේතු වුණි. එමගින් වාසි ගණනාවක්ම අප රටට අත්වුණි.

ඇත්ත වශයෙන්ම, එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම වන එංගලන්ත කණ්ඩායම අප රටට නොඑන්නට, එම ක්‍රීඩා ලෝලී සංචාරකයින් ලංකාවට පැමිණීමට හේතුවක් නොතිබිණි. ඔවුන් අප රටට ආකර්ශණය කර ගත්තේ ක්‍රීඩාවය. එහෙත් ඔවුන්, ක්‍රීඩාව හරහා මේ රටට පැමිණියද, ඔවුන් කළේ ක්‍රිකට් තරග නැරඹීම පමණක් නොවේ. ඔවුන්, ශ්‍රී ලංකාවේ සුන්දර වෙරළවල විවේක සුවයෙන් කල් ගත කළහ. තරු පහේ හෝටලවල පැවැත්වෙන රාත්‍රී සමාජ ශාලා වල පවතින ඩිස්කෝ නැටුම් වලට උද්යෝගයෙන් සහභාගී වුහ. පෞරාණික නගරවල නටඹුන් නරඹා වින්දනයක් ලැබුහ. කඳුකරයේ සරුසාර තේ වතු වල අසිරිය විඳ ගත්හ. අගනා ශ්‍රී ලාංකික මැණික් සහ ස්වර්ණාභරණ ආදිය මිල දී ගෙන පැළඳ ගත්හ. සිගිරිය බිතු සිතුවම් හා අනෙකුත් ඓතිහාසික ස්ථාන නැරඹුහ. මෘදු ලෙස ගලා යන ගංගාවල, අලි ඇතුන් නාන විලාසය බලා තෘප්තියට පත්වුහ. පූජනීය ස්ථානවල දී භක්තිමත්ව වැඳපුදා ගත්හ. රටේ විසිරී ඇති කැලෑවල දුර්ලභ පක්ෂීන් හා වන සිවුන් නරඹා විශ්මයට පත්වුහ. මෙවැනි නොයෙකුත් කාර්යයන්හි ඔවුහු සන්තෝෂයෙන් නිරත වුහ. එවන් දේ භුක්ති විඳින අතර තුර දී ඔවුහු රටේ සංචාරක ඉපැයුම් ඉහළ යන පරිදි බ්‍රිතාන්‍ය පවුම් දහස් ගණනින් වියදම් කළහ. එහෙත් මූලික සිද්ධාන්තය නම් ඔවුන්ගේ පැමිණීම සිදු වුයේ ශ්‍රී ලංකාව සහ එංගලන්ත පිල් දෙක අතර ක්‍රිකට් තරග නිසාය යන්නය. බොහෝ රටවල් දැන් මේ මූලික සත්‍යය හොඳින් තේරුම්ගෙන තිබේ.

සාජා රාජධානිය, ක්‍රිකට් ක්‍රීඩා කරන රටක් නොවුනත්, එරට වසරකට දෙවරක්ම ජාත්‍යන්තර ක්‍රිකට් තරග පවත්වයි. ගොල්ෆ් තරග පිටි නඩත්තු කිරීම ඉතා දුෂ්කර කාර්යයක් වුවත් ඩුබායි රට ප්‍රධාන පෙළේ ගොල්ෆ් තරග පවත්වයි. මැලේසියාවේ ක්වාලා ලම්පුරය 'ෆෝමියුලා වන්' (Formula One) නැමැති අධිවේගී රථ වාහන ධාවන තරග පැවැත්විය හැකි වන පරිදි පළමු පෙළේ ධාවන පථ ඉදිකර ඇත. එබඳු රටවල් ඒ උපාය මාර්ගවලින්

සහ ක්‍රියාමාර්ගවලින් පෙන්වන්නේ රට තුළට සංචාරකයින් ඇද ගැනීම සඳහා ද, රට ගැන ජාත්‍යන්තරව දැනුවත් කිරීමක් ඇතිකිරීම සඳහා ද, ක්‍රීඩා අංශ සාර්ථකව පාවිච්චි කරන බවය.

අද අප රටේ සංචාරක ක්ෂේත්‍රයේ පවතින විශේෂ දුර්වලතාවයක් නම් සංචාරක ක්ෂේත්‍රය සහ ක්‍රීඩා ක්ෂේත්‍රය අතර සැළකිය යුතු සබඳකමක් නොතිබීමයි. මුලු ලෝකයේම සංචාරකයින්ගෙන් 10% සිට 20% අතර සංඛ්‍යාවක් සංචාරය කරන්නේ ක්‍රීඩාවට සම්බන්ධ වීමෙනි. එවැනි සංචාරකයින් සාමාන්‍ය සංචාරකයින්ට වඩා වැඩි මුදලක් වියදම් කිරීමට ඉදිරිපත් වන අතර සාමාන්‍යයෙන් රටක රැඳෙන කාලයට වඩා වැඩිපුර කාලයක් රැඳීමට පෙළඹෙති. මෙම අංශයන් දෙකම සංචාරක ව්‍යාපාරයට ඉතාමත් හිතකරය. අද ශ්‍රී ලංකාවේ ඇති සංචාරක ක්ෂේත්‍රයේ මුලු ධාරිතාවය දැනට රටට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් පහසුවෙන්ම නඩත්තු කිරීමට හැකිවන එකකි. එම වාසියෙන් අප හැකි පමණ ප්‍රයෝජන ගත යුතුය. ක්‍රීඩාව හරහා, ක්‍රීඩා කණ්ඩායම් සහ ක්‍රීඩා ලෝලීහු මේ රටට ආකර්ශණය කර ගැනීමට අප සමත් වුවහොත් රටේ සංචාරක පද්ධතියට විශේෂ පිබිදීමක් ලබා දෙමින් විදේශ විනිමය රටට වර්ධනය කර ගැනීමට අපට හැකි වනු ඇත. ඒ හරහා අප රට ගැන ජාත්‍යන්තරව ඇති මතය වඩවඩාත් වර්ධනය කර ගැනීමට අපට හැකි වන්නේය. මෙය ශ්‍රී ලංකාවේ සංචාරක මණ්ඩලය සහ ක්‍රීඩා සමාජ එකතු වෙමින් ඉෂ්ට කල යුතු විශේෂ කාර්ය භාරයක් ලෙස මම දකිමි. ඒ සඳහා මේ දෙපාර්ශවය ඉතා සමීප අදහස් හුවමාරුවක් ඇති කර ගනිමින් මෙම වගකීම සපුරාලීමට දැන් සිටම කටයුතු කළ යුතුය.

ඒ ඒ රටවලට තමා ගොස් ඇතැයි කීම පමණක් පුද්ගලයින් රටවල සංචාරය කළ කාලය දැන් අවසන් වී තිබේ. එංගලන්ත ක්‍රිකට් සංචාරයෙන් මෙම අගනා පාඩම අපට පැහැදිලිව ඉගෙන ගත හැකි අතර, මේ පාඩම උපයෝගී කර ගෙන ඉදිරි වසරවලදී සංචාරක ව්‍යාපාරය මගින් ලැබෙන ආදායම් වර්ධනය කර ගැනීමට අප ඉතා ඉක්මණින් කටයුතු කරන්නේ නම් අප සියලු දෙනාටම එය අගනා වාසියක් වනු ඇත.

# 9.6

## අමතක නොකළ යුතු ඉදිකිරීම් ක්ෂේත්‍රය

1977 දී සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් 3.8% පමණ වූ ඉදිකිරීම් අංශය වසර 2000 වන විට 7% තෙක් වර්ධනය වීම, සාපේක්ෂ වශයෙන් සළකන විට, පිළිගත හැකි මට්ටමකට වර්ධනය වී ඇතැයි අපට කිව හැක. අඩුතරමින් මතුපිටින් වත් මෙම වර්ධන සංඛ්‍යාවලින් අපට පැවසෙනුයේ, පසුගිය වසර 25 තුළ මෙම අංශයේ දායකත්වය දෙගුණයක් තරම් වර්ධනය වී ඇති බවය. සැබැවින්ම එය එසේ වී තිබේ. එහෙත්, හේතු කිහිපයක් නිසාම සැබෑ ප්‍රායෝගික තත්ත්වය නම්, එනම් විශිෂ්ට යයි කීම අපහසුය. ලෝකය පුරාම, කඩිනම් සංවර්ධනයක් ලබා ඇති රටවල් ඉදිකිරීම් කර්මාන්තයේ ක්‍රමවත් සහ ඉක්මන් වර්ධනයක් ලබා තිබේ. ඒ අනුව බලන විට නම් විශේෂයෙන්ම පාරවල්ල මහාමාර්ග, ගොඩනැගිලි පාලම්, ජලමාර්ගල වරායවල්, ගුවන් තොටුපළවල්, සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ආදී යටිතල ව්‍යුහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සැසඳීමේදී, අප රටේ තවමත් ඉතාම ප්‍රාථමික මට්ටමක මේවා පැවතීම හරහා අපට නිගමනය කළ හැක්කේ මේ අංශයේ වර්ධනය අසතුටුදායක බවයි. එබැවින්, ඉදිකිරීම් අංශයේ ආංශික දායකත්වයේ වර්ධනයක් වශයෙන් ඉදිකිරීම් ක්‍රියාකාරිත්වය නගා සිටුවීමට අපේ සැලසුම්කරුවන් හදිසි ප්‍රයත්න දැරිය යුතුව ඇත.

ඉදිකිරීම් කටයුතු උනන්දුවෙන් කිරීමෙන් අංශයේ සංයුතිය ඉදිරි පස් වසර තුළවත් සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් 10%ක් හෝ 12% දක්වා හෝ ක්‍රමවත්ව ඉහළ නැංවීමට කටයුතු සකස් කළ යුතුය. මේ අංශය තුළ එවැනි කඩිනම් වර්ධනයක් වේ නම් ඉන් අනාවරණය වන්නේ රටේ යටිතල ව්‍යුහය සීඝ්‍රයෙන් සංවර්ධනය වන බවය. එය නව ආයෝජන රට තුළට ගලා ඒම

---

**2004.07.06 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

දිරි ගන්වනු ඇති අතර ආර්ථිකයේ වැඩි දියුණුවට ද ඉවහල් වනු ඇත. එසේ සිදුවීමට නම් ඉදිකිරීම් කර්මාන්තයට ද කළ හැකි දේ බොහෝය. එයින් එකක් නම් කර්මාන්තයේ නායකයින් ලෝකයේ ඉහළ තත්ත්වයන්ට සමාන වන පරිදි සිය ඉදිකිරීම් හා සැලසුම් ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමය. අපේ ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවන්, ප්‍රමාණ සමීක්ෂකයින්, මිනින්දෝරුවන් සහ අනෙකුත් ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තිකයින් බෙහෙවින් දක්ෂ අය බවට සැකයක් නැත. එහෙත් මේ අංශයේ පවතින ජාත්‍යන්තර වෙළඳ පොළ තුළ තරග කිරීමට නම්, ඵලදායකත්වය වැඩි දියුණුව ඉලක්ක සපුරා ගැනීම සහ ව්‍යපෘති නියමිත කාලයට අවසන් කිරීම වැනි මූලික අංශ කෙරෙහි ඔවුන් වඩාත් අවධානය යොමු කළ යුතුය.

පෙරසවි ගොඩනැගිල්ල කර්මාන්ත ශාලාවේ ඉදි කළ අංශ, වැඩපොළවල බලශක්ති, මෙවලම් භාවිතය, ඉහළ ප්‍රමිතියේ නූතන ද්‍රව්‍ය භාවිතය ආදී නව සහ ජනප්‍රිය ඉදිකිරීම් ශිල්ප ක්‍රම ශ්‍රී ලංකාවේ ප්‍රමාණවත් පරිදි උපයෝගී කරගෙන නැත. මෙම ක්ෂේත්‍රය සීඝ්‍රව ඉදිරියට ගෙන යාමට නම්, මේ ශිල්ප ක්‍රම සහ නවෝත්පාදනයන් භාවිත කිරීමට කර්මාන්තය ඉදිරිපත් විය යුතුය. ඒ අතරම, ඉදිකිරීම් කර්මාන්තයේ නඩු කීමේ පිරිවැයද ඉතා ඉහළ මට්ටමක පවතී. ඊට හේතුව ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත් වලින් ඉතා වැඩි කොටසක් සම්බන්ධයෙන් අතුරු තහනම්, උසාවි කටයුතු සහ බේරුම් කිරීම වැනි ආකාරයේ නඩු කටයුතු වලට යෙදෙන්නට සිදුවී තිබීමය. ඉදිකිරීම් කටයුතු වල නියැලි අයගේ මුදල්, කාලය හා ශ්‍රමය මේ ඵලදායී නොවන කටයුතු වලට විශාල වශයෙන් වැය වේ. සමහර අවස්ථාවලදී සංවර්ධකයින් සහ කොන්ත්‍රාත්කරුවන් මූල්‍ය වශයෙන් විනාශ වීමට පවා ඒවා තුඩු දෙන බැවින්, විකල්ප ආරවුල් විසඳීමේ (lternlate dispute resolution) ක්‍රමයක්, එනම් ඉදිකිරීම් අංශයේ ආරවුල් විසඳීමේ මූලික ක්‍රමෝපාය වශයෙන් බේරුම් කිරීමේ ක්‍රමයක්, යොදාගැනීම ගැන සොයා බැලීමට සමස්ත කර්මාන්තයම දැඩි සේ අවධානය යොමු කළ යුතුය. බේරුම් කිරීම හෝ සමතයකට පත් කිරීම (Mediation) වඩා වේගවත් සහ ලාභදායී ක්‍රමයක් වන අතර තමන්ගේ ආරවුල් වලට විසඳුමක් සොයන අතරම සිය හොඳ

හිත පවත්වා ගැනීමටද, එය ආරවුලට මැදි වූ පාර්ශවයන්ට අවස්ථාවක් ලබාදේ. බේරුම්කරුවකුගේ (Mediator) උපකාරය ඇතිව, ආරවුලට මැදි වූ දෙපාර්ශවයටම පිළිගත හැකි එකඟත්වයකට එළඹීමට හැකි එකම ආරවුල් විසඳුම් ක්‍රමය වශයෙන් මෙය සාමාන්‍යයෙන් සැලකේ. ඒ නිසා මගේ අදහස වන්නේ එබඳු බේරුම් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන්නේ නම් එය ඉදිකිරීම් අංශයට විශාල වශයෙන් ඵලදායි වනු ඇත යන්නය. ඒ අනුව ඉතිරි වන කාලය, ශ්‍රමය සහ නඩු වලට යන වියදම නිසා ඉදිකිරීම් කර්මාන්තයට විශාල වශයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට මෙය සරල ක්‍රියාමාර්ගය ඉවහල් වනු ඇත.

එසේම, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාව දහස් ගණනක් ඉදිකිරීම් වැඩපොළ වල වැඩ කොට උපයන වැටුප් බොහෝ විට ආපසු ඒ ප්‍රදේශවලම සංසරණය වීම ගැනද සළකා බැලීම වැදගත්ය. ඒ අර්ථයෙන් ගත් කළ, ඉදිකිරීම් කර්මාන්තය සංකෝචනය වී කම්කරුවන්ට වැඩ නැති වන විට ඒ පසු බෑස්ම සහ ආර්ථික පහත වැටීම දැඩි ලෙස දැනෙන්නේ ග්‍රාමීය ආර්ථිකයටය. අනෙක් අතට කර්මාන්තය දියුණු වන විට ග්‍රාමීය ආර්ථිකයටද ප්‍රතිලාභ සැලසී එය දියුණු වේ. එබැවින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ ජීවන තත්ත්වය ආරක්ෂා වීමට සහ දියුණු වීමට ඉදිකිරීම් කර්මාන්තය ඉතා වැදගත් වේ.

# 10

දහවන කොටස

# දේශපාලනය

# 10.1

## දකුණේ නායකයන් යථාර්ථය වටහාගෙන නෑ

ආධාර හෝ ණය වශයෙන් ලැබෙන මුදල් හරියාකාරව පරිහරණය නොකරන්නේ නම් එමගින් නිසි ප්‍රයෝජන නොලැබෙන බව අපේ රටේ නායකයන් බෝහෝවිට තේරුම් නොගන්නා කරුණකි. රටක් හා සමාජයක් වශයෙන් අප ඉතාම දරුණු ලෙස විදේශීය හා දේශීය ණය ප්‍රමාණයකට යටවී සිටින බව අප සියලු දෙනාම දන්නා කරුණකි. සෑම වසරකම අයවැය ඉදිරිපත් කරමින් මුදල් අමාත්‍යවරයා මේ සම්බන්ධයෙන් පුන පුනා කියයි. තවද, 2002 වන විට, අපගේ ඒක පුද්ගලික ණය ප්‍රමාණය රුපියල් අසුදහසක් පමණ ඇතිවීම මුදල් අමාත්‍යවරයා පෙන්වා දෙන තවත් ප්‍රබල ආර්ථික සාධකයකි. එනිසා දැනට ලැබී තිබෙන ණය හා ආධාර මුදල් දෙස අපට බැලීමට සිදුවන්නේ මෙවැනි පදනමක සිට වන අතර, තවත් සමාජ, ආර්ථික ගැටලු රාශියක්ද පසුබිමේ තිබෙන බව කිසිසේත්ම අමතක නොකළ යුතුය.

ණය හා ආධාර මුදල් ලබාගැනීම පහසු කරුණක් විමට පුලුවන. නමුත් ඒවා නැවත ගෙවීම සම්බන්ධයෙන් පවත්නා ගැටලු ගැන විශේෂ අවධානයකින් කටයුතු කළ යුතුය. අනෙක් පැත්තෙන් ණය මුදල් ලබාගැනීමේදී රටතුළ ඇතිවිය හැකි ආර්ථිකමය අර්බුදය සම්බන්ධයෙන්ද විශේෂ සැළකිල්ලක් දැක්විය යුතුය. ඒ නිසා මෙසේ ලබාගන්නා ණය හා ආධාර මුදල් මතු පරම්පරාවට ආපසු ගෙවීමට සිදුවන බව මැනවින් අධ්‍යයනය කර වියදම් කිරීම අපගේ වගකීමකි. ඊට අමතරව යොදවන මුදලින් උපරිම ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි සැලසුම් සහගතව සුපරීක්ෂාකාරීව ණය හා ආධාර මුදල් පරිහරණය කිරීමට අදාළ අංශ වගබලා ගත යුතුය.

---

**වමින්ද මුණසිංහ මහතා සමග පැවැත්වූ සාකච්ජාවක් ඇසුරින් 2003.06.24 දින ලංකාදීප පුවත්පතෙහි පළවූ ලිපියක් ආශ්‍රයෙන්**

මෙම වගකීම ඉතා බැරෑරුම් මෙන්ම ඉටුකිරීමට අපහසු සංකීර්ණ වුවක් විය හැකිය. නමුත් එකී සංකීර්ණ වගකීම තුළ රටේ ඉදිරි ගමනට බලපාන වැදගත් සාධක අඩංගුවී තිබෙන බව කිසිසේත්ම අමතක නොකළ යුතුය. අනෙක් පැත්තෙන් බලන විට මෙම වගකීම රටේ අනාගත පරපුර වෙනුවෙන් ශක්තිමත් පදනමක් සකසන්නකි. මෙපමණ වූ වැදගත් වගකීමක් අප කෙසේ ඉටුකළ යුතුද යන්න යමෙකුට ගැටලුවක් වීමට පුලුවන. තමන්ගේ වගකීම් සම්භාරය නිසිලෙස ඉටුකරන්නෙකුට මෙය එතරම් බරපතල දෙයක් නොවනු ඇත.

සෑම වර්ෂයකදීම අපට ලැබෙන ණය හා ආධාර මුදල් නිසිලෙස ප්‍රායෝගිකව පාවිච්චි කරන ප්‍රමාණය ඉතා අවම මට්ටමක පවතින බව ණය දෙන ආයතන මෙන්ම මේ රටේ විශේෂඥයින් විටින් විට පෙන්වා දී තිබේ. නමුත් ඒ කරුණ සම්බන්ධයෙන් මේ දක්වා යොමු වී තිබෙන අවධානය සම්බන්ධයෙන් අපට සෑහීමකට පත්වීමට නොහැක. එය මේ රටේ ආර්ථික පරිහානියට සෘජුවම බලපා තිබෙන සාධකයක් බව පෙන්වාදිය හැකිය. සමස්ථයක් වශයෙන් ගෙන බලන විට අප ප්‍රයෝජනයට ගන්නා ණය හා ආධාරවල ප්‍රතිශතය 14% ක් වැනි අඩු මට්ටමක පවති. මෙම ප්‍රතිශතය 2002 වසරේදී 16% ක් පමණ වූ අතර 2001 වසරේදී මෙම ප්‍රතිශතය 17% පැවතුනි.

මෙම ප්‍රතිශතය බොහෝ නොදියුණු රටවල ණය හා ආධාර පරිහරණ ප්‍රතිශතයටත් වඩා අඩු මට්ටමක් වී තිබීම සම්බන්ධයෙන් අප කණගාටු විය යුතුය. මේ දක්වා මෙරටට ලබාදී තිබෙන ණය හා ආධාර මුදල් නිශ්චිත සැළසුමක් අනුව පරිහරණය කිරීමට පරිපාලකයන් කටයුතු කළේ නම් ශ්‍රී ලංකාවට මීට වඩා ඉහළ මට්ටමේ සංවර්ධනයකට හිමිකම් කීමට හැකියාවක් තිබුණි. ජාතියේ අවාසනාවකට හෝ එවැන්නක් නොවුයේ සෘජුවම පරිපාලකයන්ගේ දුර්වලතා හේතුවෙනි.

අප රටේ සාක්ෂරතාව ඉහළම මට්ටමක තිබෙන බව අපි පුන පුනා කියන්නෙමු. ඒ අතරම රටේ පාලන තන්ත්‍රය ඉහළ මට්ටමක පවතින එකක් යැයි ඇතැම් රජයේ නිලධාරීහු ආඩම්බරයෙන් පවසති. කරුණු එසේ නම් අපට දිනා ගත හැකි වූ ණය හා

ආධාර මුදල් සාර්ථකව පරිහරණය කර රටේ සංවර්ධනය වේගවත් කරගැනීමට අපට ශක්තියක් හා අවශ්‍යතාවක් නොමැති නම් එය මුලු රටේම පාලන තන්ත්‍රය අවතක්සේරුවට ලක්කරන සාධකයක් නොවන්නේද? එනිසා මෙවැනි දුර්වලතා හැකි ඉක්මණින් මැඩපවත්වා ගැනීමට වැඩපිළිවෙළක් මුලින්ම සැකසිය යුතුය.

ටෝකියෝ සමුලුවෙන් පසුව පැවැත්වුණු විදේශ ආයෝජකයන්ගේ සම්මේලනයේදී මුදල් ඇමතිවරයා ඉතා වැදගත් ප්‍රකාශයක් කර තිබුණි. දැනට ලැබී තිබෙන ණය හා ආධාර මුදල් ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිශතය 2004 වසර වන විට සියයට 45 ක් දක්වා වර්ධනය කරන බව පැවසීම එම වැදගත් අදහසයි.

2002 වසරේ 16% ක්ව පැවති ණය හා ආධාර ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිශතය මෙතරම් ප්‍රමාණයක් දක්වා වැඩිකිරීමට නම් දළ වශයෙන් තුන් ගුණයකින්වත් එය වැඩි කළ යුතුය. ඒ වෙනුවෙන් විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවන අතරම පුලුල් සංවර්ධන වැඩපිළිවෙළක්ද ක්‍රියාත්මක විය යුතුය. එසේ යොදවන මුදලින් රටට ප්‍රතිලාභ අත්වීමද අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි. ණය හා ආධාර මුදල් පරිහරණ ප්‍රතිශතය ඉහළ දැමීමට රජයේ හා පෞද්ගලික අංශයේ හිටපු නායකයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීමට මුදල් අමාත්‍යවරයා අදහස් කර තිබෙන බවද කියැවෙයි.

මෙවැනි පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක් සත්‍ය වශයෙන්ම මෙවන් කටයුත්තක් සාර්ථකව ඉටුකරයිද යන්න සම්බන්ධයෙන් මතුවන්නේ බලවත් සැකයකි. රජයේ හා පෞද්ගලික අංශයේ වැදගත් තනතුරු දැරූ මෙම පුද්ගලයන් විශ්‍රාම යාමට පෙර දක්ෂ ලෙස හා කාර්යක්ෂමව නිසි පරිදි කටයුතු කළේ නම් වර්තමානයේ ණය හා ආධාර මුදල් පරිහරණ සම්බන්ධ ගැටලු තිබිය නොහැක. එනිසා ඒ අයම නැවත වරක් උසස් තනතුරුවලට පත්කොට වගකිම් භාරදීමෙන් සිදුවන්නේ එම වගකිම්වල ඉරණමද පෙරසේම අසාර්ථක තත්ත්වයකට පත්වීම නොවේද? එවැනි සැකයක් කවර පුද්ගලයෙකු තුළ වුවද ඇති වුවහොත් එය සාධාරණ සැකයකි.

රටේ සංවර්ධන තීරණය කෙරෙන මෙවැනි වගකීම් භාරදිය යුත්තේ විශ්‍රාමිකයන්ට නොව රටේ සංවර්ධනය සම්බන්ධයෙන් දැඩි කැක්කුමක් තිබෙන ජනතාවගේ දුක සහ ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධයෙන් නිසි පරිදි අවබෝධයක් තිබෙන ප්‍රායෝගික පුද්ගලයන්ට බව මා දරන මතයයි. මෙම කාර්ය භාරය එවැනි පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවකට භාරදී ලැබී තිබෙන මුදල් වලින් වැඩි කොටසක් ප්‍රාදේශීය මට්ටමට ගලායන නිශ්චිත ක්‍රමවේදයක් සැකසීමෙන් පමණක් ණය හා ආධාර මුදල් නිසිලෙස ප්‍රයෝජනයට ගැනීමට හැකිවනවා ඇත.

දැනට ලැබෙන්නට තිබෙන ණය හා ආධාර මුදල්වලින් වැඩි ප්‍රතිශතයක් අපට ලැබෙන්නේ රටේ පවතින සාමකාමී වාතාවරණය හේතුකොටගෙන බව අප සියලු දෙනාම දන්නා කරුණකි. සාමය වෙනුවෙන් බොහෝ කැපකිරීම් කිරීමට සාමාන්‍ය ජනකොටස් ඉදිරිපත් වී සිටින්නේ ඒ හරහා තමන්ට යම් ආර්ථික වාසියක් ලැබේය යන චේතනාවෙනි. මෙහි කිසිඳු වැරැද්දක් දැකිය නොහැක. ජනතා අපේක්ෂා ඉටුකිරීමට රටක පාලක පක්ෂය වගබලා ගත යුතුය. නගරබද හා ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන බොහෝ දෙනා පවසන්නේ සාමයේ ප්‍රතිලාභය තවමත් තමන්ට ලැබී නොමැති බවකි. ඒ සමගම රටේ ඉහළ මට්ටමේ සමාගම්, බැංකු සහ ජාත්‍යන්තර සමාගම් රටේ පවතින සාමකාමී වාතාවරණය හේතුවෙන් තම ලාභාංශය වැඩිකර ගැනීමට පොහොසත් වී ඇති බව මෑතක සිට විවිධ මාධ්‍ය ඔස්සේ අසන්නට ලැබුණි.

මෙම සමාගම්වල කොටස්කරුවෝ බොහෝ විට ඉහළ පෙළේ ව්‍යාපාරිකයන් හා විදේශ ආයෝජකයන්ය. ඔවුන් එසේ ලාභ ඉපයීම සම්බන්ධයෙන් අපට කිසි ගැටලුවක් නැත. යම් අවදානමක් සහිත ආයෝජන කටයුතුවල නියැලෙන්නේ ලාභ පරමාර්ථය මූලික කරගෙනය. ආයෝජකයන් ලාභ උපයනවාට සමගාමීව රටේ සාමාන්‍ය ජනයාටත් සාමයේ ප්‍රතිඵලයක් වශයෙන් යම් වාසිදායක තත්ත්වයක් ඉතා ඉක්මණින් ඇත්විය යුතුය. අවම වශයෙන් දැනට තිබෙන ජීවන වියදම යම් පමණකින් හෝ අඩුවන ආකාරයට ඔවුන්ට කිසියම් සහන ලබාදීම අත්‍යවශ්‍ය වුවකි. වෙළඳ පොළ මිල මට්ටම් නිරන්තරයෙන්ම ඉහළ යන

පසුබිමක් තුළ සාමාන්‍ය ජන ජීවිතය නගාසිටුවීම වෙනුවෙන් මීට වඩා මෙහෙවරක් කළ යුතුය.

එසේ කිරීමට නම් ලැබෙන ආධාර හා ණය මුදල් රටේ ප්‍රාදේශීය මට්ටමට ගලායන ලෙස පාලන තන්ත්‍රය සකස් කළ යුතුය. මෙම ප්‍රතිපාදන පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඔස්සේ දියත්වන ක්‍රමයක් සැකසීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වී තිබේ. එසේ නොමැතිව සියලුම මුදල් මධ්‍යම රජය මාර්ගයෙන් වියදම් කරන්නේ නම් මෙවර ලබාගත් ණය හා ආධාර මුදල්ද පෙර පරිදිම නිකරුණේ විනාශ වී යනවා ඇත. රට තවත් අගාධයට ඇද දමනවාද සංවර්ධනය කරා මෙහෙයවනවාද යන්න සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට මෙය හොඳම අවස්ථාව බව පෙන්වාදිය හැකිය.

ආධාර බෙදාහැරීමේදී මෙවැනි ක්‍රමවේදයකට විරුද්ධවන අයද සිටිති. පළාත් පාලන හා පළාත් සභා යන ආයතනවල පවත්නා දුර්වල තත්තවය නිසා මෙවැනි භාරදූර වගකීමක් ඔවුන්ට පැවරිය නොහැකි බව එසේ විරුද්ධ වන අය ඉදිරිපත් කරන මූලිකම තර්කය වී තිබේ. එම තර්කයේ යම් සත්‍යයක් තිබිය හැකිය. නිදහස ලබාගෙන වසර පනස් පහක් ගෙවීගොස් තිබියදීත් වසරින් වසර මෙවැනි දුර්වලතා ගැනම කතාකරමින් සිටීම අර්ථ විරහිත වුවකි. එම දුර්වලතා නිවැරදි කරගැනීමට හැකි ක්‍රමයක් ගැන අවධානය යොමු කළ යුතුය. එසේ නොමැතිව හැම විටම කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කිරීමෙන් පමණක් සත්‍ය තත්ත්වයෙන් ඈත්වීමට නුපුලුවන. රට තුළ පුලුල් සංවර්ධනයක් ඇති වී ජනතාවට දැනෙන ග්‍රාමීය මට්ටමෙන් අවශ්‍යතා සපුරාගත හැකි වන්නේ ප්‍රාදේශීය මට්ටමට මෙම මුදල් කාන්දු වුවොත් පමණි. දැනට පළාත් පාලන හා පළාත් සභාවල සිටින දේශපාලනඥයන් ක්‍රියාකාරී මට්ටමෙන් දුර්වල නම් මේ වසරේ ඉදිරි කාලයේදී එම දේශපාලනඥයන් හා නිලධාරීන්ට සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පුහුණුවක් ලබාදිය යුතුය.

මුදල් නිසි පරිදි සංවර්ධන කටයුතුවලට යෙදවීම, මූල්‍ය විනයක් පවත්වාගැනීම, සැළසුම් සකස් කිරීම, අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීම, තීරණ ගැනීම ආදි අංශ සම්බන්ධයෙන් මේ

අයට ක්‍රමවත් අවබෝධයක් ලබාදිය යුතුය. මෙම ප්‍රයත්නයේ වැදගත්කම ඔවුන්ට පහදා දිය යුතු අතරම ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් ඔවුන් පෙළඹවීම කළ යුතුව තිබේ. රටේ පාලන තන්ත්‍රයට නව පිබිදීමක් ලබා නොදී මෙම කටයුත්ත සාර්ථක කරගත නොහැකි බව මා දරන මතයයි.

කොළඹට පමණක් කේන්ද්‍ර වූ අධිකාරි හරහා ගමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති දියත් කළ නොහැක. කොළඹ ශීත කාමරවල හිරවී ග්‍රාමීය ප්‍රදේශවල තත්ත්වය කෙබඳුද යන්න වටහා ගැනීමට නුපුලුවන. අප රටේ දකුණේ සැම පළාතකම නායකයන් මේ සත්‍ය තවමත් තේරුම් ගෙන නොමැත. දකුණේ කිසිම පළාත් සභාවක නායකයෙක් හෝ පළාත් පාලන ආයතනයක් ප්‍රධානියෙක් තම ප්‍රදේශයේ සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධයෙන් රටපුරා පැතිරයන ලෙස දේශපාලන සාකච්ඡාවක් අරඹා නැත. එසේ නොවන්නේ ඔවුන්ට තම ප්‍රදේශයේ ජනතාව ගැන හැඟීමක් නොමැතිකම නිසා විය හැකිය. නමුත් උතුරේ වේලුපිල්ලේ ප්‍රභාකරන් මෙම සත්‍ය නිවැරදිව අවබෝධ කරගෙන සිටින බව අපට අකමැත්තෙන් වුවත් පිලිගැනීමට සිදුවනු ඇත. උතුරු හා නැගෙනහිර සංවර්ධන කටයුතු වෙනුවෙන් සෘජුවම ප්‍රතිපාදන ඔහු ඉල්ලා සිටින්නේ ඒ නිසාය.

මධ්‍යම රජය හරහා මුදල් ආයෝජනය වන විට උතුරේ හා නැගෙනහිර ප්‍රදේශවල ඇති වී තිබෙන ගැටලු ගැන ඔවුන් හොඳින් දන්නවා ඇත. එම ගැටලු අනිකුත් පළාත් වලත් තිබුණද අවාසනාවකට මෙන් එම පළාත්වල නායකයන් තම ඉල්ලීම රටට හා රජයට දැනෙන ලෙස ඉදිරිපත් නොකිරීම කනගාටුවට කරුණකි. තම ප්‍රදේශවල සංවර්ධනය සම්බන්ධයෙන් දැඩි කැක්කුමකින් හා වුවමනාවකින් පළාත් නායකයන් කටයුතු කළේ නම් මෙම ණය හා ආධාර සමුලුවට සෙසු පළාත් සභාවල ප්‍රධාන ඇමතිවරුද සහභාගි කරවා ගන්නා ලෙසට ඉල්ලීම් කරන්නට තිබුණි. එහෙත්, එවැනි ප්‍රවණතාවක් අපගේ පළාත් පාලන අංශවල නොමැත. ඒනිසා ණය හෝ ආධාර කොතරම් ලබාගත්තත් ඒවායින් නිසි ප්‍රයෝජනයක් ගැනීමට හැකිවේද යන්න හුදු ප්‍රශ්නාර්ථයක් පමණි.

රටේ පවත්නා තත්ත්වය අනුව විදේශ ණය හා ආධාර නොමැතිව රට සංවර්ධනය කළ නොහැක. නමුත් ලබාගන්නා ණය හා ආධාරවලින් උපරිම ප්‍රයෝජන නොගන්නේ නම් එමගින් රටට අනර්ථයක් මිස යහපතක් සිදුවන්නේ නැත. දැනට අප ලබා තිබෙන ප්‍රතිඵලයද එය වී තිබේ. එනිසා අතීතය ආදර්ශයට ගනිමින් හෝ මෙවර ලබාගත් ණය හා ආධාර මුදල් රටේ සංවර්ධන යාන්ත්‍රණය වේගවත් වන ආකාරයට පරිහරණය කළ යුතුය. එසේ නොවුවහොත් අපේ ඉදිරි පරපුර සම්පූර්ණයෙන්ම විදේශ ණයගැති පිරිසක් බවට පත්වනු ඇත. මෙම තත්ත්වයෙන් රටත් ඉදිරි පරපුරත් බේරාගැනීමට නම් මේ අවස්ථාවේ සියලු දෙනාම එකමුතුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්වී තිබේ.

# 10.2

## ආර්ථිකය විමධ්‍යගත නොකර බලය විමධ්‍යගත කිරීමෙන් ඵලක් නෑ

යුද්ධය නිමාකර සාමය උදා කිරීමේ කාර්යයේදී බලය බෙදා හැරීම සම්බන්ධයෙන් වැඩි අවදානයක් අද රටේ ඇතිවී තිබේ. මේ නිසා බලය බෙදා හැරීම වර්තමානයේ විශේෂයෙන්ම සාකච්ඡාවට බඳුන්වන මාතෘකාවකි. අන්තවාදී දේශපාලන පක්ෂ හැර, අනිකුත් සෑම දෙනාගේම කැමැත්ත නම් දේශපාලනික බලය සහ වගකීම පළාත් හරහා බෙදා හැරීම බව පැහැදිලිය. අප බහුතරයක් පිළිගන්නා ආකාරයට මෙසේ කරද්දී, අවධානය ගත යුතු විශේෂිත කරුණු රාශියක් තිබේ. ඒවා අතරින් ඇති එක් විශේෂ අවශ්‍යතාවක් නම් කල් පවතින, ප්‍රායෝගික, තේරුම් ගැනීමට හැකි සරල පාලන ව්‍යුහයක් සකස් කර ගැනීමයි.

බලය බෙදා හැරීම කඩදාසියකට පමණක් සීමා නොවිය යුතුය. එය ප්‍රායෝගික තලයක ක්‍රියාත්මක කළ හැකි ක්‍රමයක් විය යුතුය. ඒ සඳහා අනිවාර්යයෙන්ම අලුතින් නීති සහ අණපනත් පැණවීමට සිදුවනු ඇත. එහෙත් එවැනි ප්‍රයත්න අතීතයේදී සකස් කළ විට, ඒවායේ වැඩි ප්‍රායෝගිකත්වයක් නොමැති බව දක්නට තිබුණු කරුණකි. ඒවා සංකීර්ණ ඒවාද වුණි. බොහෝ විට ඒවා ප්‍රායෝගිකද නොවීය. ඒ අතරම, තවත් අතකින් බලන විට, එම ක්‍රම සාර්ථකව දියත් කර ගැනීමට හේතූන් රාශියක් සහ දැඩි දේශපාලනික අවශ්‍යතාවයක් තිබුණද, මෙවැනි තත්ත්වයන් බොහෝමයක් ඇති වන්නේ මූල්‍යමය ගැටලු නිසා බව බොහෝ දෙනෙකු තේරුම් නොගන්නටද ඇත. එමෙන්ම, මෙම කරුණ කෙරෙහි වැඩි අවධානයක්ද යොමු වූයේ නැත. මාගේ මතය අනුව එය ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. ඉදිරි අනාගතයේදී අප අලුත් බලය බෙදා දීමේ ක්‍රමයකට පිවිසීමට සූදානම් වනු

---

චම්න්ද මූණසිංහ මහතා සමග පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරින් 2002.10.16 දින ලංකාදීප පුවත්පතෙහි පළවූ ලිපියක් ආශ්‍රයෙන්

ඇත. ඒ සඳහා අලුත් නීති සම්පාදනය කිරීම, නව පාලන තන්ත්‍රය කාර්යක්ෂම කිරීමට උත්සහ කිරීම, එවැනි විසඳුම් වලට සම්පවන ප්‍රායෝගික මුදල් ප්‍රතිපත්තියක් සහ වෙන් කිරීමේ ක්‍රමයක් සකස් කිරීම, අපගේ විශේෂ වගකීමකි. දේශපාලනික බලය සහ රාජ්‍ය බලය සහ වගකීම විමධ්‍යගත කරනවා සේම, එසේ බලය බෙදෙන සහ විමධ්‍යගත කරන ප්‍රදේශවලට මූල්‍යමය සම්පත් සැපයෙන ආකාරය කෙරෙහිද අප විශේෂ අවධානයක් යොමු කල යුතුය. මේ සම්බන්ධයෙන් රටතුල පුලුල් විවාදයක් ඇතිවීම අත්‍යවශ්‍ය වූවකි. එහෙත්, වර්තමානයේ අප රටේ බලය බෙදා හැරීම ගැන සහ වෙනත් දේශපාලනික විසඳුම් ගැන සාකච්ජා කරනවා හැරෙන්න ඊට සම්බන්ධ සහ අතිශයින් අදාළ මුදල් වෙන් කිරීමේ ක්‍රම සහ විදි ගැන හෝ ඒවා හසුරුවන ආකාරය ගැන හෝ එම මුදල් හසුරුවන්නේ කවුරුන් විසින්ද යන්න ගැන හෝ නිසි අවධානයක් යොමු කෙරෙන්නේ නැත. මාගේ මතය අනුව, මෙම අපේක්ෂිත ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට නම් එවැනි පසුබිමක් සහ අවදානමක් තිබිය යුතුය.

බලය සහ මුදල් විමධ්‍යගත කිරීම සඳහා යම් පිළිගත් මූලධර්ම හරහා එම නව පද්ධති පිහිටුවීමට කටයුතු කිරීම ඉතා යෝග්‍යය. මෙවැනි ක්‍රියාවලි සඳහා බොහෝ රටවල් ක්‍රම සහ විධි සම්පාදනය කොට ඇත. ඒවා වෙනත් රටවල සාර්ථකව ක්‍රියාත්මක කළ පමණින්, ඒවා ඒ ආකාරයෙන්ම අප රටට ආනයනය කළ යුතු යැයි මා කියන්නේ නැත. එහෙත් එම රටවල් මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කළ ආකාරය මනාව අධ්‍යයනය කිරීමෙන් අප රටටම ආවේනික, සුදුසු ක්‍රමයක් සකසා ගැනීමට පහසු වන්නේය.

එකම රටක පාලන තන්ත්‍ර දෙකක් අතර බලය විමධ්‍යගත කිරීමේදී එය සාර්ථකව කර ගැනීමට නම්, බලය පමණක් නොව මුදල්ද විමධ්‍යගත විය යුතුය. ඒ අතර එක් එක් පාලන තන්ත්‍රයේ වගකීම්ද, මූල්‍ය සම්පත්ද වෙන් වෙන්ව හඳුනාගැනීම අවශ්‍ය වනු ඇත. එවිට, විමධ්‍යගත කර ඇති වගකීම් මුදල් ප්‍රතිපාදන සමගම ඒ ඒ කොටස් වලට පැවරීමට හැකි වන්නේය. මේ ආකාරයෙන් වගකීම් පවරනවාත් සමගම ඊට අදාළ වන ලෙස මුදල්ද පැවරීම ස්වභාවිකවම වාගේ සිදුවිය යුතු සිද්ධියකි. යම්

ප්‍රදේශයකට හෝ පළාතකට ස්වයං සහ විමධ්‍යගත පාලනයක් ලබාදී එම ප්‍රදේශයේම සංවර්ධන කටයුතු වලට අවශ්‍ය මූල්‍ය සම්පත් විටින් විට අවශ්‍ය වන විට මධ්‍යම රජයෙන් වෙන වෙනම ඉල්ලීම් හරහා එම මුදල් ලබාගත යුතු නම්, ප්‍රශ්න ගණනාවක්ම මතුවීමට පුලුවන ඇතැම් විට, මධ්‍යම රජය යම් හේතූන් නිසා මුදල් ලබා නොදීමට හැකිය. සමහරවිට, දේශපාලනික හේතූන් මත ලබාදෙන නිසා ප්‍රමාණය වැඩි හෝ අඩු කළ හැකිය. එවැනි සිදුවීම් සිදුවන විට, බලය විමධ්‍යගත කිරීමේ ප්‍රයත්නය දේශපාලනිකරණයට යටත් වීමෙන් උග්‍ර විවේචනයකට සහ දැඩි අප්‍රසාදයකට ලක්වෙනු ඇත. එසේ නම්, පළාත් හරහා බලය සහ මුදල් බෙදාදීමේ ක්‍රියාවලියක් සාර්ථක වන්නට නම්, එම පද්ධතිය සහ ව්‍යුහය ප්‍රශ්න කිහිපයකටම සුදුසු පිළිතුරු ලබාදිය යුතුයි. බලය සහ මුදල් බෙදීම වැනි වගකීමක් පවරද්දී, එම විමධ්‍යගත කටයුතු සහ වගකීම් ඉටු කරන්නේ කවුරුන්ද? ඒ බලය හසුරුවන අයට පුහුණුවක් ලබාදිය යුත්තේ කෙසේද? එම මුදල් සාධාරණයිද, නැද්ද තිරණය කරන්නේ කවුරුන්ද? එසේ කිරීමට උපයෝගි කරගන්නා සාධක කුමක් විය යුතුද? එය ලබාදිය යුතු ආකාරය කුමක්ද? ඒවා හරියාකාරව පාවිච්චි වුවාදැයි දැනගන්නේ කෙසේද? මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදිය හැකි ව්‍යුහයක් එම පද්ධතියේම සැකසිය යුතුය.

තවත් පැත්තකින් බලනවිට, අප වටහා ගත යුතු කැරුණක් නම් අප බලය බෙදා දීමට බලාපොරොත්තු වන්නේ පළාතක් නියෝජනය කරන තවත් දේශපාලන කොටසකට බවය. ඒ ව්‍යුහය තුළ පලාත් භාර නව නායකයන් බිහිවීම නිසැකය. ඒ අය තම පළාත් දියුණු කිරීමට කටයුතු කරනු ඇත. එසේ නම්, ඒ ප්‍රදේශවල ඇති වාණිජ සම්පත් දියුණු කිරීමට යම් සැළසුම් මධ්‍යම රජය සතුව තිබුණද, ඒවා ක්‍රියාත්මක කිරීමට පළාත් මට්ටමේ අදාළ පාලක කොටස් සමග සාකච්ඡාකොට ඒවා සඳහා අවශ්‍ය මුදල් සමග ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරා දිය යුතුය. එසේ අපක්ෂපාතිව සැළසුම් සහ මුදල් ලබාදීමට නම් මධ්‍යම රජය නිවැරදි දේශපාලනික දැක්මකින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මධ්‍යම රජය එසේ කටයුතු කරවීමට පොළඹවන නීති රීති ව්‍යවස්ථාවේම අඩංගු විය යුතුය. මෙසේ දේශපාලනික

බලය පවරනවාත් සමගම ආර්ථික බලය පැවරීමද, බලය විමධ්‍යගත කිරීමේ සුවිශේෂී ලක්ෂණයකි. තම ප්‍රදේශය සංවර්ධනය කළ යුතුයි යන අදහස, අදාළ පලාත් මට්ටමේ පාලක කොටස තුළ ඇතිවන්නේ ඒ ආකාරයෙනි. නිරන්තරයෙන්ම, තම කටයුතු සඳහා මධ්‍යම රජය සමග විටින් විටම ගනුදෙනු කිරීමට සිදුවුවහොත් එය නව ගැටුම් වල ආරම්භයකට මුල විය යුතුය. මෙසේ එක් එක් පළාත් අතර ඉහත ආකාරයෙන් ආර්ථික සම්පත් බෙදා දී ඒ අයට අවශ්‍ය වන ආකාරයට ඒවා හැසිර වීමට ඉඩ ලබාදෙන විට ඒ ඒ පළාත් අතර ඇති ආර්ථික තරගකාරීත්වය වර්ධනය වනු ඇත. එක් පළාතක පවත්නා ආර්ථික දියුණුව අභිබවා යාමට තවත් පළාතක පාලන කොටස් උත්සහ කරනු ඇත. මේ තරගකාරීත්වය තුළ නිරන්තර සංවර්ධන ක්‍රියාවලියක් ගොඩනැගෙනු ඇත. මෙවැනි තත්ත්වයක් අද ඇමෙරිකා එක්සත් ජනපදයේද, ඉන්දියාවේද ඉතා පැහැදිලිව දක්නට ඇත. මේ අනුව තම පළාත කෙරෙහි පළාත් හැගීමක්ද ඇතිවනු ඇත. ඒ අතරම එම සියලුම පළාත් එක් රටක කොටස යන හැගීම, මේ හරහා විනාශ නොවන ලෙසත් කටයුතු කිරීමට අප වගබලා ගත යුතුයි. එසේ නම්, අප ඉදිරියේ ඇති අභියෝගය නම්, පළාත් අතර තරගකාරීත්වයක් ඇතිකරන අතරම, රටේ ජාතික ආර්ථික ප්‍රතිපත්තිය සාර්ථකව දියත් කිරීමය. රජයක් නීති මාර්ගයෙන් බදු අය කිරීම සිදු කරයි. එසේ කරද්දී වැඩි ආර්ථික දියුණුවක් පවතින ප්‍රදේශවලින් ලැබෙන බදු ප්‍රමාණය වැඩිය. අඩු ආර්ථික ශක්තියක් සහ අඩු සම්පත් ඇති ප්‍රදේශවලින් අනිවාර්යයෙන්ම ලැබෙන්නේ අඩු බදු මුදල් ප්‍රමාණයකි. ශ්‍රී ලංකාව දෙස බැලුවහොත්, බස්නාහිර පළාතෙන් ලැබෙන බදු ප්‍රමාණය අනිත් සැම පළාතකටම වඩා අතිශයින්ම වැඩිය. එම පළාතේ සිටින අයගෙන් සහ ව්‍යාපාර වලින් බදු වශයෙන් මුදල් අයකරගෙන වෙනත් පළාත් දියුණු කරන්නේ ඇයි දැයි යන්න සමහර කෙනෙකු ප්‍රශ්න කළ හැකිය. එහිදී අප සැලකිය යුත්තේ, රටක ඇති සියලුම පළාත් හැකි පමණ සමාන්තරව දියුණු නොකළහොත්, හටගන්නා විශමතාවයන් විශාල දේශපාලනික අර්බුදවලට මුල පුරන බවය. එසේ වුවහොත්, දිගින් දිගටම මුලු රටම දේශපාලනිකව සහ ආර්ථිකව අස්ථාවර වනු ඇත.

මෙම විශමතාව යම් සාධාරණ සමතුලිත තාවකට යොමු කිරීම, රටේ මුදල් පාලනය කරන්නන්ගේ සහ ව්‍යවස්ථා සකස් කරන්නන්ගේ වගකීමකි. මෙය අති විශේෂ වගකීමකි. ඇතැම් පළාත් වල පවත්නා සමාජීය අවශ්‍යතා එම පළාතෙන්ම ලබාගත හැකි බදු මුදල් වලින්ම ඉටුකර ගැනීමට අපොහොසත් වනු ඇත. එවන් අවස්ථාවලදී මධ්‍යම රජයත් සමග එක්වී මෙම ප්‍රශ්නය සඳහා විසඳුම් සොයාගැනීමට සිදුවෙනු ඇත. මෙවැනි කටයුත්තක් කිරීමේදී එම විසඳුම් දේශපාලන පක්ෂ භේදයෙන් තොරව ක්‍රියාත්මක කර ගැනීමට හැකි වන ව්‍යුහයක් සකස් කර ගැනීම අත්‍යවශ්‍යය.

ඒ ඒ පළාත් වල ඇති අවශ්‍යතා ඉටුවන පරිදි, මුදල් බෙදා දීමේ ව්‍යුහයක් අප රට තුළ සකස් කළ යුතු වන්නේය. එසේ කිරීමේදී වෙනත් රටවල්වල පවතින ක්‍රම අපට ආදර්ශයට ගත හැකිය. වෙනත් රටවලද, මෙවැනිම ප්‍රශ්න ඇතිවී තිබේ. බලය සහ මූල්‍ය සම්පත් මධ්‍යම රජය සහ පළාත් රාජ්‍යයන් අතර සාධාරණව බෙදාගෙන ඇති රටවල් කිපයක්ම සැළකිය යුතු ආර්ථික දියුණු ලබා ඇතිබව පැහැදිලි කරුණකි. ස්විස්ටර්ලන්තය වැනි රටක ජනගහනය මිලියන 7 ක් පමණය. එහෙත් ඒ රට කැන්ටෝන් නමින් හැඳින්වෙන පළාත් රාජ්‍ය 26 කින් පමණ සමන්විතය. මේ පළාත් රාජ්‍යයන් තමන්ට පැවරී ඇති කටයුතු රාශියක්ම ස්වාධීනව කරගෙන යන අතර, මධ්‍යම රජයේ බලපෑම් වලින් තොරව, ඒවා කරගෙන යති. එවැනි පසුබිමක් තුළ ලෝකයේ දියුණුතම රටක් බවට ස්විස්ටර්ලන්තය අද පත්ව තිබේ. ඇමෙරිකාව, බෙල්ජියම, ජර්මනිය, ඕස්ට්‍රේලියාව ආදී රටවල්ද දියුණු වී තිබෙන්නේ මෙසේ බලය විමධ්‍යගත කොට ඇති රාජ්‍ය පාලන ව්‍යුහයක් තුළය. මේ රටවල් අනුගමනය කළ ක්‍රියාපිළිවෙත් විවෘතව අධ්‍යයනය කර, අපේ රටේ බලය සහ මූල්‍ය සම්පත් විමධ්‍යගත කිරීමක් අප රටට ගැලපෙන ලෙස ක්‍රියාත්මක කිරීමට දැන් කාළය එළඹී ඇත. මෙම ක්‍රම හඳුන්වන නම් කෙරෙහි අප හිතියක් ඇති නොකළ යුතුය. අප පැරණි සිද්ධාන්ත වලට හෝ සිරිත් විරිත් වලට හිරනොවිය යුතුය. ඉදිරි වසර සියයක්වත් රට ස්ථාවරවම පවත්වාගෙන යාමට නම්, එසේ කිරීමට තුඩු දෙන ආකාරයේ මුදල් සහ බල පරිපාලනයක් අප රටට අවශ්‍යවනු ඇත. ඒ ඒ ප්‍රදේශවලට අවශ්‍යකරන සම්පත් සහ සංවර්ධනය

නිසි පරිදි ලැබෙන්නේ නම් ගැටලු රැසකට විසඳුම් සොයාගත හැක. මේ සම්බන්ධයෙන් රටතුළ ඉතා ඉක්මණින් පුලුල් විවාදයක් සහ විවෘත සාකච්ඡාවක් ඇතිවිය යුතුය. ජනතාව දැනුවත් කිරීමක්ද අත්‍යවශ්‍ය වුවකි.

අද රටතුළ බලය බෙදා දීමේ ව්‍යුහය ගැන සාකච්ඡා රාශියක් කරගෙන යන බව සත්‍යය. ඒවා දේශපාලනික අතිනුත්, විවිධ ජනකොටස් නිරීක්ෂණය කරන කෝණ හරහා පළාත්වල භූගෝලීය පැවැත්ම අනුවත්, ඉතිහාසයේ කරුණු අනුවත්, තවත් මෙවන් සාධක හරහා, රටපුරා දියත් වනු ඇත. ජනමාධ්‍යයෙන් මෙවැනි ප්‍රශ්න සම්බන්ධව තර්ක සහ විතර්ක රාශියක් ඉදිරිපත් වේ. එහෙත් ඕනෑම පරිපාලන ක්‍රමයක් දිගුකාලීනව රැකගෙන තහවුරු කර ගැනීමට නම් ඒ පළාත් වල සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සාධාරණව බෙදා දීමේ ක්‍රමයක්ද, ඒ ඒ පළාත් වල එම මුදල් කාර්යක්ෂමව යෙදවීමේ හැකියාවක්ද ඇතිකළ යුතුය. මෙම වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් කිසිඳු සාකච්ඡාවක් අද අප රටේ කෙරෙනු දක්නට නොමැත. ඉහත කී වැදගත් ප්‍රශ්නවලට විසඳුම් නොමැතිව, බලය බෙදීමක් හෝ විමධ්‍යගත කිරීමක් සාර්ථකව කළ නොහැකි බවද, කිසිවෙකු තවමත් ඉස්මතු කර නොමැත. මාගේ මතය වනුයේ මෙම සාකච්ඡාවද දේශපාලනික සාකච්ඡාවටම සම්බන්ධ කරමින් ඉතා පුලුල් අධීක්ෂණයකට භාජනය කළයුතු බවයි. එසේ නැත්නම් සිදුවීමට ඉඩ ඇත්තේ දේශපාලනික විසඳුමක් කරා ලගාවෙන මොහොතක අවාසනාවකට මෙන් පැණනගින මූල්‍ය ප්‍රශ්න සහ ගැටලු නිසා එවැනි විසඳුම් රටතුළ දියත් කිරීමට අපොහොසත් වීමේ අවාසනාවන්ත සිද්ධිය සමහරවිට ඉස්මතුවීමට හැකි වීමයි. එසේ නම්, අප රටේ දේශප්‍රේමී විද්වතුන්, ආර්ථික විශේෂඥයින් මේ ගැන ඉක්මණින්ම තම අවධානය යොමු කළ යුතුය. එසේ කිරීමෙන් දේශපාන බලය විමධ්‍යගත කිරීමේ තම අදහස්වලට මුදල් සම්පත් බෙදාදීම ඉස්මතු කරගත්, තමන්ගේ වටිනා අදහස්ද ඒ ආකාරයෙන් එකතුකර ගැනීමට අපට හැකි වන්නේය.

# 10.3

## ශ්‍රී ලංකාව දූෂණය අතින් 66 වැනි ස්ථානයට

2003 ඔක්තෝම්බර් මාසයේදී ජාත්‍යන්තර විනිවිද භාවය පිළිබඳ ආයතනය (Transparency International) විසින් ලෝකයේ රටවල දූෂිත භාවය ගැන සමීක්ෂණ වාර්තාවක් නිකුත් කරන ලදී. එම සමීක්ෂණයේ දී රටවල් 133 ක් පිළිබඳව තොරතුරු එකතුකර ගනිමින්, සමාගම් නායකයින් විද්වතුන් හා අනෙකුත් වගකිව යුතු පාර්ශවයන් ගෙන් අදහස් ලබා ගෙන දූෂණය නැතැයි සැලකෙන රටකට උපරිම ලකුණු 10ක් ලබා දෙන අතර, සම්පූර්ණයෙන් ම දූෂිත යයි සැලකෙන රටකට අවම ලකුණු 0 ක් ද ලැබෙන ලෙස සමීක්ෂණයේ අගයන් පිළියෙල කරන ලදී. එම සමීක්ෂණයේ සොයාගැනීමක් වශයෙන්, ෆින්ලන්තය ලකුණු 9.6 ක් සහිතව පළමු ස්ථානයටද, 133 වැනි නැතහොත් අන්තිම ස්ථානයට බංගලිදේශයද හිමිකම් ලබාගෙන තිබුණි. ඒ අතර, ශ්‍රී ලංකාව ලකුණු 3.4 ක් ලබාගෙන 66 වැනි ස්ථානයට පත්වී තිබුණු බවද වාර්තා වුණි.

උපරිම ලකුණු 10 කින් 3.4 ක් වැනි ඉතා අඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගැනීමෙන් පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාවේ පවතින දූෂණය ගැන ජාත්‍යන්තරව ඉතා අයහපත් ආකල්පයක් ඇති බවයි. මෙම ප්‍රතිඵලය දෙස ආර්ථික කෝණයකින් බලන්නේ නම් එයින් පැහැදිලි වන්නේ කුමක්ද? ශ්‍රී ලංකාවත් සමග ගනුදෙනු කරන්නන් අප රට සලකන්නේ ඉතා දූෂිත පරිසරයක් පවතින රටක් සහ සමාජයක් වශයෙනි. එලෙස රටක් සැලකෙන විට, එම රට සමග ගනුදෙනු කරන බොහෝ දෙනා තව තවත් දූෂණයට තුඩු දෙන ආකාරයටම කටයුතු කිරීමට උත්සහ කරති. ඒ අතරම, එවැනි දූෂිත ක්‍රියාවලින් හෙලා දකින පුද්ගලයින් සහ සමාගම්, අප රට සමග කටයුතු කිරීමට අකමැත්තක් දක්වති. මෙම

---

**2003.10.26 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

ක්‍රියාමාර්ග දෙකම අප රටේ ඉදිරි ගමනටත්, සමාගම් ප්‍රජාවටත්, රාජ්‍ය පරිපාලනයටත් ඉතා අහිතකරය.

ශ්‍රී ලංකාවේ පවතින පාලන ක්‍රම සහ පාලන යන්ත්‍ර ඉතා දුර්වල සහ අයහපත් ඒවා බව අප නොදන්නා කරුණක් නොවේ. 2000 වර්ෂයේ දි ශ්‍රී ලංකාව දැවැන්ත යුද්ධයකට පැටලී තිබූ ඉතා දරුණු වකවාණුවකදී ද ලෝක බැංකුව විසින් කරන ලද සමීක්ෂණයකින් පැහැදිලි වුයේ ශ්‍රී ලංකාවේ එවකට තිබූ විශාලතම ප්‍රශ්නය අයහපත් පාලනය බවය. අද. යුද්ධය නතර වී ඇති අවස්ථාවක, අයහපත් පාලනය රටේ දරුණුතම ප්‍රශ්ණය ලෙස නිසැකයෙන්ම මතු වීම පුදුමයට කරුණක් නොවේ. එසේ නම්, මෙම දුෂිත පාලන ක්‍රමය ඉතා ඉක්මණින් යහපත් එකක් බවට පරිවර්ථනය කිරීම රජයේත්, ව්‍යාපාරික ක්ෂේත්‍රයේත් සියලුම නායකයන්ගේ අතිවිශාල වගකීමක් වන්නේය. එම ප්‍රයත්නයේ මුලික පියවර ලෙස හැඳින්විය හැක්කේ අපගේ දේශපාලන නායකත්වය ඉතා ඉක්මණින්ම යහපත් සහ දූෂණයෙන් තොර තත්ත්වයකට යොමු වීමය. මේ සම්බන්ධයෙන් සිංගප්පුරුවේ හිටපු නායක ලි ක්වාන් යු මහතා මෑතකදී අප රටේ ජනාධිපතිනිය හමුවූ අවස්ථාවේ දි එතුමියට පැවසූ තම අත්දැකීමක් මෙම ප්‍රශ්නයට ඉතා අදාල එකකි. එම කතාව මෙහිදි සිහිපත් කිරීම වටී.

අගමැති ලි අගමැති ධුරයට පත් වුවාට පසු ඔහුගේ ඉතාමත් කිට්ටු මිතුරෙක් හා අමාත්‍යවරයෙක් දුෂිතව කටයුතු කරන බවට සාක්කි ඔහු වෙත ලැබුණි. එවිට, අගමැති ලි තම මිතුරා කැඳවා එම සාක්ෂි ඔහුට ඉදිරිපත් කොට විකල්ප දෙකකින් එකක් තෝරා ගන්නා ලෙස ඔහුට යෝජනා කලේය. ඉන් පළමුවැන්න නම්, නීතියේ රැහැනට ගොදුරු වී සිරබත් කන්නට සුදානම් වීමයි. දෙවැන්න නම්, දිවි නසා ගැනීමයි. අගමැති ලි පැවසූ අන්දමට තම මිත්‍රයා දින කිහිපයකින් දෙවැනි විකල්පය තෝරා ගත්තේය. මෙම කථාවෙන් පැහැදිලි වන්නේ එවකට සිංගප්පුරුවේ දූෂණයේ යෙදුණු කිසි පුද්ගලයෙකු, එම පුද්ගලයා කෙතරම් රජයට හෝ නායකයින්ට සමීප වුවත් ඔහුට නීතියෙන් ගැලවීමට අවකාශයක් නොතිබුණු බවය. එවැනි දැඩි ප්‍රමිතියක් සහ ප්‍රතිපත්තියක් හරහා.

අගමැති ලී ට ඉතා වටිනා විනයක් රටතුළ ගොඩනැගීමට හැකි වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් අද සිංගප්පූරුව අවම දූෂණය ඇති රටක් බවට පත්වී ජාත්‍යන්තර කීර්තියක් ලබා ගෙන ඇත.

එසේ නම් අප රටේ ද මෙවැනිම දැඩි ස්ථාවරයක රාජ්‍ය නායකයින් යෙදුන හොත් අප රට අද වැටී ඇති මෙම දූෂිත තත්ත්වයෙන් ගලවා ගැනීමට ඔවුන් පළමුවෙනි පියවරය තැබූ බවට අපට ඉගියක් ලැබෙන්නේය. ඒ සමගම අප රටේ පාලන තන්ත්‍රයේ විශේෂිත වෙනස් කම් රාශියක් ඇතිකිරීම ද අත්‍යවශ්‍යය. මීට පෙර මා කීප වතාවක්ම පුන පුනා කියා සිටි අන්දමට අපේ පාලන යන්ත්‍රය "ප්‍රතිඵල" හරහා සිදුවන එකක් බවට අප පත්කල යුතුය. දැනට පවතින "යෙදවීම්" හරහා ඇති අපගේ පාලන යන්ත්‍රය වෙනස් කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුය. එය අති විශාල දැවැන්ත අභියෝගයක් ලෙස පෙනුනත්, ආත්ම ශක්තියක් ඇතිව එම ක්‍රියාවලිය දියත් කළහොත්, වැඩි කලක් යන්නට මත්තෙන් එසේ කිරීමට අපට හැකි වනු ඇත. අද බොහෝ දියුණු රටවල් මෙවැනි නව ක්‍රම හරහා තම පාලන යන්ත්‍ර හැඩ ගස්වා ගෙන ඇත. එසේ කිරීමෙන් තම අමාත්‍යංශ, දෙපාර්තමේන්තු සහ නිලධාරීන් වැඩි වගකීම් සහිත ආයතන සහ පුද්ගලයින් බවට පත් කිරීමට ඔවුන්ට හැකි වනු ඇත.

ඒ හැරුණු විට අපගේ නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා පාලකයින් සහ නීති අංශ සහ නිලධාරීන් දැඩි උනන්දුවක් දැක්විය යුතුය. පොලිසිය, අල්ලස් හා දූෂණ කොමිසම් සභාවල උසාවි, නීතිපති දෙපාර්තමේන්තු, අනිකුත් කොමිසන් සභා, ඇතුලු නොයෙකුත් නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කරවන දෙපාර්තමේන්තු දැනට වඩා ස්වාධීනව හා උද්යෝගයකින් යුතුව කටයුතු කළ යුතුය. ඔවුන්ට එසේ කිරීමට නිසි බලතල කඩදාසි වලට පමණක් සීමා නොකොට ඇත්ත වශයෙන්ම බලය සහ අවශ්‍ය සම්පත් රජය ලබා දිය යුතුය. එපමණක් නොව, එම ආයතනවල කටයුතු කරන, නීතිය ක්‍රියාත්මක කරන පුද්ගලයින් ආත්ම ශක්තියකින් සහ එඩිතරව කටයුතු කිරීමට ද පුරුදු විය යුතුය. ඔවුන්ට පිට අයගෙන් සහ/හෝ දේශපාලඥයින් ගෙන් බලපෑම් ඇති වන්නේ

නම්, ඒවාට විරුද්ධව නැගී සිට කටයුතු කිරීමට සාමූහික වශයෙන් සමාජයේ පිළිගත් පාර්ශව එකමුතු වී, එම සංවිධාන හෝ ආයතන හරහා එවැනි අයට සහයෝගය දිය යුතුය. එලෙස කෙලින් සහ නීත්‍යානුකූලව කටයුතු කරන අය සමාජයේ පිළිගත් අය වශයෙන් අප සැළකිය යුතුය. මේවා සියල්ලම නිසි ආකාරයෙන් සිදු වුවහොත් අප රට කෙරෙහි ඇති විශ්වාසය ඉතා ඉක්මණින් තහවුරු වනු නොඅනුමානය. එසේ වීමෙන් අප රට සමග ගනුදෙනු කිරීමට ලෝකයේ ඉහළ පෙළේ සමාගම් සහ සංවිධාන පැකිලීමක් නොමැතිව ඉදිරිපත් වනු ඇති අතර එමගින් අපේ ආර්ථිකයෙහි විශේෂ පිබිදීමක් ඇති වනු ඇත.

# 10.4

## මැතිවරණ මනාප ක්‍රමය සහ එහි දුබලතා

1988 සිට අප රටේ පැවැත්වුණු සෑම මැතිවරණයකටම පසුව අපේක්ෂකයින් සහ සාමාන්‍ය ජනතාව අතුලු බොහෝ දෙනෙක් 'මනාප' නිසියාකාරව ගණන් නොකෙරුණේයැයි චෝදනා කරති. සමහර අපේක්ෂකයින්ට ජනතාවගෙන් ලැබුණාට වඩා වැඩි මනාප සංඛ්‍යාවක් සටහන් වී ඇති බවත්, තවත් සමහරුන්ට මනාප අඩුවී ඇති බවත් ඒ අය පවසති.

ඡන්ද පත්‍රිකාවල ඡන්ද දායකයින් සටහන් කොට ඇති මනාප ගණන් කරද්දීත්, පැතුරුම්පත් (Spread Sheet) මත ලකුණු කරද්දීත්, පැතුරුම්පත් හරහා එකතු කරද්දීත්, ඒවා සාරාංශ සටහන්වලට යොමු කරද්දීත්, අක්‍රමිකතා සහ වැරදීම්, දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ ඕනෑ කමින් හෝ නොසැලකිලිමත්ව හෝ සිදුවන බව බොහෝ දෙනා සැක කරති. එවැනි සැකයක් තහවුරු කරන සාධක සහ සාක්ෂි බොහෝ අවස්ථාවලදී මෙම ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති අයට අවුරුදු ගණනක් ඔස්සේ දකින්නටත්, අසන්නටත්, විඳින්නටත් සිදුවීම අවාසනාවට කරුණකි.

ඡන්දයෙන් පසු, ඡන්ද ගණන් කිරීම ආරම්භ කරන විට, ගණන් කිරීමේ නිලධාරීන් සහ නිරීක්ෂකයන් සියලු දෙනාම පාහේ තමන්ගේ පූර්ණ සැලකිල්ල යොමු කරන්නේ එක් එක් පක්ෂවලට ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව ගැනයි. ඊට පසු පක්ෂයෙන් පක්ෂයට ලැබී ඇති ඡන්ද වල ලකුණු කොට ඇති 'මනාප' ගැන සැලකිල්ලක් දක්වන්නේ ඒ මනාප හරහා තරග කරන අයත්, ඒ අයගේ ආධාරකරුවන් පමණක්ය. උග්‍ර හා ගැටුම්කාරී මනාප පොරයක් අප රටේ තිබෙන බව සියලු දෙනාම දනිති. මෙම උග්‍ර මනාප

---

**2004.07.11 දින ලංකාදීප පුවත්පතෙහි පළවූ ලිපියකි.**

පොරෙහි නිරත වන සමහර අපේක්ෂකයන්ගේ ආධාරකරුවන් ඡන්ද ගණන් කරන කාමරවල පවා තම අපේක්ෂකයාගේ මනාප සංඛ්‍යාව වැඩිකර ගැනීමට විවිධ ආකාරයේ ක්‍රියාවලියන්හි යෙදෙන බව පෙනෙන අතර, තවත් සමහරු වෙන අපේක්ෂකයන්ගේ මනාප අඩු කරවීමටත් කටයුතු කරන බව නොරහසකි. ඒ අතර, සමහර ප්‍රබල අපේක්ෂකයන් මැතිවරණය සඳහා "ස්වාධීන කණ්ඩායම්" වෙනමම ඉදිරිපත් කිරීමෙන්, ඒ තුළින් එම මැතිවරණයට තරග කරන පක්ෂවලට හිමි නිල වශයෙන් ලැබෙන සියලුම අයිතිවාසිකම් සහ පහසුකම් තමාටම පුද්ගලිකව ලබා ගැනීමට කටයුතු කරති. එසේ කිරීමෙන් ලැබෙන වාසින් සහ පහසුකම් අතරින් එක් වැදගත් වාසියක් වනුයේ එම දිස්ත්‍රික්කයේ මනාප ගණන් කිරීමේ මධ්‍යස්ථානවල සැම කාමරයකටම තමන්ගේ පුද්ගලික නියෝජිතයෙකු නිල වශයෙන් යැවීමට හැකි වීමේ බලයයි. මතුපිටින් බලන විට මෙම ගණන් කිරීමේ කණ්ඩායම්වල වගකීම, තම අපේක්ෂකයාගේ මනාප රැක ගැනීම ලෙස පෙන්වා දුන්නත්, සමහරවිට ඊට අමතරව අන් අපේක්ෂකයන්ගේ මනාප අඩු කරවීමටත් මෙම අය සහ අනිකුත් අය ක්‍රියා කරන බව, මෙම ක්‍රියාවලිය නිරීක්ෂණය කරන බොහෝදෙනා දැක ඇති කරුණකි. මෙවැනි සිදුවීම් හරහා, මනාප 'සොරකම' අද ඉහළ මට්ටමක, සංවිධානාත්මකව සිදු කෙරෙනවා යන මතය රට පුරාම කටින් කට පැතිරී ඇත. සමහර පරාජයට පත් අපේක්ෂකයින් මේ සම්බන්ධව අධිකරණයට නඩු ගොනු කිරීමට අදහස් කළත්, එසේ කළහොත් තමාට විරුද්ධව පැණ නැගෙන තම පක්ෂයේම අනෙකුත් ජයග්‍රාහී මන්ත්‍රීවරුන්ගේත්, පක්ෂ නිලධාරීන්ගේත් අප්‍රසාදය ගැන සලකා බලා, ඒ අය එවැනි ක්‍රියාමාර්ගයකින් වැලකී ඇති අවස්ථාවන්ද අප රටේ බහුලව ඇත.

එහෙත් එවැනි සැක සහ චෝදනා මධ්‍යයේ, මැතිවරණ කොමසාරිස් තවමත් පැරණි ගණන් කිරීමේ ක්‍රමයම, සුලු වෙනස් වීම් පමණක් කරමින්, වසරක් වසරක් පාසාම පවත්වාගෙන යාම අප සියලු දෙනාගේම දැඩි කණගාටුවටත්, විශ්මයටත් හේතුවකි. සමහරවිට මැතිවරණ කොමසාරිස්, දැනට පවතින ගණන් කිරීමේ ක්‍රමය සාර්ථක එකක් යයිද, ඊට වඩා යහපත් ක්‍රමයක් ඇති කළ නොහැකි යයිද, සිතන්නට පුලුවන. ඔහු අනුගමනය කරන දැනට

පවතින ක්‍රමය අනුව, සෑම ඡන්ද පත්‍රිකාවකම ඇති 'මනාප' එක් පුද්ගලයෙක් හඬ නගා කියවන විට, තවත් එක් පුද්ගලයෙක් එය විශේෂ පැතුරුම් පතක ලකුණු කරනු ඇත. ඊට පසු එම 'මනාප' දෙවරක් පැති මාරු කිරීමෙන් පරීක්ෂා කරනු ඇත. එම දත්ත තිරස් සහ හරස්ව දෙපැත්තෙන්ම එකතු කිරීමෙන් නැවතත් සංසන්දනය කොට සාරාංශ ගොනු කොට, එම දත්ත පරිඝණකයට ඇතුළත් කරනු ඇත. එම ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් සාර්ථක ප්‍රතිඵලයක් ලබා දෙන්නේ යයි කොමසාරිස්තුමා අවංකව සිතනවා ඇත. එහෙත් මෙම ගණන් කිරීමේ ක්‍රියාවලිය ප්‍රායෝගිකව නිරීක්ෂණය කරන. විෂයක් ලෙස විගණනය ගැන යම් දැනුමක් අත්දැකීමක් සහ පලපුරුද්දක් ඇති ඕනෑම කෙනෙකුට එම ක්‍රියා පද්ධතියේ සැලකිය යුතු දුර්වලතාවයන් විශාල ප්‍රමාණයක් පෙණෙනු ඇත.

වරලත් ගණකාධිකාරිවරයෙකු ඉතා පුලුල් ලෙස අධ්‍යයනය කරන එක් වැදගත්ම විෂයක් නම් විගණනයයි. විගණනයේදී බොහෝ විට පිළිපදින එක් විශේෂ මූලධර්මයක් නම්, යම්කිසි ක්‍රියා පටිපාටියක් හෝ ගණුදෙනු පද්ධතියක ඇති අභ්‍යන්තර පාලනය (Internal controls) හරියාකාරව පවතිද සහ සාර්ථකව පවතිද, නැද්ද යන්න නිගමනයට එළඹීමය. එසේ කිරීමට නම්, පළමුකොට එම පද්ධතිය සාර්ථකව නිර්මාණය කර ඇද්ද, නැද්ද යන්න විග්‍රහ කරන අතර, දෙවනුව එම පද්ධතිය ප්‍රායෝගිකවද කාලෝචිතවද ඵලදායි ආකාරයට පාලනය වන්නේ දැයි යන්න සැළකිය යුතුය. (Efficiency in design and Effectiveness in operation) අප රටේ මැතිවරණ වලදී මනාප ගණනය කිරීමේ පද්ධතින් එවැනි විගණන මූලධර්මයන්ට භාජනය කළහොත් එම පද්ධති දුර්වල තත්ත්වයක පසුවන බව නිසැකවම නිගමනය වේ යයි මා සිතමි.

එම දුර්වලතා නිවැරදි කරගත හැකිද? මාගේ අදහස වනුයේ ඡන්ද පත්‍රිකාවේ ස්වභාවය සුළු වශයෙන් වෙනස් කිරීමෙන්ද, මහජනයා තම මනාපය ලකුණු කරන ක්‍රමය සුලු වශයෙන් වෙනස් කිරීමෙන්ද ලෝකයේ පවතින දියුණු තාක්ෂණය උපයෝගි කර ගැනීමෙන්ද අප ක්‍රමයේ ඇති අඩුපාඩු සහ දෝෂයන් සාර්ථකව

නිවැරදි කර ගත හැකි බවය. අද ලෝකයේ ඉතා ඉහළ මට්ටමක තාක්ෂණ දියුණුව පවතී. එවැනි තත්ත්වයක් පවතින ලෝකයක පහසුවෙන් ඡන්ද පත්‍රිකාවක් ස්වංක්‍රියව පරීක්ෂාකර එහි ලකුණු කොට ඇති සළකුණු අනුව නිවැරදි ප්‍රතිඵලයක් ප්‍රකාශ කිරීමට හැකි සුපරීක්ෂක යන්ත්‍ර (scanners) මුලු ලෝකයේම බහුලව පාවිච්චියේ පවතී. ඒවායේ මිලත් මේ වන විට අධික මිලක් නොවේ. සෑම මැතිවරණ කොට්ඨාශ දෙකකටම එකක් බැගින් සුපරීක්ෂක යන්ත්‍ර මිලදී ගත්තත් ඒ සඳහා වැය වන මුදල මැතිවරණයකට යොදන මුලු මුදල සමග සංසන්දනය කරන විට ඉතා අල්ප එකක් වන්නේය. එවැනි සුපරීක්ෂක යන්ත්‍ර භාවිතා කරන්නේ නම් මිනිස් ක්‍රියා හරහා සිදුවන දූෂණ සහ වැරදි නැතිකරගත හෝ අවම කරගත හැකිවන අතර, ගණන් කිරීමේ කාළයද, ශ්‍රමයද බෙහෙවින් අඩුකර ගත හැකිය. දැනට පවතින තත්ත්වය අනුව, මැතිවරණ කාර්යාලයේ ඡන්ද ගණන් කරන්නන්, මනාප ගණන් කිරීමේ ක්‍රියාවලිය අරඹන විට තම රාජකාරියේ එකදිගටම පැය 12 කට වඩා කාළයක් වත් නිරත වී ඇති අතර එම වැඩ කොටස අවසන් කරන විට එම කාර්යයයේ අවම වශයෙන් පැය 36 ක් වත් එකදිගට සේවය කොට ඇත. ඒ වන විට ඔවුන් ශාරීරිකව සහ මානසිකව අන්ත අපහුසතාවයකට පත්ව සිටිති. එවැනි වෙහෙසට පත් පුද්ගලයින් හරහා අප බළාපොරොත්තු වන නිවැරදි සේවයක් අපේක්ෂාකිරීම නුවණට හුරු නැත. මෙම රචනාවෙන් යෝජනා වන පරිදි සෑම ඡන්ද පත්‍රිකාවක්ම සුපරීක්ෂකයකට යොමු කර එහි ප්‍රතිඵලය ස්වයංක්‍රියව සහ තාක්ෂණිකව පරිඝණකයට ලබා ගැනීම සඳහා සරළ මෘදුකාංග පද්ධතියක් (software system) නිර්මාණය කරමින් අවශ්‍ය විනිවිධ භාවයකින් යුත් පරිසරයක් පහුසවෙන්ම බිහිකළ හැක. මෙවැනි නව සහ සරළ ක්‍රමයක් හරහා මනාප ගණන් කිරීමේ ව්‍යායාමය උසස් සහ නිවැරදි මට්ටමකට යොමු කිරීම මැතිවරණ කොමසාරිස්ගේ වගකීම සහ යුතුකමකි.

දේශපාලන පක්ෂ වලට ලැබෙන ඡන්ද සංඛ්‍යාව නිවැරදිව ප්‍රකාශ කිරීමෙන් මෙරට පාලනය කුමන දේශපාළන පක්ෂයකට භාරදෙන්නේ දැයි, වන ජනතාවගේ අභිලාශයට පණ කැවීම මැතිවරණ කොමසාරිස්ගේ ඉතා වැදගත් වගකීම වන අතර,

තම මනාපය ලකුණු කිරීමෙන් මන්ත්‍රීවරු වශයෙන් පත්කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන්ද, නිවැරදිව හඳුනා ගැනීමද, කොමසාරිස්ගේ විශේෂ වගකීමකි. එසේ නොවුවහොත් ජනතාවගේ මතය නිවැරදිව ඉස්මතු නොවීමෙන් ජනතාවගේ එම සාමූහික අභිලාශය පැහැරයාමක් සිදුවන්නේය. එය භයානක සිදුවීමකි.

අතීතයේදී කුමණ වරදක් සිදුවුවත් අඩු තරමින් අනාගයේදීවත් නිවැරදි ක්‍රමයකට පිවිසීමෙන් ජනතාවගේ සහ අපේක්ෂකයන්ගේ විශ්වාසය දිනා ගැනීමට හැකිවන ලෙස කටයුතු කිරීමට දැන්වත් මැතිවරණ කොමසාරිස් පෙළඹෙන්නේ නම් එය සියලුදෙනාගේම සතුටට කරුණකි. එසේ නොවුවහොත්, වැඩි කළක් යන්නට මත්තෙන් දැන් පවතින මේ අධික සැකය සහ අවිශ්වාසය දිගින් දිගටම වර්ධනය වී අප රටේ පවතින මෙම 'මනාප' ක්‍රමය සහ පොරය අදටත් වඩා පිළකුල් තත්ත්වයකට ජනාතව අතරත්, අපේක්ෂකයන් අතරත්, ජාත්‍යන්තරවත්, පත්වෙනවා නොඅනුමානය.

# 10.5

## පොරොන්දු ඉටු කිරීමට මුදල්?

2004 අප්‍රේල් මස මහ මැතිවරණයේදී නිදහස් සන්ධානය විසින් ඉදිරිපත් කරන ලද යෝජිත ක්‍රියාවලිය අනුව, ශ්‍රී ලාංකිකයන්ගේ බලාපොරොත්තු සැළකිය යුතු මට්ටමකට ඉහළ ගොස් ඇත. උපාධිධාරීන් 30,000 ක් ඇතුලු තරුණ තරුණියන් 60,000 ක් රාජ්‍ය අංශයේ රැකියා අපේක්ෂා කරති. රාජ්‍ය සේවකයන් 800,000 ක් පමණ දෙනා තමන්ගේ වැටුප් නුදුරු අනාගතයේදී 70% කින් පමණ වැඩිවේ යයි යන චේතනාවෙන් පසුවෙති. ගොවීහු තමන්ට අවශ්‍ය පොහොර අඩු මිලකට ගැනිමට බලාපොරොත්තු වෙති. සමස්ත භාණ්ඩ සහ සේවාවන් වල මිල අඩුවෙන තෙක් රට වැසියන් සියලු දෙනාම පුන පුනා බලා සිටිති.

මෙම තත්ත්වය ගැන අප මදක් සිතුවහොත් අපට පෙනෙන්නේ මෙවැනි බලාපොරොත්තු අප ජනතාව තුළ බොහෝ කලක් තිස්සේම පැවති ඇති බවය. නිදහසෙන් පසු, අප රටේ ජනතාව දිගින් දිගටම පුරුදු වී ඇත්තේද, පාලකයින් ඔවුන් නිරන්තරයෙන්ම පාහේ යොමු කර ඇත්තේද, විවිධ පහසුකම් සහ අවශ්‍යතාවයන් රජයේ මැදිහත් වීම හරහා ලබා ගැනීමටය. මේ ආකාරයට, බෙහෝ රජයන් යම් දේ ජනතාවට 'නොමිලේ' ලබා දෙනවායයි යන මිත්‍යාව දැනටමත් ජනතා සිත් තුළ කා වදින ලෙස දේශපාලඥයින් ක්‍රියා කොට ඇත. මේ ආකාරයට 'නොමිලේ' ලබාදෙනවා යයි කියන භාණ්ඩ සහ සේවා වලට අවශ්‍ය මුදල් ජනතාවගෙන්ම නොයෙකුත් ආකාර වලට රජය ලබා ගන්නා බව ජනතාව අවබෝධ කරගන්නේ කලාතුරකිනි. ඒ අතරම, යම් රජයක් තාවකාලිකව හෝ යමක් තමන්ට සෘජුවම ලබා දෙන්නේ නම්, එවැනි රජයක් තමන්ට හිතකර රජයක් ලෙසත්, එසේ

---

**2004.07.18 දින ලංකාදීප පුවත්පතෙහි 'දැවෙන ආර්ථික ප්‍රශ්න' තීරුලිපි පෙළෙහි පළවූ ලිපියකි.**

නොකරන රජයක් තමන්ට අහිතකර එකක් ලෙසත් සිතන්නට අප ජනතාව පුරුදු වී ඇත. එහෙත්, මේ ආකාරයට යමක් නොමිලේ ලැබෙනවා යයි ලෙස පෙනුනද, ඇත්තවශයෙන්ම ඒ ආකාරයට නොමිලේ ලැබෙන භාණ්ඩයක් හෝ සේවාවක් කිසිදාක නොමැති බව අප සියලු දෙනාම පාහේ අමතක කරගෙන ඇති වීම කණගාටුදායකය.

සාමාන්‍ය පුද්ගලයෙක් වෙළඳ පොළට යන විට පෙර සකස් කරන ලද 'බඩු ලැයිස්තුවක්' රැගෙන යාම ස්වභාවිකය. වෙළඳ පොළේදී එම ලැයිස්තුවට අනුව, භාණ්ඩ මිලදී ගැනිමට ඔහුට හැකි වන්නේ ඊට අවශ්‍ය මුදල් හෝ සම්පත් ඔහු සතුව තිබුණහොත් පමණකි. ඒ ආකාරයටම රජයේ නව "පොරොන්දු ලැයිස්තුව" ඉටුකර ගැනිම සඳහාද, ඊට අවශ්‍ය මුදල වාර්ශිකව උපයා ගැනිමට රජයට සිදු වනු ඇත. එලෙස අවශ්‍ය වන මුදල, දළ වශයෙන් පහත දැක්වෙන අගයන් ලෙස අපට පෙන්නුම් කළ හැක.

| ජනතා, බලාපොරොත්තු, ලැයිස්තුව | අවශ්‍ය වන වාර්ශික මුදල |
|---|---|
| නව රැකියා අවස්ථා 60,00 සඳහා වැටුප් | 6 |
| රාජ්‍ය සෙවකයන්ගේ වැටුප් 70% කින් වැඩි කිරීම සඳහා | 70 |
| පොහොර සහනාධාරය සඳහා | 5 |
| පිටි මිල පාලනය කිරීම සඳහා සහනාධාරය | 3 |
| ඛණිජ තෙල් මිල පාලනය කිරීම සඳහා සහනාධාරය | 7 |
| අවශ්‍ය වන මුළු මුදල | 91 |

එමෙන්ම, 2003 වසරේදී රජයට හිමුවු මුදල් ප්‍රමාණය කෙතරම්දැයි ශ්‍රිලංකා මහ බැංකු වාර්තා වලින් අපට දැන ගත හැකිය. එකී සංඛ්‍යා ලේඛනයේ සාරාංශයක් පහත දැක්වේ:

| 2004 වසර වර්තන | රුපියල් බිලියන |
| --- | --- |
| ආදායම [current revenue] | |
| ආදායම් බදු | 40 |
| වැට් බදු | 97 |
| සිගරට් සහ මත්පැන් බදු | 31 |
| ඛණිජ තෙල් සහ වෙනත් තෝරාගත් බදු [selected taxes] | 20 |
| ආනයන බදු | 34 |
| හර බදු (Debit tax) සහ වරාය, ගුවන් තොටුපල බදු | 10 |
| මහ බැංකුවේ ලාභය ඇතුලු අනිකුත් ලාභ, ලාභාංශ සහ පොලී | 23 |
| අනිකුත් ලැබීම් | 24 |
| මුළු වර්තන ආදායම | 279 |

ඉහත පෙන්වා දී ඇති වර්තන ආදායමට අමතරව, පුද්ගලිකරණය හරහා රු. බි. 10 ක්ද, ණය ආපසු ගෙවීම් හරහා රු. බි. 11 ක්ද ලබමින්, 2003 වර්ෂය වෙනුවෙන් රජයේ ප්‍රාග්ධන ආදායම රු. බි. 21 ක් පමණ විය. එම සංඛ්‍යා දෙකෙහි එකතුව තුළින්, සමස්ත ආදායම වශයෙන්, රුපියල් බි. 300 ක් ලබා ගැනීමට රජය සමත්විය. පවතින වර්තමාන තත්ත්වය මෙසේ නම්, මතුවන ප්‍රශ්නය වන්නේ, ඉහත කී පොරොන්දු ඉෂ්ට කිරීමට අවශ්‍ය වන අමතර රු. බි. 91 ක් පමණ මුදලක් කෙසේ කොතැනින් සොයා ගත හැකිද යන්නයි. 2003 වසරේදී ආදායම රු. බි. 300 ක්ව පවතිත්දී, ගෙවීම් රු. බි. 661 ක් වූ නිසා ගෙවීම් අඩු කිරීමෙන් මෙම අමතර මුදල සොයා ගත නොහැකි බවද පැහැදිලිය.

සමහර විට මේ ප්‍රශ්නය විටින් විට නොයෙකුත් ක්ෂේත්‍රවල මතුවන නිසා, මීට දින 10 කට පමණ පෙර රූපවාහිනියෙන් විකාශනය වූ සම්මුඛ සාකච්ඡාවකදී මෙම ප්‍රශ්නය විචාරකයෙකු විසින් ජනාධිපතිනියට ඉදිරිපත් කරන ලදී. එවිට, පිළිතුරු වශයෙන් ජනාධිපතිනිය කියා සිටියේ පසුගිය රජයෙන් ක්‍රියාත්මක කරන

ලද 'බදු සමාව' අහෝසි කිරීමත් සමගම එයින් එකතු කර ගැනීමට බලාපොරොත්තු වන මුදල රු. බි. 300ක් පමණ වන බවත්, ඒ මුදල උපයා ගනිමින් ඉහත කී පොරොන්දු ඇතුලු කාර්යයන් රාශියක්ම ඉටු කිරීමට රජයට පහසුවෙන්ම හැකිවෙන බවත්ය. මෙවැනි වැදගත් ප්‍රකාශනයක් කිරීමට පෙර, ජනාධිපතිනියට මුදල් අමාත්‍යාංශයේ හෝ ආදායම්, රේගු, සුරා බදු ප්‍රධානින්ගෙන් උපදෙස් හෝ වාර්තාවක් ලැබී ඇතැයි සිතිම සාධාරණය. එවැනි උපදෙසක් හෝ වාර්තාවක් නොමැතිව, 2003 දී රජයේ මුළු ආදායමට සමාන මුදලක් එක් ආදායම් මාර්ගයක් තුළින්ම සෘජුවම ලබාගත හැකැයි යන විශ්වාසයක් රාජ්‍ය නායකයෙකු තුළ තිබේ යයි සිතන්නටවත් අපහසුය. එසේ නම්, අප සිත් තුළ පැණ නැගෙන ඊළඟ ප්‍රශ්නය වන්නේ රු. බි. 300 ක පමණ මුදලක්, 2003 වසරේදී ක්‍රියාත්මක වූ 'බදු සමාව' අහෝසි කිරීම තුළින් ඇත්ත වශයෙන්ම එකතුකර ගත හැකිද යන්නය.

# පසුවදන

අප රටේ දැවැන්ත සංවර්ධන කටයුතු සිදුවූ යුගයන්හිදී නවීන තාක්‍ෂණයවත්, විදේශීය විශේෂඥයින්වත්, විදේශ ආධාරවත්, අප සතුව නොතිබිණි. එහෙත් මහා පරිමාණයේ වැව්, අති විශාල දාගැබ්, සූක්‍ෂම අන්දමට තනන ලද ඇල දොළ, සිසිලස දිගටම පවත්වා ගත හැකි භාවනා ප්‍රාසාද අප රටේ බහුලව පැවති යුගයන්ට අප හිමිකම් කියන්නේ මහත් ආඩම්බරයෙනි. එසේ නම් මෙවැනි ඉතිහාසයක් ඇති රටක් අද දුගී තත්ත්වයකට වැටී සැම රටකින්මද, සැම ආයතනයකින්මද පිනට ඉල්ලමින් අපේ නායකයින්ට ලෝකය වටේ යැමට සිදුවී ඇත්තේ කුමන හේතුවක් නිසාද?

මාගේ මතය අනුව, එසේ සිදුවී ඇත්තේ, අප තුළ ආත්ම ශක්තියක් ගොඩනංවා ගැනිමට අප අපොහොසත් වී ඇති බැවිනි. අප සැමවිටම පුරුදු වී ඇත්තේ, "අපි දුප්පත්", "අපි කුඩායි", "අපි ක්‍ෂේත්‍රයට අලුත්", "මේ දේ කිරීමට අපට තවමත් කාලය ඇවිත් නැ", "අපට ප්‍රශ්න/ගැටලු වැඩියි", "අපි අසරණයි", අපට උපකාර නැතිව ඉදිරියට යන්න බැ' යැයි කෙඳිරි ගැමටය. කෙසේ හෝ යම් කටයුත්තක් පසු දවසකට යොදවන්නට හෝ එය නොකර සිටිමටද අප දක්‍ෂතාවයක් ලබා ඇත. යමක් නොකිරීමට හේතු සොයනවා මිස, යමක් කිරීමට අප හේතු සාධක සොයන්නේ කලාතුරකිනි. කෙනෙක් යම් අදහසක් ඉස්මතු කරගෙන ඉදිරියට යන්නේ නම් එහි ඇති විවිධ අඩුපාඩු පෙන්වා දෙමින් එහි සාර්ථකත්වය අඩාල කරනවා මිස, එම ව්‍යාපෘතියට සහයෝගය ලබාදී එය ඉදිරියට ගෙන යාමට අප දරණ ප්‍රයත්නයන් අඩුය. එපමණක්ද නොව, අප යම් කටයුත්තක් ඉෂ්ඨ කරද්දීද, එම කටයුත්ත හිතහානුකූලව සහ විනය ගරුකව කරගෙන යන්නේද කළාතුරකිනි. වැඩ රාජකාරියක් කරද්දීද, වාහනයක් පදවද්දීද, පයින් ගමන් කරද්දීද, අපගේ පරිසරය ශුද්ධ පවිත්‍ර කරද්දීද අසල්වැසියා ගැන අප කල්පනා කරනු නැති තරම්ය. අද අප සමාජයේ සියලු දෙනාම තුළ පාහේ ඇති මෙවැනි ආකල්ප,

ජාතියක් වශයෙන් අප ඉදිරියට යාමේ ප්‍රයත්නය මන්දගාමී කරන්නේය. කෙසේ හෝ මෙම උගුලෙන් අප ගැලවිය යුතුය. කිසිවෙකුට අතනොපා ඉදිරියට යාමට අපට ශක්තියක් ඇතැයි අප තරයේම විශ්වාස කරගෙන අපගේ සමාජයේ අනිකුත් අය පිළිබඳව නිරන්තරයෙන්ම සිතන්නට අප කැප විය යුතුය. කෙනෙක්, අප කරන රාජකාරියක් හෝ කාර්යයක් කෙරෙහි අවධානය යොමු කළත්, නොකළත්, එම රාජකාරිය අවංකව සහ උපරිම මට්ටමකට කිරීමට අප අධිෂ්ඨානයක් සහ ආත්ම ශක්තියක් ඇතිකර ගත යුතුය. අපගේ නායකයන්ගේ අඩුපාඩු ගැන ලතවෙමින් අධෛර්යමත් වීමෙන් ප්‍රයෝජනයක් නැතිබව අප හොඳින් මතක තබාගත යුතුය.

අප බොහෝ දෙනා විදේශ රටවලට පිවිසුණු විට, වඩාත් කාර්යක්ෂමව වැඩ කිරීමටද, වඩාත් විනයක් ඇතිව ඒ සමාජවල හැසිරීමටද, වඩාත් යහපත් ආකල්ප අනුව කටයුතු කිරීමටද ඉක්මණින්ම හැඩ ගැසෙමු. විදේශ රටවලදී අපට ඒ දේ හොඳින් කළ හැකි නම්, එයින් තහවුරු වන්නේ එවැනි ක්‍රියාමාර්ග අපට ඇත්තවශයෙන්ම කළ හැකි බවය. එසේ නම්, අද අප ඉදිරියේ තිබෙන විශේෂතම අභියෝගය නම් අපගේ දුර්වල ආකල්ප වෙනස්කර ගැනීමය. එසේ වනවාත් සමගම අපට ජයග්‍රහනය කළ හැකි බවට ආත්ම විශ්වාසයක් අප තුළ බිහිවෙනු ඇත.

එවැනි ආකල්ප වෙනසක් අප සිත් තුළ ඇතිකරගෙන මෙම කෘතියෙහි අඩංගු මා ඉදිරිපත් කරන ලද අදහස් වලින් සමහරක් වත් අප මේ රටේ සාර්ථකව දියත් කළහොත් ඉතා ඉක්මණින්ම ශ්‍රී ලංකාව දියුණු රටක් බවට පත්වනවා ඒකාන්තය. අපගේ දූ දරුවන්ට වඩා හොඳ හෙට දවසක් ලබාදීමට, අපගේ වර්තමාන පරම්පරාවට යම් තරමකින් වත් මෙම කෘතිය ඒ අන්දමට දායක වුවහොත්, එය මට ලැබෙන විශේෂතම තෘප්තියයි.

**අජිත් නිවාඩ් කබ්රාල්**
**2004 ඔක්තෝම්බර් 8 වැනිදා**
nivard@eureka.lk



අජිත් නිවාඩ් කබ්රාල්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි සහ දකුණු ආසියානු ගණකාධිකාරී සමිති සංගමයේ හිටපු සභාපතිවරයෙකි. බස්නාහිර පළාත් සභාවේ හිටපු සභිකයෙකි. ව්‍යාපාර පුණර්ජීවනය හා ව්‍යාපාර හුන්වත් බව වෘත්තිකයන්ගේ සංගමයේ වර්තමාන සභාපතිවරයාය. ඔහු දේශිය මෙන්ම ජාත්‍යන්තර ආර්ථික විශේෂඥයෙකි. 2000 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදයේ අයිසන්හවර් අධි ශිෂ්‍යත්වය සඳහා ශ්‍රී ලංකාවෙන් තෝරා ගනු ලැබුයේද ඔහුය. යුගයේ කතුවරයෙකු වශයෙන් ඔහු රට ගැන නිරන්තර විමසුමකින් කටයුතු කරන්නෙකි. රට පිළිබඳ දැඩි ඇල්මක් ඇති ඔහු මෙරට දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වයන් සහ ජීවිතයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරිම කෙරෙහි දැඩි සේ උනන්දුවක් ඇත්තෙකි. එසේ කිරීමට හැකි මාර්ගය වන්නේ වැඩි වැඩියෙන් ධනය නිර්මාණය කිරීම හා ධනය සාධාරණව බෙදෙන සමාජ සංස්කෘතියක් බිහි කිරීම බව ඔහු තරයේම විශ්වාස කරයි.

“අධ්‍යාපනය, ආර්ථික, ව්‍යාපාරික, කෘෂිකර්මාන්ත, රාජ්‍ය ණය හා බදු කළමනාකරණය, ප්‍රවාහන, මහා මාර්ග, සංචාරක, ඉදිකිරීම් කර්මාන්ත සහ දේශපාලන යන ක්ෂේත්‍රවල පවතින ප්‍රශ්න, ගැටලු හා අර්බුද 'ලක් මවට මුතු පොටක්' හි සාකච්ඡාවට බඳුන් වී තිබේ. අප රටේ ජීවත් වන උගතුන්, බුද්ධිමතුන්, වෘත්තිකයන් සේම ව්‍යාපාරික ප්‍රජාව හා දේශපාලකයන්ද ඒ ප්‍රශ්න, ගැටලු හා අර්බුද ගැන නොයෙක් කතා කියනු අපට ඇසේ. බොහෝ දේශපාලකයන්ගේ කතාවලින් පෙනෙන්නේ ඔවුනට ඒවා තවත් කටගැස්මක් බවට පත්ව තිබෙන සෙයකි. ඔවුහු යථාර්ථය දකින්නටත් කියන්නටත් අකමැත්තෝය. ඒ අභාග්‍ය සම්පන්න තත්ත්වය නිදහසින් පසුව සෑම කාල වකවානුවකම ගම්‍ය වෙයි. අපේ ආර්ථිකය එකතැන පල්වීමට සදාචාරාත්මක ගුණධර්ම සෝදා පාලුවටත් එය හේතු වී තිබේ.

ලක් මව පීඩාවට පත් කරන අර්බුදවලට අජිත් යෝජනා කරන පිළියම්වලින් පසක් වන්නේ ඔහුට ඒ කිසිවක් කටගැස්මක් වී නොමැති බවයි. ලාභය උපරිම අරමුණ කර ගැනීමේ අපේක්ෂාවක් ඔහු සන්තානයෙහි නොමැති බවයි. ඒ කෙසේ වුවද ඔහු යෝජනා කරන පිළියම් අප මන බැඳගන්නේ ඒවායෙහි පවතින ප්‍රායෝගික බව නිසාමය. මලකඩ බැඳුණු මොළවලට ඒවා කදිම ප්‍රතිකාර ලෙස අපට පෙනේ.”

සිරි රණසිංහ
ලංකාදීප, ප්‍රධාන කර්තෘ

මිල රු. 350/-

ISBN 955-8744-00-X